

# ගඬලාදෙණි සන්නයයි.

## බාලාවතාරයෙහි පුරාණ ව්‍යාඛ්‍යානය.



# ගඩලාදෙණි සන්නයයි

ප්‍රසිද්ධ වූ

බාලාවතාරේ පුරාණ ව්‍යාඛ්‍යානය.

——0000——

හික්කඩුවේ සුමඞ්ගලාභිධාන
නායකස්ථවිරපාදයන්වහන්සේ විසින්
ශුද්ධ කොට සංස්කරණ ලදී

ශාස්ත්‍රාධාර යන්ත්‍රාලයෙහි
අච්චු ගස්වන ලදී

මුද්‍රාඞ්කණයෙහි තලාහේනේ අමරමොලි
ස්ථවිරයන් වහන්සේ විසින්
සිඩිපත්‍ර බලා ශුද්ධකරණලදී

——0000——

බුද්ධ වර්ෂ—2420.

1877

සං ශු ප න ය.

# බාලාවතාර සන්නය

බාලාවතාරය නම් කාත්‍යායනව්‍යාකරණය සුවසේ ඉගෙණගන්නාපිණිස ලුහුඬුකොට කරණලද මාහැඟි ප්‍රකරණයකි, එය වනාහි කාත්‍යායන සූත්‍රක්‍රමයෙන් සංඥා දක්වා, සන්ධිවිභක්ත්‍යාදිය විද්‍යාර්ථීන්ට සුඛාවබොධවන ක්‍රමයෙන් පිළිවෙළට යොදා ඊට කාත්‍යායන ව්‍යාකරණයෙන් සාධකසූත්‍ර ගෙණ දක්වා කරණලද්දේය—

මොග්ගල්ලායනව්‍යාකරණයට පදසාධනයද, පාණිනීය ව්‍යාකරණයට ලඝුසිද්ධාන්තකෞමුදියද, චාන්ද්‍රව්‍යාකරණයට බාලාවබොධනයද, යම්සේ සුඛාවබොධවූ ලඝුප්‍රකරණද, කාත්‍යායනව්‍යාකරණයට බාලාවතාරයත් එසේමයි—බාලාවතාරයෙහි උදාහරණ සෙදීමේ ක්‍රමය බාලාවබොධන නම් සංස්කෘතචාන්ද්‍රව්‍යාකරණයේ ක්‍රමයටද සාරස්වතිව්‍යාකරණයේ ක්‍රමයටද ඉතාආසන්නයි—කාතන්ත්‍රයේ ක්‍රමයටද ආසන්නවේ. බාලාවබොධනයෙහි සුගතශබ්දයාගේ පදසිද්ධ්‍යවසානයෙහි විභක්තික්‍රමය හඟවනුපිණිස.

“හිත්වා ත්වං සුගතො ජහාසි සුගත කෙලශානනාකස්මාත්මම
යාචෙන්‍යං සුගතං නශම්ම සුගතෙනාන්‍යෙන තුල්‍යෙන තෙ
දෙයනෙනා සුගතාය නාථ සුගතාවිශ්වස්සුඛං වාඤ්ඡති
සර්වඥීයසුගතස්‍ය ධීර සුගතෙ භක්තිනී තුච්ඡා කිල”

යන ශාර්දූලවික්‍රීඩිතවෘත්තශ්ලොකය දැක්වූ පරිද්දෙන් බාලාවතාරයේ බුද්ධශබ්දපදසිද්ධ්‍යවසානයෙහි—

බුද්ධො බුද්ධ සුඛං දදාති සරතො බුද්ධං තතො දුක්කරං
කිං බුද්ධෙන මහිද්ධයොපි මුනයො බුද්ධෙන ජිතා සුඛී
බුද්ධස්සෙව මනං දදෙ පදමහං බුද්ධා ලභෙයත්‍යච්චුතං
බුද්ධස්සිද්ධි නකිං කරෙ භවභවෙ භත්‍යත්‍රා බුද්ධෙ මම—

කියා ශාර්දූලවික්‍රීඩිතවෘත්තයක්ම කියනලද්—මේ ආදීන් පදසිද්ධි ක්‍රමයේ උදාහරණ බාලාවබොධනයට ආසන්නලෙස පෙණෙනනමුත් කාරකලක්ෂණයෙහි උදාහරණ බොහෝසේම සාරස්වතියටද කාතන්ත්‍රයටද ආසන්නයි—පාණිනීයව්‍යාකරණයට එසේ ආසන්න නොවේ—කාත්‍යායනසූත්‍රලෙසම කරණලද ග්‍රන්ථයක්වූ නමුත් එහි දැක්වූ උදාහරණ නොදක්වා සාරස්වතියෙහිද කාතන්ත්‍රයෙහිද පෙණෙන උදාහරණයන්ට අනුව ගොස් උදාහරණ දක්වනලදී—

ඒ මෙසේයි-කාත්‍යායනයෙහි,"කම්මප්පවචනීයයුත්තෙ"යනු සූත්‍රයි. වෘත්තිය"කම්මප්පවචනීයයුත්තෙ දුතියා විභත්තිහොති"-උදාහරණ. "තං ඛොපන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො-පබ්බජිතමනුපබ්බජන්ති"—බාලාවතාරයෙහි—"කම්මප්පවචනීයයුත්තෙ" යන කාත්‍යායන සූත්‍රය දක්වා"කම්මප්පවචනීයයුත්තෙ ඨානෙ දුතියා විභත්තිහොති" යන වෘත්තියක් යොදා "ලක්ඛණෙ විච්ඡාසං ඉත්ථම්භූතෙ භාගෙ සහත්ථෙ හීනෙච වත්තමානස්ස අනුස්ස—සහත්ථහීන වජ්ජිතෙසු ලක්ඛණාදිසු පතිපරිනාච භාගසහත්ථහීනවජ්ජිතෙසු තෙසෙව අභිස්සච කම්මප්පවචනීයසඤ්ඤා"-යනාදි විස්තරය කියා උදාහරණ මෙසේ දක්වනලදී—(ලක්ඛණෙදාහරණ) රුක්ඛමනුවිජ්ජොතතෙ චන්දො—***

රුක්ඛං රුක්ඛමනුවිජ්ජොතතෙ චන්දො *** (ඉත්ථම්භූතො දාහරණ) සාධුදෙවදත්තො මාතරමනු—(භාගොදාහරණ)—යදෙත්ථ මං අනුසියා තං දීයතු—(සහත්ථොදාහරණ) නදිමන්වවසිතාබාරානසී-** අනුසාරිපුත්තං පඤ්ඤවාභික්ඛු—* සාරස්වතියෙහි—ලක්ෂණෙත්ථම්භූතාඛ්‍යානභාගවීප්සාසු ප්‍රතිපය්‍යනවඃ—එෂ්වර්ථෙෂු විෂයභූතෙෂු ප්‍රත්‍යෙකඃ කර්ම්ප්‍රවචනීයසංඥඃ ස්‍යුඃ—කර්ම්ප්‍රවචනීයයුක්තෙ ද්විතීයා—** (උදාහරණ) ලක්ෂණෙ—වෘක්ෂං ප්‍රති-පරි-අනු-වා විද්‍යොතතෙ විද්‍යුත් ඉත්ථම්භූතාඛ්‍යානෙ—භක්තො විෂ්ණුං ප්‍රති-පරි-අනු-වා—භාගෙ-ලක්ෂ්මීර්හරිං ප්‍රති—පරි-අනු-වා-** වීප්සායාං-වෘක්ෂං වෘක්ෂං ප්‍රති-පරි—අනු—වා සචරති—යනාදිය දක්වනලදී-කාතන්ත්‍රයෙහි—කර්ම්ප්‍රවචනීයෛශ්ච—යන සූත්‍රයද කර්ම්ප්‍රවචනීයෛයෙයැගෙ ලිඞ්ගාද්විතීයා භවති—යන වෘත්තියද දක්වා"වෘක්ෂමභිවිද්‍යොතතෙ විද්‍යුත්-වෘක්ෂංවෘක්ෂමභිතිෂ්ඨති, සාධුර්දේවදත්තො මාතරමභි-යදත්‍රමාං පරිස්‍යාත්-යදත්‍රමාං ප්‍රතිස්‍යාත්, වෘක්ෂමනුවිද්‍යොතතෙ විද්‍යුත්"යනාදිය දක්වනලදී—කාත්‍යායනයෙහි කර්ම්ප්‍රවචනීයයුක්තස්ථානයට දක්වනලද උදාහරණය බාලාවතාරයෙහි "ක්වචි දුතියාඡට්ඨීනමත්ථෙ" යන කාත්‍යායන සූත්‍රය සම්බන්ධ උදාහරණ වශයෙන් කියනලදී—ඒ මෙසේයි—"ක්වචි දුතියා ඡට්ඨීනමත්ථෙ-ඡට්ඨ්‍යත්ථෙ ක්වචිදුතියා සියා—තංඛොපන භගවන්තං"—නුමුත් කාත්‍යායනව්‍යාකරණයෙහි මේ සූත්‍රයට මෙකී යනලද උදාහරණය නොකොට අනිකක් උදාහරණ කරණලදී—ඒ මෙසේයි-"ක්වචි දුතියා ඡට්ඨීනමත්ථෙ—ඡට්ඨීනමත්ථෙ ක්වචි දුතියා විභත්තිහොති-අපිස්සුමං අග්ගිවෙස්සන තිස්සො උපමායො පටිභංසු"-මෙසේ බාලාවතාරයෙහි කාරකකාණ්ඩයේ බොහෝ උදාහරණයන් කාත්‍යායනයෙහි අපරිද්දෙන් නොව-සාරස්වති කාතන්ත්‍රාදි සංස්කෘතව්‍යාකරණ රීතියෙන් යොදා තිබෙනබව පෙණේ—කාතන්ත්‍රයෙහි කාරකවිධියේ "යතො පෛතිභයමාදත්තෙ වාතදපාදානම්"—යනා

ඒ සූත්‍රයන්ට ඉතා ආසන්නලෙස කාත්‍යායනයෙහි "යස්මාදපෙතිභය
මාදත්තෙවාතදපාදානං" යනාදි සූත්‍රගදරා තිබෙනනමුත් උදාහර
ණයන් බොහෝසේම බුඩදෙසනාවෙන්ම ගෙණහැරදක්වා තිබෙ
නබවද බාලාවතාරයෙහි බොහෝතැන ඒ උදාහරණ නොදක්වා
සංස්කෘත ව්‍යාකරණානුසාරයෙන් උදාහරණ දක්වා තිබෙනබවද පෙ
ණේ—බාලාවතාරයෙහි උක්තානුක්තක්‍රමයහා විභක්තිභෙදය වෙ
නබොහෝ පොත්වල නැතිසේ ස්ඵුටලෙසද විස්තරලෙසද දක්වා
තිබේ,එය ලඞ්කාවාසී සියලුම ආචාය්‍ය්‍ය පරම්පරාවලම්මෙන් ශිෂ්‍යයන්
ට සුඞමාගධව්‍යාකරණ පුහුණුකරවණපිණිස පිළිගෙණ තිබෙන්
නේ ඒ නිසායයි හඟිමු—

ඉන් උගත්කල්හි අනිකුත් සුඞමාගධ ව්‍යාකරණයන් ඉගෙණග
න්වී ශක්තිය ලැබෙනසේ නුමුළාවන අවබොධයක් ලැබෙනබැව්ද
හැගේ—එය කළකත්‍ර්‍යතෙමේ කවරේද කවරකලෙක වූයේදැයි දැන
ගණුනොහැකිබැව් බුඩවෂී 2412 වෙනි වෂීයෙහි අඞ්කිතවූ බාලාව
තාරයේ සංශුපනයෙහි පෙණි ඇති—ඒ මේ බාලාවතාරයට සිංහලා
ර්‍ථව්‍යාඛ්‍යානවසයෙන් කරණලද පොත් සතරක් අපට දකින්ට ලැබී
තිබේ—එයින් එකක් බලනසන්නයයි ව්‍යවහාරයට පැමිණියේයි—
අර්‍ථාවබොධයපිණිස බැලියයුතුහෙයින් ඒ ව්‍යවහාරයට පත්වියයි
හඟිමු—එයින් සිංහලජනයාවිසින් සංක්‍ෂෙපයෙන් අර්‍ථාවබොධකර
ණු හැකිනමුත් එය නිරාකුලවූ ඉතාප්‍රශස්තව්‍යාඛ්‍යානයක්නොවේ—
එහි තිසිතැනෙක තත්‍වාවබොධවන පරිද්දෙන් අර්‍ථව්‍යාඛ්‍යානය ගැ
ළපීනැත්තේයි—ඒ මෙයින් දතයුතු—"පුම්ත්‍රීලිඞ්ගා ඝටකටයටයි
මුටයිසිනඩුරෙණුප්පභූතයො—ඝටකටයටයි මුටයිසිනඩුරෙණුප්පභූත
යො, ඝට කට යටයි මුටයි සිනඩු රෙණු ශබ්දයන් ප්‍රභූතකොටඇති
ශබ්දයෝද; පුම්ත්‍රීලිඞ්ගා,පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග ඇත්තාහුයි—ද්විපදචතුප්ප
දජාතිවාචිනොච යථා—ද්විපදචතුප්පද ජාතිවාචිනොච, ද්විපද චතු
ප්පද ජාතිවාචී ශබ්දයන්ට; යථා, උදාහරණ මෙසේයි— ඝටො, ඝටො
යනු වේ"—මේ ව්‍යාඛ්‍යානය යොග්‍යනොවේ—

මෙහි යොග්‍යවූ ව්‍යාඛ්‍යානය මෙසේයි—

ඝටකටයටයිමුටයිසිනඩුරෙණුප්පභූතයො, ඝට-කට-යටයි-මුටයි-
සිනඩු-රෙණු ආදිහුද; ද්විපද චතුප්පද ජාතිවාචිනොච, ද්විපද ජාතිවා
චීහුද චතුෂ්පදජාතිවාචීහුද; පුම්ත්‍රීලිඞ්ගා, පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ගවෙත්-ය
ථා, මෙසේයි; ඝටොයි පුල්ලිඞ්ගයි—යනාදියයි.

එකත්-පදසිඞ්ක්‍රමයදක්වා කරණලදී—එය ලියන සන්නයයි ව්‍ය
වහාරකරණුලැබේ—

එහි තිසිතැනෙක සූත්‍රගෙණහැර දක්විමේ විරොධයක් ඇතත්

සන්ධිවිභක්ත්‍යාදියේ පදසිද්ධික්‍රමය දැනගැන්ම පිණිස ඉතාප්‍රයොජනයි—එකාක්ෂරනිද්දේශයයි-එය කාත්‍යායනසූත්‍රනිද්දේශානුසාරයෙන් කරණලද මාහැඟිපොතකි, එයින් බාලාවතාරයෙහි සූත්‍රයන් සම්බන්ධවූ පදවිභාගාදිය යහපත්ලෙස විද්‍යාර්ථීන්විසින් දැනගත හැකිවේ—එකක් ගඩලාදෙණි සන්නයයි ව්‍යවහාරකරති,ඒවනාහි කලිකාලසාහිත්‍යසර්වඥපණ්ඩිතපරාක්‍රමබාහු මහරජනන් කාලයෙහි ගඩලාදෙණි විහාරයෙහි විසූ පණ්ඩිතස්ථවිරකෙනෙක් විසින් කරණලද හෙයින් ගඩලාදෙණිසන්නයයි ව්‍යවහාරකෙරෙත්යයි මුඛපරම්පරාගත ප්‍රවෘත්තියක් අසනුලැබේ, නමුත් පොතේ කිසිතැනෙක අසවල්කාලයෙහි අසවලාවිසින් කරණලද්දේයයි නොපෙණේ, ශුද්ධමාගධව්‍යාකරණ ඉගෙණගන්නාපිණිස බාලාවතාරය අතිශයින් ප්‍රයොජනවත් ප්‍රකරණයක් වනසේම මේ ගඩලාදෙණිසන්නය බාලාවතාරයෙහි අර්ථාවබොධකරණුපිණිස ඉතාප්‍රයොජනවත් අනඝප්‍රකරණයකි—මේ පොත සංක්‍ෂෙපකරණුපිණිස බොහෝසෙයින් පෙයහලමුඛයෙන් පාඨ දක්වාද. සුවසේ පදුද්ධාරය හැඟෙනතන්හි පදුද්ධාරය නොදක්වා අර්ථකියාද තිබේ. බොහෝසේම සාධක සූත්‍රවෘත්‍ත්‍යාදිය පාණිනීයව්‍යාකරණයෙන් ගෙණහැරදක්වා තිබේ. නානාර්ථාදිය දක්වනලදස්ථානවල අමරමෙදිනීහලායුධාදි සංස්කෘත කොෂවලින් ගෙණහැරදක්වා තිබේ. විද්‍යාර්ථීන්ට දුරවබොධස්ථානයන්හි බොහෝ විස්තරකථාද දක්වාතිබේ—කිසිතැනෙක පාණිනීයාදිය සඳහන්කරතිබෙතනමුත් බොහෝතන්හි මේ උදාහරණය අසවල්ග්‍රන්ථයෙනැයි සඳහන්නොකොටම දක්වනලදී—ලඞ්කාවාසීන්ගේ ප්‍රයොජනයපිණිස බාලාවතාරය විස්තරකිරීම් වශයෙන් කරණලද කොයිසම් පොතක්වත් මෙපමණ ප්‍රයොජනවත්ව මාහැඟිව අපට නොවැටහේමය—මෙහි භාෂාවේ ස්වභාවයෙන් ඉතාපුරාණ බව වැටහේ—මෙහිකියසුතුවූ විශෙෂ නම්—යම්කිසිතන්හි බාලාවතාරයෙහි තිබෙන ක්‍රමයට වෙනස්ලෙසකින් පෙණෙන පාඨයන්ට අර්ථව්‍යාඛ්‍යාන යොදතිබේ. බාලාවතාරයේ කොපමණපරණපොතක්නමුත්ගෙණ එසේම පරණ ගඩලාදෙණිසන්නයකුත් ගෙණ බැලූකල දෙයාකාරය මිස සමනොවනසේ පෙණේ-එසේවෙලා තිබෙන්නේ යම්කලක සන්නය කරණලද්දේද ඊට පසුව යම්කිසි ආචාර්‍ය්‍යපරම්පාරාවක ඉච්ඡානුකූලවශයෙන් පාඨයක ස්වල්පවෙනසක් කොට ලියාගැන්මෙනැයි හඟිමු—කාත්‍යායනවෘත්තියද මේ රටේ ලියාතිබෙන පොත්වලට වෙනස්වසයෙන් වැඩිඋදාහරණාදියෙන් යුක්තව බුරුම සියම් රටවල ලියනලද පොත්වල පෙණෙන මෙනි. එසේවූ බවට සාක්‍ෂියක්නම්—බාලාවතාරයෙහි සප්තමිවිභක්ති ප්‍රයොගයෙහි—“කාලභාවෙසුච”යන සූත්‍රයට අනතුරුව “භාවෙනත්‍ති

යං, කාලෙ භාවෙ ච සත්තමී හොති" කියාතිබෙනනමුත්-සන්නා
ස කාලෙ භාවෙච යන පාඨයටම කරණලදී-කාතන්ත්‍රයෙහි "කාල
භාවයොඃ සප්තමී—යනසූත්‍රයට අනතුරුව "කාලභාවයොර්විශෙෂණ
භූතයොර්නිත්තමානාලිඞ්ගාත්සප්තමීභවති" යනු දක්වාතිබේ-එහෙ
යින් බාලාවතාරයෙහිද "කාලෙ භාවෙච සත්තමී හොති" කියා පාඨ
ය යෙදීතිබුනුබැව්ද ඉන්පසු යම් ආචාර්‍ය්‍යකෙනෙකුන්විසින් කාලෙ
යනාදීන් යොදාගත්බැව්ද සැලකියයුතුයි—

මේ සන්නයෙහි පදච්ඡේදක්වීම බොහෝසේම ව්‍යඤ්ජනානුකූල
නොව භාවය සලකා කියාතිබෙන බැව් හැඟේ, එය සමාසයෙහි—
"පයුත්තා, කියනලද—විධාකතෙ, බෙදනලදකල්හි"—යනාදියෙන්
හැඟේ—කාතන්ත්‍රයනයෙහි ඇතම් සූත්‍රයන්ගේ පදවිභාගය නානා
චාර්‍ය්‍යවරයන්විසින් නානාප්‍රකාරයෙන් කියාතිබෙනබැව් කාතන්ත්‍ර
යනීවර්ණනා මුඛමත්තාදීපනී සූත්‍රනිර්දේශ ආදියේ පෙණෙන ප්‍රභෙ
දවලින් හැඟේ. එයින් බොහෝතැන සූත්‍රවිභාගාදිය මේ සන්න
යෙහි මුඛමත්තදීපනියේ පරිච්ඡෙදන්පෙණේ—'සො' යන සූත්‍රය කා
තන්ත්‍රයනවර්ණනාදියෙහි සි-ඔ කියා විපදයයිකියනලද නුමුත් මුඛම
ත්තදීපනියෙහි එකපදයයිකියනලදී, මේ සන්නයෙහිදු එකපදයයි
කියනලදී—මේ ආදියෙන් මුඛමත්තදීපනියේ මතානුගතව මේසන්
නය කරණලද බැව්හැඟේ—තවද ව්‍යාකරණශාස්ත්‍රයෙහි නානා
ස්ථානයෙහි සැකකරණු ලබන කරුණු සැකහැරෙණසේ මේ සන්
නයෙහි කියාතිබේ—කාරකකාණ්ඩයෙහි කර්මකර්ත්‍රාදීන් යෙදිමේ
සැකනැතිවනපරිච්ඡෙදන් ඉතාවිස්තරකොට තිබෙනක්‍රමය අතිශයි
න් ප්‍රශංසනීයයි-සංඛ්‍යාශබ්ද වරනගණ වරනැගිලිවල දහසින් මත්
තෙහි. නහුත ශබ්දයක්ද, ප්‍රකොටියෙන් මතෙහි නහුත ශබ්දයක්
ද යොදාතිබෙනු පමණක්නොව.අභිධාන ප්‍රදීපිකාවෙහිදු "සතං සහ
ස්සංනහුතං" යනාදියෙන් ශඞ්කාසහිතලෙසම තිබෙයි. මෙයින් දස
දහසවූ ගණනට නහුත ශබ්දයනොවෙයි අයුතශබ්දයයි ඇතම්කෙ
නෙක්කියත්, නවුතශබ්දයයි ඇතම්කෙනෙක්කියත්. තවත් ඇතම්
කෙනෙක් ඒ දෙතන්හිම නහුතශබ්දයමය, ඒ ශබ්දයේ නානාර්ථව
ශයෙන් දෙතන්හිම යෙදෙයි කියත්-බාලාවතාරයෙහි වනාහි. "ස
තං නපුංසකමෙකවචනන්තං එවං සහස්සාදි" කියනලදී. ඊට මේ
සන්නයෙහි-'සහස්සාදි, සහස්සශබ්දයා ආදිවූ ශබ්දයෝද; එවං, මෙ
සේමැයි-මෙහි"ආදිශබ්දයෙන් අයුත නියුත ප්‍රයුත අබ්බුද"කියනලදී-
ලීලාවතියෙහි 'එකදශශත සහස්‍රායුත ප්‍රයුතකොටයඃ ක්‍රමසඃ' යනා
දියෙහි දශසහස්‍රය අයුතයයි කියනලදී—අමරාදීන්විසින් කොටියට
නියුත ශබ්දයක්ද කියනලදී—ඉන් නිසා මේ සන්නයෙහි කියනලද
විස්තර ශුද්ධනිරාකුලවසයෙන්ම හැඟේ—මේ ආදි නොයෙක් කරු

ණු කර්ණකොටගෙණ බාලාවතාරයෙන් මාගධව්‍යාකරණාවබොධයපිණිස මේ සන්නය මාහැඟිබැව්හඟිමු. එසේද වුවත් ලියාතිබෙන පොත්වලපාඨ බොහෝ දෝෂසහිතව අතිශයින් දුරවබොධවශයෙන් තිබේ-පාණිනියාදියෙන්හා අභිධානරත්නමාලාදියෙන් යෙණහැරදක්වනලද සූත්‍රයක් ශ්ලොකයක් තියාගන්ට බැරිපරිද්දෙන්දෝෂාකුලයි, එහෙයින් පරණපොත්කීපයක් ගෙණබලා ශිෂ්‍යයන්ගේ උද්ග්‍රහණයට යොග්‍යපරිද්දෙන් ශුඬකෙළෙමු, එසේම මුද්‍රාඞ්කිතවූ පොත්බැලීමෙහි අවබොධයට සැපවූ පරිද්දෙන් අධොලිපි වශයෙන් යෙදියයුතුතැන් එසේකළෙමු-සූත්‍ර විවිධවිභාගාදියහා ශඞ්කා උපදියයි සැලකුණුතන්හි අපවිසින් අධොලිපිස්වල්පයක් යොදනලදී, එය හඳුනන පිනිස ( )මේ සලකුණෙණ් ඇතුල්කරණලදී—මේසන්න යෙහිද වෙනත් පඤ්චිකාප්‍රදීපාදියෙහිද සම්බන්ධයක් ද්‍යොතක කල්හි තියාද සමහර පිටපතක ද්‍යොතකකල්හි තියාද මේආදී යම් යම් තන්හි “ද්‍යොතක”නොහොත්ද්‍යොතක ශබ්දයක්පෙණේ, ඒවනාහි මහා සිඬාන්තකෞමුදී ආදියෙහි “ලක්‍ෂණෙද්‍යොත්‍යෙ ‘නුරුක්තසංඥඃ ස්‍යාත්; අස්මින් ද්‍යොත්‍යෙ ‘නුරුක්තසංඥඃ ස්‍යාත්”—යනාදීන් පෙණෙනද්‍යොත්‍ය ශබ්දයමයයි හඟිමු—නමුත් ද්‍යොතක ශබ්දයක් කර්තෘකාරකාර්ථයෙහි විමද නොපිළිවන් නොවනබැවින් කිසිතන්හි ද්‍යොතක ශබ්දයතැබූයෙමු, ද්‍යොත්‍යශබ්දයාගේ ව්‍යුත්පත්ත්‍යර්ථයක් නොපෙණුන හෙයින්නොයෙදූනමුත් කිසිතැනෙක වැටීඇති, මේ පොතෙහි එකවචනයෙහි යොදනලද සිංහලවචන කිසිතැනෙක මේ කාලයෙහි ව්‍යවහාරකරණු ලබන බහුවචනසේ හැගෙනනමුත් ඒ එසේම තැබූයෙමු-මේ පොත බොහෝසේම ලිපිදෝෂයෙන් ගහණව තිබුනුබැවින් ශක්තිපමණින් ශුඬකෙළෙමු—නමුත් අවශෙෂදෝෂයක් ඇතහොත් නැවත විචක්‍ෂණයන්විසින් ශුඬකටයුතුයි

---

මේ ශුඬකොට සකස්කරණලද පොත ලබාගෙණ දෙන් බතේතාලෝමේවුස් අප්පුහාමි සහ කොරණේලිස් කුරේ අප්පුහාමි ඇතුළුව තවත් තුන්දෙනෙක්විසින් අච්චුගස්වනලදී

නමො තස්ස

භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

බුද්ධං තිධාභිවන්දිත්වා බුද්ධම්බුජවිලොචනං

බාලාවතාරං භාසිස්සං බාලානං බුද්ධිවුද්ධියා.

බුද්ධ, ප්‍රබුද්ධවූ; අම්බුජ, පියුම් බඳුවූ; විලොචනං, ඇස්ඇති; බුද්ධං, සර්වඥයා; තිධා, (කයින් වචසින් මනසින්යයි) තුන්පරිද්දෙන්; අභිවන්දිත්වා, වැඳ; බාලානං, (අව්‍යුත්පන්න) බාල ජනයන්ගේ; බුද්ධිවුද්ධියා, ප්‍රඥාව වඩනා පිණිස; බාලාවතාරං, බාලාවතාරනම් ප්‍රකරණයක්; භාසිස්සං, කියමි. *

"අක්ඛරා'පාදයො එකචත්තාළීසං"—යනු සූත්‍රයි—අක්ඛරා යන පදය අපි යන පදය ආදයො යන පදය එකචත්තාළීසං යනු පදයි—

අක්ඛරාපි, අක්ෂරයෝද; අකාරාදයො, අකාරයා ආදිකොට ඇති; එකචත්තාළීසං, එක්සාළිස්දෙනෙක්; සුත්තන්තන, පිටකත්‍රයට; උපකාරා, වහල්හුයි—තං යථා, හේ මෙසේයි—

අ, අකාරය; ආ, ආකාරය—පෙ—ළ, ළකාරය; අංඉති, අංයන මොහු (අක්ෂරයෝ නම්හු) යි.

"තත්‍ථො'දන්තාසරා'ට්ඨ"—යනු සූත්‍රයි—තත්‍ථ යනපදය ඔදන්තා යන පදය සරා යනපදය අට්ඨ යනු පදයි—

තත්‍ථ, ඒ; අක්ඛරෙසු, අක්ෂරයන් අතුරෙහි; ඔකාරන්තා, ඔකාරයා අන්තකොට ඇති; අට්ඨ, අටදෙනෙක්; සරානාම, ස්වරයෝ නම්හුයි—

තත්‍ථඉති, තත්‍ථ යනු වත්තතෙ, වැටේ—"වත්තතෙ"ය 'එව'ය යන

---

* "අවතරන්ති සත්‍ථමනෙනා'ති" අවතාරො—අව පූර්වවූ "තරතරණෙ" යන්නාහු කෙරෙන් කරණ කාරකයෙහි 'ණ' වේ—බාලානං අවතාරො බාලාවතාරො—ෂෂ්ඨීතත්පුරුෂයි—"බාලාව බොධනං" යනාදියෙහි මෙන් මෙහිදු "සත්‍ථං" යනු අධ්‍යාහාර වේ—"අනුක්තස්‍ය වශ්‍යං වක්තව්‍යස්‍යාහරණමධ්‍යාහාරඃ" යනුබැවින් නොකිවද අවශ්‍යයෙන් කියයුත්තක්හුගේ ගැණීම අධ්‍යාහාර නම්—කෙසේයත්, අගුලගත් දෙරින් පිටත සිට දෙරයයි කීපමණකින් "හළ මැනව" යනු හැඟෙන හෙයින්ම මෙහිදු "අවතරන්ති" කීපමණකින් "සත්‍ථං" යනු ලැබේ; මත්තෙහිදු මෙසේම දතයුතුයි.

දෙශබ්දයෙන් දක්වූ දෙය නිපා සූත්‍රයක්හා සම්බන්ධ කරණලැබෙයි-"අධිකාර" ශබ්දයෙන් දක්වූදය බොහෝ සූත්‍රයන්හායයි දතයුතුයි.

ලහු—පෙ—ලහුමත්තා ය, තයො ය, රස්සා ය, යනු පදයි—

තත්‍ර, ඒ; සරෙසු, ස්වරයන් අතුරෙහි; ලහුමත්තා, ලඝුමාත්‍රාවූ; අ. ඉ. උ. ඉති, අකාර, ඉකාර, උකාරය, යන; තයො, තුන්දෙනෙක්; රස්සා, හ්‍රස්වයෝ නම් හූයි—*

අඤ්ඤෙ—පෙ—අඤ්ඤෙ ය, දීඝා ය, යනු පදයි—

තත්‍ර, ඒ; සරෙසු, ස්වරයන් අතුරෙහි; රස්සෙහි, හ්‍රස්වයන් කෙරෙන්; අඤ්ඤෙ, සෙස්සෝ; දීඝා, දීර්ඝයෝ නම් හූයි—

සංයොගතො, සංයොගයෙන්; පුබ්බො, පූර්වවූ; එ ඔ, එකාර ඔකාර යන දෙදෙන; රස්සාඉව, හ්‍රස්වයන්මෙන්; † උච්චන්තෙ, උච්චාරණය කරනුලැබෙත්; කියනු ලැබෙයි සේයි—

අනන්තරා, ව්‍යවධාන රහිතවූ; (මැදස්වරයක් නැතිබැවින්) බ්‍යඤ්ජනා, බ්‍යඤ්ජනයෝ; සංයොගො, සංයොග නම්—එත්‍ර, යනු ව්‍යඤ්ජන රහිත කෙවල එකාරයාට උදාහරණය; සෙසෙත, යනු ව්‍යඤ්ජන සහිත වූ එකාරයාටයි—ඔට්ඨා, සොත්ථි, යනුදු මෙසේමැයි—

සෙසා—පෙ—සෙසා ය, බ්‍යඤ්ජනා ය, යනු පදයි—

සරෙ, ස්වරයන්; ඨපෙත්වා, හැර; සෙසා, සෙසු; කාදයො, කකාරයා ආදිකොටඇති; නිග්ගහිත'න්තා, නිග්ගහීතයා අන්තකොටඇත්තාහු; බ්‍යඤ්ජනා, බ්‍යඤ්ජනයෝ නම්හූයි—

වග්ගා—පෙ—වග්ගා ය, පඤ්චපඤ්චසො ය; මන්තා ය, යනු පදයි—

බ්‍යඤ්ජනානං, ව්‍යඤ්ජනයන් අතුරෙහි; කාදයො, කකාරයා ආදිකොට ඇති; මකාරන්තා, මකාරයා අන්තකොට ඇති; පඤ්චපඤ්චසො, පස් පස්පරිද්දෙන්; අක්ඛරවන්තො, අක්ෂරයන් ඇත්තාහු; වග්ගා, වර්ගයෝ නම්හූයි—

වග්ගානං, වර්ගයන් අතුරෙහි; පඨම, පළමුවනුවූ; "කචටතප" යෝද; දුතියා, දෙවනුවූ "ඛඡඨථඵ" යෝද; සොච, සකාරයද; අඝොසා, අඝොෂයෝ නම්හූයි—

ළන්තා, ළකාරයා අන්තකොටඇති; අඤ්ඤෙ, සෙසු බ්‍යඤ්ජනයෝ; ඝොසා, ඝොෂයෝ නම්හූයි-ඝොස, ඝොෂය; අඝොස, අඝොෂය යන; සඤ්ඤාච, සංඥාවෝ දෙදෙනද; "පරසමඤ්ඤා පයොගෙ" ඉති, පර සමඤ්ඤා පයොගෙ යන සූත්‍රයෙන්; සංගහීතා, සංග්‍රහ කරණ ලද

---

* එකමත්තො හවෙ රස්සො, ද්විමත්තො දීඝමුච්චතෙ
ම'න්තා ඉතිච විඤ්ඤෙය්‍යා, උම්මිසො නිම්මිසොපිවා—

† ('කචි' යන්නක් ඉතා පරණ බාලාවතාර පොත්හි පෙනෙනබු මුත් මේ සන්නයෙහි ඒ පදයහෝ කිසිතැනෙක යන අර්ථවාඛ්‍යානයක්හෝ නොපෙනේ)—.

හූයි; (මේ මාගධ ව්‍යාකරණයෙහි ඇතුලත්කරණ ලදහූයයි සේයි)- එවං, මෙසේයින්; ලිඞ්ග, ලිඞ්ගය; සබ්බනාම, සර්වනාමය; පද, පදය; උපසග්ග, උපසර්ගය; නිපාත, නිපාතය; තද්ධිත, තද්ධිතය; ආඛ්‍යාත, ආඛ්‍යාතය; කම්මප්පවචනියාදී, කර්මප්‍රවචනීය යනාදී; සඤ්ඤා ච, සංඥාවෝද; (සංග්‍රහ කරණ ලදහූයි)—

අං ඉති—පෙ—අං ච, ඉති ච, නිග්ගහීතං ච, යනු පදයි—

අං ඉති, අංයයි; අකාරතො, අකාරයා කෙරෙන්; පරං, පරව; යො බින්දු, යම්බින්දුවෙක්; සූයතෙ, අසනුලැබේද; තං, ඒ තෙම; නිග්ගහීතං නාම, නිග්ගහීතනම්—

චූළාමණි, සිළුමිණකටබඳුවූ; ආකාරො, ආකෘතිඇති; බින්දු, බින්දුයෙක්තෙමේ; නිග්ගහීතං ඉති, නිග්ගහීතයයි; වුච්චතෙ, කියනු ලැබෙයි; කෙවලස්ස, හුදකලා (බින්දු) හුගේ; අප්පයොගත්තා, ප්‍රයොගනැතිහෙයින්; අකාරො, අකාරයතෙම; සන්නිධියතෙ, ලංකරණු ලැබේ—(හුදකලා බින්දුව නොකියහැකි හෙයින් අකාරයහා එක් කොට කියනු ලැබෙයි සේයි.)

අ, අවර්ණය, කවග්ග, කවර්ගය; (ක ඛ ග ඝ ඞ ය) හා, හකාරය යන මොහු; කණ්ඨජ, කණ්ඨයෙන් උපදිත්.

ඉ, ඉවර්ණය; චවග්ග, චවර්ගය; (ච ඡ ජ ඣ ඤ ය) යා, යකාරය යන මොහු; තාලුජ, තල්ලෙන් උපදිත්.

උ, උවර්ණය; පවග්ගා, පවර්ගය; (ප ඵ බ භ ම) යන මොහු; ඔට්ඨජ, ඔෂ්ඨයෙන් උපදිත්.

ටවග්ග, ටවර්ගය; (ට ඨ ඩ ඪ ණය) රළා, රකාරළකාර යන මොහු; මුද්ධජ, මූදුනෙන් උපදිත්.

තවග්ග, තවර්ගය; (ත ථ ද ධ නය) ලසා, ලකාර සකාර යනමොහු; දන්තජ, දතින් උපදිත්.

එ, එකාරයතෙම; කණ්ඨතාලුජො, කණ්ඨයෙන්හා තල්ලෙන් උපදී.

ඔ, ඔකාරය තෙම; කණ්ඨොට්ඨජො, කණ්ඨයෙන්හා ඔෂ්ඨයෙන් උපදී.

වො, වකාරයතෙම; දන්තොට්ඨජො, දන්තයෙන්හා ඔෂ්ඨයෙන් උපදී.

සඤ්ඤා, (අක්ෂර) සංඥා විධානයයි—

ලොක අග්ගො ඉති, ලොකඅග්ගො යන; අස්මිං, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතා කියනුලැබේ—"සන්ධිවුච්චතෙ" යන වාක්‍යශෙෂය තෙමේ මුලනොතිවද අධ්‍යාහාරයෙන් කියනු ලැබේ)—

පුබ්බ-පෙ-වියොජයෙත්ති "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ" යන සූත්‍රයෙන්; පුබ්බබ්‍යඤ්ජනං, පූර්ව සිටි ව්‍යඤ්ජනතෙම; සරතො, ස්වරයා කෙරෙන්; පුථක්කාතබ්බං, වෙන්කටයුතුයි—

සරා—පෙ—සරා ච; සරෙ ච, ලොපං ච, යනුපදයි—

අනන්තරෙ, අව්‍යවධානවූ; සරෙ, ස්වරයක්හු; පරෙ, පරකල්හි; සරා, පූර්වස්වරයෝ; ලොපං, ලොපට; පප්පොන්ති, පැමිණෙත්—(ලොප නම් වර්ණවිනාශයයි වර්ණයාගේ නොනිම්යයි සේයි)—

නයෙ—පෙ—"නයෙ පරං යුත්තෙ" යන සූත්‍රයෙන්; අස්සරො, ස්වරරහිතවූ; බ්‍යඤ්ජනො, (පූර්ව) ව්‍යඤ්ජනතෙම; පරක්ඛරං, පරඅකුරකරා; නෙතබ්බො, පැමිනවියයුතුයි—ලොකග්ගො—යි සිද්ධ වේ—

සරෙඉති, "සරෙ" යන; අස්මිං, මෙහි; ඔපසිලෙසිකො කාසසත්තමී, ඖපශ්ලෙෂිකාධාරසප්තමිය; තතො, එහෙයින්; වණ්ණෙ, වර්ණයක්හු විසින්ද; කාල, කාලයක්හු විසින්ද; ව්‍යවධානෙ, අතුරක්ඇති කල්හි; කාරියං, (සංහිතා) කාර්‍ය්‍යතෙමේ; නහොති, නොවේ—යථා, හේ මෙසේයි;—මං අහාසි ඉති, මං අහාසි කියාද; පමාද මනුයුඤ්ජන්ති ඉති, පමාද මනුයුඤ්ජන්තියන පාදය; ආදි, ආදිකොට ඇති; ගාථායං, ගාථාවෙහි; ජනා අප්පමාදන්තිච, ජනා අප්පමාදං කියාද වේ—* සබ්බසන්ධිසු, සියලුසංහිතායෙහිම; එවං, මෙසේ දතයුතුයි—

("සරාසරෙ ලොපං" යන්නෙන් පූර්වස්වරයහටම ලොපැයි නියම කරණු පිණිස "අනන්තරං" යනාදිය කියනලදී)—

අනන්තරං, ඉක්බිතිව; පරස්ස, පරවූ; සරස්ස, ස්වරයහට; ලොපං, ලොප; වක්ඛති, (සූත්‍රකාරකතෙම) කියයි; තස්මා, එහෙයින්; අනෙන, මේ සූත්‍රයෙන්; පුබ්බස්ස, පූර්වස්වරයහට; ලොපො, ලොපතෙමේ; ඤායති, දත්නාලැබේ—("වාපරො අසරූපා"-යන සූත්‍රයෙන් පරස්වරයාහට සූත්‍රකාරකයා ලොප්කීහෙයින් මේ සූත්‍රයෙන් පූර්වස්වරයහටම ලොප හැහෙයිසේයි—මේ සූත්‍රයෙහි "පරෙ" යන්නක් නොකිව ද නොවැටෙතුදු "පරෙ" යනු ලැබෙනබව හඟවනු පිණිස "තෙනෙව" යනාදි කිය)—

---

* මං අහාසි යන්නෙහි, අකාරයක්හු පරවූවද, නිග්ගහීතයා මැදව සිටිහෙයින් පූර්වමකාරස්ථ අකාරය හට ලොප් නොවේ—

"පමාද මනුයුඤ්ජන්ති, බාලා දුම්මෙධිනො ජනා—
අප්පමාදඤ්ච මෙධාවී, ධනං සෙට්ඨංව රක්ඛති"—

යන මේ ගාථාවෙහි පූර්වාර්ධය කෙළවරසිටි "ජනා" යන පදයෙහි නකාරස්ථ ආකාරය හට. අපරාර්ධයෙහි පූර්වවූ, "අප්පමාදං"-යන පදයෙහි ආදිවූ අකාරයා පරවූවද කාලව්‍යවධාන ඇතිහෙයින් ලොප්නොවේ, පූර්වාර්ධයනියා මැද සැතැප්මක් ඇතිව අපරාර්ධය කියනහෙයින් අර්ධයන් දෙදෙනාගේ උච්චාරණය අවිච්ඡින්නව නොපවත්නාහෙයින් මධ්‍යයෙහි විරාම කාලයක් ඇත්තුයි කල්හුවිසින් ව්‍යවධාන නම්.

තෙනේව, එහෙයින්ම:(පූර්වස්වරයහට ලොප්වන හෙයින්ම) සත්තමී නිද්දිට්ඨස්ස, සප්තමීන් දක්වන ලද්දහුගේ; පරත්තංපි, පරබවද; ගම්‍යතෙ, හැඟේ-(මෙහි සත්තමීන් දක්වනලද්දේනම් "සරෙ" යනුයි).

සරෙඉති, සරෙයනු; අධිකාරො, සම්බන්ධකරණු ලැබේ—(අධිකරීයති, සම්බන්ධීයතීති අධිකාරො—මෙහි "සරෙ" යනු ස්වරසංහිතා මුලුල්ලෙහිම වැටෙයි එහෙයින් "අධිකාරො" යනු කියේයි).

පන ඉමෙති, පනඉමෙ යන; ඉහ, මෙහි; (සංහිතා කියනු ලැබේ)-

සරාඉති, සරා යනුද; ලොපංඉතිච, ලොපංයනුද; එව, වැටේ— *

වාපරො—පෙ—වා ය, පරො ය, අසරූපා ය, යනු පදයි—

අසමාන රූපා, සමාන ස්වරූප නොවන්නාවූ; සරම්හා, ස්වරයා කෙරෙන්; පරො, පරවූ; සරො, ස්වරතෙම; වා, විකල්පයෙන්; ලුප්‍යතෙ, ලොප්කරණුලැබේ—පනමෙ, යනුවේ—නොවූතැන්හි "සරා සරෙ ලොපං" යි පූර්වස්වරයහට ලොප් වේ—පනිමෙ—යනුවේ—

බන්ධුස්ස—පෙ—බන්ධුස්ස ඉව—න උපෙති යන; ඉධ, මෙහි; (සංහිතා කියනු ලැබේ)—

ක්වචාස—පෙ—ක්වචි ය, අසවණ්ණං ය, ලුත්තෙ ය, යනු පදයි—

සරෙ, පූර්වස්වරයා; ලුත්තෙ, ලොප්කරණලද කල්හි; පරසරස්ස, පරවූස්වරයහට; ක්වචි, සමහර තැනෙක්හි; අසවණ්ණො, අසමාන වර්ණයෙක්; හොතීති, වේ නුයි; ඉ. උ. ඉති, ඉකාර උකාරයන; එතෙසං, මොවුන්ට; ඨානාසන්නා, ස්ථානයෙන් ආසන්නවූ; එ. ඔ එකාර ඔකාර දෙදෙන; (යථාක්‍රමයෙන් වෙති) † බන්ධුස්සෙව නොපෙති, යනු වේ—‡

තත්‍ර අයං-පෙ-තථා උපමං ඉති, තථා උපමං යන; එතස්මිං, මෙහි. දීඝං—යන සූත්‍ර එකපදිකයි—

---

* "එව" ශබ්දයා පදපූරණය, අවධාරණය, කෙවලාත්‍ර වෘත්තිය ප්‍රසක්තාවාත්‍ර වෘත්තිය යන අර්ථවාචක වූවද මෙතැන කෙවලාත්‍ර වෘත්තියෙහි වැටෙයි—චාන්ද්‍රපඤ්චිකා. කාරද බොහොසේ "එව" ශබ්දයෙන්ම අනුවෘත්ති දක්වා—

† තාලුකස්ථානීය "ඉ" කාරයහට කණ්ඨතාලුකස්ථානීය "එ" කාරය එකදෙශයකින් ආසන්නය—ඔෂ්ඨස්ථානීය උවර්ණයහට කණ්ඨෞෂ්ඨස්ථානීය "ඔ" කාරයද එසේමැයි—

‡ "පනිමෙ" යනු ක්‍රමයෙන් "ක්වචි" ග්‍රහණයෙන් අසවර්ණ නොකළ තැනි—මේ ප්‍රකරණයෙහි එක විෂයකට උදාහරණ දෙකක් දැක්වූ ප්‍රයොජන විශෙෂයෙක් ඇතැයි දතයුතුයි—

සරෙ, පූර්වස්වරයා; ලුත්තෙ, ලොප්කරණලද කල්හි; පරො, පරවූ, සරො, ස්වරතෙම; ක්වචි, සමහර තැනෙක්හි; ධාතායනානං, ධ්‍යාන යෙන් ආසනනාවූයේ; දීඝං, දිඝිබවට; යාති, පැමිනේ—* තත්‍රායං—යනාදිය වේ—

කිංසු ඉධ ඉති, කිංසු ඉධ යනා; අත්‍ර, මෙහි-(සංහිතා කියනුලැබේ)-

පුබ්බොච—යනු සූත්‍රයි; පුබ්බොය, චය, යනු පදයි—

සරෙ, පරස්වරයා; ලුත්තෙ, ලොප්කරණලද කල්හි; පුබ්බොච, පූර්වස්වර තෙමේද; ක්වචි, සමහර තැනෙක්හි; දීඝං, දිඝියට; යාති, පැමිනේ—කිංසූධ යනු වේ—

තෙ අජ්ජ—පෙ—එනො, මෙහි—

යමෙ—පෙ—යංය, එදන්තාස්සය, ආදෙසොය; යනු පදයි—

සරෙ, ස්වරයක්හු; පරෙ, පරකල්හි; අන්තස්ස, කෙළවරවූ; එකාර ස්ස, එකාරයහට; ක්වචි, කිසි තැනෙක්හි; යො, යකාරතෙම; ආදෙ සො හොති, ආදෙශ වේ—† ත්‍යජ්ජ, යනු වේ—

"දීඝං" ඉති, දීඝංයන සූත්‍රයෙන්; ව්‍යඤ්ජනෙ පරෙ, ව්‍යඤ්ජනයක්හු ප රකල්හි; ක්වචි, සමහර තැනෙක්හි; දීඝො, දීඝි වේ—ත්‍යාහං—යනු වේ—ක්වචිඉති, ක්වචියනු, කිං, කුමටය; නෙනො, යනතන්හි යකා රාදෙශ නොවන පිණිසයි—මෙසේම මත්තෙහිදු දතයුතුයි-"නෙ එනො" යි තුබූතන්හි "ක්වචි" ග්‍රහණයෙන් යකාරාදෙශනොව පූර්වස්ව රයහට ලොප්ම වේ—

සො අස්ස—පෙ—එනො, මෙහි—

වමො—පෙ—වං ය ඔදුදන්තානං ය යනු පදයි—

සරෙ, ස්වරයක්හු; පරෙ, පරකල්හි; අන්තා, කෙළවරවූ; ඔකාරඋකා රානං, ඔකාර උකාරදෙදෙනාහට; ක්වචි, කිසිතැනෙක්හි; වො ආ දෙසො හොති, වකාරා දෙශ වේ—ස්වාස්ස අනෙවති යනු වේ—

ක්වචිඉති, ක්වචියනු; කිං, කුමටය; තයස්සු සමෙතා යස්මා—තයො අස්සු සමෙතු ආයස්මා, යි, බූත් කල්හි ක්වචි ග්‍රහණයෙන් වකාරා දෙශනොවැ පූර්වස්වරයහටම ලොප් වේ—

ඉධ අහං, ඉති, ඉධ අහං යනා; ඉධ, මෙහි—

---

* "දිඝි" ශබ්දයා වර්ණයද ගුණයද කියයි, මෙතැන ගුණයෙහි වැටේ—"ක්වචාදිමජ්ඣුත්තරානං දීඝරස්සාපච්චයෙසු ච" යනාදී ත න්හි "දිඝි" යනු වර්ණයෙහි වැටේ—හ්‍රස්වශබ්දයද මෙසේමැයි—

† ධාතීනං ආමද්දිත්වා දීයසති උච්චාරීයතීති, ආදෙසො—ධාතී නං, පෙරසිටිස්ථානීහු; ආමද්දිත්වා, මැඩ; දීයසතියි, සේයි—උච්චාරීය තීති, කියනු ලැබේනුයි; ආදෙසො, ආදෙසනාම්—ආදෙශනාම් මකාව න දෙයයි—

දෙධස්සාච යනු සූත්‍රයි—දෙ ය, ධස්ස ය, ච ය, යනු පදයි—

සරෙ පරෙ, සවරයා පරකල්හි; ධස්ස, ධකාරයහට; ක්වචි, කිසිතැනෙක්හි; දෙ හොති, දකාරාදෙශ වේ (පූර්වස්වරයහට ලොප්වේ)—

දීඝෙ, ("දීඝං" යන සූත්‍රයෙන් ව්‍යඤ්ජනයා පර නිමිත්තින්) දීර්ඝ කළකල්හි—(යම්තැනෙක්හි කාර්යයක් සප්තමීන් දක්වූවහොත් ඒ කාර්යය පෙරකී සූතුරෙහිනැයි දතයුතුයි)—ඉද්ධං—යනු වේ—

ක්වචිඉති, ක්වචියනු; කිං, කුමටය; "ඉධ එව" යි බිඳ පූර්වස්වරය හට ලොප්කරණු පිණිසයි—

චකාරෙන, (මෙමසූත්‍රයෙහි) චග්‍රහණයෙන්; ව්‍යඤ්ජනෙපි, ව්‍යඤ්ජනයක්හු පරකල්හිදු; (ධකාරයහට දකාරයෙක්වෙයි යොදනු) ඉද භික්ඛවෙ යනු වේ—

පති අන්තං චුතන්ති අස්ස යන ඉහ, මෙහි—

ඉවණ්ණො—පෙ—ඉවණ්ණො ය, යං ය, නවා ය, යනු පදයි—

සරෙපරෙ, සවරයා පරකල්හි; ඉවණ්ණස්ස, ඉවර්ණයහට; යො, යකාරාදෙශතෙම; නවා, කිසිතැනෙක්හි; හොති, වේ—නවා ශබ්ද ක්වචිශබ්ද සමානාර්ථයි.

කත යකාරස්ස, කරණලද යකාරාදෙශ ඇති; තිස්ස, තිකාරය හට; සබ්බො චනතීති, "සබ්බො චනතී" යන සූත්‍රයෙන්; ක්වචි, කිසි තැනෙක්හි; චාදෙසෙ, චකාරාදෙශ කළකල්හි; "පරවෙභාවො ඨානෙ"ති, "පරවෙභාවො ඨානෙ" යන සූත්‍රයෙන්; සරතො, සවරයා කෙරෙන්; පරබ්‍යඤ්ජනස්ස, පරවූ ව්‍යඤ්ජනයහට; ඨානාසන්නවසා, ස්ථානාසන්නහෙයින්; ච්චත්තං, ච්ච වේ-එකක් මකාඑවැනිදෙකක් වේ.

පච්චන්තං, යනු වේ—චුත්‍යස්ස, යනු චකාරාදෙශ නුවූතැනී-නවා ඉති, නවායනු; කිං, කුමටය; "පතයගි"—පති අගගි, යි වූන්කල්හි; නවාග්‍රහණයෙන් යකාරාදෙශ නොවන පිණිසයි—

එත්ථ, මෙහි; "ක්වචිපටි පතිස්ස" ඉති, ක්වචිපටිපතිස්ස යන සූත්‍රයෙන්; පතිස්ස, පති ශබ්දයහට; පටි, පටියනාදෙශ වේ—

(සූතුරෙහි 'ඉ' කියා, නොදක්වා 'ඉවණ්ණො' යි, වර්ණග්‍රහණය කුමටයත්) වණ්ණග්ගහණං, වර්ණ ග්‍රහණය; සබ්බත්ථ, හැම සූතුරෙහි; රස්සදීඝ, හ්‍රස්වයන්හාදීර්ඝයන්ගේ, සංගහණත්ථං, සංග්‍රහපිණිසයි—(යම් තැනෙක්හි වර්ණ ශබ්දයාහා එක්කොට ස්වරයන් දක්වූව හොත් ඒ ඒ ස්වරයන්ගේ හ්‍රස්වදීර්ඝයෝ දතයුතුතෙනෝයි—"කාර" ශබ්දයහා වුවහොත් එම ස්වරයෝ ගන්නා ලැබෙත්-අකාරයයි කිවහොත් හ්‍රස්වමය—ආකාරයයි කිව දීර්ඝමයයි සේයි)—

යථා එව, යන; ඉහ, මෙහි—

එවාදිස්සරි-පෙ-එවාදිස්ස ය,රිය,පුබ්බො ය,ච ය,රස්සො ය,යනුපදයි

සරතො; සවරයාකෙරෙන්; පරස්ස, පරවූ; එවස්ස, එව් ශබ්දයා ගේ; ආදි, පූර්වූ; එකාරො, එකාරතෙම; රිත්තං, රිකාරබවට; නවා, කිසිතැනෙක්හි; යාති, යෙයි; පුබ්බොච, පූර්වස්වරද; ඨානාසන්නං, ස්ථානයෙන් ආසන්නවූයේ; රස්සං, හ්‍රස්වබවට; (යාතියි යොදනු)—යථරිව යනු වේ—යථෙව, යන්නෙහි පූර්වස්වර ලොපී--

න ඉමස්ස—පෙ—ඉහ, මෙහි—

වා ඉති, වායනු; එව, වැටේ—

යවමදන—පෙ—යවමදන තරළ ය, ච ය; ආගමා ය යනු පදයි—

සරෙපරෙ, සවරයා පරකල්හි; යාදයො, යකාරාදීහු; (යවමදනත රළ යනමොහු) ආගමා, නොමකා වන්නාහු; වා, විකල්පයෙන්; හොන්ති, වෙත්; චකාරෙන, ච ග්‍රහණයෙන්; ගොච, ගකාරයෙකුදු; (ආගම වේ) * නාසිමස්ස යනාදිය වේ.

“රස්සං” ඉති රස්සං යන සූත්‍රයෙන්; බ්‍යජනෙ, බ්‍යජනයක්හු; පරෙ, පරකල්හි; ක්වචි, කිසි තැනෙක්හි; රස්සො, හ්‍රස්ව වේ; පගෙ ච යනු වේ—

වාඉති, වායනු; කිං, කුමටය; ජ අභිඤ්ඤා යනාදී තන්හි නොවන පිණිසයි—එත්ථ, මෙහි; “සරෙ ක්වචි” ඉති, සරෙක්වචි යනසූත්‍රයෙන්; (සවරයක්හු පරකල්හි) සරානං, සවරයන්ට; පකති, ප්‍රකෘතිතොම; හොති, වෙයි; සසසරූපමෙව, සවකීයවූ සවරූපයම; නවිකාරොඉති, විකාරයෙක් නොවෙයි යන; අත්ථො, අර්ථයි—විකාරනම් අන්‍ය ථාත්ව ය—මූලාවස්ථාවයෙන් උත්තරා වස්ථාවයයි සේයි—

අභි—පෙ—අත්‍ර. මෙහි—

‘‘අබ්භො අභි’’ ඉති, අබ්භො අභි යන සූත්‍රයෙන්; අභිස්ස, අභිශබ්දයහට; අබ්භො, අබ්භ යනාදෙශ වේ—අබ්භුග්ගතො යනු වේ—

සරසන්ධි—සවර සංහිතා කාණ්ඩයයි—

---

බ්‍යජනෙ, ඉති, බ්‍යජනෙ යනු; අධිකාරො, (සියලු බ්‍යජනසන්ධි සෙහි) වැටේ—ක්වචිඉති, ක්වචියනු; එව, වැටේ—

සො භික්ඛු—පෙ—ඉහ, මෙහි—

ලොපච—පෙ-ලොපං ය, ච ය, තත්‍ර ය, අකාරො ය, යනු පදයි—

බ්‍යජනෙපරෙ, බ්‍යජනයක්හු පරකල්හි; සරානං, සවරයන්ට; ක්වචි, කිසිතැනෙක්හි; ලොපොහොති, ලොප්වෙයි; තත්‍ර, ඒ; ලූතෙන

---

* ඨානීනං ආලිඞ්ගිත්වා ගච්ඡති තිට්ඨතීති ආගමො-ඨානීනං, ස්ථානීහු; ආලිඞ්ගිත්වා, වැලඳ; ගච්ඡති, යෙයි; තිට්ඨතීති, සිටීනුයි; ආගමො, ආගම නම්—ආගමනම් නොමකාවන දෙයයි—

ඨානෙ, ලොප් කරණලද තන්හි; අකාරාගමො, අකාරයෙක් ආගමවෙයි; චකාරෙන, ච ග්‍රහණයෙන්; ඔකාරුකාරාපි, ඔකාර උකාර දෙදෙනාද; (ආගමවෙත්)—ස භික්ඛුයනාදි වේ—

ක්වචීති කිං සොමුනි—ක්වචි ඉති, ක්වචි යනු; කිං, කිම; සොමුනි, සොමුනි යන තන්හි ස්වරලොප් ආදිය නොවනපිණිසයි—

උ ඝොසො—පෙ—ඉහ, මෙහි-

වෙහාවො ඉති, වෙහාවො යනුද; ඨානෙ ඉති, ඨානෙ යනුද; එව, වැටේ—වග්ගෙ—පෙ—වග්ගෙය, ඝොසාඝොසානංය, තතියපඨමාය, යනු පදයි—

වග්ගෙ, වර්ගයෙහි; ඝොසාඝොසානං, ඝොසය අඝොසය යන නම් ඇති; චතුත්ථදුතියානං, සතරවන දෙවන අක්ෂරයන්ට; තබ්බග්ගෙ, එම වර්ගයෙහි වූ; තතියපඨමා, තුන්වන පළමුවන අක්ෂරයෝ; යථාසංඛ්‍යං, සංඛ්‍යා නො ඉක්ම;* යුත්තෙ ඨානෙ, යුක්තස්ථානයෙහි; විත්තං, විත්තයට; යනාති, පැමිණෙත්—

උග්ඝොසො යනු වේ—රස්සං, (රස්සං යන සූත්‍රයෙන්) හ්‍රස්ව කළ කල්හි; අක්ඛාතං යනු වේ—

පර සහස්සං—පෙ—ඉහ, මෙහි-

ක්වචි ඔබ්‍යඤ්ජනෙ ඉති, ක්වචි ඔබ්‍යඤ්ජනෙ යන සූත්‍රයෙන්; ඔකාරාගමො, ඔකාරයෙක් ආගම වේ-පරොසහස්සං යනු වේ-ගාගමෙ ච,(යවමදාදි සූත්‍රයෙහි ච ග්‍රහණයෙන්)ගකාරාගමද කළ කල්හි—

අතිප්පගොඛො යනු වේ——

අව—පෙ—අතු, මෙහි—ඔ අවස්ස ඉති, ඔ අවස්ස යන සූත්‍රයෙන්; ක්වචි, කිසි තැනෙක්හි; (ව්‍යඤ්ජනයන්හු පරකල්හි) අවස්ස, අවශබ්දයට; ඔ, ඔකාරාදෙශ වේ—ඔනද්ධා යනු වේ—ක්වචි තිකිං, ක්වචි යනු කිමෙක; අවසුස්සතුයි නොවූ තැනි——

ව්‍යඤ්ජනසන්ධි—ව්‍යඤ්ජනසංහිතා කාණ්ඩයයි—

---

නිග්ගහීතංත්‍යධිකාරො—නිග්ගහීතං ඉති, නිග්ගහීතං යනු; අධිකාරො, සියලු නිග්ගහීත සන්ධියෙහි වැටේ—

කිං කතො—පෙ—ඉහ, මෙහි—

වග්ගන්තං—පෙ—වග්ගන්තංය, වාය, වග්ගෙය, යනු පදයි—

වග්ගබ්‍යඤ්ජනෙ, වර්ගයෙහි වූ ව්‍යඤ්ජනයන්හු; පරෙ, පරකල්හි; බින්දුස්ස, නිග්ගහීතයට; තබ්බග්ගන්තො, එමවර්ගයාගේ අන්තයෙම; වා හොති, විකල්පයෙන් වේ—

කිඞ්කතො යනාදි වේ—

---

* සංඛ්‍යා නොඉක්ම යනු සතරවන්නට තුන්වන්න, දෙවන්නට පළමුවන්නා යයි සේයි——

වා'ති කිං නතං කම්මං—වායනුකිම, කිසි තැන නතං කම්මං—කියා වේ—

වා කාරෙනෙව, (මෙම සූත්‍රෙරහි) වා ග්‍රහණයෙන්ම; ලෙ, ලකාරයා පර කල්හි; ලොච, (නිග්ගහීතයාට) ලකාරයකුදු වේ—පුල්ලිඞ්ගං යනු වේ—පුං ලිඞ්ගං යී බිඳයි—

වා ඉති, වායනු: අධිකාරො, සියලු නිග්ගහීතසන්ධියෙහි වැටේ-

එවං අස්ස—පෙ—ඉහ, මෙහි—

මදා—පෙ—මදාය, සරෙය, යනු පදයි—

සරෙ පරෙ, ස්වරයක්හු පරකල්හි; බින්දුනො, නිග්ගහීතයහට; මදා, මකාර දකාර දෙදෙන; වා හොන්ති, විකල්පයෙන් වෙත්—එවමස්ස යනාදි වේ-වා'ති කිං, වායනුකිම; මංඅජිනි යනතන්හිනොවේ.

තං එව—පෙ—ඉහ, මෙහි—

එහෙඤ්ඤං—එහෙය ඤංය, යනු පදයි—

එකාරෙ, එකාරයක්හුද; හෙච, හකාරයක් හුද; පරෙ, පරකල්හි; බින්දුනො, නිග්ගහීතය හට; ඤො, ඤකාරයෙක්; වා හොති, විකල්පයෙන් වේ—

විත්තෙ, (පරවෙභාවො ඨානෙ යනාසූත්‍රයෙන්) විත්වකළ කල්හි-තඤ්ඤේව යනාදි වේ—

සං යොගො ඉති—ඉහ, මෙහි—

සයෙ ච—සයෙය, චය, යනුපදයි—*යකාරෙ පරෙ, යකාරයක්හු පරකල්හි; තෙන සහ, ඒ යකාරයහා එක්කොට; බින්දුනො, නිග්ගහීතයහට; ඤො, ඤකාරයෙක්; වා හොති, විකල්පයෙන් වේ—

විත්තෙ, විත්වකළකල්හි; සඤ්ඤොගො යනාදි වේ—

චක්ඛු—පෙ—ඉහ මෙහි—

ආගමො ඉති, ආගමො යනුද; ක්වචි ඉති, ක්වචි යනුද; එව, වැටේ—

නිග්ගහීතං ච—නිග්ගහීතංය, චය, යනු පදයි—

සරෙ වා, ස්වරයක්හු හෝ; බ්‍යඤ්ජනෙ වා, බ්‍යඤ්ජනයක්හු හෝ; පරෙ, පර කල්හි; ක්වචි, කිසිතැනෙක්හි; බින්දු, නිග්ගහීතයෙක්; ආගමො හොති, නොමතා වේ—චක්ඛුං අනිච්චං යනාදිවේ—

විදූනං—පෙ—ඉහ මෙහි—

ක්වචි ලොපං ඉති, ක්වචි ලොපං යනාසූත්‍රයෙන්; සරෙ, ස්වරයක්හු පරකල්හි; බින්දුලොපො, නිග්ගහීතයහට ලොප්වේ-විදූනාගගංයනු.

---

* (මෙහි මේසූත්‍රය විපදකොට කියනලදි—මුඛමත්තදීපනියෙහි—සහ ඉති එකං යෙ ඉති එකං ච ඉති එකන්ති තිපදමිදං සුත්තං යී ත්‍රිපදකොට කියනලදී—කාත්‍යායන වර්ණනාවෙහිද මෙසේයි—තුමුත්සූත්‍රවර්ණනාවෙහි විපදකොට කියනලදී)

වේ—ඒසෙ, (ඒසං යන සූත්‍රයෙන් බ්‍යඤ්ජනයා පරකල්හි) ඒකීකළ කල්හි; තාසාහං යනු වේ—

බුද්ධානං—පෙ—ඉහ, මෙහි—

බ්‍යඤ්ජනෙ වෙති, බ්‍යඤ්ජනෙ ච යන සූත්‍රයෙන්: බිඳු ලොපො, නිග්ගහීතයහට ලොප්වේ—බුද්ධානසාසනං යනුවේ—
ඒසෙ, ඒකීකළ කල්හි; සාරාගො යනු වේ—

බීජං—පෙ—ඉහ, මෙහි—

පරො—පෙ—පරොය, වාය, සරොය, යනු පදයි—බිඳුතො, නිග්ගහීතයාකෙරෙන්; පරො, පරවූ; සරො, සවරතෙම; වා, විකල්පයෙන්; ලුප්‍යතෙ, ලොප්කරණු ලැබෙයි—බීජංච යනු වේ—

එවං—පෙ-ඉහ, මෙහි—

බ්‍යඤ්ජනො-පෙ-බ්‍යඤ්ජනොය, චය, විසඤ්ඤොගොය, යනුපදයි.

බිඳුතො, නිග්ගහීතයා කෙරෙන්; පරෙ, පරවූ; සරෙ ලුත්තෙ, සවරයා තමා ලොප්කළ කල්හි; සංයොගො, සංයොගවූ; බ්‍යඤ්ජනො, බ්‍යඤ්ජනතෙම; විනට්ඨසංයොගො, නටුවාවූ සංයොගඇත්තේ; හොතීති, වේනුයි; පුබ්බස්ස ලොපො, පූර්වයහට ලොප්වේ—
(මෙතන පූර්ව සකාරයහටලොපි)—එවංස යනු වේ –

නිග්ගහීතසන්ධි-

නිග්ගහීතසංහිතාකාණ්ඩයයි—

---

අනු—පෙ—අනුපදිට්ඨානංය, වුත්තයොගතොය, යනු පදයි—

ඉධ, මේව්‍යාකරණයෙහි; අනිද්දිට්ඨා, නොකියන ලද; සන්ධියො, සංහිතාවෝ; වුත්තානුසාරෙන, කියනලදදෙය අනුව යාමෙන්; ඤෙය්‍යා, දතයුත්තාහුයි—යථා, මෙසෙයි—

යදි—පෙ—ඉහ, මෙහි—

යාදෙසෙ, ඉවණ්ණා යනනවායි යකාරාදෙශකළ කල්හි; ඉමිනා සුත්තෙන, මේ අනුපදිට්ඨානං වුත්තයොගතො යන සූත්‍රයෙන්: ද යකාරසංයොගස්ස, දයකාර සංයොගයහට; ජෝ, ජකාරයෙන් (ආදෙශ) වේ; ධයකාර සංයොගස්ස, ධයකාරසංයොගය හට; ඣො. ඣ වේ—විතෙත්ත, විත්තකළ කල්හි—
යජ්ජෙවං බොජ්ඣඟා යනු වේ*—

මෙහි යම් කාර්‍ය්‍යයෙක් සත්තමින් දක්වූ යේද ඒ පෙරති සූත්‍රෙන යම්කාර්‍ය්‍යයෙක් ප්‍රථමායෙන් දක්වනලද්දේද එම සූත්‍රෙනැයි දනන--

---

* ආදිතැන පරවෙහාවො ඨානෙයි විත්තවෙයි දෙවෙනි තැන ව ගෙග ඝොසා ඝොසානංතනිය පඨමා යන්නෙන් වෙ—

අසදිසසංයොගෙ, වෙනවෙන අක්ෂරයන් ඇති සංයොගයෙහි; එකසරූපතාච, එකකුහා සමාන ස්වරූපඇතිබවද වේ—

පරි—පෙ—ඉහ, මෙහි—

යාදෙසෙ, යකාරාදෙශ කළ කල්හි; රකාරස්ස, රකාරයහට; යො, (මෙමසූත්‍රයෙන්) යකාරයෙක්වේ—පය්‍යෙසනා යනු වේ—(මෙතන රකාරයාහා යකාරයාහා නොසමහෙයින් අසදිසසංයොගනම් වේ—එහෙයින් පූර්වවූ රකාරතෙම පරයකාරයා වැනි වෙයි—සමහරතැනෙක්හි පර යම් වර්ණයෙක් පූර්වයවැනිවෙයි දතයුතුයි)—

වණ්ණානං. අක්ෂරයන්ගේ; බහුත්තං, බොහෝ බවද; විපරීතතා ච, පෙරළි බවද වේ—

ස රති—පෙ—ඉහ, මෙහි;

මාගමො, මේ සූත්‍රයෙන් මකාරාගමද; සකාරෙ, සකාරයා කෙරෙහි (සිටි;) අකාරස්ස, අකාරයහට; උච, උකාරයෙක්දවේ—සුමරති යනු වේ—ඉස්ස, ඉකාරයහට; වො, (මෙමසූත්‍රයෙන්) වකාරයෙක් වේ—ඉත්ථෙවං යනුවේ—පරලොපෙ, (වා පරො අසරූපායි) පරයාට ලොප් කළ කල්හි; අකාරස්ස, අකාරය හට; ඔ, මෙම සූත්‍රයෙන්; ඔකාරයෙක් වේ—සොත්ථි යනු වේ— මාගමෙ,(යවමදද් සූත්‍රයෙන්;) මකාරාගමද; පුබ්බරස්සෙච, රස්සං-යන්නෙන්පූර්වයට හ්‍රස්වද කළකල්හි; එකාරස්ස, එකාරයහට; (මෙයින්) ඉ, ඉකාරයෙක්වේ—බුසම්ව යනුවේ—වාදෙසෙ, (වමොදුදන්තානං යන්නෙන්) වකාරයෙක්කළකල්හි; හවකාරවිපරියයො (මෙයින්)හකාර වකාර දෙදෙනාගේ පෙරළිය වේ—(පූර්වව සිටි හකාර පරවෙයි පරවසිටි වකාර පූර්වවෙයි සේයි) බව්හා බාධො යනුවේ—අධිස්ස, අධිශබ්දයහට; ක්වචි, කිසිතැනෙක්හි; අජ්ඣො, (මෙයින්) අජ්ඣ යන ආදෙශය වේ—(ධකාරස්ථ අකාරයහට ලොප්වේ)—දීඝෙ, (දීඝං යනසූත්‍රයෙන්) දීර්ඝකළකල්හි; අජ්ඣාහව් වේ—(ක්වචියි තිහෙයින් අජ්ඣගා, යනාදියෙහිනොවේ. මේ බොජ්ඣඞ්ගා යනු සේමැයි)—බින්දුනො, නිග්ගහීතයහටද; ඔකාරස්සච, ඔකාරයහටද; එ, එකාරයෙක්වේ—සුඛෙ, දුක්ඛෙ, ජීවේ, යනුවේ

රදූනං, රකාරදකාර දෙදෙනාට; ළො, (මෙයින්) ළකාරයෙක් වේ—පළිබොධො, පරිළාහො යනුවේ—(පරිබොධො පරිදාහොයි බිඳ)—සරෙ, ස්වරයක්හු හෝ; බ්‍යඤ්ජනෙවා, බ්‍යඤ්ජනයක්හු හෝ;

පරෙ, පරකල්හි; බින්දුනො, නිග්ගහීතයහට; ක්වචි, කිසිතැනෙක්හි; මො, මකාරයෙක් වේ-මම්අහාසි, බුඩම්සරණම් යනුවේ. පුබ්බෙ, පූර්වයෙහි; මො, මකාරතෙම; පරං, පර අක්ෂරකරා; නනෙ තබ්බා, *නොපැමිණියයුතුයි අයුත්තත්තා, යුක්තස්ථානනොවනහෙයිනි†—

* (මේපූරාණ ව්‍යවහාරයි අභිනවව්‍යවහාරයෙහි නොපැමිණ විය යුතුයි)—

† අයුක්ත ස්ථානනම් පෙළ නොපෙනෙන තැනි—

(මම්අභාසි, යන තන්හි මකාර නයෙපරං යුතෙතායි නොපැමිණි යයුත්තේයි)—

බින්දුතො, නිග්ගහීතයා කෙරෙන්; පරසරානං, පරවූ ස්වරයන්ට; අඤ්ඤස්සරතාපි, අනික් ස්වරබවකුදු වේ——

තං ඉමිනා—පෙ—ඉහ, මෙහි—

ඉස්ස, ඉකාරයහට;අ,(මෙයින්)අකාරයෙක් වේ—(මදසරෙ යනාසූ ත්‍රයෙන් නිග්ගාහීතයහට දකාරයෙක්වේ) ඉස්ස, ඉකාරයහට; උ, උ කාරයෙක්ද; අකාරස්ස ච, අකාරය හටද; එ, එකාරයෙක්ද; (මෙයි න්මවේ) බින්දු ලොපාදෙ, නිග්ගහීත ලොපාද්‍යකළ කල්හි; (සබ්ච් ලොපංයි නිග්ගහීතයට ලොප්ද සරාසරෙලොපංයි, පූර්ස්වරයහට ලොප්ද නයෙපරං යුතෙතායි පැමිණි මද කළ කල්හියයි සේයි—එවු මං කොහං යනු වේ—

වාක්‍යසුඛුච්චාරණත්‍ථං, වාක්‍ය සුවසේ කියන පිණිසද; ඡන්දහානි ත්‍ථං ච, ඡන්දස් නොනස්නාපිණිසද; වණ්ණ ලොපොපි, අක්ෂරයන්ට ලොපුදු වේ—*

පටිසංඛාය—පෙ—ඉහ, මෙහි—

පුබ්බයලොපො, පූර්වවූ යකාරයහට (මෙයින් ලොප්වේ) අලාපුනි ත්‍යාදෙ, අලාපුනි යන මේපදය ආදිකොටඇති ඡන්දස්හි; අකාරලො පො, අකාරයහට ලොප්වේ—ලාපු—පෙ-යනු වේ—†

වුත්‍යභෙදය, වෘත්තිය නොනස්නා පිණිස; විකාරොපි, වර්ණයා ගේ අන්‍යථාභාවයද වේ—

අකරම්හසෙ ඉති, අකරම්හසෙ යන පදය; ආදෙ, ආදිකොටඇ ති (ඡන්දස්හි); සකාරෙ, සකාරයෙහි සිටි; ගරුනො, ගුරුවූ; එකාර ස්ස, එකාරයහට; ඉමිනා මේසූත්‍රයෙන්; ලහු, ලඝුවූ; අකාරො, අකා රයෙක් වේ—අක—පෙ—යනුවේ—

මේ අනුෂ්ටුප්ඡන්දසය පචමං ලඝුස්වීත්‍රයි-අනුෂ්ටුප්ඡන්දසට ලක්ෂණ හෙයින් මේ පස්වනුවූ සකාරයා එකාරයා ගුරුහෙයින් වෘත්තිභෙද නොවන පිණිස ලඝුයෙක්කරණලැබේ—ඡන්දස්ආදි කිමයත්—අ ක්ඛරනියමො, අක්ෂරනියමය; ඡන්දං භවෙ, ඡන්දසනාම; (අක්ෂරනිය මයනාම් එකඅකුර කින් උක්ථානාම්ඡන්දස් වෙයි; දෙකකින් අත්‍යු ක්ථානාම් ඡන්දස් වෙයි; තුනකින් මධ්‍යනාම් ඡන්දස්වෙයි සතරකින්ප්‍ර තිෂ්ඨානාම් වෙයි පසකින් සුප්‍රතිෂ්ඨානාම් වෙයි සයකින් ගායත්‍රි වෙ

---

* වාක්‍යනාම්පදසමූහයි—

† මේඡන්දස, ඉන්ද්‍රවජ්‍රානාම් එකොළොස් එකොළොස් අකුරකින් එ ක් පදයෙක් වෙයි—අලාපු ශබ්දයාගේ අකාරයා සිටිය හොත් ඡන්ද සඅකුරු දොළසක්වන්නාහ ඉන්ද්‍රවජ්‍රානාම් ඡන්දසට හානිවෙයි එහෙ යින්අකාරලොපි—

යි සත්අකුරෙකින් උෂ්ණික්වෙයි අටකුරකින් අනුෂ්ටුප්ඡ්වෙයි—යනාදීන් නියම්නිර්මයි) ගරුලහු නියමො, ගුරුලඝූන්ගේ නියමය; චූලාත් භවෙ, චූලනිනම් වෙයි; දීඝො, දීඝද; සංයොගාදි පුබ්බො,සංයොගාදීන්ට පළමුව සිටියාවූ; රස්සොච, හ්‍රස්වද; ගරු භවෙ, ගුරුනාම්වෙයි (ආදිශබ්දයෙන් නිග්ගහීතයා ගන්නේ එහෙයින් නිග්ගහීතයාට පළමුවසිටි හ්‍රස්වද ගුරුනම්වෙයි) රස්සො, හ්‍රස්වතෙමේ; ලහුතු භවෙ, ලඝුනම්වෙයි—යථා, මෙසේයි-ආ, අස්සා, අං, අ, යනු ක්‍රමයෙන්උදාහරණයි—ආයි, දීඝයෙන් ගුරුය; අස්සයි, සංයොගයහටපූර්වූ හ්‍රස්වයගුරුය; අංයයි, නිග්ගහීතයහට පූර්වූ හ්‍රස්වය ගුරුය; අ, යනු ලඝුයි—එවං, මෙසේ; තන්තියා, පෙළට; හිතා, අනුකූලවූ; අඤ්ඤපි, සෙසුද; සංහිතා, සන්ධීහු; විච්ඡේදයත, දතයුත්තාහුයි (සංහිතානම් කිමයත්) සංහිතානිච, සංහිතා නමුදු; වණ්ණානං, අක්ෂරයන්ගේ; අව්‍යවධානතො, වර්ණයෙන් කාලයෙන් අතුරක්නැතිව; සන්නිධි, ලංවීමයි—

වොමිස්සකසන්ධි, (ස්වර ව්‍යඤ්ජන නිග්ග
හීතයෙන්) මිශ්‍රවූසංහිතාවයි—

---

ජිනවචනයුත්තංහිහි, ජිනවචන යුත්තංහි යන සූත්‍රය; සබ්බත්ථ, හැමතන්හි; අධිකාරො, වැටෙයි—(සියලුවේ මාගධව්‍යාකරණයෙහි වැටෙයි සෙයි)—ලිඞ්ගං—පෙ-ලිඞ්ගංය, චය, නිපච්චතෙය, යනු පදයි. ධාතු පච්චය විභත්ති, ධාතුය ප්‍රත්‍යය විභත්තිය යන මොවුන්විසින්; වජ්ජිතං, තොරකරණලද; අත්ථයුත්තං, අර්ථයෙන් යුක්තවූ; සද්දරූපං, ශබ්දස්වරූපතෙම; ලිඞ්ගං නාම, ලිඞ්ගනම්—ජිනවචන යොග්ගං, පෙළට සුදුසුවූ; ලිඞ්ගං, ලිඞ්ගතෙම; ඉධ, මේමාගධව්‍යාකරණයෙහි; ඨපීයති, තබනු ලැබෙයි; නිපාතාදියතිච,නිපදවනුදලැබෙයි;(සිඬකරණු ලැබෙයි සේයි) නිපාතාදියතියනු චකාරබල යෙනි-තබනුලැබෙයිනි පදවනුලැබෙයි කීහෙයින් පළමුකොට තබනපරිදි කියනුලැබෙයි.

බුද්ධ ඉති, බුද්ධනියා; ඨිතෙ, තුබූකල්හි;(ඉක්බිතිනිපදවනපරිදි කියනුලැබෙයි)—

තතො ච—පෙ—තතොය, චය, විභත්තියොය, යනු පදයි—

තස්මාලිඞ්ගා, ඒලිඞ්ගින්; පරා, පරවූ; විභත්තියො, විභක්තීහු; හොන්ති, වෙත්; ච කාරෙන, චග්‍රහණයෙන්; තාසං, ඒ විභක්තීන්ට; එකවචනාදි, එකවචන බහුවචනයයි යනුද; පඨමාදි, පඨමාය දුතියාය යනාදි; සඤ්ඤාච, සංඥවොද; (හොන්ති යොදනු)—(විභක්තිහු නාමිකවරන යත්)—

සියො—පෙ—සම්ං සු හී තියා; විභත්තියො, විභක්තිහුයි—සියො ඉති, සිය යො යී, පඨමා, පළමුවන විභක්තිහුයි—අං යො ඉති, අංය යොයි, දුතියා, දෙවන විභක්තිහුයි—නාහි ඉති, නාය හිය යී;

තතියා, තුන්වනවිභක්තිහුයි—සනං ඉති, ස ය, නං ය යී, චතුත්ථී ,ස තරවන විභක්තිහුයි—ස්මාහි ඉති,ස්මාය හියයි, පඤ්චමී, පස්වන විභ ක්තිහුයි—සනංඉති, ස ය නං ය යී, ඡට්ඨී, සවන විභක්තිහුයි—ස්මිං සු ඉති, ස්මිංය සු ය යී, සත්තමී සත්වනවිභක්තිහුයි—

තාසං, ඒවිභක්තීන්ගේ; අනියමප්පසඞ්ගෙ, අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි; (අනියමයෙන් ප්‍රසඞ්ගය නම් එකශබ්දයක්හු කෙරෙන් එකවට සියලු විභක්තීන්ගේ ප්‍රාප්තියයි)

වත්තිච්ඡාවසා, වක්තෘහුගේ විවක්‍ෂාවූ පරිද්දෙන්; (වත්තිච්ඡානු පුබ්බිකා සද්දප්පවත්ති—යනුහෙයින් ශබ්දය කියන්නාහු කැමති පරිද්දෙන්වත්මුත් වස්තුස්වරූපා පෙක්‍ෂායෙන් නොවේ—එසේමනු මාතුගාම ශබ්දය වක්තෘවිවක්‍ෂාහෙයින් පුලිංගුවත් මුත් වාච්‍යවූ ස්ත්‍රීලක්‍ෂණවූ වස්තුව අපෙක්‍ෂාකොට ස්ත්‍රීලිඞ්ගනොවේ—සෙසුතන්හි ද මෙසේ මැයි)—

• ලිඞ්ගත්ථෙ—පෙ-ලිඞ්ගත්ථෙය, පඨමා, යනුපදයි-යො, යව්අර්ථයෙන්; කම්මකත්තාදි, කර්මකර්තෘයනාදිවූ; අවත්ථන්තරං, අනික් අවස්ථාවක ට; අප්පත්තෙන, නොපැමිණියේද; සසරූපට්ඨො, තමතමාගේ ස්ව රූපයෙහි සිටියේද; සුද්ධො, අමිශ්‍රද; සො, හෙතෙම; ලිඞ්ගත්ථො නා ම, ලිඞ්ගාර්ථ නම්; තස්ස, ඒලිඞ්ගාර්ථයාගේ; අභිධානමත්තෙ, කථන මාත්‍රයක් ඇතිකල්හි; පඨමාවිභත්ති හොති, පළමුවන විභක්ති වේ; තස්ස අපි, ඒප්‍රථමාවිභක්තියගේද; අනියමෙ, නියමයක් නැතිකල් හි; (එකවචන බහුවචන ප්‍රසඞ්ගඇති කල්හියයි සේයි) එකම්හි, එ කාර්ථයක්; වත්තබ්බෙ, කිවමනාකල්හි; එක වචනං, එකවචනවූ, සි, සිවේ—

අනෙන, මේකරණ කොට ගෙන; වුච්චතෙති, කියනුලැබෙනුයි;ව චනං, වචනනම්—(වච්චියතීතියං, වාච්‍යං යනනාහු කෙරෙන් ක ර්තෘවෙහි යුවූතැනි)—එකස්ස අත්ථස්ස, එකඅර්ථයක් හුගේ; වචනං, කීමට වහල්වන්නේ; එකවචනං, එකවචනනම්වේ—බහුවචනං, බහුවචනං යනුද; එවං, මෙසේමැයි—(බහූනං අත්ථානං වචනං බහු වචනං යි දත්නැයි සේයි—*

---

* විභක්තිකරණ පරිදිමෙසේයි—බුද්ධශබ්ද බුද්ධකියා ත්ථෙයි ඕසට පර සමඤ්ඤාපයොගෙ යන සූත්‍රයෙන් ලිඞ්ගසංඥවෙයි ඔහුකෙරෙ න් පරව තතො ච විභත්තියො යන සූත්‍රයෙන් ස්‍යාදි විභක්තිහු වෙති ස්‍යාදීන් තමන් අනියමෙන් ප්‍රසඞ්ගඇත්තේ—වත්තිච්ඡානුපුබ්බි කා සද්දප්පවත්ති—යනු න්‍යායහෙයින් වක්තෘහුගේ විවක්‍ෂාවූ පරිද් දෙන්ලිඞ්ගාර්ථමාත්‍රයක් කළමනාකල්හි ලිඞ්ගත්ථෙපඨමායනා සූත්‍රයෙ හි ච ශබ්දග්‍රහණයෙන්ම එකවචන සංඥකරණලද සි වේ—

අතො ඉති, අතොයනු: එව, වැවේ—

සො, යනු සූත්‍රයි—එකපදයි*

අකාරන්තා, අකාරාන්ත ශබ්දයා කෙරෙන්; පරස්ස, පරවූ; සිස්ස, සිවිභක්තිහට: ඔ හොති, ඔකාරයෙක්වේ—

සර—පෙ—සරලොපොය, අමාදෙසප්පච්චයාදිමුහි ය; සරලොපෙ ය, තුය, පකතිය, යනුපදයි—අං ආදිසු, අං ආදීන්; පරෙසු, පරකල් හි; සරස්ස, ස්වරයහට: ලොපො හොති, ලොප්වෙයි; තස්මිං, ඒ සර ලොප තමා; කතෙතු, කරණලදකල්හි; තුචාදිනා, තුචාසවණ්ණං ලුතෙත යනාසූත්‍රයෙන්; අසවණ්ණෙ, අසමානවර්ණයක්හු: පත්තෙ, ප්‍රාප්තකල්හි; පකති හොති, ප්‍රකෘතිවේ—(ස්වරූපයෙන් සිටී විකාර යකට නොපැමිණෙයි සේයි—අං ආදිහුනවි මෙම සූත්‍රයෙහිකී අංය ආදෙශය ප්‍රත්‍යය යනාද්හුයි—තුශබ්දයෙහි ප්‍රයොජන මතෙතහිපෑ නේ)

නයෙ—පෙ—නයෙ පරං යුතෙත යන සූත්‍රයෙන් පමුණුවත්නැයී සේයි—

එවං, මෙසේ; උපරි, මතෙතහි; සරලොපාදි, ස්වරලොප් ආදි දත යුතුයි—(ස්වරලොප්ද ප්‍රකෘතිද පැමිණීමද මෙහිපරිද්දෙනැයි සේ) යි—බුද්ධොයිවේ—

බහුම්හිච නතබෙබ, බහුවණීයක්කිවමනාකල්හි; බහුවචනං, බහු වචනවූ; යො, යො වේ—

---

මෙසෙයින් බහුවචනද විනියා විභක්තිද දතයුතුයි—බුද්ධ ශබ්දය කිතකහෙයින් තද්ධිතාදි සූත්‍රයෙන් නම්බදුකළකලැනාමය ලිඟය යනුඑකාඡීබැවින් බුද්ධශබ්දයා කෙරෙන් විභක්තසූත්පත්ති සිඬවූව නැවත ඕහට පරසමඤ්ඤා පයොගෙ යන්නෙන් ලිඟුසංඥ කුමටය යන් ශබ්දයෝ තුමූ ව්‍යුත්පන්නය රූඪිහයි විවිධ වෙත් එහි ව්‍යුත් පන්නයෝ නම් පචතීති පාචකො පඨතීති පාඨකොයි පචනාදි ක්‍රියාසඞ්ඛ්‍යය ප්‍රවෘත්ති නිමිත්තකොට සිද්ධවූ සූපකාරාදෘර්ථ වාච්වූ පාච කාදි ශබ්දයෝය රූඪි ශබ්දයොනම් "ප්‍රවෘත්ති නිමිතෙත සත්‍යසති වා තවෛවෘත්තිරූඪිඃ,, යනුබැවින් ප්‍රවෘත්තිනිමිත්තයක් ඇතද නැතද පූර්ව බුද්ධො තදකාරාදීන්යුක්තවූ මෘන්මයාදිවූ වස්තුවෙහි ප්‍රසිද්ධවූ ඝටපටාදිහුයි—මෙතන ඝටාදින්මෙන් රූඪිවූ බුද්ධශබ්ද ය විවක්ෂිතයි—යම්කලෙක්හි ප්‍රකෘති ප්‍රත්‍යයාදෘච්ඡා පෙක්ෂාවෙන් බුද්ධශබ්ද විවක්ෂිත වේද එකල්හි කෘදන්තහෙයින්ම නම්බදුවේ—

---

* (මේසන්තයෙහි සො යනාසූත්‍රය එකපදයයි කියාතිබෙන නමුත්—සි ඔ කියා ද්විපදයයි කාත්‍යායන වර්ණනාවෙහි කියනලදී—මුඛ මත්තදීපනියෙහි එකපදයයි කියනලදී)—

අතො° යනුද, වා ඉති, වා යනුද, එව, වැටේ—

සබ්බ—පෙ—සබ්බයොනීනං ය, ආ ඒ ය, යනු පදයි-අකාරන්තා, අකාරාන්තයාකෙරෙන්; පරෙසං, පරවූ; පඨමදුතියා යොනීනං, ප්‍රථමා වූ යොය තිය යන දෙදෙනාහටද; විතියා වූ යොය තිය යන දෙදෙනා හටද; යථාසංඛ්‍යං, සංඛ්‍ය නොඉක්මු; ආ ඒ, ආකාර ඒකාර දෙදෙනා; වා, විකල්පයෙන්; හොන්ති, වෙත්; (ප්‍රථමා යොනීන්ට ආකාර වෙයි විතීයා යොනීන්ට ඒකාරවෙයි සේයි)*-

බුද්ධා, යනු වේ—

වාඉති, වායනු; කිං, කුමටය; අග්ගයො, අග්ගායො යන තැන නොවනපිණිසයි—(අග්ගිශබ්දයා කෙරෙන් පරව යො වෙයි ඉකාරය හට "ඉවණ්ණුවණ්ණාඣලා" යන සූත්‍රයෙන් ඣ සංඥා වෙයි යො පරකල්හි හ්‍රස්වනොකරණලද ඣ සංඥය හට "යොසුකතනිකාරලොපෙසු" යන සූත්‍රයෙන් අතව වේ)—අග්ගයො, යනු වේ—

ලිඞ්ගත්ථෙ—පෙ—ලිඞ්ගත්ථෙ පඨමා යනු; එව, වැටේ—

"ආලපනෙච"—ආලපනෙය, චය, යනු පදයි—අභිමුඛී කරණං, (ශබ්දයෙන්) අභිමුඛකිරීම; ආලපනං, ආලපනනම්; තදධිකෙ, ඒ ආලපනය අධිකකොටඇති; ලිඞ්ගත්ථෙ, ලිඞ්ගාර්ථයක් කිවමනාකල්හි; පඨමා හොති, ප්‍රථමා වේ—"ආලපනෙ සි ගසඤ්ඤො" ඉති, ආලපනෙ සි ගසඤ්ඤො යන සූත්‍රයෙන්; සිස්ස, සිවිභක්ති හට; ගසඤ්ඤො, ගසංඥ වේ; ගෙඉති, ගෙයනු; එව, වැටේ—

අකාර—පෙ—අකාර පිතාද්‍යන්තානංය, ආය, යනු පදයි-ගෙපරෙ, ගසංඥයාපරකල්හි; අකාරො, අකාරය; පිතු සත්ථු අත්ත රාජාදීනං, පිතුය, සත්ථුය, අත්තය, රාජය, යනාදීන්ගේ; අන්තොච, අන්තද; ආත්තං, ආකාරබවට; යාති, පැමිනේ—

ආකාරොවා ඉති, ආකාරොවා යන සූත්‍රයෙන්; ගෙපරෙ, ගසංඥය පරකල්හි; ආකාරස්ස, ආකාරය හට; රස්සො, හ්‍රස්වතෙමේ; වා, විකල්පයෙන් වේ—

සෙස—පෙ—සෙසතොය, ලොපංය, ගසිය, අපිය, යනු පදයි—

සො, සිං, සත්‍යව, සබ්බතො ගසෙසවා ඉති, සො—පෙ—සබ්බතො ගසෙසවා යන; ආදිනිද්දිට්ඨෙහි, මෙආදිසූත්‍රයෙන් දක්වන ලද්දවුන්කෙරෙන්; අඤ්ඤෙ, සෙසු; අවණ්ණිවණ්ණුවණ්ණොකාර, අවර්ණය ඉවර්ණය උවර්ණය ඕකාරය යන මොවුන්; අන්තා, අන්තකොට ඇත්තාහු; සෙසා, සෙසයෝනම්; තෙහි, ඒ සෙසයන් කෙරෙන්; පරෙ, පරවූ; ගසී, ගසංඥය සිවිභක්තිය යන දෙදෙනා; ලුප්පන්තෙ, ලොප්කරණු ලැ

---

* "අතොනෙන" යනසූත්‍රයෙන් අතොයනු සබ්බයොනීනමා ඒ ය න්තෙහි වැටේ—

බෙත්—(හෙ) බුඬ. බුඬා, යනු වේ—යො, යො වෙයි—බුඬා, යනු

කම්මණෙ—පෙ—කම්මණෙය, දුතියාය, යනු පදයි—

යං, යමක්; කරොති, (කර්තෘතෙමේ) කෙරේද; තං, ඒ වස්තුව; කම්මං නාම, කර්මකාරකනම්; තත්ථ, ඒ කර්මය කිවමනාකල්හි; දුතියා හොති, දෙවන විභක්ති වේ—අං, වේ†—බුඬං, යනුවේ—යොනං, යො හට; එ, "සබ්බයොනීනමා එ" යන්නෙන් එකාරයෙක්ද වේ—බුඬෙ, යනු වේ—

තතියා ඉති, තතියා යනු; එව, වැටේ—

කත්තරි—පෙ—කත්තරිය, චය, යනු පදයි—

යො, යමෙක්; කරොති, ක්‍රියාව කෙරේද; සො, හෙතෙම; කත්තා නාම, කර්තෘනම් වේ—තත්ථ, ඒකර්තෘව කිවමනාකල්හි; තතියා හොති, තුන්වන විභක්ති වේ-"යො කරොති සකත්තා" යි කර්තෘසංඥ වේ. නා, නා වේ—

අතො—පෙ—අතොය, නාය, එනය, යනු පදයි‡—

අකාරා, අකාරාන්තයාකෙරෙන්; පරො, පරවූ; නා, නාතෙම; එනං, එනබවට; යාති, පැමිනේ§—

බුඬෙන, යනු වේ—හි, හි වේ—සුහි—පෙ—සුහිසුය, අකාරොය, එය, යනු පදයි—සුහිසු, සු හි යනමොවුන්; පරෙසු, පරකල්හි; අකාරස්ස, අකාරය හට; එ හොති, ඒ කාරයෙක් වේ—

ස්මාහි—පෙ—ස්මාහි ස්මිනනංය, මහාහි මහිය, වාය, යනු පදයි—

සබ්බ සද්දෙහි, සියලු ශබ්දයන් කෙරෙන්; පරෙසං, පරිවූ; ස්මා හි ස්මිනනං, ස්මාය හිය ස්මිංය යනමොවුන්ට; යථා සංඛ්‍යං, පිළිවෙළින්; මහා හි මහි ඉති, මහාය හිය මහිය යන; එතෙ, මේ ආදෙශයෝ; වා,

---

* ආලපනයෙහි එකවචන බහුවචන යෙහිදු බුඬායි වනහෙයින් බහුවචන හඟවන පිණිස යො යි කීයේ--මෙසේම මතුදු දතයුතුයි

† යටකී පරිද්දෙන් ලිඟුසංඥකොට යං කරොති තං කම්මං යන්නෙන් කර්ම සංඥකොට විතියා කරණුය—කත්‍රාදි සංඥද ඒ ඒ සුතුරෙන් මෙසේමැයි—

‡ එනොයි කිවමනාතැන සබ්බාසමාවුසො, යනාදියෙහි ආදිග්‍රහණයෙන් සි හට ලොප්කොට එන කීහු—මෙසේමමත්තෙහිදු ලුප්තප්‍රථමාන්ත දතයුතුයි—මෙසේවූ ලොප් ශාස්ත්‍රවිෂයෙහි මුත් ලොකවිෂයෙහි නැති—ලොකවිෂයෙහි නැති ප්‍රයොග ශාස්ත්‍රවිෂයෙහි පැනේ මැයි—හලන්තශබ්දයා මාගධයෙහිනැතද අඤ්ඤතිත්‍යන්නෙහි කිත්යයි ශාස්ත්‍රයෙහි හලන්තව පැනෙන පරිද්දෙනි—

§ එනත්තං කිවමනාතන්හි එනයයි විපරීතව කීයේ ගුණප්‍රධානකොටයි, මෙසේම සෙසු තන්හිද දතයුතුයි—

විකල්පයෙන්; හොන්ති, වෙත්—බුද්ධෙහි, බුද්ධෙභි, යනු වේ—

කර—පෙ—කරණෙය, තතියාය, යනු පදයි—

යෙන වා, යමක්කරණකොටගෙනහෝ; කයිරතෙ, කෘත්‍ය තෙම කෙරේද; තං, හෙතෙමේ; කරණං නාම, කරණකාරකනම; තස්මිං, ඒ කරණය කිවමනාකල්හි; තතියා හොති, තෘතීයා වේ-("යෙනවා කයිරතෙ තං කරණං,, යයි කරණ සංඥා වේ—මෙහි වා ශබ්දයෙහිප්‍රයොජන මතුකාරක ප්‍රස්තාවයෙහි පැනේ)-සබ්බං, සියල්ල; කත්තු සමං, කර්තෘකාරකයහා සමයි—(සියලු කාරියද රූපද සමයයිසේයි—එහෙයින්) බුද්ධෙන, බුද්ධෙහි, බුද්ධෙභි, කියාවේ—

සම්ප—පෙ—සම්පදානෙය, චතුත්ථිය, යනු පදයි—

යස්ස, යමක්හට; දාතුකාමො වා, (කර්තෘ) දෙනුකැමැත්තේනම් හෝ; රොචතෙවා, ප්‍රීතිකෙරේනම් හෝ; ධාරයතෙවා, දරානම් හෝ; තං, හේ වස්තුව; සම්පදානං නාම, සම්ප්‍රදානකාරකනම; තස්මිං, ඒසම්ප්‍රදානය කිවමනාකල්හි; චතුත්ථි හොති, සතරවන විභක්ති වේ—ස, ස වේ—

අතො යනුද, වා යනුද, එව, වැටේ—

ආය—පෙ—ආයය, චතුත්ථෙකවචනස්සය, තුය, යනු පදයි—

අකාරා පරස්ස, අකාරයා කෙරෙන් පරවූ; චතුත්ථෙකවචනස්ස, චතුර්ථී එකවචනය හට; ආයො, ආය යන ආදෙශයතෙවේ; වා, විකල්පයෙන්; හොති, වේ—(තුග්‍රහණයෙන් හිතත්ථං යනාදිතන්හි; ත්ථං, ප්‍රත්‍යය* දතයුතුයි)—බුද්ධාය, යනු වේ—

"සාගමොසෙ" ඉති, සාගමො සෙ යනසූත්‍රයෙන්; සෙ, සවිභක්තිපරකල්හි; සකාරාගමො, සකාරගම වේ—බුද්ධස්ස, යනු වේ—නං, නං වේ—

දීඝං ඉති, දීඝං යනු; එව, වැටේ—

සුනා—පෙ—සුනංහිසුය, චය, යනු පදයි—

සුනංහිසු, සුය නංය හිය යනමොවුන්; පරෙසු, පරකල්හි; සරානං, ස්වරයන්ට; දීඝො හොති, දීඝ වේ-ච සදෙදන, ච ග්‍රහණයෙන්; ක්වචි, සමහරතැනෙක්හි; න, නො වේ—බුද්ධානං, යනු වේ—

අපාදා—පෙ—අපාදානෙය, පඤ්චමීය, යනු පදයි—

යස්මා, යමක්හු කෙරෙන්; අපෙති වා, පහවේනම් හෝ; භයං වා, භයවේනම් හෝ; ආදත්තෙ වා, ගනිනම්හෝ; තං, හෙ තෙම; අපාදානං නාම, අපාදානකාරකනම; තස්මිං, ඒ අපාදානය කිවමනාකල්හි; පඤ්චමීහොති, පස්වනවිභක්ති වේ—("යස්මාදපෙති භයමාදත්තෙ

---

* (කාත්‍යායනයෙහි, "තුසඅදගඝඝණෙනා ත්ථංච හොති අත්තත්ථං හිතත්ථං සුඛත්ථං" යන්නෙන් සවිභක්තියට 'ත්ථං' යන අදෙශය තිබෑ ච් හැයේ—මෙහිවනාහි ප්‍රත්‍යයයිකියනලදි)

වා තදපාදානං,, යී අපාදානසංඥවේ)—ස්මා, ස්මා වේ—

අතො යනුද, ආ ඒ, යනුද, ඒව, වැවේ—

ස්මා—පෙ—ස්මාස්මිනානංය, වාය, යනු පදයි—

අකාරා, අකාරාන්තයාකෙරෙන්; පරෙසං, පරවූ; ස්මාස්මිනානං, ස්මාය ස්මිංය යන දෙදෙන හට; ආ ඒ, ආය ඒය යන දෙදෙනා; වා, විකල්පයෙන්; හොන්ති, වෙත්—බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා, බුද්ධෙහි, බුද්ධෙභි, වේ—සාමි—පෙ—සාමිස්මිංය, ඡට්ඨීය, යනු පදයි—

යස්සවා, යමක්හුගේ හෝ; පරිග්ගහො, අයද්ද; තං, හේතෙම; සාමිනාම, සාමිනම් වේ—තණ, ඒ ස්වාමිත්ව කිවමනාකල්හි; ඡට්ඨී හොති, සවන විභක්තිවේ—

(වා යන්නෙහි ප්‍රයොජන මිතු පැනේ-"යස්සවා පරිග්ගහො තං සාමි,, යන්නෙන් සාමි සංඥ වේ)*—බුද්ධස්ස, බුද්ධානං, යනු වේ—

ඔකාසෙ—පෙ—ඔකාසෙය, සත්තමීය, යනු පදයි—

යො, යමෙක්තෙමේ; ධාරො,† පිහිටද; තං, ඒ කාරකය තෙම; ඔකාසං ‡නාම, ඔකාසනම; තණ, ඒඔකාසයකිවමනාකල්හි; සත්තමී හොති, සත්වන විභක්ති වේ—

("යොධාරො තමොකාසං,, යී ඔකාසසංඥ වෙයි)—ස්මිං, වේ—බුද්ධෙ. බුද්ධම්හි, බුද්ධස්මිං, වේ—සු, සු වේ—("සුහිස්වකාරො ඒ,, යී ඒ වේ) බුද්ධෙසු, යනු වේ—

බුද්ධ. සර්වඥය; බුද්ධො, සර්වඥතෙම; බුද්ධං, සර්වඥයා; සරතො, සිහිකරන්නා හට; සුඛං දදාති, (මෙලොවින් පරලොවින්)සුවදේ? තතො, එහෙයින්; බුද්ධෙන, සර්වඥයාවිසින්; දුක්කරං, දුෂ්කරදෙයක්; කිං, කිම; (සිහිකරන්නාහටපවා සුව දෙන බැවින් නොකටහැකිදෙයක් නැතැයි සේයි)මහිද්ධයො, මහත්සෘද්ධිඇත්තාවූ; මුනයො අපි,(සැරියුත්මුගලන්ආදිවූ) ශ්‍රාවකයෝපවා; බුද්ධෙන, සර්වඥයා කරණකොටගෙන; සුඛිතා, සුවපත්වූවාහු; (නිර්වාණසුඛප්‍රාප්තවූවාහුයි සේයි එහෙයින්) බුද්ධස්ස එව, (එම) බුදුන්ටම; මනං, සිත; දදෙ, දෙමි; (බුදුන්ම සිහිකෙරෙමියි සේයි)දදෙයනු දදාති යන ධාතුහට වර්තමාන ආත්මනෙ පදයෙහි උත්තමපුරුෂ ඒකවචනයි) අහං, මම; බුද්ධා,

---

* සාමිතෙමේ ක්‍රියාසම්බන්ධයක් නැතිහෙයින් කාරක නොවේ—

† (ධාරො ආධාරොයයි සමහරපොත්වල පැනේ—'ධාරකම්මා ධාරඃ, කියා සංස්කෘත ව්‍යාකරණයන්හි පැනෙනහෙයින් මෙහිද ධාරො යනු උචිතයයි සැලකියයුතු)—

‡ සර්වාදයොහි වක්ෂ්‍යමාණෙන සම්බන්ධඃනෙන යනුබැවින් සර්වනාම යොමතුකියනදෙයක්හා සම්බන්ධකරණු ලැබෙති එහෙයින් යොය යි පදන්නා පෙක්ෂාවෙන්පුලිංගවූව මතුකියන ලබන තං යනු කාර කාපෙක්ෂායෙන් නපුංසකලිංගව්—

සබ්බඤ්ඤුතා කෙරෙන්; අච්චුතං පදං, නිර්වාණපදය; ලභෙය්‍යං, ලබමි; (ලභෙය්‍යං අච්චුතං යී තුබූතැන තාසාහං යනාදියෙහි මෙන් නිග්‍රහීතය හටද පූර්වස්වරයා හටද ලොප්කොට පරය හට දීර්ඝකළ කල්හි ලභෙයත) චඤ්ඤුතං යනු වේ-(සිහිකළමාත්‍රයකින් නිවන් ලැබේද යත්) බුද්ධස්ස, සර්වඥයාගේ; ඉද්ධි, සෘද්ධිය තොමෝ; කිං, කුමක්; නකරෙ, නොකරන්නීද (හැමම කෙරෙයි සේයි—එහෙයින්) මම, මාගේ; භත්ති, භක්තිතොමෝ; භව භවෙ, ජන්ම ජන්මයෙහි; බුද්ධෙ, සර්වඥයා කෙරෙහි; අත්ථු, වේවා—(වීප්සාර්ථය කිවමනාකල්හි භවෙ යන සප්තම්‍යන්තය හට යදෑදින්, ද්විත්වකොට භවෙ භවෙ කිවමනාතන්හි වෘත්තිභෙදය පිණිස අකාරලෝපය. යනාදියෙහි මෙන් පූර්වකාරය හට අකාරයෙක්කොට භව භවෙයි කියනලදී*-

ඉතොපරං, මෙයින්මතු; තතියාපඤ්චමීනංච, තෘතියා පඤ්චමීන්ගේද, චතුත්ථි ඡට්ඨීනංච, චතුර්ථීෂෂ්ඨීන්ගේද; සරූපත්තා, සමානස්වරූපබැවින්; පඤ්චමීඡට්ඨියෝ, පඤ්චමීෂෂ්ඨීදෙදෙන; භියො, බොහෝසේ; උපෙක්ඛන්තො, උපෙක්ෂා කරණුලැබෙත්—(තෘතියා පචමීන්ද චතුර්ථී ෂෂ්ඨීන්ද එක්වැ නිහෙයින් පචමී ෂෂ්ඨී දෙදෙන සමහරතැනෙක්හි නොකියනු ලැබෙති තෘතියා චතුර්ථී දෙදෙනාමෙන් දතයුත්තාහයි සේයි)—

අත්තායි, අත්ත ශබ්දයා කෙරෙන් සි වේ—

බ්‍රහ්මත්ත සඛරජාදිතො—යනු, එව, වැටේ—

සත—ම්ප—සතය, වය, යනු පදයි—

බ්‍රහ්මා† දිතො, බ්‍රහ්මාදීන් කෙරෙන්(පරවූ;) සිස්ස, සිහට; ආ හොති, ආ වෙයි; අත්තා යනු වේ—

"යොනමානො" ඉති, යොනමානො යන සූත්‍රයෙන්; බ්‍රහ්මාදිතො, බ්‍රහ්මාදීන්කෙරෙන් (පරවූ;)යොනං, යොවිභක්තීන්ට; ආනො න්තං, ආනො යන ආදෙශ වේ—(ආනොයි නොකියා ආනොන්තං යී භාව නිර්දේශයතෙමේ ආදෙශය අකාරාන්තනොවෙයි ඔකාරාන්තමයයි හභවනපිණිසයි—මත්තෙහිද භාවයෙන්හා කාරප්‍රත්‍යයෙන්හා දක්වූතැන් මෙසේම දතයුතුයි)—අත්තානො, යි වේ—(හෙ)අත්ත යී ගලොපවූතැනයි—"අකාරපිතාද්‍යන්තානමා,, යී ආකාරයෙක් වේ—අත්තා, යනු වේ—යො, යො ඉවි—අත්තානො, යනු වේ—

---

*බුදුන් සිහිකරන්නාහට බුද්ධ තෙමේ සුවදෙයි යනු සර්වඥයා සිහිකරන්නාහට සුවදෙයිසේයි-මධ්‍යමපුරුෂ කළමනාතැන ප්‍රථමපුරුෂප්‍රයොගයකළමනාහෙයින් මෙපුරුෂව්‍යත්තිනම් අලංකාර යයිදන්න මේඅලංකාරයද වක්‍රොක්තිජීවිත නම් කාව්‍යලක්ෂණයෙහි පැනේ-

† ආදිශබ්දයෙන් චන්‍දිමා යුවා සා මා පූමා යනාදිදන්න සානම් සූනඛයි—

බ්‍රහ්ම—පෙ—"බ්‍රහ්මත්තසඛරාජාදිතොඅමානං" *යනසූත්‍රයෙන් බ්‍රහ්මාදිතො, බ්‍රහ්මශබ්දාදීන්කෙරෙන් (පරවූ;) අංවචනස්ස, අංහට; ආනං, ආනං යන ආදෙශයතෙමේ; වා, විකල්පයෙන් හොති, වේ—

අත්තානං, අත්තං, යනු බුද්ධං යනු සේයි—අත්තානො සී වේ—අත්තෙන, අත්තනා, යනු වේ—පක්ඛෙ, එක්තැනෙක්හි; ජිනවචනානුරොධෙන, පෙළට අනුව පැවැත්මෙන්; එනාභාවො, එන යනාදෙශ නොවීමයි—(අතොනෙන, යනසූත්‍රයෙන් විකල්පනැත ජිනවචනයුත්තංහි, යනු වැටෙනහෙයින් නොවෙයි සේයි)

අත්තා—පෙ-"අත්තානොතාහිස්මිමනත්තං" යන සූත්‍රයෙන්; හිම්හි, හිවිභත්ති පරකල්හි; අත්තනත්තස්ස, අත්තශබ්දයාගේ අන්තයහට; අනො, අනයනාදෙශ වේ-"සුහිස්වකාරොඑ,, යි එ වේ-අත්තනෙහි, අත්තනෙහි, වේ—කරණෙ, කරණකාරකයෙහි; එවං, මෙසේමැයි-

සස්සනො—පෙ—සස්සනො යන සූත්‍රයෙන්; නොකාරො, නොයන ආදෙශවේ-අත්තනො, යනුවේ-(බහුවචනයෙහි)අත්තානං, යනුවේ.

අම්හ—පෙ—අම්හ තුම්හ නන්තු රාජ බ්‍රහ්ම ත්ත සඛ සත්ථු පිතාදිහිය, ස්මාය, නාය, ඉවය, යනු පදයි—

අම්හාදිතො, අම්හාදින් කෙරෙන් (පරවූ;) ස්මා, ස්මා තොමෝ; නාඉව, නාමෙන්; හොති, වේ—(රූපයෙන් නා වැනිවෙයි සේයි-මෙතන ස්මාහට නා යනු ආදෙශය ගුණවතා යනාදිතන්හි ස්මාතොමෝලබනකාර්‍ය්‍යයෙන් නා වැනිවෙයි—එහෙයින් තොහිතා යනාදිසූත්‍රයෙන් ස්මා හට නා වෙයි)—අත්තනා, යී වේ—

තතො—පෙ—"තතොස්මිත්ති,, යන සූත්‍රයෙන්; ස්මිනො, ස්මිංහට; නි, නිවේ—අත්තනි, යී වේ—

අනත්තංඉති, අනත්තං යී †භාවනිද්දෙසෙන; භාවයෙන්දැක්වූහෙයින්; සුම්හිච, සුපරකල්හිදු; අනො, අන වේ—අත්තනෙසු, යනුවේ-

රාජා, රාජශබ්දයතෙමේ; අත්තාව, අත්තශබ්දය වැන්න—(වෙනස කියනු ලැබේ)—නා, නා වේ—

සවිභත්තිස්ස යනුද, රාජස්ස යනුද, එව, වැටේ—

නාම්හි—පෙ—නාම්හිය, රඤ්ඤය, වාය, යනු පදයි—

නාම්හි, නාපරකල්හි, සවිභත්තිස්ස, විභත්තිසහිතවූ; රාජසද්දස්ස. රාජශබ්දය හට; රඤ්ඤා, රඤ්ඤා යන ආදෙශය; වා හොති, විකල්පයෙන් වේ—රඤ්ඤා, රාජෙන, යී වේ—

---

* ආනං යයි අක්ඛරෙහිකාරං. යනුමෙන් නපුංසක නිද්දේශනොවෙයි නියාමිතනත්තමවූ ආදෙශයකි මෙසේම මත්තෙහිදු දතයුතුයි.

† සද්ධිකා අත්ථාධිකොහොති යනු බැවින් අත්තානො හිස්මිමනො යිම නො කියා අනත්තං යී අක්ෂරාධික්‍යයෙන්දැක්වූ හෙයින් අර්ථාධික්‍යයෙන් හැගෙනුයි සු පරකල්හිදු අනත්තං වෙයි සේයි—

රාජස්ස—පෙ—රාජස්සය, රාජුය, සුනංහිසුය, චය, යනු පදයි—

සුනංහිසු, සුය, නංය, හිය (යනමොවුන්;) පරෙසු. පරකල්හි; රාජස්ස, රාජශබ්දය හට; රාජු හොති, රාජු යන ආදෙශය වේ—චකාරෙන, චග්‍රහණයෙන්; ක්වචි, සමහරතැනෙක්හි; න, නො වේ—

සුනංහිසුවෙති, "සුනංහිසුච,, යන සූත්‍රයෙන්; දීඝෙ, දීඝකළ කල්හි; රාජූහි, රාජූභි, රාජේහි, රාජේභි, වේ*—

රාජූහි වේ—(මෙසෙයින් මතුසුබොධතැන්'තියනු නොලැබේ)—

සවිභත්තිස්ස යනු, අධිකාරො (රාජශබ්දයට වන සියලු විධියෙහි වැටේ)—

රාජ—පෙ—"රාජස්ස රඤ්ඤො රාජිනො සෙ" යී සෙ, සවිභත්තිපර කල්හි; (විභත්ති සහිතවූ රාජශබ්දයහට) රඤ්ඤො, රාජිනො, රඤ්ඤොය රාජිනොය (යන) ආදෙශයෝ; හොන්ති, වෙත්—රඤ්ඤො, රාජිනො, යනු වේ—

රඤ්ඤං—පෙ—"රඤ්ඤංනම්හි වා" යන සූත්‍රයෙන්; නම්හි, නං විභත්ති පරකල්හි; රඤ්ඤං, රඤ්ඤං යන ආදෙශයතෙමේ; වා විකල්පයෙන් වේ-රඤ්ඤං, රාජූනං, රාජානං, යනු වේ—ස්මාස්ස, ස්මාවිභත්ති තමා; නාතුල්‍යත්තා, නාවිභත්තිය සමානහෙයින්; නාම්හි, නාවිභත්ති පරකල්හි; රඤ්ඤා, රඤ්ඤා යන ආදෙශය; වා, විකල්පයෙන්වේ—රඤ්ඤා, රාජස්මා, යනු වේ—

ස්මිං—පෙ—"ස්මිම්හි රඤ්ඤෙ රාජිනි" යී ස්මිම්හි, ස්මිං විභත්තිපර කල්හි; රඤ්ඤෙ රාජිනි, රඤ්ඤෙය රාජිනිය යන ආදෙශයෝ; හොන්ති, වෙත්-රඤ්ඤෙ, රාජිනි, රාජූසු, රාජෙසු, යනු වේ—

ගුණවන්තුසි—ගුණවන්තු ශබ්දයා කෙරෙන් සි වේ—

සවිභත්තිස්ස යනුද න්තුස්ස යනුද එව වැටේ—

ආ—පෙ—"ආසිම්හි" යී සිම්හි, සිවිභත්ති පරකල්හි; සවිභත්තිස්ස, විභත්තිසහිතවූ; න්තුස්ස, න්තු යන ශබ්දයහට; ආ, ආ වේ—ගුණවා, යනු වේ—

යොම්හි යනුද, පඨමෙ යනුද, එව, වැටේ—

න්තු—පෙ—න්තුස්සය, න්තොය, යනු පදයි—

පඨමෙ යොම්හි, පළමුවන යො පරකල්හි; සවිභත්තිස්ස, විභත්ති සහිතවූ; න්තුස්ස, න්තුයන ශබ්දය හට; න්තොකාරො හොති, න්තොයන ආදෙශ වේ—ගුණවන්තො, යනු වේ—

සුනංහිසු අත්තං ඉති, අත්තං යනු—එව, වැටේ—

---

* (හිහට භිවූතැන 'සුබොධහෙයින්—නොදක්වූයෙ මත්තෙහිද මෙසේමැයි—තදාදෙසස්සාවත් යනු බැවින් හිහටආදෙශද හි වැනි බැවින් සුනංහිසු චයී දීඝවේ)

න්තු—පෙ—න්තුස්සය. න්තෝය. යොසුය. චය. යනු පදයි—

සුත්‍රාංගිසු යොසු. සුය නාය තිය යොය යනාමොවුන් පරකල්හි; ච කාරෙන, චග්‍රහණයෙන්; අඤ්ඤසුප් පරෙසු,සෙස්සන්පරකල්හිද; න්තුස්ස. න්තුහුගේ; අන්තො, අන්තා තෙමේ; අත්තං, අකාරබවට; යාති, පැමිනේ—ගුණවන්තා, යනු වේ—

සවිභත්තිස්ස ඉති, සවිභත්තිස්ස යනු, අධිකාරො, මතුසූත්‍රහා ස ම්බන්ධයි—

අං ඉති, අං යනු; එව, වැටේ—

අව—පෙ—* අවණ්ණාය, චය, ගෙය, යනු පදයි—

ගෙ පරෙ, ගසංඥයා පරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; න්තුස්ස, න්තුහට; අං, අ, ආ, අංය අය ආය (යනාමෝහු;) හොන්ති, වෙත්—(න්තුස්සන්තො යොසුච, යනසූත්‍රයෙහි චග්‍රහණයෙන් අ වෝ)—(හෙ) ගුණවං, ගුණව, ගුණවා, යනු වේ—යො, යො වේ—ගුණවන්තො, ගුණවන්තා, යනු වේ—අත්තං, අතවේ—ගුණවන්තං ගුණවන්තෙ, යනු වේ—

තොති—පෙ—"තො ති තා සස්මිංනාසු,, යන සූත්‍රයෙන්; සවිභත්ති ස්ස, විභක්තිසහිතවූ; න්තුස්ස, න්තුහට; නාම්හි, නාපරකල්හි; තා, තා වෙයි; සෙ, සවිභක්තිපරකල්හි; තොකාරො, තො වෙයි; ස්මිම්හි, ස්මිං පරකල්හි; තිච, ති යනාදෙශද; වා, විකල්පයෙන් වේ—ගුණ වතා, ගුණවන්තෙන, ගුණවන්තෙහි, ගුණවන්තෙභි, යනු වේ—ගු ණවතො, ගුණවන්තස්ස, යනු වේ—

නම්හි—පෙ—"නම්හිතංවා,, යී, නම්හි, නං පරකල්හි; න්තුස්ස,(විභ ක්තිසහිතවූ) න්තුහට; තං, තං යනා දෙශ; වා, විකල්පයෙන් වේ—ගුණවතං, ගුණවන්තානං, යනු වේ—ස්මා, ස්මාතෙමේ; නාඉව, අ ම්හාදි සූත්‍රයෙන් නා වැනි වෙයි—ගුණවති, ගුණවන්තෙ, ගුණව න්තම්හි, ගුණවන්තස්මිං, ගුණවන්තෙසු, යනු වේ—

ගච්ඡන්ත සි—ගච්ඡන්ත ශබ්දයා කෙරෙන් සි වේ—

සිම්හි—පෙ—"සිම්හිගච්ඡන්තාදීනං න්තසද්දෝ අං" යී න්තසද්දස්ස, න්තයන ශබ්දය හට අං, අං තෙමේ; වා, විකල්පයෙන් වේ—සිලො පෙ, "සෙසතො ලොපං ගසිපි" යී සිහට ලොප් කළකල්හි—ගච්ඡං, යනු වේ—

---

* වණ්ණග්‍රහණයෙන්ම හ්‍රස්ව දීඝයන් ගැනෙන බැවින් අවණ්ණා යී එකවචන නිර්දේශයෙන්ම අකාර ආකාරදෙදෙන ගැණෙත්—අ වණ්ණායී බහුවචන නිර්දේශය කුමටය යත් "ජාත්‍යපෙක්ඛාය මෙ තස්මිං බහුවචන මන්‍යතරස්‍ස,, යනවචන බැවින්ජාතියක් කිවම නාකල්හි එකවචනද බහුවචනද වෙයි මෙහි අවණ්ණ ජාතිය විවක්ෂි තහෙයින් බහුවචනද ගැනේ—

සිඝස, සිහට; ඞ, "ඝො" යන සූත්‍රයෙන් ඞකාරයෙක් වේ—ගච්ඡ නෙතා, යි වේ—

ගච්ඡන්තාදීනං න්තසද්දො ඉති—න්ත සද්දො යනු; එව, වැටේ—

සෙසෙසු—පෙ—සෙසෙසුය, න්තුය, ඉවය, යනු පදයි—

වුත්තං, කියන ලද (සිවිභත්තිය;) හිත්වා, හැර; සෙසෙසු, සෙසු (විභයෙහි) ගච්ඡන්තාදීනං, ගච්ඡන්ත ශබ්දාදීන්ගේ; න්තසද්දො, න්ත ශබ්දයතෙමේ; න්තු ඉව, න්තු ප්‍රත්‍යයා මෙන්; දට්ඨබ්බො, දැක්කයුත්තේයි—("න්තුස්සන්තො යොසුච" යනාදීන් විභක්තිසහිතවූ න්තුශබ්දයහට න්තො යනාදිය වෙයි)—ගච්ඡන්තො, ගච්ඡන්තා ඉච්චාදි, ගච්ඡන්තො, ගච්ඡන්තා, යනාදිය වේ—සෙසං, සෙසස; ගුණවන්තුසමං, ගුණවන්තු ශබ්දයා හා සමයි—ගච්ඡන්තාදයො නාම, ගච්ඡන්තාදීහුනම්, අන්තප්පච්චයන්තා, "වත්තමානෙ මානන්තා" යි අන්තා ප්‍රත්‍යයා අන්තකොට ඇත්තෝයි—(එහෙයින් තප්‍රත්‍යයාන්තවූ සන්තො දන්තො යනාදිහු නොගතයුත්තෝයි)—අග්ගි—පෙ—

අග්ගි ශබ්දයා කෙරෙන් සිවිභක්ති හට; "සෙසතො ලොපං" යි, ලොප්වේ—

ඉව—පෙ—"ඉවණ්ණු වණ්ණ ජ්ඣලා" යි, ඉවණ්ණු වණ්ණානං, ඉවණ් උවණ් දෙදෙනා හට; යථා සංඛ්‍යං, පිළිවෙළින්; ඣල සඤ්ඤා, ඣසංඥය ලසංඥය යන දෙදෙන වෙත්—

ඣලතො වා ඉති, ඣලතො වා යනු; එව, වැටේ—

සප—පෙ—සපතොය, චය, යොනංය, ලොපොය, යනු පදයි—

ස ප ඣ ල තො, සසංඥය පසංඥය ඣසංඥය ලසංඥය යන මොවුන් කෙරෙන් පරවූ; යොනං, යොනට; ලොපො, ලොපතෙමේ; වා, විකල්පයෙන්; හොති, වේ—

යොසු—පෙ—යොසුය, කතනිකාරලොපෙසුය, දීඝංය, යනු පදයි.

කතො, කරණලද; නිකාරො, නියනාදෙශද; ලොපොච, ලොප්ද; යෙසං, යම්කෙනෙකුන්ටද; තෙසු යොසු, ඒ යොවිභක්තීන් පරකල්හි; සරානං, ස්වරයන්ට; දීඝො හොති, දිඝිවේ—අග්ගි, යනු වේ-පක්ඛ, තුවූ පක්ෂයෙහි—

අත්තං ඉති, අත්තං යනු; එව, වැටේ—

යොසු—පෙ—යොසුය, අකතරස්සාය, ඣෙය, යනු පදයි—

යොසු, යොවිභක්තීන් පරකල්හි; අකතරස්සා, හ්‍රස්ව නොකරණලද; ඣෙ, ඣසංඥතෙමේ; අත්තං, අකාරබවට; යාති, යේ; අග්ගයො, යනු වේ—

ආලපනෙ, ආලපන යෙහිදු; තථා, එසේමැයි—(ප්‍රථමා සේමැයි-සේයි)—

අම්මො—පෙ—අම්මොය, නිග්ගහීතංය, ඣලපෙහිය, යන්නු පදයි*-
ඣලපතො, ඣසංඥ ලසංඥ පසංඥය යනමොවුන් කෙරෙන්පරවූ; අං, අං ද; මොච, මකාරද; බින්දුං, නිග්ගහීතබවට; යනාති, යෙත්—අග්ගිං, අග්ගි, අග්ගයො, වේ—අග්ගිනා, යි වේ—දිසෙ, "සුනං හිසුච" යි, දීඝකළ කල්හි—අග්ගීහි, අග්ගිහි, යනු වේ—

ඣලතො—පෙ—"ඣලතො සස්ස නොවා" යනසූත්‍රයෙන්; සස්ස, සවිභක්ති හට; නොත්තං, නොබව; වා, විකල්පයෙන් වේ—අග්ගිනො, අග්ගිස්ස, අග්ගිනං, යනු වේ—

ඣල—පෙ—"ඣලතො ච" යන; සූත්‍රයෙන්; ස්මාස්ස, ස්මාහට; නා, නා වේ—අග්ගිනා වේ—අග්ගිම්හි, අග්ගිස්මිං, අග්ගිසු, යනු වේ—

ආදි, ආදිශබ්දය තෙමේ; අග්ගිව. අග්ගි ශබ්දයා මෙනි—ස්මිනො පත, ස්මිංහට වනාහි—

ආදි—පෙ—"ආදිතො ඔච" යන සූත්‍රයෙන්—අං, අංද; ඔච, ඔකාරද; වා, විකල්පයෙන් වේ—ආදිං, ආදො, ආදිම්හි, ආදිස්මිං, ආදිසු, ආදීසු, වේ—

දණ්ඩි සි, දණ්ඩී ශබ්දයා කෙරෙන්; සි වේ—

අඝො—පෙ—"අඝොරස්සමෙකවචනයොස්වපිච" යන සූත්‍රයෙන්; රස්ස, හ්‍රස්ව; සම්පත්තො, පැමිනිකල්හි—

නසි-පෙ—"නසිස්මිමනපුංසකානි" ති, නසිස්මිං යනාදි සූත්‍රයෙන් සිමහි, සිපරකල්හි; අනපුංසකානං, පුල්ලිංග ස්ත්‍රීලිංගශබ්දයන්ට; රස්සා, හ්‍රස්ව; න, නොවේ—

සිලොපො "සෙසතො ලොපං" යි, සිහට ලොප් වේ—දණ්ඩී, යනුවේ.

යොලොපො "ඝපතොච යොනං ලොපො" යි, යොහට ලොප් වේ—දණ්ඩී, යනු වේ—පක්ඛෙ, පක්ෂයෙහි—

අඝො—පෙ—අඝොය, රස්සංය, එකවචනයොසුය, අපිය, චය, යනු පදයි—

එකවචන, එකවචනද; යොසු, යොවිභක්තීන් පරකල්හි; ඣලපා, ඣසංඥ ලසංඥ පසංඥ යන මොහු; රස්සං, හ්‍රස්වයට; යනාති, යෙත්—

ඣතො කතරස්සා ඉති, ඣතො කතරස්සා යනු; එව, වැටේ—

යොනං—පෙ—යොනංය, නොය, යනු පදයි—

කතරස්සා, කරණලද හ්‍රස්ව ඇති; ඣතො, ඣසංඥයා කෙරෙන් පරවූ; යොනං, යොනට; නොත්තං, නොයනා දෙශ බව; හොති, වේ—දණ්ඩිනො, යනු වේ—

ඣලපා—පෙ—"ඣලපා රස්සං" යි—ගෙ පරෙ, ග පරකල්හි; ඣල පානං, ඣසංඥ ලසංඥ පසංඥ යනමොවුන්ට; රස්සො, හ්‍රස්ව වේ—(හෙ) දණ්ඩි, දණ්ඩී, දණ්ඩිනො, යනු වේ—

---

* (අම්මො-පෙ-අංය මොය නිග්ගහීතංය ඣලපෙහියයි පදසතර වද බෙදනුහැකි)—

වා අං ඉති, වා අං යනු, එව, මතු සූත්‍රයෙහි වැටේ—

නං ඣතො—පෙ—"නං ඣතො කතරස්සා" යි අං ඉති, අං යනා; අස්ස, මෝහට; නං, නං තෙම; වා, විකල්පයෙන් වේ—දණ්ඩිනං, දණ්ඩිං, දණ්ඩී, දණ්ඩිනො වේ—දණ්ඩිනා, දණ්ඩිහි, දණ්ඩිහි වේ—දණ්ඩිනො, දණ්ඩිස්ස, දණ්ඩීනං, යනුද වේ—

ඣතො කතරස්සා ඉති, ඣතො කතරස්සා යනු; එව, මතු සූත්‍රයෙහි වැටේ—සම්හනි ඉති "සම්හනී" යි සම්හනො, සම්ං හට; නි, නි වේ—දණ්ඩිනි, දණ්ඩීසු, යනු වේ—

භික්ඛු සි ලොපො, භික්ඛුශබ්දයා කෙරෙන් පරවූ සි හට ලොප් වේ—

වා යො නං ඉති, වා යොනං යනු, එව, වැටේ—

ලතොං—පෙ—"ලතො වො කාරොච" යි; ලතො, ලසංඥයා කෙරෙන් පිරවූ; යොනං, යො නට; වා, විකල්පයෙන්; වොත්තං, වො යනාදෙශබව වේ—

අත්තං අකතරස්සා ඉති, අත්තං අකතරස්සා යනු; එව, මතු සූත්‍රයෙහි වැටේ—

වෙ වො—පෙ—වෙවො සුය, ලොය, චය, යනු පදයි—

වෙවොසු, වෙ වො යන මොවුන් පරකල්හි; අකතරස්සා, නො කරණලද හ්‍රස්වඇති; ලො, ලසංඥතෙම, අත්තං යාති, අකාරබවට යේ—භික්ඛවෙ, යනු වේ—පසෙඛ, පසෙක්ඛි; යොලොපදීසා, "සපතොච යොනං ලොපො" යි, යො හට ලොප්ද "යොසු කතනිකාරලොපෙසුදීඝං" යි, දීඝද යන මොහු වෙත්—භික්ඛු—(හෙ) භික්ඛු යනු වේ—

අකත—පෙ—"අකතරස්සා ලතො ය්වාලපනස්ස වෙ වො" යි, ආලපනෙ, ආලපනයෙහිවූ; යොස්ස, යොහට; වෙවො කාරා, වෙය වොය යන මොහු වෙත්—

අත්තං "වෙවොසුලො" යි, අ වේ—භික්ඛවෙ, භික්ඛවො, භික්ඛු වේ—භික්ඛුං, භික්ඛවො, භික්ඛූ, යනුද වේ—සෙසං, සෙසු (තෘතීයාදිය;) අග්ගි ඉව, අග්ගිශබ්දයාමෙනි—

එවං, මෙසේ; (භික්ඛු ශබ්දයා මෙන්) ජන්තු යනාදි වේ—

ලතො—පෙ—"ලතො වොකාරො ච" යන, ඉහ, මේ සූත්‍රයෙහි; කාරග්ගහණෙන, කාරග්‍රහණයෙන්; යොනං, යොනට; නොත්තං නොයනාදෙශබවද—චකාරෙන, මෙහිම චග්‍රහණයෙන්; කච්, කිසිතැනෙක්හි; වොනොනං, වොය නොය යන දෙදෙනාගේ; අභාවොච, නොවිමම; විසෙසො, වෙනසයි—ජන්තුනො යි; නො අදෙශවූ තැනය, ජන්තුයො යි වොද නොද නුවූ තැනයි—

සත්ථුසි, සත්ථුශබ්දයාකෙරෙන් සි වේ—

සත්ථු—පෙ—“සත්ථුපිතාදීනමා සිස්මිං සිලොපොච” යී, සත්ථාදී නන්තස්ස, සත්ථුආදීන්ගේ අන්තයහට; ආ, ආ වේ—සිලොපොච, සිහට ලොප්ද වේ—සත්ථා, යනු වේ—

සත්ථුපිතාදී නං ඉති, සත්ථුපිතාදීනං යනු; අධිකාරො, මතුසූත්‍රහා සම්බන්ධ වේ—

අඤ්ඤෙසු—පෙ—අඤ්ඤෙසුය, ආරත්තංය, යනු පදයි—

සිතො, සිවිභක්තියෙන්; අඤ්ඤෙසු, සෙසසන් පරකල්හි; සත්ථාදීනන්තස්ස, සත්ථුශබ්දාදීන්ගේ අන්තය හට; ආරො, ආරතෙම, හොති, වේ—

තතො—පෙ—තතොය, යොනංය, ඔය, තුය, යනු පදයි—

තතො ආරතො, ඒ ආරයනාදෙශයාකෙරෙන් පරවූ; යොනං, යො නට; ඔ හොති, ඔ වේ—(තුග්‍රහණයේ ප්‍රයොජනමතු පැනේ)—සත්ථාරො, යනු වේ—(හෙ) සත්ථ සත්ථා යන තන්හි “අකාරපිතාදීනන්තානමා” යන සූත්‍රයෙන් ආ වේ—

සත්ථාරො—සත්ථාරං, සත්ථාරෙ, සත්ථාරො, යනුද වේ—

“නා ආ” ඉති, නා ආ යි, ආරතො, ආරයනාදෙශයාකෙරෙන් පරවූ; නාස්ස, නාහට; ආ, ආ වේ—සත්ථාරා, සත්ථාරෙහි, සත්ථාරෙභි, යනුවේ—

උස—පෙ—උසස්මිංය, සලොපොය, චය, යනු පදයි—

සෙ, ස පරකල්හි; සත්ථාද්‍යන්තස්ස, සත්ථාදීන්ගේ අන්තයහට; උ හොති, උ වෙයි; සලොපොච, සකාරයා හට ලොප්දෑ වා, විකල්පයෙන් වේ—සත්ථු, සත්ථුනො, සත්ථුස්ස, යනු වේ—

“වානම්හි” ති, වානම්හි යන සූත්‍රයෙන්; නම්හි, නං පරකල්හි ආරො, ආරතෙම; වා, විකල්පයෙන් වේ—සත්ථාරානං, යනු වේ—

සත්ථු—පෙ—“සත්ථුනාත්තච” යී, නම්හි, නං පරකල්හි; සත්ථාදීනන්තස්ස, සත්ථුශබ්දාදීන්ගේ අන්තයහට; වා, විකල්පයෙන්; අත්තං, අත්වවේ—“දීඝො, සුනංහිසුච” යි, දීඝ වේ—සත්ථානං, යනු වේ—

තතො—පෙ—“තතොස්මිමී” යී, ආරතො, ආරයනා දෙශයා කෙරෙන්; ස්මිනො, ස්මිං හට; ඉ, ඉ වේ—

ආරො—පෙ—“ආරො රස්සමිකාරෙ” යි, ඉම්හි, ඉ පරකල්හි; ආරස්ස, ආරයනාදෙශයා හට; රස්සො, හ්‍රස්ව වේ—සත්ථරි, සත්ථාරෙසු, යනුවේ—නත්තාදී, නත්තුශබ්දාදී ශබ්ද ගණයෝ; එවං, මෙසේම; යි පිතා, පිතුශබ්දයතෙම; සත්ථු ඉව, සත්ථු ශබ්දයා වැනි—

පිතා—පෙ—“පිතාදීනමසිම්හි” යි, සිතො, සිවිභක්ති කෙරෙන්; අඤ්ඤෙසු, සෙසසන් පරකල්හි; ආරස්ස, ආරයනා දෙශයාහට; රස්සාව, හ්‍රස්වතෙමේම; විසෙසො, වෙනසි—පිතරො, යනු වේ—

(ආදිශබ්දයෙන් කත්තු ගන්තු යනාදිවූ ශබ්දයෝද “සබ්බතො නවු ත්වා” විවායි, කළ තුප්‍රත්‍යයද ගැණෙත්)—

නාම්හි, නාංපරකල්හි; පිතුනාන්හිපි, පිතූනං සිද්ධ හොති, වේ—නාතු ප්පභුතයො නාතුශබ්දාදීහු: එවං, මෙසේමැයි*—

(අභිභූ, අභිභූශබ්දයා කෙරෙන් සිහට "සෙසාදින්,, ලොප් වෙයි)- අභිභූ සි වේ—රස්සො, "අඝො රස්ස මෙකවචනයොස්වපිච,, යි, හ්‍රස්වවේ— අභිභුවො, යනු වේ—

යො ලොපෙ "ස පතො ච යොනං ලොපො,, යි, යො හට ලොප් කළකල්හි, අභිභූ යනු වේ—සෙසං, සෙස්ස; භික්ඛු ඉව, භික්ඛුශබ්දයාමෙනි; රස්සොච "අඝොරස්සමෙකවචනයොස්වපිච,, යි, හ්‍රස්වයම, විසෙසො, වෙනසයි—සබ්බඤ්ඤූ, සබ්බඤ්ඤූ යනුද; එවං, මෙසේමැයි—පුබ්බෙ ඉව, පෙරකී සෙයින්ම-"ලතො වොකාරොච,, යන සූත්‍රයෙහි කාරග්‍රහණයෙන්ම) යොනං, යොනට; නොකාරොච, නොකාරයෙක්ද වේ—සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤූ, යනු වේ—

ගෝ, ගො යනුවේ.

ගාවඉති, ගාවයනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

"යොසුච,, ඉති, යොසුචයන සූත්‍රයෙන්; ගොසද්දෙකාරස්ස, ගොශබ්දයාගේ ඔකාරයහට; ආවො, ආව යන ආදෙශ වේ—

තතො—පෙ—"තතො යොනමොතු" යන; ඉහ, මේ සූත්‍රයෙහි; තුසද්දෙන, තු ශබ්දග්‍රහණයෙන්; යොනං, යොවිභක්තීන්ට; ඔ,ඔකාරයෙක් වේ—ගාවො, යනු වේ—ආලපනෙ, ආලපනයෙහිද; තථා, එසේමැයි—

අව—පෙ—අවය, අම්හිය, චය, යනු පදයි—

අම්හි පරෙ, අං පරකල්හි; ගොසද්දෙකාරස්ස, ගො ශබ්දයාගේ ඔකාරය හට; ආව අවා, ආවඅව යන ආදෙශයෝ; හොන්ති, වෙති; චසද්දෙන, චග්‍රහණයෙන්; හිනංවජ්ජිතෙසු, හිය නංය යන දෙදෙනාවර්ජිතකොටඇති; සෙසෙසුපි, සෙස්සන්පරකල්හිදු; (ආව අව යන ආදෙශයෝ වෙත්)—

ආව—පෙ—"ආවස්සුවා" යි, අම්හි, අං පරකල්හී; ආවන්තස්ස, ආවා දෙශයාගේ අන්තයහට; වා, විකල්පයෙන්; උත්තං, උකාරබව වේ— ගාවුං, ගාවං, ගවං, යනු වේ—යො, යො වේ—ගාවො, යනු වේ— ගාවෙන, ගවෙන, ගොහි, ගොහි, යනු, වේ—

"ගාවසෙ" ඉති' ගාවසෙ යන සූත්‍රයෙන්; සෙ, සවිභක්තිපරකල්හි; ඔස්ස, ඔකාරයහට; ආවො, ආව වේ—ගාවස්ස, ගවස්ස, යනු වේ.

තතො නාමාදෙ' "තතො නමංපති ම්හාලුත්තෙච සමාසෙ" යන සූත්‍රයෙහි; චකාරෙන, චග්‍රහණයෙන්; නං ඉති, නං යන; අස්ස, මෝහට; අං, අං වෙයි; ඔස්ස, ඔකාරයාහට; අවොච, අවයනාදෙශ දවේ—ගවං, යනු වේ—

---

* පකුතිශබ්දයෙන් ජමාතු ආදීහුයි—

"සුහිනාසුච" 'ඉති, සුහිනාසුචයන; ඉහ, මෙහි; චකාරෙන, චග්‍රහණයෙන්; ගොස්ස, ගොශබ්දයහට; ගුව, ගුයනාදෙශද වේ--
විභත්ති "පරවෙභාවොඨානෙ" යන සූත්‍රයෙන් විභාගකළකල්හි; ගුන්නං, ගොනං, යනාදිය වේ—

පුල්ලිඞ්ගා, පුල්ලිඞ්ගශබ්දයෝ කියන ලදහුයි—

කඤ්ඤා, යනු වේ—සිලොපො, "සෙසතො ලොපංගසිපි" හි සිහට ලොප් වේ—
"ආඝො" 'ඉති, ආඝොයි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙන; ආකාරස්ස, ආකාරයහට; ඝ සඤ්ඤා, ඝසංඥා වේ—යොලොපෙ "ඝපතො චයොනංලොපො" 'හි යොහට ලොප්කළ කල්හි;—කඤ්ඤා, යනු වේ—පක්ඛෙ, පක්ෂෙහි; කඤ්ඤායො, යනු වේ—
"ඝතෙච" ඉති, ඝතෙච යි, ගස්ස, ග හට; එ, එකාරයෙක් වේ—(හෙ) කඤ්ඤෙ, යනාදිය වේ—
ආයඑකවචනස්ස ඉති, ආයඑකවචනස්සයනු; එව, මතු සූත්‍රයෙහි වැටේ—
"ඝතො නාදිනං" ඉති, ඝතො නාදිනංයි, (ඝසංඥයාකෙරෙන් පවූ,) නාවෙකවචනානං; නාදිවූ එකවචනයන්ට; ආයො, ආය වේ—කඤ්ඤාය, කඤ්ඤාහි, යනාදිය වේ*—
ඝප—පෙ—ඝපතොය, ස්මිංය, යංය, වාය, යනු පදයි—
ඝපෙහි, ඝසංඥ පසංඥ දෙදෙනාකෙරෙන් පරවූ; ස්මිනො, ස්මිං හට; වා, විකල්පයෙන්; යං, යං තෙම; හොති, වේ—කඤ්ඤායං, කඤ්ඤාය, කඤ්ඤාසු යනු වේ—
රත්ති, රත්ති ශබ්දයාකෙරෙන්; සිලොපො, සිහට ලොප් වේ—
තෙ—පෙ—"තෙ ඉත්ථිඛ්‍යාපො" යි, ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙන; ඉවණ්ණුවණ්ණානං, ඉවර්ණ උවර්ණ යන දෙදෙනාට; පසඤ්ඤා, පසංඥාවේ—යොලොපදිසා, "ඝපතොචයොනංලොපො" යි, යොලොප්ද; "යොසු කතනිකාරලොපෙසු දීඝං" යි, දීඝද වේ-රත්තී වේ—පක්ඛෙ, පක්ෂෙහි; රත්තියො, යනු වේ—ආලපනෙ, ආලපනයෙහිද; තථා, එසේමය—රත්තිං, රත්ති, රත්තියො, යනුවේ—
එකවචනස්ස නාදිනං ඉති, එකවචනස්ස නාදිනං යනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—
පතො—පෙ—"පතොයා" යි, නාවෙකවචනානං, නාදිවූ එකවචනයන්ට: යා, යා වේ—රත්තියා, යනාදියවේ—
නද්ශබ්දයාකෙරෙන් සි වේ—ඕහට ලොප් වේ—නදී යි වේ—
සෙසං, සෙසුඋදාහරණ; රත්තිව, රත්තිශබ්දයා වැන්න—අඝත්තා, ඝසංඥ නො වනබැවින්; රසොව "අඝොරස්සමෙකවචනයොස්වපි

---

* ස්ත්‍රීලිඞ්ගයෙහිද හි හට භිවනබව දක්වනපිණිස කඤ්ඤාහි කියේ

ච" යි, චන් හ්‍රස්වයම; විසෙසො වෙනසී—යාගු, යාගුශබ්දය; රත්තිඉ ච,රත්තිශබ්දයාවැත්ත—මාතු—පෙ—මාතුය පිතුය දුහිතුය යනාද්වූ ශබ්දයෝ; පිතාඉව, පිතුශබ්දයා මෙනි—මාතා, මාතරො, යනා දිවේ. ජම්බු, ජම්බුශබ්දය; නදී ඉව, නදී ශබ්දයාමෙනි—ජම්බු, ජම්බූ, ජම්බුයො, ය නාදිය වේ—

සත්‍රීවිධිකියනු ලැබේ—

කඤ්ඤ ඉති, කඤ්ඤ කියා; ඨිතෙ, තුබූකල්හි—

ඉත්ථි—පෙ—ඉත්ථියංය, අතොය, ආප්පච්චයොය, යනු පදයි—

ඉත්ථියං, සත්‍රීලිඟුයෙහි; වත්තමානා, වැටෙන්නාවූ; අකාරන්ත තො, අකාරාන්තයාකෙරෙන්; ආප්පච්චයො හොති, ආ ප්‍රත්‍යය වේ—සරලොපපකත්‍යාදි, සවරලොපයප්‍රකෘතිය යනාදියවේ—(සරලො පො යනාදින් සවරලෙප්ද ප්‍රකෘතිද "නයෙපරංයුත්තෙ" යි, පැමි නිමද වේයි සේයි)—කඤ්ඤයි තුබූකල්හි—

ධාතුප්පච්චය—පෙ—චලිංගං යි, ධාතුප්පච්චය විභත්ති, ධාතුන් හා ප්‍රත්‍යයෙන්හා විභක්තින්විසින්; වජ්ජිතං, තොරකරණලද; අ ත්ථවං, අත්ථවත්වූයේ; ලිංගං ඉති, ලිඟුනාමැයි; වචනතො, කීහෙයින් පච්චයන්තස්ස, ප්‍රත්‍යයාන්තයා තම්‍ය; අලිංගත්තා, ලිඟුනොවන බැවි න්; තද්ධිතාදි සුත්තෙ "තද්ධිතසමාස කිතකානාමංවා තවෙතු නාදි සුච" යන සූත්‍රයෙහි; චකාරෙන, චග්‍රහණයෙන්; නාමං ඉව, නා මයමෙන්; කතෙ, කරණලද කල්හි; සාදි, සි ආදි විභක්ති වේ—

ඊ ඉනීසු, ඊය ඉනිය යන ප්‍රත්‍යයන් පරකල්හිදු; එවං, (නම්බදුකි රීම) මෙසේ මැයි—

අජා—පෙ—ඉතිආදි, අජා යන මේ ශබ්දගණයෝද; එවං, කඤ්ඤ ශබ්දයාවැනි—

ඉත්ථියං ඉති, ඉත්ථියං යනු; අධිකාරො, මතුසූත්‍රහා සබ්බ වේ—

නදූ—පෙ—නදූදිතොය, වාය, ඊය, යනු පදයි—

ඉත්ථියං, සත්‍රීලිඟුයෙහි වැටෙන; නදූදිතොවා, නදශබ්දාදින්කෙ රෙන්ද; අනදූදිතොවා, එයින්පිටත් ශබ්දයන්කෙරෙන්ද; ඊ හො ති, ඊ වේ—නදී, නගරී, යනාදිය වේ—

මාතු—පෙ—"මාතුලාදිනමා නත්තමීකාරෙ" යි, ඊමහි, "නදූදි තොවාඊ" යි, ඊ ප්‍රත්‍යය කළකල්හි; මාතුලාදීනන්තස්ස, මාතුලාදින් ගේඅන්තයහට; ආනො, ආන වේ—මාතුලානී ඉති, මාතුලානී යන; ආදී, මේආදිය වේ—

අනදූදිතො, අනදූදින්කෙරෙන්ද; ඊ, ඊප්‍රත්‍යය කියනු ලැබේ—සඛී, හත්ථී, යනු වේ—

භවතො—පෙ—භවතොය, භොතොය, යනුපදයි—

ඊමහි, (අනාදීන් කෙරෙන්) ඊ ප්‍රත්‍යය කළකල්හි; භවනතසස, භවනතශබ්දය හට; හොතො හොති, හොත යන ආදෙශය වේ— හොති, යනුවේ—

ණව—පෙ—"ණව ණික ණෙය්‍ය ණ නතුහි,, සී, ඊ, ඊප්‍රත්‍යය වේ මානවී, නාවිකී, වෙනතෙයියී, ගොතමී, යනු වේ—

නතු—පෙ—"නතුසස තමිකාරෙ" යි, ඊ පරකල්හි; නතුසස, නතුහ ට; වා, විකල්පයෙන්; තො, තකාරවේ—ගුණවති, ගුණවනති, සී වේ (මේ වනතු ප්‍රත්‍යයානතයි—ධිතිමති, ධිතිමනති, සී මනතුප්‍රත්‍යයා නතයි)—

නතසස, නතප්‍රත්‍ය හට; නතු බ්‍යපදෙසො—නතුවත් වේ—(එසෙ යින්) මහති, යන තන්හි, "නතුසස තමිකාරෙ" යි, නතු ප්‍රත්‍යය හ ට තකාරයෙක් වේ—

පති—පෙ—පති භිකඛු රාජිකාරනෙතහිය, ඉනිය, යනු පදයි—

පති ආදිහි, පති ආදීන්කෙරෙන්ද; ඊ කාරනෙතභිච, ඊකාරානතා යන් කෙරෙන්ද; ඉත්‍ථියං, සත්‍රීලිඞ්ගයෙහි; ඉනි හොති, ඉනි ප්‍රත්‍යවේ

පති—පෙ—"පතිසසිනිමහි" යන සූත්‍රයෙන් (ඉනිපරකල්හි;) ප තිඅනතසස, පති ශබ්දයාගේ අනත්‍යයහට; අතෙත, අත්‍වකළ කල්හි; "සරලොපාදෙ" සරලොපාදි සූත්‍රයෙහි; තුකාරෙන, තුශබ්දයෙන්; ලොපාභාවො, ලොප්නොවීමයි—

වාපරෝ—පෙ—"වාපරොඅසරූපායි" ඉලොපො, ඉකාරය හට ලොප්ද;—ඒසොච, පූර්‍වස්වරයහට; "පුබෙබාච" යනසූත්‍රයෙන් ඒකීද වේ—ගහපතානි, යනාදිය වේ—

ඊකාරානතයාකෙරෙන් ඉනී කළකල්හි මෙධාවිනි යනාදිය වේ—(මෙහිමෙධාවිනි යනු වීප්‍රත්‍යයානතය තපසසිනී යි සී ප්‍රත්‍යයානතය යන දෙක තඩිතය, ධම්මචාරිණී යි ණී ප්‍රත්‍යයානතය භයදසසාවි නියි ආවි ප්‍රත්‍යයානතය ගුතතාවිනි යි තාවි ප්‍රත්‍යයානතය මෙතුන කිතකයි)

ඉත්‍ථිලිඞ්ගා, සත්‍රීලිඞ්ගශබ්දයො කියනලදහුයි—

චිතත සි, චිතතශබ්දයාකෙරෙන් පරව සි වේ—

නපුංසකෙහි අතො නිච්චං ඉති, නපුංසකෙහි අතොනිච්චංයනු, එව, මතුසූත්‍රයෙහි වැටේ—

සිං යනු සූත්‍රයි, සිය, අංය, යනුපදයි—

අකාරනෙතහි, අකාරනතවූ; නපුංසකෙහි, නපුංසක ලිඞ්ගශබ්ද යන්කෙරෙන් පරවූ; සිසස, සිහට; නිච්චං, නිත්‍යයෙන්; අං හොති, අංවේ—චිතතං, යනු වේ—

යොනංනි නපුංසකෙහි ඉති, යොනං නි නපුංසකෙහියනු; එව මතුසූත්‍රයෙහි වැටේ—

අතො—පෙ—අතොය, නිච්චංය, යනු පදයි—

අකාරන්තෙහි, අකාරාන්තවූ; නපුංසකෙහි, නපුංසකලිඞ්ග ශබ්දය න් කෙරෙන් පරවූ; යොනං, යො විභක්තීන්ට; නිච්චං, නිත්‍යයෙන්; නි හොති, නි වේ; නිස්ස, නිහට; ආ "සබ්බයොනීනමා එ" යි, ආවේ. චිත්තා, යනු වේ—පක්ඛෙ, පක්ෂයෙහි; යොසඤ්ඤාදිනා, "යොසු කතනි කාර ලොපෙසු දීඝං" යි; දීඝෙ, දීර්ඝකළකල්හි; චිත්තානි, යනු වේ—

ගලොපෙ, ගසංඥහට ලොප්කළ කල්හි—(හෙ) චිත්ත, චිත්තා, යනාදිය වේ—නිස්ස, නිහට; එ "සබ්බයොනීනමා එ" යි, එ වේ—චිත්තෙ, යනාදිය වේ—සෙසං, සෙස්ස; බුද්ධොව, බුද්ධශබ්දයා මෙනි—

මනසි, මනශබ්දයා කෙරෙන් සි වේ—මනං, යනු වේ—

නා, නා වේ—

වා ඉති, වායනු; ඒව, වැටේ—

මනෝ—පෙ—මනොගණාදිතොය, ස්මිංනානංය, ඉය, ආය, යනු පදයි—

මනාදිතො, මනශබ්දාදීන් කෙරෙන් පරවූ; ස්මිනානං, ස්මිංය නාය යන මොවුන්ට; ඉ ආ, ඉය, ආය, යන දෙදෙන; වා, විකල්පයෙන්; හොන්ති, වෙත්—

සස—පෙ—සසරෙය, වාය, ආගමොය, යනු පදයි—*

විභත්‍යාදෙසෙ, විභක්තිය හට ආදෙශවූ; සරෙ පරෙ, ස්වරයක් පරකල්හි; මනාදිතො, මනොගණාදීන් කෙරෙන් පරවූ; සාගමො, සකාරාගම; වා, විකල්පයෙන්; හොති, වේ—මනසා, යනු වේ†—

සස්ස—පෙ—සස්සය, චය, ඕය, යනු පදයි—

මනාදිතො, මනොගණාදීන් කෙරෙන් පරවූ; සස්ස, සහට; ඕ හොති, ඕ වෙයි—චසද්දෙන, චග්‍රහණයෙන්; ස්මාස්ස, ස්මා හට; ආච, ආද වේ—

මනසො—මනසා—යනු වේ—ෂෂ්ඨීද මනසො යි—මනසි, යනු ඉ වූ තැනි—නොවූ තැන මනෙ, යනු වේ—සෙසං, සෙස්ස; චිත්තං ච, චිත්තශබ්දයා මෙනි—(එහෙයින් මනං, මනානි, යනාදිය වේ)—

මනා, මනසය; සිරං, හිසය; උරං, ලයය; තෙජා, තෙදය; රජං,

---

* (කාත්‍යායන සූත්‍රනිර්දේශාදියෙහි මේසූත්‍රය චතුෂ්පදයයි කියන ලදී—එහෙයින්-සය,සරෙය, වාය, ආගමොය, යනුපදයි කියයුතුයි-එසේදවුවත් පොතේ තිබුනසේ යොදනලදී)—

† විකල්පයෙන් ආ නුවූ තැන මනෙන, යනු වේ—

රජ්ජය; ඉජ්ජං, ඉජ්ජවය; වයං, වයසය; පයං, ජලය හෝ කිරිය; යසං කීර්තිය; තපං, තපසය; වචං, වචනය; චෙතං, සිතිවිලිය; එවමාදි, මේආදීහු; මනොගණෙ, මනො ශබ්දාදින්ට අයිතිවූ ශබ්ද සමූහයයි.

ගුණවන්තු සි, ගුණවන්තුශබ්දයා කෙරෙන් සි වේ—

අං—පෙ—"අං නපුංසකෙ" යි, සිම්හි, සි පරකල්හි; සවිභත්තිස්ස, විභත්තිසහිතවූ; න්තුස්ස, න්තුහට; අං, අං වේ—ගුණවං, යනුවේ—න්තුස්ස, න්තු හට; අතෙත "න්තුස්සන්තො යොසුච" යන සූත්‍රයෙහි චග්ගහණයෙන් අත්ත කළ කල්හි—ගුණවන්තානි, යනු වේ—යොනො, යො කෙරෙන්; අඤ්ඤං, සෙස්ස; පුමෙව, පුල්ලිඞ්ග මෙනි--ගච්ඡං, ගච්ඡං යනුද; එවං, මෙසේමැයි—

අට්ඨි යනු වේ—

වා ඉති, වා යනු; එව, වැටේ—

යොන—පෙ—"යොනන්නි නපුංසකෙහි" යි, යොනං, යොනට; වා, විකල්පයෙන්; නි, නි වේ—

අට්ඨීනි, යනු වේ—ඣතො, ඣසංඥ හෙයින්; යොලොපෙ, "ඣප තොච යොනං ලොපො" යි, යො හට ලොප්කළ කල්හි—අට්ඨී, යනු වේ—ආලපනෙ, ආලපනයෙහිද; තථා, එසේමැයි—අට්ඨිං, යනාදිය වේ—සෙසං, සෙස්ස; අග්ගිව, අග්ගිශබ්දයා වැනි—

දණ්ඩිසි, දණ්ඩිශබ්දයා කෙරෙන් සි වේ—අඣතො, ඣසංඥ නොවනබැවින්; රස්සො, "අඝොරස්සමෙකවචනයොස්වපිච" යි, හ්‍රස්ව වේ—දණ්ඩි යනු වේ—යොනො, යො කෙරෙන්; අඤ්ඤං, සෙස්ස, පුමෙව, පුල්ලිඞ්ග මෙනි—ආයු, ආයුශබ්දය තෙම; අට්ඨිව, අට්ඨිශබ්දයා මෙනි—

නපුංසකලිඞ්ගා, නපුංසක ලිඞ්ග ශබ්දයෝ කියන ලදහුයි—

---

ඝට—පෙ—රේණුප්පභුතයො, රේණුශබ්දාදීහුද; ද්විපද චතුප්පද ජාතිවාචිනොච, ද්විපදජාතිවාචීහුද චතුෂ්පද ජාතිවාචීහුද; පුම්ඉත්ථිලිඞ්ගා, පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග වෙත්—යථා, මෙසේයි—ඝටො යි පුල්ලිඞ්ගයි—ඊපච්චයෙ, "නදාදිතොවා ඊ" යි, ඊප්‍රත්‍යය කළ කල්හි; ඝටී, වේ-(ඝටීශබ්දයාගේ රූපභෙදයක් නැද්ද එසො එ සා යනු ලිඞ්ගභෙදය හඟවනු පිණිස තීයේ)—දිප—පෙ—දිපද ජාතිවාචීහු—යථා, මෙසේයි—ඛත්තියො, යි, වේ—ආපච්චයෙ "ඉත්ථියමතො ආපච්චයො" යි, ආප්‍රත්‍යය කළ කල්හි—ඛත්තියා, යනු වේ—(ඛත්තිය ශබ්දය ක්ෂත්‍රිය ජාතිවාචකයි)—සමණෙ යිවේ (සමණශබ්දය ශ්‍රමණ ජාති වාචියි)—ඊම්හි, ඊප්‍රත්‍යය කළකල්හි; සමණී ඉති, සමණී යන; ආදි, මේ ආදිය වේ—චතුප්පද—පෙ—චතුෂ්පදජාතිවාචි ශබ්දයෝ; යථා, මෙසේ

යී—ගජේ, ගජේ යී වේ—ආ, ආප්‍රත්‍යය වේ—ගජා, යනු වේ—ව්‍යග්ඝො, යනු වේ; ඊමහි, ඊප්‍රත්‍යය කළ කල්හි; ව්‍යග්ඝී ඉති, ව්‍යග්ඝී යනා, ආදි, මේ ආදිය වේ—

ධම්ම—පෙ—මධ්වාදයො, මධුශබ්දාදීහු; පුම නපුංසකලිඟා, දෑලිඟු නපුංසකලිඟු ඇත්තාහුයි—(එහෙයින් ධම්මො ධම්මං යනාදිය වේ)—

නගර අච්චිප්පමුඛා, නගර අච්චි යනාමොවුන් ප්‍රමුඛකොටඇති ශබ්දයෝ; ඉත්ථිනපුංසක ලිඟා, ස්ත්‍රී නපුංසක ලිඟුශබ්දයෝයි—

තට—පෙ—කලසාදයො, කලස ශබ්ද ආදීහුද; නාමිකතා, නම් කරණලද ශබ්දයෝද; සබ්බනාමානිච, සබ්බාදීහුද; සබ්බලිඟා, තුන්ලිඟුයෙහිම වෙත්—යථා, මෙසේයි—තටො, යනු වේ—ඊමහි, ඊප්‍රත්‍යය කළ කල්හි; තටී, යනු වේ—තටං ඉති, තටං යනා; ආදි, මේ ආදිය වේ—(තටො, තටී, තටං, යනු එකාර්ථයි)*—

නාමිකතා, නම්කරණලද ශබ්දයෝ; යථා, මෙසේයි—දෙවදත්තා යයි එක්පුරුෂයකුට නමයි—

ආ "ඉත්ථියමතො" යී, ආප්‍රත්‍යය වේ—දෙවදත්තා යී එක්ස්ත්‍රියක්හට නම්—දෙවදත්තං යයි එක්කුලයකට නම්—ඉතිආදි, මේ ආදිය වේ—(ධනවඩ්ඪ සිරිවඩ්ඪ යනාදියද මෙසේයි)—

සබ්බ—පෙ—අම්හඉති, අම්හ යන මොහු; සබ්බනාමානි, සර්වනාමයෝ නම්හුයි—(සබ්බෙසං ඉත්ථිපුමනපුංසකානං නාමානි සබ්බනාමානි—සියලු ස්ත්‍රීපුනපුංසකයන්ගේ නාමයෝ සර්වනාමනම් වෙත්—ස්ත්‍රීපුනපුංසකයන් වාචකහෙයින් සර්වනාමනම් වෙතියි සේයි)†–

සබ්බො, සබ්බශබ්දයතෙම; බුද්ධොච, බුද්ධශබ්දයා මෙනි—අයං, මේ මතුකියන දේ; විසෙසො, වෙනසයි—

යො ඉති, යො යනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

සබ්බ—පෙ—සබ්බනාමකාරතෙය, පඨමොය, යනු පදයි‡—

---

* (පුරශබ්දය ත්‍රිලිඟයයිමෙහිපෙනේ එසේත් පුල්ලිඟයෙහි පුරශබ්දයක්අදෘෂ්ටපූර්වයි-එ පසුව වූ ලිපිදෝෂයයි හඟිමි)—

† ("සබ්බෙසං ඉත්ථිපුමනපුංසකානං නාමානි සබ්බනාමානි" යනුඑසේම පිළිගැණීම නොහැකිවේ-එසේනම් තටශබ්දාදියත් සර්වනාමවියයුතුයි-"බුද්ධිට්ඨානං සබ්බෙසං වාචකානි නාමානි සබ්බනාමානි' බුද්ධිස්ථවූසියල්ලන් වාචකනාමයෝ සර්වනාමයයි සැලකියයුතුයි)—

‡ මේසූත්‍රය මෙසේ විපදවශයෙන් මෙහිපෙනේ—ඒලිපිදෝෂයයි හැඟේ—සබ්බනාමකාරතොය, එය පඨමොයයි ත්‍රිපදවියයුතුයි—

සබ්බාදීනං, සර්වනාමයන්ගේ; අකාරතො, අකාරයා කෙරෙන්; පරො, පරවූ; පඨමො, පළමුවනුවූ; යො, යො තෙම; එත්තං, එකාරබවට; යාති, පැමිණේ—සබ්බෙ යී වේ—

නයො—පෙ—"නයො නෙවච සබ්බනාමෙහි" යි, නිසෙධා, ප්‍රතිසෙධ කළහෙයින්; ස ස්මා ස්මිනානං, සය ස්මාය ස්මිංය යන මොවුන්ට; ආය ආ එ, ආය ආ එ යන මොහු; න හොන්ති, නොවෙත්—සබ්බස්ස, යී වේ—

සබ්බ—පෙ—සබ්බතොය, නංය, සං සානංය, යනු පදයි—

සබ්බාදිතො, සර්වනාමයන්කෙරෙන්; නං ඉති, නංයන; අස්ස, මෝහට; සං සානං, සංය සානංය යන දෙදෙන, හොන්ති, වෙත්—

අකාරෙ එ ඉති, අකාරෙ එ යනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

සබ්බ—පෙ—සබ්බනාමානංය, නම්හිය, චය, යනු පදයි—

නම්හි, නං පරකල්හි; සබ්බාදීනං, සර්වනාමයන්ගේ; අකාරස්ස, අකාරය හට; එ හොති, එ වේ—සබ්බෙසං, සබ්බෙසානං, යනු වේ

ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගවෙහි; ආ, ආප්‍රත්‍යය වේ—සබ්බා, සබ්බා ශබ්දය; කඤ්ඤාව, කඤ්ඤා ශබ්දයා මෙනි—අයං, මේ; විසෙසො, වෙනසයි—

වා ඉති, වායනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

ඝප—පෙ—ඝපතොය, ස්මිං සානංය, සංසාය, යනු පදයි—

ඝපසඤ්ඤතො, ඝසංඥ පසංඥ ඇති; සබ්බාදිතො, සර්වනාමයන් කෙරෙන් පරවූ; ස්මිං සානං, ස්මිංය සය යන දෙදෙනාහට; සං සා, සංය සාය යන ආදෙශයෝ; වා හොන්ති, විකල්පයෙන් වෙත්—

සංසා—පෙ—"සංසාසෙවක වචනෙසුච" යි; සාගමො, සකාරයෙක් ආගම වේ*—

ඝොරස්සං—ඝොය, රස්සංය, යනු පදයි—

එකවචන සංසාසු, එකවචනවූ සංසා යන මොවුන් පරකල්හි—ඝො, ඝසංඥතෙම; රස්සං, හ්‍රස්වබවට; යාති, පැමිණේ—සබ්බස්සා, සබ්බාය, යනාදිය වේ—

නෙතා—පෙ—නෙතාහිය, ස්මිංය, ආයය, යාය, යනු පදයි†—

ඝපසඤ්ඤාහි, ඝසංඥ පසංඥ ඇති; සබ්බාදිහි, සර්වනාමයන් කෙරෙන් පරවූ; ස්මිනො, ස්මිංහට; ආය යා න හොන්ති, ආය යා යන දෙදෙන නොවෙත්—(එහෙයින් ඝසංඥවූව ස්මිං පරකල්හි සබ්බාය, යන රූපය නොවේ)—

නපුංසකෙ, නපුංසකලිඞ්ගවෙහි—සබ්බං, සබ්බානි, යනු වේ—දුති

---

* සංසාසෙවක වචනෙසුච යනු ඝොරස්සං යන්නෙහි වැටෙනබැවි ප්‍රයෝගයෙහි අනුවෘත්ති නොකළෝ—මෙසේවූතැන්මත් තෙහිදු දතයුතුයි—

† (නාය, එතාහිය, තියාත්පදවෙන්කළ හැකිවේ)—

ස්මිනො යී තිවමනාතන්හි ස්මිංයයි ෂෂ්ඨී ලොප්කොට තිබේ—

යා, විතියාවිභත්තියද; එවං, මෙසේමැයි—සබ්බාදයො, සබ්බශබ්දා දිහු; නපුංසකෙ, නපුංසකලිඞ්ගුවෙහි; තතියාදිසු, තෘතියාදීන්පරකල් හි; සකසක, තමතමන්ගේ; පුමසමා, පුල්ලිඞ්ගුසමයෝයි-(එහෙයින් සබ්බෙන, සබ්බෙහි, සබ්බස්ස, සබ්බෙසං, සබ්බසානං, යනාදිවේ)—

යසඤ්ඤනතා, ය ශබ්දයාඅන්තකොටඇත්තාහු; එවං, මෙසේමැයි—(කතරාදි යශබ්දය අන්තකොට ඇත්තාහු සබ්බශබ්දයා වැන්නායි සේයි)—

පුබ්බපරාපරෙහිතු, පුබ්බය පරය අපරය යන මොවුන් කෙරෙන් පරවූ වනාහි; ස්මිනො, ස්මිං විභක්තිහට යද—පෙ—"යඳනුපපන්නා නි පාතනාසිජ්ඣන්ති" යි, අනිච්චියං, පූනනපුංසකලිඞ්ගුවෙහි; එ, එ කාරයෙක්; වා, විකල්පයෙන් වේ—පුබ්බෙ පුබ්බස්මිං ඉති, පුබ්බෙ පුබ්බස්මිං යන; ආදි, මේ ආදිය වේ—(ආදිශබ්දයෙන් පරෙ, පරස්මිං, අපරෙ, අපරස්මිං, යනු වේ)—

එකසඞ්ඛ්‍ය, එකශබ්දයතෙම; සංඛ්‍යා, ගණන; අතුල්‍ය, අසමය; අඤ්ඤ, අනිකෙක; අසහාය, හුදකලාය යන මොවුන්; අත්ථො, අ ර්ථකොට ඇත්තේයි—(සංඛ්‍යාදි අර්ථවාචීයයි සේයි)—යද, යම්කලෙ ක්හි; සඞ්ඛ්‍යානෙ, සඞ්ඛ්‍යා වාචීද; තදා, එකල්හි; එකවචනො, එකව චනාන්තවෙයි; අඤ්ඤත්‍ර, සෙසුඅතුල්‍යාද්‍යර්ථයෙහි වැටෙන්නේ; සබ්බ වචනො, සියලුවචනඇත්තේයි—(එහෙයින් සංඛ්‍යාවෙහි එකො, එ කං, එකෙන, යනාදියවේ—අතුල්‍යාදිවූ අර්ථයෙහි එකො, එකෙ, එ කෙන, එකෙහි, යනාදිය වේ)—යාදිනං, ය ශබ්දාදීන්ට; ආලපනං, ආලපනයක්; නත්ථි, නැති*—

තසි, තශබ්දයා කෙරෙන් පරව සි වේ—

සිමහි සං අනපුංසකස්සඉති, සිමහි සං අනපුංසකස්සයනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

එත—පෙ—එතතෙසංය, තොය, යනු පදයි—

සිමහි, සි පරකල්හි; අනපුංසකානං, පුල්ලිඞ්ගු ස්ත්‍රීලිඞ්ගුවූ; එතත ඉ ති, එත ත යන; එතෙසං, මොවුන්ගේ; තකාරස්ස, තකාරයා හට; සහොති, සකාරයෙක් වේ –සො, යනු වේ—

තස්ස—පෙ—තස්සය, වාය, නත්තංය, සබ්බත්‍ථය, යනු පදයි—

තිලිඞ්ගෙසු, තුන්ලිඞ්ගුයෙහි; සබ්බාදි, සර්වනාමයන්ගේ; තකාරස්ස,

* කවරහෙයින යත් එබඳුවූ අභිධාන ශක්තිස්වභාවයක් නැතිහෙ යිනි—ශබ්දයන්ගේ අර්ථකථන ශක්තියද වෘඬප්‍රයොගානු සාරහෙයි නි—යාදිහුනම් ය ශබ්දයාදිකොටඇති අමන්‍යශබ්දයා අන්තකොටඇ ත්තෝයි—

තකාරයාහට; නො, නකාරතෙම; වා හොති, විකල්පයෙන් වේ—නෙතෙ, යනු වේ—සෙසං, සෙසස; සබ්බසමං, සබ්බශබ්දයාහා සමය; නත්තංච, නකාරාදෙශබවම; විසෙසො, වෙනසයි—

ඉත්ථියං, සත්‍රීලිඞ්ගයෙහි—සා නා නායො—පෙ—ඉච්චාදි, මේආදිය වේ—

වා ඉති, වායනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

තතො—පෙ—තතොය, සස්සය, ස්සායය, යනු පදයි—

තා එතා ඉමාහි, තාය එතාය ඉමාය යනමොවුන්කෙරෙන් පර වූ; සස්ස, සහට; ස්සායො, ස්සාය තෙමේ; වාහොති, විකල්පයෙන් වේ—

සංසාසෙවක—පෙ—ඉඉති, ඉ යනු: එව, මතුසූත්‍රයෙහි වැටේ—

තස්සාවා, තස්සාය, වාය, යනු පදයි—

එකවචනසංසාසු, එකවචනවූ සංය සාය යන මොවුන් පරකල්හි: තාසද්දස්ස, තාශබ්දයාගේ; ආ, ආකාරතෙම; ඉත්තං, ඉකාරබවට; වා, විකල්පයෙන්; යාති, යේ—තිස්සාය, තිස්සා, යනාදිය වේ—

නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; තං, තානි, යන; ඉතිආදි, මේ ආදිය වේ—

එසො, එසො යි එතශබ්දයහට පුල්ලිඞ්ගයෙහි එකවචන වේ—

සෙසං, සෙසස; සබ්බසමං, සබ්බශබ්දයහා සමයි—

ඉත්ථියං, සත්‍රීලිඞ්ගයෙහි—එසා, කියා වේ—

සංසාසෙවක—පෙ—එව, මතු සූත්‍රයෙහි වැටේ—

එතිමාසම්—එතිමාසංය, ඉය, යනු පදයි—

එකවචනසංසාසු, එකවචනවූ සංය සාය යන මොවුන් පරකල්හි; එතා ඉමානං, එතා ඉමා යන මොවුන්ගේ; අන්තස්ස, අන්තයහට; ඉ හොති, ඉ වේ—එතිස්සාය, එතිස්සා, යනාදිය වේ—සෙසං, සෙසස. සබ්බාච, සබ්බා ශබ්දයා මෙනි—

නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; එතං ඉති ආදි, එතං යනාදිය වේ—

ඉමස්සි, ඉමශබ්දයාකෙරෙන් පරව සි වේ—

අන—පෙ-"අනපුංසකස්සායං සිම්හි" යි, සිම්හි, සි පරකල්හි; ඉමස්ස, ඉමශබ්දයහට: අයං, අයංයනාදෙශ වේ—සිලොපො"සෙසාදින්,, සි හට; ලොප් වේ—අයං ඉමෙ, ඉමං ඉමෙ, යනු වේ—

අනි—පෙ—"අනිමිනා මිහිච" යි (නාපරකල්හි) ඉමස්ස, ඉමශබ්දයහට; අනො, අන යනුද; ඉමිච, ඉමි යනුද වේ—අනෙන, ඉමිනා, යනු වේ

සබ්බ—පෙ—"සබ්බස්සිමසෙසවා" යි සුනංහිසු, සුය නංය හිය යන මොවුන් පරකල්හි; එ, එකාරතෙම: (ඉමශබ්දයාහට) වා, විකල්පයෙන් වේ—එහි. ඉමෙහි; යනු වේ –

වාස—පෙ—එව, මතුසූත්‍රයෙහි වැටේ—

"ඉමසද්දස්සච" ඉමසද්දස්සය, චය, යනු පදයි—

ස ස්මා ස්මිං සං සාසු, සය ස්මාය ස්මිංය සංය සාය යන මොවුන් පරකල්හි; ඉමස්ස, ඉමශබ්දයහට; අත්තං, අකාරබව; වා හොති, විකල්පයෙන් වේ—අස්ස, ඉමස්ස, යනාදිය වේ—

අත්තපක්ඛෙ, අත්වකළ පසෙහි—

නාති—පෙ—"නාතිමෙහි කතාකාරෙහි" යී, ස්මා ස්මිනනං, ස්මාය ස්මිංය යන මොවුන්ට; මහා මහි, මහාය මහිය යන දෙදෙන; නයි ජඩනෙත, සිඩකරණු නොලැබෙත්—

ඉත්ථියං, ස්ත්‍රීලිඟුයෙහි; අයං, යනු වේ—සෙසං, සෙසස, එතාව, එතාශබ්දයා වැනි—සංසාසු, සං සා යන මොවුන් පරකල්හි; අත්තං ච, අත්වතිරීමම; විසෙසො, වෙනසී—

නපුංසකෙ, නපුංසකලිඟුයෙහි—

සවිභත්ති—පෙ—එව, මතුසූත්‍රයෙහි; වැටේ—

ඉමස්සිද—පෙ—"ඉමස්සිදමංසිසු නපුංසකෙ" යී, ඉමස්ස, ඉමශබ්දයාහට; වා, විකල්පයෙන්; ඉදං, ඉදං යනාදෙශ වේ-ඉදං, ඉමං, යනාදිය වේ—දුතියා, විතියාවිභක්තිද; එවං, මෙසේයී—

අමූසි, අමුශබ්දයාකෙරෙන් පරවැ සි වේ—

වා අනපුංස—පෙ—එව, මතුසූත්‍රයෙහි වැටේ—

අමුස්ස—පෙ—"අමුස්සමොසං" යී, අමුස්ස, අමුශබ්දයාගේ; මස්ස, මකාරයාහම; සො, සකාරතෙම; වා, විකල්පයෙන් වේ—

සිලොපො, සිහට ලොප් වේ—අසු, යනු වේ—

සබ්බ—පෙ—"සබ්බතො කො" යී, සබ්බනාමතො, සර්වනාමයන් කෙරෙන් පරවැ; කාගමො, කකාරාගම වේ—

සොති "සො" යී; ඔ, (සිහට) ඔ වේ—අමුකො, යනු වේ—පක්ඛෙ, පසෙක්හි; (සකාරාදෙශ කකාරාගමද නොවූතැන්හි)අමු, යනු වේ-අමූ, අමුයො, යනුද වේ—

පුබ්බෙව, පෙරකීපරිද්දෙන්ම; යොනං, යොනට; වොකාරො, වොකාරතෙම; නා, නො වේ—(ජන්තුනො යන තන්හිමෙන් "ලතො වොකාරොච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් වො නොවෙයි සේයි)-අමූං, අමූ, අමුයො, යනු වේ

සෙසං, සෙසුරූප; භික්ඛුව, භික්ඛුශබ්දයා වැන්න: සබ්බාදිකාරියා, සර්වනාමකාර්‍යයෙන්; අඤ්ඤත්‍ර, පිටත්තන්හියි—(එහෙයින්) අමුනා, අමුහි, අමුස්ස, අමූසං, අමූසානං, යනාදි වේ—අසු, යන තැන "අමුස්ස මොසං" යි ස වේ)—

ඉත්ථියං, ස්ත්‍රීලිඟුයෙහි; අසු, යනු වේ—සෙසං, සෙසස; යාගුසමං, යාගුශබ්දයහා සමයී—විසෙසො, වෙනස; අයං, මේයී—(අමුයා

අමුයං, යනුද පැනේ—ඊ නූනී සත්තමියෙහි විකල්පයෙන් සං සා නොවූතැන ඒ දෙරූපයද වනබව හඟවන පිණිසයි

අමුස්ස, යන තන්හි "සුනංහිසුච" යී, ඇති වේ)—අමුස්සා, අමූයා, යනාදිය වේ—

නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි—

සවිභත්ති—පෙ—එව, ඒ සූත්‍රයෙහි වැටේ—

අමුස්සාදුං ඉති "අමුස්සාදුං" යී(නපුංසකලිඞ්ගයෙහි අමුශබ්දයහට;) අදුං, අදුං යන ආදෙශය වේ-අදුං, අමූ, අමූනි, යනු වේ—දුතියා, විතී යාවද: එවං, මෙසේයි—

"සෙසෙසුච" ඉති, සෙසෙසුච යී: සබ්බෙසු, තුන්ලිඞ්ගයෙහි; කිස්ස, කිං ශබ්දයාහට; කො, ක වේ—කො, කා, කිං, යනු තුන්ලිඞ්ගයෙහිම ප්‍රථමෙකවචනයයි*—ඉතිආදි, මේ ආදිය වේ—ලිඞ්ගත්තයෙ, තුන්ලිඞ්ගයෙහි; සබ්බසමො, සබ්බශබ්දයාහා සමයි—(එහෙයින් කො, කෙ, යනාදිය පුල්ලිඞ්ගයෙහි වේ—ස්ත්‍රීලිඞ්ගයෙහි කා, කායො, කං, කායො, යනාදීවේ—නපුංසකලිඞ්ගයෙහි කං, කෙ, කානි, යනාදිවේ—

තුම්හසි—අම්හසි, තුම්හ අම්හ ශබ්දයන්කෙරෙන් සි වේ—(තුම්හ අම්හශබ්දයන්ට වන යම් ආදෙශයෙක් සවිභත්තිවූ දෙදෙනාහට වේ)—

සවිභත්ති—පෙ—අධිකාරො, මතුසූත්‍රයා සම්බන්ධයි—

ත්වම—පෙ—ත්වම්හංය, සිම්හිය, චය, යනු පදයි—

සිම්හි, සි පරකල්හි: සවිභත්තීනං, විභත්තිසහිතවූ; තුම්හම්හානං, තුම්හය අම්හය යනදෙදෙනාහට; ත්වං අහං, ත්වංය අහංය යනදෙදෙනා; හොන්ති, වෙත්; ච සද්දෙන, චග්‍රහණයෙන්; තුම්හස්ස, තුම්හශබ්දයහට; තුවංච, තුවං යන ආදෙශද වේ—ත්වං, තුවං, අහං, යනු වේ—යො, යො වේ—තුම්හෙ, යනු වේ—

මයං—පෙ—"මයං යොම්හි පඨමෙ" යී; අම්හස්ස, අම්හශබ්දයහට; මයං, මයං යන ආදෙශය; හොන්ති, වේ—මයං, යනු වේ—

තංමමම්හි ඉති-"තංමමම්හි" යී, අම්හි, අංපරකල්හි,(තුම්හඅම්හශබ්දයන්ට)තං මං, තංය මංය යනමොහු; හොන්ති(ක්‍රමයෙන්)වෙත්,

තවං—පෙ—"තවං මමංච නවා" යී; අම්හි, අංපරකල්හි; (තුම්හඅම්හදෙදෙනාහට)තවං මමංච, තවං මමං යන දෙදෙනා; නවා, නියි තැනෙක්හි වෙත්—

තුම්හ—පෙ—"තුම්හස්ස තුවං ත්වමම්හි" යී;තුම්හස්ස, තුම්හශබ්දයා

---

* කිංරූපං යනාදිප්‍රයොගයෙහි "කිංකුතඃ ප්‍රශ්නයොර්තං" යනුබැවින් කිංශබ්දයා ප්‍රශ්නයෙහිවැටෙන නිපාතයකි—නොහොත් "සෙසෙසුචයි" යන්නෙහි චග්‍රහණයෙන් කාදෙශනොවෙයි—

හට; තුවං ත්වංච, තුවංය ත්වංය යන ආදේශද වෙත්—තං, තවං ය නාදිය වේ—

ආකංඉති, ආකං යනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

වාය්වප්පඨමොති—"වාය්වප්පඨමො" යි, දුතියායොස්ස, විතියායො හට: ආකං, ආකං යනාදේශතෙම; වා, විකල්පයෙන් වේ—තුම්හාකං තුම්හෙ, යනාදිය වේ—

නාම්හි—පෙ—"නාම්හිතයාමයා" යි; නාම්හි, නාපරකල්හි;(තුම්හ අම්හ දෙදෙනාහට) තයා මයා, තයාය මයාය යන දෙදෙන; හොන්ති, වෙත්—

තයා—පෙ—"තයා තයීනං තකාරො ත්වත්තං වා" යි, තස්ස (තයා තයි යන දෙදෙනාගේ) තකාරයහට; ත්වා, ත්වතෙම; වා, විකල්ප යෙන් වේ—ත්වයා, තයා, යනාදිය වේ—

තව—පෙ—"තව මම සෙ" යි; සෙ, සපරකල්හි; (තුම්හ අම්හ දෙදෙනා හට); තව මම, තව—මම යන දෙදෙන; හොන්ති, වෙත්—

තුය්හං—පෙ—"තුය්හං මය්හං ච" යි; සෙ, සපරකල්හි(තුම්හ අම්හ දෙදෙනාහට) තුය්හංමය්හංච, තුය්හං—මය්හං යන දෙදෙනාද වෙත්—

සස්සං—පෙ—"සස්සං" යි; සස්ස, සහට; අං, අංතෙම; වා, විකල්ප යෙන් වේ—

අම්හා—පෙ—"අම්හස්ස මමං සවිභත්තිස්ස සෙ" යි: සෙ, සපරකල්හි; අම්හස්ස, අම්හශබ්දයා හට; මමච, මමං යන ආදේශද වේ—තව, තුය්හං, යනාදිය වේ—

තුම්හ—පෙ—"තුම්හාම්හෙහි නමාකං" යි; නංවචනස්ස, නංහට ආකං, ආකං වේ—තුම්හාකං—අම්හාකං යනු වේ—

ස්මා, ස්මාතෙම; නාඉව, (අම්හ තුම්හ නාතු යනාදියෙන්) නා වැනි වේ—(එහෙයින්) තයා, මයා, යි වේ—(ෂෂ්ඨී චතුර්ථි මෙනි)—

තුම්හා—පෙ—"තුම්හාම්හානං තයිමයි" යි: ස්මිම්හි, ස්මිංපරකල්හි (තුම්හඅම්හ දෙදෙනහට) තයි මයි, තයි—මයි, යන දෙදෙන: හොන්ති, වෙත්—ත්වත්තෙ "තයා තයීනං තකාරො ත්වත්තං වා" යි, තකාරයහට ත්ව යන ආදේශ කළකල්හි;—ත්වයි, යනාදිය වේ—ලිඞ්ගත්තයෙ, තුන්ලිඟුවෙහි; සමං, රූප සම වේ—(එහෙයින් ත්වං පුරිසො, ත්වං ඉත්ථි, ත්වං නපුංසකං යනාදි යෙදේ*)

තවාඉති, තවායනු: එව, මතුසූත්‍රයෙහි වැටේ—

---

(*ත්වං නපුංසකං යන්නෙන් නපුංසක ලිඞ්ගිකාවූ ශබ්දයක් ගෙණ ත්වං පදුමං යනාදීන් යෙදිය යුතු)

පද—පෙ—පදතොය. දුතියාචතුත්ථීඡට්ඨීසුය, වොනො. යනු පද යි—අන්වර්ථනාමා, අර්ථය පහළකරන්නාවූ; වණ්ණා, අක්ෂරයෝ; පදං, පදනම්—*දුති—පෙ—දුතියා, විතියාය; චතුත්ථී, චතුර්ථීය; ඡට්ඨී, ෂෂ්ඨීය; (යනමොවුන්ගේ) බහුවචනෙසු පරෙසු. බහුවචනය න්පරකල්හි; පදස්මා. පදයාකෙරෙන්; පරෙසං, පරවූ; සවිභත්තීනං, විභක්තිසහිතවූ; තුම්හඅම්හානං, තුම්හ අම්හදෙදෙනාහට; වොනොකාරා, වොය නොය යන දෙදෙන; නවා, තිසිතැනෙක්හි; හොන්ති, වෙත්—

වො (තුම්හෙ), තොප; රක්ඛතු, රක්ෂාකෙරේවා—නො (අම්හෙ), අප; පස්සතු. දකිවා—(මේ විතියානතායි)-වො (තුම්හාකං), තොපට; දදාති, දේ; නො (අම්හාකං), අපට; දදාති, දෙව—

(මේ චතුර්ථීයි)-වො(තුම්හාකං), තොපගේ; සඞ්ඝො, ශ්‍රධාවෙයි; නො (අම්හාකං), අපගේ; සත්ථා, ශාස්තෘයි—නවා ඉති, නවා යනු; කිං, කුමටය; අම්හාකං, අපගේ; එසො, මෙතෙම; සත්ථා, ශාස්තෘයි—(මේ ෂෂ්ඨ්‍යනතායි)—

පදතො ඉති, පදතො යනු; අධිකාරො, සියලු පදින් පරවිධියෙහි වැටේ—

තෙ මෙ—පෙ—"තෙමෙකවචනෙ" යි; චතුර්ථී ඡට්ඨෙකවචනෙසු, චතුර්ථී ෂෂ්ඨී එකවචනයන් පරකල්හි; තෙ මෙ, තෙය මෙය යන ආදෙශයෝදෙදෙන; හොන්ති, වෙත්—තෙ (තුය්හං), තට; දදාමි, දෙමි; මෙ (මය්හං), මට; දදාහි, දෙව—තෙ (තව), තාගේ; ඉදං, මේයි; මෙ (මම), මාගේ; අයං, මේයි—

"නාම්හි" ති, නාම්හි යි; අම්හි, අං පරකල්හි; නිසෙධො, (තෙ මෙ යන ආදෙශ) ප්‍රතිෂේධ වේ—තං, තා; පස්සති, බලන්නේය; මං, මා; අජිනි, දිනී—

වාතනි—පෙ—"වාතතියෙච" යි, තතියෙකවචනෙ, තෘතීයා එකවචනය පරකල්හි; තෙ මෙ, තෙ මෙ යන දෙදෙන; වා, විකල්පයෙන්; හොන්ති, වෙත්—තෙ, තාවිසින්; කතං, කරණලදී; තයාවා, කතං තයා කියාහෝ වේ—මෙ, මාවිසින්; කතං, කරණලදී; මයාවා, කතං මයා කියා හෝ වේ—

---

*"ඡත්‍රපෙක්ෂයාචෛකස්මින් බහුවචනමන්‍යතරස්‍ය" යි වචනබැවින් සාමාන්‍යයක් කිවමනාකල්හි එකවචනද බහුවචනද වණ් සාමාන්‍යය කියවිවන්නේයි—බහුවචනයෙන් දැක්වූවද සා යනාදිවූ එකාක්ෂරද සවෝ යනාදිබහ්වක්ෂරයෝද පදනම් වෙත්—

බහු—පෙ-"බහුවචනෙසු වො නො" යී, නාමියා බහුවචනෙසු, නාමියා බහුවචනයා පරකල්හි; වො නො, වො නො යන දෙදෙන; හොන්ති, වෙත්-"බහුවචනෙන" කියුවච්චනෙසු යී බහුවචනග්‍රහණයෙන්; පඨමෙ යොම්හිච, පඨමාවන යො පරකල්හිද (වො නො දෙදෙනා වනි යොදනු)-වො (තුම්හෙයාහි), තොපවිසින්; කතං, කරණලදී; නො (අම්හෙයාහි), අපවිසින්; කතං, කරණලදී-ගාමං, ගමට; වො (තුම්හෙ), තෙපි; ගවෙජ්ජථ, සෙව්; ගාමං, ගමට; නො (අම්හෙ), අපි, ගවෙජ්ජාම, සමු—(ගවෙජ්ජථ ගවෙජ්ජාම යනු ප්‍රථමාන්ත බහුවචන ගගවනපිණි සයි)—

සංඛ්‍යා, සංඛ්‍යාවාචී ශබ්දතෙම; වුච්චතෙ, කියනු ලැබේ—* එක සඞ්ඛ්‍යා, එකශබ්දයතෙම; සබ්බනාමෙසු, සර්වනාමයන්කෙරෙහි; වුච්චතෙ, කියන ලදී; (සංඛ්‍යාවාචීවූ එකශබ්දය පෙරකීහෙයින් මෙහි නොකියම්හයි සේයි)—

වාදයො, විශබ්දයා ආදිකොට ඇති; අට්ඨාරසන්නං, අට්ඨාරසශබ්දයා අන්තකොට ඇත්තාහු; බහුවචනන්තා, බහුවචනාන්තයෝයි—

සවිභත්තිස්ස—පෙ—අධිකාරො, මතුසූත්‍රයා සඹන්ධ වේ—

යොසු—පෙ—"යොසු චිනාං වෙච" යී; විස්ස, විශබ්දයාහට; වෙ හොන්ති, වෙ යනාදෙශ වේ—වෙ, වෙ යනුද—විහි, විභි යනුදවේ—

නොච—පෙ—නොය, චය, වාදිතොය, නම්හිය, යනු පදයී—

නම්හි, නං පරකල්හි; වාදිතො, වි ශබ්දාදීන්කෙරෙන්පරවූ; නකාරාගමො හොන්ති, නකාරාගම වේ—විනානං, විසූ, යනු වේ—ලිඞ්ගත්තයෙ, තුන්ලිඞ්ගුවෙහි; සමං, සමයී—

තිච—පෙ—තිචතුනානංය, තිස්සො චතස්සො තයො චත්තාරොය, තීණිචත්තාරිය, යනු පදයී—

යොසු, යොවිභක්තීන්පරකල්හි; ඉත්ථිපුමනපුංසකෙසු, ස්ත්‍රීපුනපුංසකලිඞ්ගයෙහි වැටෙන්නාවූ; සවිභත්තීනං, විභක්තිසහිතවූ; තිචතුන්නං, තිය චතුය යන දෙදෙනාහට; තිස්සො චතස්සො ආදයො හොන්ති, තිස්සොය චතස්සොය තයොය චත්තාරොය තීණිය චත්තාරිය යන ආදෙශ වෙත්—තයො, යනාදීහු වෙති—

ඉණ්ණං—පෙ—"ඉණ්ණම් ණණ්නනාතීහි සංඛ්‍යාහී" යී, තිසද්දතො, තිශබ්දයාකෙරෙන් පරවූ; නං ඉති, නං යන; අස්ස, මෝහට;

---

* සංඛ්‍යාය කිවද අභෙදොපචාරයෙන් සංඛ්‍යාවාචීශබ්දය ගැණේ—යම්සේ "හුළොසෙම්හං" යී ශ්ලෙෂ්මකරවූ ගුඩය අභෙදොපචාරයෙන්—ශ්ලෙෂ්මා යයි කියනු ලැබේද සංඛ්‍යා යනුද එසේමැයි—

ඉණ්ණං ඉණ්ණන්නඤ්ච, ඉණ්ණං, ඉණ්ණන්නං යන ආදේශ දෙදෙනද වෙත්—තිණ්ණං, යනාදිය වේ—

නොවාදෙ "තොචචාදිතො නම්හි" යන සූත්‍රයෙහි: චකාරෙන, චග්ගහණයෙන්: නම්හි, නං පරකල්හි; සසං, සසංතෙමෙ: ආගමො, ආගම වේ—වග්ගන්තෙන "වග්ගන්තං වා වග්ගෙ" යි වග්ගන්ත කළ කල්හි—තිස්සන්නං, යි වේ—

"ඔ සරෙ ච" යන, ඉහ, මෙහි: චකාරෙන, චග්ගහණයෙන්; යොසු, යොපරකල්හි; උස්ස, උකාරය හට: උරො, උර වේ—

"තතො යොනමොතු" යන ඉහ, මෙහි: තුකාරෙන, තුග්ගහණයෙන්; යොනං, යොනට; ඔ, ඔ වේ* දුතියා. චිතියා තොමෝ: එවං, මෙසේමැයි—චත්තාරො, චතුරො, වෙයි සේයි—

පුබ්බෙච, පෙරමෙන්; සසං ආගමේ නොවාදියෙහි චග්ගහණයෙන් සසං ආගමකළකල්හි; සදදිනා යදනුපපන්නා යනාදින්; උස්ස, උකාරයාහට; අත්තං, අ වේ—

පඤ්ච—පෙ—"පඤ්චාදීනමකාරො" යී: යොසු, යොවිභත්තින් පර කල්හි; සවිභත්තිස්ස, විභත්තිසහිතවූ; පඤ්චාදීනං, පඤ්චාදීන්ගේ: අන්තස්ස, අන්තයට; අත්තං, අ වේ—

පඤ්චා—පෙ—"පඤ්චාදීනමත්තං" යී: සුනංහිසු, සුය නංය හිය යන මොවුන්පරකල්හි; පඤ්චාදීනන්තස්ස, පඤ්චාදීන්ගේ අන්තයහට; අත්තං, අ වේ—අයං, මේ අකාරාදෙශය: එදිසානං, එකාර් දීඝී දෙදෙනාහට; අපවාදෙ, බාධකයි: (අපවදති බාධතීති අපවාදො-අපපූර්වවූ වදයන්නාහුකෙරෙන් කත්තර්ථෙ ණ—අකාරයහට නැවත අකාරයක් කිරීම අර්ථවිශෙෂයක්හගවයි "සුහිස්වකාරො එ" යී කරණලදඑකාරද "සුනංහිසු ච" යී චනදීඝීද අකාරාදෙශ වලකයි සේයි—එකාර දීඝී දෙදෙන නැවතවෙත්නම් අකාරාදෙශය ව්‍යර්ථවන්නේයි)—පඤ්චහි—යනාදිය වේ—

ලිඞ්ගත්තයෙ, තුන්ලිඟුවෙහි: සමං, සමයි-ඡ සත්ත අට්ඨ නව දසආදයො, ඡ සත්ත අට්ඨ නව දස යන මේ ශබ්දයන් ආදිකොට ඇති; අට්ඨාරසන්තා, අට්ඨාරස ශබ්දයා අන්තකොට ඇත්තාහු; එවං, මෙසේමැයි-(වාදයො යන්නෙහි ආදිශබ්දයෙන් එකාදස චාදස චුද්දස පඤ්චදස සොළස සත්තරස යන මොහුයි—එකූනවීසතිශබ්දය නොපැයේ වීසති ශබ්දනීමෙන්ම හැගෙනහෙයිනි)—වීසත්‍යාදයො, වීසතිශබ්දයා ආදිකොටඇත්තාවූ; ආනවුතියා, නවුතිශබ්දයා දක්වා; ඉත්ථිලිඟා,

---

* (චත්තාරො, චතුරො වේ" යනු මෙහි නොපෙනුනද ගතයුතුයි)—

ස්ත්‍රීලිඞ්ගයෙ; එකවචනන්තා, එකවචනාන්තයෝයි—වීසති, වීසති ශබ්දයතෙම; රත්තිව, රත්තිශබ්දයා වැනි—(වීසති, (හෙ) වීසති, වීසතිං, යනාදිය වේ)-තිංසති, තිංසතිශබ්දයාද; එවං, මෙසේමැයි—(වීසතිශබ්දයා වැනානැයි සේයි)-චත්තාළීසං පඤ්ඤාසං සද්දෙහි, චත්තාළීසංය, පඤ්ඤාසංය, යන ශබ්දයන් කෙරෙන්; පරාසං, පරවූ; සබ්බාසං විභත්තීනං, සියලු ප්‍රථමා විතීයාදිවූ විභක්තීන්ට; සබ්බාසමාදෙ ඉති "සබ්බාසමාවුසොපසග්ගනිපාතාදිහිච" යන, ඉහ, මේ සූත්‍රයෙහි; ආදිසද්දෙන, ආදිග්‍රහණයෙන්; ලොපො, ලොප් වේ-(එහෙයින් චත්තාළීසං රුක්ඛා, (හෙ) චත්තාළීසං රුක්ඛා, චත්තාළීසං රුක්ඛෙ, චත්තාළීසං රුක්ඛෙහි, චත්තාළීසං රුක්ඛානං, චත්තාළීසං රුක්ඛෙසු, යනු වේ)-පඤ්ඤාසං, යනුද; එවං, මෙසේමැයි*(චත්තාළීස ශබ්දය නියත ස්ත්‍රීලිඞ්ග එකවචන හෙයින් ස්වරූපයෙන්ම සිට පුලිඞ්ගාදිවූ රුක්ඛ ශබ්දාදීන්ගේම විශෙෂණ වේ—වීසත්‍යාදීහුද මෙසේමැයි)--සට්ඨි, සට්ඨිශබ්දයතෙමේ; වීසතිව, වීසතිශබ්දයා මෙන්—සත්තතිය, අසීතිය, නවුතිය, යන ශබ්දයෝ; එවං, සට්ඨිශබ්දයා මෙන්—සතං; සතශබ්දයතෙමෙ; නපුංසකං, නපුංසකලිඞ්ගය; එකවචනන්තං, එකවචනාන්තයි—සහස්සාදි, සහස්සශබ්දයා ආදිවූ ශබ්දයෝද; එවං, මෙසේමැයි—(මෙහි ආදිශබ්දයෙන් අයුත නියුත ප්‍රයුත අබ්බුද)-කොටි, කොටිශබ්දයතෙමෙ; වීසතිව, වීසතිශබ්දයා මෙනි—(ස්ත්‍රීලිඞ්ගය එකවචනාන්තායි සේයි—(කොටි, (හො) කොටි, යනාදිය වේ)—

රාසිභෙදෙතු, වර්ගභෙදයක් ඇතිකල්හි වනාහි; සබ්බත්‍ථ, හැම වීසතිශබ්දාදීන්කෙරෙහි; බහුවචනම්පි, බහුවචනද වේ—(රැස කීපයක් නිවම්නාකල්හි වීසත්‍යාදිහු බහුවචනාන්තද වෙති යි සේයි)—යථා, මෙසේයි—බුද්ධදන්තා, සර්වඥ දන්තයෝ; වෙවීසතියෝ, දෙවිසිකෙනෙනි, (විසි විසිබැවින් දෙරැසයි-සතළිස්දෙනෙකැයි සේයි)—දිනසට්කා, දිවස ෂට්කාවෝ; තිසෙසා වීසතියො, තුන්විසිකෙනෙනි; (සැටෙකැයි සේයි—ෂට්කානම් පැයයි)—අඤ්ඤත්‍ර, සෙසු චත්තාළීසං යනාදියෙහිදු; එවං, මෙසේමැයි—

යථා, යම්; අඤ්ඤෙසු, වස්තුවෙක්හි; එසා, මෝතොමෝය; එසො, මේ තෙමේය; එතං, මේය යන; පසිද්ධි, ප්‍රසිද්ධිතොමෝ; ලොකස්ස, ලෝවැස්සාට; හොති, වේද, තානි ඉමානි, ඒ මේ; අත්‍ථා, වස්තූහු; ඉත්ථිපුමනපුංසකානි ඉති, ස්ත්‍රීලිඞ්ග පුලිඞ්ග නපුංසකලිඞ්ගහුයි; ලොකෙන,

* (පඤ්ඤාසං යනුද යනාදිය බාලාවතාර පාඨයට වැඩියක්ව පෙනේ)—

ලොව්‍යුසාව්සින්; උච්චනෙත, කියනුලැබෙත්—* (මේ ගාථාව ආ යතා ගිනියි—

අලිංගා, ලිංගුනැ නිශබ්දයෝ; වුච්චන්තෙ, කියනුලැබෙත්—
කච්—පෙ—කච්ච, තොය, පඤ්චම්‍යෝජය, යනු පදයි--

ලිංගතො, ශබ්දයාකෙරෙන් පරවූ පඤ්චම්‍යන්ත, පඤ්චම්‍යර්ථයක් කිව්මිනාකල්හි; කච්, කිසිතැනෙක්හි; තොපච්චයො, තො යන ප්‍රත්‍යය; හොති, වේ—

ත්‍යාදයො—පෙ—"ත්‍යාදයො විභත්තිසඤ්ඤයො" යි තොපහුති, තොප්‍රත්‍යය ආදිකොටඇති; දුත්‍යන්තානං, දුතිප්‍රත්‍යයා අන්තකොට ඇතිප්‍රත්‍යයන්ට, විභත්තිසඤ්ඤා (හොති), විභක්තිසංඥවෙයි—තස්මා, එහෙයින්; තදන්තානම්පි, එප්‍රත්‍යයාන්තයනු; විභත්‍යන්තත්තා, විභක්ත්‍යන්තහෙයින්; පදත්තං, පදබව; සිද්ධං ඉති, සිද්ධයි; පුන, නැවත; විභත්තින, විභක්ති නොවේ-† චොරස්මා, සොරුකෙරෙන්; (යන අර්ථයෙහි) චොරතො, යි වේ—(කච්ගුහණයෙන් නොවුතැන් චොරස්මා, යනු වේ-එවං යනු මෙසේම තොප්‍රත්‍යය වෙයි යනු පෙණි සයි)—පිතරා, පිතිතො, මාතරා, මාතිතො—එහි, මේ පිතිතො මාතිතො යන දෙතැන්හි—"පිතාදීනමසිම්හි" යනු; අත්‍ර, මේසූත්‍රයෙහි; අසිම්හියාහරණන, අසිම්හිග්‍රහණයෙන්; තොම්හි, තො පරකල්හි; පිතාදීනං, පිතුආදීන්ගේ; උස්ස, උකාරයහට; ඉ, ඉකාරයෙක් වේ—

ඉම—පෙ—ඉමස්ස, ඉය, ථ නදු නිභතොධෙසුය, චය, යනු පදයි—
ථංආදිසු, ථංය දනිය හය තොය ධය යන මේ ප්‍රත්‍යයන්; පරෙසු, පරකල්හි; ඉමස්ස, ඉම්ශබ්දයහට; ඉ හොති, ඉ වේ—අස්මා, මෙයින් (යන අර්ථයෙහි) ඉතො, වේ—

---

* ඵනකෙසවති නාරී මස්සුමා පුරිසො සියා,
උභින්නමන්තරං එතං ඉතරොභයමුත්තකො.

යනාදි ලිංගලක්ෂණ විනවි තනද හිසකේද නැති වී * ලතාදීන් ට ස්ත්‍රීලිංගබවයද, දැළිනැති රුක්ඛපබ්බත යනාදීන්ට පුල්ලිංගබවයද නොවන්නේය එහෙයින් "ලිංගමසජ්ජං ලොකාශ්‍රයත්වාත්" යනුද කිබැවින් ලිංගලක්ෂණ නොකියයුතුය ලොකව්‍යවහාරවූ පරිද්දෙන් ලිංගව්‍යවස්ථාව දතයුතුයි සේයි—

† යම්සේ රුක්ඛං, රුක්ඛා, යනාදීන් විභක්ත්‍යන්තහෙයින් ඔවුන් කෙරෙන් නැවත විභක්ති නොවේද එසේම තොප්‍රත්‍යයාදීන්ට විභක්තිසංඥකළහෙයින් තදන්තයෝ අව්‍යයකවෙත්තුයි ඔවුන් තම්තමන් පදවන හෙයින් නැවත විභක්ති නොවෙයි සේයි—

සබ්බ—පෙ—“සබ්බස්සෙතස්සාකාරොවා” යී; තොථෙසු, තො ය ථ ය යනමොවුන් පරකල්හි; එතස්ස, එතශබ්දයහට; අත්‍තං, අඤ්ඤත්‍ථේ; වා, විකල්පයෙන් වේ—(එතස්මා යන අර්‍ථයෙහි) අතො, එත්‍තො, යනු වේ—පක්‍ඛෙ, (එතො, යන) පක්‍ෂයෙහි “සරලොපාදිනා” සර ලොපාදී සූත්‍රයෙන්; (එතශබ්දයාගේ) අකාරලොපො, අකාරයහට ලොප් වේ—

“ත්‍රතොථෙසුච” යී; ත්‍ර ය තො ය ථ ය යන මොවුන් පරකල්හි; කිස්ස, කිංශබ්දයහට; කු, කු වේ-කස්මා යන අර්‍ථයෙහි කුතො, යී වේ-(රුක්‍ඛාතො පතිතො නරො යනාදිතන්හී රුක්‍ඛා යනු පඤ්චම්‍යර්‍ථය—තො යනු නිපාත ශබ්දයෙහි)—

“ක්‍වචිතොති,, ක්‍වචිතො යී; සුත්‍තවිධාකරණෙන, සූත්‍රය දෙකක් කිරීමෙන්; සත්‍තම්‍යත්‍ථෙච, සප්තම්‍යර්‍ථයෙහිදු; තො හොති, තො ප්‍රත්‍යය වේ—ආදිස්මිං, ආදියෙහි; යන අර්‍ථයෙහි ආදිතො, යී වේ—*

ත්‍රථ-පෙ—“ත්‍රථසත්‍තමියා සබ්බනාමෙහි” යී—සබ්බනාමයන් කෙරෙන්; සත්‍තම්‍යත්‍ථෙ, සප්තම්‍යර්‍ථයක්හිවමනාකල්හි; ත්‍රථපච්චයා, ත්‍ර ය ථ ය යන ප්‍රත්‍යයෝ, හොන්ති, වෙත්—සබ්බස්මිං, සියල්ලෙහි ය න අර්‍ථයෙහි; සබ්බත්‍ර, සබ්බත්‍ථ, යී වේ—ද්විත්‍තං (වග්ග ඝොසා යනාද්න්; සබ්බත්‍ථ, යනතන්හි) ද්විත්‍ව වේ-(එවං යනු මෙසේම සප්තම්‍යර්‍ථයෙහිය යනු පිණිසයි)—එතස්මිං යන අර්‍ථයෙහි අත්‍ර, අත්‍ථ, එත්‍ථ, යනු වේ.“ත්‍රෙනිච්චං” ති ත්‍රෙනිච්චං යී; පුබ්බෙ, පූර්‍වවූ; (අත්‍ර යන රූපයෙහි) එතස්ස, එතශබ්දයහට (ත්‍ර පරකල්හි නිත්‍යයෙන්) අ, අ වේ—(ථ පරකල්හි “සබ්බස්සෙතස්ස කාරොවා” යී එතශබ්දයට අ වෙයි වග්ග ඝොසාද්න් ද්විත්‍ව වෙයි අත්‍ථ, යී වේ—ථ පරකල්හි සරලොපාද්න් තකාරස්ථ අකාරයහට ලොප්වෙයි එත්‍ථ යී වේ)—(කස්මිං යන අර්‍ථයෙහි ත්‍ර ථ යන මොවුන්පරකල්හි “ත්‍රතො ථෙසුච” යී කු වේ)—කුත්‍ර, කුත්‍ථ, යී වේ—

“සෙසෙසුච” ති, සෙසෙසුච යී; සාදෙසෙ (ථ පරකල්හි) කකාරා දෙශ කළකල්හි; කත්‍ථ, යී වේ—

කිස්මා—පෙ—“කිස්මා වො ච” යී; (කිංශබ්දයාකෙරෙන්) වපච්චයො, වප්‍රත්‍යය වේ—

---

*සූත්‍රවිභාග දෙපරිද්දෙකින් සූත්‍රකොට කියහැකිදෑ දෙසූත්‍රක් කොටකීමය ඒකසූත්‍ර දෙකක්කොටගැන්මයි—මේ දෙතෙන “ක්‍වචිතො පඤ්චම්‍යත්‍ථෙ” යී ඒකක්කොට “යොගවිභාගා ඉට්ඨප්පසිද්ධි” යනු බැවින් අභිමතවූ සප්තම්‍යර්‍ථයෙහි සිද්ධිපිණිස ක්‍වචිතො යී ගන්නාලැබෙයි—

කිස්ස—පෙ—"කිස්ස ක වෙච" යි; (ව ප්‍රත්‍යය පරකල්හි කිංශබ්දය හට) කො, ක වේ—කකාරාකාරලොපෙ, කකාරයෙහි අකාරය හට ස රලොපො යනාදින් ලොප්කළකල්හි—කව, යනු වේ—

හිංහං—පෙ—"හිංහං හිඤ්චනං" යි; කිස්මා, කිංශබ්දයාකෙරෙන්, හිං ආදිපච්චයා, හිංය හංය හිඤ්චනංය යන ප්‍රත්‍යයෝ වෙත්—

කුහිං—පෙ—"කුහිංහංසු ච" යි (හිංය හංය යන මොවුන් පරකල් හි) කිස්ස, කිංශබ්දයහට, කු, කු වේ—චකාරෙන, චග්‍රහණයෙන්; හිංචනංදාචනංසු ච, හිංචනංය දාචනංය යන මොවුන්පරකල්හි ද වේ—කුහිං, කුහං, කුහිංචනං, යනුද වේ—

"තම්හා ච,, ති, තම්හාච යි; (තශබ්දයාකෙරෙන් පරව) හිංහං, හිංය, හංය, යන මොහු වෙත්—තහිං, තහං, යනු වේ—

"යතොහිං" ති, යතොහිං යි; (යශබ්දයාකෙරෙන්) හිං, හිංප්‍රත්‍යය වේ—(යස්මිං), යහිං, යනු වේ—

"ඉමස්මා හධා ච" ති, ඉමස්මා හධාච යි; (ඉමශබ්දයාකෙරෙන්) හධා, හය ධය යන ප්‍රත්‍යයෝ වෙත්—(අස්මිං යන අර්ථයෙහි) ඉහ, ඉධ; යනු වේ—

(ඉමස්සිත්ථං යනාදින් ඉමශබ්දයහට ඉ වේ)—

"සබ්බතො ධි" ති, සබ්බතො ධි යි; (සබ්බශබ්දයාකෙරෙන්) ධි, ධිප්‍රත්‍යය වේ—(සබ්බස්මිං යනඅර්ථයෙහි) සබ්බධි, යනු වේ—

කාලෙ ඉති, කාලෙ යනු; අධිකාරො, මතුසූත්‍රහා සම්බන්ධයි—

කිං—පෙ—"කිංසබ්බඤ්ඤෙකයකුහි දාදාචනං" යි; කිං ආදිතො, කිං ය සබ්බය අඤ්ඤය එක ය යන මොවුන් කෙරෙන් පරවූ; දා දාචනං ච, දාය දාචනංය යන ප්‍රත්‍යයෝ වෙත්—(දාචනං යන ප්‍රත්‍යය කිංශබ්දයාකෙරෙන්ම වෙයි හභවනපිණිසය නැවත කුග්‍රහණය "සෙසෙසු ච" යි කිංශබ්දය හට කු වේ)—කස්මිංකාලෙ, කවර කාලෙක්හි (යන අර්ථයෙහි); කදා, කුදාචනං, යි වේ—

සබ්බ—පෙ—"සබ්බස්ස සො දාම්හි වා" යි දා පරකල්හි; සබ්බස්ස, සබ්බශබ්දය හට; සො, සකාරතෙමෙ; වා, විකල්පයෙන් වේ—(සබ්බස්මිං කාලෙ යන අර්ථයෙහි,) සදා, සබ්බදා, යනු වේ—(අඤ්ඤදා, එකදා, යදා, සිද වේ)—

"තම්හා දානි ච' ති, තම්හා දානිච යි, (තශබ්දයාකෙරෙන්) දානි දාච, දානිය දාය යන ප්‍රත්‍යයෝ වෙත්—(තස්මිං කාලෙ යන අර්ථයෙහි); තදානි, තදා, යනු වේ—

යදාදිනා යදනුපපන්නා යනාදින්; ඉමසද්දා. ඉමශබ්දයාකෙරෙන්ද; සමානාපරෙහිච, සමානය අපරය යන දෙදෙනාකෙරෙන්ද;

යථාසංඛ්‍යං, ක්‍රමයෙන්; ජ්ජ ජ්ජුප්පච්චයා, ජ්ජය ජ්ජුය යන ප්‍රත්‍යයෝ වෙති; ඉමසමානානං, ඉමය සමානය යන දෙදෙනාට; අසාච, අය සය යන ආදෙශයෝද වෙත්—(ඉමශබ්දයාකෙරෙන් ජ්ජ වෙයි සමාන අපර යන මොවුන් කෙරෙන් ජ්ජු වෙයි ඉමශබ්දය හට අකාරාදෙශ ද්වෙයි සමානශබ්දය හට සකාරාදෙශ වෙයි සේයි)——(අස්මිං කාලෙ) අජ්ජ, යනුද (සමානෙකාලෙ) සජ්ජු, යනුද, (අපරස්මිං කාලෙ) අපරජ්ජු, යනුද වේ—

"ඉමස්මා රහිධුනාදානිචෙ" ති, ඉමස්මා රහිධුනාදානිච යි; (ඉමශබ්දයාකෙරෙන්) රහාදිප්පච්චයා, රහිය ධුනාය දානිය යන ප්‍රත්‍යයෝ වෙත්—

"එත රහිම්හි" ති, එත රහිම්හි යි; (රහි ප්‍රත්‍යයා පරකල්හි) ඉමස්ස ඉමශබ්දයා හට; එතො, එත යන ආදෙශ වේ—

"අ ධුනාම්හිචෙ" ති, අ ධුනාම්හිච යි; (ධුනා පරකල්හි) ඉමස්ස, ඉම් ශබ්දය හට; අ, අ වේ—("ඉමස්සිත්‍තං" යනාදින් දානිප්‍රත්‍යයාපරකල්හි ඉමශබ්දය හට ඉ වේ)—(ඉමස්මිංකාලෙ යන අර්ථයෙහි) එතරහි, අධුනා, ඉදානි, යනු වේ—

ලොපංඉති, ලොපංයනු; එව, මතුසූත්‍රයෙහි වැටේ—

සබ්බා—පෙ—සබ්බාසංය, ආවුසොපසග්ගනිපාතාදිහිය, චය, යනු පදයි—

එතෙහි, මේ ආවුසොය උපසග්ගනිපාතය යනාදින්කෙරෙන්; පරා, පරවූ; සබ්බා විභත්ති, සියලු විභක්තිහු; ලුප්‍යන්තෙ, ලොප්කරනු ලැබෙත්—ත්වං, තො; ආවුසො, ඇවත; තුම්හෙ, තෙපි; ආවුසො ඇවැත්නි*—

උපසග්ගනිපාතා, උපසර්ග නිපාතයෝ; වුච්චන්තෙ, කියනු ලැබෙත්—

ප පරා—පෙ—උප යන; එතෙ විසති, මේ විසි ශබ්දයෝ; උපසග්ගා, උපසර්ගයෝනම් හුයි—†

---

* ස්වභාවයෙන්ම ආවුසො ශබ්දයා ඔකාරාන්තහෙයින් එකවචන බහුවචනයන් ලොප්වූවද රූපභෙදයක්නැතිහෙයින් එකත්ව බහුත්වහඟවන පිණිස ත්වංය, තුම්හෙය, කී—

† උපෙච්චඅත්‍ථං සජ්ජන්තීති උපසග්ගා, උපෙච්ච, ධාතුන්සමීපයට පැමින; අත්‍ථං, අර්ථය; සජ්ජන්තීති, ප්‍රකාශකෙරෙත්නුයි; උපසග්ගා, උපසර්ගයෝනම් හුයි—උප පූර්වවූ සජ ගතිම්හි යනාහු කෙරෙන්, කර්තෘවෙහි ණ වේ—

(ඒකාක්ෂරයන් පටන්කොට ෂඩක්ෂරයන් අන්තකොට් ලඝුක්‍රමානයෙකින් අකාරාදි ක්‍රමයෙන් නිපාතයෝ ද යතු ලැබෙත්)—

ච ශබ්දාදී තිං ශබ්දාන්තයෝ ඒකාක්ෂරයෝයි—හන්දාදි සද්ධිං ශබ්දාන්තයෝ ද්ව්‍යක්ෂරයෝයි—

අථවාදී සසක්කං ශබ්දාන්තයෝ ත්‍ර්‍යක්ෂරයෝයි—එත්තාවතාදී සෙය්‍යථීදං අන්තයෝ චතුරක්ෂරයෝයි—අපෙව නාම; යනු පඤ්චාක්ෂරයි—භිය්‍යොසොමත්තාය යනු ෂඩක්ෂරයි)—ඉච්චාදයො, මේ ආදීහු; නිපාතා, නිපාතයෝනම් හූයි—*

යෙ. යම් ශබ්දකෙනෙක්; තිලිඞ්ගෙසු, තුන්ලිඟුයෙහිද; සබ්බාසුච විභත්තීසු. සියලුවිභක්තියෙහිද; සබ්බෙසු වචනෙසුච, සියලුවචනයෙහිද; සදිසා, සමයෝද ඒකාකාරයෝද අනික්ප්‍රකාරයකට නොපැමිණෙද්ද, තෙ, ඔහූ; නිපාතාඉති, නිපාතයහයි; කිත්තිතා, කියන ලදහූයි—

යථා, මෙසේයි—උච්චං, උස්වූ; රුක්ඛො, ගසය; ලතා, ලියය; සරං වා, ගෙයයි කියාහෝ වේ (මෙහි උච්චං රුක්ඛො, උච්චං ලතා උච්චං සරං වා, යි යොදනු—උච්චං ශබ්දයාකෙරෙන් පරවූ සි හට ලොප්කළ කල්හි උච්චං යන රූපය තුන්ලිඟුයෙහි සමව සිටී)—

උච්චං රුක්ඛො, හෙ උච්චං රුක්ඛ, යනාදිය විභක්තීන්ට උදාහරණයි-(මේ මෙහි උච්චං ශබ්දයා කෙරෙන් සියලු විභක්තියටම ලොප්කොට උච්චං රුක්ඛො තිට්ඨති; හෙ උච්චං රුක්ඛ තිට්ඨ; උච්චං රුක්ඛං පස්සන්ති; උච්චං රුක්ඛෙන කතං; උච්චං රුක්ඛස්ස දෙහි; උච්චං රුක්ඛස්මා පතිතො; උච්චං රුක්ඛස්ස සාඛා; උච්චං රුක්ඛෙ නිධෙහි; යි උච්චං ශබ්දයා හැමතන්හි යොදනු—ආදි ශබ්දයෙන් උච්චං ලතා (හෙ) උච්චං ලතෙ, උච්චං ලතං, යනාදිද—උච්චං සරං (හෙ) උච්චං සර, උච්චං සරං, උච්චං සරෙන, යනාදිද වේ)—උච්චං රුක්ඛො, (උච්චා) රුක්ඛා යනු වචනයට උදාහරණයි—(මෙහි ඒකවචන බහුවචනයනටද ලොප්කොට උච්චං රුක්ඛො තිට්ඨති; උච්චං රුක්ඛා තිට්ඨන්තියි යොදනු)—

(ආදිශබ්දයෙන් (හෙ) උච්චං රුක්ඛ (හෙ) උච්චං රුක්ඛා, උච්චං රුක්ඛං, උච්චං රුක්ඛෙ, උච්චං රුක්ඛෙන, උච්චං රුක්ඛෙහි, යනාදි

* පදනාමාද්‍යන්තෙසු නිපතන්තීති නිපාතා—පදනං, පදයන්ගේ; ආද්‍යන්තෙසු, ආදියෙහිද අන්තයෙහිද; නිපතන්තීති, හෙත්නුයි සිටින්නුයි; නිපාතා, නිපාතයෝනම්හූයි—අනෙනාගඩ යනාදි පදයෙහි අනෙනා යන නිපාත ආදියෙහි යවාදිතැන්හි ච යන නිපාත අන්තයෙහි—

වේ— ලතා සරානි, ලතාය සරය යන ශබ්දයෝද; එවං, මෙසේ මැ
යි—(එහෙයින් උච්චං ලතා, උච්චං ලතායො, යනාදිද, උච්චං සරං,
උච්චං සරානි, යනාද්ද වේ)—

උභයෙසු, දෙපක්ෂයෙහිවූ (උපසර්ග නිපාතයන් අතුරෙහි යයි
සේයි) විභත්ති, විභක්තිය; අත්ථ, අර්ථය; ක්‍රිය, ක්‍රියාය; දෙස,
ප්‍රදෙශය; සමය, කාලය; දිසාගුණාභෙහි, දිසාද ගුණය යන මොවු
න් අර්ථකොට ඇත්තවුන්කෙරෙන්; (විභක්ත්‍යර්ථාදිවූ අර්ථවාචීන්
කෙරෙනැයි සේයි) යථා යොගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්; ස
බ්බා විභත්තියො අපි, සියලු විභක්තිහුද වෙති; අඤ්ඤත්‍ර තු, සෙස්
සන්කෙරෙන් වනාහි (විභක්ත්‍යර්ථාදිවාචීවූ ශබ්දයන් හැර පිටත් ශබ්ද
යන් කෙරෙනැයි සේයි) පඨමා, ප්‍රථමා වේ (මෙහි විභක්තියයි අභෙ
දොපචාරයෙන් විභක්ත්‍යර්ථයම ගැණේ, විභක්තින්ගේ අර්ථයනම්
ආධාරාදියයි—මේ ගාථා පදාර්ථයි)—

තංයථා, ඒ මෙසේමැයි—අධි අන්තො, අධිය අන්තොය යන; ස
ද්දෙහි, ශබ්දයන් කෙරෙන්; සත්තමී, සප්තමිය; (මෙහි අධි ශබ්දය උ
පසර්ගය අන්තො යනු නිපාතයි මූ දෙදෙන විභක්ත්‍යර්ථ වාචීහුයි—
මතු අව්‍යයී භාවයෙන් විභක්ත්‍යර්ථදන්නේයි)—

සයං සද්දා, සයං යන නිපාත ශබ්දයාකෙරෙන්; තතියා ඡට්ඨීච, තෘ
තීයා ෂෂ්ඨීද වේ-(සයං යනු ආත්ම වාචියි, සයං, තමාවිසින්; තමාගේ
ද යන අර්ථයි)—නමො සද්දා, නමො යන නිපාතශබ්දයාකෙරෙන්;
පඨමා දුතියාච, ප්‍රථමා ද්විතීයාද වේ-(නමො යනු ක්‍රියාවාචියි නමො
යනු නමොතස්ස යනාදියෙහි ප්‍රථමාන්තය, නමො කරොහි නාගස්ස
යනාදි තන්හි ද්විතීයාන්තයි)—පාරං සද්දා, පාරං යන නිපාත ශබ්ද
යාකෙරෙන්; සත්තමී, සප්තමී වේ—(පාරං යනුද දෙශවාචියි—පාරං
එතර)—දිවා සද්දා, දිවා යන නිපාතශබ්දයාකෙරෙන්; පඨමා දුති
යා සත්තමීච, ප්‍රථමා ද්විතීයා සප්තමී (යන මොහු) වෙත්—(දිවා, කා
ල වාචියි)—හෙට්ඨා සද්දා, හෙට්ඨා යන නිපාතශබ්දයාකෙරෙන්; ස
ත්තමී, සප්තමී වේ—(හෙට්ඨා යි දිග්වාචියි—හෙට්ඨා, යට)—උච්චං,
සද්දා, උච්චං යන නිපාතශබ්දයාකෙරෙන්; සබ්බා අපි, සියලු විභක්ති
වේ-(උච්චං යි ගුණවාචියි, උච්චං, උස්, සෙස්සන්කෙරෙන්; තියනු ලැ
බෙයි)-ප සද්දාච, ප ශබ්දයාකෙරෙන්ද; ච සද්දාච, ච ශබ්දයාකෙරෙ
න්ද; පඨමා, ප්‍රථමා වේ—(ප යන උපසර්ගයාද ච යන නිපාතයාද
විභක්ත්‍යර්ථවාචී නොවනහෙයින් විභක්ත්‍යද්භු නොවෙත්)—හෙ ස
ද්දා, හෙ යන නිපාතශබ්දයාකෙරෙන්; ආලපනෙ පඨමා, ආලපන
යෙහි ප්‍රථමා වේ—අඤ්ඤත්‍ර අපි, සෙස්සන්කෙරෙන්ද; තථා, එසේ
මැයි—(සෙසු පරාශබ්දාදි උපසර්ගයන්කෙරෙහු වා ශබ්දාදි නිපා

නයන් කෙරෙන්ද විභක්ත්‍යන්තද්‍රව්‍යවාචීනොවනහෙයින් ප්‍රථමාම වෙයිසේයි)—

උපසග්ගා, උපසර්ගයෝ; සබ්බෙපි, හැමදෙනම්ද; සද්දන්තරෙන සහ, අනික් ශබ්දයක්හුහා එක්කොට; පයුජ්ජන්තෙ, කියනු ලැබෙති—නිපාතාතු, නිපාතයෝ වනාහි; කෙචි, සමහර ශබ්දකෙනෙක්; විසුම්පි, වෙන්කොටද කියනු ලැබෙත්—(ශබ්දයන්හා එක්කොටද කියනු ලැබෙත්)—යථා, මෙසේයි—පහාරෝ, පහරති, යනු වේ—(පහාරෝ යනු උපසර්ග කිතකයාහා යෙදුනැනයි—පහරති යනු ආඛ්‍යාත ධාතු හායි)—සාච සොච යනුද භාසතිවා කරොතිවා යනුද නිපාතයන් අනික්ශබ්දයන්හා එක්කොට යෙදු තැනි—සොඤ් යනුවෙන් කොටයි—

එකෙකලිංගං, එකි එකි ලිඟු ඇත්තේය; විලිංගං, ලිඟු දෙකක් ඇත්තේය; තිලිංගංච, තුන්ලිඟු වක්ඇත්තේය; අපි, නැවත; අලිංගිකං ඉති, ලිඟු නැත්තේයයි; නාමං, නාමපදය තෙම; චතුධා, සතර පරිද්දෙන්; ඉති, මෙසේ; අත්ථං, අර්ථය; නමතිති, නමාතුයි; නාමං, නාමයයි; කිත්තිතං, කියනලදී—(අර්ථය නම් ප්‍රකාශග්‍රහණයෙන් අර්ථ හමුකර තබයිදතයුතුයි)—

නාමිකං, නාමික පදයයි; නාමමෙව නාමිකං, (ස්වාර්ථයෙහි යෙන වා යනාදියෙහි වාග්‍රහණයෙන් ණික වේ)—

——0000——

නාම—පෙ—"නාමානං සමාසො යුත්තත්ථො" යනු; අධිකාරො, යි යලු සමාසයෙහි වැටේ—සමාසොති, සමාසනම්; භින්නත්ථානං, වෙන්වෙන්වූ අර්ථඇති; පදානං, පදයන්ගේ; එකත්ථතා, සමානාර්ථබවයි—(සමසනං සමාසො, සමසනං; එකාර්ථබව, සමාසො, සමාසනම්—එකාර්ථවාචක බවයයි සේයි—නීලුප්පලං යනතන්හි නීලශබ්දය නීලාර්ථලක්ෂණ ගුණවාචීය උප්පලශබ්දය උත්පලත්වලක්ෂණ ජාතිවාචීය මේ භින්නාවූ අර්ථඇති ශබ්දයෝ දෙදෙන එක ජලජවූ උත්පලාඛ්‍යවූ ද්‍රව්‍යය කියත්නුයි—මොවුන් දෙදෙනාගේ සමානාර්ථබයි—මෙසේම සෙසුතන්හිදු යෙදෙනයෙදෙන පරිද්දෙන් දතයුතුයි)—යුත්තත්ථොති, යුක්තාර්ථනම්; අඤ්ඤමඤ්ඤ, ඔවුනොවුන්හා; සම්බන්ධො, සම්බන්ධවූ; අත්ථො, අර්ථයි—

විභාසාඉති, විභාසායනු; අධිකාතබ්බං, සම්බන්ධකටයුතුයි—(කුමට යයත්) වාක්‍යත්ථං, වාක්‍යපිණ්ඩසයි—(විභාසා යනු නොවැටෙත්හොත් කර්මධාරයාදිසමාස නිත්‍යයෙන්වන්නේයි-මහන්තො වීරො යනාදිවාක්‍යයෙහි පෙනෙයි-එහෙයින් විභාසාධිකාරය අඛ්‍යසීභාවයෙන් පිටත් හැමසමාසයෙහිම කටයුතුයයි සේයි—විභාසා වා ශබ්දදෙදෙනම එකාර්ථයෝයි—වාක්‍යනම් පදසමූහයි)—

මහන්තො ච සො, මහත්වූයේත් හේමය; වීරොචාති, වීරවූයේත් හේමය යනා; වාක්‍යෙ, වාක්‍යයෙහිද—

විප—පෙ—විපදෙය, තුල්‍යාධිකරණෙය, කම්මධාරයොය, යනු පදයි—

භින්න, වෙන්වෙන්වූ; පවත්තිනිමිත්තා, ප්‍රවෘත්ති යොග නිමිත්ත ඇති; සද්දා, ශබ්දයෝ; එකස්මිං වත්ථුනි, එක්වස්තුවෙක්හි; පවත්තා, පැවැත්තාහු; තුල්‍යාධිකරණා, සමානාධිකරණනම් හුයි—*

විසෙසන විසෙස්ස භූතා, විශෙෂණ විශෙෂ්‍යවූ; සමානාධිකරණ, තුල්‍යාධිකරණවූ; වෙ පදා, පදයෝ දෙදෙනෙක්; යදා, යම්කලෙක්හි; සමස්‍යන්ත, සමාසකරණලැබෙද්ද; තදා, එකල්හි; සොසමාසො, ඒ සමාසය; කම්මධාරයොනාම, කර්මධාරයනම් වේ—†

---

*ශබ්දප්‍රවෘත්තිනිමිත්තවූ ජාත්‍යාදිපක්ෂවකය "ණ්‍යත්තතා භාවෙතු" යන්නෙහි කියනුලැබේ-වේතෙම මහන්තො වීරො යන්නෙහිමහන්තශබ්දයාගේ ප්‍රයොගයට නිමිත්තවූයේ මහත්වලක්ෂණවූ ගුණය වීරශබ්දයාගේ ප්‍රයොගයට නිමිත්තවූ වීරත්වලක්ෂණවූ ගුණයයි, මෙසේ භින්නප්‍රවෘත්තිනිමිත්ත ඇති මහන්තවීර ශබ්දයෝ දෙදෙන යම් කලෙක්හි දෙවදත්තාදිවූ ද්‍රව්‍යය කියත්නම් තුල්‍යාධිකරණනම්වෙත්—යස්මිං සද්දෙ පයොගාය අධිකාරීයන්ති නියුජ්ජන්තෙ අධිකරණං-යස්මිං, යමෙක්හිලා; සද්දෙ, ශබ්දයතෙමේ; පයොගාය, ප්‍රයොගයපිණිස; අධිකාරියන්ති සී සේයි, නියුජ්ජතෙ, යොදනු ලැබේද; තං, හේ තෙමේ; අධිකරණං, අධිකරණනම්)—† ආසො යනාදිමෙන් එකා

ඉධ. මේ කාතන්තනයෙහි; සමාසසුත්තානි, සමාස සූත්‍රයෝ; සඤ්ඤාද්වාරෙන, සංඥාමුඛයෙන්; සමාසවිධායකානි, සමාසකෙරෙත්—(මෙහි පරයත්ගේමෙන් සමාසයට සංඥා සූත්‍රමුත් සමාස කරණවෙනාසූතුරුනැත එහෙයින් සංඥා මුඛයෙන්ම සංඥා සූතුරු සමාස විධායක වේ, සමාසයෝනම් සංඥායෙන්ම ප්‍රයොජනයක් නැතිහෙයිනි-එහෙයින්ම එම සූත්‍රයෙන් සමාස සංඥා කරනු)අගහිත, නොගන්නාලද; විසෙසනා, විශෙෂණයෝ ඈති; බුද්ධි. බුද්ධිතොම; විසෙසමහි, විශෙෂ්‍යයෙහි, න උප්පජ්ජතීති, නොඋපදිනුයි, විසෙසනං, විශෙෂණය තෙමේ; පුබ්බංහොති, පූර්ව වේ (විශෙෂණ විශෙෂ්‍ය දෙදෙන හට පූර්වපර ව්‍යවස්ථා නොලද නීලුප්පලං යන තන්හි නීලුප්පලං යි කී කල්හි පළමු කොට විශෙෂණවූ නීල ගුණය ගෙණ පසුව විශෙෂ්‍ය වූ උත්පලයෙහි බුද්ධිය උපදනා හෙයින් පළමු කොට බුද්ධියට විෂය වන විශෙෂණය පූර්ව වෙයි පසුව විෂය වන විශෙෂ්‍යය පර වෙයි සේයි)—

සමාසෙනෙව, සමාසයෙන්ම; තුල්‍යාධිකරණත්තස්ස, සමානාධිකරණබව තමා; වුත්තත්තා, කියන ලදහෙයින්; තප්පකාසනත්ථං, ඒ තුල්‍යාධිකරණබව හඟවනපිණිස; පයුත්තා, කියන්ලද; සමාසතො අනිරිත්තා, සමාසයෙන් ඉතිරිවූ; ච සො ඉති, චය සොය යන; එතෙ, මේ ශබ්දයෝ; වුත්තට්ඨානමප්පයොගොති, වුත්තට්ඨානං, කියනලදඅර්ථඇතිශබ්දයන්ගේ; අප්පයොගොති, නොකීමය යනු; ඤායා, යුක්තියෙන්; නප්පයුජ්ජනෙත, ප්‍රයොගකරණු නොලැබෙත්—*

---

ස්වරසංඥානොකොට කම්මධාරයො යි බහුව්‍රීහිසංඥාකිරීම අන්වර්ථසංඥාව හඟවණපිණිසයි, රූඪිසංඥාය අන්වර්ථසංඥායයි සංඥාවිවිධ වේ-අර්ථාපෙක්ෂා නොකොට වත්නාවූ ඝට පටයනාදි සංඥා රූඪි පද නම, පචතීති පාචකො යි අර්ථයුක්තවත්නාවූ සංඥා අන්වර්ථ නම්. කම්මම්වචයං ධාරයතීති කම්මධාරයො. කම්මම්ච, කර්මයමෙන්; චයං, දෙකක්; ධාරයතීති, දරානුයි; කම්මධාරයො, කර්මධාරයනම්—යම්සේ ඔදනං පචති යන තන්හි ඔදනාඛ්‍යවූ කර්මය ප්‍රධානවූ පාකක්‍රියාවය අප්‍රධානවූ ද්‍රව්‍යසංඝට්ටන යනාදිවූ ක්‍රියාවය යන ක්‍රියාදෙක දරාද එසේම කර්මධාරයද ප්‍රධානවූ විශෙෂ්‍යාර්ථයද අප්‍රධානවූ විශෙෂණාර්ථයද යන දෙක දරානුයි කර්මධාරය නම් වේ—පාකය පිණිස දබ්බසංඝට්ටනය යනාදි කරණ හෙයින් පාකය ප්‍රධාන නම දබ්බ සංඝට්ටන යනාදි අප්‍රධාන නම්—විශෙෂණ විශෙෂ්‍ය මතු කාරකයෙහි ක්‍රියනු ලැබේ)—* මහන්තො ච සො වීරො ච යන වාක්‍යයෙහි මහන්තවීරදෙදෙනාගේ තුල්‍යාධිකරණ බව හඟවණ පිණිස කියනලද ච සො යනශබ්දයෝ සමාස කළ කල්හි සමාසයෙන්ම තුල්‍යාධිකරණ

තෙසං-පෙ—තෙසංය, විභත්තියොය, ලොපොය, චය, යනු පදයි—
තෙසං, ඒ; යුත්තත්ථානං, සම්බන්ධවූ අර්ථ ඇති; සමාසානං,සමාස ක
රණලද; පුබ්බුත්තරපදානං, පූර්වවූද පරවූද පදයන්ගේ; විභත්ති, වි
භක්තීහු; ලුප්‍යන්තෙ, ලොප්කරනු ලැබෙත්; චකාරෙන, චග්‍රහණ
යෙන්; ක්වචි, කිසිතැනෙක්හි; න, ලොප්කරනු නොලැබෙත්-(මෙ
හි සමාසානං, යන තැන සමාස ශබ්ද සම්‍යසතෙති සමාසො යි සං
පූර්ව අසුක්ඛෙපනෙ යන්නනු කෙරෙන් කර්මයෙහි ණ වූකල සිඬය එ
හෙයින් සමාසකරණලද යන අර්ථය ලැබේ)—තතො, ලොප්කළ ඉ
ඉක්බිතිව; මහන්ත ඉති, මහන්ත කියාද; වීරඉති, වීර යි කියාද; රූ
පප්පසද්ධෙග, (හලන්තාවූ) රූපයන්ගේ ප්‍රාප්තියෙහි—*

පකති—පෙ—පකතිය, චය, අස්සය, සරන්තස්සය, යනු පදයි—
විභත්තිසු, විභක්තීන්; ලුත්තාසු, ලොප්කරණලද කල්හි; සරන්ත
ස්ස, සවර්යා අන්තකොටඇති; පුබ්බභූතස්සච, පූර්වවූද; පරභූතස්ස
ච, පරවූද; අස්ස, මේ; සමාසපදස්ස, සමාසකරණලද පදයට; පක
තිහොති, ප්‍රකෘතිවේ; ඉහ, මෙහි; ලුත්තා, ලොප්කරණ ලද; අකාරා,
අකාරයෝ දෙදෙන; පුන, නැවත; ආගියතෙ, එලවනු ලැබෙ
ත්—තතො, ප්‍රකෘතිකළ ඉක්බිති; මහන්තවීර ඉති, මහන්තය වීරය
යිද කියා; ඨිතෙ, සවරාන්තව තුබූ කල්හි—

මහ—පෙ—"මහතං මහා තුල්‍යාධිකරණෙ පදෙ" ති, පෙ—පදෙ
යි; (තුල්‍යාධිකරණෙ, තුල්‍යාධිකරණ සමාසයෙහි); මහන්තස්ස, මහ
න්ත ශබ්දය හට; මහා, මහා යන ආදෙශ වෙයි—

තද්ධිත—පෙ—තද්ධිතසමාසකිතකාය, නාමංය, ඉවය, අතවෙතු
නාදීසුය, චය, යනු පදයි—

තද්ධිතාදයො, තද්ධිතය සමාසය කිතකය යන මොහු; නාමංඉ
ව, නාමය මෙන්; දට්ඨබ්බා, දතයුත්තාහුයි—තවෙප්පභූති, තවෙය,
තුනය, ත්වාය, යනාදී; පච්චයෙ, ප්‍රත්‍යයන්; වජ්ජෙත්වා, හැරයි—ත

---

බව කියනලද හෙයින් නැවත තමන්විසින් ප්‍රයොජනයක් නැති
හෙයින් ඔහු නොකියනු ලැබෙයි සේයි—වාක්‍යයෙහි වූකලි තුල්‍යා
ධිකරණත්වය චය සොය යන ශබ්දයන් නැතහොත් ව්‍යක්තනොවෙ
යි-සමාසකළ පදයෙහි උන් නැද්ද සමාසයෙන්ම හැගේ, ච සො ශ
බ්දයන්නැතිව මහන්තො විරො යි වාක්‍යද ගණිත්මැයි—වාක්‍යයෙ
හි පවා ච සො ශබ්දයන්නැතිව තුල්‍යාධිකරණත්වය හැඟෙන කල
සමාසයෙහිම තුා—එහෙයින් ච සො ශබ්දයන්ගේ අප්‍රයොග සුදුසු
මැයි)—අඤ්ඤත්‍ර, සෙසුතන්හි; එවං, මෙසේමැයි—(මත්තෙහි ඒ ශ
බ්දාදීන්ගේ ප්‍රයෝගද මෙසේම දතයුතුයි සේයි)—

* (උච්චාරණයපිණිස අකාරය යොදන ලදි)

නො. නම් බඳුකළ ඉක්බිති; විතතිච්ඡාය. විසතාවිච්ඡායෙහෙයින්; සත ද, සි ආදි විභක්ති වේ—මහාවිරො මහාවිරා ඉති, මහාවීරො, මහාවීරා, යනා; ආදි, මේ ආදිය වේ—

කම්මධාරයො, කම්ධාරයද; චනෙදූච, චඳයද; තප්පුරිසොච, තප්පුරිසයද යනා; තයො, තුන්සමාසයෝ; පරපදෙ, උත්තරපදයෙහි; ලිඞ්ගං, ලිඟු; ලභන්නො, ලබන්නාහ; බහුබ්බීහි, බහුබ්බීහිසමාසය තෙම; පදනතරෙ, අනික් පදයෙක්හි; (ලිඟු ලබන්නේයයි යොදනු)-*(මතුකියන උදාහරණයෙන්ම ලිඟව්‍යවස්ථාව ද දතයුතුයි)—

රත්තාච සා, රත් වි හෝම, පටිචාති, පටිවිත් හෝම තුයි; රත්තපටිනම් වේ-මහනතිච සා, මහත්වි හෝමය; සඩාචාති, ශ්‍රඩාවිත් හෝමතුයි; මහාසඩානම් වේ—එසු, මෙහි—කම්ම-පෙ—“කම්මධාරයසඤ්ඤච” යි; පුබ්බපදෙ, පූර්වපදයාතමා; පුමෙවකතෙ, පුම්වත්කරණලද කල්හි; ආප්පච්චයානං, ආ ප්‍රත්‍යයන්ගේ; නිවුත්ති, වැළැක්මයි-(සමාසකොට රත්තාය පටිය මහන්තිය සඩායයි කිවමනාහින්හි, රත්තාය මහන්තිය යන පූර්වපදයන් දෙදෙනාහට පුංවත්භාව යකළකල්හි රත්තාශබ්දයෙහි ආප්‍රත්‍යයද මහන්තීශබ්දයෙහි ඊප්‍රත්‍යයද ලොප්ව රත්තය මහන්තයයි පුලලිඟුස්වරූපයෙන් සිටිතියි සේයි—මහාසඩා යි කිතැන “මහතංමහා” යනාදින් මහායන ආදෙශ වේ)—

නිලංච තං, නිල්වූයෙත් හේමය; උප්පලංචාති, උප්පල වූයෙත් හේමතුයි; නිලුප්පලං, නීලුප්පල නම්—සත්‍ථිච, ශස්ත්‍ර යක් වැනිතුයි; සත්‍ථි (මෙතන සත්‍ථි ශබ්දය උපමා හෙයින් සත්‍ථි තුල්‍යය කියයි යනු භගවණ්පිණ්ස සත්‍ථිශබ්දයාභායොදූ දක්වූ “අත්තස්වභාවෙතත්ස්වභාවාරොපණ මුපමානං” යනු බැවින් ඒ ස්වභාවය නැතිවස්තුයෙහිස්වභාවය ඇතිකොට සිතාගැන්ම උපමාන නම්, යම් සේ සීහොමානවකො යනාදියෙහි මානවකයා සිංහ නොවතුදු සිංහයාට ඇති ශෞර්‍ය්‍යාදිස්වභාව මානවකයා කෙරෙහි ඇතැයි සිතාගෙණ මානවකසිංහයායි කියනු ලැබේද එසේම ශස්ත්‍රයට ඇතිස්වභාව කල්පනායෙන් සාමා තොමෝ සත්‍ථි යයි කියනු ලැබේ)-සත්‍ථිච සා, ශස්ත්‍රයක් වැනිවි හෝමය; සාමාචාති, සාමාවිත් හෝම තුයි; සත්‍ථිසාමා නම් වේ—නාරී, ස්ත්‍රීයි—මුඛමෙව, මුහුනම; චනෙදූ, චන්ද්‍රයා වැනිතුයි;

---

* “වසෙත්‍ර මධ්‍යෙ තථා ජීද්‍රෙ ව්‍යවධානෙනතරාත්මනි අවකාශෙබහිර්යොගෙ විශෙෂෙ වසරෙනතාරම්” (හලායුධ) යනුබැවින් පදනතරෙ යනතන්හි අනතරශබ්දය අන්‍යශබ්දයාගේ අර්‍ථයෙහි වැටේ—(අනතමවකාශාවධි පරිධානාන්තර්ධිභෙදතාදර්ථෙ, ජිද්‍රාත්මීය විනාවහි රවසරමධ්‍යතාව සදෘශෙෂු. මෙදිනී)

මුඛචන්දො, යනු වේ—(නොහොත් චන්දො ඉව චන්දො, මුඛං ච තං චන්දො චා 'ති සී; වාක්‍යගතන)—විසෙසන විසෙසානං, විශෙෂණ විශෙෂ්‍යදෙදෙන; යථෙච්ඡන්තා, කැමතිපරිද්දෙන් වන හෙයින්; කචි, කිසිතැනෙක්හි; විසෙසනං, විශෙෂණය; පරං හොති, පරවේ—ඛත්තියො ච සො භූතො චා ති ඛත්තියභූතො—ඉති ආදී, මේ ආදිය වේ—(මෙතන භූත ශබ්දය විශෙෂණවූයේද පර වී)—ඉච්ඡා ච, විවක්ෂාවද; යථා තනාති, පෙළවූ පරිද්දෙනි—(පෙළ පැනෙන පරිද්දෙන්මුත් තමා කැමතිපරිද්දෙන් නොකිය හැක්කැයි සේයි)—

න සද්දෙ, න ශබ්දයා කෙරෙන්; සි, සි වේ; තස්ස, ඕහට; ලොපො, "සබ්බාසමාවුසො" යනාදින් ලොප් වේ—න සුරො, සුර නොවන්නේ; අසුරො, අසුර නම්—එත්ථ, මෙහි; කම්මධාරයෙ කතෙ, කම්ධාරය සමාස කළ කල්හි; "උභෙතප්පුරිසා" ඉති, උභෙතප්පුරිසා යී; තප්පුරිසසඤ්ඤ, තත්පුරුෂ සංඥ වෙයි—(කම්ධාරයසංඥ ඇතද නැවත අනික් සංඥාකිරීම ඒ සංඥවෙන් වන කාය්‍ය්‍යලබනු පිණිස යී—ලෝකයෙහිදු එකෙක් අනික් නමින් ඒ ඒ ප්‍රයොජනපිණිස ව්‍යවහාර කරණු ලැබේමැයි)—

අත්තං—පෙ—"අත්තං නස්ස තප්පුරිසෙ" යී; (තප්පුරිස සමාසයෙහි) නස්ස, න කාරය හට; අ, අකාරයෙක් වේ—න අස්සො, අශ්ව නොවන්නේ; අනස්සො, අනස්ස නම්—එත්ථ, මෙහි; "සරෙ අන්" ති, සරෙ අන් යී; සරෙ, ස්වරයා පර කල්හි; නස්ස, න කාරය හට; අන්, අන් යන ආදෙශ වේ—"නාමානං සමාසො" ති, නාමානං සමාසො යී; සුත්තෙන, සූත්‍රය තමා; විධා කතෙ, බෙදනලද කල්හි; අයුත්තත්ථානම්පි, අයුක්තාර්ථයන්ටද; කචි, කිසිතැනෙක්හි; සමාසො, සමාස වෙයි—පුන, නැවත; න ගෙය්‍ය, නොකිය යුතුය යන අර්ථයෙහි; අපුනගෙය්‍යා, අපුනගෙය්‍යා නම් වෙයි; ගාථා, ගාථාවයි; ඉති ආදි, මේආදිය වේ—එත්ථ, මෙහි; ගෙය්‍යෙන, ගෙය්‍ය ශබ්දයාහා; සම්බන්ධො, යුක්තවූ; න සද්දො, න ශබ්දයතෙම; අයුත්තත්ථෙනාපි, අයුක්තාර්ථවූ; පුනෙන, පුන ශබ්දයා හා එක්ව; යොගවිභාගබලා, සූත්‍රවිභාගසාමර්ථ්‍යයෙන්; සමස්‍යතෙ, සමාස කරණු ලැබේ—(ක්‍රියාව ප්‍රතිෂෙධකටයුතු හෙයින් ගෙය්‍ය ශබ්දයාහා සම්බන්ධඇති න ශබ්ද තෙමේ සූත්‍රය දෙකක්කිරීමෙන් සම්බන්ධනැති පුන ශබ්දයහාද සමාසකරණුලැබෙයි සේයි)—*

*ආරම්භො වචනම්ප්‍රාප්ති ලිඞ්ගණං යොගලක්ෂණී
වාක්‍යඤ්ච සූත්‍රයත්නාද්‍යාඃ සූත්‍රානාමභිධායකාඃ—
යනුබැවින් මෙතන යොගනම් සූත්‍රයි—

තයො ලොකා, තුන්ලෝකසෙනෙන්: සමාහටා, එක්කරණලද්දු හූ: තිලොකං, තිලොක්‍නම් වෙති—(තිණ්ණං ලොකානං සමාහාරොයි; තියාද වාක්‍යගණිත්)—එසේ, මෙතැන්හි: සංඛ්‍ය-පෙ—"සංඛ්‍ය පුබ්බො දිගු" යි; සංඛ්‍ය ශබ්දයා පූර්වකොටඇති; කම්මධාරයස්ස, කර්මධාරයසමාසයහට; දිගුසඤ්ඤ, දිගුසංඥවේ——දිගු—පෙ—"දිගුස්සෙකත්තං" යි; දිගුසමාසයහට; එකත්තං, එකත්වයද; නපුංසකත්තඤ්ච, නපුංසකබවද වේ—(රත්තපටි යනාදි උදාහරණ ප්‍රපඤ්ච කර්මධාරයාගේ අනෙක හෙද හඟවන පිණිසයි—
එසේම මත්තෙහිදු ඒ සමාසයෙහි දු දතයුතුයි)—

---

තප්පුරිසා ඉති, තප්පුරිසා යනු; එව, වැටේ—
අමා—පෙ—අමාදයො ය, පරපදෙහි ය, යනු පදයි—

ද්විතීයන්තාදයො, ද්විතීයාන්තාදීහූ: පරපදෙහි, උත්තරපදවූ; නාමෙහි, ශබ්දයන්හා; යදා, යම්කලෙක්හි; සමස්‍යන්ත, සමාසකරණු ලැබෙද්ද: තදා, එකල්හි; සො සමාසො, ඒසමාසයතෙමේ; තප්පුරිසො නාම, තත්පුරුෂ නම්-(තස්ස පුරිසො තප්පුරිසො, තස්ස, ඔහුගේ; පුරිසො, පුරුෂතෙම: තප්පුරිසො, තත්පුරුෂ නම්—තප්පුරිසො විය තප්පුරිසො, තත්පුරුෂයා වැනිතුයි; තත්පුරුෂ නම්—පුරුෂ තෙමේ තත් ශබ්දයෙන් වාච්‍ය නොහමුවූ රාජදින් පිළිබඳ වේ—තත්පුරුෂ මානයයි කීකල්හි පුරුෂමාත්‍රය ගැණෙන්නේ නොවෙයි තත් ශබ්දයෙන් වාච්‍යවූ නොහමුවූ තැනැත්තහු පිළිබඳවූ පුරුෂයාම ගැණේ—එ හෙයින් පුරුෂතෙමේ තත් ශබ්දයෙන් වාච්‍යවූ නොහමුවූ රාජදි අන් පිළිබඳ වේද එ පරිද්දෙන් මෙම සමාසය පූර්වපදාර්ථප්‍රධානකොට ඇතිහෙයින් තත්පුරුෂ නම් වේ)—ගාමං ගතො යන්නෙහි ගත ශබ්දයෙන් ගමනක්‍රියායෙන් යුක්තවූ පුරුෂමාත්‍රයම ගන්නේ නොවෙයි ගමටගිය තැනැත්තේම ගැණේ—ගාමං, ගමට; ගතො, ගියේ; ගාමගතො, ගාමගත නම්—පස්ස-පෙ-සාවත්ථිං ඉති, සාවත්ථිං යන: අත්‍ර, මෙහි; අයුත්තත්ථතාය, අයුක්තාර්ථවනහෙයින්; න සමාසො, සමාස නොවෙයි-(මෙහි) වාසිට්ඨ, වශිෂ්ඨ පුත්‍රය; ගාමං, ගම; පස්ස, බල; තිස්සො, තිස්ස නම් තැනැත්තේ; සාවත්ථිං, සැවැත්නුවරට; ගතො, ගියේයි; යන්නෙහි ගාමං-ගතො යන දෙදෙන ඔවුනොවුන්හා සම්බන්ධනැතිහෙයින් සමාස නොවේ-ගාමං යන්න හා පස්ස යනු හාම සම්බන්ධයක් මුත් ගතො යනු හා සාවත්ථිං යනුහා සම්බන්ධනොවේ)—තථා, එසේම; අඤ්ඤත්‍ර, සෙසුතන්හි; ඤෙය්‍යං දතයුතුයි—(සුතං දෙවදත්තෙන බඩො යඤ්ඤදත්තො

යනාදි තෘතීයාන්ත විෂයෙහිදු සමාසනොවෙයි සේයි)—*

රඤ්ඤා, රජහුවිසින්; හතො, නසනලද්දේ; රාජහතො, රාජහතොයි වෙයි—

කිච්චනෙනහි, කිච්චප්‍රත්‍යයාන්තයන් හා; භියෙන, බොහෝසේ; අධිකත්ථවචනෙ, අධිකාර්ථවචනයෙහි; (තෘතීයාසමාස වේ)—තබ්බ—පෙ—තබ්බ ය, අනීය ය, ණ්‍ය ය, රිච්ච ය, යන, පච්චයා (මේ)ප්‍රත්‍යයෝ; කිච්චා, කිච්ච නම් වෙත්—ද්‍රුතිනිකූණං, සතුනිද නිනැද පිණ්ඩ ස; අජ්ඣාරොපිත, නගණලද; අත්ථං, අර්ථැති; වචනං, තෙපුල; අධිකත්ථවචනං, අධිකාර්ථවචන නම්—සොණෙහි ලෙය්‍යත සොණලෙය්‍යත, බල්ලන්විසින් ලෙවියයුත්ත සොණලෙය්‍යනම්—කූපො, ළිඳයි; සොණෙහි, බල්ලන්විසින්; යථා, යම්සේ; ලිය්‍යතෙ, ලෙවනාලැබේද; තථා, එසේම; පූණ්ණගතා, පිරුණුහෙයින්; ද්‍රුති, සතුනිය; තෙහි, ඒබල්ලන්විසින්; උච්ඡිට්ඨත්තා, ඉඳුල්කළහෙයින්; නිනැදුවී, නිනැදදෑති—(ලිය්‍යති යන අර්ථයෙහි ලිහ අස්සාදනෙ යන්නහුකෙරෙන් "ණෙය්‍යාච' යි සාමියෙහි ණ්‍ය වේ—
වදමදූඅ සූත්‍රයෙහි ආදි ග්‍රහණයෙන්; ධාත්වන්තයහා එක්ව ණ්‍ය හට එය්‍ය යන ආදෙශය වෙයි—ළිඳ පිරුණුබව ගුණහෙයින් සතුනිය බල්ලන්විසින් ඉඳුල්කරණ ලදහෙයින් නිනැදුයි)—

දධිනා, දීයෙන්; උපසිත්තං, තෙමනලද; භොජනං, භොජනය තෙමේ; දධිභොජනං, දධිභොජන නම්—සමාසපදෙනෙව, සමාසපදයෙන්ම; උපසිත්තක්‍රියාය, උපසිත්තක්‍රියාව (තමා,) කථනා, කියනලදහෙයින්; එත්ථ, මෙහි; අයුත්තත්ථතා, අයුක්තාර්ථබවෙක්; නත්ථි, නැති—(දධි ශබ්දයාහා උපසිත්ත ශබ්දයාහාම සම්බන්ධයක් මුත් භොජන ශබ්දයාහා සම්බන්ධ කෙසේය යත්—සමාස පදයෙන්ම උපසිත්තශබ්දයාගේ අර්ථය කියනුලබන හෙයින් උපසිත්ත ශබ්දයාගේ අප්‍රයොගය වනහෙයින් දධි භොජන දෙදෙනාගේ අයුක්තාර්ථබවෙක් නැතැයි සමාසම වෙයි සේයි) උපසිත්තාසද්දප්පයොගො, උපසිත්තශබ්දයාගේ අප්‍රයොගය; පුබ්බෙබව, පෙරසේමැයි—(මහාවිරො යන තත්හි ච සො යන්නවුන්ගේ අප්‍රයොගය මෙනැයි සේයි)—

කරණෙ තු, කරණකාරකයෙහි වනාහි; (උදාහරණ කියනු ලැබේ) අසිනා, කඩුවකරණකොටගෙනවූ; කලහො, කලහය; අසිකලහො, අසිකලහ නම්—(කරණෙ තු යනු කීයේ කරණයෙහි තෘතීයාවෙන්

---

*("පස්ස වාසිට්ඨ ගාමං—ගතො තිස්සො සාවත්ථිං"—
මෙසේ වාක්‍ය දෙකක්ව යෙදේ-එකල ගාමං යනු පස්ස යන ක්‍රියාව හා සම්බන්ධයි—ගතො යනු තිස්සො යන කර්තෘහා සම්බන්ධයි—එබැවින් පූර්වවාක්‍යයෙහිවූ ගාමං යනු අපරවාක්‍යයෙහිවූ ගතො යන්න සමග සමාසනොවේ)—

කාරණපිණ්ඩසයි)—බුද්ධස්ස, බුදුන්ට; දෙය්‍යං, දියයුත්තේ; බුද්ධදෙය්‍යං, බුද්ධදෙය්‍ය නම් වේ—පරස්ස, පරහට; පදං, පදය; පරස්සපද නම්-එත්‍ථ, මෙහි; විභත්‍යලොපො, විභක්තිහට ලොප් නොවේ—("තෙසං" යනාදියෙහි ව ග්‍රහණයෙන් පරස්සපදං යන්නෙහි චතුර්ථියට ලොප් නොවෙයි සේයි)—අත්තනොපදං යනුද එවං, මෙසේමැයි-චොරස්මා, සොරුන්කෙරෙන්වූ; භයං, භයතෙමේ; චොරභයං, චොර භය නම්—බන්ධනස්මා, බැඳිමෙන්; මුත්තො, මිදුනේ; බන්ධනමුත්තො, බන්ධන මුත්ත නම්-රඤ්ඤො, රජහුගේ; පුත්තො, පුත්‍රතෙමේ; රාජපුත්තො, රාජපුත්ත නම්—

බ්‍රාහ්මණස්ස, බමුණාගේ; කණ්හා, කලුවූ; දන්තා ඉති, දන්තායෝ ය යන; අත්‍ර, මෙහි; දන්තාපෙක්ඛා, දන්ත ශබ්දයා අපෙක්ෂාකළාවූ; ඡට්ඨී, ෂෂ්ඨියයි; කණ්හෙන, කණ්හ ශබ්දයාහා; සම්බන්ධා භාවා, සම්බන්ධයක්නැතිහෙයින්; න සමාසො, සමාස නොවෙයි—

(බ්‍රාහ්මණස්ස යි කිතැන ෂෂ්ඨිය දන්තාපෙක්ෂාහෙයින් බ්‍රාහ්මණකණ්හායි සමාස නොවෙයි සේයි*)—යදා තු. යම්කලෙක්හි වනාහි කණ්හා චතෙ, කලුවූවෝ ඔහුමය; දන්තා චෙ ති,දත්වූවෝ ඔහුමයයි; කම්මධාරයො, කර්මධාරය සමාස වේද; තදා, එකල්හි; ඡට්ඨී, ෂෂ්ඨීතොමෝ; කණ්හදන්තාපෙක්ඛා ති, කණ්හ දන්ත යන සමාසපදය අපෙක්ෂාකෙරේනුයි; බ්‍රාහ්මණකණ්හදන්තා ඉති, බ්‍රාහ්මණකණ්හදන්තා යි; සමාසො, සමාසයතෙම; හොතෙව, වේ මැයි—

(කර්මධාරය කොට කණ්හදන්ත යි එක්පදවූ කල ඔහුගේ දත්තාය නුම අපෙක්ෂානොකොට කණ්හදන්තසමුදාය අපෙක්ෂාකොට බ්‍රාහ්මණස්සයි කිතැන ෂෂ්ඨී වනහෙයින් බ්‍රාහ්මණස්ස කණ්හදන්තා බ්‍රාහ්මණකණ්හදන්තායි වේමැයි)——රඤ්ඤො—පෙ—"රඤ්ඤො මාගධස්ස ධනං" යන; අත්‍ර, මෙහි; රඤ්ඤොති, රඤ්ඤො කී තන්හි; ඡට්ඨී. ෂෂ්ඨීතොමෝ; ධනමපෙක්ඛතෙ, ධනය අපෙක්ෂාකෙරෙයි; මාගධං, මාගධ ශබ්දය; න, අපෙක්ෂා නොකෙරෙයි රාජ; එව, රජම; මාගධස්සෙද්න, මාගධ ශබ්දයෙන්; වුච්චතෙති, කියනුලැබේනුයි; භෙද භාවා, භෙදයක් නැතිහෙයින්; සම්බන්ධාභාවොති, සම්බන්ධයෙක් නැත්තුයි; තුල්‍යාධිකරණෙන, සමානාධිකරණවූ; මාගධෙන සහ, මාගධ ශබ්දයාහා සමග; රාජා, රාජ ශබ්දය තෙමේ; න සමස්‍යතෙ, සමාසකරණු නොලැබේ—(රාජමාගධ ශබ්ද දෙකින් එකම නරෙන්ද්‍රයෙක්වූ අර්ථය වාච්‍යවත් මුත් වෙන වෙන අර්ථයෙක් වාච්‍ය නොවේනුයි භෙදයක් නැතිහෙයින් මාගධස්ස යන පරපදයහා රඤ්ඤො යන ෂෂ්ඨ්‍යන්තපදයම සමාසකරණු නොලැබෙයි සේයි—මාගධස්ස, මගධෙශ්වරවූ; රඤ්ඤො, රජහුගේ; ධනං, ධනයයි; (යො

---

(*කණ්හයන ගුණශබ්දය විශෙෂණව කර්මධාරයෙහි පූර්වපදවේ—තත්පුරුෂසමාස යෙහි නොයෙදේ)—

දනු)—සම්බන්ධො, සම්බන්ධයතෙමේ; ද්විට්ඨොහි, දෙදෙනෙන්හු කෙ
රෙහි පිහිටියේමැයි—(සම්බන්ධයද මතු කියනුලැබේ)—
රඤ්ඤො, රජහුගේ; අස්සො, අශ්වද; පුරිසො චෙති, පුරුෂද; (යන)
අත්‍ර, මෙහි; රඤ්ඤො අස්සො, රජහු අස; රඤ්ඤො පුරිසො තිච, රජ
හු පුරුෂයාදැයි (යන මෙහි;) පච්චෙකං, වෙන් වෙන්ව; සම්බ
න්ධතො, සම්බන්ධහෙයින්; සාපෙක්ඛතා, අපෙක්ෂා සහිතබව; අත්ථි
ති, ඇත්තූයි; න සමාසො, සමාස නොවේ—(රඤ්ඤො යනු වෙන
වෙනම අස්සො යනුද පුරිසො යනුද අපෙක්ෂාකරණ හෙයින් ර
ඤ්ඤො අස්සො යන තන්හි එක අස්සො යනු අපෙක්ෂාකොට
සමාස නොවෙයි)—අස්සො ච, අශ්වද; පුරිසො චාති, පුරුෂදැයි; ච
ඤෙ කතෙ තු; චඤසමාස කළකල්හි වනාහි; රාජස්ස පුරිසොති, රා
ජස්ස පුරිසා යි; හොතෙව, (ෂෂ්ඨී සමාස) වේමැයි—(කවර හෙයින්ද
යත්) අඤ්ඤං න පෙක්ඛන්තා, අනිකක්හු අපෙක්ෂා නොකරණ හෙ
යින්—(රඤ්ඤො යනු තෙමේ චඤසමාස කළ කල්හි අස්ස පුරිසා යි
කියා පදසමුදයම අපෙක්ෂා කරත්මුත් වෙන වෙන අශ්වයාද පුරු
ෂයාද අපෙක්ෂා නොකෙරෙයි රඤ්ඤො අස්සපුරිසා රාජස්සපුරිසා
යි සමාස වෙයි සේයි)—රඤ්ඤො—පෙ-අත්‍ර, මෙහි; රාජාපෙක්ඛිනො
'පි' රජු අපෙක්ෂා කරන්නාදවූ; ගුරුනො, ගුරුහට; පුත්තෙන සහ,
පුත්‍රයාහා එක්ව; සමාසො, සමාසය තෙමේ වේ—ගමකත්තා, ගම
ක හෙයිනි—ගමකත්තම්පි (සමාස) ගමකබවද; සමාසස්ස, සමාස
යට; නිබන්ධනං, කාරණයි—(හුදෙක් යුක්තාර්ථ බවම සමාසයට කා
රණ නොවෙයි ගමකත්වයද සමාසයට කාරණ යයි සේයි)—
(ගමකත්ව නම් අර්ථප්‍රතීතිය කරණබවයි)—*

තත්‍ර, ඒ "රඤ්ඤො ගුරුපුත්තො" යන තන්හි; ගුරුනො, ගුරුහු
ගේ; පුත්තොති, පුත්‍රයයි; විග්ගහො, පදවිභාග වේ—එවං, මෙසේ;
අඤ්ඤත්‍ර, සෙසු (සාපෙක්ෂා) තන්හිදු; (දතයුතුයි)—

රූපෙ, රූපයෙහි; සඤ්ඤා, සංඥතොමෝ; රූපසඤ්ඤා, රූපසංඥ
නම්—කචි, කිසිතැනෙක්හි; නිච්චං, නිත්‍යවක් හැහෙනකල්හි;
(සප්තමී සමාස වේ)—කූපෙ, ලිඳෑ; මණ්ඩූකො විය. මඬුවකු වැනිනු
යි; කූපමණ්ඩූකො, කූපමණ්ඩූක නම්-නගරකාකො, නගරකාකො
යනුද; එවං, මෙසේමැයි-(නගරෙ කාකො විය නගරකාකො, නුවර

---

*"අභිධාන ලක්ෂණාහි කෘත්තද්ධිතසමාසාඃ" යනු හෙයින් කිතක ත
ද්ධිත සමාස යන මොහු අර්ථකථනයම නිමිත්තකොට වෙති එ හෙ
යින් යම් තැනෙක්හි සාපෙක්ෂා බවක් ඇතද අර්ථප්‍රතීතියෙක් වේ
නම් සමාස වේමය එ හෙයින් "රඤ්ඤො ගුරුපුත්තො" යන තන්හි
දු රජ ගුරුහුගේ පිත්යනු අර්ථප්‍රතීතිය වනහෙයින් සමාස වේ මැයි—

කපූටවකු වැනිනුයි නගරනාක නම්)-අනු, මෙහි: උපමාය, උප
මාවසින්; නිනද, ගම්භිතොමෝ: ගම්ඃතෙ, හැගේ—(ලිඳ මඩුවකු
වැනිනුයි කිසල නිනදවක් හැඟෙන්මුත් ලිඳ මඩුයෙකැයි කීපමණ
කින්ම හැගෙන්නේ නොවෙයි-යමෙක් මදක් දුන මෙයින් මහතෙ
ක් නැතැයි සිතාද හේතෙමේ කුපමණ්ඩූකයෙකැයි කියනු ලැබේ-
නගරකාකො යනාදීන් සුදුසුපරිද්දෙන් දතයුතුයි)—අන්ත-පෙ-
අන්තෙවාසිකො යනාදියෙහි: විභත්‍යලොපො, විභක්තීන්ට ලොප්
නොවේ—(අන්තෙවසතීති අන්තෙවාසිකො, සමීපයෙහි වෙසේනුයි
අන්තෙවාසික නම්—ආදි ශබ්දයෙන් ජනෙසුතොයනාදිය වේ)-

---

අඤ්ඤ—පෙ—අඤ්ඤපදත්ථෙසු ය, බහුබ්බීහි ය, යනු පදයි—අප්ප
ඨමන්තානං, ප්‍රථමාවිභක්ත්‍යන්ත නොවන්නාවූ; අඤ්ඤසං පදානං,
අනික් පදකෙනෙකුන්ගේ; අත්ථෙසු, අර්ථයන්කිවමනාකල්හි; වෙ
වා නාමානි, ශබ්දයෝ දෙදෙනෙක්හෝ; බහූනි වා නාමානි, බො
හෝ ශබ්දකෙනෙක්හෝ: යදා, යම් කලෙක්හි; සමස්‍යන්ත, සමාස
කරණුලැබෙද්ද; තදා, එකල්හි; සො සමාසො, ඒ සමාසය; බහුබ්බී
හිනාම, බහුව්‍රීහි නම් වේ—

(බහවො වීහයො යස්ස සො බහුබ්බීහි පුරිසො බහුබ්බීහි විය බ
හුබ්බීහි සමාසො මෙහි යම්සේ බහු ශබ්දයෙන් වාච්‍යවූ සංඛ්‍යාවද
ව්‍රීහි ශබ්දයෙන් වාච්‍යවූ ධාන්‍යයද තබා බහුබ්බීහි ශබ්දයෙන් බො
හෝ වී ඇති එකෙක් කියනු ලැබේද එසේම මේ සමාස පදයෙනු ද
තමාවිසින් වාච්‍යඅර්ථයෙන් පිටත් අනිකෙක් කියනු ලැබේනුයි මේ
සමාසයද බහුව්‍රීහි නම් වේ)—

ආගතා, ආවාවූ; සමණා, ශ්‍රමණයෝ; යං, යම් තැනකටද; සො
හේතෙම; ආගතසමණො, ආගතසමණ නම; විහාරො, විහාරය
යි—(මෙහි ආගත ශබ්දයෙන් වාච්‍යවූ ආගමනක්‍රියායෙන් යුක්තය
න්ද සමණ ශබ්දයෙන් වාච්‍යවූ භික්ෂූන්ද තබා ආගතසමණ යන ස
මාසපදයෙන් කියනුලබන්නේ විහාර ශබ්දයෙන් වාච්‍යවූ නිවාසා
ධ්‍ය අර්ථයයි—මෙසේම සෙසුතන්හි දු යොදනු)—

ජිතානි, දිනනලද; ඉන්ද්‍රියානි, ඉන්ද්‍රියයෝ; යෙන, යමක්හුවිසි
න්ද; සො, හේතෙම; ජිතින්ද්‍රියො, ජිතින්ද්‍රිය නම; භගවා, සර්වඥ
යි—ආහිතො, කරණලද; අග්ගි, ගිනිතෙමේ; යෙන, යමක්හුවිසි
න්ද: සො, හෙතෙමේ; ආහිතග්ගි, ආහිතග්ගි නම—අග්‍යාහිතො වා,
අග්‍යාහිත නම් හෝ වේ—ඉතිආදෙ, මේ ආදීතන්හි; යථෙච්ඡං, විව
ක්ෂාවූ පරිද්දෙන්; විසෙසනාස්ස, විශෙෂණයාගේ; පරතා, පරබව
වේ—(විවක්ෂාවද ජිනවචනා නුරොධයෙනි)—

කරණෙණතු, කරණයෙහි විනාහි—ජිනෙනා, කපනලද; රුක්ඛො වෘක්ෂය තෙමේ; යෙන, යමක්හු කරණකොටගෙනද; සො, හේතෙම; ජිනනරුක්ඛො, ජිනනරුක්ඛ නම්; එරසු, පොරොවයි-දිනෙනා, දෙනලද; සුංකො, සුංවත්; යස්ස, යමක්හටද; සො, හේතෙම; දින්නසුංකො, දින්නසුංක නම්; රාජා, රජයි—නිග්ගතො, නික්මුණාවූ; ජනා, ජනයෝ; යස්මා, යමක්හු කෙරෙන්ද; සො, හේතෙම; නිග්ගතජනො, නිග්ගතජන නම; ගාමො, ගමයි—දසබලොති, දසබලයෙනෙක්; යස්ස, යමක්හුගේද; සො, හේතෙම; දසබලො, දසබලනම, භගවා, සර්වඥයි—

සමො, සමඑකෙක්; යස්ස, යමක්හට; නත්ථි, නැද්ද; සො, හේතෙම; අසමො, අසම නම්—එත්ථ, මෙහි; "අත්තනාස්ස,, ඉති, අත්තනාස්ස යන; යොගවිභාගෙන, සූත්‍රය දෙකක්කිරීමෙන්; නස්ස, නකාරයාහට; අ, අ වේ—පහූතා, මහත්වූ; ජිව්හා, දිව; යස්ස, යමක්හුගේද; සො,හේතෙම; පහූතජිව්හො, පහූතජිව්හ නම්-මහන්ති, මහත්වූ; පඤ්ඤා, ප්‍රඥාතොමෝ; යස්ස, යමක්හුගේද; සො, හේතෙම; මහාපඤ්ඤො, මහාපඤ්ඤ නම්—විසු, දෙතන්හි—ඉත්ථියං—පෙ- "ඉත්ථියං භාසිතපුම්ත්ථි පුමාවචෙ,, යි පුංභාවාතිදෙසා, පුංවත්කිරීමෙන්; පුබ්බුත්තරපදෙසු, පූර්වෝත්තරපදයෙහි; ආ ඊ පච්චයානං, ආ ඊ ප්‍රත්‍යයන්ගේ; අභාවො, වැලැක්මයි—(සමාසකොට පහූතා ජිව්හා මහන්ති පඤ්ඤා යි කිවමනාතන්හි පුංවත්කිරීමෙන් පහූතා ජිව්හා යන පුබ්බුත්තර පදයන්ගේ ආ ප්‍රත්‍යයද මහන්ති පඤ්ඤා යන පුබ්බුත්තර පදයන්ගේ ආ ඊ යන දෙදෙනද වලකතියි සේයි)—ක්වචි—පෙ——"ක්වචි සමාසන්තගතානමකාරන්තො ා". යි සමහරතැනෙක්හි සමාසයෙහි-අන්තස්ස, කෙළවර වර්ණයාටද; අත්තං, අකාරයෙක් වෙයි—කාරග්ගහණෙන, (මෙමසූත්‍රයෙහි) කාර ශබ්දයෙන්; ආ ඉ ච, ආ ය, ඉ ය, යන ආදෙශ (අන්තය හටම) වෙයි—ඉත්ථියං ඉ වණ්ණන්තා, ස්ත්‍රීලිඟුවෙහි ඉ වර්ණයා කෙරෙන්; තුනතෙහිච, තු ශබ්දාන්තයන් කෙරෙන්ද; කප්පච්චයොපි, ක ප්‍රත්‍යයද වේ—යථා, මෙසේයි—(පිළිවෙළින් උදාහරණ කියනු ලැබෙයි සේයි)—

විසාලං, මහත්වූ; අක්ඛි, ඇස; යස්ස, යමක්හුගේද; සො—පෙ— (මෙහි අන්තාවූ ඉ කාරයහට; අ කාරයි)—පච්චක්ඛො, ප්‍රත්‍යක්ෂවූ; ධම්මො, ධර්මය තෙමේ; යස්ස, යමක්හටද; සො, —පෙ—(අ කාරයට ආ කාරයි)—සිලොපො සෙසතො යනාදීන් සි හට ලොප් වේ—සොභනො, මනාවූ; ගන්ධො, ගන්ධය; යස්ස, යමක්හුගේද; සො—පෙ-(අ කාරයාට ඉ කාර වෙයි)—බහු බොහෝවූ; කත්තියො, කාන්තීහු; යස්ස, යමක්හුගේද; සො—පෙ—බහු, බොහෝවූ; නදි

යො, නදීහු: යස්ස, යමක්හුගේද: සො—පෙ—එත්, ශ්‍රී බහුනදී
යො යනාතන්හි; යදාදිනා යදනුපපන්නා යනාදීන්: රස්සො, (ඊ
කාරයහට) හ්‍රස්ව වේ—බහවො, බොහෝවූ; කත්තාරො, කත්‍රෘහු;
යස්ස, යමක්හුගේද; සො—පෙ—(අසමො යනාදී හැම ඍෂියටයි)
මත්තා, මත්වූ; බහවො, බොහොවූ; මාතඟා, ඇත්හු; යස්මිං, යම්
තැනෙක්හිද; තං, හේතෙම; මත්ත—පෙ—වනං,වනයයි—(මෙත
නබොහෝ පදයෝයි සමාස කරණලද්දේ-මෙම පරිද්දෙන්ම යම්
තාක් පදයෝද සමාස කරණු ලැබෙත්)—තුල්‍යාධිකරණෙ, සමා
නාධිකරණ බහුව්‍රීහියි—(ආගත ශබ්දයෙන්ද සමණ ශබ්දයෙන්
ද භික්ෂු ලක්‍ෂණවූ එකම වස්තුව කියන ලබන හෙයින් ආගතසම
ණෙ යනු තුල්‍යාධිකරණයි ජිතින්ද්‍රියො යනාදීහුද මෙසේමැයි)—

සුවණ්ණස්ස විය, ස්වර්ණයාගේ මෙන්; වණ්ණො, වර්ණය; යස්ස,
යමක්හුගේද—සො—පෙ—
වජිරං, වජ්‍රයතෙමේ; පාණිම්හි, අත්හිවූයේ; යස්ස, යම්කිහුගේද;
සො—පෙ—උරසි, ලෙහි; ලොමානි, ලෝමයෝ; යස්ස, යම්කිහු
ගේද; සො—පෙ—එත්, මෙහි; (උරසි ලොම, යන තන්හි) විභත්‍ය
ලොපො, (සප්තමී) විභක්තිහට ලොප් නොවේ—

අනෙව්හු ති, අනෙව්හු යි; බහු ව්‍යාගහණෙන; බහුවචන තීමෙන්;
කච්චි, කිසිතැනෙක්හි; පඨමන්තානම්පි, ප්‍රථමාන්තයන්ගේ අර්ථ
යෙහිද (සමාස වේ)—සහහෙතුනා, හේතුවහාසමග; යො, යමෙ
ක්; වත්තතෙ, පවතීද; සො, හේතෙමේ; සහෙතුකො, සහෙතුක
නම්—යදාදිනා යදනුපපන්නා දීන්; සහස්ස, සහ ශබ්දයහට;සො,
ස වේ—

යෙ, යම්කෙනෙක්; සත්තවා, සද්දෙනෙක්හෝ; අට්ඨවා, අ
ටදෙනෙක්හෝ; (වූනම්) තෙ, ඔහු; සත්තට්ඨ, සත්තට්ඨ නම් වෙ
ති; මාසා, මාසයෝ යි—එත්, මේ (සත්තට්ඨ යන තන්හි) අඤ්ඤපද
ත්‍ථො, අනික් පදයක්හුගේ අර්ථ නම්; වා සද්දස්ස, වා ශබ්දයාගේ; අ
ත්‍ථො, අර්ථයයි—(වා ශබ්දයෙන් වාච්‍යවූ විකල්පාර්ථය කිවමනාකල්
හි සමාස වනහෙයින් වා ශබ්දයාගේ අර්ථය අන්‍යපදාර්ථ නම් වේ)—
දක්ඛිණස්සාච, දකුණුදිගටද; පුබ්බස්සාච, පූර්වදිගටද(යන)යං, යම්;
අන්තරාලං, අතුරෙක් ඇද්ද; සා, හෝතොමෝ; දක්ඛිණපුබ්බා, ද
ක්ඛිණපුබ්බා නම්; දිසා, දිගුයි—(පූර්ව දක්ෂිණ ශබ්දයහට පුංවත් වේ)
භින්නාධිකරණෙ, භින්නාධිකරණ බහුව්‍රීහියි—(මෙහි සුවණ්ණ ශ
බ්දයා කනකාඛ්‍යවූ අර්ථයද වණ්ණ ශබ්දය) ප්‍රභාඛ්‍යවූ අර්ථයද වෙන්
වෙන් කොට කියත්මුත් සුවණ්ණය වණ්ණය යන ශබ්දයන් දෙදෙ
නා එකවස්තුවෙක නොපවත්නා හෙයින් සමාසය භින්නාධිකර
ණ නම් වේ—මෙසේම වජිරපාණි යනාදියෙහි සුදුසු සුදුසු පරිද්
දෙන් යොදනු)—අපඨමන්තානන්ති කිං, ප්‍රථමාන්ත නොවූ අන්‍ය

පදයන්ගේ අර්ථයෙහි නොවෙයි යනු කුමටය—

දෙසිතො—පෙ—යො ධම්මො සී—හීතැන නොවනපිණිසයි—බුද්ධෙන, සර්වඥයාවිසින්; දෙසිතො, දෙසනලද; යො ධම්මො, යම් ධර්මයෙක්ද සී; (හීකල්හි ධම්ම ශබ්දයෙන් වාච්‍යවනාර්ථය මෙතැන අන්‍යපදාර්ථහෙයින් දෙසිතො බුද්ධෙන යනතැනද සමාසකොට දෙසිතබුද්ධො සී රූපප්‍රසඞ්ගයෙහි අප්‍රථමාන්තශ්‍රවණයෙන් සමාසනොව දෙසිතො බුද්ධෙනයි ව්‍යස්තමවෙයි—

මේ බහුබ්‍රීහිසමාසය තග්ගුණසංවිඥ්ඤාණය අතග්ගුණසංවිඥ්ඤාණයයිද්විවිධ වේ-තෙසු ගුණෙ තග්ගුණෙ, තෙසු, ඒරැස්වූවවුන් අතුරෙහි; ගුණෙ, අප්‍රධානවූයේ; තග්ගුණෙ, තද්ගුණනම්-තග්ගුණස්ස සංවිඥ්ඤාණං යස්මිංබහුබ්බීහිම්හි සො තග්ගුණසංවිඥ්ඤාණෙ, තග්ගුණස්ස, තද්ගුණයාගේ; සංවිඥ්ඤාණං, දැන්ම; යස්මිං බහුබ්බීහිම්හි, යම් බහුව්‍රීහියෙක්හිද; සො, හේතෙම; තග්ගුණසංවිඥ්ඤාණෙ, තද්ගුණසංවිඥාන නම්—තබ්බිරුද්ධො අතග්ගුණසංවිඥ්ඤාණෙ, තබ්බිරුද්ධො, ඒ තග්ගුණයට විරුද්ධවූයේ; අතග්ගුණසංවිඥ්ඤාණෙ, අතද්ගුණසංවිඥාන නම්—තද්ගුණ සංවිඥාන යෙහි අන්‍යපදාර්ථය තෙමේවිශෙෂණයා එක්කොට ගන්නාලැබෙයි—ලම්බකණ්ණං පුරිසමානය, යනාදියෙහි තද්ගුණ සංවිඥානයි-ලම්බො කණ්ණො යස්ස සො ලම්බකණ්ණො, ලම්බො, එලෙන්නාවූ; කණ්ණො, කණතෙමේ; යස්ස, යමක්හුගේද; සො, හෙතෙම; ලම්බකණ්ණො, ලම්බකණ්ණ නම්—

තං ලම්බකණ්ණං, ඒ එලෙන කන්ඇති තැනැත්තහු; ආනය, ගෙණ—මෙහි අන්‍යපදාර්ථවූ පුරුෂතෙමේ විශෙෂණවූ ලම්බ කණ්ණ යහා එක්කොට ගන්නාලැබේ--අතද්ගුණසංවිඥානයෙහි විශෙෂණය හැර හුදෙක් අන්‍යපදාර්ථයක් ම ගන්නා ලැබේ--දිට්ඨසාගරමපුරිසමානය යනාදියෙහි—දිට්ඨො සාගරො යෙන සො දිට්ඨසාගරො-දිට්ඨො, දක්නාලද; සාගරො, සාගරයතෙමේ; යෙන, යම්ක්හු විසින්ද; සො, හෙතෙම; දිට්ඨසාගරො, දිට්ඨසාගර නම්—තං දිට්ඨසාගරං, මෙහි දෘෂ්ටවූ සාගරය විශෙෂණවූයේ අන්‍යපදාර්ථ පුරුෂයාහා එක්ව නොගැණේද)—

---

නාමානං—පෙ—නාමානං ය, සමුච්චයො ය, චනෙද ය, යනු පදයි—සමුච්චයො ති, සමුච්චය නම්; පිණ්ඩීකරණං, රැස්කිරීමයි—එකවිභත්තිකානං, සමානවිභක්ති ඇති; නාමානං, ශබ්දයන්ගේ; යො සමුච්චයො. යම් රැස්කිරීමෙක්ඇද්ද; සො, හෙතෙම; චනෙද නාම, චඳනම්—ඉදං සුත්තං, මේ සූත්‍රයතෙමේ; බහුවචනවිසයං, බහුවචන

විභජයී-(මේ සූත්‍රයෙන් සමාසකළ පදයෝ බහුවචන වෙත්හී යේයි) චන්දො ච, සඳද, සුරියො ච, හිරුද; චන්දිමසුරියා, චන්දසුරියනම්හු යි, තිට්ඨන්ති ති, (චන්ද්‍රසූර්ය දෙදෙන)සිටිත් යනු; ආදි, මේ ආදිවූ; ක්‍රියාසම්බන්ධසාමඤ්ඤතො, ක්‍රියාසම්බන්ධිය සාමාන්‍යහෙයින්; එත්ථපි, මේ චන්ද්‍රයෙහිදු; එකත්ථතා, ඒකාර්ථබවෙක්; අත්ථි, ඇති—(සමාසො ති භින්නත්ථානං පදානමෙකත්ථතා යී—තිව චන්ද්‍රයෙහි එකාර්ථතා ව කෙසේය යත්—චන්ද්‍ර සූර්ය දෙදෙනා එකස්ථිතික්‍රියාව කාරණහෙයින් ස්ථිතික්‍රියාව සම්බන්ධදෙදෙනාට සමධාරණහෙයින් දෙන්නාම ස්ථිතික්‍රියාධාරවූ අර්ථයෙහි පවතිත්හුයි ඒකාර්ථ වෙති යි සේයි—ආදි ශබ්දයෙන් ගච්ඡන්ති යනාදියි)—නරො ච, නරයෝද; නාරියො ච, ස්ත්‍රීහුද; නරනාරියො—(මේ ස්ත්‍රීලිඞ්ගාන්තයි) අක්ඛරානි ච, අක්ෂරයෝද; පදානි ච, පදයෝද; අක්ඛරපදානි—(මේ නපුංසකාන්තයි)—

෧

තථා—පෙ—තථා ච, චන්දෙ ච, පාණි—පෙ-ආදිනං ච, ච ච, යුක්ත පදයි—විවිධෙන, නානාප්‍රකාරවූ; ආකාරෙන, සවරූපයෙන්; විරුද්ධා, විරොධඅත්තාහු, විවිධවිරුද්ධා—සභාගා, සභාග නම්; සදිසා, සමය භ ඊ සේයි—(සමානො භාගො කොට්ඨාසො යෙසං තෙ සභාගා)-විවිධා ච තෙ, විවිධවූවාහු ඔහුමය; සභාගා චෙ ති, සදෘශවූවාහු ඔහුම් යයි-විසභාගා—(මෙතැන වි ශබ්දය විවිධාර්ථයෙහි වැටේ)—යථා, යම් සේ; දිගුසමාසෙ, දිගු සමාසයෙහිද; තථා, එසේම; චන්දෙ, චන්ද්‍රසමාසයෙහිදු: පාණ්‍යඞ්ගාදිනං, පාණ්‍යඞ්ග තූර්යඞ්ග යනාදින්ගේ; එකත්තං, එකත්වයද; නපුංසකත්තං ච, නපුංසකලිඞ්ගබවද; හොති වේ—

(පාණීනං අඞ්ගං පාණ්‍යඞ්ගං, ප්‍රාණීන්ගේ අවයවතෙමේ පාණ්‍යඞ්ගනම්; පාණ්‍යඞ්ගං අත්ථො යස්ස සද්දස්ස සො පාණ්‍යඞ්ගත්ථො, පාණ්‍යඞ්ගත්ථයතෙමේ අභිධෙය්‍යවූයේ යම් ශබ්දයක්හටද හෙතෙමේ පාණ්‍යඞ්ග නම්—සෙස්සද මෙසේ දතයුතුයි)—චක්ඛු ච සොතං ච චක්ඛුසොතං, ඇසද කණද චක්ඛුසොතනම්—(මේ පාණ්‍යඞ්ගයි)-ගීත ච වාදිත ච ගීතවාදිතං, ගීතද වාද්‍යද ගීතවාදිත නම්:(මේ තූර්යඞ්ගයි)-යුග ච නඞ්ගල ච යුගනඞ්ගලං, වියද නඟුලද යුගනඞ්ගල නම්: (මේ යොග්‍යඞ්ගයි—යොග්‍යඞ්ග නම් කෘෂිභාණ්ඩයි)—හත්ථි ච අස්සො ච හත්ථස්සං, ඇත්ද අස්ද හත්ථස්ස නම්—(මේ සෙනාඞ්ගයි) (ඇත්හුය අස්හුය රථය පදය යන මොහු සෙනාඞ්ග නම් හුයි—ආයුධද සෙනාඞ්ගකොට කියත්මැයි—එහෙයින් අසිචම්මං යනාදිය වේ—මෙහි චම්ම නම් ඵලකයි)—ඩංසා ච මකසා ච ඩංසමකසං, ඇටලෙවිස්සෝද මදුරුවෝද ඩංසමකස නම්හුයි—(මේ ඛුද්දජන්තු

කාණ්ඩයි*)—කාකා ච උලූකාච කාකොලූකං, කපුටුවෝද බකමූණෝ ද කාකොලූක නම්හුයි—(මේ විච්ඡවිරුඬයි)—නාම ච රූපච නාම රූපං, නාමයද රූපයද නාමරූප නම්—නාමං, නාමයතෙම්; නමනලක්ඛණං, නැමීම ලක්‍ෂණකොට ඇත්තේය; රූපං, රූපයතෙමේ; රුප්පනලක්ඛණං, නස්නාබව ලක්‍ෂණකොට ඇත්තේය—එවං, මෙසේ; එතෙ ධම්මා, මේ නාම රූපය යන ධර්‍මයෝ දෙදෙනා; ලක්ඛණතො, ලක්‍ෂණහෙයින්; විවිධා, නානාප්‍රකාරයහ; පරමත්‍ථතො, පරමාර්ත්‍ථබැවින්; සභාගා ච, සදෘශයෝයි—(මෙ තැන නාම නම් වෙදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන සතර කඳය, රූප නම් පෘථිව්‍යාපාදි රූපස්කන්ධයි†)—ආදි සද්දෙන, ආදිශබ්දයෙන්; අඤ්ඤත්‍ථාපි, සෙසුතැන්හිදු;(එකත්‍ව නපුංසකලිඞ්ග වේ)—යථා, මෙසේයි—භින්නලිඞ්ගානං, වෙන් වෙන්වූ ලිඞ්ගඇති ශබ්දයන්ගේ; (එකත්‍වනපුංසකත්‍වය වේ)—ඉත්‍ථී ච පුමා ච ඉත්‍ථිපුමං, ස්ත්‍රීද පුරුෂද ඉත්‍ථිපුම නම්—යදෘදින්‍යා, යදනුපපන්නා දීන්; රසෙසා, (පූර්වපදයහට) හ්‍රස්ව වේ-දසිදසං යනාදින්. මෙසේම දන්න—පත්තො ච චීවර ච පත්තචීවරං, පාත්‍රයද චීවරයද පත්තචීවර නම්—ගඞ්ගා ච සොණා ච ගඞ්ගාසොණං, එනම් ගඟද එනම් හොයද ගඞ්ගාසොණ නම්—(මේ තුන භින්නලිඞ්ගයන්ටයි)—සංඛ්‍යාපරිමාණානං, සංඛ්‍යාපරිමාණවාචීන්ගේ; (එකත්‍ව නපුංසකත්‍වයද වේ)—තික ච චතුක්ක ච තිකචතුක්කං, තුනෙක්ද සතරෙක්ද තිකචතුක්ක නම්-(ත්‍රීණිපරිමාණානි අස්සෙති යන අර්ත්‍ථයෙහි තිකයයි සිඬවනහෙයින් තිකාදිහු සංඛ්‍යාපරිමාණ වාචීහු නම් වෙත්)—සිප්පීනං, සිල්පීවාචී ශබ්දයන්ගේ; (එකත්‍වයද නපුංසකත්‍වයද වේ)—වෙනොච රථකාරො ච වෙනරථකාරං, කුළුපතුද රියවඩුද වෙනරථකාර නම්—ලුද්දකානං, ලුද්දකවාචීන්ගේ; එකත්‍වයද නපුංසකත්‍වයද වේ)—සාකුන්තිකො ච මාගවිකො ච සාකුන්තිකමාගවිකං, ලිහිණිවැදිද මුවවැදිද සාකුන්තිකමාගවික නම්—අප්පාණිජාතීනං ප්‍රාණජාතිවාචී නොවන්නාවූ ශබ්දයන්ගේ; (එකත්‍ව නපුංසකත්‍වයද වේ)—ආරො ච සත්‍ථි ච ආරසත්‍ථි, විදිනාකට්ටද සැ

---

*ක්‍ෂුද්‍රාජන්තුරනස්ථිකත්‍ව දථවා ක්‍ෂුද්‍රඑවයඃ,
ශතං වා ප්‍රසූතං යෙෂාං කෙචි දනකුලාදපි—

යනුබැවින් ක්‍ෂුද්‍රජන්තුක නම් ඇටනැතිසත්හුය—නොහොත් ඇට ඇතද නැතද කුඩා යම් සත්කෙනෙක නොහොත් යම් සත්හු සියෙක් පතක්පමණ වෙද්ද ඔහුය නොහොත් මුගටියන් දක්වා කුඩා යම් සත්කෙනෙකි—

†පරමත්‍ථතො ස නිබ්බාන පචක්ඛන්ධොත්‍ථරාසිතො,
ඛන්ධෙත්‍වච සමාසෙ ති—වුත්තෙත්තිතාදි හෙදනං—

යනු බැවින් නාම රූප දෙදෙන පරමාර්ත්‍ථහෙයින් සභාගයහ යිසේයි.

ත්කට්ඨවද ආරඤ්ඤනම්--එකජ්ඣායන බ්‍රාහ්මණානං, සමානවූ ජාඩ්‍යඇ
ති බ්‍රාහ්මණවාචී ශබ්දයන්ගේ (එකත්‍ව නපුංසකත්‍වයද වේ)-කඨො
ච කලාපො ච කඨකලාපං, කඨ නම් චරණය හදුරණ තැනැත්
තේද කලාපනම් චරණය හදුරණ තැනැත්තේද කඨකලාප නම්*
විභා—පෙ—විභාසා ය—පෙ—දීනං ය, ච ය, යනු පදයි—එසේද
එකසමාසකළකල්හි; රුක්ඛාදීනං, රුක්ඛතිණාදිවාචීශබ්දයන්ගේ;
එකත්තං, එකත්‍වයද; නපුංසකත්ත ච, නපුංසකලිඟුබවද; වාහො
ති, විකල්පයෙන් වේ—ධවො ච ඛදිරො ච ධවඛදිරං, දුවගසද කි
හිරිගසද ධවඛදිර නම් වේ-(මේ වෘක්‍ෂයටයි)—මුජො ච බබ්බජො
ච මුජබබ්බජං මුජබබ්බජා, මුදුතණද බබුස්තණද මුජබබ්බජං මු
ජබබ්බජා යි වේ—(මේ තෘණයටයි)—අජා ච එළකො ච අජෙළකං,
එළුද නිරළුද—පෙ—(මේ පශුවාචීන්ට යි)—පශුශබ්දය චතුෂ්පදවා
චීයි—හිරඤ්ඤ ච සුවණ්ණ ච—හිරඤ්ඤ—පෙ—අමුරන් රත්රණ්
යි—(මේ ධනයට යි)—සාලි ච යවො ච—සාලි—පෙ—සැල්ද යව ද
ද—පෙ—(මේ ධාන්‍යයට යි)—කාසී ච කොසලො ච—කාසි—පෙ—
කාසිරටද කොසොල් රටද—පෙ—(මේ ජනපදයට යි)—ආදිසද්දෙ
න, සූත්‍රයෙහි ආදි ග්‍රහණයෙන්; අඤ්ඤෙසු පි, සෙසුඅර්ථයෙහිද; වා,
විකල්පයෙන් වේ—යථා, මෙසේයි—නිච්චවිරොධීනං, නිත්‍යවිරොධ
ඇති; අද්‍රබ්‍යානං, ද්‍රව්‍යවාචීනොවන ශබ්දයන්ගේ; (එකත්‍වනපුංස
කත්‍වද; වා, විකල්පයෙන් වේ)—කුසල ච අකුසල ච—පෙ—කුසල්
ද අකුසල්ද—පෙ—(කුසල් අකුසල් දෙක ඔවුනොවුන්ට නිත්‍යයෙ
න් ම විරුඬය ද්‍රව්‍යද නොවේ—ද්‍රව්‍යලක්‍ෂණ මතු කියනුලැබේ)—ස
කුණීනං, පක්‍ෂිවාචීන්ගේ—බකො ච බලාකා ච-පෙ—කොක්ද කො
කිතිද—පෙ—බ්‍යජනානං, බ්‍යජන වාචීන්ගේ—දධි ච ඝතං—පෙ
-දීහිද ගිතෙල්ද—පෙ—දිසානං, දික් වාචීන්ගේ—පුබ්බා ච අපරා
ච—පෙ—ඉදුරුදිගද පැලදිගද පෙ—(ආදිශබ්දයෙන් පෙළවූ පරි
ද්දෙන් දන්න)—

---

අධි සද්ද, අධි ශබ්දයාකෙරෙන්; සම්ං, සප්තමී එකවචන වේ—
තාස්ස, ඕහට; ලොපො, සබ්බාසමාදීන් ලොප් වේ—අධි සද්දෙ
න, අධි ශබ්දයාහා; තුල්‍යාධිකරණත්තා, සමානාධිකරණහෙයින්; ඉ
ජ් සද්දපි, ඉත් ශබ්දයාකෙරෙන්ද; සම්ං, සම්ං වේ—(අධි ශබ්දයෙන්

---

* කඨඨයයිද කලාපයයිද වේදයෙහි චරණවිශෙෂයට නම් බැවි
න් ඒ දෙකම හදුරන්නෝ චරණය සාමාන්‍යහෙයින් එකාධ්‍යයන
නම් වෙත්—මෙතැන ආදි ශබ්දයෙන් ජිනවචනානුරොධයෙන් අ
ර්ථවිශෙෂයෙහිද ප්‍රයොග දතයුතුයි—

ද ඉජ්ඣි ශබ්දයෙන්ද වාච්‍යවන්නේ එක සන්නිලක්ෂණවූ අර්ථයයි—එ
හෙයින් ඉජ්ඣිශබ්දය අධිශබ්දයාහා තුල්‍යාධිකරණයි)—නිච්ච සමාස
නහා, නිත්‍යසමාස හෙයිනි—ආධාරභූතායං ඉජ්ඣියනානි, ආධාරවූ යම්
සත්‍රියක කෙරෙහියයි; පදන්තරෙන, අනික් පදයකින් විග්ගහෙ, වා
ක්‍ය ගත්කල්හි; අධි ඉජ්ඣියනානි, අධි ඉජ්ඣියාං යි; ඊතෙ, දැක්වූකල්හි*—

උප—පෙ—උපසග්ගනිපාතපුබ්බකො ච, අබ්‍යයීභාවො ච, යනු
පදයි—උපසග්ගාදිපුබ්බකො, උපසර්ග නිපාත යන මොවුන් ප්‍රධාන
කොට ඇති; සඤ්ඤ, ශබ්දයතෙමේ; විභත්‍යර්ථාදිසු, විභක්ත්‍යර්ථය ය
නාදිවූ අර්ථයෙහි; † සමාසො හොති, සමාස වෙයි; අබ්‍යයීභාව ස
ඤ්ඤො ච අබ්‍යයීභාව සංඥද ඇතිවේ—(බ්‍යයො ඤ්ඤත්ථාභාවො,
බ්‍යය නම් අන්පරිද්දෙකින් විමය; බ්‍යයො යෙසං නත්ථි තෙ අබ්‍ය
යා, බ්‍යය යම්කෙනෙක්හට නැද්ද ඔහු අබ්‍යය නම්හුයි; තුන්ලිඟු
යෙහිද අටවිභක්තියෙහිද සියළුවචනයෙහිද අන්‍යථාභවයට නොපැ
මිණ එකසවරූපයෙන් සිටිත් නුයි අබ්‍යයෝ නම්—අව්‍යයෝ නම් උ
පසර්ග නිපාතයෝ යි—අව්‍යයානං අත්ථං භාවයතීති අබ්‍යයීභාවො අ
ව්‍යයන්ගේ අර්ථය පහලකෙරේනුයි අබ්‍යයී භාව නම්—අව්‍යයභා
ව යයි වුවමනා තන්හි—යදදින් ඊ කාර කළහෙයින් අබ්‍යයීභාවය
යි වේ-නොහොත් බ්‍යයභවනං බ්‍යයීභාවො, ව්‍යයවීම ව්‍යයීභාව නා
ම; ව්‍යයීභාවො යස්ස නත්ථි සො අබ්‍යයීභාවො, බ්‍යයභාවය යමක්හ
ට නැත්තේද හෙතෙමේ අබ්‍යයීභාව නම්—

සෙසු කර්මධාරයාදි සමාස නොඑක් ලිඟුද නොඑක් විභක්තිද
නොඑක් වචනද ඇත්තේය-මේ සමාසය වූකලී නපුංසකලිඟුද එ
කවචනාන්තද වත්මුත් අන්‍යථාභවයකට නොපැමිණෙනුයි අව්‍යයී
භාව නම්—විභාසා යනු නිත්‍යසමාසහෙයින් මෙහි නොවැටේ)—

---

* අවිග්ගහො නිච්චසමාසො පදවිග්ගහො වා-යනුබැවින් නිත්‍ය
සමාසයාට වාක්‍ය නැත ඉද්න් වාක්‍යයෙක් වේනම් අනික්පදයකින්
වෙයි එහෙයින් අබ්‍යයීභාව සමාසය නිත්‍යහෙයින් මෙතන අධිශබ්ද
යාගේ අර්ථය අධි ශබ්දයෙන් ම නොදක්වා ආධාරභූතායං යන
අනික් පදයකින් විග්‍රහදක්වූයේයයි සේයි—මෙසේම කිතක විෂ
යෙහිද පුඤ්ඤකාරො පභංකරො යනාදි දතයුතුය—එද නිත්‍ය ස
මාස හෙයින් පුඤ්ඤං කරොති පභංකරොති යන අනික් පදයකින්
ම වාක්‍යවත්මුත් පුඤ්ඤං කරොති පභං කරොති කාරකය කාරකය
යන සවපද යෙන් විග්‍රහ නොවේ—මෙසේ මැයි සෙසු තන්හිදු—

† (විභක්තිය සම්පාර්ථය යනාදිවූ අර්ථයෙහියි ඇතම් පොත්වල
පෙනේ)—

සො—පෙ—"සො නපුංසකලිඞ්ගො" යි, අබ්‍යයීභාවො, අව්‍යයීභාව සමාසයතෙමේ; නපුංසකලිඞ්ගො, නපුංසකලිඞ්ග වේ—යදාදිනා, යදාදීන්: එතවතො ච, ඒකවචනද වේ—

සරො—පෙ—"සරො රස්සො නපුංසකෙ" යි; රස්සො, නපුංසක ලිඞ්ගයෙහි ස්වරයහට හ්‍රස්ව වේ—

අඤ්ඤ—පෙ—අඤ්ඤස්මා ය, ලොපො ය, ච ය, යනු පදයි—අත කාරන්තා, අකාරාන්තනොමවන; අව්‍යයීභාවා, අව්‍යයීභාව සමාසයාකෙරෙන්; පරා, පරවූ; සබ්බා විභත්ති, සියලු විභක්තීහු; ලුප්පරෙ, ලොප් කරණලැබෙත්—විභත්තිනං, විභක්තීන්ගේ; අත්ථො, අර්ථය නම්; ආධාරාදි, ඔකාසාදියයි—ඉධ, මෙහි; අධි සද්දෙ, අධි ශබ්දය තෙමේ; ආධාරෙ වත්තතෙ, ආධාරාර්ථයෙහි වැටේ—(එහෙයින්) අධිත්ථි ඉති, අධිත්ථි යන; එතං පදං, මේ පදය; ඉත්ථියං ඉති, ස්ත්‍රියකෙරෙහිය යන; එතං අත්ථං, මේ අර්ථය; වදති, කියා; (ඉත්ථියං යන පදයෙන් යම් අර්ථයෙක් වාච්‍යද අධිත්ථි යන්නෙහුදු එම අර්ථයම වාච්‍යයයි සේයි)—සමීපං නගරස්ස, පුරයාගේ සමීපයතෙමේ; උපනගරං, උපනගර නම්—(මෙ තැන උප ශබ්දයෙන් වාච්‍යවූ ශමීපාර්ථද ශමීපය පදන්තරයෙන් දක්වූය)—

අං—පෙ—"අංවිභත්තීනමකාරන්තාබ්‍යයීභාවා" යි—අකාරාන්ත අබ්‍යයී භාවයාකෙරෙන් පරවූ; විභත්තීනං, සියලු විභක්තීන්ට; කවචි, කිසි තැනෙක්හි; අං, අං වේ—

කවචි ඉති, කවචි යනු; කිං, කුමටය; උපනගරෙ කීතන්හි අං නොවන පිණිසයි

(එහෙයින් සම්හට එ කාරවේ)—අභාවො මක්ඛිකානං, මැස්සන්ගේ නොවීම; නිම්මක්ඛිකං, නිම්මක්ඛික නම්—(මෙ තැන නි ශබ්දය අභාවාර්ථයෙහි වැටේ—රස්සො, "සරො රස්සො නපුංසකෙ" යි; මක්ඛිකා ශබ්දයාගේ ආ කාරයට හ්‍රස්ව වේ—ථෙරානං, තෙරවරුන්ගේ; අනුපුබ්බො, ක්‍රමය; අනුථෙරං යි වේ—(මෙහි අනු ශබ්දය ක්‍රමයෙහි වැටේ)—සත්තිං, සාමර්ථ්‍යය; අනතික්කම්ම, නොඉක්මම යන අර්ථයෙහි; යථාසත්ති, යි වේ—(මෙහි යථා ශබ්දය අනතික්‍රමයෙහි වැටේ)—

යෙ යෙ වුඩ්ඪා, යම් යම් වෘද්ධකෙනෙක්ද යන අර්ථයෙහි; යථාවුඩ්ඪං, යි වේ—විච්ඡායං, මේ වීප්සාවෙහි සමාසයි—

(මෙතන යථා ශබ්දය වීප්සායෙහි වැටේ—වීප්සාද මතු කියනු ලැබේ)—ජීවස්ස, ජීවිතයාගේ; යත්තකො, *යම්; පරිච්ඡෙදො, පිරිසිඳිය යන අර්ථයෙහි; යාවජීවං, යි වේ—අවධාරණෙ, මේ සමාසය අවධා

---

(*යත්තකො; යම්පමණවූ යන අර්ථද වේ)

රණයෙහියි—(මෙහි යාව ශබ්දය අවධාරණාර්ථ වාචීයි—අවධාරණ
නම් නියමයි)—ආ පබ්බතා; පර්වතය දක්වා; ඛෙත්තං, ක්ෂේත්‍රය යන
තන්හි; ආ පබ්බතං ඛෙත්තං යනු වේ—(ඛෙත්ත ශබ්දය තියේ සුප්‍රති
ෂ්ඨිතපිණ්ඩ වාක්‍යය ආ පබ්බතා යනු ම, සමාස පදය ආ පබ්බතං ය
නු මැයි)—මරියාදායං, මේ සමාසය මර්යාදායෙහි යි—මෙහි ආ යන
උපසර්ගය මර්යාදායෙහි වැටෙයි—තජ්ජමානා, හරණලබන්නාවූ;
සීමා, හිම; මරියාදා, මර්යාදා නම්—පබ්බතං විනාති, පර්වතය හැරය
යන; අත්‍ථො, අර්ථයි—(පර්වතය මර්යාදාය එහෙයින් පර්වතය හැර
යි)—ආ ජලන්තා, දිය කෙළවර දක්වා; සීතං, හැල්බවය යන අර්
යෙහි; ආ ජලන්තං සීතං, යි වේ-(මෙහි සීතං යනුද සප්‍රථමා පිණ්ඩ
යි)—අභි විධිම්හි, මේ සමාසය අභි විධියෙහි යි-(ආ යන උපසර්ගය අ
භිවිධියෙහි වැටේ)-ගජ්ජමානා, ගන්නාලද; සීමා, සීමාව; අභි විධි,
අභි විධි නම්-(එහෙයින්) ජලන්තෙන සහෙත්‍යත්ථො, ජලාන්තයහා
සමගය යන අර්ථයි—(ජලාන්තය අභි විධියි—අභි විධිවූ ජලාන්තය
නොහැර ම ඇල්බවය යි සේයි*—අව්‍යයීභාව සමාසය නිත්‍යවූව ආ
පබ්බතා ආජලන්තා යනුද වාක්‍යකෙසේ ය යත්)-ආ සද්දයොගෙ, ආ
යන උපසර්ගයාහා සම්බන්ධයක් ඇතිකල්හි; ධාතුනාමාදිනා, "ධාතු
නාමාදිනමුපසග්ගයොගාදිස්වපි ච" යි; අපාදානවිධානෙනෙව, අ
පාදානසංඥා කළහෙයින්ම; වාක්‍යම්පි, වාක්‍යයද; සිද්ධං, සිද්ධයි—(ඉදි
න් ආ යන උපසර්ගය පූර්වවූකල සමාසය විකල්පයෙන් නොව නි
ත්‍යම වී නම් ආ පබ්බතා යන ව්‍යස්තපදයෙන් නොවන්නෙය එ
සේකල්හි අපාදාන සංඥාම ව්‍යර්ථවෙයි එතකුදු වූවත් අපාදාන සංඥා
ව හදාලේමය එහෙයින් ම ආ පබ්බතා යනාදිවාක්‍යයට බාධා නැත්
මය යි සේයි)—තථා, එසේම; අඤ්ඤත්‍ර, සෙසු තන්හිදු; දතයුතුයි—
(මේ කී පරිද්දෙන් ජත්‍යාදිවූ අර්ථයෙහිද නිත්‍යයෙන් ලක්ෂණාදිවූ
අර්ථයෙහි විකල්පයෙන්ද මේ සමාස දතයුයි සේයි)—

උත්තමො, උතුම්වූ; වීරො, විරතෙම; පවීරො, පවීර නම; (යන)
ඉත්‍යාදෙද පන, මේ ආදිතන්හි වනාහි; පුබ්බපදත්ථ, පූර්වපදයෙන් වා
ච්‍යවූ අර්ථයාගේ; පධානත්තාභාවා, ප්‍රධානබවක් නැතිහෙයින්; අ
ව්‍යයීභාවාභාවො, අව්‍යයීභාවසමාසයාගේ නොවීමය; කම්මධාර
යො එව, කර්මධාරය සමාස ම වේ-(පවීරො යන්නෙහි පූර්වවූ ප ශබ්ද
ය උපසර්ග වූව ප ශබ්දයාගේ ප්‍රධානය නොව පරවූ වීර ශබ්දයාගේ
අර්ථය ප්‍රධානහෙයින් අව්‍යයීභාව නොවෙයි සේයි—අභි ධම්මා-ක

---

* "උණ්හ සීතා ගුණෙපි ච"යනුහෙයින් උෂ්ණ ශීත ශබ්දයෝදෙ
දෙන ගුණීන් කෙරෙහිද වැටෙති මෙහි සීත ශබ්දය ගුණ වාචියයි
දතයුතුයි—

දන්තං—යනාදියෙහි දු අබ්‍යයීභාව සමාස නොව කර්මධාරයම වෙයි ගහපතිනාපිණ්ඩස එවං යානාදිය ති)—එවං, මෙසේ; විසිට්ඨො, විසෙස් වූ; ධම්මො, ධර්මයතෙම; අභි ධම්මො—කුච්ඡිතං, නපුරුවූ; අන්නං, බත්තෙම; කදන්නං—

එත්ථ, මේ කදන්නං යන තන්හි; කදං කුස්සාති, "කදං කුස්ස" යි; සරෙ, ස්වරයා පරකල්හි; කුස්ස, කු ශබ්දයහට; කදාදෙසො, කද යන ආදෙශ වේ-(කු ශබ්දයා නිපාතද වූව උපසර්ගයන්හා කු ශබ්දයාගේ පූර්වකල්හි කර්මධාරය සමාස ව්‍යවස්ථිතවිභාෂාධිකාර හෙයින් නිත්‍ය මැයි—නිත්‍යසමාසහෙයින්මැයි උත්තමො වීරො යනාදිවාක්‍යද පද්‍යන්තරයෙන් ම දක්වූයේ*)-අප්පකං, මඳවූ; ලවණං, ලුණු; කාලවණං-

එත්ථ, මෙහි; කාප්පත්ථෙසු චාති, "කාප්පත්ථෙසු ච" යි; කුස්ස, කු ශබ්දයහට; කා, කා වෙයි; බහුවචනෙන, (අප්පත්ථෙසු ච යි) බහුවචන ග්‍රහණයෙන්; අඤ්ඤත්ථාපි, සෙසු අර්ථයෙහි දු, ක්වචි, කිසිතැනෙක්හි (කු) වේ—(මෙහි කු ශබ්දය අල්පාර්ථයි)—කුච්ඡිතො, නින්දිතවූ; පුරිසො, පුරුෂතෙමේ; කාපුරිසො, කාපුරිස නම; කුපුරිසො යි කියාද වේ—(මේ බහුවචනග්‍රහණයෙන් එක් තැනෙක්හි කාදෙශවූ තැනියි) එවං, මෙසේ; අසුරාදි, අසුර යනාදිද වේ-(න සුරො අසුරො—න අසෙසා අනසෙසා—යනාදියෙහි දු පූර්වවූ න ශබ්දය නිපාතද වූව පූර්ව පදාර්ථ ප්‍රධාන නොවනහෙයින් කර්මධාරය සමාස වෙයි සේයි)—

අබ්‍යයීභාව සමාසො, අබ්‍යයීභාව සමාසයද; †කම්මධාරයක තප්පුරිසා චෙ, කර්මධාරය තත්පුරුෂ යන දෙදෙනාද; ද්වන්දො ච, ද්වන්ද්වයද; බහුබ්බීහි ච, බහුව්‍රීහිය යන මොහු, (පිළිවෙලින්) පුබ්බපරූභයඤ්ඤපදත්ථ; පූර්වපදාර්ථයද උත්තරපදාර්ථයද උභයපදාර්ථයද අන්‍යපදාර්ථයද; පධානා, ප්‍රධානකොට ඇත්තාහු; ඤෙය්‍යා, දතයුත්තාහුයි—

(අබ්‍යයීභාව සමාසය පූර්වපදාර්ථ ප්‍රධානය කර්මධාරයද තත්පුරුෂයද උත්තරපදාර්ථ ප්‍රධානය දිගුසමාසයද තප්පුරිසයෙහි ම ඇතුලත් වනහෙයින් හෙද උත්තරපදාර්ථ ප්‍රධානය ද්වන්ද්වය උභයපදාර්ථ ප්‍රධානය බහුව්‍රීහිය අන්‍යපදාර්ථ ප්‍රධාන යයි සේයි—කෙසේය යත් උපනගරං යි කී කල නගරසමීපය ම මුඛ්‍යව හැගේ ඒ සමීපාර්ථයද පූර්වපදවූ උප ශබ්දයාවිසින් වාච්‍යවූව-මහාවීරො යන්නෙහි මහත්ත්ව ගු

---

* "ලක්ෂණානුසාරෙණ ප්‍රවෘත්තිනාභාෂා ව්‍යවස්ථිත විභාෂා" යනු බැවින් ප්‍රයොගානුසාරයෙන් දක්වූදෙය ව්‍යවස්ථිතවිභාෂා නම්—

† "කම්මධාරයක" යි-ස්වාර්ථයෙහි ක ප්‍රත්‍යය කළේ ඡන්දස්පිණ්ඩිය යයි සේයි—මේ ඡන්දස අචලධෘතිය යි—

ණයෙන් යුක්තව හැගෙන්නේ වීරො යන උත්තර පදයාවිසින් වාච්‍යවූ අර්ථය යි—ගාමං ගතො යන්නෙහි ගතො යන උත්තර පදයෙන් වාච්‍යවූ පුරුෂාදිවූ අර්ථය ම මුඛ්‍යව හැගේ—තිලොකං යන්නෙහිද උත්තරපදවූ ලොක ශබ්දයෙන් වාච්‍යවූ අර්ථයමැයි ත්‍රි සංඛ්‍යාවෙන් යුක්තව හැඟෙන්නේ—චන්දසූරියා තිට්ඨන්ති යන්නෙහි චන්ද ශබ්දයෙන්ද සූරිය ශබ්දයෙන්ද වාච්‍යවූ අර්ථයෝ දෙදෙන ම ඒකස්ථිතික්‍රියාව කරන්නාහු මුඛ්‍යව හැඟෙත්—ආගතසමණො විහාරො යන්නෙහි ආගත ශබ්දයෙන්ද සමණ ශබ්දයෙන්ද වාච්‍යවූ අර්ථය හැර විහාරො යන අනික් පදයකින් වාච්‍යවූ අර්ථය හැගේ-මෙසේම සෙසු තන්හි ද දතයුතුයි)—

සමාසො—සමාසය නිමි—

---

වා ණ—පෙ—වා ය, ණෙ ය, අපච්චෙ ය, යන්නු පදයි—ඡට්ඨන්තා, ෂෂ්ඨ්‍යන්තවූ; සද්දා, ශබ්දයාකෙරෙන්; තස්ස, ඔහුගේ; අපච්චං ඉති, දරුය යන; අත්ථේ අත්ථෙ, මේ අර්ථය කිවමනා කල්හි; ණෙ, ණ ප්‍රත්‍යයතෙමේ; වා හොති, විකල්පයෙන් වේ—(අපච්ච ශබ්දයෙන් පුත්‍ර ද දුවද කියත්)—

වාති, වා යන්නු; වාක්‍යත්ථං, වාක්‍යය පිණිසයි—ණෙ නෙව, ණ ප්‍රත්‍යයාවිසින් ම; අපච්චත්ථස්ස, අපත්‍යාර්ථයා තමා; වුත්තත්තා, කියනලදහෙයින්, අපච්ච සද්දස්ස, අපච්ච ශබ්දයාගේ; අප්පයොගො, "වුත්තත්ථාන මප්පයොගො" යි; අප්‍රයොග වේ—තෙසං—පෙ—"තෙසං විභත්තියො ලොපා ච" යන සූත්‍රයෙහි; තෙසං ගහණෙන, තෙසං ග්‍රහණයෙන්; විභත්තිලොපො, විභක්තිහට ලොප්වේ—තථා, එසේම; උත්තරත්‍ර, මත්තෙහිදු—(අපච්ච සංසට්ඨ තරති යනාදි ශබ්දයන්ගේ අප්‍රයොගද තෘතීයාදීන්ට ලොප්ද මෙසේ ම දතයුත්තේය යි සේයි)-

තෙසං—පෙ—"තෙසං ණො ලොපං" යි; පච්චයානං, ප්‍රත්‍යයන්ගේ; ණස්ස, ණ කාරයහට; ලොපො, ලොප්වෙයි—

වුඩ්ඪා—පෙ—"වුඩ්ඪාදිසරස්ස වා සංයොගාන්තස්ස සණෙ ච" යි; සණ කාරෙ පරෙ, ණ කාරසහිත ප්‍රත්‍යයා පරකල්හි; අසංයොගාන්තස්ස, සංයොග අන්තකොට නැත්තාවූ; ආදිසරස්ස, පදාදිවූ ස්වරයහට; වුඩ්ඪි, වෘඩි වේ—තස්සා පි, ඒ වෘඩියගේද; අනියමෙ, නියමයක් නැතිකල්හි—

අඉු—පෙ—අඉුවණ්ණානං ය, එ ය, ආයො ය, වුඩ්ඪි ය, යන්නු පදයි— අකාරිවණ්ණුවණ්ණානං, අ කාරය, ඉ වර්ණය, උ වර්ණය, යන මොවුන්ට; ආ එ ඔ, ආ ය, එ ය, ඔ ය, යන මොහු; වුඩ්ඪියො හොන්ති, වෘද්ධිහු වෙත්—ව සද්දෙන, ච ග්‍රහණයෙන්; කුචි, කිසි තැනෙක්හි; න, වෘද්ධි නොවේ—සරලොපාදි, සවරලොප් ප්‍රකෘති යනාදිය ජේ—(සරලොපො මාදෙසා දින් සවරලොප්ප්‍රකෘතිද වෙයි සේයි)—තද්ධිතන්තා, තද්ධිතහෙයින්; නාමච්ච, නම්බඳු; කතෙ, කළකල්හි; යකදි, සි ආදි විභක්ති වේ—

තද්ධිතා, තද්ධිතසෝත්තුමු; අභිධෙය්‍ය, අභිධෙය්‍යයා වැනිවූ; ලිඞ්ග, ලිඞ්ගයා; විභත්ති, විභක්තිහු; වචනා, වචනඇත්තාහු, සියුං, වන්නාහ; (ඔවුහු දු කෙරෙන් විශෙෂනියනුලැබෙයි) සමූහභාවජ, සමූහාර්ථයෙහිදු භාවාර්ථයෙහිවූ ප්‍රත්‍යයෝද; සකත්ථෙ, ස්වාර්ථයෙහිවූ, ණෙක, ණ්‍ය ප්‍රත්‍යයාද; භියෙන, බොහෝසේ; නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහිය; තා තු, සමූහයෙහිද භාවයෙහිද කළාවූ තා ප්‍රත්‍යය,වන්‍තෙහි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි ය; ධාදි, ධා ප්‍රත්‍යය ආදිකොට ඇති; ඨං පච්චයන්තා,ඨං ප්‍රත්‍යය අන්තවූ; තෙ, ඔහු; නිපාතා, නිපාතයෝයි—(නිපාත යන්නෙන් අලිඞ්ගයයි සේයි)—

වසිට්ඨස්ස, වසිට්ඨයාගේ; අපච්චං, දරුවූ, පොසො, පුරුෂතෙම; වාසිට්ඨො, වාසිට්ඨ නම්—වසිට්ඨස්ස අපච්චං ඉත්ථි—වාසිට්ඨී-කියාද—

වසිට්ඨස්ස අපච්චං නපුංසකං—වාසිට්ඨං—කියාද යොදනු—

(වාසිට්ඨ නිතන්හි ණ අනුහෙයින් ණව ණිකා දීන් ස්ත්‍රීලිඞ්ගයෙහි ඊ වේ—අපච්ච ශබ්දය නියතනපුංසකලිඞ්ගහෙයින් ස්වරූපයෙන්ම සිට පුරුෂ ස්ත්‍රී දෙදෙනාහට විශෙෂණ වේ)—*

විකප්ප විධානතො, තද්ධිත විකල්පයෙන් කළහෙයින්; තද්ධිතෙන, තද්ධිත ප්‍රත්‍යයාවිසින්; සමාසස්ස, සමාසයහට, අච්චන්තං, අත්‍යර්ථයෙන් ම; බාධාය, බාධාවගේ; අභාවා, නැතිහෙයින්; වසිට්ඨාපච්චන්තිපි, වසිට්ඨාපච්චං, කියාද; හොති, වේ†—

සාමඤ්ඤ, සාමාන්‍යයන්; අභිමතෙ, අභිමතකල්හි; සද්දෙ, ශබ්ද

---

* ස්ත්‍රීපුංසයො රප්‍රත්‍යයාන්තාඃ යන වචනහෙයින් අපත්‍යාර්ථයෙහි කරණලද ප්‍රත්‍යයාන්තයෝ සංස්කෘතයෙහි පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ගයෙහිම වෙති නපුංසක ලිඞ්ගයෙහි නොවෙති—මේ මාගධයෙහි වූකලි තුන්ලිඞ්ගයෙහි ම පැනෙත්—

† මේ ෂෂ්ඨී තත්පුරුෂයි—

(වසිට්ඨස්ස අපච්චං වසිට්ඨාපච්චං කියා සමාසකළ කල්හිදු-වසිට්ඨාපච්ච ශබ්දයෝ වාසිට්ඨ ශබ්දයාගේ අර්ථයම හැහෙයි සේයි)—

යතෙම්; භූමෙන වා, පුල්ලිඞ්ගයෙන් හෝ; නපුංසකෙන වා, නපුංසකලිඞ්ගයෙන් හෝ; නිද්දිස්සන්ති, දක්වනුලැබේ නුයි; සද්දසත්ථවිදූ, ශබ්දශාස්ත්‍ර දන්නාහු; විදූං, දනිත්—

(තද්ධිතයන් තමන් වාච්‍ය ලිඞ්ගද වූව සාමාන්‍ය විවක්ෂාවක් ඇදිතල්හි පුල්ලිඞ්ගයෙන් හෝ නපුංසක ලිඞ්ගයෙන් හෝ මෙයින් මතු දක්වනුලැබෙති විශෙෂ විවක්ෂාවක් ඇතිකල්හි වාච්‍ය ලිඞ්ගයෝ යි—මෙසේම කිතකයෙහිද දන්න)—

වා ඉති, වා යනුද; අපච්චෙ ති ච, අපච්චෙ යනුද; අධිකාරො, වැටේ—

ණාය—පෙ—ණ යන ය, ණාන ය, වච්ඡාදිතො ය, යනු පදයි—

වච්ඡාදිතො, වච්ඡ ශබ්දයා ආදිකොට ඇති; ගොත්තගණතො, ගොත්‍රගණ වාචී ශබ්දගණයාකෙරෙන්; ණායනො, ණායන ප්‍රත්‍යයද; ණානො ච, ණාන ප්‍රත්‍යයද; හොති, වේ—පඨමන්තප්පභුති, ප්‍රථමාන්තයා පටන්කොට; අපච්චං, දරුවෝ; ගොත්තං, ගොත්‍ර නම් වෙත්—කච්චස්ස, කච්චයාගේ; අපච්චං, අපත්‍යතෙම; කච්චායනො, කච්චායන නම; කච්චානො වා, කච්චාන නම් හෝ වේ—

සංයොගන්තත්තා, සංයොගයා අන්තකොට ඇතිහෙයින්; න වුඩ්ඪි, වෘද්ධි නොවේ—(මේ සාමාන්‍යයෙන් පුල්ලිඞ්ගයි—මතු දු මෙසේමැයි—වච්ඡ, කණ්හ, අග්ගිවෙස්ස, සකට, කච්ච, ගුග්ගුල, මුජ, කුජ, මේ ආදී වච්ඡාදී ගණයයි)—

ණෙය්‍යො-පෙ—"ණෙය්‍යො කත්තිකාදීහි" යි; ණෙය්‍යො, ණෙය්‍ය ප්‍රත්‍යය වේ—විනතාය, විනතාවගේ; අපච්චං, පිත්තෙම; වෙනතෙය්‍යො, වෙනතෙය්‍ය නම්-විනතෙය්‍යවා, විනතෙය්‍යයිතියාද වේ—

(විනතා නම් ගරුඩ මාතාව යි)—පක්ඛෙ, එක් පක්ෂයෙහි; න වුඩ්ඪි, වෘද්ධි නොවේ—("අයුවණ්ණානං චායොවුඩ්ඪි" යන්නෙහි ච ග්‍රහණයෙන් වෘද්ධි නොවෙයි සේයි)—කත්තිකා, විනතා, රොහිණී, ගඞ්ගා, කද්දම, නදී, අන්තා, අහි, කපි, සුචි, බාල, මේල, කොල—මේ ආදී කත්තිකාදියි)—ණෙය්‍යොති, "ණෙය්‍යො" යි කියා; යොගවිභාගෙන, සූත්‍රය දෙකක් කිරීමෙන්; තස්ස, ඔහට; දියතෙති, දෙනුලැබෙයි යන; අඤ්ඤෙපි, අර්ථයක් කිවමනා කල්හිද; ණෙය්‍යො, ණෙය්‍ය ප්‍රත්‍යය වේ—දක්ඛිණා, සත්කාර දනාය; යස්ස, යමක්හට; දියතෙ, දෙනුලැබේද; සො, හෙතෙමේ; දක්ඛිණෙය්‍යො, දක්ඛිණෙය්‍ය නම්-(මෙසේම ප්‍රයොගානුසාරයෙන් අර්ථ විශෙෂයෙන් ඇතද ණෙය්‍ය ප්‍රත්‍යයද දතයුතුයි)—

අතො—පෙ—අතො ය, ණිය, වා ය, යනු පදයි—

අකාරන්තතො, අකාරාන්ත ශබ්දයාකෙරෙන්; අපච්චෙ, අපත්‍යාර්ථ

සත් නිවම්නාතල්හි, ණි, ණි හොවේ: වා හොති, විකල්පයෙන් වෙයි—ජූනා වා සදෙදුනා, නැවත වා ග්‍රහණයෙන්; ණිකො, ණක ද වේ—අකාරනතා, අකාරාන්තයා කෙරෙන්ද: අන කාරනතා ච, අකාරාන්ත නොවන්නාවූ ශබ්දයාකෙරෙන්ද; ඛො පි, බ ප්‍රත්‍යයද වේ-දක්ඛස්සාපච්චං දක්ඛි—(ණි වූතැනියි) සක්‍යපුත්තස්සාපච්චං සක්‍යපුත්තිකො—(ණික යි—මේ දෙඋදහරණයෙහි සංයොගාන්තයෙයින් වෘධි නොවේ)—මණ්ඩිස්ස අපච්චං මණ්ඩිබෙබා—(අකාරාන්තයා කෙරෙන් බ වූ තැනි—භාතුනො අපච්චං භාතුබෙබා—බෑයාගේ පිනි—විත්ත:, "පරවෙභාවො ඨානෙ" යි, ඛකාරයාට විත්ව වේ—

ණවො—පෙ—"ණවො පගවාදිහි" යි, ණව වේ—(උපගු ශබ්දාදීන් කෙරෙන් ණව ප්‍රත්‍යය වේ)—මනුනො, මනුහුගේ; අපච්චං, පිත්තෙවේ; මානවො—(උපගු, මනු, භගු, පණ්ඩු, උපකච්ඡායු, උපබින්දු, මේ ආදී උපගවාදියි) ණෙර—පෙ—"ණෙර විධවාදිතො" යි, විධවා ශබ්දාදීන්කෙරෙන්; ණෙර වේ-සමණස්ස අපච්චං සාමණෙරො-(විධවා, වන්ධකී, සමණ, නාළික, මේ ආදී විධවාදියි—

---

යෙන—පෙ—ණිකොයි; සංසට්ඨ යනාදිවූ අර්ථයෙහි ණික වේ—වා කාරෙන, වා ග්‍රහණයෙන්; නෙකත්ථෙ, නොයෙක් අර්ථයෙහි; නෙකප්පච්චයා ච, නොයෙක්ප්‍රත්‍යයෝ ද වෙත්—

සතෙන, තිතෙලින්; සං සට්ඨො, මිශ්‍රකරණලද්දේ; සාතිකො, සාතික නම්—උදනො, බතයි—උළුම්පෙන, පසුරෙන්; තරතීති, එතරවේනුයි; ඔළුම්පිකො, ඔළුම්පික නම; උළුම්පිකො වා, උළුම්පිකය යි කියාද වේ—පකෙඛ, එක් තැනෙක්හි; න වුඩ්ඪි, වෘධි නොවේ—සකටෙන්, ගැළින්; චරතීති, හැසිරේනුයි; සාකටිකො, සාකටික නම්

සිසෙන, හිසින්; වහතීති, උසුලානුයි; සීසිකො, සීසික නම්—න වුඩි, (සීසිකො යී කිතැන) වෘඩි නොවේ—ඉත්ථිලිඞ්ගතො, ස්ත්‍රී ලිඟු ශබ්දයන්කෙරෙන්; එය්‍යකො, එය්‍යක ප්‍රත්‍යයද; ණකො ච, ණක ප්‍රත්‍යයද වේ—චම්පායං, චම්පායෙහි; ජාතො, උපන්නේ; චම්පෙය්‍යකො, චම්පෙය්‍යක නම්—බාරාණසියං, බාරාණසියෙහි; ජාතො, උපන්නේ; බාරාණසෙය්‍යකො, බාරාණසෙය්‍යක නම්—ණකොච, ණක ද කියනුලැබේ—කුසිනාරායං, කුසිනාරායෙහි; වසතීති, වෙසේනුයි; කොසිනාරකො, කොසිනාරක නම්—ජනපදතො, ජනපදවාචි ශබ්දයන්කෙරෙන්; *ණක වෙයි යොදනු)—මගධෙසු, මගධ දෙශ

---

* (ජනපදතො ණකො ච කියා බාලාවතාර පොත්වල පෙනේ—නුමුත් මෙහි ණකො යනු ශෙෂපාඨවසයෙන් යොදන්ට කියනලදි-මේසන්නය කළකාලයෙහි ඒ ණකොච යනු පොතෙහි නොතිබූ නසේ හැගේ)—

යෙහි; වසන්ති, වෙසෙත්නුයි හෝ; තස්ස, ඒ මගධයාගේ; ඉස්සරොවා ඊශ්වරයහෝ; මාගධකො, මාගධක නම්—තජ්ජාතියා, ඒ ජාතිහෙයින්; විසිට්ඨෙනෙ, වෙසෙසනලද යන අර්ථයෙහි; ආජනියෙන, ආජනිය්‍ය ප්‍රත්‍යය වේ—අස්සජාතියා, අශ්වජාතීන්; විසිට්ඨො, වෙසෙසනලද්දේ; අස්සාජනියෙන, අස්සාජනිය්‍ය නම්—ඤ්ඤ, ඤ ප්‍රත්‍යයවේ—අග්ගනති, අග්‍රයයි; ජනිතබ්බං, දතයුතේතේ; අග්ගඤ්ඤං, අග්ගඤ්ඤ නම්—චිත්තං, ඤ කාරච්ත්ව වේ—(මේ සාමාන්‍යයෙන් නපුංසකලිඟු යෙන් දක්වූයේ-විශෙෂ විවක්‍ෂායෙහිදී අග්ගඤ්ඤපුමා-අග්ගඤ්ඤ ඉත්ථී—අග්ගඤ්ඤං කුලං—යි අභිධෙය්‍යයට බඳු ලිඟුලැබෙයි—මෙශ්ම සෙසුතාන්හි ජනතාදිවූ අර්ථයෙහි එය්‍යකාදි ප්‍රත්‍යය වා කාරයෙනි)—

තම—පෙ—තං ය, අධිතෙ ය; තෙන ය, කතාදි සන්නිධානනියොගසිප්පහණ්ඩජීවිකත්තෙසුය, ච ය, යනු පදයි—

තං, ඒ; අධීතෙ, හදූරයි යන; ඉච්චාදිසු, මේ ආදිවූ; අත්ථෙසු. අර්ථයෙහි ද; ආදිසද්දෙන, ආදිශබ්දයෙන්; හතාදිසු ච, හතාදිවූ අර්ථයෙහිද; ණිකො, ණික ප්‍රත්‍යය; වා හොති, විකල්පයෙන් වේ-අභිධම්මං, අභිධර්මය; අධීතෙති, හදූරාතුයි; ආභිධම්මිකො, ආභිධම්මික නම; අභිධම්මිකො වා, අභිධම්මික යයිද වේ-පක්ඛෙ, එක් පක්‍ෂයෙක්හි; නවුඩි, වෘද්ධිනොවේ—වචසා, තෙප්ලෙන්; කතං, කරණලද; කම්මං, කර්මය; වාචසිකං, වාචසික නම්—මානසිකං, මානසිකං යනු ද; එවං, මෙසේමැයි;" එත්ථ, මේ වාචසිකං යන්නෙහි, "සසරෙවාගමො" ති, සසරෙවාගමො යන; ඉහ, මෙහි; අනුවත්තිත,(ඔබෙබහි සුතුරෙන්) අනුප්‍රාප්තිකරණලද; ආදිසද්දෙන, ආදිශබ්දයෙන්; සාගමො, සකාරාගම වේ—සරීරෙ, ශරීරයෙහි; සන්නිධානා, සන්නිහිතවූ; වෙදනා, වේදනාතොමෝ; සාරීරිකා,—(මෙහි වාච්‍යවූ වේදනාව ස්ත්‍රී ලිඟු හෙයින් නිකාරාන්තයාකෙරෙන් "ණවණික ණෙය්‍යණන්තුහි" යි ඊප්‍රත්‍යකළමනාතන්හි ආ ප්‍රත්‍යය පෙනෙයි-මේ චින්ත්‍යයි)-වාරෙ, දෙරෙහි; නියුතෙත්තා, යෙදෙනලද්දේ; දෙවාරිකො—

එත්ථ, මෙහි—මාලූ—පෙ—"මාලූනමාගමො ඨානෙ" යි; චකාරතො, චකාරයාකෙරෙන්; පුබ්බෙ, ආදියෙහි; ඔකාරගමො, ඔකාරාගමවේ—සිප්පානි, ශිල්පනම්; ගීතාදිකලා, ගීතාදිවූ කලාය—වීණා, වීණාතොමෝ; අස්ස, මෝ හට; සිප්පානි, ශිල්පතුයි; වෙණිකො—අත්‍ර, මෙහි; වීණෙති, වීණානම්; වීණාවාදනං, (උපචාරයෙන්) වීණාවාදනයයි—ගන්ධො, සුවඳතෙමේ; අස්ස, මෝහට; භණ්ඩනානි, බඩුනුයි; ගන්ධිකො—මගෙ, මෘගයන්; හනාත්වා, මරා; ජීවතිති, ජීවිකා කෙරේනුයි; මාගවිකො, මාගවික නම්—චකාරාගමො, යවමදනාදින් ච කාරාගම වේ—ජාලෙන, දැලින්; හතො, මරණලද්දේ; ජාලි

තො—සුතෙතන. හුයින්; බඩො, බඳනාලද්දේ; සුත්තිකො—වාපො, දුන්නා; අස්ස, මෝහට; ආබුධොති, ආබුධනුයි; වාපිකො—වාගතා, වාතයතෙමේ; අස්ස, මෝහට; ආබාධො, රෝගනුයි හෝ; අභජිතිවා, ඇත්තුයි හෝ; වානිකො—බුඩෙ, සර්වඥයාකෙරෙහි; පසනෙනා, පහන්වූයේ; බුඩිකො-වණෙන, වසනුයෙන්; කිතං, ගන්නාලද! භණ්ඩං භාණ්ඩය; වජ්ජිකං—කුමෙභා, කුම්භයතෙමේ; පරිමාණං, පමණවූයේ; අස්ස, මෝහටනුයි හෝ; තං, ඒ කුම්භය; අරහති, වටිනුයිහෝ; තෙසං, ඒ කුම්භයන්ගේ; රාසිවා, රැසහෝ; කුම්භිකො, කුම්භික නම්—(මෙහි කුම්භශබ්දය මානවිශෙෂවාචියි)-අකෙඛාන, පසඇටින්; දිබ්බතිති, කෙළිනුයි; අක්ඛිකො—මගධෙසු, මගධරට; වසතිති, වෙසේනුයි හෝ; ජාතො, උපන්නුයිහෝ; මාගධිකො, මාගධික නාම ඉච්චාදි, මේ ආදි වේ-(ජාලිකො යනාදිය ආදිග්‍රහණයෙහි ඵලයි)—

---

ණරා—පෙ— ණ ය, රාගා ය, තෙන ය, රත්තං ය, තස්ස ය, ඉදං ය අඤ්ඤෙසු ය, ච ය, යනු පදයි—තෙන, ඒ කාරණකොටගෙන; රත්තනති, රඳනාලද යනා; අඤ්ඤෙසු, මේ ආදිවූ අර්ථයෙහි; ණෙ; ණ ප්‍රත්‍යය; වා හොති, විකල්පයෙන් වේ—(රැඳීම නම් වර්ණාන්තරයකට පැමිණීමයි)-කසාවෙන, කෂායෙන්; රත්තං, රඳනාලද්දේ; කාසාවං, කාසාව නම්—නීලං පීතං ඉති, නීලං පීතං යනා; ආදි, මේ ආදියද; එවං මෙසේමැයි-(නීලෙන, නිලින්; රත්තං, රඳනාලද්දෙ; නීලං-පීතෙන, රන්වණින්; රත්තං, රඳනාලද්දේ; පීතං)-න වුඩ්ඪි, නීල පීත යන දෙතන්හි පෙරසේ වෘඩ්ධිනොවේ *—මහිසස්ස, මීහිහුගේ; ඉදං, මේ; මාහිසං, මාහිස නම; සිංගං, අඟයි—රාජපොරිසං, රාජපොරිසං යනුද; එවං, මෙසේමැයි—(රාජපුරිසස්ස ඉදං රාජපොරිසං)-එත්ථ, මේ රාජපොරිසං යන තන්හි; අසුවණ්ණානං චාදෙ, "අසුවණ්ණානං චායො වුඩ්ඪි" යන්නෙහි; පුන, නැවත; වුඩ්ඪිග්ගහණෙන, වෘඩ්ධිග්‍රහණයෙන්; උත්තරපදස්ස, පර පදයහට; වුඩ්ඪි, වෘඩ්ධි වේ—(උකාරයට ඔකාරයෙක් වේ—වුඩ්ඪාදිසරස්ස වා යනාදි සූත්‍රයෙන් වෘඩ්ධිග්‍රහණය "අසුවණ්ණානං චායො වුඩ්ඪි" යන්නට වැටෙතුදු නැවත එහි වෘඩ්ධිග්‍රහණයෙන් සමාසයෙහි පරපදයහට වෙයි සේයි)—මගධෙහි, මගධයෙන්; ආගතො, ආයේ හෝ; තත්‍ර, ඒ මගධයෙහි; ජාතො, උපන්නේ හෝ; තස්ස, ඒ මගධයට, ඉස්සරො, ප්‍රධානවූයේ හෝ; සො, ඒ මගධයතෙමේ; අස්ස, මෝහට; නිවාසොති වා, නිවාසනුයි හෝ; මාගධො, මාගධ නම—(නිවසන්තෙත්ථාති නිවාසො—නිවාස නම් වසනතැනයි)—කත්තිකාදිහි, කැතිනැකතින් හා පුත්සඳින්; ඵුස්සෙනා,

---

* "න වුඩ්ඪි නීලපීතාදෙ පච්චයෙ ණණකාරකෙ" යයි-නීයේමනු—

යෙදුණේ; කත්තිකො, කත්තිකා නම්; මාසො, හිල්මසයි; (නක්ෂත්‍ර වාචී කත්තිකා ශබ්දය බහුවචනයි)—

බුද්ධො, බුදුතෙමේ; දෙවතා, දෙවිවූයේ; අස්ස, මෝහටනුයි; බුද්ධො- (සංයොගාන්තහෙයින් වෘද්ධි නැති) ව්‍යාකරණං, ශබ්දශාස්ත්‍රය; අධෙච්ච, දැන; අධිතෙති, හදුරාතුයි; වෙය්‍යාකරණෝ-එනම්, මේ වෙය්‍යාකරණ යන තන්හි; මායූනමාදිනා "මායූනමාගමො ඨානෙ" ය යි; යකාරතො, යකාරයාකෙරෙන්; පුබ්බෙ, ආදියෙහි; එ ආගමො, එකාරාගම වේ; යස්ස, යකාරයට; විත්තං, විත්ත වේ—සගරෙහි, සගරයන්විසින්; නිබ්බත්තො, නිපදවනලද්දේ; සාගරො-ඉති ආදි, මේ ආදිය වේ—(මාගධො යනාදිහැම අඥ්ඤත්‍රෝත්සු යන්නෙහි එලයි)—

ජාතා—පෙ—ජාතාදීනං ය, ඉම්යා ය, ච ය, යන්නු පදයි—ජාතාදිසු; ජාතාදිවූ අර්ථයෙහි; ඉමො, ඉම ප්‍රත්‍යයද; ඉයො ච, ඉය ප්‍රත්‍යයද, හොති, වෙයි; ච සද්දෙන, ච ග්‍රහණයෙන්; කියො ච, කිය ප්‍රත්‍යයද වේ—පච්ඡා, පසුව; ජාතො, උපන්නේ; පච්ඡිමො—මනුස්සජාතියා, මනුෂ්‍යජාතියෙහි; ජාතො, උපන්නේ; මනුස්සජාතියො—අන්තො, කෙළවර; නියුත්තො, යෙදෙනලද්දේ; අන්තිමො; අන්තිම නම; අන්තියො, අන්තිය නමුදු වේ—අන්ධකියො, අන්ධකියො යනුද; එවං, මෙසේමැයි—(අන්ධෙ නියුත්තො අන්ධකියො, අන්ධයාකෙරෙහි යෙදෙනලද්දේ; අන්ධකිය නම්-මේ කිය ප්‍රත්‍යයයි)-පුත්තො, පුතුතෙම; අස්ස, මෝහට, අත්ථි, ඇත්තුයි; පුත්තිමො, පුත්තිම නම; පුත්තියො, පුත්තිය නමුදු වේ—(මේ අස්ත්‍යර්ථයෙහි ඉම ඉය යි) කප්පියො, කප්පියො යනුද; එවං, මෙසේමැයි; (කප්පො අස්ස අත්ථි කප්පියො—කැපමෝහට ඇත්තුයි කප්පිය නම්—මෙතැන ඉයයි)—

තද—පෙ—"තදස්සට්ඨානමීයොචෙ" යි; ඊයො, තං අස්සඨානං යන අර්ථයෙහි ඊය ප්‍රත්‍යයවෙයි; ච කාරෙන, චග්‍රහණයෙන්; හිතාදීනත්ථෙපි, හිතාදිවූ අර්ථයෙහිදු ඊය වේ—බන්ධනස්ස, බැඳුමට; ඨානං, කාරණවූයෙ; බන්ධනියං—චඛකම්මනස්ස, සක්මනට; හිතං, හිතවූයේ; චඞ්කමනියං—

ආලු—පෙ—"ආලු තබ්බහුලෙ" යි, තබ්බහුලාර්ථයෙහි ආලු වේ—අභිජ්ඣා, ලොභය; බහුලො, බොහෝකොට ඇත්තේ; අභිජ්ඣාලු—.

විසෙසෙ—පෙ—විසෙසෙ ය, තරතම්ස්සිකියිට්ඨා ය, යන්නු පදයි—අතිසයත්‍ථෙ, අතිශයාර්ථයෙහි; තරාදයො, තර ය තම ය ඉස්සික ය ඉය ය ඉට්ඨ ය යන මොහු; හොන්ති, වෙත්—අයං, මෙතෙම; එතෙසං, මොවුන්අතුරෙහි; අතිසයෙන, විශෙෂයෙන්ම; පාපොති, පව්ටුනුයි; පාපතරො, පාපතර ය; පාපතමො, පාපතම ය; පාපිස්සිකො, පාපිස්සික ය; පාපියො, පාපිය ය; පාපිට්ඨො වා, පාපිට්ඨ යන් හෝ වේ—(පාප ශබ්දය ගුණයෙහි වැටෙතුදු මෙතන ගුණීහු කෙරෙහි වැ

වේ—නිසේධ යත් පාපමිස්ස අජ්ජීති යන අර්ථයෙහි ණ වූහෙයිති— මෙසේ ධම්වාචකවූ සෙසු ශබ්දයෝ ද දතයුත්තාහුයි-අතිශය ශබ්ද තෙමේ ක්‍රියා ගුණ දෙදෙනාපිළිබඳය ඒ ක්‍රියා ගුණ දෙදෙනා ද්‍රව්‍යය ක් ආශ්‍රයකොට අතිශය සහිතවියනොහෙති-එහෙයින් ක්‍රියා ගුණ දෙදෙනාට ආශ්‍රයවූ ද්‍රව්‍යබලයෙන් ඔවුන්ගේ අතිශය හැඟේයි ඒ අතිශය සහිතවූ ක්‍රියාගුණ දෙදෙනා විසින් යුක්තවූ ද්‍රව්‍යයද අතිශය සහිත නම් වෙයි-එහෙයින් ඒ ක්‍රියාගුණයුක්ත ද්‍රව්‍යවාචක ශබ්දයන් කෙරෙන් තරාදිහු වන්නාහුදු ගුණයුක්ත ද්‍රව්‍යවාචීන්කෙරෙන් තරාදීහුම වෙති—ක්‍රියායුක්තද්‍රව්‍යවාචීන්කෙරෙන් තර තම දෙදෙන වෙත්—ක්‍රියාවිෂයද උදහරණ නොපැමිද පාචකතරො පාචකතමො යනාදියයි දතයුතුයි)—

වුඩ—පෙ—"වුඩ්ඪස්ස ජෙ ඉයිට්ඨෙසු" යි; ඉය ඉට්ඨ යන මොවුන් පරකල්හි; වුඩ්ඪස්ස, වුඩ්ඪ ශබ්දයහට; ජාදෙසෙ, ජකාරාදෙශ කළකල්හි; සරලොපාදෙ, "සරලොපොමාදෙසපච්චයාදිම්හි" යනාදියෙහි; පකතියාගහණෙන, ප්‍රකෘතිග්‍රහණයෙන්; පකත්‍යභාවා, ප්‍රකෘතිවත් නොවීමෙන්; ඉස්ස, ඉ කාරයහට; එ" කචාසවණ්ණං ලුත්තෙ" යි, ඒ වේ—(අයං, මෙතෙම; එතෙසං; මොවුන්අතුරෙහි; අතිසයෙන, විශෙෂයෙන්; වුඩ්ඪො, මහලු තුයි;) ජෙය්‍යො, ජෙය්‍ය නම; ජෙට්ඨො, ජෙට්ඨ නමුදු වේ—

පසත්‍ථ—පෙ—"පසත්‍ථස්ස සො ච" යි; සාදෙසෙ, ඉය ඉට්ඨ යන මොවුන් පරකල්හි පසත්‍ථ ශබ්දයහට ස කාරාදෙශ කළ කල්හි; (ආදිය මෙසේ ප්‍රකෘතිග්‍රහණයෙන් ප්‍රකෘතිවත් නොවනහෙයින් ඒකාරයක් කළකල්හි අයං, මෙතෙම; එතෙසං, මොවුන්අතුරෙන්; පසත්‍ථො, පසස්නාලද්දේ) සෙය්‍යො, සෙය්‍ය නම; සෙට්ඨො, සෙට්ඨනම—(ජේ යනාදි සතරම ගුණවිශෙෂයට නම්යි)—

තද—පෙ—"තදස්සාත්‍ථීති වීච" යි, තං අස්ස අත්‍ථීති යන අර්ථයෙහි; වී, වී ප්‍රත්‍යය වේ—මෙධා, නුවන; අස්ස, මොහුට; අත්‍ථීති, ඇත්තේය යන අර්ථයෙහි; මෙධාවී— (ආදිශබ්දයෙන් මායාවී යනුයි)—

එවං, මෙසේ; අත්‍ථ්‍යර්ථයෙහි ම යයි සේයි—

තපා—පෙ—"තපාදිතො සී" යි; තපාදීන්කෙරෙන්; සි, සි වේ—විත්තං, (සකාරයහට) විත්ත වේ—තපං, අස්ස අත්‍ථීති තපස්සී, තපස මොහට ඇත්තුයි තපස්සී නම්—(තපාදීහු නම් මනොගණයෙහි ශබ්දයෝයි)—

දණ්ඩ—පෙ—"දණ්ඩාදිතො ඉකඊ" යි, දණ්ඩශබ්දාදීන්කෙරෙන්; ඉකො, ඉකද; ඊ ච; ඊ යන ප්‍රත්‍යයද වේ—දණ්ඩො අස්ස අත්‍ථීති දණ්ඩිකො—දඬුමොහට ඇත්තුයි දණ්ඩික නම්—දණ්ඩීනමුදු වේ—

ගුණ-පෙ-"ගුණාදිතො වන්තු" යි ගුණ ශබ්දාදීන්කෙරෙන්; වන්තු,

වන්තු ප්‍රත්‍යය වේ—ගුණෝ අස්ස අත්ථීති ගුණවා—පඤ්ඤා අස්ස අත්ථීති පඤ්ඤවා—යදාදිනා, යදනුපපන්නානාදීන්; රස්සො, පඤ්ඤා ශබ්දයාගේ ආකාරයට හ්‍රස්ව වේ—(මේ දෙසුතුර අවණ්ණාන්තවිෂයයි)—

සත්‍යා—පෙ—"සත්‍යාදීහි මන්තු" යී, සති ශබ්දාදීන්කෙරෙන්; මන්තු, මන්තුප්‍රත්‍යය වේ—සති අස්ස අත්ථීති සතිමා—භානු අස්ස අත්ථීති භානුමා—(භානු ශබ්දයෙන් හිරුද රශ්මියද කියත්—මේ සූත්‍ර ඉවණ්ණාන්ත උවණ්ණාන්ත විෂයයි)—

ආයු—පෙ-"ආයුස්සුකාරස්මන්තුම්හි" යී, මන්තුප්‍රත්‍යයා පරකල්හි; උස්ස, ආයු ශබ්දයාගේ උකාරයහට; අස්, අස් යන ආදේශයවේ—ආයු අස්ස අත්ථීති ආයස්මා—

සද්ධා—පෙ—"සද්ධාදිතො ණ" යී, සද්ධා ශබ්දාදීන්කෙරෙන්:(අස්ත්‍යර්ථයෙහි) ණෝ, ණ වේ—සද්ධා අස්ස අත්ථීති සද්ධෝ—(ආදිශබ්දයෙන් පඤ්ඤෝ, අඝෝ, රස්සෝ, දීඝෝ, නීලෝ, පීතෝ, යනාදියයි)—

තප්ප—පෙ—"තප්පකතිවචනෙ මයො" යී; මයො, මය වේ—සුවණ්ණෙන, රණින්; පකතං, කරණලද්දේ; සොවණ්ණමයං, සොවණ්ණමය නම; සුවණ්ණමයංවා, සුවණ්ණමයං කියාහෝ වේ—පක්ඛෙ, එක්තැනෙක්හි: යදාදිනා, යදනුපපන්නානාදීන්; වුඩ්ඪි, වැඩි වේ-(සුවණ්ණ ශබ්දයාගේ උකාරයහට ඔකාරයෙක් වෙසි සේයි)—

එතෙ-පෙ—ඒතෙසං ය, ඔ ය, ලොපෙය, යනු පදයි—විභත්තිලොපෙ, විභක්තීන්ට ලොප්වූකල්හි; මනාදීනං, මන ශබ්දාදීන්ගේ; අන්තස්ස, අන්තයහට; ඔ හොති, ඔ කාරයෙක්වේ—මනසා, සිතින්; පකතං, කරණලද්දේ; මනෝමයං-මනොමය නම්—මනොගණාදි හු නම් පෙර කී මනොගණයයි—

---

සංඛ්‍යා—පෙ—සංඛ්‍යාපූරණෙ යනු: අධිකාරෝ, වැටේ—විති-පෙ—"විතීහි තියො" යී; තියො, සංඛ්‍යාපූරණාර්ථයෙහි වි ශබ්ද ති ශබ්ද දෙදෙනාකෙරෙන්; තිය ප්‍රත්‍යය වේ—

තියෙ—පෙ—"තියෙ දුතා පිච" යී; විතීනං, වි ශබ්ද ති ශබ්ද දෙදෙනාහට; දුතා, (තිය ප්‍රත්‍යයා පරකල්හි) දු ය, ත ය, යන ආදේශයෝ ක්‍රමයෙන් වෙත්—විනනං, වි සංඛ්‍යාව; පූරණෙ, පුරන්නේ; දුතියො, දුතිය නම—(තිණ්ණං පූරණෙ තතියො යනුද) එවං, මෙසේමැයි—

චතු—පෙ—"චතුඡෙහි ථ ඨා" යී; ථ ඨා, චතු ය, ඡ ය, යන දෙදෙනාකෙරෙන් ථ ය, ඨ ය, යන දෙදෙන; ක්‍රමයෙන් වෙත්—චතුන්නං පූරණෙ චතුත්ථෝ-ඡන්නං පූරණෙ ඡට්ඨෝ-(මේ දෙතැන්හි වග්ගෝ ඝොසාඝොසාදීන් විත්ව වේ—

තෙසං—පෙ—තෙසං ය; අඩ්ඪූපපදෙන ය, අඩ්ඪුඩ්ඪදිවඩ්ඪදියඩ්ඪා ඩ්ඪතියා ච, යනු පදයි—චතුත්ථදුතියතතියානං, චතුත්ථදුතියතති ය යන ශබ්දයන්ට; අඩ්ඪූ පපදෙන සහ, අඩ්ඪ යන උප පදයාහා එක්ව; අඩ්ඪුඩ්ඪදිවඩ්ඪදියඩ්ඪාඩ්ඪතියා, අඩ්ඪුඩ්ඪ ය, දිවඩ්ඪ ය, දිය ඩ්ඪ ය, අඩ්ඪතිය ය, යන ආදෙශයෝ; හොන්ති, වෙත්—(මෙහි අඩ්ඪූ පපදවූ චතු ශබ්දයාට අඩ්ඪුඩ්ඪ ය, දුතිය ශබ්දයහට දිවඩ්ඪ ය, දි යඩ්ඪ ය, යන ආදෙශයෝ දෙදෙනාය ති ශබ්දයහට අඩ්ඪතිය වෙයි දතයුතුයි)*—අඩ්ඪෙන, අඩකින්; චතුත්ථො, සතරවනුවූයේ; අඩ්ඪු ඩ්ඪො, අඩ්ඪුඩ්ඪ නම්—අඩ්ඪෙන, අඩකින්; දුතියො, දෙවනු වූයේ; දිවඩ්ඪො, දිවඩ්ඪ නම්—දියඩ්ඪො වා, දියඩ්ඪ නමුදු වේ—අඩ්ඪෙන, අඩකින්; තතියො, තුන්වනුවූයේ; අඩ්ඪතියො, අඩ්ඪතිය නම—(මෙහි චතුත්ථ ශබ්දාදීන්හා තතියාන්තවූ අඩ්ඪ ශබ්දයහට "අමාද යො පරපදෙහි" යි, සමාසකොට පසුව අඩ්ඪ ශබ්දයහා එක්කොට චතුත්ථ ශබ්දාදීන්ට අඩ්ඪාදි ආදෙශකරනු)—

සංඛ්‍ය-පෙ—"සංඛ්‍යපූරණෙ මො" යි; සංඛ්‍යාපූරණාර්ථයෙහි; මො, ම ප්‍රත්‍යය වේ—පචන්නං පූරණෙ පචමො—ඉත්ථියං, ස්ත්‍රීලිඟුයෙහි; පචන්නං, පසක්; පූරණී, පූරන්නී; පචමී—("නදාදිතො වා ඊ" යි; ඊ වේ)—එකො ච එකොක්ද; දසචාති, දසයෙක්දයි; චඤ්ඤකතෙ, ච ඤසමාසකළ කල්හි—

වෙ—පෙ—වෙකට්ඨානං ය, ආකාරො ය, වා ය, යනු පදයි-සංඛ්‍යා නෙ, සංඛ්‍යාවාචි ශබ්දයා; උත්තරපදෙ, සමාසයෙහි පරපදකල්හි; වි එක අට්ඨ ඉති; වි ය, එක ය, අට්ඨ ය, යන මොවුන්ගේ; අන්තස්ස, අන්තයහට; ආ හොති, ආ වේ—එකාදස—පචීව, පචශබ්දයා වැනි යි—(එහෙයින් එකාදස එකාදසහි එකාදසන්නං එකාදසසු යනු වේ)—වාදස, වාදසයනුත්; එවං, එකාදස ශබ්දයාවැන්නි—(මෙච දසච යි මතුසමාසද වෙකට්ඨාදීන් ආ කාරද වේ)—වාදස—යදාදී නා, යදාදීන්; තිස්ස, ති ශබ්දයහට; තෙආදෙසො, තෙ යනාදෙශ කා ළකල්හි—එකා—පෙ-"එකාදිතො දස ර සංඛ්‍යානෙ" යි; දසස්සෙ, දස ශබ්දයෙහි; දස්ස, ද කාරයහට; රො, ර වේ—තයොච දසච තෙ රස—

චතු—පෙ—"චතුපපදස්ස ලොපොතුත්තරපදාදිචස්ස චුචොපි න වා" යි; චතුසද්දෙ, චතු ශබ්දයෙහි; තුස්ස, තු කාරයහට; ලොපො, ලොප්වේ; චස්ස, ච කාරයහට; චුච, චු යනආදේශද වේ-චත්තාරො ච දස ච චුද්දස—

---

* පුබ්බමුච්චාරිතං පදං උපපදං යනුබැවින් පළමුකොට කියනල ද පදය උපපද නම්—

දසෙ—පෙ—"දසෙ සො නිච්චං ච" යි; ජස්ස, ජ ශබ්දයහට, සො ආදෙසො, දස ශබ්දයාපරකල්හි සො යනාදෙශවේ—"ළදරානං" ති, ළදරානංයි; දසසදෙද, දස ශබ්දයෙහි; දස්ස, දකාරයහට; ළො, ළකාරයෙක්වේ—

ජ ච දස ච සොළස—අට්ඨ ච දස ච අට්ඨාදස—(මෙහි "වෙක ට්ඨානමාකාරො වා" යි දස ශබ්දයා පරකල්හි අට්ඨශබ්දයාගේ අන්තයහට ආකාරයෙක්වේ—"එකාදිතො දස ර සංඛ්‍යානෙ" යි දස ශබ්දයාගේ ද කාරයහට රවේ)—

විස—පෙ—විසතිදසෙසු බා විස්සතු" යි; විස්ස, වි ශබ්දයහට; බා, (විසති දස යන මොවුන් පරකල්හි) බා යන ආදේශවේ—වෙ ච-වීසති ච බාවීසති—එකාදසන්නං, එකොළොස්දෙනෙකු; පූරණෙ, පූරන්නේ; එකාදසමො—(මෙහි "සංඛ්‍යාපූරණෙ මො" යි—ම ප්‍රත්‍යය වේ)—

එකා—පෙ—"එකාදිතො දසස්සී" යි; ඉත්ථියං, ස්ත්‍රීලිඟයෙහි; ඊ, (එකාදින්කෙරෙන් පරවූ දස ශබ්දයාකෙරෙන් පරව) ඊ ප්‍රත්‍යයවේ; එකාදසන්නං පූරණී එකාදසී—ආදි ශබ්දයෙන් බාරසී තෙරසී යනාදියවේ—

චාදි—පෙ—"චාදිතො කො නෙකත්ථෙ ච" යි; කො, චි ශබ්දාදීන් කෙරෙන් අනෙකාර්ථයෙහි ක ප්‍රත්‍යය වේ—වෙ, දෙදෙනෙක්; පරිමාණනි, පමණවූවාහු; අසෙසනි, මෝහට තුයි; විකං, විකනම්—තීණි පරිමාණනි අසෙසති තිකං—(ආදි ශබ්දයෙන් චතුක්ක පඤ්චක ඡක්කාදියි)—

සමූ—පෙ—"සමූහත්ථෙ කණ්ණා ච" යි; කණ්ච, කණ් ප්‍රත්‍යයද; ණෙ ච, ණ ප්‍රත්‍යයද වේ—මනුස්සානං, මනුෂ්‍යයන්ගේ; සමූහො, රැස; මානුස්සකො, මානුස්සක නාම—මානුස්සො වා, මානුස්ස නම් හෝ වේ—(මේ දෙක සමූහයෙහි ප්‍රත්‍යයාන්තවූ සමූහභාවජ භියෙන යි-භිධෙය ග්‍රහණයෙන් පුලිඟද වේ)—ණෙ කතෙ, මෙමසූත්‍රයෙන් ණ ප්‍රත්‍යය කළකල්හි—

ඛල—පෙ—"ඛලානම්යුවා සරෙ වා" යි; ඉහ, මෙහි; වාකාරෙන, වා ග්‍රහණයෙන්; ඉස්ස, ඉ කාරයහට; අයාදෙසො, අය යන ආදෙශ කළකල්හි—විනානං සමූහො චයං—තිණ්ණං සමූහො තයං—(මේ දෙක නපුංසකලිඟුයි)—එවං යනු සමූහාර්ථයෙහි ම යයි ගහවනපි ණිසයි—

ගාම—පෙ—"ගාමජනබන්ධුසහායාදීහි තා" යි; තා, තා ප්‍රත්‍යය වේ—ගාමානං සමූහො ගාමතා—නාගරානං සමූහො නාගරතා—(මෙහි ආදි ශබ්දයෙන් ගන්නේ නාගරතා යනුයි—නාගරයෝ නම්

ඛ්‍යාතීයෝයි—ජනතා බන්ධුතා සහායතා යනු සුබොධහෙයින් නොදක්වූයේයි)—

---

ණ්‍යත්ත—පෙ—ණ්‍යත්තතා ය, භාවෙ ය, තු ය, යනු පදයි—භාවෙ, භාවාර්ථයක් කියවමනාකල්හි; ණ්‍යත්තතා, ණ්‍ය ය ත්ත ණ තා ය යන ප්‍රත්‍යයෝ; හොන්ති, වෙති; තු සද්දෙන, තු ග්‍රහණයෙන්; *ත්තනො ච, ත්තන ප්‍රත්‍යයද (භාවාර්ථයෙහි) වේ; සකත්ථාදිසු පි, ස්වාර්ථයෙහි ද; ණො ච, ණ්‍ය ප්‍රත්‍යය වේ; සකත්ථෙ, ස්වාර්ථයෙහි; තා ච, තා ප්‍රත්‍යයද වේ—(එක තු ශබ්දග්‍රහණයෙන් ම භාවාර්ථයෙහි ත්තන ප්‍රත්‍යයද ස්වාර්ථයෙහි ණ්‍ය ප්‍රත්‍යයද ස්වාර්ථයෙහි තා ප්‍රත්‍යයද වෙයි සේයි—මෙහි භාව නම් කිමයත්)—

අස්මා, මොහුකෙරෙන්; සද්දඤාණානි, ශබ්දඥාණ දෙදෙන; හොන්ති, වෙත්නුයි; භාවො, භාව නම; සො, ඒ භාවයතෙමේ; සද්දවුත්තියා, ශබ්දප්‍රවෘත්තියට; නිමිත්තභූතං, කාරණවූ; නාම ච, නාමයද; ජාති, ජාතිය; දබ්බං, ද්‍රව්‍යය; ක්‍රියා, ක්‍රියාය; ගුණො, ගුණය යනාමෙයි—(මෙහි භාවනම් ශබ්දප්‍රවෘත්ති නිමිත්තවූ නාමාදී පඤ්චකයයි සේයි—නාමාදි පඤ්චකයට ලක්‍ෂණ මතු කාරක ප්‍රස්ථායෙහි කියනුලැබේ—යස්මා සද්දබුද්ධියො භවන්ති සො භාවො, යමක් හේතුකොට ගෙණ ශබ්ද බුද්ධි දෙදෙන උපදිද්ද ඒ භාවනම්—හුයන්නාහුකෙරෙන් අපාදනයෙහි ණ වූ තැනි)—

යථා, මෙසේයි—චක්ඛුස්ස, චක්ඛුශබ්දයාගේ; භාවො, ප්‍රවෘත්තිනිමිත්තයතෙමේ; චක්ඛුත්තං, චක්ඛුත්ත නම්—ඉහ, මෙහි; නාමවසා, නාම් හෙයින්; චක්ඛුසද්දො, චක්ඛු ශබ්දයතෙමේ; චක්ඛුදබ්බෙ, චක්ඛුද්‍රව්‍යවූ ද්‍රව්‍යයෙහි; වත්තතෙ, පවත්ති—නිමිත්තස්සරූපානුගතං, නිමිත්ත ස්වරූපය අනුවවූ; ඤාණ ච, ඥාණයද; (නාමබලයෙන් ම චක්ඛුද්‍රව්‍යයෙහි පවත්නි යි යොදනු—චක්ඛුශබ්දය ජාතිහෙයින් හෝ ද්‍රව්‍යහෙයින්හෝ ක්‍රියාහෙයින්හෝ ගුණහෙයින්හෝ චක්ඛුද්‍රව්‍යයෙහි පවත්නේ නොවෙයි හුදෙක් සංඥාහෙයින් පවත්තී—චක්ඛුද්‍රව්‍යයෙහි පවත්නාවූ ඥාණයද ජාත්‍යාදි ස්වරූපානුසාරයෙන් නොපැවත සංඥා ස්වරූප ම අනුව පවත්තියි සේයි—ශබ්දප්‍රවෘත්තිනිමිත්ත නම් ශබ්දයාගේ ප්‍රයොගයට කාරණවූ දෙයයි ශබ්දයාගේ ද්‍රව්‍යයෙහි ප්‍රවෘත්තිනම් ද්‍රව්‍යවාචක බවයි—ඥාණයාගේ ද්‍රව්‍යයෙහි ප්‍රවෘත්තිනම් ද්‍රව්‍යවිෂයෙහි ඉපැද්මයි—මෙසේයින් මත්තෙහි දු යෙදෙන යෙදෙන පරිද්දෙන් දතයුතුයයි භගවනපිණ්ස එවං යි කීය)—එවං, මෙසේ; මනුස්සත්තන්ති, මනුස්සත්තං යනු; මනුස්සජාතිවසා, මනුෂ්‍යජ

---

* මේ හැම තා ප්‍රත්‍යයාන්තහෙයින් ස්ත්‍රීලිඟය—

තිහෙයි ති—*යදාදිනා, යදාදීන්; ඊසා, දණ්ඩ ශබ්දයාගේ ඊකාරයත ච; රස්සො, හ්‍රස්වකළකල්හි; (දණ්ඩත්තං යනු වේ)—දණ්ඩත්තන්ති,

දණ්ඩිත්තං යනු; දණ්ඩිදබ්බසම්බන්ධො, දණ්ඩිද්‍රව්‍යය සම්බන්ධහෙයි ති—†පාචකත්තන්ති, පාචකත්තං යනු; පචනක්‍රියා සම්බන්ධො, පාචකක්‍රියාසම්බන්ධහෙයි ති—‡

නීලත්තන්ති, නීලත්තං යනු; නීලගුණවසා, නීලගුණහෙයිති—§ එවං, මෙසේ; ණ්‍යාදිසු, ණ්‍ය ය ත්ත ය යනාදිවිෂයෙහිදු; යථායොගං යෙදෙනයෙදෙන පරිද්දෙන්; ඤෙය්‍යං, දතයුතුයි—(ණ්‍ය ප්‍රත්‍යය පළමුකොට නොදක්වූයේ තදන්තාද්‍යත්‍යයයොගය නාමාදිපච්කයේ සුලභ නොවනහෙයිනි)—ණ්‍ය, ණ්‍ය ප්‍රත්‍යය කළකල්හි—

අව—පෙ—අවණ්ණා ය, යෙ ය, ලොපං ය, ච ය, යනු පදයි—යෙ පරෙ, ය කාරය පරකල්හි; අවණ්ණා, අවර්ණය තෙමේ; ලුපන්තෙ, ලොප්කරණුලැබෙයි; ච කාරෙන, ච ග්‍රහණයෙන්; ඉකාරො

---

* මෙහි මනුස්ස ශබ්දයතෙමේ මනුෂ්‍යලක්ෂණවූ දව්‍යයෙහි නාමාදිහෙයින් නොපැවැත්ම මනුෂ්‍යජාතිහෙයින් ප්‍රවෘත්තිනිමිත්තවූ ජාතිස්වරූපය අනුවවූ ක්‍රණයද ජාතිහෙතුකොටම පවත්නී—මනුස්සස්ස භාවො මනුස්සත්තං—

† මෙහි දණ්ඩී ශබ්දයතෙමේද දණ්ඩො අස්ස අත්ථීති යනුබැවින් දණ්ඩයෙන් යුක්තවූ දෙවදත්තාදිවූ ද්‍රව්‍යයෙහි නාමාදිහෙයින් නොපැවත දණ්ඩිද්‍රව්‍යයාගේ සම්බන්ධයම නිමිත්තකොටගෙණ පවත්නී—ක්‍රණයද නිමිත්තවූ දණ්ඩිද්‍රව්‍ය සම්බන්ධයාගේ ස්වරූපය අනුව පත්නී—දණ්ඩිනො භාවො දණ්ඩිත්තං—

‡ මෙහි පාචක ශබ්දය පචතීති පාචකො යනු බැවින් පාකක්‍රියායෙන් යුක්තවූ දෙවදත්තාදිවූ ද්‍රව්‍යයෙහි නාමාදිහෙයින් නොපැවතැ පචනක්‍රියාවහා සම්බන්ධයම නිමිත්තකොට පවත්නී—ක්‍රණයද නිමිත්තවූ පචනක්‍රියාසම්බන්ධ ස්වරූපානුසාරයෙන් පවත්නී—පචකස්ස භාවො පාචකත්තං—

§ මෙහි නීලශබ්දයතෙමේ නීලගුණයෙන් යුක්තවූ පටාදී ද්‍රව්‍යයෙහි නාමාදිහෙයින් නොපැවත නීලාඛ්‍යවූ ක්‍රණයද නිමිත්තවූ නීලගුණස්වරූපයද අනුව පවතී-නීලස්ස පටස්ස භාවො නීලත්තං-නීලශුක්ලාදී ශබ්දයෝ ගුණයෙහිද ගුණයුක්තයාකෙරෙහිද වැටෙති ගුණවාචීවූවේලේ නීලශබ්දයාගේ ප්‍රවෘත්තියට නිමිත්තවන්නේ නීලත්ව ශුක්ලාදි ජාතිය ගුණීහු කියනකල නීල ගුණප්‍රවෘත්තිවෙයි මෙතන නීලශබ්දය ගුණයුක්තයා කියා—එහෙයින් ගුණවසා යයි ගුණයුක්තයාකියා—

පි. ඉ කාරද ලොප්කරණුලැබේ---

සච—පෙ—"සචනං තලනාදකාරානං බ්‍යඤ්ජනානි චලඤජකාර නනං" යි; යකාරසුනනානං, යකාරඇති; තාදිනං, ත කාර ල කාර න කාර ද කාර යනමොවුන්ට; චාදයො, ච කාර ල කාර ඤ කාර ජ කාර යන මොහු; (ක්‍රමයෙන්)හොන්ති, වෙති; කාරග්‍රහණෙන, මෙහිම කාර ග්‍රහණයෙන්; සකපහමාදිතො, ස කාර ක කාර ප කා ර හ කාර ම කාරාදින්කෙරෙන්, පරයකාරස්ස, පරවූ ය කාරයහට; පුබ්බනසහ, පූර්වයහා එක්කොට: කචි, කිසිතැනෙක්හි; පුබ්බරූප ඤ, පූර්වරූපද වේ—චිත්තං, චිත්තද වේ—පණ්ඩිතස්ස භාවො පණ්ඩිච්චං-කුසලස්ස භාවො කොසල්ලං-(මේදෙතැනම ප්‍රවෘත්තිනිමිත්ත වූයේ ගුණයි)—සමණස්ස භාවො සාමඤ්ඤං—(මෙතන ජාතියයි)—සුහදස්ස භාවො සොහජ්ජං—(මෙහි ගුණයි)—පුරිසස්ස භාවො පොරිස්සං—(මෙහි ජාතියයි)—නිපකස්ස භාවො නෙපක්කං—(නිපකනම් ඥාණවිශෙෂයකින් යුක්තයා යි)—සරූපස්ස භාවො සාරූප්පං—(මේ දෙතැන ගුණයයි)—උසභස්ස භාවො ඔසබ්භං—(මෙහි ච ගොග සොසාසොසාදින් චිත්‍ර වේ—(මෙතන ජාතියයි)—උපමාය භාවො ඔපම්මං—(මෙතන ගුණයයි—

ආ—පෙ—ආනත්තං ය, ච ය, යනු පදයි—ඉ උ ඉති, ඉය උය යන; එතෙසං, මොවුන්ට; ආභොති, ආ යන ආදෙශ වෙයි; ඨානෙ, සුදුසු තැන්හි; රි කාරගමො ච, රි කාරාගමද වේ—සරලොපාදිනා, සරලොපො මාදෙසාදීන්; ඉලොපො, ස කාරයාඑ ඉ කාරයහටලොප් වේ—(පෙරසේම කාරග්‍රහණයෙන් ස කාරයහට පූර්වරූප වේ)—ඉසිනො භාවො ආරිස්සං—(මේ ජාතියයි)—මුදුනො භාවො මුදුතා---(මේ ගුණයි)—

අරහන්තස්ස භාවො අරහතා—(මෙහි ජාතියයි)—න්තස්ස, න්තශබ්දය හට; යදාදිනා, යදනුපපන්නාදීන්; ලොපො, ලොප්වේ—(මේ දෙතැන්හි තා වේ)—පුථුජ්ජනස්ස භාවො පුථුජ්ජනත්තනං—(මේ තතන යි)—අතිවනමෙව, කිසිවක්නැත්තේම; ආකිඤ්චඤ්ඤං, ආකිඤ්චඤ්ඤ නම්—(මේ සවාජීයෙහි ණ්‍යවූතැනි—එහෙයින් නපුංසක ලිඟයි) කුණ්ඩිනියා, කුණ්ඩිනියගේ; අපච්චං, පිත්තෙම; කොණ්ඩඤ්ඤ, කොණ්ඩඤ්ඤනම්—(සරලොපො යනාදීන් නකාරයාඑ ඉකාරයහට ලොප් වේ)—එහි, මෙහි;(කොණ්ඩඤ්ඤ යනතන්හි) වුඩාදෙ, වුඩාදිසරස්ස වා යනාදියෙහි; වාකාරෙණ, වාග්‍රහණයෙන්; සංයොගන්තස්සාපි,සංයොගාන්තයාහටද; වුඩ්ඪි,වෘඩිවේ-පදය, පයට; හිතං, හිතවූයේ;පාජ්ජං, පාජ්ජ නම්-ධනාය, ධනයපිණිස; සංවත්තනිකං, පවත්නේ; ධඤ්ඤං—සතිතො, සමෘතියෙන්; සම්භූතං, වූයේ; සච්චං—ඉලොපො, සරලොපාදින් සති ශබ්දයාගේ ඉ කාරයහට ලො

ප්වේ—විඤ්ඤූ, ධඤ්ඤං සච්චං යන දෙතන්හි; නවුද්ධි, පෙරසේම වා ග්‍රහණයෙන් වෘද්ධිනොවේ-(කොණ්ඩඤ්ඤ යනාදී ණ්‍ය වූ තැනි)—දෙවො එව, දෙවිමය යන අර්ථයෙහි; දෙවතා—(මේ ස්වාර්ථයෙහි තාවූ තැනි—තා ප්‍රත්‍යාන්තහෙයින් මෙද ස්ත්‍රීලිඟුයි—පුථුජ්ජනත්තනං යනාදී හැම තු ග්‍රහණයෙහි ඵලයි)—

ණ්‍යවි—පෙ—"ණ්‍ය විසමාදීහි" යි; භාවෙ, භාවයෙහි; (විසම ශබ්දාදීන්කෙරෙන්) ණ්‍ය, ණ්‍ය ප්‍රත්‍යය වේ—විසමස්ස භාවො වෙසම්මං—උජුනො, උජුහුගේ; භාවො, භාවය; අජ්ජවං—(මෙතන ගුණයි)—එත්ථ, මෙහි; උස්ස, උකාරයහට; ආතෙන, "ආත්තං ච" යි ආකාරයක් කළකල්හි; පරුකාරස්ස, පරවූ උකාරයහට; යදාදිනා, යදාදීන්; අවො, අව යන ආදෙශ වේ—

රම—පෙ—"රමණීයාදිතො කණ්" යි; කණ් (භාවාර්ථයෙහි) කණ් වේ—මනුඤ්ඤස්ස භාවො මානුඤ්ඤකං—(මානුඤ්ඤනම් මනොඥයි—මෙහිද ගුණයි)—

විභා—පෙ—"විභාගෙ ධා ච" යි; ධා,(විභාගාර්ථ යෙහි) ධා වේ—චකාරෙන, ච ග්‍රහණයෙන්; සොප්පච්චයො, ච, සො යන ප්‍රත්‍යයදවේ. එකෙන විභාගෙන, එකප්‍රකාරයෙකින්; (යන අර්ථයෙහි) එකධා—නිපාතත්තා, ධාදී ප්‍රත්‍යයාන්තයන් නිපාතහෙයින්; සිලොපො, සබ්බාසමාවුසො යනාදීන් සිහට ලොප්වේ—(සො ය, ථය, ථත්තා ය, ථං ය, යනමොවුන් අන්තකොට ඇත්තන්ද නිපාතහෙයින් සි ලොප්ම වේ)—පදවිභාගෙන, පදභෙදයෙන යන අර්ථයෙහි; පදසො—(මෙසේම අත්ථසො බ්‍යඤ්ජනසො යනුද දන්න)—

සබ්බ—පෙ—"සබ්බනාමෙහි පකාරවචනෙහි තු ථා" යි; ථා, ප්‍රකාරාර්ථයෙහි ථා වෙයි; තු කාරෙන, තු ග්‍රහණයෙන්; ථත්තාච, ථත්තා ප්‍රත්‍යයද වේ—සබ්බො පකාරො, සියලුප්‍රකාරය; සබ්බෙන පකාරෙනවා, සියලුප්‍රකාරයෙන යන අර්ථයෙහි; සබ්බථා—අඤ්ඤථත්තා, අඤ්ඤථත්තා යනුද එවං, මෙසේමැයි—(අඤ්ඤ පකාරො අඤ්ඤෙන පකාරෙන අඤ්ඤථත්තා—ථා වූ කල අඤ්ඤථාත්තා යිද වේ—

කිම්—පෙ—"කිම්මෙහි ථං" යි; ථං, ථං වේ—කාදෙසෙ, "කිස්ස ක වෙ ච" යන සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් ක යන ආදෙශ කළකල්හි; (කො පකාරො කෙන පකාරෙන) කථං, ඉ ආදෙසෙ, ("ඉමස්සිත්ථනාදිහතොධෙසු ච" යි ඉම ශබ්දයාට) ඉ කාර කළකල්හි; (අනෙන පකාරෙන) ඉත්ථං—ථනාති, ථංයි; යොගවිභාගෙන, සූත්‍රය දෙකක් කිරීමෙන්; බහුත්ථං, බහුත්ථං යි වෙ—(යොගවිභාගයෙන් බහු ශබ්දයා කෙරෙන්ද ප්‍රකාරාර්ථයෙහි ථං වෙයි සේයි—බහූහි පකාරෙහි බහුත්ථං යි බොහෝප්‍රකාරයෙන යන අර්ථයෙහි බහුත්ථං—මේ දෙක්හි ව

යො ඝොසාඝොසාදීන් විභා වේ)—අමලිනං. නොකිලුටුවූදෙය; ම ලිනං කරොතීති, කිලුටුකෙරෙයි යනා: ආදෘනේ, මේ ආදි අර්ථය කි වමනාකල්හි; අභූතතබ්භාවෙ, අභූතතද්භාවාර්ථයක්; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; කර භූ යොගෙ, කරකරණ භූ සත්තායං යන ධා තූන්දෙදෙනාගේ සම්බන්ධයක්; සතිඇතිකල්හි; නාමතො,°ශබ්දයා කෙරෙන්; යදදිනා, යදනුපපන්නාදීන්; ඊප්පච්චයො, ඊප්‍රත්‍යය වේ- මලිනීකරොති සෙතං(යනාදි උදාහරණයි)-සෙතං, සුදුදෙය; මලිනී කරොති, කිලුටුකෙරෙයි—(පෙර නොකිලුටුදෙය කිලුටුකෙරෙයි සේ සි)—අභස්මනො, පෙර හළුනුවූවාහු; භස්මනොකරණං, හළුකිරීම; භස්මීකරණං, භස්මීකරණ නම; කටඨස්ස, කාෂ්ඨයාගේයි-අමලිනො, පෙර නොකිලිටුවූයේ; මලිනො භවතීති, කිලුටුවෙයි යනා; (අර්ථයෙහි) මලිනීභවති සි; වෙයි—සෙතො, සුදයි—ඊප්පච්චයනොපි, ඊප්‍ර ත්‍යයාන්තවූ ශබ්දද; නිපාතො, නිපාතයි—(නිපාතහෙයින් කත ශ බ්දයාකෙරෙන් පරවූ විභක්තියහට ලොප්වේ)—අභූතතබ්භාවෙ ඉති, අභූතතබ්භාවයෙහි (වෙයි) යනු; කිං, කුමටය; පටං කරොති ප ටො භවති යනතැන නොවනපිණිසයි—(මෙහි පෙර නැති පටය ක් කරත්මුත් පෙර ඇතිපටය අනික් පරිද්දෙකින් කරණලබන් නේ නො වේ— පටො භවති යනුදමෙසේ මැයි)—කර භූ යොගෙ ඉති, කර භූයොගෙ යනු; කිං, කුමටය; අමලිනො, නොකිලුටුවූයේ; මලිනො ජායතෙ, කිලුටුවේ—(මෙහි ජන ජනනෙ යනුහා සම්බන්ධයක්මුත් කර භූ දෙදෙනාගේ සම්බන්ධනැතිහෙයින් අභූතතද්භාවාර්ථයක් ඇතද ඊප්‍රත්‍යය නොවේ)—

අවත්ථාවතො, අවස්ථාවත්වූ; (පෙරම ඇති යයි සේයි) අඤ්ඤාය අ වත්ථාය අභූතස්ස, අනික් අවස්ථායෙකින් නොවූ; වත්ථුනො, වස්තුහු ගේ; තාය අවත්ථාය, ඒ නොවූ අවස්ථායෙන් යුක්තව; භවනං, වීම; අභූතතබ්භාවං, අභූතතබ්භාවයයි; විදුං, දනිත්—(පළමු එක් ස්වරූ පයකින් යුක්තවසිටි යම් වස්තුයෙක් අනික් යම් ස්වරූපයකට නො පැමිනියේද පසුව යම් කලෙක ඒ නොපැමිනි ස්වරූපයෙන් යුක්තව එම්වස්තූහුගේ වීම අභූතතබ්භාව නමැයි සේයි—මලිනීකරොති සෙ තං යනාදිතන්හි ශ්වෙතවස්තුව පළමු ශ්වෙතාවස්ථායෙන් සිටිබවමු ත් මලිනාවස්ථාවට නොපැමිනියේද පසුව මලිනාවස්ථායෙන්යුක්ත වේ—මෙසේම සෙසුතන්හිදුදත්න—තෙන අවත්ථන්තරෙන භාවො තබ්භාවො, ඒ අවස්ථාන්තරයෙන්වීම තබ්භාව නම්—අභූතස්ස අව ත්ථන්තරෙන අජාතස්ස තබ්භවො අභූතතබ්භාවො-අභූතස්ස සි, සේ සි—අවස්ථාන්තරයකින් නොවූවාහුගේ ඒ නොවූ අවස්ථාන්තරයෙන් වීම අභූතතබ්භාව නම්—

සමාසො පදසංඛෙපො, පදප්පච්චයසංහිතං,
තද්ධිතං නාම හොතෙවං, විඤ්ඤෙය්‍යං තෙසමන්තරං, යි.

කීබැවින් සමාසයනම් නොඑක්පදයන්ගේ එකාර්‍ථබවය—තද්ධිත නම් පදසහා ප්‍රත්‍යයසහා එකාර්‍ථබවයි—මේ දෙක වෙනස දතයුතුයි—නීලුප්පලං යන්නෙහි නීලපදයෙන්ද උප්පලපදයෙන්ද වාච්‍යවන්නේ ඒ එකජලජවූ උත්පලාඛ්‍යවූ අර්‍ථයයි—වාසිට්ඨො යන්නෙහි වාසෙට්ඨ පදයෙන්ද ණ ප්‍රත්‍යයෙන්ද වාච්‍යවන්නේ එක වසිට්ඨ පුත්‍රමයි—මෙසේම සෙසුතන්හිදු දතයුතුයි-කත්තබ්බො කටො යනාදියෙහි කර යන ධාතුය තබ්බ ප්‍රත්‍යය යන දෙදෙනා කරණ ක්‍රියායෙන් සම්බන්ධකරණලද ඒ කට තටාදිවූ කර්‍මය කියතුදු කර යන මොහු පදනොවනහෙයින් කත්තබ්බො යනාදි ශබ්දයන්ට තද්ධිතත්‍ව ප්‍රසඞ්ගනැති—අත්‍ථජ්ජෝතකා වණ්ණා පදං යි කිව කර යන්නහුදු කරණ ක්‍රියාලක්‍ෂණවූ අර්‍ථප්‍රකාශයක් කරත්මුත් හෙතෙම පද කුමකැයි නොවේදයත් එක කර යන ධාතුහු ප්‍රත්‍යයාන්තවමුත් හුදකලාව ස්වාර්‍ථප්‍රකාශනොකොටහෙන හෙයිනි—වසිට්ඨ ශබ්දයවූකලී වසිට්ඨස්සාපච්චං යන අර්‍ථයෙහි වසිට්ඨස්ස යන ෂෂ්ඨ්‍යන්තයාකෙරෙන් ණ ප්‍රත්‍යය වනහෙයින් ඒ ණ ප්‍රත්‍යය වන්නට පළමුකොටද විභක්ත්‍යන්තහෙයින් ස්වාභිධෙය්‍යයක් ප්‍රකාශකෙරේනුයි පද නම් හෙයින් විභක්ත්‍යන්ත ශබ්දය පදයයි දතයුතු—නොහොත් තස්ස අත්‍ථාය හිතො තද්ධිතො, ඒ අර්‍ථයට හිතවූයේ තද්ධිත නම්—අර්‍ථයට හිතබවනම් අර්‍ථප්‍රකාශනය කරණබැවින් අභිධෙය්‍යයටද අනුකූලබවයි-තස්ස හිතො යන වාක්‍යයෙහි චතුර්‍ථී තත්පුරුෂකොට විභක්තිලොප්කොට ත හිත යහයි තුබූකල්හි දධිතාදි සූත්‍රයෙහි තද්ධිතයයි නිපාතනහෙයින් හිත ශබ්දයාගේ හ කාරයට ධ කාරයක්කොට වගෙග ඝොසාදින් චිහ්නයෙන් දකාරයක් කළකල්හි තද්ධිතො යනු වේ—අර්‍ථප්‍රකාශකරණ හෙයින් රුකෙඛා, පචති, කත්තබ්බො, යනුද අර්‍ථයට හිතවුවද තද්ධිත ශබ්දයතෙමේ යොගරූඪහෙයින් වාසිට්ඨ ඝාතිකාදිවූ ශබ්දයන්කෙරෙහිම වැටෙයි රුකෙඛා යනාදින්කෙරෙහි නොවැටේ—ශබ්දයෝ යොගිකයහ රූඪයහ යොගරූඪයහයි ත්‍රිවිධවෙත්-එහි යොගිකයෝ නම් පචනාදික්‍රියාසම්බන්ධප්‍රවෘත්තිනිමිත්තකොටඇති පාචකාදි ශබ්දයහ—රූඪයෝ නම් ලොකප්‍රසිද්ධ සංඥාමාත්‍රය ප්‍රවෘත්තිනිමිත්තකොටඇති ඝටපටාදි ශබ්දයහ-යොගරූඪයෝ නම් ක්‍රියාදි සම්බන්ධයක්ද ලොකප්‍රසිද්ධ සංඥාවක්ද ප්‍රවෘත්තිනිමිත්තකොටඇති පඞ්කජාදි ශබ්දය—පඞ්කෙ ජාතං පඞ්කජං, මඩෙහි උපන්නේ පඞ්කජ නම්—පඞ්කජ ශබ්දය පඞ්කයෙහි ජනනක්‍රියාසම්බන්ධ

යද ලොකප්‍රසිද්ධියද අපෙක්‍ෂාකොට පවත්නේය මඩෙහි උපන් සෙසු හෝලුආදීන් ඇතද ඕවුන්කෙරෙහි පඞ්කජ යන ලොකප්‍රසිද්ධියක් නැතිහෙයින් ඕවුන් හැර පියුමෙහිම වේ-මෙසෙයින්ම තද්ධිත ශබ්දයද අර්ථප්‍රකාශන ක්‍රියාසම්බන්ධයද වෘද්ධප්‍රසිද්ධ සංඥාවද ප්‍රවෘත්තිනිමිත්තකොට පවත්නේ අර්ථප්‍රකාශන, රුක්ඛො, පචති, කත්තබ්බො, යනාදි සෙසු පදයන් ඇතද ඒ රුක්ඛ යනාදීන්කෙරෙහි තද්ධිත යන ව්‍යවහාරයක් නැතිහෙයින් ඕවුන් හැර ණව ණිකාදි ප්‍රත්‍යයාන්තවූ වාසිට්ඨ ජාතිකාදීන්කෙරෙහිම වැටේ—තද්ධිතප්‍රත්‍යයෝ ප්‍රථමාදි සත්විභක්තීන්කෙරේ ලැබෙත්—හේමෙසේයි—දණ්ඩා අක්‍ෂ අජිනි ද ණාදි-වත්තකරණං අවෙච්ච අධිතෙහි වෙයාකරණෝ—මනසා පකතං මානසිකං—චන්දෙන කිතං චන්දිකං—පදය හිතං පාජ්ජං—මගධා ආගතො මාගධො—මහිසස්ස ඉදං මාහිසං-වාරෙ නියුත්තො දෙවාරිකො—යනාදීන් තද්ධිතයෙන් වාච්‍යවන්නේ නාම ජාත්‍යාද්‍යර්ථපඤ්චකයයි—කෙසේයත්—මහිසස්ස ඉදං මාහිසං—නාමං—මහිසස්ස අයං මාහිසී—ජාති—මාහිසී—ගති—මාහිසො—වණ්ණො—මාහිසඃ—සිංගං—යනාදියයි—මාහිසං යන්නෙහි මහිස ශබ්දය මීවුන්ට කියත්මුත් ඉම ශබ්දයෙන් වාච්‍යවූ මේය යන අර්ථය නොකියයි—ණ ප්‍රත්‍යය ඉම ශබ්දයෙන් වාච්‍යවූ මේ ය යන අර්ථය කියත්මුත් මීවු නොකියයි—එහෙයින් මීවුන්ගේ මේය යන අර්ථය කාවිසින් වාච්‍ය වේදයත්—මහිස ශබ්ද ණ ප්‍රත්‍යය දෙදෙනා එකම මීහු මේය යන නාමාදි අර්ථයන් ප්‍රකාශකෙරෙත් එසේ වුවහොත් යම්සේ එකෙකි ඇටින් මිරිකූකල තෙල්ඇති තලආදීන්ම රුස්වේද තෛලොත්පාදනයෙහි සමර්ථවත්මුත් වෙන්වෙන්ව මිරිකූකල කැටකැබිලිති ආදීහූ රුස්වූවාහූද තෛලොත්පාදනයෙහි අසමර්ථයෝද එපරිද්දෙන් යමෙක් වෙන්වෙන්වම යම් අර්ථයක් ප්‍රකාශකරන්නට පොහොසත්වූනම් ඔහු රුස්වූවාහූද ඒ අර්ථය ප්‍රකාශකෙරෙති යමෙක් වෙන්වෙන්ව අර්ථප්‍රකාශයට නොපොහොසත්වූනම් ඔහූම රුස්වූවාහූදු ඒ අර්ථප්‍රකාශනොකරත්නෝ වෙත්දයත්—යම්සේ ජලාහරණාදි ක්‍රියායෙහි වෙන්වෙන්ව නොපෝසද්දවූ චක්‍රනේමිකූටාගාරාදී ශකටාවයවයෝ එක්වූවාහූම ඒ ක්‍රියායෙහි පොහොසත්හූද එසේම වෙන්වෙන්වම මහිසයාගේ මේ නාමය ජාතිය යනාදිවූ අර්ථප්‍රකාශකරන්නට නොපොහොසද්දවූ මහිස ශබ්දය ණ ප්‍රත්‍යය යන දෙදෙනා ඒ අර්ථය ප්‍රකාශයකෙරෙත් මැයි—මෙසේම වාසිට්ඨ ජාතික යනාදීම තද්ධිතයෙහිද ආඛ්‍යාතයෙහිද කිතකයෙහිද අර්ථපඤ්චකය ප්‍රකෘතිප්‍රත්‍යයන්විසින් වාච්‍යවනපරිද්ද දතයුතුයි—තද්ධිතයතෙමේ සාමාන්‍යය විශෙෂය භාවය නිපාතයයි චතුර්විධවේ—එහි සාමාන්‍ය නාම් අපච්ච සංසට්ඨාද්‍යර්ථයෙහිවූ ලිඞ්ගත්‍රයට සාධාරණවූ වාසිට්ඨ ජාතිකා

දිය—විශෙෂණ නම් සමුහ භාවාභිධායියෙහිවූ එතිඑතී ලිඞ්ගඇති ගා මතා ආතිවසඤ්ඤං යනාදිය—භාව නම් පණ්ඩිච්ච චතුත්ත අරහතා යනාදිය—නිපාත නම් එකධා පදසො යනාදියයි—

සාමඤ්ඤාච විසෙසො ච, නිපාතො භාවජො තථා
ඉති විඤ්ඤූහි විඤ්ඤෙයො, තද්ධිතො තු චතුබ්බිධො)—

තද්ධිතො, තද්ධිත නිමි—

පච පාකෙ, පච යන මේ ශබ්දස්වරූපය; පාකෙ, පිසීමෙහිවැටේ— (වත්තතෙ යන්නු අධ්‍යාහාරයෙහයින් වැටෙයි සේයි)—පච ඉති, පච ය යි කියා; සීතෙ, තුබූකල්හි—

භූවා—පෙ—භූවාදයො ය, ධාතවො ය, යනු පදයි—භූ ඉති, භූ ය නා, ආදයො, මේ ආදිවූ; සද්‍ද, ශබ්දයෝ; ධාතවො නාම, ධාතු සංඥ වෙත්—

ධාතු—පෙ—"ධාතුස්සන්තො ලොපො නෙකසරස්ස" යි; ධාතුවන්ත ස්ස, අනෙකස්වරවූ ධාතුහුගේ අන්තයගට; කච් ලොපො, සමහර තැනෙක ලොප්වේ—

ධාතු-පෙ—"ධාතුලිඞ්ගෙහි පරාපච්චයා" යි; ධාතුම්හා, ධාතුහුකෙ රෙන්; අනෙකපච්චයප්පසඞ්ගෙ, අනෙකප්‍රත්‍යයන් පත්තෙහි; වත්ති චඡාතො, වක්තෘහුගේ විවක්‍ෂාවූ පරිද්දෙන් වෙයි සේයි—

වත්ත—පෙ—වත්තමානාදින්; ත්‍යාදිනං, ති අන්ති යනාදින්ට; ව ත්තමානසඤ්ඤා, වත්තමාන යන සංඥවේ—කාලෙති, කාලෙ යනු; අට්ඨවිභත්තිවිධානෙ, වර්තමානාදිවූ අටවිභක්තිකරණ සූත්‍රයෙහි; ව ත්තතෙ, වැටේ—

කාලො, කාලයතෙමේ; අතීතක්‍රියා, අතීතවූක්‍රියාවය; වත්තමාන ක්‍රියා, පවත්නාක්‍රියාවය; අනාගතක්‍රියා, මතුවනක්‍රියාවද; ලක්ඛ ණෙ, ස්වරූපකොටඇත්තේය;* ක්‍රියෙ, ක්‍රියාවතමා; ආරද්ධ, පටන් ගන්නාලදින්; අනිට්ඨිතෙ, නොනිමිකල්හි; පච්චුප්පන්නො කාලො, වර්තමානකාලයයි; මතො, දන්නාලදී—(පචති, පිසෙයි; කිකල්හි ප

---

* කාලනම් අතීතානාගතවර්තමානක්‍රියාමය වෙනවස්තුවෙක් නොවෙයි—එහෙයින් කරණං යන අර්ථයෙහි කර යන ධාතුහුකෙ රෙත් භාවයෙහි ණ ප්‍රත්‍යය කොට කරණයයි නිවමනාතන්හි කා ලෙ යයි සූත්‍රනිර්දේශයෙන්ම රෙඑයට ලකාරයක් කොට කාලයයි කියයුතු—

වත්තනක්‍රියාව පටන්ගත්තාලද්දයි හැඟෙන්මුත් නිමියයි හැඟෙන්නේ නොවෙයි)—

ක්‍රියාසන්තාන, පටන්ගත් ක්‍රියාපරම්පරාවගේ; විච්ඡෙදෙ, නිමාවන්වූකල්හි; කාලෙ, කාලයෙහිමේ; අතීතොති, ඉකුත්යයි; ගම්‍යතෙ, හැඟෙයි; ක්‍රියාය තු, ක්‍රියාවගේ වනාහි; අනාරම්භෙ, පටන් නොගැන්මෙහිලා; අනාගතො, අනාගතකාලයයි; පතීයතෙ, හැඟෙයි—(ක්‍රියානම්තෙම කිම යත්)—

අද්දබ්බභූතං, ද්‍රව්‍යනොවූ; කත්තාදි කාරකගාමසාධියං, කර්තෘකාරණාදිවූ කාරකසමූහයාවිසින් සාධ්‍යවූ; කත්තුකම්මට්ඨං, කර්තෘකර්මදෙදෙනාකෙරෙහි පිහිටියාවූ; පදත්ථං, පදාර්ථය; ක්‍රියං, ක්‍රියාවයි; තබ්බිදූ, ඒ ක්‍රියාදන්නාහු; ඉච්ඡන්ති, කැමතිවෙත්—(දෙවදත්තො ගච්ඡති යනතන්හි පාදෙක්ඛෙපනනාව පතනාදි සවරූපවූ ගමනය දෙවදත්තාඛ්‍යවූ කර්තෘකෙරෙහි පිහිටිහෙයින් කර්තෘස්ථනම්*—ඔදනං පචති යන්නෙහි විකෙලදනලක්ෂණවූ පචනය ඔදනාඛ්‍යවූ කර්මයෙහි පිහිටිහෙයින් කර්මස්ථවූ පදාර්ථනම්†—දෙවදත්තො භවති යන්නෙහි කර්තෘවූ එකම දෙවදත්තයාමුත් කාරකසමූහයක් නැත—භවනක්‍රියාව කෙසේ සාධ්‍යවේද යත්—දෙවදත්තයි තීකල අසවල් තැන්හිය අසවල්කල්හිය යන්නක් අපෙක්ෂාකරණහෙයින් ආධාරකාරකය ලැබෙනහෙයින් කාරකසමූහය ඇත්මැයි—මෙසේම සෙසුතැන්හිදු දතයුතුයි—පදස්ස අත්ථො පදත්ථො, වාච්‍යවාචකත්වයෙන් පදය පිළිබඳවූ අර්ථය පදාර්ථනම්; පදයෙන් වාච්‍යවූ අර්ථය පදාර්ථයයි සේයි—පදාර්ථයද නාමජාත්‍යාදිමැයි—නාමාදිවූ පදාර්ථයන්කෙරෙන් යමෙක් මෙකී ලක්ෂණයෙන් යුක්තවූනම් ඒ ක්‍රියානම්)—

වත්ත—පෙ—වත්තමානාය, පච්චුප්පන්නෙ ය, යනු පදයි—පච්චුප්පන්නෙ කාලෙ, ප්‍රත්‍යුත්පන්නකාලයෙහි; වත්තමානාවිභත්ති හොති, වර්තමාන නම් විභක්ති වේ-(වත්තතීති වත්තමානං, පවතීනුයි වර්තමාන නම්—වස්තුවයි—ඒ වර්තමානාර්ථප්‍රතිපාදකවූ විභක්තිද වාච්‍යවාචක දෙදේනාගේ අභෙදෞපචාරයෙන් වර්තමාන නම් වේ—වතු වත්තනෙ යන්නහුකෙරෙන් මානප්‍රත්‍යයද තකාරයාට ත්තද කොට වත්තමාන ශබ්දයකෙරෙන් ස්ත්‍රීලිංගයෙහි ආප්‍රත්‍යය කළකල්හි වත්තමානා යනු වේ)—තස්සාපි, ඒවර්තමානනම් විභක්තියගේද; අනියමෙ, අනියමයෙන් ප්‍රසංගයක් ඇතිකල්හි—

අථ—පෙ—අථ ය, පුබ්බානි ය, විභත්තීනං ය, ඡ ය, පරස්සපදානි

---

* පාදෙක්ඛෙපතනාවපතන නම් පය නගාලීම හෙලාලීමයි—

† විකෙලදන නම් පැසීමයි—

ච, යනු පදයි—අට්ඨවිභත්තීනං අටවිභක්තීන්ගේ; යානි යානි, යම් යම්; පුබ්බානි, පූර්වවූ; ඡපදානි, සපදකෙණෙක් ඇද්ද; තානි තාන්, ඔහු ඔහු, පරස්සපදානි නාම, පරස්මෛපදයෝ නම්හුයි—

කත්ත-පෙ-"කත්තරි පරස්සපදං" යී; කර්තෘකාරකයෙහි පරස්මෛපදවේ—තස්සාපි, ඒ පරස්මෛපදයාගේද; අනියමෙ, අනියමයෙන් ප්‍රාප්තියෙහි—

චෙ—පෙ—චෙ ච, චෙ ච, පඨමමජ්ඣිමුත්තමපුරිසා ච, යනු පදයි—අට්ඨවිභත්තීසු, අටවිභක්තීන්අතුරෙහි; පරස්සපදානං, පරස්මෛපදයන්ගේද; අත්තනොපදානච, ආත්මනෙපදයන්ගේද; ද්වෙ ද්වෙ පදානි, දෙපද දෙපදයෝ; පඨමමජ්ඣිමුත්තමපුරිසා නාම, ප්‍රථමපුරුෂ මධ්‍යමපුරුෂ උත්තමපුරුෂ නම්වෙත්—යථා, මෙසේයි—ති අන්ති ඉති, ති ච අන්ති චයි; පඨමො පුරිසො, ප්‍රථමපුරුෂය; සි ථ ඉති, සි ච ථ චයි; මජ්ඣිමො, මධ්‍යමපුරුෂය; මි ම ඉති, මි ච ම චයි; උත්තමො, උත්තමපුරුෂයි—අත්තනො පදෙසුපි, ආත්මනෙපදයන්අතුරෙහිදු; (පුරුෂව්‍යවස්ථාකරණුලැබෙයි අධ්‍යාහාර කරණු)—තෙ අන්තෙ ඉති, තෙ ච අන්තෙ ච යනු; පඨමො, ප්‍රථමපුරුෂය; සෙ ව්හෙ ඉති, සෙ ච ව්හෙ ච යනු; මජ්ඣිමො, මධ්‍යමපුරුෂය; එ ම්හෙ ඉති, එ ච ම්හෙ ච යනු; උත්තමො, උත්තමපුරුෂයි—තථා, එසේම; උපරි, මත්තෙහිදු; දන්නේ—(පචම්‍යදියෙහිදු මෙසේමැයි සේයි)—

නාම-පෙ—නාමම්හි ච, පයුජ්ජමානෙ ච, අපි ච, තුල්‍යාධිකරණෙ ච, පඨමො ච, යනු පදයි—තුල්‍යාධිකරණභූතෙ, සමානාධිකරණවූ; නාමම්හි, නාමයක්හු; පයුජ්ජමානෙ, ප්‍රයොගකරණලබනකල්හිද; අප්පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණනොලබනකල්හිදු; පඨමො පුරිසො හොති, ප්‍රථමපුරුෂවේ—(මෙතැන අපි ශබ්දය අනුක්ත සමුච්චයෙහි වැටෙනහෙයින් අප්පයුජ්ජමානෙ යනු සූත්‍රයෙහි නොතිබද අපි ග්‍රහණයෙන් ලැබේ)—එකම්හිවත්තබ්බෙ, එකාර්ථයක් කිව මනාකල්හි; එකවචනං, එකවචනවූ; ති, ති විභක්තිවේ-(මෙහිදු විභක්ති කරණපරිදි මෙසේයි—පච පාකෙ යන්නෙහි පච ශබ්ද පච යි කියාතිබෙයි ඕහට "භූවාදයො ධාතවො" යන සූත්‍රයෙන් ධාතුසංඥ වෙයි "ධාතුස්සන්තො ලොපො නෙකසරස්ස" යන සූත්‍රයෙන් අනෙකස්වරයන්ඇති ධාතූහුගේ අන්තවූ ස්වරයහට කිසිතැනෙක්හි ලොප්වෙයි ධාතූහුකෙරෙන් පරව "ධාතුලිඞ්ගෙහි පරාප්පච්චයා" යන සූත්‍රයෙන් අනෙකප්‍රත්‍යයන් පත්තෙහි වක්තෘහුගේ විවක්ෂාහෙයින් "වත්තමානා ති අන්ති සි ථ මි ම—තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ" යන සූත්‍රයෙන් වර්තමානසංඥකරණලද ති ආදිවිභක්තිහු "වත්තමානාපච්චුප්පන්නෙ" යන සූත්‍රයෙන් වර්ත්තමානකාලයෙහි වෙති—ඔවුනුදුගේ අනියමයෙන් පත්තෙහි වක්තෘහුගේ විවක්ෂාහෙයින්

“අථ පුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි” යි පරස්සෛපද සංඥාකාරණලද ති ආදි සදෙන “කත්තරි පරස්සපදං” යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි වෙති-ඔවුනුදුගේ අනියමයෙන් පත්තෙහි “වෙ වෙ පඨමමජ්ඣිමුත්තමපුරිසා” යනාසූත්‍රයෙන් ප්‍රථමපුරුෂසංඥාකරණලද ති අන්ති යන දෙදෙන නාමයා ප්‍රයොගකරණලබතුදු නොලබතුදු “නාමම්හි පයුජ්ජමානෙපි තුල්‍යාධිකරණෙ පඨමො” යන සූත්‍රයෙන් වෙති-ඔවුනුදුගේ අනියමයෙන් පත්තෙහි වක්තෘවිවක්‍ෂාහෙයින් එකම්හි වත්තබ්බෙ එකවචනං ති යනුහෙයින් එකාර්ථයක් වාච්‍යකාල්හි එකවචනවූ ති වේ-බහ්වර්ථයක් වාච්‍යකල්හි බහුවචනවූ අන්ති වේ—මෙසෙයින්ම මධ්‍යමපුරුෂ උත්තමපුරුෂ දෙදෙනවෙති-වෙනසෙක්නම් “වෙ වෙ පඨමමජ්ඣිමුත්තමපුරිසා” යත්නෙන් මධ්‍යමපුරුෂසංඥාකරණලද සි ථ දෙදෙනද උත්තමපුරුෂ සංඥාකරණලද මි ම යන දෙදෙනදවෙතියි කියනබවයි—ආත්මනෙ පදයෙහිදු පච පාකෙ යන්නෙහි-පච-පෙ-ති ආදි විභක්තිහු “වත්තමානා පච්චුප්පන්නෙ” යන සූත්‍රයෙන් වර්තමානකාලයෙහි වෙති ඔවුනුදුගේ අනියමයෙන් පත්තෙහි වක්තෘහුගේ විවක්‍ෂාහෙයින් “පරානත්තනො පදානි” යන සූත්‍රයෙන් ආත්මනෙ පද සංඥාකරණලද තෙ ආදී සදෙන “අත්තනො පදානි භාවෙ ච කම්මනි” යන සූත්‍රයෙන් කර්මයෙහි වෙති-සෙස්ස පෙරසේමැයි-භාවයෙහිදු මෙසේමැයි—වෙනස නම් ප්‍රථම පුරුෂයෙහි එකවචන වෙයි යන බවයි)-කත්තරීති, කත්තරි යනු; විකරණවිධානෙ. විකරණප්‍රත්‍යයන් කරණ; සබ්බත්ථ, හැමසූත්‍රයෙහි; වත්තතෙ, වැටේ—

භූවා—පෙ—භූවාදිතො ය, අ ය, යනු පදයි—භූ ඉති, භූ යන; ආදිහි, මේ ආදිවූ; ධාතූහි, ධාතූන්කෙරෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; වත්තමානා පචමි හියත්තනීසු, වර්තමානය පචමිය හියත්තනිය ය නමොවුන් පරකල්හි; අප්පච්චයො හොති, අකාරප්‍රත්‍යය වේ—යාදි විකරණ, ය කාරාදි විකරණයෝ; එවං, මෙසේමැයි—*

පුබ්බාපරභාග, පූර්වාපරභාගයෙහි; ඨිතා, සිටිමෙන්; භින්නා, වෙන්වෙන්වූ; ධාතුවිභත්තියො, ධාතු විභක්තිදෙදෙනා; නිස්සාය, නිසා; යෙ, යම්; පච්චයා, ප්‍රත්‍යකෙණෙක්; හොන්ති, වෙද්ද; තෙ, ඔහු; විකරණ, විකරණ නම්හු; සියුං, වෙත්—සො, හෙතෙම; ඔදනං, බත; පචති, පිසේ—

---

* “භාවකම්මෙසු යො” ය, “රුධාදිතො නිග්ගහිතපුබ්බං ච” යනාදිවූ “චුරාදිතො ණෙ ණයා” යනු, අනන්තකොටඇති සූත්‍රයෙන් වන්නාවූ—ය ය, අ ය, ‘ණු ය, ණා ය, උණා ය, ප්ප ය, ණ්හා ය, ඔ ය, යිරා ය, ණෙ ය, ණ ය—යන මේ විකරණප්‍රත්‍යයෝ වත්තමාන පචමි හියත්තනීයෙහි වෙතියි සේයි—

බහුමහි, බහුවචනයක්; වත්තබ්බෙ, කිවමනාකල්හි; බහුවචනා, බහුවචනවූ; අනති, අනති වේ—සරලොපාදි, සරලොපො මාදෙස පච්චයාදීන් ලොප්ද ප්‍රකෘතිද නයෙ පරං යන්නෙන් පැමිනිමද වේ—තෙ, ඔහු; පචන්ති, පිසෙත්—(අප්පයුජ්ජමානෙපි යනුහෙයින් සො ච, තෙ ච, යනාදි නාමයන්ගේ ප්‍රයොගනැතිවද කෙවලව පචති පචන්තිද වේ—අර්ථවූකලී සම්මැයි—සො යන ශබ්දයෙන්ද පචති යන ශබ්දයෙන්ද එකම කර්තෘ වාච්‍යවනහෙයින් ඒ ශබ්දයෝ දෙදෙන එකම කර්තෘඛ්‍ය අර්ථයෙහි පවතිත්තුයි පචති යන පදයහා සො යන පදය තුල්‍යාධිකරණයි-මෙසේම සෙසුතන්හිදු දතයුතුයි—තුල්‍යාධිකරණෙ යනුහෙයින් තෙන හඤ්ඤසෙ ත්වං යනාදියෙහි ප්‍රථමපුරුෂ් නොවේ—මෙහි තෙන යන නාමය ප්‍රයුක්තදවුව තෙන යන පදයෙන් වාච්‍යවූ කර්තෘඛ්‍යවූ අර්ථයද හඤ්ඤසෙ යන පදයෙන් වාච්‍යවූ කර්මාඛ්‍යවූ අර්ථයද වෙන්වෙන්හෙයින් තෙන හඤ්ඤසෙ යන පදයන්ගේ තුල්‍යාධිකරණබවෙක් නැති—මෙසේම සෙසුතැන්හිදු දතයුතුයි—හන හිංසායං යන්නෙහි හන යන ශබ්දරූපයට පෙරසේම ධාතුසංඥාදි කළකල්හි ඔවුන් කෙරෙන් කර්මයෙහි මධ්‍යමපුරුෂයෙහි වත්තමාන සෙ විභක්තිවෙයි "භාවකම්මෙසුයො" යි මැද ය වෙයි—යවතං යනාදින් යවත්වූ නකාරයහට ඤ වෙයි—ඤහට ද්විත්ව වෙයි—හඤ්ඤසෙ යනු වේ—තෙන, ඔහුවිසින්; ත්වං, තෝ; හඤ්ඤසෙ, නසනුලැබෙයි)—පයුජ්ජමානෙ, පයුජ්ජමානෙ යනුද; අපි, අපි යනුද; තුල්‍යාධිකරණෙ ඉතිච, තුල්‍යාධිකරණෙ යනුද; අධිකාරො, පරස්සෙම පදයෙහිද අත්තනොපදයෙහිද වැටේ—

තුම්හෙ—පෙ—තුම්හෙ ච, මජ්ඣිමො ච, යනු පදයි—තුල්‍යාධිකරණෙ, සමානාධිකරණවූ; තුම්හෙ, තුම්හ ශබ්දය; පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණලබනකල්හිද; අප්පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණ නොලබනකල්හිද; මජ්ඣිමො හොති, මධ්‍යමපුරුෂ වේ—(මජ්ඣෙ භවතීති මජ්ඣිමො—"ජතාදිනම්මියා ච" යි මජ්ඣ ශබ්දයාකෙරෙන් ඉම වේ)-ත්වං, තෝ; පචසි, පිසෙයි; තුම්හෙ, තෙපි; පචථ, පිසව්-(කෙවලවද පචසි පචථ යි වේ—අර්ථසම්මැයි—තුල්‍යාධිකරණෙ යනුහෙයින් ත්වයා පච්චතෙ ඔදනො යනාදියෙහි මධ්‍යමපුරුෂ නොවේ-ත්වයා, තාවිසින්; ඔදනො, බතතෙම; පච්චතෙ, පිසනුලැබේ—මෙහි ත්වයා යි තුම්හ ශබ්දප්‍රයුක්තදවුව ත්වයා යන ශබ්දයෙන් වාච්‍යවූ කර්තෘද පච්චතෙ යන ශබ්දයෙන් වාච්‍යවූ කර්මයද වෙන්වෙන්හෙයින් තුල්‍යාධිකරණබවෙක් නැති-තුම්හ ශබ්දයාට සත්තම්‍යෙකවචනයෙහි ත්වයි තයි යන රූපම වත්මුත් තුම්හෙ යනු කෙසේයත්—මෙහි තුම්හ ශබ්දයතෙමේ තෝ ය, යන අර්ථවාචක නොවෙයි තෝ ය, යන අර්ථවාචීවූ අනුකාර්‍යවූ තුම්හ ශබ්දය වාචකවූ අනුකරණ ශ

ඛදාන්තරයෙහි-එහෙයින් අනුකරණ තුම්හ ශබ්දයාකෙරෙන් පරවූ ස්‍යිංහට "සමාසන්තා. වා" යි එකාරයෙක් කළකල්හි තුමෙහ යිවේ මේ අනුකරණ අනුකාය්‍යනම් කිම යත්—අනුකාරියං අනුකරියතිස දිසිකරියති අනෙනාති අනුකරණං-අනෙන, මේ කරණකොටගෙණ; අනුකාරියං, අනුකාය්‍යතෙමේ; අනුකරියති යි සේයි; ස්දිසිකරියති, සදෘශකරණුලැබේනුයි; අනුකරණං, අනුකරණ නම—අනුපූර්වවූ කර යන ධාතුහුකෙරෙන් පරව කරණයෙහි යු වූතැනියි—අනුකාරණෙන අනුකරියති සදිසී කරියතිති අනුකාරියං—අනුකරණෙන, අනු කරණය කරණකොටගෙණ; අනුකරියතිති සේය; සදිසිකරියතිති, සදෘශකරණුලැබේනුයි; අනුකාරියං, අනුකාය්‍ය නම් —අනු පූර්වවූ කර යන්නාහුකෙරෙන් කම්මයෙහි ණ්‍ය වූ තැනි—යම් ශබ්දයෙක් නාමාද්‍යර්ථපචකයෙන් එක්තරා අර්ථයක් ප්‍රකාශකරන්නාවූ ශබ්දයක්හු ප්‍රකාශ කෙරේද හේතෙමේ අනුකරණ නම-ඒනාමාද්‍යර්ථවාචකවූ ශබ්දතෙමේ අනුකරණ ශබ්දයාවිසින් වාච්‍යවේනුයි අනුකාරිය නම්—හුදෙක් ශාස්ත්‍රයෙහි මතු නොවෙයි—ලොකයෙහි ද ශබ්දයෙන් ශබ්ද වාච්‍ය වනතැන් ඇති, කෙසේයත්—ශබ්දය ය හපත ශබ්දය අසනලැබෙයි යනාදි කල්හි ශබ්දය යන මේශබ්දයෙන් ශබ්දයම වාච්‍යවේ—ශබ්දාර්ථනම් නාම ජාති ක්‍රියා ගුණ ද්‍රව්‍යයන පචක්‍රමයයි කිව ශබ්දාර්ථකෙසේවේදයත්—සමහරවාදි කෙණෙකුන් ආකාසයාගේ ගුණය ශබ්දයයි කියනබැවින් ශබ්දයා ගුණයෙහි ම ඇතුලත්වෙයි එහෙයින් ශබ්දයතෙමේ ශබ්දයාගේඅර්ථයද වෙයි යනු විරුඩනොවේ—"තසීමසී" යන සූත්‍රයෙන් සම්ංසහිතවූ තුමහ ශබ්දයාහට තසී යනආදෙශ වෙයි—සාමාන්‍යයෙන් කිව අනුකරණ ශබ්දයහට නොවෙයි යනු කෙසේ හැගේදයත්—තුමෙහ මජ්ඣිමො යි යන්නෙහි තුමෙහ සි දක්වූහෙයින් ම හැගේ—අමෙහ යනාදියද මෙසේමැයි)—

අමෙහ—පෙ-අමෙහය උත්තමො ය, යනුපදයි—තුල්‍යාධිකරණෙ, සමානාධිකරණවූ; අමෙහ, අමහශබ්දයා; පයුජ්ජමානෙපි, ප්‍රයොග කරණුලබනකල්හිද; අප්පයුජ්ජමානෙපි, ප්‍රයොගකරණුනොලබනකල්හිද; උත්තමො පුරිසො හොති, උත්තමපුරුෂ වේ—(අයමෙතෙසං අතිසයෙන උක්කටෙඨාති උත්තමො—මෙහි උ යන උපසර්ගයතෙමේ උත්කෘෂ්ටාර්ථයෙහි වැටෙයි එහෙයින් ඒ උ ශබ්දයාකෙරෙන් තම ප්‍රත්‍යය වෙයි—තකාරයහට ද්විත්වවේ)—

අකා—පෙ—අකාරො ය, දීඝං ය, හිමිමෙසු ය, යනු පදයි—හකාදිසු, හි ය, මි ය, ම ය, යන මොවුන් පරකල්හි; අකාරස්ස, අකාරයහට; දීඝො, දීර්ඝවේ—අහං, මම; පචාමි, පිසමි; මයං, අපි; පචාම, පිසමු; (කෙවලවද පචාමි පචාම යි වේ—අභි සමමැයි—තුල්‍යාධිකරණෙ ය

නුර්ගයින් මයා ඉජ්ජතෙ බුද්ධො යනාදියෙහි උත්තමපුරුෂ නොවේ—මෙහි මයා යි අම්හ ශබ්දප්‍රයුක්තද වූව මයා යන්නෙන් වාච්‍යවූ කර්තෘද ඉජ්ජතෙ යන්නෙන් වාච්‍යවූ කර්මයද භින්නහෙයින් මයා යන පදය ඉජ්ජතෙ යන පදයහා තුල්‍යාධිකරණ නොවේ—මයා, මාවිසින්; බුද්ධො, බුදුතෙම; ඉජ්ජතෙ, පුදනුලැබේ—යජදෙවපූජායං යන්නෙහි යජ යන්නහට ධාතු සංඥකොට කර්මයෙහි ප්‍රථමපුරුෂෛකවචනවූ තෙ විභක්තිද මැද ය ප්‍රත්‍යය කොට තස්ස චවගග යනාදින් ධාත්වන්ත්‍යයා එක්කොට ය කාරයහට ජ කාරයෙක්ද විතද යජ යන්නහුගේ යකාරයහට, "යජස්සාදිස්සි" යන සූත්‍රයෙන් ඉ කාරයක් කළකල්හි ඉජ්ජතෙ, යනු වේ—

පරා—පෙ—පරානි ය, අත්තනො පදානි ය, යනු පදයි—අට්ඨවිභත්තීනං, අටවිභක්තීන්ගේ; යානි යානි, යම් යම්; පරානි, පරවූ; ඡ පදානි, සපදකොණක් ඇද්ද; තානි තානි, ඒ ඒ පදයෝ; අත්තනො පදානි නාම, ආත්මනෙ පදයෝනම් හූයි—

කත්තරිචෙ ති, "කත්තරි ච" යි; අත්තනො පදානි, ආත්මනෙපදයෝ; හොන්ති, (කර්තෘකාරකයෙහි)වෙත්—සෙසං, සෙසු ප්‍රථමපුරුෂ යනාදි; පුබ්බෙව, පෙරසේමැයි—(පරස්මෛපදයෙහි වෙනස යි සේයි)—සො, හෙතෙම; පචතෙ, පිසේ; තෙ, ඔහු; පචන්තෙ, පිසෙත්; ත්වං තෝ; පචසෙ, පිසෙයි; තුම්හෙ, තෙපි; පචව්හෙ, පිසවු; අහං, මම; පචෙ, පිසමි; මයං, අපි; පචාමෙහ, පිසමු—(මෙහිදු ම කාරයා පරහෙයින් දීඝිවේ—මෙහිද කෙවලව පචතෙ පචන්තෙ යනාදිය වේ—තුල්‍යාධිකරණ යන්නට පෙරකී තෙන හඤ්ඤසෙ ත්වං—ත්වයා ඔදනො පච්චතෙ—මයා ඉජ්ජතෙ බුද්ධො—යන තුනම මෙහි ක්‍රමයෙන් පුරුෂත්‍රයට ප්‍රත්‍යුදාහරණයි—පරස්මෛපදිහ ආත්මනෙපදිහ උභයපදිහ යි ත්‍රිවිධවූ ධාතුහු ධාතුපාඨයෙහි දක්වනලදහ එහෙයින් පරස්මෛපදින් කෙරෙන් කර්තෘකාරකයෙහි පරස්මෛ පද වෙයි—ආත්මනෙපදින්කෙරෙන් කර්තෘයෙහි ආත්මනෙපදයෝ වෙති—උභයපදින්කෙරෙන් කර්තෘයෙහි ඒ දෙපදමවේ)—

අත්ත—පෙ—අත්තනො පදානි ය, භාවෙ ය, ච ය, කම්මනි ය, යනු පදයි—භාවෙ ච, භාවාර්ථයෙහිද; කම්මනි ච, කර්මකාරකයෙහිද; අත්තනො පදානි හොන්ති, ආත්මනෙ පදයෝ වෙත්—

භාව—පෙ—"භාවකම්මෙසු යො" යි; යො, භාව කර්ම දෙදෙනාගේ විෂයෙහි යවිකරණ ප්‍රත්‍යය වේ—

තස්ස—පෙ—තස්ස ය, චවගගයකාරවකාරත්තං ය, සධාත්වන්තස්ස ය, යනු පදයි—තස්ස, ඒ; යප්පච්චයස්ස, ය ප්‍රත්‍යයහට; ධාත්වන්තෙන සහ, ධාත්වන්ත්‍යයාහා එක්ව; යථාසම්භවං, සම්භවවූ පරිද්දෙ

න්; චවගගසවා, ච වර්ග ය කාර ච කාර යන මොහු: හොනති, ආව ත්—ඉධ, මෙහි; ධාතවනතසස, පච යන ධාතුහුගේ අනතයා; චව ගගාදිනතා, චවර්ගාදිහෙයින්; නාදිසෙ කතෙ, ඔහුබඳු චකාරයක් කළකල්හි; චිනතං, "පරවෙහාවො ඨානෙ" යි චිනවේ—

අනත—පෙ—අනතනො පදනි ය, පරසස පදනතං ය, යනු පදයි —අනතනො පදනි, ආතමනෙපදයෝ; කවචි, කිසිතැනෙක්හි; පර සස පදනතං, පරසෛමපදබවට; යනති, පැමිනෙත්—තෙන, ඔහුවි සින්හෝ; තයාවා, තාවිසින්හෝ; මයාවා, මාවිසින්හෝ; සො ඔද නො, ඒ බතතෙම; පචචනි, පිසනුලැබේ—පචචතෙ වා, පච්චතෙයි කියාහෝ වේ—(පචචති පච්චතෙ යනු සමානාර්ථයි—තෙහි තුමෙහ හි අමෙහහි පචචති යි කියාද යොදනු—මෙසේම බහුවචන යෙහි ද මධ්‍යම උතතම පුරුෂයෙහිද යෙදියයුතු)—තෙ, ඔහු; පචචනෙත, පිසනුලැබෙත්; පච්චසෙ, තෝ පිසනු ලැබෙයි; පචචවෙහෙ තෙපි පි සනුලබවු; පචෙච, මම පිසනු ලබමි; පච්චාමෙහ, අපි පිසනු ලබමු— (අප්‍රයුකතකල්හි වන බව හගවනපිණිස ඣං යනාදි නොකීවද ඣං පච්චසෙ යනාදිද වේමැයි)—

භාවෙ, භාවවිෂයෙහිදු—හූ හූ, හූ ය හූ ය යනදෙදෙන; සනතාය, විමෙහි වැටෙත්—ඉධ, මෙහි; භාවො, භාවනම්; කාරකාමිසසො, කා රකයෙන් අමිශ්‍රවූ; සුඬො, ශුඬවූ; ධාතවතෙථා, ධාතවර්ථයි—(ධාතවර්ථ න ම් ක්‍රියායි)-තසස, ඒ භාවයාතමා; එකතතා, කෙවලහෙයින්; එකවච නමෙව, එකවචනමැයි—තච, හෙද; පඨමපුරිසෙ එව හොති, ප්‍රථ මපුරුෂවිෂයෙහිම වේ—(බහුවචනයෙහි කුමට නොවෙයි යත්—ද්‍ර ව්‍යයන්ගේ ද්‍රව්‍යසංඛ්‍යාව අද්‍රව්‍යවූ ක්‍රියාඛ්‍යවූ භාවයට සමභවනොවන හෙයිනි—එසේ වුව එකත්වයද සංඛ්‍යාබැවින් භාවයාගේ එකවචන යද නොවුවමනා වේද යත්—එකවචනවූකලී ශබ්දශකතිසවභාවහෙ යින් වේ—ශබ්දශකතිසවභාවනම් ශබ්දයාගේ අර්ථකථනයෙහි සාම ර්ථ්‍යයයි—ඒ ශබ්දශකතිසවභාවයද ව්‍යවහාරයෙන් හැගේ—ම ධ්‍යමොතතම පුරුෂ දෙක්හිද ශබ්දශකතිසවභාවයහෙයින්ම භාවා ඛ්‍යාතයම නොවේ—තෙන, ඔහුවිසින්හෝ; තයා, තාවිසින්හෝ; ම යාවා, මාවිසින්හෝ; භූයතෙ, විමයි-තසස, ඔහුගේහෝ; තව, තාගේ හෝ; මමවා, මාගේහෝ; සමපති, දැන්; භවනනති, විමය යන; අතෙථා, අර්ථයයි-(තෙහි තුමෙහහි අමෙහහිවා භූයතෙ යි ද යොදනු-භූයතෙ යන්නෙහි තෙ විභකතියවිසින් කර්තෘහෝ කර්මහෝ උකත නොව නහෙයින් භූයතෙ යන පදයෙන් වාච්‍යවූ භවනක්‍රියාතොමෝ කර්තෘ හුවිසින්හෝ කර්මයවිසින්හෝ මිශ්‍රනොවෙතුයි කාරකයෙන් මිශ්‍රනො වූ ධාතවර්ථනම-පචති යන්නෙහි වූකලී ති විභකතිවිසින් පචනක්‍රියා වගේ කර්තෘ වාච්‍යහෙයින් එකවචනක්‍රියාතොමෝ හුදකලා නොව

කර්තෲහා මිශ්‍රවනහෙයින් ශුද්ධවූ ධාත්වර්ථ නම් නොවෙයි—පච්චතෙ යන්නෙහි තෙ විභක්තිවිසින් පචනක්‍රියාවගේ ඔදනාදිවූ කර්මය වාච්‍යහෙයින් එකවචනතෙම කෙවලනොව කර්මයෙන් මිශ්‍රවෙනුයි ශුද්ධවූ ධාත්වර්ථ නම්නොවේ-මෙහි භාවය ධාතුහුගේ අර්ථවිනම් ඒ භාවය ධාතුහුවිසින් වාච්‍යවත් තෙවිභක්තියවිසින් සැහෙනු කිමයත්—යම්සේ චක්ෂුවවිසින් විෂයකරණලබන්නාවූ රූපයතෙමේ ආලෝක මනසකාර යනාදීන් නැතිව පහළනොවේද එසේම ධාත්වර්ථවූ භාවයතෙමේ ධාතුහුවිසින් වාච්‍යවූවද තෙ විභක්තිය නැතිව ස්ඵුට නොවෙනුයි තෙ විභක්ති වේ—කර්මයෙහිද භාවයෙහිද වන්නාවූ ආත්මනෙ පදයෝතුමූ පරස්මෛපදීය ආත්මනෙපදීය උභයපදීය යන ත්‍රිවිධ ධාතූන්කෙරෙන්ම වෙත්-එහිදු සකර්මකයන්කෙරෙන් කර්මකයෙහි වෙති—අකර්මකයන්කෙරෙන් භාවයෙහි වෙත්)—

සබ්බෙ, සියලු; ආඛ්‍යාතප්පච්චයා, ආඛ්‍යාතප්‍රත්‍යයෝතුමූ; සාධනත්‍රයෙ, සාධනතුනැ; භවෙය්‍යුං, වන්නාහු; (ඒ සාධනතුනනම් කිමයත්) කත්තා, කර්තෘද; කම්මංච, කර්මයද; භාවොච, භාවයද; සාධනානි, සාධනහයි; ඉධ, මේ මගධව්‍යාකරණයෙහි; වුච්චරෙ, කියනුලැබෙත්—(බාහ්‍යව්‍යාකරණයෙහි සාධනව්‍යවහාරය කාරකසාධ්‍යය—මෙහි අභාවයටද ඇති එහෙයින් ඉධ යනුකිය—ඒ ආඛ්‍යාතප්‍රත්‍යයෝ සාධනත්‍රයෙහි වෙතියි පළමුකොට සාමාන්‍යයෙන් දක්වා දූන් විශෙෂ කියනු ලැබේ)—

තෙ, ඒ ආඛ්‍යාතප්‍රත්‍යයෝ; සකම්මකම්හා, කර්මසහිතවූ; ධාතුම්හා, ධාතුහුකෙරෙන්; කත්තුකම්මෙසු, කර්තෘකර්මදෙක්හි; හොන්ති, වෙති; භාවෙ, භාවයෙහි; න, නොවෙත්; කම්මරහිතම්හා, අකර්මකධාතුහුකෙරෙන්; කත්තුභාවෙසු, කර්තෘභාවදෙක්හිවෙති; අපරෙ, කර්මකාරකයෙහි; න, නොවෙත්-(අපරෙ යි සාමාන්‍යයෙන් කිවද කර්මය යනු කෙසේ හැගේද යත්—යම්සේ සෛන්ධව ශබ්දයෙන් ලවණයද අශ්වයාද කියතුදු භොජනකාලයෙහි සෛන්ධවයයි කී කල ලුණුයනුද යුද්ධකාලයෙහි අශ්වයයි යනුද හැගේද එසේම අපරෙ යි සාමාන්‍යයෙන් කිව පළමුකොට කර්තෘභාව දෙදෙනා කීහෙයින් ප්‍රස්තාවහෙයින් ඔවුන්කෙරෙන් පිටත්නම් වන්නේ කර්මයමය යනු හැගේ*—සකර්මකධාතුහුකෙරෙන් භාවයෙහිද සමහරතැනෙක වුව විරොධනැතිබව දක්වනු ලැබේ)—

* (මෙය සන්නය කළ ආචාර්යවරයාගේ අත්තනො මතියක් පමණමෙන් හැගේ-එසේම මේ කාණ්ඩයෙහි කච්චායනයෙහි නොපෙනෙන බොහෝ කරුණු සංස්කෘතව්‍යාකරණ ක්‍රමලෙස පෙන්නා තිබේ විමසියයුතු)—

කම්මාවචනිච්ඡාසං, ඇතිකර්මය නොකියවිකල්හි; සකම්මකා ,ස්‍යා
මිකධාතුහුකෙරෙන්; භාවෙපි,භාවයෙහිද; න විරුජ්ඣති, ප්‍රත්‍යයන්
ගේ විම විරුඬනොවේ; තං යථා, හේ මෙසේයි; දෙවදත්තෙන, දෙ
වදත්තයාවිසින්; ගෙහෙ, ගෙහි; පච්චතෙ, පිසීමයි—(පච යනු සවභා
වයෙන් සකර්මකහෙයින් ඇත්තාදවූ කර්මය වක්‍යාහු නෝකියවිවූ
හෙයින් භාවයෙහිදු ප්‍රත්‍යයවී—මෙසේම සෙසුතන්හිදු දතයුතුයි—
ලෝකයෙහිදු ඇතිදෙයක් සමහරතැනෙක්හි නොකියවිබවද නැ
තිදෙයක් කියවිබවද දක්වනුලැබේ)—

සනාහම්පි, ඇතිදවසතුවක්; වත්තුං, කියන්නට; නවාපි, සමහරතැ
නෙක්හි; ඉච්ඡාන, ඉච්ඡා නැති; අසන්තම්පි, නැතිවසතුව; වත්තුං,
කියන්නට; සාඉච්ඡා, ඒ ඉච්ඡාතොමෝ; භවෙ, වන්නීයි; තං යථා,
හේ මෙසේයි; කසුද්ද, සත්‍රිතොමෝ; අනුදරා, බඩනැත්තීය; සමුද්දෙ,
සමුද්‍රයතෙම; කුණ්ඩිකානිව, කිඩිකායෙකැයිද කියත්—(මෙහි බඩ
නැතිව කන්‍යවක් තමා නැතිහෙයින් බඩ ඇත්මය එතකුදුවූවන්
කුඩාබඩ කියව්ව අනුදරායි කියත්—කුණ්ඩිකාසවරූපයෙන් නැත්
තාදවූ සමුද්‍රය කුණ්ඩිකාවක්දකොට කියත්)—

කොච්, කිසි; අකම්මාපි, අකර්මකධාතුද; උපසගගවසා, උපසර්බ
ලයෙන්; සකම්මකො, සකර්මකනම්වේ; යථා, මෙසේයි; මහිඩ්නා, ම
හත් සැඩිඇති; තාපසෙන, තපස්වීහුවිසින්; රාගො, රාගයතෙමේ;
අභිභූයතෙ, මඩනාලැබේ—(මෙහි භූ යන ධාතුහු සවභාවයෙන්ම
අකර්මකවූවද අභි යන උපසර්ගයාගේ යෝගහෙයින් සකර්මකවෙයි
—එයින් කර්මයෙහි ය ප්‍රත්‍යය වේ සකර්මකයන්ටද අකර්මකයන්ටද
ලක්ෂණ කියනුලැබේ)—

යස්මිං ධාතුම්හි, යම් ධාතුවක්; කත්තුවාචිනි, කර්තෘහුවාච්‍යකල්හි;
කම්මං, කර්මයතෙම; ගවෙසසතෙ, සොයනුලැබේද; සො, ඒ ධාතු
තෙම; සකම්මකොති, සකර්මකයයි; ඤෙයෙන, දතයුත්තේය; තබ්බි
රුඬො, එයටවිරුඬවූයේ; අකම්මකො, අකර්මක නම්—

(යම් ධාතුවක්විසින් කර්තෘහු කියනලබනකල්හි කර්මයෙක් අපෙ
ක්ෂාකරණුලැබේනම් ඒ ධාතුව සකර්මකනම යම් ධාතුවක්හුවිසින්
කර්තෘ කියනලැබෙනකල්හි කර්මයෙක් අපෙක්ෂාකරණු නොලැ
බේද හෙතෙම අකර්මකනමැයි සේයි—ප්‍රත්‍යයන්නැතිව කෙවලධා
තුහු අභිවාච් නොවතුදු කර්තෘවාචියයි කීයේ අවයවයෙහි සමුද
යොපචාරයෙනි—යම්සේ සමුද්‍රයෙන් එක්දේශයක් දුටද සියලුසමු
ද්‍රය දුටුවාසේම සමුද්‍රය දක්නාලදැයි කියනුලැබේද මෙහිදු එපරිද්දෙ
නැයි සේයි—කථංහි යනාදින් කීදෙය සමර්ථනයකරණලැබේ)—

තථාහි, එසේමනු—සො, හෙතෙම; පචතීති, පිසෙයි; වුත්තෙ, කී
කල්හි; පාකක්‍රියාය, පචනක්‍රියාවවිසින්; සම්බන්ධියමානං, සම්බන්ධක

රණලබන්නේ; කිං තනති, කිමෙක්ද හේයයි; ඔදනාදිකං, ඔදනා
දිව්; කම්මං, කර්මය; ගවෙසනෙ, සොයනුලැබේ—සො, හෙතෙම;
භවතීති, වෙයි; වුත්තෙතු, කියනලබන කල්හි වනාහි; භවනක්‍රියා
ය, භවනක්‍රියාවවිසින්; සම්බන්ධියමානං, සම්බන්ධකරණලබන්නේ;
කිංතනති, කිමෙක්ද හේ යයි; කිච්කම්මං, කිසිකර්මයක්; න ගවෙ
සසතෙ, සොයනුනොලැබෙයි-(කවරහෙයිනයත්)—තාදිස, එබඳුවූ;
සද්දසත්තිසසභාවාභාවා, ශබ්දශක්තිස්වභාවයක් නැතිහෙයිනි—(ශ
බ්දයාගේ එබඳුවූ අර්ථකථනසාමර්ථ්‍යයක් නැතිහෙයිනැයිසේයි—ශ
බ්දයන්ගේ අර්ථකථන සාමර්ථ්‍යය ස්වභාවයෙන්ම සිඬය පුරුෂෙච්ඡා
වූ පරිද්දෙන්නොවේ-ශබ්දශක්තිය පුරුෂෙච්ඡාවූපරිද්දෙන් වේන
ම් ඝටශබ්දාදින් පටාදිහුද පටශබ්දාදින් ඝටාදිහුද වාච්‍යවන්නාහුයි)
තථා, එසේම; අඤ්ඤත්‍ර, සෙසුතැන්හිදු; (සකර්මකා කර්මකභෙද ද
තයුත්තෝයයි සේයි)—

——000——

පච—පෙ—ආමසෙති, ආමසෙ යි; තවාදිනං, තු ආදි විභක්තින්ට; ප
චමිසඤ්ඤා, පචමී සංඥවේ—

ආණ—පෙ—ආණත්‍යාසිට්ඨෙ ය, අනුත්තකාලෙ ය, පචමී ය, යනු
පදයි—ආණත්‍යත්ථෙ ච, නියොගාර්ථයක්ද; ආසිට්ඨත්ථෙච, ආශිංසනා
ර්ථයක්ද; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; පච්චුප්පන්නෙ, වර්තමාන
යෙහි වේවයි; කාලභෙදං, කාලවිශෙෂයක්; අනාමසිත්වාවා, නො
ගෙණවේවයි; පචමීහොති, පචමී නම් විභක්තිවේ—(සමහරකෙ
ණෙක් පචමී වර්තමානයෙහි වෙතියි කියති—සමහරකෙණෙක්
අසවල් කලයයි කාලවිශෙෂයක් අපෙක්ෂා නොකොට වෙතියි කිය
ත් එහෙයින් ඒ දෙපක්ෂයම දක්වනලදී)—

නියොගං, නියොගය; ආණත්තිං, ආණත්තියයි; ජඤ්ඤා, දන්නේ
ය; ඉට්ඨපත්ථනං, කැමතිදෙයක් පැතීම; ආසිට්ඨංජඤ්ඤා, ආසිට්ඨයයි
දන්නේය; අනුත්තකාලො, අනුත්තකාලනම්; සාමීපෙ, ආසන්නයෙ
හි; වුත්තො කාලො, කියනලදකාලයතෙමේ; ඉධ, මේ ප්‍රස්තාවයෙ
හි; ඉච්ඡිතො, කැමතිවනලද; වා, නොහොත්; පච්චුප්පන්නාදි, ව
ර්තමානය අතීතය අනාගතය යන; භෙදතො, විශෙෂයෙන්; අවු
ත්තො, නොකියනලදකල; ගහෙතබ්බො, ගතයුතුයි—(අනුශබ්ද
යෙන් සමීපාර්ථවාචීද වනහෙයින් අනුවුත්තො අනුත්තො යි ආ
සන්නහෙයින් කියනලද්දේද අනුත්තකාල නම් වෙයි—නොහො
ත් න වුත්තො අනුත්තො යි නොකියනලද්දේද අනුත්තනම්වේ—
මෙහි ආදිකොට වත්තමානා පච්චුප්පන්නෙනායි කියා දෙවනුකොට
ආණත්‍යාසිට්ඨෙ නුත්තකාලෙ යි කියනලදහෙයින් පචමියට ආසන්

තකල්හි පච්චුප්පන්නකාලයයි අතීතානාගතවර්තමාන හෙයින් නියමයක් නොකියනලද්දේ අනුත්තකාලයයිනම යනපක්ෂය ග ත්කලැ පළමු තුන්කලටම විරුඬනොවේ--නියොගය ආදරානාද රහෙයින් විවිධ වේ—භගවා ධම්මං දෙසෙතු යනාදි ආදරයෙන් නි යොගය භතකො කම්මං කරොතු යනු අනාදරයෙන් නියොගයි—

අප්පච්චයො, "භුවාදිතො අ" යි, අ වේ—පචතු, පිසේවා; පචන්තු පිසෙත්වා—

හිලොපං වාති, "හිලොපං වා" යි; හිස්ස, හි විභක්තිහට; ලොපො, ලොප් තෙමේ; වා, විකල්පයෙන් වේ—පච, පිස; පචාහි, පිස; ප කොථ, පචාහි යනතන්හි; අදෙසො, "අකාරෙ දීඝං හිමිමෙසු" යි දීඝ වේ—පචථ, පිසව්; යනාදිවේ—අත්තනොපදෙ, ආත්මනෙපදවිෂයෙ හි; පචතං, පිසේවා යනාදි වේ--කම්මනි, කර්මවිෂයෙහි; පච්චතං, පිසනුලැබේවා යන; ඉච්චාදි, මේආදිවේ-කත්තුසමං, කර්තෘසමයි; යොජව, "භාවකම්මෙසු යො" යි කරන්නාවූ යප්‍රත්‍යයම; විසෙසො, වෙනසෙකි—(එහෙයින් පච්චතං පච්චන්තං පච්චස්සු පච්චවෙහා පචෙච පච්චාමසෙ සනුවේ)—

භාවෙ, භාවවිෂයෙහි; භූයතං, විමවේවා—ඉතොපරං, මෙයින් ම ත්තෙහි; භාවකම්මෙසු, භාවකර්ම දෙක්හි; නයානුසාරෙන, න්‍යයා නුසාරයෙන්; ඤෙයං, දතයුතුයි—(මෙයින් මතු සත්තමඅදියෙහි භාවකර්මදෙකට උදහරණ නොපැවද උක්තානුසාරයෙන් දතයුත් තේයයි සේයි)—

සත්ත—පෙ—එය්‍යාමෙහ යි; එය්‍යාදිනං, එය්‍ය විභත්තිආදින්ට; ස ත්තමීසඤ්ඤා, සප්තමීසංඥවේ—

අනු—පෙ—අනුමතිපරිකප්පත්‍ථෙසු ය, සත්තමී ය, යනුපදයි—අනු මත්‍යෙථෙ ච, අනුමත්‍යර්ථයක්ද; පරිකප්පත්‍ථෙ ච, පරිකල්පාර්ථයක් ද (හැහෙණකල්හි;) අනුත්තකාලෙ, අනුක්තකාලයෙහි; සත්තමී හොති, සප්තමී නම් විභක්තිවේ—(අනුක්තකාලය ආදි තිපරිද්දෙ න්මැයි)—

යංකිංචි, යම්කිසිවක්; කත්තුං, කරන්නට; ඉච්ඡන්තං, කැමැත්ත හුට; අඤ්ඤ, අනිකෙක්; අනුමඤ්ඤති, අනුදන්නි යන; යං, යමෙ ක් ඇද්ද; සා, හෝතොමෝ; අනුමති, අනුමතිනම; කත්තබ්බ, ක ටයුත්තෙහි; අනිච්ඡයො, නිශ්චය නොකිරීම; පරිකප්පො, පරික ල්පයයි; මතො, දන්නාලදී—

යඳදිනා, යඳනුපපතනාදීන්; එය්‍යස්ස, එය්‍ය විභක්තියට; එආදෙ සො, එ යන ආදෙසය; වා, විකල්පයෙන් වේ—පචෙ, පචෙය්‍ය, කියා දවේ—(පිසනු කැමැත්තාහට පිසේවායි අනුදන්නේද පචෙ යි කිය

යී—බත් පිගස්ස්සෙහෝ අඹු පිගේස්සෙහෝයි කටයුත්තෙහි හිමිකන්නැති විෂයෙහිදු පචෙ යී කියා, මෙසේම බහුවචනයෙහි මධ්‍යමොත්තමපුරුෂයෙහිදු සුදුසු පරිද්දෙන් යොදනු)—පචෙය්‍යං යනාදි වේ—

අත්තනො—ආත්මනෙපදයෙහි—(මෙහි අත්තනොයි කී මාත්‍රයකින් අත්තනොපදෙ යනුම සෙනාභිමනාථයෙන්*ලැබේ—භිමසෙන යනා මේ සමසනපදයෙහි සෙන යන ශබ්දයහැර භිම යන එකදෙශයෙන් භිමසෙන ශබ්දයෙන් වාච්‍යවූ රජ කියනු ලැබේ—දෙවදත්තොයි කිවමනාතන්හි දත්තයනු හැර දෙවොයි කියත්මය දෙවයනු හැරද දත්තයයි කියත්මැයි)—පචෙථ, පිසව්, † යනාදි වේ—(කර්මයෙහි පචෙවථ පචෙවරං යනාදිවේ—භාවයෙහි භූයෙ භූයෙථ යනුදවේ—දෙතැන්හිම ය වේ)—

පඨමී සත්තමී ඉති, පඨමී සත්තමී යන; අයං, මෝතොමෝ; පුබ්බාචරියසඤ්ඤා, පූර්වාචාර්‍ය්‍යයන් කළසංඥයි—(බුදෙක් රුඪිසංඥයයි සේයි)—

---

පරො—පෙ—මෙහ යී, අ ඉත්‍යාදීනං, අ යනාදි විභක්තීන්ට;පරොක්ඛාසඤ්ඤා, පරොක්ෂා සංඥවේ—

අප—පෙ—අපච්චක්ඛෙ ය, පරොක්ඛා ය, අතීතෙ ය, යනුපදයි—අක්ඛං, අක්ඛනම්; ඉන්ද්‍රියං, ඉන්ද්‍රියය, තං, ඒ අක්ඛය; නිස්සිතං, ඇසිරුකෙළේ; පච්චක්ඛං, පච්චක්ඛනම; නපච්චක්ඛං, ප්‍රත්‍යක්ෂනොවන්නේ; අපච්චක්ඛං, අප්‍රත්‍යක්ෂනම්—අපච්චක්ඛෙ, ප්‍රත්‍යක්ෂනොවූ ඉන්ද්‍රියවිෂය නොවූ; තස්මිං අතීතෙ කාලෙ, ඒ ඉකුත්කල් හැමෙනකල්හි; පරොක්ඛා හොති, පරොක්ෂානම් විභක්තිවේ—

ඣචා-පෙ-"ඣචාදිවණ්ණානමෙකස්සරානං වෙභාවො" යී; සස්සරස්ස, සවරසහිතවූ; ආදිස්ස, ආද්‍යවර්ණයහට; ද්විත්තං, ද්විත්වවේ—පපච, පිසී—(අක්ඛානං පරං පරොක්ඛං, ඉඳුරන්ට විෂයනොවූයේ පරොක්ෂා නම්—පරොක්ඛායි සූත්‍රනිර්දේශයෙන්ම පර ශබ්දයාගේ පූර්වබවද පූර්වසිටි අක්ඛ ශබ්දයාගේ පරබවද අක්ඛශබ්දයාගේ අකාරයහට අභාවවූ ඔකාරයෙක්ද වේ—අභෙදෙ පචාරයෙන් පරොක්ෂා ප්‍රතිපාදක විභක්තිද පරොක්ෂා යයි කියනු ලැබේ)—

ඉකා-පෙ—ඉකාරාගමො ය, අසබ්බධාතුකම්හි ය, යනු පදයි—ව්‍යංජනාදෙ, ව්‍යඤ්ජනයක්හු ආදිකොටඇති; අසබ්බධාතුකම්හි, අසබ්බධාතුකයා පරකල්හි; ඉආගමො, ඉකාරාගමවේ—හියත්තානී පචමි

---

* (සමහරපොතෙක "භිමසෙන නාථයෙන්" කියාතිබේ)—

† (සමහරපොත්වල පිසවතියා තිබේ)—

සත්තමී වත්තමානා, හීයත්තනිය පඤ්චමිය සත්තමිය වත්තමානාය යන නාමොහූ: සබ්බධාතුකං, සර්වධාතුකනම්වෙති; තදඤ්ඤා, ඔවුන්කෙරෙන් පිටත්හු: අසබ්බධාතුකං, අසර්වධාතුකයෝනම් වෙත්—(පපච යනාදී ප්‍රයොග ශුද්ධිය විෂයනොවන තන්හියි)—

හීය—පෙ—මියාසෙ යි; ආආදිනං, ආ විභක්තිආදින්ට; හීයත්තනිසඤ්ඤා, හීයත්තනිසංඥවේ—

හීයො—පෙ—හීයොප්පභුති ය, පච්චක්ඛෙ ය, හීයත්තනි ය, යනු පදයි—හීයොප්පභුති, ඊයේපටන්කොට; පච්චක්ඛෙවා, ප්‍රත්‍යක්‍ෂවූ හෝ; අපච්චක්ඛෙවා, අප්‍රත්‍යක්‍ෂවූහෝ, අතීතෙ කාලෙ, ඉකුත්කල හැහෙනකල්හි: හීයත්තනි හොති, හීයත්තනි විභක්තිවේ—(හීයොභවං හීයත්තනං, ඊයේවූදෙය හීයත්තනනම්—අභෙදෛපචාරයෙන් විභක්තිද හීයත්තනිනම්වේ—හීයත්තනියි සූත්‍රනිර්දේශයෙන්ම හීයො ශබ්දයාකෙරෙන් භාවාර්ථයෙහි තද්ධිතවූතැන ප්‍රත්‍යයකොට හීයොශබ්දයාගේ ඔකාරයහට අකාරයකුදු ත්තනප්‍රත්‍යයාගේ තකාරය හට විත්වද කොට හීයත්තනි ශබ්දයාකෙරෙන් "නදාදිතොවා" යි කළ ඊහට යදාදින් හ්‍රස්වකළකල්හි හීයත්තනියි වේ)—

අකාරො—පෙ—පත්තිසු යි; ධාතුතො, ධාතුහුකෙරෙන්; පුබ්බෙ, ආදියෙහි; කච්, කිසිතැනෙක්හි; අකාරාගමො, අකාරාගම වේ—අපචා, පිසි—අපචූ යනාදි වේ—(ඊයේපටන්කොට ඔබ්බෙවූදෙයක් කිවමනාකල්හි හීයත්තනි ප්‍රයෝගකෙරෙති—අද උදැසනවූ දෑයද අතීතබැවින් අදදහවල් වෙයි කියත්හොත් හීයත්තනි ප්‍රයොගකොට හැකිවේ—"භුවාදිතො අ" යි කියා අ වේ)—

අජ්ජ—පෙ—අමෙහ යි; ඊ ආදීනං, ඊ විභක්තිආදින්ට; අජ්ජතනිසඤ්ඤා, අජ්ජතනිසංඥ වේ—

සමී—පෙ—සමීපෙ ය, අජ්ජතනි ය, යනු පදයි— අජ්ජප්පභුති, අද පටන්කොට; සමීපෙ, ආසන්නවූ; අතීතෙ කාලෙ, ඉකුත්කල හැගෙනකල්හි; අජ්ජතනිහොති, අජ්ජතනිනම් විභක්තිවේ—(අජ්ජභවං අජ්ජතනං, අදවූයේ අජ්ජතන නම;උපචාරයෙන් විභක්තිද අජ්ජතනිනමු—අජ්ජතනියි සූත්‍රනිර්දේශයෙන් අජ්ජශබ්දයාකෙරෙන් භාවාර්ථයෙහි ත්තනප්‍රත්‍යය වේ—ඊහට හ්‍රස්ව පෙරසේමැයි)—අපචී, පිසි—යදාදිනා, යදනුපපන්නාදීන්; රස්සො, ඊකාරයහට හ්‍රස්වකළකල්හි: අපචි යනු වේ—අකාරාගමාභාවෙ, කච්ග්‍රහණයෙන් අකාරාගමය නූවූතන්හි, පචි යනු වේ—

සබ්බ—පෙ—සබ්බතො ය, උං ය, ඉංසු ය, යනු පදයි—සබ්බධාතුහි, සියලුධාතුන්කෙරෙන් පරවූ; උංවිභත්තිස්ස, උං විභක්තියට, ඉංසවා දෙසො හොති, ඉංසු යන ආදෙශ වේ—අපචිංසු, පිසුහ—අපචුං යනා

දිඉවේ-ඉකාරාගමො, "ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යි. ඉ වේ—
අපච්ඡිඉ යනු වේ—

අතීතරත්තියා, අතීත්වූරාත්‍රියගේ, පච්ඡිමෙ, පසුවූ; යාමෙවා, යමහෝ; අමුස්ස, මේ යම්හුගේ; අඩ්ඪං වා, භාගයක්හෝ; අජ්ජතනො කාලො, අජ්ජතනිකල්හම්; සියා, වන්නේයයි; වෙය්‍යාකරණා, වෙය්‍යාකරණයන්ගේ, දස්සනං, මතයයි—(ඊයේ රෑයින් දසපැයක් සමහරකෙණෙක් අදට ඇතුලතැයි කියති සමහරකෙණෙක් එයින් පස් පැයක් ඇතුලතැයි කියතියි සේයි, එයින් ගියරැයින් යමක් හෝ එයින් භාගයක්හෝ ඇතුලත්කොට අජ්ජතනි ප්‍රයොග කටහැකි)—

භවි—පෙ—ස්සාමෙහ යි; ස්සත්‍යාදීනං, ස්සති විභත්ති ආදීන්ට; භවිස්සන්ති සඤ්ඤා, භවිස්සන්ති සංඥා වේ—

අනා—පෙ—අනාගතෙ ච, භවිස්සන්ති ච, යනු පදයි—අනාගතෙ කාලෙ, අනාගතකාලයක්; ගම්‍යමානෙ, හැඟෙනකල්හි, භවිස්සන්ති විභත්තිහොති, භවිස්සන්තිනම් විභක්තිවේ—(භවිස්සතීති භවිස්සන්ති, මතුකල්හි වේනුයි භවිස්සන්තිනම්-භවිස්සන්ති යනාදි සූත්‍රයෙහි භවිස්සන්තියන සූත්‍ර නිපාතනයෙන්ම හුයන්නාහුකෙරෙන් අනාගතකාලයෙහි ස්සන්තිප්‍රත්‍යයවෙයි—"ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යි ඉද "අඤ්ඤදසුච" යි ධාතුහුගේ උකාරයහට වෘද්ධිඔකාරද "ඔඅවසරෙ" යි ඔකාරයාහට අවයන ආදෙශද කළකල්හි භවිස්සන්ති ශබ්දයාකෙරෙන්වූ ස්ත්‍රීලිඞ්ගයෙහි ඊ හට හ්‍රස්වවූකල භවිස්සන්ති යනු වේ)—ඉකාරාගමො, ඉකාරාගමො යනාදින්; ඉ වේ—

පචිස්සති, මතු පිසේ; පචිස්සන්ති, මතුපිසෙත්; යනාදි වේ—

කාලා—පෙ—ස්සාමහසෙ යි; ස්සාදීනං, ස්සා විභත්තිආදීන්ට; කාලාතිපත්තිසඤ්ඤා, කාලාතිපත්තිසංඥා වේ—

ක්‍රියා—පෙ—ක්‍රියාතිපන්නෙ ච, අතීතෙ ච, කාලාතිපත්ති ච, යනු පදයි—ක්‍රියාතිපන්නමත්තෙ, ක්‍රියාවගේ අභාවමාත්‍රයක්හැඟෙනකල්හි; අතීතෙ කාලෙ, අතීතකාලයෙහි; කාලාතිපත්ති හොති, කාලාතිපත්තිනම් විභක්ති වේ—(කරණං යන අර්ථයෙහි කරයන්නාහුකෙරෙන් භාවයෙහි ණ ද රෙඵයට ලකාරද කළකල්හි කාලනම, ක්‍රියායි—අතිපතනමතිපත්ති, අභාවය අතිපත්තිනම-අති පූර්වවූ පදගතිම්හි යන්නාහුකෙරෙන් "ඉත්ථියමතියවො වා" යි තිප්‍රත්‍යයවූතැනි—කාලස්සඅතිපත්ති කාලාතිපත්තියි, ක්‍රියාවගේ නොවීම කාලාතිපත්තිනම—අභෙද්‍යොපචාරයෙන් තත්ප්‍රතිපාදකවූ විභක්තිද කාලාතිපත්ති නම් වේ—

විරුද්ධ, විරොධවස්තුවක්හුගේ; සන්නිධානාවා, සම්ප්‍රාප්තියෙන් වේ

වයි; හෙතු, හේතුවත්හුගේ; වෙකල්ලතොපිවා, අසම්පූර්ණබවක්හු ත් වේ වයි; ක්‍රියාය, ක්‍රියාවගේ; අභවනං, නොවීමය යනු; යං, යමෙක් ද; තං, හෙතෙමේ; ක්‍රියාතිපන්නං, ක්‍රියාතිපන්නායයි; ඉච්ජිතං, අභි මතයි-(අතිපතනමතිපන්නං, අභාවයතෙමේ අතිපන්න නම්-අති පූර්වවූ පද යන්නාහුකෙරෙන් භාවයෙහිවූ ත ප්‍රත්‍යයට "භිදාදිතො ඉ න්නාන්නාර්නාවා" යන්නෙන් ධාත්වන්තයාහා එක්කොට අන්න යන ආදෙශවූතැන ක්‍රියාය අතිපන්නං ක්‍රියාතිපන්නං)—

අකාරිකාරාගමො, අකාරාගමො භියත්තනජ්ජතනි යනාදින් අ කාරාගමද "ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යි ඉකාරාගමද වේ)- සවෙ, ඉදින්; තබ්බිරුඩං, එයට විරුඩවස්තුයෙක්; න භවෙය්‍ය, නො වීනම්; තදුපකරණං, එයට උපකරණයක්; ලභෙථ, ලද්දේවිනම්; අ පච්ඡසා, පිසූයේයි-(මෙහි පචනයට විරුඩ වස්තුවනම් වෂ්‍රාදිය උපක රණ නම් භාජනාදියයි)-අපච්ඡසංසු යනාදිය වේ-කාලාතිපත්තියයි—

පචන්තං, පිසන්නාහු; පයොජයන්ති, මෙහෙයයි යනු; අත්ථෙ, අර්ථ යෙහි—

ධාතු—පෙ—ධාතුහි ය, ණෙ ණය ණාපෙ ණාපයා ය, කාරිතානි ය හෙත්වත්ථෙ ය, යනු පදයි—හෙත්වත්ථෙ, හෙත්වර්ථයක්; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; ධාතුහි, ධාතූන්කෙරෙන්; ණෙ ආදයො, ණෙ ය, ණ ය ය, ණාපෙ ය, ණාපය ය, යන මොහු; හොන්ති, වෙති; තෙසං, ඒ ණෙ ආදින්ට; කාරිතසඤ්ඤා ච, කාරිතසංඥදවේ—

කාරි—පෙ—ලොපං යි; ණලොපො, කාරිතසංඥයන්ගේ ණහට ලොප්වේ—

අසං—ෙ —ාරිතෙ යි; වුඩ්ඩි, කාරිතකළකල්හි අසංයොගාන්ත යාහට වෘ

ධාතු—පෙ— පච්චයෙහි ය, විභත්තියො ය, යනු පදයි—ධාත්ව ත්ථෙ, ධාත්වර්ථ්යෙහි; නිද්දිට්ඨෙහි, දක්වනලද; ඛාදි, ඛ ප්‍රත්‍යය ආ දිකොටඇති; කාරිතනෙතෙහි, කාරිතප්‍රත්‍යයන් අන්තකොටඇති; ප ච්චයෙහි, ප්‍රත්‍යයන්කෙරෙන්; විභත්තියො හොන්තීති, විභක්තිහුවෙ ත් හුයි; ත්‍යාදයො, ති අන්ති යනාද් විභක්තිහු වෙත්—(මෙහි පච්ච යා යි අභෙදෙපචාරයෙන් ප්‍රත්‍යයාන්තවූවන් ගත්හුයි-එහෙයින් ප ච්චයෙහි යි ප්‍රත්‍යයාන්තයන්කෙරෙනැයි සේයි—ඛාදිහු නම්-තිජ— පෙ—ඛජසා යනාදි සූත්‍රයෙන් කරණලබන ඛ ය, ජ ය, ස ය, ආ ය, ඊය, යනමොහුයි-කෙවල ධාතූන්කෙරෙන් වනත්‍යාදි විභක්තින් ධා තූන් ප්‍රත්‍යයාන්තවූකලද වනපිණිස මේසූත්‍ර කීය)-පාචෙති, පිසවා පරලොපො, "වා පරො අසරූපා"යි ලොප්වේ-පාචෙන්තිඉති, පාචෙ න්ති යනු; ආදි, මෙආදිවූ රූප වේ—(පාචෙසි, පාචෙථ, පාචෙමි, පා-

දෝම, යනු, වේ—ණය වූ කල්හි පාවයති යී වෙයි-ණපෙ වූකල්හි පාවාපෙති යනුවෙයි—ණාපය වූකල්හි පාවාපයති යනුවෙයි—අනවනෙපදයෙහි පාවෙතෙ යනාදි වෙයි අත්තේ—හෙත්වර්ථප්‍රත්‍යයාන්තයන් සකර්මකහෙයින් කර්මයෙහිමුත් භාවයෙහි ප්‍රයොගනැති)—අට්ඨවිහත්තිසු, වත්මානාදි අටවිභක්තියෙහි; ඤෙය්‍යං, දතයුතු—

අකම්මකාපි, කර්මරහිතවූ ධාතුහුද; හෙත්වත්ථප්පච්චයන්තා, හෙත්වර්ථයෙහි කළාවූ ප්‍රත්‍යයන් අන්තකොට ඇත්තාහු; සකම්මකා, කර්මසහිත වෙති, තං යථා, භේ මෙසේයි; භික්ඛු, භික්ෂුතෙමේ; රාගාදි, රාගවෙෂාදීන්; දූසකං, නසන්නාවූ; මග්ගං, ආය්‍යීමාර්ගය; භාවෙති, බවා-(භූයන්නාහුකෙරෙන් හෙත්වර්ථයෙහි ණෙ ප්‍රත්‍යයකොට කාරිතසා පරකල්හි වෘද්ධින් ඌ කාරයහට ඔ කාරයක් කොට "තෙ ආයාවා කාරිතෙ" යී ඔකාරයහට අව යන ආදෙශ කොට භාවෙ යන්නාහුකෙරෙන් පෙරලෙස්ම ති විභක්ති කළකල්හි භාවෙති යනුවේ—මෙහි භූ යනු සබ්භාවයෙන් අකර්මකවූයේද ණෙ ප්‍රත්‍යයාන්තහෙයින් මග්ගං යන කර්මය අපෙක්ෂාකෙරේනුයි සකර්මක නම් වේ—මෙසේම සෙසුතන්හිදු දතයුතු)—භූවාදි ගණයයි—

——000——

රුධි යන වේ; ආවරණෙ, වැළැක්මෙහි වැටේ—

අඉති, අ යනු; එව, වැටේ;

රුධා—පෙ—රුධාදිතො ය, නිග්ගහීතං ය, පුබ්බං ය, ච ය, යනු පදයි—(සූත්‍රයෙහි නිග්ගහීතං පුබ්බං යී තිවමනාතන්හි සන්ධිහෙයින් නිග්ගහීතයාට ලොප්කොට නිග්ගහීතපුබ්බං යී කීය)—රුධාදිතො, රුධාදි ධාතුන්කෙරෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; අප්පච්චයො හොති, අ වෙයි; ධාත්වන්තා, ධාත්වන්ත්‍යයාකෙරෙන්; පුබ්බෙ, ආදියෙහි; බින්දාගමොච, නිග්ගහීතයෙක්ද ආගම වේ-(වර්ගාන්තාවෙයි)-රුන්ධති, වලකා; රුන්ධන්තිත්‍යාදි, රුන්ධන්තියනාදි වේ—අට්ඨවිහත්තිසු, අටවිභක්තියෙහිද; හෙත්වත්ථෙපි, හෙත්වර්ථයෙහිද; ඤෙය්‍යං, දතයුයි—(හෙත්වර්ථයෙහි රොධෙති යනාදි වේ)* තථා, එසේම; උපරි, මත්තෙහිද දතයුතුයි-(මතු කියන දිවාදිවූ ගණයෙහිදු නොකිවද අටවිභක්තිහිද හෙත්වර්ථයෙහිදප්‍රයොග දතයුතුයයි සේයි-රුධාදි, රුධාදි යී-

දිවු යනවේ; කීළාදිම්හි, ක්‍රීඩාදිවූ අර්ථයෙහි වැටේ—

දිවා-පෙ—"දිවාදිතො යො" යි කත්තරි, කර්තෘකාරකයෙහි; යො, දිවාදීන්කෙරෙන් යප්‍රත්‍යය වේ—තස්සෙසත්තාදි, තස්ස චවග්ගයකාරව

---

* (ඇතම්පොතක රුන්ධෙති යනාදි වේ කියා තිබේ)—

කාරන්තං සධාතුවන්තස්ස" යනුද, පුබ්බරූපන්ති, පුබ්බරූපං යනුද එව, වැටේ—

යථා—පෙ—යථා ය, කත්තරි ය, ච ය, යනු පදයි—යථා, යම්සේ; භාවකම්මේසු, භාව කම් දෙක්හි; යපච්චයස්ස, ය ප්‍රත්‍යයහට; ආදෙසො හොති, ආදෙශවේද; තථා, එසේම; කත්තරිපි, කර්තෘකාරක යෙහිද වෙයි; ය කාරස්ස, ය කාරයාට; පුබ්බරූපො, පූර්වරූපවූ; වො, ව කාරයෙක් වේ—විතෙත, "පරවෙභාවො ඨානෙ" යි ව්භකළකල්හි—

"දෙ ධස්සචෙ" ති, දෙ ධස්සච යනා; අත්‍ර, මේ සූත්‍රයෙහි; ච කාරෙන, ච ග්‍රහණයෙන්; බවයං, බ කාරදෙකක් වේ—දිබ්බති, කෙළියි- දිබ්බන්ති යනාදි වේ—දිවාදි, දිවාදියි—

සු යනමේ; සවණෙ, ඇසීමෙහි වැටේ—

සවාදි—පෙ—"සවාදිතො ණුණාඋණා ච" යි කත්තරි කර්තෘකාරක යෙහි; ණුවාදයො, ණු ය, ණා ය, උණා ය, යනමොහු; සවාදින්කෙරෙන් වෙත්—

අස්සොණුසු චෙති, "අස්සොණුසු ච" (යන) ඉහ, මෙහි; ච කාරෙන; ච ග්‍රහණයෙන්; ණුස්ස, ණුහට; වුද්ධි, වෘද්ධිවේ—සුණොති, අසා— උ ලොපො, සරලොපාදින් ණු හුගේ උ කාරයාහට ලොප්වේ—සුණන්ති යන; ඉත්‍යාදි, මේ ආදිවේ—(ණා වූකල්හි සුණාති යි වේ—ප පූර්වූ අප පාපුණාතෙ යන්නාහුකෙරෙන් උණා වූකල පාපුණාති යි වේ- සවාදි, සවාදියි—

කී යනු; දබ්බවිනිමයෙ, ද්‍රව්‍යයන්ගේ ගණු දෙන්නෙහි වැටේ—

කියා—පෙ—"කියාදිතො ණා" යි; කත්තරි, කර්තෘකාරකයෙහි; ණා (කියාදීන්කෙරෙන්) ණා වේ-යදූදිනා, යදනුපපනනාදින්; ඊස්ස, ඊ කාරයහට; රසෙස, හ්‍රස්වකළකල්හි—කිණාති, මිළදී ගණියි—(විකිණාති යි කිකල, විකුණෙයි සේයි—මෙහි විපූර්වයි)—කිණන්ති යනතන්හි සරලොපාදින් ණා ප්‍රත්‍යයාගේ ආකාරයාට ලොප්වේ—කියාදි, කියාදියි—

ගහ යනු; උපාදානෙ, ගැන්මෙහි වැටේ—

ගහ—පෙ—"ගහාදිතොප්පණ්හාච" යි; කත්තරි, කර්තෘකාරකයෙහි; ප්පණ්හාච, ප්ප ණ්හා, ගහාදින්කෙරෙන් වේ—

ගහ—පෙ—"ගහස්ස ඝෙප්පෙ" යි; ඝෙ ආදෙසො, ගහයන්නාහුට ප්ප පරකල්හි ඝෙ යන ආදෙශ වේ—ඝෙප්පති, ගණී—

හලො-පෙ—"හලොපොණ්හාමහි" යි; ණ්හා පරකල්හි; ධාතුවන්තස්ස, ධාතුවන්තවූ; හස්ස, හකාරයාට; ලොපො, ලොප්වේ— ගණ්හාති, ගණී-(මෙද එකවචනයි)-ගණ්හන්ති යනතන්හි ණ්හා ප්‍රත්‍යයෙහි ආකාරයාට ලොප්වේ—ගහාදි, ගහාදියි—

ඤාර යනු; කරණෙ, කිරීමෙහි වැටේ—

තනා—පෙ—තනාදිතො ය, ඔයිරා ය, යනු පදයි—තනූද්වෙව මාදිහි, තනු යන මේ ආදී; ධාතුහි, ධාතූන්කෙරෙන්, කත්තරි, කත්තෘ කාරකයෙහි; ඔයිරා හොන්ති, ඔය යිරාය යන ප්‍රත්‍යයෝ වෙත්-කරොන්ති, කෙරේ-යදාදිනා, යදනුපපන්නාදීන්; ධාතු, ධාතුහුගේ; රස්ස, රෙඵයහට; ලොපො, ලොප්වේ; ආකාරස්ස, ආකාරයහට; රස්සො, හ්‍රස්ව වේ—කයිරති, යනුවේ—(මෙද එකවචනයි) උත්ත—පෙ—"උත්ත මො කාරො" යි; ඔස්ස, ඔකාරයාට; උත්තං, උකාරතෙමේ; වා, විකල්පයෙන් වේ—

කර—පෙ—"කරස්ස කාරොච" යි; ධාතුකාරස්ස, ධාතුහුගේ අකාරයහට; වා, විකල්පයෙන්; උත්තං, උකාරයෙක් වේ—රලොපො, යදාදීන් ධාතුහුගේ රෙඵයාට ලොප්වේ—උස්ස, දෙවන උකාරයාට; වො, "වමොදුදන්තානං" යි වකාරයෙක්වේ—ව්තෙත, වකාරයාට ව්ත්තකලකල්හි; බවයං, "දෙ ධස්ස, ච" යන්නෙහි චග්‍රහණයෙන් බකාරවයෙක් වේ-කුබ්බන්ති යනු වේ—කරොන්තාවා, කරොන්තියි කියාහෝ වේ—(මෙහි ඔ ප්‍රත්‍යයාට උකාරද රේඵයාට ලොප්දනො වෙයි—"වාපරො අසරූපා" යි අන්ති විභක්තියගේ අකාරයට ලොප්වේ)—අන්තනොපදෙ, ආත්මනෙපදයෙහි; (පෙරසේම ඔකාරයාට ද ධාතුහුගේ අකාරයාටද උකාරයෙක් වේ)—කුරුතෙ කරොනෙත යි වේ—කුබ්බනෙත යනු කුබ්බන්ති යනු මෙන්—(අනෙත යන විභක්තිමැයි වෙනස්)—

කම්ම, කර්මයෙහි; යෙ, යවිකරණය කළකල්හි—

ඉව—පෙ—"ඉවණ්ණො ගමො වා" යි; ඉ ඊ ආගමා, ඉකාරය ඊ කාරය යන ආගමයෝ; වා, විකල්පයෙන් වෙත්—යස්ස, යකාරයාට; ව්තෙත, ව්තකලකල්හි; කරීයතෙ—කරීයනෙත-යනු වේ-පක්ඛෙ, ඉ කාර ඊ කාරාගම නොකළ පක්ෂයෙහි; රලොපො, යදාදීන් රෙඵයාට ලොප්වෙයි—(ව්තවෙයි)—කය්‍යතෙ යනුවේ—(තුන්රූපයෙන්ම කරණුලැබෙයි යන අර්ථයි)—

වාතෙව, වා යනු වැටේ—

කර—පෙ—කරස්සය, කාසත්තං ය, අජ්ජතනිම්හි ය, යනු පදයි—අජ්ජතනිම්හි පරෙ, අජ්ජතනි ප්‍රත්‍යයා පරකල්හි; කරස්ස, කර යන ධාතුහට; කාසාදෙසො, කාස යන ආදෙශය; වා හොන්ති, විකල්පයෙන් වේ—(මෙහි කරස්ස යන්නෙහි කර යන ශබ්ද කරණ ක්‍රියාවාචී වූ කර යන ධාතුහගවන්නාවූ ශබ්දාන්තරයෙක ධාතුනොවෙයි එ හෙයින් ඔහුකෙරෙන් ෂෂ්ඨීවිභක්ති වේමැයි-සෙසුතැන්හිද මෙසේ

මැයි)—ඊසස, ඊ වහකතියට, රසෙස, යදාදින් * හ්‍රස්වකළකල්හි; අ
කාසි යනු වේ—

ලොපො යනුද, භවිස්සන්තිමිහි යනුද, සසසස යනුද, එව, වැවේ—

කර—පෙ-"කරස්ස සප්පච්චයස්ස කාහො" යී; කරසස, කරයන ධා
තුහට: කාහො, කාහ යන ආදෙශ වෙයි; සසසස, සසයහට; ලොපො,
ලොප්වේ †—කාහති යනුවෙයි—කරිස්සති යනාදිවේ-(තනාදියෙහි
ආද්‍යි තනු යන්නනු නොපෑ කරයන්නනු පෑයේ කායිද ඔහුවිසින්
ප්‍රයොජනද මුධෘගෙයිති)—තනාදි, තනාදියි—

චූර යනමේ, ථෙයෙය, සොරකම්හි වැවේ—‡

චූරා—පෙ—චූරාදිතො ය, ණෙ ණයා ය, යනු පදයි—චූරාදිහි චූ
රාදීන් කෙරෙන්; ණෙ ණයා, ණෙ ය, ණය ය, යන; විකරණ හො
නාති, විකරණප්‍රත්‍යයෝ වෙති; කාරිතසඤ්ඤාච, කාරිතසඥද ඇ
තිවෙත්§—ණලොපවුධි, ණ ලොප් වෘධි දෙදෙන වෙත්—චොරෙ
ති, සොරකම්කෙරේ; ණය වූකල චොරයති යිවේ-චූරාදි, චූරාදියි

——000——

හොතුං, කාන්නට; ඉච්ඡන්ති, කැමතිය යන; අණෙ, අණීයෙහි—

භුජ පාලනාබ්‍යවහරණෙසු, භුජ යනු පාලන රක්‍ෂාවහා කැමෙ
ති වැවේ—⁊

භුජ—පෙ—භුජ ඝස හර සුපාදිහි ය, තු මිච්ඡනෙසු ය, ච ය, යනු
පදයි—භුජාදිහි, භුජාදි ධාතූන් කෙරෙන්; තුමනානසහිතෙසු, තු ප්‍රත්‍ය
යාන්තයානා යුක්තවූ; ඉච්ඡනෙසු, ඉච්ඡාර්ථයෙහි; ඛ ඡ සා, ඛ ය, ඡ ය,
ස ය, යන ප්‍රත්‍යයෝ; වා හොනාති, විකල්පයෙන් වෙත්—ඛචාදිව
ණ්ණානමාදිනා,? "ඛචාදිවණ්ණානමෙකස්සරානං වෙභාවො" යි;
ආදිස්ස, ආදිවර්ණයාට; විත්තං, විත්ත වේ—

* ("යදාදිනා" යනු බාලාවතාරයෙහි පෙණෙන නමුදු එය නොනි
බූතසේ මෙහි ව්‍යාඛ්‍යාන තරතිබේ—අකරි අකාසුං අකරුං යන පද
බාලාවතාරයෙහි තිබෙන නමුදු මෙහි නොකියනලදි)—

† (ලොපො චවා කියා බාලාවතාරයෙහි පෙණෙන නමුදු මෙහි
චවා යනු නැතිසේ ව්‍යාඛ්‍යානය පෙනේ)—

‡ (කාරිතානිචෙව යනුද මෙහි නොපෙන්)—

§ තෙසං කාරිතසඤ්ඤාච කියා බාලාවතාරයෙහි පෙණේ—

⁊ (බජ්සාචාතෙච යනු මෙහි සන්නයට නොගත්සේ පෙණේ)—

? (ඛචාදි වණ්ණානං යනාදි සූත්‍රය බාලාවතාරයෙහි සම්පූර්ණව
තිබේ)—

පුබ්බො—පෙ—"පුබ්බොබ්භාසො" යි; ද්විත්ත, ද්විත්වකළ කල්හි; පු
බ්බස්ස, පූර්වයහට; අබ්භාසසඤ්ඤා, අබ්භාසසංඥාවේ—

දුති—පෙ—දුතියාදීන්; අබ්භාසස්ස, අබ්භාසසංඥාඇති; චතුත්ථස්ස,
වර්ගයෙහි සතරවනුවූ; හස්ස, හ කාරයාට; තතියො, තුන්වනුවූ; බො,
බකාරයෙක් වේ—

කො බෙවෙති, "කො බෙච" යි; ධාත්වන්තස්ස, ධාතූහුගේ අන්‍ය
වූ; ජකාරස්ස, *ජකාරයාට; කො, ක කාරාදෙශවේ-බුභුක්ඛිසද්දතො,
බුභුක්ඛ යන ශබ්දයාකෙරෙන්—ධාතු—පෙ—"ධාතුප්පච්චයෙහි විභ
ත්තියො" යි; වුත්තත්තා, කියනලදහෙයින්; ත්‍යාදී, ති අන්ති යනාදී
විභක්ති වේ—බුභුක්ඛති, කනුකැමැත්තේ; බුභුක්ඛන්ති යනාදි වේ—
(ධාතූන්කෙරෙන් තුං නොකළද තුමත්ථය ධාතුම ශබ්දශක්තිස්වභාව
යෙන් හඟවනහෙයින් ධාතුතෙමේ තුමන්තයයි කියනලද්—වා ග්‍ර
හණය භොත්තුමිච්ඡති යනාදි වාක්‍යයපිණිසයි)—එවං යන්නෙන්
ඝසිතුමිච්ඡති යනාදී වාක්‍යදක්වූය—
ඝස යනු; අදනෙ, කෑමෙහි වැටේ—ඡෙ, භුජාදීන් ඡ ප්‍රත්‍යය කළක
ල්හි; ද්විත්තාදී, ද්විත්වද අබ්භාසසංඥද වේ—

කවගගස්ස—පෙ-"කවගගස්ස චවග්ගො" යි; අබ්භාසස්ස, අබ්භා
සසංඥාවූ; (ද්විත්වයෙහි පූර්වවූ) ඝස්ස, ඝ කාරයාට; ඣො, ඣ වේ—දුති
යාදිනා, "දුතියචතුත්ථානං පඨමතතියා ච" යි; ඣස්ස, ද්විත්වයෙහි පූ
ර්වවූ ඣ කාරයාට; තතියො, තුන්වනුවූ; ජො, ජ වේ—

අන්ත—පෙ—"අන්තස්සිවණ්ණාකාරො වා" යි; අබ්භාසන්තස්ස, අ
බ්භාසයාගේ අන්තයාට; ඉ, ඉ කාරයෙක් වේ—

බ්‍යජනා—පෙ—"බ්‍යජනාන්තස්ස චො ඡප්පච්චයෙසු ච" යි; ධාත්ව
න්තස්ස චො, ධාත්වන්ත්‍යයහට ච වේ—ජිඝච්ඡති කනු කැමැත්ත—
හරයනු; හරණෙ, පැහැරගැන්මෙහි වැටේ—(හරිතුං ඉච්ඡති යන
අර්ථයෙහි භුජාදීන් සවේ)—

හර—පෙ-"හරස්ස ගිං සෙ" යි; සෙ, † ස ප්‍රත්‍යයාපරකල්හි; ගිං, හ
ර යන්නට ගිං යන ආදේශවේ; හස්ස, හ කාරයාට; ජො, "කවග්ග
ස්ස චවග්ගො" යි; ජ වේ—ජිගිංසති හරණකැමැත්ත—තුමිච්ඡත්ථෙ
ස්විති කිං, තුමන්තසහිතවූ ඉච්ඡාර්ථයෙහිය යනු තුමටය; භුජනමි
ච්ඡති යනතන්හි නොවනපිණිසයි—භුජනං, කෑම; ඉච්ඡති, කැමැ
ත්ත—(මෙහි භුජයනුද ඉච්ඡාර්ථය ඇතද ඉච්ඡාව තුමන්තවූ භුජ
ධාතූහුහා සහිත නොවනහෙයින් ඛ ප්‍රත්‍යයානොවේ)-අට්ඨවිභත්ති

---

* ජකාරස්ස යනු බාලාවතාරයෙහි නොපෙණේ—

† මෙහි සෙයන්නක්ද වැඩියි—

සූ. අටවිභක්තියෙහිද; හෙතුවෙහිච, හෙතුවර්ථයෙහිද; සෙසයං, දත සූත්‍රයි—(ආයාදිවූ; මතුකියන ප්‍රත්‍යයාන්තයෝද අටවිභක්තියෙහිද හෙතුවර්ථයෙහිද දතයුත්තාහුයි භගවනපිණ්ඩස) තවූපරි යී කිය—

පබ්බතමිව, පර්වතයක්මෙන්; අත්තානං, තමා, ආචරති සේය; කරොති ති, කෙරේනුයියත; අත්ථෙ, අර්ථයක් කිවමනාකල්හි;

ආය—පෙ—ආය ය, නාමතො ය, කත්තූපමානා ය, ආචාරෙ ය, යනු පදයි—(මෙහි දකාර සන්ධියෙන් අ යි)—අනෙන, මේ කරණකොට ගෙණ, උපමියතෙති, උපමාකරණුලැබේනුයි; උපමානං, උපමාන නම්-කත්තුසස, කර්තෘහට; උපමානම්හා, උපමානවාචිවූ; දුතියන්තා, ද්විතීයාන්තවූ; නාමම්හා, ශබ්දයාකෙරෙන්; ආචාරත්ථෙ, ආචාරාර්ථයෙහි; ආයො හොති, ආය වේ—තෙසංගහණෙන, "තෙසං විභත්තියො ලොපා ච" යන්නෙහි තෙසං ග්‍රහණයෙන්; විභත්තිලොපො, විභක්තියට ලොප්වේ—සරලොපාදි, සරලොපොමාදෙසාදින් සරලොප් ආදි වේ—පබ්බතාය සද්ද, පබ්බතාය ශබ්දයාකෙරෙන්; පුබ්බෙච, උප ර පරිද්දෙන්; ("ධාතුප්පච්චයෙහි විභත්තියො" යන්නෙන්ම) ත්‍යාදි, ති ආදිවේ—උපරි, මත්තෙහිද; තථා, එසේමැයි—(මතු කියන ඊ ආදීන් කළකල්හි දු විභක්තිලොප් සවරලොප් ත්‍යාදීහු කී පරිද්දෙන්මයයි සේයි)—යොගී, ධ්‍යානලාභිතෙම; පබ්බතායති, පර්වතයක්මෙන් තමා කෙරේ—(තෙමේ පර්වතයක් වැනි වෙයි සේයි—මෙහි උපමානනම් පර්වතය උපමෙය නම් කර්තෘවූ යොගියි)—පුත්තමිව, පුත්‍රයක්හුමෙන්; ආචරතීති, කෙරේය යන අත්ථෙ, අර්ථයෙහි;

ඊයූ—පෙ—ඊය ය, උපමානා ය, ච ය; යනුපදයි—උපමානා, උපමානවාචිවූ; දුතියන්තා, ද්විතීයාන්තයාකෙරෙන්; ආචාරත්ථෙ, ආචාරාර්ථයෙහි; ඊයො හොති, ඊය ප්‍රත්‍යය වෙයි—(පුත්ත ශබ්දයාකෙරෙන් පෙරසේම ත්‍යාදීහු වෙත්)—ගරු, ගුරුතෙමේ; සිස්සං, ශිෂ්‍යයා; පුත්තීයති, පුත්‍රකුමෙන් කෙරේ—අත්තනො, තමහට; පත්තං, පාත්‍රයක්; ඉච්ඡති, කැමැත්තයන; අත්ථෙ, අර්ථයෙහි;

නාමම්හා-පෙ—නාමම්හා ය, අත්තිච්ඡත්ථෙ ය, යනු පදයි *—දුතියන්තා, ද්විතීයාන්තවූ; නාමම්හා, ශබ්දයාකෙරෙන්; අත්තනො, තමහට; ඉච්ඡත්ථෙ, කැමතිවීමය යන අර්ථයෙහි; ඊයො හොති, ඊය වේ—(මෙයට පූර්වවූ සූත්‍රයෙන් ඊය යනු වැටේ—පත්තීය ශබ්දයාකෙරෙන් පෙරසේම ති වේ)—භික්ඛු, මහණතෙම; පත්තීයති, පාත්‍රය කැමැත්තේ—

ධාතු-පෙ-ධාතුරූපෙ ය, නාමස්මා ය, ණයො ය, ච ය, යනු පදයි—ධාතුරූපෙ, ධාතුරූපනම්; ධාත්වත්ථෙ, ධාත්වර්ථයෙහි; සොච, ඒ ධාත්වර්ථය

* ("කාරිතානිතෙව" යනු මේ ව්‍යාඛ්‍යානයෙහි නොපෙනේ)—

දැ. විසුද්ධා හොන්තීත්‍යාදි, විසුද්ධා හොන්ති යනාදි වේ—(විසුද්ධා හොන්ති ද
ළ්හං කරොන්ති යනාදී අර්ථ ධාත්වර්ථනම්‍ැයි සේයි)—ධාතුරූපෙ සති,
ධාත්වර්ථයක් ඇතිකල්හි; සද්දූනානං, සි ආදිවිභක්තීන් අන්ත්‍යකොට
ඇති; නාමතො, ශබ්දයාකෙරෙන්; ණයො හොන්ති, ණය වෙයි; කාරි
තසඤ්ඤා ච, කාරිතසංඥද වේ—("කාරිතානං ණො ලොපං" යි ණ
හට ලොප්ද සරලොපාදිදකොට විසුද්ධ ශබ්දයාකෙරෙන් පෙරසේම
ත්‍යාදිවෙයි)—විසුද්ධා හොන්තීති, විසුද්ධවෙයි යන අර්ථයෙහි; විසුද්ධයති,
විසුද්ධයති යි වේ—(විසුද්ධවන්නී රාත්‍රියයි සේයි—විසුද්ධා යනු රත්‍රිය
හුබලා ස්ත්‍රී ලිඟුය ප්‍රථමෛක වචනාන්තයි)—දළ්හං කරොන්තීති, දෘඪ
කෙරෙයි යන අර්ථයෙහි; දළ්හයති යි වෙයි—(කුමක් කවරෙක් දෘඪ
කෙරේදැයි යත්—ඒ භගවතපිණිස විනයං මුනි කිය—එහෙයින් මු
නිවිනයං දළ්හයතී යි යොදනු)—මුනි, භික්ෂුතෙම, විනයං, විනය; ද
ළ්හයති; දෘඪකෙරේ—(දළ්හං යනු ක්‍රියාන්තයි)—හජිනා, ඇතුකර
ණකොටගෙණ; අතික්කමතීති, ඉක්මෙනුයි; අතිහරයති, අතිහර
යති යන; ඉත්‍යාදි, මේ ආදිවේ—අති පුබ්බො, අති පූර්වයි—(අතිපූර්වවූ
න්‍යාගියාන්තවූ හජ ශබ්දයාකෙරෙන් ණය වේ)—

යං, යම්පදයෙක්; තිකාලං, භූත භවිෂ්‍යත් වර්තමාන යන තුන්කා
ල්ඇත්තේද; තිපුරිසං, ප්‍රථම මධ්‍යමොත්තම යන පුරුෂත්‍රයක් ඇත්
තේද; ක්‍රියාවාචී, ක්‍රියාවාචකද; තිකාරකං, කර්තෘ කර්‍මම භාවය යන
තුන්කාරකය ඇත්තේද; අත්තලිඟං, ස්ත්‍රී පුං නපුංසකය යන ලිඟු
තුන නැත්තේද; ද්විවචනං, එකවචන බහුවචනය යන වචනද්වය
ක් ඇත්තේද; තං, හේතෙම; ආඛ්‍යාතනාති, ආඛ්‍යාතයයි; වුච්චති, කි
යනුලැබේ—(කාලත්‍රය වාච්‍යකල්හි නිපදවනලබනහෙයින් පදස
කාලත්‍රය ඇත්තේත්මිවෙයි-තිපුරිසං තිකාරකං යනුද මෙසේමැයි).

ආඛ්‍යාතං, ආඛ්‍යාත නිමි.

---

ණාදයො—පෙ—ණාදයො ච, තෙකාලිකා ච, යනු පදයි—ණාදි,
ණප්‍රත්‍යයා ආදිකොටඇති; දුතියන්තා අන්ත, දෙවන යු ප්‍රත්‍යයා අ
න්තකොටඇති; පච්චයා, ප්‍රත්‍යයෝ; කාලත්තයෙ, තුන්කල්හිද;දට්ඨ
බ්බා, දක්කයුත්තාහුයි—("සඥකුධචලමණ්ඩත්‍යරුචාදිහි යු". යන්
නෙන්වූ යුප්‍රත්‍යයාට පසුව "නන්‍දාදිහි යු" යන්නෙන් වන යුප්‍රත්‍යය
තෙමේ දෙවන යුප්‍රත්‍යයනම්—දෙවන යු ඇතුළුව ණාදීහු හැම තු
න්කල්හි වෙතියි සේයි)—

අඤ්ඤෙ—පෙ—අඤ්ඤෙ ච, කිත් ච, යනුපදයි—කිච්චෙහි, කිච්චප්‍ර
ත්‍යයන්කෙරෙන්; අඤ්ඤෙ, සෙසු; ණාදයො, ණප්‍රත්‍යයාදිහුද; යුප්‍ර
ත්‍යයොච, යුප්‍රත්‍යයා ආදිකොටඇත්තාහුද; කිත්සඤ්ඤා, හොන්ති,

කිතකසංඥා නිවෙත්—(කිච්චයෝ නාම තෙකිච්චායී—කිච්චසංඥක
රණලද තාබ්බ ය, අනීය ය, ණ්‍ය ය, රිච්ච ය, යන මොහුයී—අඤ්ඤෙ“කා
රොපිනි, අඤ්ඤයතෙරේහුයි: කිත්, කිත්නම්—අඤ්ඤය කාරණබවනම්
අඤ්ඤාමිනාමයම්‍යී—කර යන්නාහු කෙරෙන් “අඤ්ඤෙ කිත්” යයි
සූත්‍රනිර්දේශයෙන්ම රිත් ප්‍රත්‍යයද “රමති රතෙනා රාදිතො” යයි ප්‍ර
ත්‍යයාගේ රෙඑයකාටද ලොප්කොට සරලොපාදීන් සරලොප්ආදි
කොට කිත් ශබ්දය කිතකහෙයින් නම්බඳුකොට ඔහුකෙරෙන් වූ
සිවිභත්තියට සබ්බාසම්මාවුසො යනාදියෙහි චග්‍රහණයෙන් ලොප්
වූකල්හි කිත් යනු වේ—මෙද යොගරූඪම්‍යී—මැද කියන කිච්චප්‍ර
ත්‍යයන්කෙරෙන් ආද්වූ ණාදිහුද පසුවකි යුප්‍රත්‍යයාදිහුද කිත්සංඥ
වෙතියි සේයි)—

කත්තරි—පෙ—කත්තරි ය, කිත් ය, යනු පදයි—කිත්සඤ්ඤා, කි
ත්සංඥාඇත්තාහු; කත්තරි දට්ඨබ්බා, කර්තෘකාරකයෙහි දක්කයුත්
තාහ; යථාතනයි, පෙළනොඉක්ම; කච්, කිසිතැනෙක්හි; කම්මාදි
සුපි, කර්මාදියෙහිද: දක්කයුත්තෝයී—(කිත්සංඥයන් කර්තෘකාරක
යෙහි වෙතියි කිවද ජිනවචනයුත්තංති යනුවැටෙනහෙයින් කිසි
තැනෙක්හි කම්මකාරණාදියෙහිදු වෙතියි සේයි)—පුඤ්ඤං, පින්; අ
කාසි, කෙළේ; කරෝති, දුන්කෙරෙයි; කරිස්සති වා, මතුකෙරේහුයි
හෝ යන; අනෙ, අඤ්ඤයක් කිවමනාකල්හි—

ධාතු—පෙ—ධාතුයාය, කම්මාදිම්හිය, ණෙය, යනු පදයි—කම්මෙ,
කර්මවාච් ශබ්දයක්; අදෙ සති, පූර්වසිටිකල්හි; ධාතුතො, ධාතුහු
කෙරෙන්; ණො හොති, ණ ප්‍රත්‍යය වේ—

කාරි-පෙ—“කාරිතං විය ණානුබන්ධො” යි; කාරිතෙවකතෙ, (ණ
කාරානුබන්ධයා) කාරිතවත් කළකල්හි; ණලොපො වුඩ්ඪි, “කාරිතා
නං ණො ලොපං” යන්නෙන් ණකාරයහට ලොපද “අසංයොග
න්තස්ස වුඩ්ඪි කාරිතෙ” යන්නෙන් වෘද්ධිද යන දෙදෙන වෙත්—(අ
නුබන්ධයෝ නම් ලොප් ලබන්නාහුයී)—තෙසංගහණෙන, “තෙසං
විභත්තියො ලොපාච” යන්නෙහි තෙසං ග්‍රහණයෙන්; විභත්තිලො
පො, විභක්තියට ලොප්වේ—

කිතකා, කිතකයෝතුමූ: අභිධෙය්‍ය, අභිධෙය්‍යයට බඳුවූ; ලිඞ්ගා,
ලිඞ්ගඇත්තාහ; ඉයුවණ්ණා වරාදිතො, ඉ වර්ණ උ වර්ණාන්තධාතුන්
කෙරෙන්වූද වරාදී ධාතූන්කෙරෙන්දවූ; අප්පච්චයො, අකාරප්‍රත්‍යය
ද; දුතියො ණො, දෙවන ණප්‍රත්‍යයද, ඉප්පච්චයො, ඉප්‍රත්‍යයද; (යන
මොහු) දූමෙ සියුං, පුලිඞ්ගයෙහි වනනාහ; අකත්තරි, කර්තෘකාරක
යෙන් පිටත්තන්හිවූ; යුච, යුප්‍රත්‍යයද; භාවස්මිං, භාවයෙහිවූ; කිච්චා,
කිච්චප්‍රත්‍යයෝද; තොච, තප්‍රත්‍යයද; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙ

හිය; තවාදී, තවෙප්‍රත්‍යයාආදිකොට ඇති; තබ්බන්තුම් තනාතූ, තබ්බ තුං ප්‍රත්‍යයාදී නනකොට ඇති; (ප්‍රත්‍යයෝ) අලිඟා, ලිඟනැත්තාහ; අවිභත්තයොච, විභක්තිදනැත්තාහුයි-(කිත්වූ කිතකොයි වාක්‍යය ගෙණ කිත්ශබ්දයාකෙරෙන් "තද්ධිතසමාසකිතකා නාමංවා තවෙතූනාදිසු ච" යන්නෙහි කිතකා යි නිපාතනයෙන්ම ස්වාර්ථයෙහි අත ප්‍රත්‍යයකළකල්හි කිත් සංඥවෝතුමුම් කිතකනම්හයි දතයුත්තේයි--කිත්හුම කිතකනම්වෙත් නම් කිම්වයන්ටද කිතකව්‍යවහාරය කෙසේය යත්--යම්සේ සෙසුගස්ඇතද තිඹිරිගස් බොහෝවලට .බොහෝසෙයින් බඳිරවනයයි කියනුලැබේද එසේම සෙසුද කිම්හ සංඥයන්ඇතද කිත්සඥ බොහෝහෙයින් කිතකව්‍යවහාරවේ-වරාදීහු මතු කියනුලැබෙත්—දුතිය ණ නම් "විසරුජපදාදිතො ණ" යන්නෙන් කරණ ණ ප්‍රත්‍යයයි, තවාදීහුනම් තවෙ ය, තුං ය, තුන ය, යන මොහුයි-තවෙආදි තබ්බතුං ප්‍රත්‍යයාන්තයෝ කිතකවූවාහුද අත ඉවෙතූනාදිසුවයි ප්‍රතිෂෙධකළහෙයින් තද්ධිතාදිසූත්‍රයෙන් නම්බඳු නොවෙයි ඔහුකෙරෙන් විභක්තිහුනොවෙත්—නච්ජනති විභත්තියො යෙසං තෙ අවිභත්තයො, මෙහි බහුබ්‍රීහිකළහෙයින් අවිභත්ති ශබ්දය කිතකා යනුබලා පුලලිංගවනහෙයින් ඔහුගේ ඉ කාර පසංඥ නොවේ ඝසංඥවෙයි යො කළකල්හි "යොස්වකතරස්සොජෙඝො". යි අතවේ)—නාමම්වකතෙ, තද්ධිතාදිසූත්‍රයෙන් නම්බඳුකරණලද කල්හි; ස්‍යාදී, සි ආදිවිභක්තිවේ—පුඤ්ඤකාරො, පුඤ්ඤකාරනම්; පුමා, පුරුෂයි—ඊම්හි, ණවණිකාදීන් ඊ ප්‍රත්‍යයකළකල්හි; පුඤ්ඤකාරී, පුඤ්ඤකාරී නම්—ඉත්‍ථී, ස්ත්‍රීයි—පුඤ්ඤකාරං කුලං, පුන්‍යකාරවූ කුලයයි—

ධාතුයා ඉති, ධාතුයා යනු; අධිකාරො, සියලුකිතකයෙහි වැටේ—
කම්මාදිම්හි, කම්මාදිම්හි යනුද; අ ඉති, අ යනුද; එව, වැටේ—
සබ්බ—පෙ—සබ්බතො ය, ණවුතාවී ය, වා ය, යනුපදයි—

කම්මෙ ආදෙ, කර්මවාචී ශබ්දයක් පූර්වසිටිකල්හි වේවයි; අනාදෙ වා, ආදිවනොසිටිකල්හිවේවයි, සබ්බධාතුහි, සියලුධාතූන්කෙරෙන්; අකාරො, අප්‍රත්‍යයද; ණවුතුආවීච, ණවු ය, තු ය, ආවී ය, යනමොහුත්; වා, විකල්පයෙන්; හොන්ති, වෙත්-විත්‍තං, "පරවෙභාවො ඨානෙ" යි විතවේ—තංකරොතීති, ඒ කෙරේනුයි; තක්කරො—(මේ සාමාන්‍යවිවක්‍ෂාහෙයින් පුලලිංගයෙන් දක්වූය විශෙෂවිවක්‍ෂායෙහි වූකලි අභිධෙය්‍යලිංගමැයි එහෙයින් තක්කරො-පුමා—තක්කරා—ඉත්‍ථි-තක්කරං—කුලං යී වේ-මෙසේම මත්තෙහිදු දන්න)—සඤ්ඤයං, නමක් කිවමනාකල්හි; විභත්‍යලොපො, "තෙසං විභත්තියො ලොපාච" යන්නෙහි ච ග්‍රහණයෙන් විභක්තියට ලොප්නොවේ—

දීපඞ්කරො ඉති, දීපඞ්කරො යන. ආදී. මේ ආදියවේ—(දීපං, ආලො කය: කරොතීති, කෙරේනුයි: දීපඞ්කරො, දීපඞ්කර නම්; දීපඞ්කරනම් සර්වඥකෙණෙහි—ආදිශබ්දයෙන් ජුතින්ධරො යුගන්ධරො නෙමින්ධරො පරන්තපො යනාදීයි—නී, නියනධාතු; පාපුණනෙ, පැමිනීමෙහි වැටේ-විප්පුබ්බො, වියන උපසර්ගයා පූර්වකොටඇත්තේයි-(විප්පුබ්බො යස්මා සො විප්පුබ්බො—මාගධයෙහි ධාතුශබ්දය ස්ත්‍රීලිඞ්ගපුල්ලිඞ්ගයෙහිවේ)—උපසග්ගා, උපසර්ගයෝ; ධාතුතො, ධාතුහුකෙරෙන්: පුබ්බභාගාඑව, පූර්වභාගයෙහිවූවාහුම; දට්ඨබ්බා, දැක්කයුතාහුයි—(උපසර්ගයෝ ධාතුහුකෙරෙන් පූර්වසිටිත්මුත් පරවනොසිටිතියි සේයි)—අසංයොගන්තස්සවුඩ්ඪිඉති, අසංයොගන්තස්ස වුඩ්ඪියනු; එව, වැටේ--

අසංයු—පෙ—"අසංයුත්තුව", යි, අසංයොගාන්තස්ස, සංයොගාන්තනොවූ: ධාතුස්ස, ධාතුහුගේ: ඉවණ්ණුවණ්ණානං, ඉවර්ණඋවර්ණ දෙදෙනාහට; වුඩ්ඪි, වෘද්ධිවේ—

එඅයානි, "එඅය" යි; සරෙ, ස්වරයාපරකල්හි; (ධාතුහුගේ) එස්ස, එකාරයහට; අයො, අය යන ආදෙශවේ—විනෙති, විනෙතියි සේයි; සික්ඛයතීති, හික්මවාහුයි; විනයො, විනය නම්—(කර්තෘයෙහි ඉවර්ණයාකෙරෙන් කළ අකාරප්‍රත්‍යයහෙයින් පුලලිඞ්ගයි)—ධාතූනං, ධාතූන් තමන්; අනෙකත්ථත්තාඑව, අනෙකාර්ථහෙයින්ම; නීති, නීයනා; අස්මිං ධාතුම්හි, මේ ධාතුයෙහි; සන්තමෙව, ඇතිමවූ, සික්ඛණං; සික්ෂාර්ථය, විසද්දෙ, විශබ්දයතෙමේ; ජොතෙති, පහළකෙරේ—තථාහි, එසේමනු—

සන්තමෙවහි, පෙරම ඇතිවූ; නීලාදී, නීලාදිවූ; වණ්ණං, පැහැය, දීපාදයො විය, දීපාදීන්මෙන්; ධාතුස්මිං, ධාතුයෙහි; සන්තමෙවඅත්ථං, ඇතිමඅර්ථය; උපසග්ගා, උපසර්ගයෝ; පකාසකා, ප්‍රකාශකෙරෙත්—

(යම්සේ දීපාදීහු ඇතිම පැහැයක් ප්‍රකාශකරත්මුත් නැතිවර්ණයක් පහළනොකෙරෙත්ද එපරිද්දෙන්ම උපසර්ගයෝ ධාතුයෙහි ඇතිව සැහවිසිටි අර්ථය ප්‍රකාශකරත්මුත් නැති අර්ථයක් ප්‍රකාශනොකොටහෙති ඒහෙයින් අනෙකාර්ථවාචකවන්නෝ ධාතුහුමය උපසර්ගයෝ එමඅර්ථය ජොතකයහයි සේයි) තථ්‍යඤ්ච (යනු) සෙසූතාන්හි (උපසර්ගයෝද) මෙසේමය යි (භගවනපිණ්ඩසයි)—

"ඔඅවසරෙති" ඔඅවසරෙයි; ඔස්ස, ධාතුහුගේ ඔකාරයහට; අවො, අව වෙයි—(භවති භවනං භවන්ත්‍යස්මින්නිවා භවො, භවති, වේනුයිහෝ; භවනං, විම්හෝ; අස්මිං, මෙහිලා; භවන්ති, වෙත්නුයිහෝ;) භවො, භව නම්—(භූසත්තායං යන්නහුකෙරෙන් කර්තෘ භාව ආධාර

යනතුනැ අ වෙයි භාවාධාරදෙකැජි නවචනාහුරොධහෙයින් අවේ-
මතුදුකතීංයෙන්පිටත්තන්හි මෙසේමැයි—මේ උවණීයාතෙරෙන්
අප්‍රත්‍යයහෙයින් පුලලිඟුයි)—වර යතුඃ වරණෙ, වැලැක්මෙහි වැ
වේ—(සංපූර්වයි—සංවර්යති, සංවරණංවා) සංවරො, (වලකනුලැබේ
නුයිහෝ, වැලැක්මහෝ,) සංවර නම්—(කර්මභාවදෙකැහි අ වෙ—
මේ වරාදිහෙයින් පුලලිඟුයි)—

වර සරා, වරවරණෙය සර ගතිම්හිය යනදෙදෙනද; දර චරා, දර
අනාදරෙය චර ගති භක්ඛණෙසුය යනදෙදෙනද; ගමු යමූ, ගමු ස
ප්පගතිම්හිය යමු උපරමෙය යනදෙදෙනද; සන හනා, සන සද්දෙ
ය හන හිංසාගතීසුය යනදෙදෙනද; නද මද, නද අබ්‍යත්තෙ ස
ද්දෙය මද උම්මාදෙය යනදෙදෙනද; රණ ගහා, රණ සද්දෙය ගහ
උපාදානෙය යන දෙදෙනද; ජපාදයො, ජප ජප්පවචනෙයතුද; සෙ
සුනොකීවෝද වරාදයො, වරාදීහුනම්හුයි-(නොකීවත් ප්‍රයොගානු
සාරයෙන් දත්න—සංවරො අවසරො වරො ආදරො සචරො ආග
මො නියමො නිස්සනො—

මෙහි සකාරයාට විකවේ—"වධො හනෙච ධොච සබ්බතො" යී හ
න යන්නට වධ යන ආදේශවේ-නිනාදෙ මදෙ රණෙ සංගහො ජ
පො යනාදිහු ඒ ඒ අර්ථයෙහි ප්‍රයොගානුසාරයෙන් දතයුත්තාහුයි).

ණම්හි ඉති, ණම්හි යතුඃ එව, වැවේ—

ආකා—පෙ—ආකාරනතානං ය, ආයො ය, යනුපදයි—ණානුබන්ධ,
ලොප්කරණලද ණකාරයාඇතතහු; පරෙ, පරකල්හි; ආකාරනතධා
තූනං, ආකාරයාඅන්තකොට ඇතිධාතූන්ගේ; අනතස්ස, අන්ත:යහ
ට; ආයො හොති, ආය වේ—අට්ඨිතිධම්මා, නොසිටිනාසුලු වූවාහු; අනු
බන්ධා, අනුබන්ධයෝ නම්හු—(නොසිටිනාසුල්ලෝනම් ලොප්කරණු
ලබන්නාහුයි)—

අන—පෙ—"අනකාසුණවූනං" යී; යු ණවූ නං, යු ණවු දෙදෙනා
හට; අනකා, අන අක යනආදෙශයෝ; (ක්‍රමයෙන් වෙත්)—ඥ යතු;
ඥනෙ, දීමෙහි වැවේ-(අන්නං, බත; දදාති, දේනුයි;) අන්නදායකො;
අන්නදායක නම්—

තෙ—පෙ—"තෙ ආයාවා කාරිතෙ" යී; එඹිනං, එය ඔය යනමො
චූන්ට්; ආයආවා, (කාරිතයාපරකල්හි) ආය ආව යනදෙදෙනාවෙත්-
(නී පාපුනනෙ—නියතීති) නායකො, (පමුනුවාතුයි) නායකනම්—
(සු සවණෙ—සුණාතීති) සාවකො, (අසාතුයි) සාවකනම්—

කර—පෙ—"කරස්සාච තත්තං තුස්මිං" යී; තුම්හි, තුප්‍රත්‍යයාපරක
ල්හි; ධාතවන්තස්ස, ධාතූහුගේ අන්තයාට; තො, ත වෙයි—(කරකර
ණෙ-කරොතිති) කත්තා, (කෙරේනුයි) කත්තුනම්; සත්ථාව, සත්ථුශ

බිඳුයාවැ නියි—(සන්ධිපිනාදීන් කන්තුශබ්දයාගේ අන්තවූ උකාරයාට ආවෙයි සිහටලොප්ද වෙනියි සේයි)—දිස යනු; පෙක්ඛණෙ, බැල් මෙහිවැටේ—යදුදිනා, යදනුපපන්නාදින්; ඉස්ස, (දිසපෙක්ඛණෙ යන්නනුගේ) ඉකාරයාට: අත්තං, අත්තවේ—(සකාරයාට ත්තවේ—භයං පස්සතීති) භයදස්සාවි, (භය දක්නුයි) භය දස්සාවිනම්; දණ්ඩී ච, දණ්ඩී ශබ්දයාභාසමයි—රුජයනු: භගෙ, බිඳීමෙහි වැටේ—

විස—පෙ—"විසරුජපදදිතොණ" යි; ණො, ණ ප්‍රත්‍යයවේ—

කගා—පෙ—"කගා චජානං" යි; ණානුබන්ධෙපරෙ, ණකාරානුබන්ධයා පරකල්හි; ධාත්වන්තානං, ධාත්වන්තවූ; චජානං, චකාර ජකාර දෙදෙනාට; කගා, කකාර ගකාර දෙදෙනාවෙත්-(රුජතීති) රොගො, (පෙළානුයි) රොගනම්-(මේ දෙවන ණප්‍රත්‍යයහෙයින් පූලලිභූයි)—

භාවෙච ඉති, "භාවෙච" යි; භාවෙ, භාවයෙහි; ණො, ණ වේ—

පචනං, පිසීම; පාකො, පාකනම්—ඉහච, මෙහිදු; කම්මාවචනිච්ඡායං, කම්මයනොකියවිහෙයින්; භාවෙපි, භාවයෙහිද; ණප්පච්චයො, ණ ප්‍රත්‍යය වේ—(ආඛ්‍යාතයෙහි කර්මය අවිවක්‍ෂිතකල්හි සකර්මක ධාතූන්කෙරෙන්ද භාවයෙහි ප්‍රත්‍යය වනපරිද්දෙත්ම මේ කිතකයෙහිද වෙයිසේයි)—කිතකාභිහිතො, කිතකප්‍රත්‍යයන්විසින් කියනලද; භාවො, භාවය; දබ්බමිවෙනි, ද්‍රව්‍යවැනිවෙයි; (යන) කෑයා, (වෛයාකරණයන්ගේ) සූක්තිහෙයින්; බහුවචනචහොති, බහුවචනද වේ—(එහෙයින්) පාකා, පාකායි; (බහුවචනානන්දවේ—ක්‍රියාලක්‍ෂණවූ භාවය කෙවලහෙයින් එකවචනවත්මුත් බහුවචන කොසේ වේදයත් ද්‍රව්‍යවත්වෙයි ආප්තවචනහෙයින් බහුවචනද වෙයි සේයි)—ගමුයනු; ගතිමහි, ගමන්හි වැටේ—

ක්විචෙති, "ක්විච" යි; ක්වි, ක්විප්‍රත්‍යයවේ—

ධාතු—පෙ—ධාත්වන්තස්ස ලොපො ක්විම්හි" යි; ක්විම්හි, ක්විප්‍රත්‍යයා පරකල්හි; ධාත්වන්තස්ස, ධාතුහුගේ අන්තයහට; වා, විකල්පයෙන්, ලොපො, ලොප්තෙමේ වේ—

ක්වි—පෙ—ක්වි ලොපොච" යි; ක්විස්ස ලොපො, ක්විහට ලොප්වේ—(සබ්බං ගච්ඡතීති) සබ්බගො, (සියල්ලට යේනුයි) සබ්බගනම්—(භූ සත්තායං—අභි පූර්වයි—අභිභවතීති) අභිභූ, (පරදවානුයි) අභිභූ නාමි—(මේ වාග්‍රහණයෙන් ධාත්වන්තයහට ලොප්නොවූතැනියි)—චර යනු; ගතිමහි, ගමනෙහි වැටේ—

තස්සීලා—පෙ—තස්සීලාදිසු ය, ණී ත්වාවි ය, ච ය, යනුපදයි—ධාතුහි, ධාතූන්කෙරෙන්; තස්සීලාදිසු, තස්සීලාදීවූ; අත්ථෙසු, අර්ථයෙහි; ණකාදයො, ණී ය, තු ය, ආවී ය, යනමොහු: හොන්ති, වෙත්—(වෘඩී වේ) බ්‍රහ්මං, බ්‍රහ්මය; සීලෙන, සවභාවයෙන්; චරතීති, කෙරේනුයි

හෝ; තංධම්මං, ඒ බ්‍රහ්මය ආචාරකොට ඇත්තේහෝ; තස්මිං, ඒ බ්‍රහ්මයෙහි; සාධුවා, දක්‍ෂවූතැනැත්තේහෝ, බ්‍රහ්මචාරී, බ්‍රහ්මචාරී නම්—(මෙහි) සීලං, සීලනම්; සභාවො, ස්වභාවය; ධම්මො, ධම්මනම්; ආචාරො, ආචාරය—සාධු, සාධුනම්; කුසලො, නිපුනතැනැත්තේයි—ඝුස යනු; සද්දෙ, ශබ්දයෙහි වැටේ—

ඝද්ද—පෙ—"සද්දකුධචලමණ්ඩත්ථරුචාදිහියු" යි; යු, යුවේ—(අනකාදීන් යුහට අනවේ-"අනෙකඤ්ඤසුච" යි උකාරයාට ඔකාරයෙක්වේ)-සීලෙනා, සවභාවයෙන්; ඝොසති, ශබ්දකෙරේනුයි; ඝොසනො, ඝොසන නම්—(මෙම සූත්‍රෙහි ආදිග්‍රහණයෙන් යුවෙයි ගහවනපිණ්ස එවංයි කීයේ) වඩ්ඪ යනු; වඩ්ඪනෙ, වැඩීමෙහි වැටේ—(වඩ්ඪති සීලෙන) වඩ්ඪනො, (සවභාවයෙන් වඩීනුයි) වඩ්ඪන නම්—*

පාරා—පෙ—පාරාදිගම්මහා ය, රූ ය, යනුපදයි—පාරාදීහි, පාරාදීන්කෙරේන්; පරස්මා, පරවූ; ගම් ධාතුතො, ගමුසප්පගත්මහි යන ධාතූහුකෙරෙන්; තක්සිලාදිසු, තක්සිලාදිවූ අර්ථයෙහි; රූ නොති, රූ වේ—

රමහි—පෙ—රම්හි ය, අනෙකා ය, රාදි ය, නො ය, යනුපදයි—රානුබන්ධෙ, රකාරානුබන්ධයක්හු; පරෙ, පරකල්හි; සබ්බො ධාතවනෙතා, සියලු ධාතූන්ගේ අන්තනෙමේ; නෙන රෙන, ඒ රෙඑයාහා එක්ව; නොහොති, නොවෙයි ලෝයි—ලුප්පතීති, ලොප්කරණුලැබෙයි; (යන) අඤ්ඤො, අන්‍යයි-(පාරං ගච්ඡතීති) පාරගූ (නොළවරට යේනුයි) පාරගූනම්—(මෙහි නිපාතවූ නිග්ගහීතාන්ත පාරං ශබ්දනොවෙයි—අකාරාන්ත පාර ශබ්දයෙක එහෙයින් නෙසංග්‍රහණයෙන් අංගට ලොප්කරණු—ආදිශබ්දයෙන් වෙදගූ යනාදියි)—

භික්ඛ යනු; යාචනෙ, ඉල්වීමෙහි වැටේ—(රූ යනු වැටේ)—

භික්ඛ—පෙ—"භික්ඛාදිතොච" යි; රූ, (භික්ඛාදීන්කෙරෙන් පරව) රූවේ—යදාදිනා; යදාදීන්; කචි, කිසිතැනෙක; රස්සො, (රූයන්නාහුගේ; ඌකාරයට) හ්‍රස්වව උකාරයෙක්වේ—(භික්ඛති සීලෙන භික්ඛු, (ශවභාවයෙන් සිඟානුයි) භික්ඛු නම්—මෙම සූත්‍රෙහි ආදිග්‍රහණයෙන් රූවෙයි ගහවනපිණ්ස එවංයි කීය—

ඤා යනු; අවබොධනෙ, දැනීමෙහි වැටේ—(විප්පුවීයි—විජානාතීති) විඤ්ඤූ, (දනීනුයි) විඤ්ඤූනම්—මේ කචියන්නෙන් හ්‍රස්වනොවූ තැනිසි—ආදිශබ්දයෙන් සබ්බඤ්ඤූ යනාදියි—

——000——

* කුධාදීන් සුබොධහෙයින් නොකීවද මෙසේ දතයුතුයි—කුධකොපෙ, කුජ්ඣති සීලෙන කොධනො—චල කම්පනෙ, චලති සීලෙන චලනො, මණ්ඩභූසනෙ, මඩයති සීලෙන මණ්ඩනො—සවභාවයෙන්මණ්ඩනානුයි මණ්ඩන නම්—

භාව—පෙ—“භාවකම්මෙසු තබ්බානීයා” යි; තබ්බො, තබ්බප්‍රත්‍යය ද, අනීයො ච, අනීයප්‍රත්‍යයද; (භාවකර්මදෙක්හි වේ)—

ඉකාරා-පෙ—“ඉකාරාගමො අසබ්බධාතුකම්හි” යි; ඉ ආගමො, ඉකාරාගමවේ—(“අපෙක්ඛුසුව” සි වෑඩින් උකාරයහට ඔකාරයෙක් වේ—“ඔඅවසරෙ” යි අව වේ)—තබ්බාදෙ, තබ්බාදිසූත්‍රයෙහි; චකාරෙන, චග්‍රහණයෙන්; කිච්චන්තා, කිච්චප්‍රත්‍යයාන්තයෝ; නාමං ච, නාමයමෙන්වේ-භවනං, වීම; භවිතබ්බං, භවිතබ්බනම; භවනීයං, භවනීය නමුදුවේ—(භූ යනු අකර්මකහෙයින් දෙතැන්හිම භාවයෙහි ප්‍රත්‍යයයි—කිතකද අකර්මකහෙයින් භාවයෙහිමුත් කර්මයෙහි නොවේ)—

අන්තස්ස කරස්ස ච තත්තං තු, අන්තස්ස කරස්ස ච තත්තං ය, තු ය, යනු; එව, වැටේ—

තුංතූන—පෙ—තුංතූනතබ්බෙසු ය, වා ය, යනු පදයි—තුමාදිසු, තුං ය තූනය තබ්බය යනමොවුන් පරකල්හි; කරන්තස්ස, කර යන්ධාතුහුගේ අන්තවූ රේඵයාට; තො, තකාරය; වාහොති, විකල්පයෙන් වේ-කාරියන්ති, කරණලැබේනුයි; කත්තබ්බො, කත්තබ්බනම; කරණීයො, කරණීයනමුදුවේ—එත්ථ, මෙහි; “රහාදිතොණ” ඉති, රහාදිතොණයි; නස්ස, නකාරයාට, ණො, ණකාරයෙක්වේ—

සාස—පෙ-“සාසදිසතො තස්ස රිට්ඨාච” යනමෙහි; චකාරෙන, චග්‍රහණයෙන්; තස්ස, තකාරයහට, රට්ඨා, රට්ඨ යන ආදෙශවේ යි-(රමහි යනාදීන් රාදිලොප්වෙයි—ඉකාරයාට සරලොපාදීන්ලොප් වේ—දිස පෙක්ඛනෙ, දිස්සතීති) දට්ඨබ්බං, (දක්නාලැබේනුයි) දට්ඨබ්බනම්—(කරයනුද දිස යනුද සකර්මකහෙයින් කත්තබ්බාදී තුනම කර්මයෙහියි)—

ණ්‍යතචෙති, “ණ්‍යතච” යි; භාවකම්මෙසු, භාවකර්මදෙක්හි; ණ්‍යත, ණ්‍යවෙයි; චසද්දෙන, චග්‍රහණයෙන්; තය්‍යප්පච්චයොච, තය්‍යප්‍රත්‍යයද වේ—ඉ ආගමො, “ඉකාරාගමො අසබ්බධාතුකම්හි” යි ඉකාරාගමවේ—කරණං, කිරීමහෝ; කත්තබ්බංවා, කරණුලබනදෙයහෝ; කාරියං, කාරියනම්—(භාවයෙහිහො කර්මයෙහිහෝයි—ඤායතීති) ඤාතය්‍යං, (දන්නාලැබේනුයි) ඤාතය්‍යනම්—

වද—පෙ—වදමදගමයුජගරහකාරාදිහි ය, ජ්ජම්මග්ගය්හය්‍ය ය, ගාරො ය, වා ය, යනුපදයි—වදාදිහි, වදමදාදීන්කෙරෙන්ද; අකාර න්තෙහිච, අකාරාන්තයන්කෙරෙන්ද; පරස්ස, පරවූ; ණ්‍යස්ස, ණ්‍යහට; ජ්ජාදයො, ජ්ජ ම්ම ආදීහු; ධාතවන්තෙනසහ, ධාතවන්ත්‍යයාහා එක් ව; හොන්ති, වෙති; ගරහස්ස, ගරහ යනධාතුහට; ගාරො, ගාර යනු

ආදෙශඥ: ඛ්‍යා, විකල්පයෙන්වේ—(ධාතන්තයාද ණ්‍යද මිනා ජ්ජාදීනු
වෙනියි සේයි-වද මද දෙදෙනාකෙරෙන් පරවූ ණ්‍ය හට ජ්ජ මිය-නෙ
සූ ගමාදීන්කෙරෙන් පරවූ ණ්‍යහට ම්මාදීහු යථාක්‍රමයෙනි)—වද ය
නු;,වචනෙ,බිණී මෙහි වැටේ-(වදීයතීති, කියනුලැබේනුයි;) වජ්ජං,
වජ්ජනම්—ගරහ යනු, නින්දායං, නින්දාවෙහි වැටේ—(ගරහීයතීති)
ගාරය්හං, (නින්දාකරණුලැබේනුයි) ගාරය්හනම්— පා යනු; පානෙ,
පීමෙහි වැටේ—(පීයතීති) පෙය්‍යං, (බොනුලැබේනුයි) පෙය්‍යනම්—

කර—පෙ—"කරම්හා රිච්චො" යි; රිච්චො, කරයන්නාහුකෙරෙන්
රිච්චවේ—රාදිලොපො, (රම්හි යනාදීන්) රාදිහට ලොප්වේ—(කරී
යතීති) කිච්චං, (කරණුලැබේනුයි) කිච්චනම්—(කර්මයෙහියි)—

——000——

"නන්දාදීහියු" යි; භාවකම්මෙසු, භාවකර්මදෙක්හි; යු, යු වේ—(ග
හ උපාදානෙ-ගාහො ගණ්හියංවා) ගහණං, (ගැන්මහෝ ගන්නා
ලබනදෙයහෝ) ගහණනම්—(භාවකර්මදෙක්හියි-ඤායති) ඤාණං,
(දැන්ම) ඤාණනම්-(භාවයෙහියි)-චීසු, (ගහණං ඤාණං යන) දෙතැ
න්හි; නස්ස, නකාරයාහට; ණො, "රහාදිතො ණො" යි ණ වේ—(ක
ර්තෘකාරකයෙන් පිටත්තන්හි යුහෙයින් මේ දෙක නපුංසකයි)—

කත්තු-පෙ-"කත්තුකරණප්පදෙසෙසුච" යි; යු, යු වේ; චකාරෙන,
චග්ගහණයෙන්; සම්පදානාපාදානෙසුපි, සම්ප්‍රදාන අපාදානදෙක්හිද
යු වේ—පදෙසොති, පදෙසනම්; ආධාරො, ආධාරයයි—රජං, රජස්;
හරතීති, දුරුකෙරේනුයි; රජොහරණං, රජොහරණ නම-තොයං, ජ
ලයයි—එතෙ—පෙ—"එතෙසමොලොපෙ" යි; ඔ, ඔකාරයෙක්වෙ
යි—(මේ කර්තෘයෙහි කළ යු හෙයින් වාච්‍යලිඞ්ගබව හඟවනපිණි
ස තොයං යී කීයේ—අභිධෙය්‍යාපෙක්ෂාහෙයින් රජොහරණෙ ප
ටො—රජොහරණී සාටී යයි කියත්—වෙමැයි—හර හරණෙ ප පූ
ර්වෙයි) යෙන, යමක්කරණකොටගෙණ; පහරනති, පහරිද්ද; තං,
හෝ; පහරණං, පහරණ නම්—(කරණයෙහියි)—ආස, යනු; උපවෙ
සනෙ, හිඳීමෙහි වැටේ—යස්මිං, යමෙක්හි; ආසනති, හිඳිත්ද; තං,
ඒ; ආසනං, ආසන නම්—(ආධාරයෙහියි)—යස්ස, යමක්හට; සම්මා,
මනාකොට; පදීයතෙ, දෙනුලැබේද; තං, හෝ; සම්පදානං, සම්පදාන
නම්—(දා දානෙ—සං යනුද ප යනුද පූර්වකොට ඇත්තේයි)—යස්මා,
යමක්හුකෙරෙන්; අපදදාති යී සේයි; අපෙති, පහවේද; තං, හෝ; අ
පාදානං, අපාදාන නම්—(මේ අපාදානයෙහියි)—

සඞ්ඛ්‍යා—පෙ—"සඞ්ඛ්‍යායං දධාතො ඉ" යි; (නමක් කිවමනා කල්
හි දා ධා දෙදෙනාකෙරෙන්) ඉ, ඉවේ—දා, දායනු; දානෙ, දීමෙහි වැ

වේ—ආ පුබ්බො, ආ පූර්වයි—ආදියන්නි, ගන්නාලැබේනුයි; ආදි, ආදිනම්—(කම්වයෙහියි—ආදි යයි පූර්වදෙයට සංඥවමුත් ගන්නාළුබ්න යම්දෙයක්ව නොකියන්—මේ ඉප්‍රත්‍යයාන්ත හෙයින් පුලලිඟුයි)-ධාධාතු: ධාරණේ, දරීමෙහි වැටේ—උදකං, ජලය, දධාජ්ජති, දරාතුයි; උදධි, උදධිනම-(සාගරයයි)—යදද්නා, යදදින්; කලෝපො, උදකශබ්දයාගේ කකාරයාට ලොප්වේ—(මේ කතිඃයි)—

ඉජ්—පෙ—"ඉජ්යමනියවොවා" යි; ඉජ්යං, සත්‍රීලිඟුයෙහි; අකාරො, අකාරප්‍රත්‍යයද; ති, තිප්‍රත්‍යයද; සුව, සුප්‍රත්‍යයද; වා, විකල්පයෙන් වේ—ජර, ජර යනු: වයොහානිමහි, වයස්පිරිහීමෙහි වැටේ—(වයස්පිරිහිමනම් මිහිකිරීමයි) ජීරතිති, දිරාතුයි; ජරා, ජරානාම—(කතිඃයි)—පුන, නැවත; ආ, "ඉජ්යම්තො ආපපච්චයො" යි ආ වේ—(ආදිකොට සත්‍රීලිඟුයෙහි අප්‍රත්‍යයකළද නැවත ආප්‍රත්‍යයවනහෙයින් පුනයිකියා)*—මනයනු; ඤාණේ, දැන්මෙහි වැටේ—

ගම—පෙ—"ගම ඛන හන රමාදිනමනතො" යි; තෙ, තප්‍රත්‍යය ද; තිම්හිච, තිප්‍රත්‍යයද පරකල්හි; ධාත්වන්තලොපො, ගමාදි ධාතූන්ගේ අන්තයට ලොප් වේ-(ගමාද්සූත්‍රයෙහි ආදිශබ්දයෙන් ගත්තේ මන යනුයි—මඤ්ඤතිනි) මති, (දනිතුයි) මති නම්—(කතිඃයි)-චිති යනු; චින්තායං, සිතීමෙහි වැටේ—චෙතයතිති, සිතාතුයි; චෙතනා, චෙතනා නම්—

ඊස—පෙ—ඊසදුස්සුහි ඛ, ඛ ය, යනු පදයි—ඊසාදිහි,ඊසය, දු ය, සු ය, යනමොවුන්කෙරෙන්; ඛො හොති, ඛ වේ—යදදිනා, යදදින්; ඛලොපො, (ඛප්‍රත්‍යයාගේ අකාරයාහැර) ඛකාරයාටලොප් වේ—(කර කරණේ)—ඊසං, මඳක් කොට; කරීයතිති, කරණුලැබේනුයි; ඊසක්කරං, ඊසක්කර නම්—(කකාරයාට විත්ව වේ-ඊසයනු නිපාතයි-වාක්‍යමෙසේමයයි භගවනාපිණිස ඒවංයි කිය—දුක්ඛෙන කරීයතිති) දුක්කරං, (දුකින් කරණුලැබේනුයි) දුක්කරනම්—(සුඛෙන කරීයතිති) සුකරං, (සුවයෙන් කරණුලැබේනුයි) සුකරනම්-(මේ හැම කාම්‍යය සාමාන්‍යහෙයින් නපුංසකලිඟුය—විශෙෂාපෙක්ෂායෙහිදී අභිධෙය්‍යලිඟුමැයි)—

සමා—පෙ—"සමාදිහි ථමා" යි; ථමා, ථ ය ම ය යන ප්‍රත්‍යයෝ; (සමාදින්කෙරෙන්වෙත්)—සමු යනු; උපසමෙ, සංසිඳිමෙහි වැටේ—යදදිනා, යදදින්; උයස, සමුයන්නාහුගේ උකාරයාට, අ, අ වේ; ධාත්වන්තලොපො, ධාත්වන්තයාට ලොප; න, නොවේ—(ධාත්වන්තයාට යදදින් වන ලොප් කවිග්‍රහණයෙන් නොවෙසි සේයි)—සමෙ තීති

* නොහොත් ජරණං ජරා, දිරායාම ජරානම්-භාවයෙහි හෝ වේ-

සංහිදුවාහුයි; සමථො, සමථනම්—(කන්‍යායි)—හියනු; හයෙ, හයෙහි වැදේට්—යස්මා, යමක්හුකෙරෙන්; භායන්ති, භයපත්වෙත්ද; සො, හේතෙම; භීමො, භීමනම්—(අපාදනයි)-ඉම්මිව, මොහුමෙන්; තං, ඔහු; පස්සන්ති, බලතියන; අජෙ, අජීයෙහි—ඉම්සඳහපදද, ඉමශබ්දයා උපපදකොටඇති; දුසපෙක්ඛණෙ ඉති, දුසපෙක්ඛණෙ යන, අස්මා, මොහුකෙරෙන්, ක්විම්හි, ක්විප්‍රත්‍යයා පරකල්හි; ධාත්වන්තස්ස, ධාත්වන්තයහට; ලොපෙ සම්පත්තෙ, "ධාත්වන්තස්ස ලොපොක්විම්හි" යී ලොප් සම්ප්‍රාප්තකල්හි—

ඉය—පෙ—ඉයතමකිඑසානං ය, අන්තස්සරො ය, දීඝං ය, ක්වචි ය, දුසස්ස ය, ගුණං ය, දො ය, රං ය, ස ය, කඛ ය, ඡ ය, ච ය, යනුප දයි—අයතානං, ය ශබ්ද ත ශබ්දයන් නැත්තාවූ; ඉම යන අදිය තිං එත සමාන ඉති, ඉම ය යය තය අදියය තිං ය එතය සමානය ය න; එතේසං, මොවුන්ට; ඉම තී එස ඉති, ඉමය තීය එ ස යන; ආදේසා, ආදෙශයෝ, හොන්ති, වෙති; තෙසං, ඒ ආදෙශයන්ගේ; අන්තස්ස සරස්ස, අන්තවූ ස්වරයාට; ක්වචි, කිසිතැනෙක්හි; දීඝො, දීඝ වෙයි; දුසස්ස, දුසයනධාතුහුගේ, උකාරස්ස, උකාරයාට; ගුණො ඉකාරො, ගුණවූ ඉකාරවෙයි; දස්ස, දකාරයාට; රො, රකාරයෙක්වෙයි; ධාත්වන්තස්ස, ධාතුහුගේ අන්තයාට; සො, සකාරද; කඛො, කඛද; ඡච, ඡදවේ—ඡදිසො—යනුවේ (මෙහි ඉමශබ්දයාට ආදෙශවූ ඉකාරයාට කෙවලහෙයින් අන්තයෙකුනැතද "ආද්‍යන්ත වදෙකස්මින්" යනුවචනහෙයින් එකක්හු කෙරෙහිදු ආද්‍යන්තව්‍යවහාරකරණහෙයින් අන්තස්වරයාට දීඝවෙයි යනු විරුඩනොවේ—එවං යන්නෙන්වාක්‍යමෙසේමැයි සේයි—එහෙයින්-යම්ව නංපස්සන්ති) * යාදිසො, (යමක්හුමෙන් ඔහුබලත්තුයි) යාදිසනම්—(තම්ව නං පස්සන්ති) තාදිසො, (ඔහුමෙන් ඔහුබලත්තුයි) තාදිසනම්—(මම්ව නං පස්සන්ති) මාදිසො, (මාමෙන් ඔහු දකිත්තුයි) මාදිසනම්—(කිම්ව නං පස්සන්ති) කීදිසො, (කුමක්මෙන් ඔහුබලත්තුයි) කීදිසනම්—(එතම්ව නං පස්සන්ති) එදිසො, (ඔවුන්මෙන් ඔහු දකිත්තුයි) එදිසනම්—(සමානම්ව නං පස්සන්ති) සාදිසො, (සමයක්හුමෙන් ඔහුබලත්තුයි) සාදිසනම්—දීඝාභාවෙ, ක්වචිග්‍රහණයෙන් දීඝනොවූතැන්හි—සදිසො, සදිසොයීදවේ—(සාදිස සදිස යනු එකාර්ථය)—රාදෙසෙ, ධාතුහුගේ දකාරයාට රකාරාදෙශකළකල්හි—ඊරිසො යන; ඉ

* (පස්සන්ති යී වාක්‍යයෙහි බහුවචනය ඇතම් පොතෙක්හි පෙනේ—දකිත් යන සිංහල වචනයද පෙනේ—එසේත් වේසන්නායෙහි වෙත් වෙති—කියත් කියති කියා එකවචනාර්ථයෙහිදු පෙනේ)-

තනදි. මේආදිරූපවේ—(ආදිශබ්දයෙන් යාරිසො, තාරිසො මාරිසො කීරිසො එරිසො සාරිසො යනුවේ—දිඝීසනොවූතැන සරිසො යී වේ—මෙහි ඉමම්ව නං පස්සති යන වාක්‍යයද අඤ්ද ආදිහිපරිද්දෙන්ම දන්න)—ඉක්ඛාදෙසෙ, දිසයනධාතුහුගේ අන්තයාට ඉක්ඛ යන ආදෙශකළකල්හි—ඊදික්ඛො යනාදිවේ—(ආදිශබ්දයෙන් යාදික්ඛො තාදික්ඛො මාදික්ඛො කිදික්ඛො එදික්ඛො සාදික්ඛො යනු වේ—දිඝීසනොවූකල එක්තැනෙක්හි රාදෙශවෙයි එහෙයින් සරික්ඛො සදික්ඛොයිද වේ-මෙහිද වාක්‍යද අඤ්ද පෙරසේම්‍යැයි)-ඊකාරාදෙසෙතතෙ: (ධාත්වන්තයාට) ඊකාරාදෙශකළකල්හි; රාදෙසො, රාදෙශයතෙමේ; න, නැති; සසතු, (සමාසශබ්දයාට කළ) සකාරාදෙශයාටවනාහි; දිසො, දිසීතෙමේ; නිච්චං, නිත්‍යයෙන් වේ—ඊදි ඉති, ඊදියනා ආදි, මේ ආදියවේ—(යාදි තාදි මාදි කීදි එදි සාදි යනු වේ-මෙහිදවාක්‍යද අඤ්ද පෙරසේම්‍යැයි-ඉමෙ ඉව නං පස්සන්තිති යි යනාදිබහුවචනයෙහිදු ඊදිසො ඊරිසො ඊරික්ඛො ඊදි යනාදීම වේ)—ඉහ, මේකාතකයනයෙහි; එ ඔනං, එකාර ඔකාරදෙදෙනාට; වුඩ්ඪි, වෘද්ධියයි; ගහිතත්තා, ගත්තාලදහෙයින්; ගුණොති, ගුණසංඥනම්; ඉකාරාදි, ඉකාරඅකාරයි—*

——000——

භූ, භූ යනු වේ—(භූයන්නෙන් භූසත්තායං යනුද්දක්වූයේ, යම්සේ වනච්ඡන්නවූ පුරුෂයාගේ අඟවිදර්ශනමාත්‍රයකින් එපුරුෂයාගේ ශරීරය හැම හැයේද එසේම භූ යන එකදෙශමාත්‍ර දර්ශනයෙන් භූසත්තායං යන සියළුවාක්‍යය හැයේ)—

අති—පෙ—"අතීතෙ තතවන්තුතාවී" යි; අතීතෙ, අතීතකාලයක් කිවමනාකල්හි; තො, තය; තවන්තු, තවන්තුය; තාවී, තාවිය යන මොහු වෙත්—රස්සො, යනුදින් ධාතුහුගේ ඌකාරයාට හ්‍රස්වවේ—අහොසීති, වියුයි; භූතො, භූතනම; භූතවා, භූතවානම; භූතාවී, භූතාවිනම්—†

භුජ—පෙ—භුජාදීනංය, අන්තොය, නොය, චිය, චය, යනු පදයි—තාදෙපරෙ, තකාරාදිපරකල්හි; භුජාදීන්ගේ අන්තය

---

* බාහ්‍යශාස්ත්‍රයෙහි "ආදදෙඩගුණඃ" කියා අකාර එකාර ඔකාර යන්ට ගුණසංඥකළද මෙහි "අයුවණ්ණා නංචායොවුඩ්ඪි" යි එකාර ඔකාර දෙදෙනාට වෘද්ධිසංඥකළහෙයින් තමාට ඉෂ්ට ඉකාරද පරයන්ට ඉෂ්ට අකාරද ගුණයයි සේයි—

† (මේ ආදිදෙතැනෙක්හි "තසෙසචෙව" යනු බාලාවතාරයෙහි පෙනෙන නමුත් මෙහි නොපෙනේ)—

තෙමි; ලුපඤ්ඤෙ, ලොප්කරණු ලැබෙයි; පරස්ස, පරවූතකාරයාට; චිත්තං ච, චිත්තදවේ—අභුඤ්ජි, කෑහුයි; භුත්තො—භුත්තවා—භුත්තාවී නම්—ජන යනු; ජනනෙ, ඉපදවීමෙහි වැටේ—

ජන—පෙ—ජනාදීනං ය, ආයතිමහි ය, ච ය, යනුපදයි-තෙ, තකාරයාද; තිමහිච, තිප්‍රත්‍යයාදපරකල්හි; ජනාදීනන්තස්ස, ජනාදීන්ගේ අන්තයාට; ආහොති, ආවේ—(අජායීති) ජාතො, (උපන්නුයි) ජාතනමි—ජාග යනු; ජනනෙ, ඉපදවීමෙහි වැටේ—(ආපූවීයි)—

හා—පෙ—හාතෙන්තාහි ය, හො ය, හාස ය, ලො ය, වා ය, අදහන හානං ය, යනු පදයි-දහනාහවජ්ජිතෙහි, දහය නහය යනමොවුන් වර්ජිතකොටඇති; හකාරනෙතහි, හකාරාන්තයන් කෙරෙන්; පරස්ස, පරවූ; තස්ස, තකාරයාට; හො හොති, හකාරාදෙශවෙයි; ධාතුනන්තස්ස, ධාතුනන්තවූ; හස්සච, හකාරයටද; ළො, ළයනාදෙශවේ—(ආරොහීති) ආරුළ්හො, (නැග්ගුයි) ආරුළ්හනම්—(හූතාදිවූ ආරුළ්හතාවූ හැම කත්‍රකාරකයෙහි—"අතීතෙ ත තවන්තු තාවී" යී තවූනැති)—

භාව-පෙ—"භාවකම්මෙසු ත" යී; තප්පච්චයො, ධාතුන්කෙරෙන් තප්‍රත්‍යයවේ—ගෙයනු; සද්දෙ, ශබ්දයෙහි වැටේ—

සබ්බ—පෙ—"සබ්බත්‍ථ ගෙ ගී" යී; ගෙස්ස, ගෙයනධාතුහට; ගී, ගී යනාදෙශවේ—ගායනං, කීම; ගීතං, ගීතනම්—(මේභාවයෙහි)—

රකාරොචෙති, "රකාරො ච" යී; තෙ, තපරකල්හිද; තිමහිච, තිප්‍රත්‍යයාපරකල්හිද; ධාතුන්තස්ස, ධාතුහුගේ අන්තවූ රේඵයාට; ලොපො, ලොප්වේ—අකරීති, කරණලදනුයි; කතං, කත නම්—දුප්පුබ්බා, දුශබ්දයපූර්වකොට ඇත්තේයි—දෙධස්සචෙති, "දෙධස්ස ච" යන; ඉහ, මෙහි; චකාරෙන, චග්‍රහණයෙන්; තස්ස, තකාරයාට; ටො, ටවේ—(කකාරයාට ද්විත්වවෙයි—දුක්ඛෙන අකරීති) දුක්කටං, (දුකින්කරණලදනුයි) දුක්කටනම්—

ධඪ—පෙ—ධඪභහෙහිය, ධඪාය, චය, යනුපදයි—ධහෙහි, ධකාරහකාර යනමොවුන්කෙරෙන් පරවූ, තස්ස, තකාරයාට; ධො හොති, ධවෙයි; ඪහෙහි, ඪකාර හකාර යනමොවුන්කෙරෙන්පරවූ; තස්ස, තකාරයාට, ඪො, ඪ වේ—

හච—පෙ—හචතුත්ථානං ය, අන්තානං ය, දෙ ය, ධෙ ය, යනුපදයි—ධෙපරෙ, ධකාරයා පරකල්හි; ධාතුන්තානං, ධාතුන්ගේ අන්තවූ; හකාරවග්ගචතුත්ථානං, හකාරයාටද වර්ගයෙහි සතරවනඅක්ෂරයන්ටද; දෙහොති, දවේ—

ඩො—පෙ—ඩො ය, ඪකාරෙ ය, යනුපදයි—ඪෙ පරෙ, ඪපරකල්හි; හචතුත්ථානං, හකාරයාටද වර්ගයෙහි සතරවනඅක්ෂරයන්ටද;

යෝ හෝති, ඨවේ—බධසනු: බන්ධනෙ, බැඳීමෙහි වැටේ—(අබන්ධාති) බන්ධො, (බඳනාලදනුයි) බද්ධනම්—ලභසනු: ලාභෙ, ලැබීමෙහි වැටේ—(අලභාති) ලද්ධං, (ලබනලදනුයි) ලද්ධනම්—(කතං යනාදිවූ ලද්ධං යනු අ නාමවූ හැම කර්මයෙහියි) වඩ්ඪ යනු; වඩ්ඪනෙ, වැඩීමෙහි වැටේ—(වඩ්ඪනං) වුඩ්ඪො, (වැඩීම) වුඩ්ඪනම්—(මේ භාවයෙහියි)—ඒත්, මෙහි; යදාදිනා, යදනුපපනනාදීන්; උ, වකාරයාට අකාරයාට උවේ—දහ යනු; භස්මීකරණෙ, හළුකිරීමෙහි වැටේ—(අදහාති) දඩ්ඪං, (දවනලදනුයි) දඩ්ඪනම්—දුස යනු; අප්පීතිම්හි, අප්‍රීතියෙහි වැටේ—

සාදි—පෙ—“සාදිසනතපුච්ඡභජහංසාදීහි ට්ඨො” සි; ආදිබ්‍යඤ්ජනෙනසහ, ආදිබ්‍යඤ්ජනයාගා එක්කොට; තස්ස, (සකාරාන්තයන්කෙරෙන්ද පුච්ඡාදීන්කෙරෙන්ද පරවූ) තප්‍රත්‍යයාට; ට්ඨො, ට්ඨ යන ආදෙශවේ—(අදෙසාති) දුට්ඨො, (වෛෂකරණලදනුයි) දුට්ඨනම්—භිද යනු; විදාරණෙ, පැළීමෙහි වැටේ—

භිදු—පෙ—“භිදාදිතො ඉන්නානනඊනා වා” සි; තස්ස, (භිදාදීන්කෙරෙන්වූ තප්‍රත්‍යයාට; ඉන්නාදයො, ඉන්න අනන ඊන යනමොහුවෙති: ධාත්වන්තලොපොච, ධාතුහුගේ අන්ත්‍යයාට ලොප්දවේ—(අභෙදති) භින්නො, (බිඳිනාලදනුයි) භින්නනම්—(දඩ්ඪයනාදිවූ භින්නො යනු අනාවූ හැම කර්මයෙහි ත වූතැනියි—ඡද අපවාරණෙ යන්නාහුකෙරෙන් කර්මයෙහිවූ ත හට, අනනවූකල ඡන්නොයිවේ-ඛි ඛයෙ යන්නාහුකෙරෙන් කර්තෘයෙහිවූ ත හට ඊනවූ කල ඛීනො යනාදිවෙයි දතයුතුයි)—තඉති, ත යනු; එව, වැටේ—

බුධ—පෙ—බුධගමාදිත්‍ථෙ, කත්තරිය, යනුපදයි-සබ්බකාලෙ, හැමකල්හි; බුධගමාදිහි, බුධ බොධනෙ ගමු සප්ප ගතිම්හි යනාදීන් කෙරෙන්; තදත්‍ථෙ, ඒබුධාදීන්ගේ අර්ථය; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; කත්තරි, කර්තෘකාරකයෙහි: තො හොති, තවේ—බුධයනු; බොධනෙ, දැන්මෙහි වැටේ—අබුජ්ඣි, පෙරදත්තුයිහෝ; බුජ්ඣති, දැන් දනිතුයිහෝ; බුජ්ඣිස්සතිතිවා, මතු දන්නේතුයිහෝ; බුද්ධො, බුද්ධනමි—(මේ බුධයනු වන්ති)—තර යනු, තරණෙ, පීනීමෙහි වැටේ—

තරා—පෙ—“තරාදීහි ඉණ්ණො” යි; තස්ස, තරාදීන්කෙරෙන් පරවූ තප්‍රත්‍යයට; ඉණ්ණො, ඉණ්ණ වේ; ධාත්වන්තලොපොච, ධාත්වන්තයාට ලොප්දවේ—(අතරීති) තිණ්ණො, (පිහිණීතුයි) තිණ්ණනම්—

---

වත්ත—පෙ—වත්තමානෙ ය, මානන්තා ය, යනුපදයි—පච්චුප්පන්නෙ, වර්තමානකාලයෙහි; ධාතුතො, ධාතුහුකෙරෙන්; කත්තුකම්ම භාවෙසු, කර්තෘ කර්ම භාවය යනමෙහි; මානොහොති, මානප්‍රත්‍ය

යඡේ: කන්තාරි, කන්තාරකයෙහි; අනොච, අන්‍ය ප්‍රත්‍යයද වේ—සඝයනු; ඛමායං, ක්ෂමායෙහි වැටේ—(සඝන්ති) සඝමානො, (ක්ෂමා කෙරේනුයි) සඝමාන නම්—(මේ කර්‍තෘයි—මෙහි යදද්න් ධාත්වන්ත යාට ලොප් කළ යුතු වැටෙනහෙයින් නොවේ)—

හව්-පෙ-"හව්පරියයොලොවා" යි; යෙ, යපරකල්හි; හව්පරියයො, හකාරයාගේ පෙරලීම වේ—(හකාරපසුවෙයි යකාරපූර්වවෙයිසේයි-සය්හතෙති සය්හමානො, ක්ෂමාකරණුලැබේනුයි) සය්හමාන නම්—තෙන, ඔහුවිසින්; සය්හමානො, ක්ෂමාකරණුලබන්නේයි—(මේ කර්මයයි-හූසත්තායං—භවනං) හූයමානං, (වීම) හූයමානනම්—(මේ භාවයි—ගමුගතිම්හි—ගච්ඡතීති) ගච්ඡං, (යේනුයි) ගච්ඡන්තනම්—

ගමි—පෙ—"ගමිස්සාන්තතොච්ඡොවා සබ්බාසුව" යි; මස්ස, ගමු යන්නාහුගේ මකාරයහට, ච්ඡො, ඡවේ—(වගෙගඝොසාදින් විකල්වේ-මේද කර්‍තෘයි)—*

සෙසෙ—පෙ—සෙසෙ ය, ස්සන්තමානානා ය, යනුපදයි—සෙසොති, ශේෂනම්; අපරිසමත්තො, නොනිමුනේය—භවිස්සන්තිකාලෙ, අනාගතකාලයෙහි; කම්මනි, කර්මයක්; උපපදෙ, උපපදකල්හි, සෙසතො, අපරිසමාප්තාර්ථයක් තිබමනාකල්හි; ස්සං අදයො, ස්සං යන්තය මානය් අනය යනමොහු; හොන්ති, වෙත්—(කර කරණෙ) කම්මං, ක්‍රියාව; කරිස්සතීති, මතුකෙරේනුයි යනඅර්ථයෙහි; කම්මං කරිස්සං වජති යි හෝ—කම්මං කරොන්තො වජති යිහෝ—කම්මංකුරුමානො වජති යි හෝ—කම්මංකරානො වජති යිහෝ වේ—(කරිස්සං—කරොන්තො—කුරුමානො—කරානො-යනුළුකාර්ථයි—ස්සංවූ තන්හි ඉකාරාගම වේ)—පුබ්බරූපෙ, කරිස්සං යනරූපයෙහි; සිලොපො, සෙසතො යනාදින් සිහට ලොප් වේ—(කරොන්තො කුරුමානො යනතන්හි "තනාදිතොඔයිරා" යි ඔවෙයි-"උත්තමොකාරො" යී ඔකාරයාට උවෙයි—කරයන්නාහුගේ තකාරස්ථ අකාරයාට "කරස්සකාරොච" යී උකාරයෙක් වෙයි)—

අක්ඛ—පෙ—අක්ඛරෙහිය, කාරංය, යනුපදයි—අක්ඛරවාච්හි, අක්ෂරවාච්වූ; සද්දෙහි, ශබ්දයන්කෙරෙන්; සකත්ථෙ, ස්වාර්ථයෙහි; කාරො හොති, කාරප්‍රත්‍යයවෙයි-(සකත්ථෙ යනු සූත්‍රෙහි නැතද නොවැටෙතුදු අර්ථාන්තරයක් නොකීහෙයින් හැයේ)-අ එව, අ යනමේ ශබ්දයතෙමේම; අකාරො, අකාරනම්වේ—එවං (යනුකීබැවින්—ක එව) කකාරො, (ක යන ශබ්දයතෙමේම) කකාරනම්—(රඑව රකා

* (භවිස්සන්ති කම්මනි ඉච්චෙව යනුද බාලාවතාරයෙහි ඇතද මෙහි නොපෙනේ)—

රො. ලිඞ්ගයෙහි ර ශබ්දයාගෙරෙන් කාරප්‍රත්‍යය නොකරනුදු මෙහි
විනාබව හඟවනපිණිස) රකාරොයී තිය—*

ධාතුතොපි, ධාතූන්කෙරෙනුදු: සකාණෙ, සවාණිජයෙහි යළදිනා,
යළනුපපනනාදීන්; ඉච්, ඉය; තිව, තිය යන; පච්චයා, ප්‍රත්‍යයෝ; කා
තබ්බා, කට්ඨුනනාහුයි-ගමුඉති, ගමුගන්මහි යන; අයං, මේ; ධාතුඑ
ව. ධාතුම; ගම්, ගම්නාම්වේ—(කරඉති, කරයන; ධාතුඑව, ධාතුම;)
එවං, මෙසේ: කරොති, කරොති යනුද; වේ—තනාදිතො, තනාදීන්
කෙරෙන්; ඔ, ඕවේ—("තනාදිතොඔයිරා" යි තිප්‍රත්‍යය කළකල්හිම
වෙයි සේයි—මෙයින්මතු අලිඟයෝ කියනුලැබෙත්)—

——000——

ඉච්ඡ—පෙ—ඉච්ඡත්ථෙසු ය, සමානකත්තුකෙසු ය, තවෙතුං ය, වා
ය, යනුපදයි—එකකත්තුකෙසු, එකම කර්තෘහු ඇති; ඉච්ඡත්ථෙසු, ඉ
ච්ඡාර්ථයන්; ගම්‍යමානෙසු, හැඟෙනකල්හි; ධාතුහි, සියලුධාතූන්කෙ
රෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; තවෙ තුං, තවෙය තුංය යන්දෙ
දෙන; වාතොනාති, විකල්පයෙන් වෙත්—

තවෙ—පෙ—"තවෙතුනාදිසුකා" යි; කරස්ස, කරකරණෙ යනධාතු
හට, කා, තවෙතුනාදීන් පරකල්හි කා යනාදෙශවේ-කාතවෙ, කර
න්නට; ඉච්ඡති, කැමතිය, කාතුංවා යන්නෙන් කාතුං ඉච්ඡතියී යො
දන්න—(කරණය කාතවෙ, කරණුපිණිස යනඅර්ථයෙහි; කාතවෙ
කාතුං යනුවේ—"තුංතුනතබ්බෙසුවා" යි කරයන්නාහුගේ රෙඑයාට
තකාරයක් කළකල්හි කාතුං කියාද වේ)—යො, යමෙක්; කරොති,
කෙරේද; සො එව, හෙමම; ඉච්ඡතීති, කැමැත්තේයයි; එකකත්තුක
තා, එකකර්තෘබවයි—(කරණක්‍රියාවද ඉච්ඡතික්‍රියාවද කරන්නේ දෙ
වදත්තාදිවූ එකෙක්මැයි—කර්තෘහු භින්නාවූනම් තවෙආදිහු වෙත්)-
සාකාදෙ, "සාසදිසතො තස්සරිටෙඩාච" යන්නෙහි; චකාරෙන, චශ

---

* සකාණෙ යනු සූත්‍රෙහිනැතද නොදවැටෙත් කෙසේ ලැබෙ
යිසත්—යම්සේ දෙවදත්තතෙම පුතකුකැමැත්ත යනවාක්‍යයෙහි
තමාට යන ශබ්දයක් නැතද සෙසු යඤ්ඤදත්තාදීන් ඇසිනොසිටි
හෙයින් තමාටම පුතකු කැමැත්ත යනු හැගේද එසේම මේ සූත්‍රයෙ
හි අර්ථාන්තරයක් අනාශ්‍රිතහෙයින් සවාණිජයෙහිය යනුහැගේ—බා
හ්‍යයෙහි ධාතූන්කෙරෙනුදු සවාණිජයෙහි ප්‍රත්‍යය හළලේ-මෙහි නො
හළළද "පාරාදිගම්මියාරු" යනාදියෙහි ගම්කියාද—කරොති යනා
දින්පැනෙනහෙයින් ව්‍යාකරණයෙහි ලක්ෂණයටවඩා ලක්ෂ්‍යයම ප්‍ර
ධානහෙයින් ප්‍රයොගානුසාරයෙන් ධාතූන්කෙරෙන් සවාණිජයෙහි ප්‍ර
ත්‍යය කරණපිණිස ධාතුතො; යනාදිකීය—

හ ණයෙන්; තුංපච්චයස්ස, තුංප්‍රත්‍යයාට; රට්ඨුමාදෙසො, රට්ඨුං යනඅ දෙශයක ප්‍රාප්ත කල්හි-(රාදිලොප්වේ--දස්සනාය) දට්ඨුං, (දක්නාවය යන අර්ථයෙහි) දට්ඨුංයයි වේ—(මෙහිදු ඉච්ඡති යනුයොදන්න—අතවෙතුනාදීසූ යි තිහෙයින් තයිතාදී සූත්‍රයෙන් තවේතුනාදී ප්‍රත්‍යයන් නම්බදුනොවනහෙයින් ඔවුන්කෙරෙන් විභක්තීහු නොවෙති—ඉත්ථී කාතවෙ ඉච්ඡති—පුමා කාතවෙ ඉච්ඡති—කුලං කාතවෙ ඉච්ඡති-යනාදියෙහි ස්ත්‍රීපුංනපුංසකයන්ට සාමාන්‍යහෙයින් ලිඞ්ගවිශෙෂයක් නැත්තේතුයි අලිඞ්ගනම් වේ)—

අර—පෙ—"අරහසක්කාදීසුච" යි; අරහසක්කාද්‍යර්ථෙසු, අරහසක්කාදී අර්ථයක් හැඟෙනකල්හි; තුං, තුං වේ—නිඥ යනු; ගරහායං, නින්දායෙහි වැටේ—නින්දිතුං, ගර්හාකරන්නට; අරහති, සුදුසුයි—(ඉකාරාගමවේ)—

පුබ්බ—පෙ—පුබ්බකාලෙකකත්තුකානං ය, තූන ත්වාන ත්වා ය, වා යඃ යනුපදයි—සමානකත්තුකානං, එකකර්තෘකවූ; ධාතූනං, ධාතූන්ගේ; මජ්ඣෙ, අතුරෙහි; පුබ්බක්‍රියාවාචීහි, පූර්වක්‍රියාවාචී ධාතූන්කෙරෙන්; තූන ත්වාන ත්වා, තූනය ත්වානය ත්වාය යනමොහු; වාහොන්ති, විකල්පයෙන් වෙත්—(ධාතූන්විසින් වාච්‍යවූ අර්ථයන් එකකර්තෘහු වනහෙයින් අභෙදොපචාරයෙන් ධාතූන්ම එකකර්තෘකකොටකිය—මෙහි කාලශබ්දයා ක්‍රියාවාචියි)—කාතූන, කොට; ගච්ඡති, යේ—කත්වාන ගච්ඡති—කත්වා ගච්ඡති යි යොදනු—අර්ථසමමැයි—කාතූනයනතන්හි කරස්ස යන්නහුට "තවෙතුනාදීසුකා" යි කා යන ආදෙශවෙයි—කත්වාන කත්වා යන දෙතැන්හි ධාත්වන්තයාට යදාදින්ලොප් වේ)—සිත්වා, සිට; පීත්වා, බී; වජති, යෙයි යනු; ඉත්‍යාද්‍යෙ, මේආදිප්‍රයොගයෙහි; පරාපෙක්ඛාය, පරක්‍රියාව අපෙක්ෂාකිරීමෙන්; පුබ්බත්තං, පූර්වබවයි—(පරවූ පානක්‍රියාව අපෙක්ෂාකොට ස්ථිතික්‍රියාව පූර්වහෙයින් එකාන්තවාචක ත්වා යන්නහුකෙරෙන් ත්වාවෙයි—නැවත වජනක්‍රියාව අපෙක්ෂාකොට පූර්වවූ පානක්‍රියාව වාචකවූ පායන්නහු කෙරෙන් ත්වාවෙයි සේයි—මෙසේම යම්තාක් ක්‍රියාව ඇතිනමුදු පසුවවූ ක්‍රියාව අපෙක්ෂාහෙයින් පූර්වවූ ක්‍රියාවාචී ධාතූහුකෙරෙන් තූනාදීහු වෙත්මැයි)-ඨායනු; ගතිනිවුත්තිම්හි, ගමන් වැලැක්මෙහි වැටේ-

ඨාපා—පෙ—"ඨාපානමීඊච" යි; ඨාස්ස, ඨායන්නාහුගේ ආකාරය; ඊ; ඉ, ඉකාරයෙක්වෙයි; පාස්ස, පායන්නහුගේ ආකාරයාට; ඊච, ඊ දවේ; වාකාරෙණ, පුබ්බයනාදියෙහිවූ වාග්‍රහණයෙන්; භින්නකත්තුකෙසුපි, වෙන්වෙන් කර්තෘන්විෂයෙහිදු; වදන්ති, තූනාදීහු වෙතියි කියත්-යථා, මෙසේයි—සීහං, සිංහයා; දිස්වා, දැක; භයං, භය; උප්පජ්ජති, උපදියි යනු; ඉත්‍යාදි, මේආදියි—(මෙහි දර්ශනක්‍රියාවට කර්තෘවූ පු

රුෂයාට උපදනා භයහෙයින් උත්පත්තික්‍රියාවට කර්තෘවූයේ භයයි-
එහෙයින් පූරුෂභයලක්ෂණ කර්තෘන්විසින් භිතානහෙයින් දිසළප
කබනෙ උපපූර්වූ පදයන්හි යන ධාතුහු දෙදෙන එකකර්තෘඇත්
තෝතොවෙත්)—එණ්, මෙහි; (සමායන්නෙහි)—දිසා—පෙ—"දිසා
සමානාසමානාතලොපොච" යි; තුනාදිනා, තුනාදීන්; (දිසයන්නාහුකෙ
රෙන්පරවූ තුන ත්වාන ත්වා යනමොවුන්ට) සමා, සමායනආදෙශවෙ
යි; ධාත්වන්තලොපොච, ධාත්වන්තවූ සකාරයාට ලොප්වේ—සඳයනු;
විසරණාදිමහි, විනාසාදියෙහි වේ—

දධා—පෙ—"දධාන්තතො යොකවි" යි; තුනාදිසු, තුනාදීන් පර
කල්හි ධාත්වන්තයාකෙරෙන්පරවූ කිසිතැනෙක්හි; යාගමෙ,* යාග
ම කළකල්හි; යවතම්ාදිනා, යවතංතලනදකාරානං යනාදීන්; සය
කාරසස, යකාරසහිතවූ; දසස, දකාරයාට; ජෙ, ජවෙයි—විත්තං, වි
ත්ව වේ—ඉආගමො, ඉකාරාගමවෙයි—සජ්ජිත්වා, සඳ—(දිසහි යනාදී
උත්තරක්‍රියාව හැගෙනහෙයින් කිය—මත්තෙහිදු මෙසේ මැයි)—

යථා-පෙ—"යථාකත්තරිච" යි; සයකාරසස, යකාරසහිතවූ; ධසස,
ධකාරයාට; ඣො, ඣ වේ—(බුධ බොධනෙ)—බුජ්ඣිත්වා, දූන—(ස
යකාරසසයිතියේ "ධාත්වන්තතොයොකවි" යි කළ යකාරයාගෙනැ
යි සේයි)—

සබ්බ—පෙ—"සබ්බහි තුනාදිනං යො" යි; යාදෙශො, සියලු ධා
තූන්කෙරෙන් පරවූ තුනාදින්ට යාදෙශවේ—(විකල්පයෙනි) කරී
ය, කොට—(මෙහි ඉආගමවේ) කත්තූන, කොට යනඃ ඉච්චාදි, මේආ
දිවේ— (තුනයා පරකල්හි තුංතුනාදීන් කරයන්නාහුගේ රෙඑයට
තකාරයෙක් වේ)—දිස යනු; උච්චාරණෙ, කිමෙහි වැටේ—(උපපූර්
යි—ධාතූහුගේ දකාරයාට චිත්වවේ)—

පුබ්බ—පෙ—"පුබ්බරූපච" යි; යෙ පරෙ, යකාරයක්පරකල්හි; පු
බ්බරූපං, පූර්වරූපවූ සකාරයෙක් වේ—උද්දිස්ස, උදෙසා—දළ්හාංති,
දළ්හංයනඃ දුතියන්තොපපදං, විතීයාන්තයාඋපපදකොටඇති; ගහ
ඉනි, ගහඋපාදනෙ යනඃ අසමා, මොහුකෙරෙන්; යදාදිනා, යදනුප
පන්නාදීන්; ණංපච්චයො, ණංයනප්‍රත්‍යයද; තස්මා, ඒ ණංප්‍රත්‍යයා
කෙරෙන්ඃ ගහසස, ගහඋපාදනෙ යන්නාහුගේ; අනුපපයොගොච,
පශ්චාත්ප්‍රයොගයද; කත්තබ්බො, කටයුතුයි—විභත්තිලොපො, තෙ
සංග්‍රහණයෙන් විභක්තියට ලොප් වේ—(සණකාරප්‍රත්‍යයා පරහෙයි
න් වෘධි වේ—දළ්හගාහං යන ශබ්දයාකෙරෙන් පරවූ සිහට නිපාත
හෙයින් ලොප් වේ)—දළ්හගාහංගණ්හාතියි සේයි-දළ්හං, දෘඪකො
ට; ගණ්හාති, ගනිතියනඃ අඤ්ඤො, අනික්යි, එවං, මෙසේ; අඤ්ඤම්පි,
සෙසසද; ඤෙයඤං. ප්‍රයොගානුසාරයෙන් දතයුතුයි—

* ("යාගමො" යි බොහෝසේ බාලාවතාර පොත්වල පෙනේ)—

එකා—පෙ—එකාදිතො ච, සඞ්ඛ්‍යාය ච, ක්ඛත්තුං ච, යනු පදයි—සඞ්ඛ්‍යාති, සඞ්ඛ්‍යාං නම්; වාරං, වාරයය-(මෙහි සඞ්ඛ්‍යාශබ්ද එකවාරයක්ම නියතේ නොවෙයි—වාරසාමාන්‍යවාචියයි සේයි)—එකාදිති, එකවිශබ්දාදීන්ගෙන්; සඞ්ඛ්‍යාසද්දස්ස, සඞ්ඛ්‍යාශබ්දයාගේ; අත්‍ථෙ, අර්ථයෙහිවර්තමානකල්හි; ක්ඛත්තුංපච්චයො හොති, ක්ඛත්තුං යනප්‍රත්‍යය වේ—එකස්මිං වාරෙ, එක්වරෙක්හි; (යන අර්ථයෙහි) එකක්ඛත්තුං, එකක්ඛත්තුං යයි වේ—එවං, මෙසේම; (ද්වීසු වාරෙසු) ද්වික්ඛත්තුං, (දෙවරෙකයයි යන අර්ථයෙහි) ද්වික්ඛත්තුංයයි වේ—(තීසු වාරෙසු) තික්ඛත්තුං, (තුන්වරෙකය යනඅර්ථයෙහි) තික්ඛත්තුංයයි වේ—(ආදිශබ්දයෙන් චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං-පෙ-සතක්ඛත්තුං සහස්සක්ඛත්තුං යනාදි වේ)—විභත්‍යලොපෙතු, විභක්තියට තෙසං යනාදියෙහි විග්‍රහණයෙන් ලොප්නොකළකල්හි; තිණ්ණක්ඛත්තුම්ච්චාදි, තිණ්ණක්ඛත්තුං යනාදි වේ—(තිණ්ණක්ඛත්තුං යයි කිවද තුන්වරෙක යන අර්ථමැයි—එකස්මිං වාරෙ යී සප්තම්‍යන්තකොට එකං වාරං යනාදීන් ද්විතීයාන්තකොටද වාක්‍ය ගතයුතුයි)—.

ලිඞ්ගං, ලිඞ්ගුතෙම; බාලප්පබොධනත්‍ථං, බාලයන් දන්නාපිණිස; යෙභුය්‍යවුත්තියා, බාහුල්‍යවෘත්තීන්; වුත්තං, කියනලද; තත්‍ථ, ඒ; සබ්බත්‍ථ, හැමතන්හි; විසෙසො, වෙනස; විඤ්ඤූහි, නුවනැත්තවුන්විසින්; පාළිතො, පෙළින්, ඤෙය්‍යො, දතයුතුයි—(බොහෝසේ පැනෙනද්‍ය ගෙණ ලිඞ්ගව්‍යවස්‍ථා බාලයන්පිණිස නාමාදී යම්තැනෙක්හි කෙලේනම්ද ඒ හැමතැන්හි වෙනස වදළපෙළින් දතමැනවැයි සේයි).

කිතකො, කිතකයතෙමේ, වුත්තො, කියනලදී—

අථ, ඉක්බිත්තෙන්; ඡ කාරකානි, කාරකයෝ සදෙනද; සාමි ච, සාමිද; වුත්තාවුත්තභෙදතො, උක්තානුක්තාව භෙදහෙයින්; විධා, දෙපරිද්දෙන්; වුච්චරෙ, කියනුලැබෙති; විභත්තීනං ච, විභත්තීන්ගේද; භෙදෙ, විශෙෂය, වුච්චතෙ, කියනුලැබේ—(කාරකයන්ගේ උක්තානුක්ත භෙදයද විභක්තිභෙදයද නාමයෙහි නොකීයේ කුමටය යත්—සමාසතද්ධිතාඛ්‍යාතකිතක යන මොවුන්විසින් පහළකරණලද අර්ථය උක්ත නම—ඔවුන්විසින් පහළ නොකරණලද අර්ථය අනුක්ත නම—සමාසාදීන් නොදත්කල ඔවුන්විසින් උක්තානුක්තභෙදය නොහැඟෙනහෙයින් ආදිකොට සමාසාදීන් කියා පසුව ඔවුන්විසින් උක්තානුක්තහෙයින් කී කල සුබොධිහෙයිනි- විභක්තිභෙද නම් කර්මයෙහි ද්විතීයාය කර්තෘයෙහි තෘතීයාය යනාදී වූ පෙර කියනලද ද්විතීයාදීන්තමන් කර්මයෙන් කර්තෘයෙන් පිටත් ෂෂ්ඨියෙහිද සප්තම්‍යාදියෙහිද වනබවය—මෙකී විභක්තිභෙදය නාමයෙහිම කිවහොත් සංකරහෙයින් දුරවබොධ වන්නේයි—එහෙයින් මෙතැන්හි කියනලදී)—

සමාසතද්ධිතාඛ්‍යාතකිතකා, සමාසය තද්ධිතය ආඛ්‍යාතය කිතකය යනමොහු; යෙන, යම් කර්මාදි අර්ථයක් කිවමනාකල්හි; ජයරෙ, වෙද්ද; සො අත්‍ථො, ඒ කර්මාදිවූ අර්ථයතෙම; තෙහි, ඒ සමාසතද්ධිතාඛ්‍යාතකිතක යන මොවුන්විසින්; කථිතො, උක්තනම; තදපරො, එයින් අන්‍යවූ අර්ථය; අවුත්තො භවෙ, අනුක්තනම් වේ—(යම් කර්මාදිවූ අර්ථයෙක් කිවමනාකල්හි සමාසාදි නුවූද ඒ අර්ථය අනුක්තනමැයි සේයි)—

කම්මාදි, කර්ම කර්තෘ කරණාදිවූ කාරකයද; සාමිස්මිං, සාමිද; වුත්තෙ, සමාසාදීන්විසින් උක්තකල්හි; ලිඞ්ගත්‍ථෙ, ලිඞ්ගාර්ථමාත්‍රයෙහි; පඨමා සියා, ප්‍රථමා වන්නීය; අවුත්තෙ තු, (සමාසාදීන්විසින්) අනුක්තවූ කර්මාදිද සාමිද කිවමනාකල්හි; අඤ්ඤා, සෙසු; දුතියාදී, ද්විතීයා තෘතීයාදිහු; යථාරහං, සුදුසු පරිද්දෙන්; භවන්ති, වෙත්—(සුදුසු පරිද්දෙන් විම නම් කර්මයෙහි දුතියාය යනාදීන් වීමයි)—

කරොතීති, කරොතීයිසේ: කිරියං නිප්ඵාදෙතීති, ක්‍රියාව නිපදවාතුයි; කාරකං, කාරකනම; කිරියානිප්ඵත්තිනිමිත්තානාති, ක්‍රියාවගේ සිඩිය වකාරණය යන; අත්‍ථො, අර්ථයි-(කාරක ශබ්දය නිමිත්තපර්‍ය්‍යාය වීනම් නියත නපුංසකලිඞ්ගය ඉන් පිටත්තැන්හි අභිධෙය්‍යලිඞ්ගයි—එහෙ

යින් කාරකො පුම්‍ා—කාරකා ඉති—කාරකං කුලං යි වෙ)—කාරක
සද්දෙ, නිම් ගතපයතායවූ කාරක ශබ්දයතෙමේ; මුඛ්‍යතො, මුඛ්‍යහෙ
යින්; කත්තාරං, කර්තෘහුද; අමුඛ්‍යතො, අමුඛ්‍යහෙයින්; කම්මාදිච, ක
ර්මකරණාදිද; වදන්ති, කියා-(කරොතීති කාරකං යයි කර්තෘකාරකයෙ
හි ණවු ප්‍රත්‍යය වූකල කාරක ශබ්දයා සිඬවනහෙයින් කාරක ශබ්ද
යතෙමේ මුඛ්‍යාර්ථහෙයින් කර්තෘහු කියයි—අමුඛ්‍යාර්ථහෙයින් කර්මා
දීන් කියයි සේයි—හුදෙක් කාරකශබ්දයාම මුඛ්‍යාමුඛ්‍යහෙයින් අර්ථ
ප්‍රකාශකරන්නේ නොවෙයි හැමශබ්දයෝද එසේමයයි හඟවනපි
ණිස තථාහි යනාදිය කිය)—තථාහි, එසේමතුයි; සබ්බො, සියලු; ස
ද්දවොහාරො. ශබ්දයන්ගේ ව්‍යවහාරය; මුඛ්‍යාමුඛ්‍යවසෙන, ප්‍රධානා
ප්‍රධානහෙයින්; විධා, දෙපරිද්දෙන්; වත්තතෙ, පවතී—යථා, මෙසේ
යි—ගඞ්ගායං, ගඟ; නහානං, නැහැමය; ගඞ්ගායං, ගඟ; සස්සන්තිච,
ගොයමැඩි තියාද වේ—ගඞ්ගාසද්දෙන, ගඞ්ගාශබ්දයෙන්; පුබ්බෙ, අ
දියෙහි කීතැන්හි; ජලප්පවාහො, දිය වතුර; වුච්චතෙ, කියනුලැ
බෙයි—පච්ඡිමෙනතු, පසුව කීතැන්හි වූකලි; තං සම්පො, ඒ ගඟා
සමීපය කියනුලැබේ—(ආදි කී ගඞ්ගායං නහානං යන තැන්හි ගඟා
ශබ්දය තමාවිසින් සාක්ෂාත් වාච්‍යවූ ජලප්‍රවාහයම කියා සිටිහෙයින්
එහි මුඛ්‍ය පැවැත්තානම් වෙයි—පසුව කී ගඞ්ගායං සස්සං යන තන්
හි ගඟා ශබ්දයතෙම ගොයම් නම් දෙය ගඟාව සමීපභූමියෙහිම ව
න්මුත් ජලප්‍රවාහයෙහි නොවනහෙයින් තමාවිසින් මුඛ්‍යකොට වා
ච්‍ය ජලප්‍රවාහලක්‍ෂණවූ ගඟාව හැර සමීපදෙශය ක්‍රියාවාච් අමුඛ්‍ය
හෙයින්. පවත්නා නම් වේ-මෙසේම සෙසු තැන්හිදු මුඛ්‍යාමුඛ්‍යහෙ
යින් ශබ්දව්‍යවහාරය දතයුතුයි. *

—— 0·0·0 ——

තත්‍ථ, ඒ කාරකයන් අතුරෙහි; වුත්තකම්මං, උක්තකර්මය; තාව,
පළමුකොට; (වුච්චතෙ යනු අධ්‍යාහාර වේ—ආගතසමණො, ආවා
වූ ශ්‍රමණයන් ඇති; විහාරො, විහාරය; සාතිකො, සෑතයෙන් මිශ්‍ර
කරණලද; ආහාරො, ආහාරය; සූදෙන, අරක්කැමියාවිසින්; ඔද
නො, බත; පච්චතෙ, පිසනුලැබෙයි; බුඬෙන, සර්වඥයාවිසින්; දෙසි
තො, දෙසනලද; ධම්මො, ධර්මයය-එත්‍ථ, මෙහි; සමාස තඬිතාඛ්‍යා
තකිතකානං, සමාසය තඬිතය ආඛ්‍යාතය කෘත්කය යන මොවුන්;

---

* (මෙහි මුඛ්‍යාර්ථයහා අමුඛ්‍යාර්ථය දැක්විමෙහි ප්‍රයොජනය කාරක
ශබ්දයෙන් ප්‍රධානවශයෙන් කර්තෘහැගෙනබවද අප්‍රධානවශයෙ
න් කර්මාදිකාරකයන් හැඟෙනබවද දක්වනපිණිසයි—උපචාරය
අමුඛ්‍යයි)—

කම්මනි, කම්මයෙහි වාච්‍යකල්හි; විහිතත්තා, කරණලදහෙයින්;
තෙහි, ඒ සමාසාදීන්විසින්; කම්මං, කර්මය; වුත්තනති, කියනලදය
යි; වුච්චතෙ, කියනුලැබේ—(මෙහි ආගතා සමණා යං සො ආගතස
මණො යි බහුබ්‍රීහිසමාසයද සතෙන සංසට්ඨො සාකිකො යි යෙන
වා සංසට්ඨ, යනාදීන් තද්ධිතවූ ණිකද පච්චතෙ යනතන්හි ආඛ්‍යාත
වූ තෙ විභක්තිද අදෙසින් දෙසිතො යි කිතකවූ තප්‍රත්‍යයද කර්මය
ක් වාච්‍යකල්හිම කරණලදහෙයින් සමාසාදීන්විසින්ම කර්මාර්ථය
ප්‍රකාශකරණලදහෙයින් ඒ කර්මය උක්තකර්මනමැයි සේයි-උක්ත
කර්මයේ ප්‍රථමාවිභක්තියමය කියනප්‍රශ්න සථා යනාදී කීය)—යථා,
යම්සේ; ඔදනං, බත; පචති, පිසෙයි; ඉත්‍යාදෞ, මේ ආදීතන්හි; ඔද
නසංඛාතං, ඔදනයයි කියනලද; කම්මං, කර්මය; දුතියාය, විතියා
විභක්තියවිසින්; වුත්තනාති, කියනලදනුයි; පුන, නැවතද; අත්ත
නා, විතියාව තමාවිසින්; වත්තබ්බස්ස, කියයුතු; අත්‍ථවිසේසස්ස, අ
ර්ථවිශෙෂයක්හුගේ; අභාවා, නැතිහෙයින්; න දුතියා, විතියාවූනො
වේද; තථා, එසේම; අත්‍රාපි, මෙහිදු; සමාසාදීහි එව, සමාස තද්ධිත
ආඛ්‍යාත කිතකයන්විසින්ම; විහාරාදීනං, විහරය ආහරය ඔදනය ධ
ර්මය යන; කම්මානං, කර්මයන්; කථිතත්තා, කියනලදහෙයින්; පු
න, නැවත; තප්පකාසිතා, ඒ කර්මය ප්‍රකාශකරන්නාවූ; දුතියා, විති
යාවිභක්තිතොම; නසියා, නොවන්නීය—(යම්සේ ඔදනශබ්දයාකෙ
රෙන් කර්මය වාච්‍යකල්හි විතියාකොට සිඛවන ඔදනංයන පදයෙ
න් නැවතකර්මාර්ථය ප්‍රකාශකරණුපිණිස විතියානොවේද එසේම
සමාසාදීන්විසිනුදු කර්මයඋක්තකල්හි විතියානොවෙයි සේයි—එ
සේවූවහොත් විතියාසේම යම්විභක්තියෙක්ම නොවේද යත් ප්‍රථමා
වූකලි වෙයිසනු විභත්තිං ආදී කීය)—විභත්තිං විනාච, විභක්තිය
හැරද; අත්‍ථං, අර්ථය; නිද්දිසිතුං, දක්වන්නට; අසක්කුනෙය්‍යත්තා,
නොපිලිවන්හෙයින්; අවසිට්ඨ, ඉතිරිවූ; ලිඞ්ගත්‍ථමත්තාපෙක්ඛායමප
න, ලිංගාර්ථමාත්‍රාපෙක්‍ෂාවක් ඇතිකල්හිවනාහි; විහාරාදිතො, විහා
රය ආහරය ඔදනය ධර්මයයන මේ ශබ්දයන්කෙරෙන්; තබ්බිසෙස
නෙහි, ඒ විහාරාදීන්ට විශෙෂණවූ; තත්‍ථුලත්‍ථාධිකරණෙහි, ඒ විහාරා
දී ශබ්දයන්හා සමානාධිකරණවූ; ආගතසමණාදීහිච, ආගතසමණ
ය සාකිකය දෙසිතය යනශබ්දයන්තුන්දෙනාකෙරෙන්ද; පඨමාහො
ති, ප්‍රථමාවේ-(ආසංකාපරිහාරයක් තටට්ච කථං යනාදි කීය)-කථං,
කෙසේද; ඔදනං, පචතිඉති, ඔදනං පචතියන; ආදෞ, මේ ආදීතන්
හි; දුතියායපි, විතියාවවිසින්ද; කම්මෙ, කර්මය; වුත්තෙ, කියනලද
කල්හි; පුන, නැවත; ලිඞ්ගත්‍ථමත්තං, ලිංගාර්ථමාත්‍රය; අපෙක්ඛිත්වා,
අපෙක්‍ෂාකොට; පඨමා, ප්‍රථමාතොමෝ; කථං, කෙසේ, නහොන්ති
ච, නොවේදයත්; කම්මමත්තෙ, කර්මමාත්‍රය; න්‍යාය, විතියාවවිසි

න්; පාකටං, ප්‍රකටකොට; වුත්තෙසු, කියනලදකල්හි; සන්තොපි, ඇත්තාඅදවූ; ලිඞ්ගත්ථස්ස, ලිඞ්ගාර්ථයාගේ; තිරොභූතත්තා, මුවහවූහෙයින්; (නගොනිති යොදනු)—(යම්සේ සත්පුරුෂනපුංසකකුමාරතරුණවරුණවෘද්ධාදිවිශෙෂයෙහි පැතිරසිටියාවූ මනුෂ්‍යත්වලක්ෂණවූ සාමාන්‍යය ඇතද ස්ත්‍රියයි කීකලැ ස්ත්‍රීස්වරූපවූ මනුෂ්‍යවිශෙෂයම ප්‍රකටකොටකීහෙයින් සාමාන්‍යවූ මනුෂ්‍යත්වයටවඩා ස්ත්‍රීලක්ෂණ මනුෂ්‍යවිශෙෂයම හැඟේද මෙහිදු සියලු කර්මකර්තෘකරණාදියෙහිම පැතිරසිටියාවූ ලිඞ්ගාර්ථමාත්‍රය ඇතද ඔදනං යනාදියෙහි කර්මාද්‍යවිශෙෂාර්ථය විතියාවවිසින් ස්ඵුටකොට කියනලදහෙයින් ලිඞ්ගාර්ථමාත්‍රයට වඩා කර්මාර්ථයම මුඛ්‍යවහැඟෙනහෙයින් ඇතද අර්ථමාත්‍රය මුවාවූහෙයින් තදපෙක්ෂායෙන් ප්‍රථමා නොවෙයි සේයි)-ඔදනො පච්චතෙ ඉති, ඔදනො පච්චතෙ යන; අත්‍ර, මෙහි; ඒකත්තෙනතු, ඒකත්වසංඛ්‍යාව වනාහි; තේවිභත්තියා, තෙ යන විභක්තියවිසින්; වුත්තෙපි, කියනලද්දුතාය, ඒ තෙ විභක්තියවිසින්; තං, ඒ ඒකත්වය; අමුකස්සෙවෙති, අසවල්හුගේමයයි; අනියමෙත්වා, නියම්නොකොට, සාමඤ්ඤෙන, සාමාන්‍යයෙන්; වුත්තත්තා, කියනලදහුයි; ඔදනාඛ්‍ය, ඔදනය යන නාමිඇති; විසෙසෙ, විශෙෂාර්ථයෙහි; ඨිතං, සිටියාවූ; ඒකත්තං, ඒකත්වසංඛ්‍යාව; නිස්සාය, ආශ්‍රයකොට; ඒකවචනං, ඒකවචනය; හොතෙව, වන්නේමැයි—(යම්සේ සමාසාදීන්විසින් කර්මය උක්තකල්හි නැවතකර්මාර්ථය ප්‍රකාශකරණපිණිස විතියා නොවේද ඒසේම ඒකාර්ථයක් කිවමනාකල්හි වන්නාවූ තෙ විභක්තියවිසින්ම ඒකත්වසංඛ්‍යාව කියනලදහෙයින් ඔදනො යනතන්හි ඒකවචන නොවන්නේදයත්-පච්චතෙ යි කීකල්හි ඒක යම් වස්තුයෙක් පිසනලැබෙයි යන මෙපමණක් සාමාන්‍යයෙන් හැඟෙනබවමුත් පිසන්නේ ඔදනය පෙය්‍ය යනාදිවූ අසවල්එකදෙයයි හිම්ව නොහැඟෙනහෙයින් යම්කලෙක්හි ඔදනය පිසනලැබෙන විශෙෂයෙන් අපෙක්ෂාකරණලැබේද එකල්හි විශෙෂඔදනයෙහි පිහිටියාවූ ඒකසංඛ්‍යාවනිසා ඔදනො යනතන්හි ඒකවචනයවෙයි සේයි—තිදෙයම සමර්ථනය කටට්ව තථාහි යනාදී කීය)—තථාහි, එසේමනු; ආඛ්‍යාත, ආඛ්‍යාතප්‍රත්‍යයෝ; සාමඤ්ඤං, සාමාන්‍යවූ; අත්ථං, අර්ථය; වදන්ති, කියති; ස්‍යාදයොතු, සිවිභක්තිආදිහුවනාහි; විසෙසං, විශෙෂාර්ථයකියත්; (පචති පච්චතෙ යි කීකල එකෙක් පිසෙයි එකෙක් පිසනලැබෙයි යන මෙපමණිකින් සාමාන්‍යාර්ථයක් හැඟෙන්මුත් පිසන්නේ දෙවදත්තාදිය පිසනලබන්නේ ඔදනාදියයි යන විශෙෂාර්ථය නොහැඟේ දෙවදත්තො ඔදනො යනාදීන් විශෙෂයවූකල ස්‍යාදීන්විසින්ම හැඟෙයි සේයි—නැවත ආශංකාපරිහාරයක් කටට්ව යජ්ජෙවං යනාදී කීය)—යජ්ජෙවං, ඉදින්මෙසේවූවහොත්; විසෙසගතං, විශෙෂගතවූ

ඔදනාදිසංඛ්‍යාතවූ; කම්මං, කර්මය; නියොජෙය, අපෙක්ඛාහොති: දුතියාපි, විතියාවද; කිංනහොතිවෙ, කුමැයි නොවේද: තගාතම්පි, ඒවිශෙෂයෙහිඇත්තාවූද: කම්මං, කර්මයතෙම; සද්දසත්තිසභාවතො, ශබ්දශක්තිස්වභාවහෙයින්; තෙ විභත්තියාඑව, තෙ යනවිභක්තියවිසින්ම; ගම්‍යතෙති, හඟවනලැබෙයි කියායි—(ඉද්න් ඔදනො පච්චතෙ යන්තෙහි තෙ විභක්තියවිසින් එකවචනිවද විශෙෂවූ ඔදනයෙහි ප්‍රතිවිියාවූ එකවචනිසාඑකවචනවෙනුයි තෙ විභක්තියවිසින් කර්මය උක්තාවූවද විශෙෂවූ ඔදනාදියෙහි ඇත්තාවූකර්මයනිසා විතියාද කුමැයි නොවේදයත්, ඔදනාදිවිශෙෂසංඛ්‍යවූ කර්මාර්ථය ශබ්දශක්තිස්වභාවහෙයින් තෙ විභක්තියවිසින්ම හඟවනලැබෙනහෙයින් විතියානොවෙයි සේයි—ශබ්දශක්තිස්වභාවනම් ශබ්දයන්ගේ අර්ථකථනයෙහි සමර්ථස්වභාවයයි—ශබ්දයෝ යම්බඳුසමර්ථබවෙකින් අර්ථප්‍රකාශකෙරේද ශබ්දශක්තිස්වභාවනම් එයයිදන්න—ශබ්දශක්තිස්වභාවයද ව්‍යවහාරපදෙශයෙන්ම හැගේ-නැවත කථං යනාදි ආසංකාපරිහාරයයි)-ආගතසමණං, ආවාවූශ්‍රමණයන්ඇති; විහාරං, විහාරය; පසෙසති, බලව යතු: කථනිවෙ, කෙසේවියයි යත්; විහාරස්ස, විහාරයාගේ; ආගමනකම්මභූතා, ආගමනක්‍රියාවටකර්මවූ; අවත්ථා, අවස්ථාතොමෝ; සමාසෙන, බහුව්‍රීහිසමාසයාවිසින්; වුත්තා, උක්තය; දස්සනකම්මභූතං, දර්ශනක්‍රියාවටකර්මවූ; අවත්ථන්තු, අවස්ථාවවනාහි; ජෝතයිතුං, ප්‍රකාශකරන්නට; දුතියා සියා, විතියූවිභක්තිවන්නීයි—(සමාසයෙන් කර්මය උක්තකල්හි විතියාවනොවේනම් ආගතසමණං විහාරං පස්ස යන්තෙහි බහුව්‍රීහියෙන්කර්මය උක්තකල්හි විහාරං යයි විතියාකෙසේවේදැයි යත්-යම්සේ දෙවදත්තොසෙති ආසතිතිට්ඨති ගච්ඡති,එකදෙවදත්තතෙමේ ආශනසයනාදිවූඅනෙකක්‍රියායෙන් යුක්තවූ අවස්ථාඇතිවේද එසේම විහාරයද ආගමනක්‍රියායෙන් සම්බන්ධකරණලැබෙනහෙයින් ආගමනක්‍රියාකර්මාවස්ථාවක්ද ඇත්තේය—දර්ශනක්‍රියායෙන් සම්බන්ධකරණලබනහෙයින් දර්ශනක්‍රියාකර්මාවස්ථාවක්ද ඇත්තේය මෙහි ඔහුගේ ආගමනක්‍රියාවටකර්මවූපූර්වාවස්ථාතොමෝ සමාසයෙන් උක්තය දර්ශනක්‍රියාවටකර්මවූ උත්තරාවස්ථාවවූකලී විතියානැතිව නොහැහෙනුයි ඒ උත්තරාවස්ථාව හඟවනපිණිස විහාරශබ්දයාකෙරෙන් විතියා වේමයයි සේයි)-එවං, මෙපරිද්දෙන්; කත්තාදිසු, කර්ත්‍රාදිවූකාරකයෙහිද; සාමිනිච, සාමිවිෂයෙහිද; යථායොගං, යෙදෙනයෙදෙනපරිද්දෙන්; වුත්තාත්තවිභත්තිවචනානි, උක්තාවිභක්තිවචනයතමොහු; නෙතබ්බානි, දතයුත්තාහුයි—(යථායොගං යන්තෙහි එල මතුකියන සමාසො හොති යනාදි ගාථායෙන් හැගේ)—අනෙකෙසු කම්මෙසු, නොයෙක්කර්මයන් අතුරෙන්; දුහාදිනං, දුහපපූරණයනාදින්

ගේ යොගයක්ඇතිකල්හි; අප්පධානං කම්මං, අප්‍රධානවූකර්මයද; නාඥිතනානු, නී පාපුනනෙ යනාදීන්ගේ ප්‍රයොගයක්ඇතිකල්හි; පධානකං කම්මං, ප්‍රධානවූකර්මයද; වුත්තකම්මනාති, උක්තකර්මයයි: වුච්චතෙ, කියනුලැබේ—දුහප්පූරණේ යාච යාචනෙ රුධි අවරණෙ පුච්ඡ පුච්ඡනෙ භික්ඛ යාචනෙ සාස අනුසිට්ඨිම්හි වච වියත්තියං වාචායං යන; ආදයො, මේආදිහුද; නීපාපුනනෙය වහ පාපුනනෙය හර හරනෙය යන; ආදයො ච, මේආද්හුදයන; තෙළුහයෙ, ඒදෙපක්‍ෂයෙහිඇත්තෝ; ද්විකම්මකා, කර්මදෙකක්ඇතිධාතුයි-(මෙහි ආදිකීවෝ දුහාදිහ පසුවකීවෝ නාහදිහුයි මොවුන් දෙපක්‍ෂයෙහිඇත්තවුන්ගේ ප්‍රයොගයක්ඇතිකල්හි කර්මදෙකක්සම්බවනහෙයින් ඔහු දෙපක්‍ෂයේ ඇත්තෝම ද්විකර්මකයෝනම්වෙත්—*

තංයථා, සේමෙසේයි—ගොපාලෙන, ගොපොල්ලාවිසින්; ගො, දෙන්තොමෝ; ඛීරං, කිරි; දුය්හතෙ, දෙනාලැබෙයී—දුඩාවා, දෙනාළදූයිහෝවේ—(මෙහි දුය්හතෙයනු ආඛ්‍යාතවිෂයට දුඩායනු කිතකවිෂයටයි—එහෙයින් ගොපාලෙන ගො ඛීරං දුය්හතෙයි කියාද ගොපාලෙන ගො ඛීරං දුඩා කියාදයොදනු—මත්තෙහිද මෙසේ මැයි)—ඉහ, මෙහි; ගොරූපං, ගොස්වරූපවූ; එකං කම්මං, එක්කර්මයෙක; ඛීරලක්ඛණංච, ක්ෂීරස්වරූපදවූ; එකං කම්මං, එක්කර්මයෙක; එතෙසු, මේකර්මයන් දෙදෙනාඅතුරෙහි; පයොජනතෙන, ප්‍රයොජනබැවින්; අභිමතං, ඉෂ්ටවූ; ඛීරං, ක්ෂීරය; පධානං, ප්‍රධානය; තන්නිමිත්තභූතා, ඒ ක්ෂීරයට නිමිත්තවූ; ගො, දෙන්නොමෝ; අප්පධානා, අප්‍රධානයි; තස්මා, එහෙයින්; ගොති, ගො යන; එත්ථ, මෙහි; වුත්තත්තා, උක්තකර්මහෙයින්; පඨමා, ප්‍රථමාවෙයි; ඛීරන්ති, ඛීරංයනු; ඉහ, මෙහි; අවුත්තත්තා, අනුක්තකර්මහෙයින්; කම්මත්ථෙදුතියා, කර්මාර්ථයෙහි ද්විතීයාවේ—එවං, මෙසේම; යාචාදිසු, යාච රුධාදීන්විෂයෙහි දතයුතුයි—(තෙසේද බ්‍රාහ්මණෙන ගහපති ඔදනං යාචියතෙ යාචිතොවා—ගොපාලෙන ගො වජංරුජ්ඣතෙ රුඩාවා—වජනම් ගොවූදයි—සිස්සෙන ගුරුධම්මං පුච්ඡතෙ පුට්ඨොවා—විප්පෙන ජනො භත්තංභික්ඛියතෙ භික්ඛිතොවා—විප්පනම් බමුණුයි—ගුරුණා සිස්සො ධම්මං අනුසාසියතෙ අනුසාසිතොවා—පණ්ඩිතෙන ජනො සත්තාබ්බමුච්චතෙ වුත්තොවා—මාලාකාරෙන රුක්ඛො පුප්ඵං අවචීයතෙ අවචිතොවා—ගොපාලිකාය

---

* ගොපාලො ගාවං දොහතීති වුත්තෙ ගාවන්ති එකංකම්මං පුන කිං දොහතීති ගවෙසනායං ඛීරන්ති අපෙක්ඛියමානත්තා ඛීරඤ්ච එකං කම්මං කම්මවයං දුහාදිපයොගෙ සම්භවති—

දධිනොනීතං මනපීයතෙ මනපිතොවා යනාදි වේ)—දාසෙන, දස් හුවිසින්; භාරො, බරතෙම; ගාමං, ගමට; නියතෙ, පමුනුවනුලැ බෙයි; නීතොවා, පමුනුවනලදුයිහෝ වේ—අත්‍ර, මෙහි; නියමානො පමුනුවනුලබන්නාවූ; භාරො, බරතෙම; පධානං, ප්‍රධානයු; තන්නි මිත්තං, ඒ බරගෙණයාමට නිමිත්තවූ; ගාමො, ගමතෙම; අප්පධා නං, අප්‍රධානයි; (නිමිත්තශබ්දයානියතනපුංසකලිඞ්ගහෙයින් සවලි ඞයෙන්ම පුලලිඞුවූ ගාමො යන්නට විශෙෂණව සිටිහ) තථා, එ සේම; වහාදීසු, වහ හරාදීන්කෙරෙහිදු දතයුතුයි (කොසේය යත් දා සෙන භාරො ගාමං වුය්හතෙ වහිතොවා දාසෙන භාරො ගාමං හ රීයතෙ හටොවා යනාදිවේ)—

ගති, ගමනය; බොධ, අවබොධය; අහාර, ආහරය; සද්ද, ශබ්දයය නාමොවුන්; අණ, අණිකොටඇති ධාතුන්ගේද; හර කර, හර හරනෙ ය කරකරණෙය යනධාතුන්දෙදෙනාගේද; අකම්මකානං, අකර්මකධා තුන්ගේද ප්‍රයොගයක් ඇතිකල්හි; අකාරිතෙ, කාරිතප්‍රත්‍යයාන්ත නොවනකල්හි; යො කත්තා, යමෙක්කර්තෘද; තං, හේතෙම; කාරි තෙ, කාරිතප්‍රත්‍යය කළකල්හි; වුත්තකම්මං හි, උක්තකර්මමවේ; (යථා, මෙසේයි; අකාරිතෙ, කාරිතප්‍රත්‍යය නොකළකල්හි;)—දා සො, දස්තෙම; ගාමං, ගමට; ගච්ඡති, යෙයි කියාවෙයි-කාරිතෙතු, කාරිතප්‍රත්‍යය කළකල්හි වනාහි; සාමිනා, සවාමිහුවිසින්; දාසො, දස් තෙම; ගාමං, ගමට; ගච්ඡාපීයතෙ, යවනුලැබෙයි; ගච්ඡාපිතොවා, යවනලදුයිහෝ; ඉච්චාදි, මේ ආදි වේ—(මෙහි කාරිතසංඥද ණෙ ණයාදීන් නොකරණකල ආදිකොට ගමනක්‍රියාවට කර්තෘවසිටි දාස තෙමේ පසුවකාරිතවූ ණාපෙ කළකල්හි උක්තකර්මවී—ආදිශබ්දයෙ න් ගරුනා සිස්සො ධම්මං බොධාපීයතෙ බොධාපිතොවා-උපාසකෙ න භික්ඛුභත්තං භොජපීයතෙ භොජපිතොවා—උපජ්ඣායෙන සි ස්සො පාළිං පාඨාපීයතෙ පාඨාපිතොවා—සාමිනා දාසො භාරං හරා පීයතෙ හරාපිතොවා—මුනිනා ජනො කුසලං කාරාපීයතෙ කාරාපි තොවා යනු දත්න)- අකම්මකානං යථා, අකර්මකයන්ගේ ප්‍රයොග යෙහි උදාහරණ මේසේයි-හත්ථී, ඇත්තෙම; සයති, හොවී; කාරිතෙ තු, කාරිතප්‍රත්‍යය කළකල්හි; හත්ථාරොහෙන, ඇතරුවාවිසින්; හත්ථී, ඇත්තෙම; සයාපීයතෙ, හොවනලැබෙයි; සයාපිතොවා, හොවනල දුයි යන; ඉච්චාදි, මේආදි වේ—(ආදිශබ්දයෙන් මාතරා බාලො ආසා පීයතෙ ආසාපිතොවා යනාදිදන්න—මෙහි අකාරිතාවත්ථායෙ හි ශයන ක්‍රියාවට කර්තෘවූ හත්ථිතෙම පසුවකාරිතාවත්ථායෙ හි උක්තකර්මවේ)—

පධානප්පධානක්‍රියාසම්බන්ධතො, ප්‍රධානක්‍රියාසම්බන්ධහෙයින්ද අප්‍ර ධානක්‍රියාසම්බන්ධහෙයින්ද; යස්ස, යම් එක්කර්මයක්හුගේ; වුත්තාවුං

තත්ථ තත්ථ, උක්තබවය අනුක්තබවය යන දෙදෙන; සිද්ධං, වෙද්ද; ත
ණ්ඩ; ඒ කම්මය තිවමනාකල්හි; පඨමා හොති, ප්‍රථමාවෙයි; අපරාන,
විතියානොවේ—(අපරායී සාමාන්‍යයෙන්කිව්ද; යම්සේ සෙසඬවයයි
අශ්වයාද ලවණයද කියතුදු භොජනකාලයෙහි සෙසඬවයයි කීකල
ලුණුමයයනු හැගේද එසේම මෙහිදු කම්මප්‍රස්ථාවහෙයින් විතියාමුත්
සෙසුවිභක්තිනොහැගේ)—යථා, මෙසේයි—බ්‍රාහ්මණේන, බමුණාවි
සින්; ඔදනො, බත්තෙම; පචිතො, පිස; * භුජ්ජතෙ, කනුලැබෙයි; භු
ත්තාවා, කනලද්දයිහෝ වේ—අත්‍ර, මෙහි; යදිපි, ඉදිනුදු; එකමෙව,
එකම; ඔදනාඛ්‍යං, ඔදනනම්වූ; කම්මං, කම්මයතෙමේ; තෙ තප්ප
ච්චයෙහි, තෙය තය යනප්‍රත්‍යයන්විසින්; උත්තං, උක්තය; ත්වාප්පච්ච
යෙනතු, ත්වාප්‍රත්‍යයවිසින්වනාහි; අවුත්තාවසියා, අනුක්තදවත්තේ
ය; තථාපි, එනකුදුවුවත්; පධානතාය, ප්‍රධානබැවින්, අභිමත, ඉෂ්ට
වූ; භොජනක්‍රියාභිසම්බන්ධවාරෙන, භොජක්‍රියාවගේ සම්බන්ධොපා
යෙන්; වුත්තත්තා, තෙ ත ප්‍රත්‍යයන්විසින්උක්තහෙයින්; පධානප්ප
ධානානං, ප්‍රධානාප්‍රධානයන්අතුරෙහි; පධානෙඑව, ප්‍රධානයාකෙ
රෙහිම; කාරියප්පසිද්ධිඉති, කාර්‍ය්‍යයාගේ ප්‍රතීතිය යන; ඤායා, යුක්ති
හෙයින්; පඨමාඑව, ඔදනශබ්දයාකෙරෙන් ප්‍රථමාම වේ-භොජක්‍රියා
ය, ප්‍රධානවූ භොජනාඛ්‍යවූක්‍රියාවට; විසෙසනතාය, විශෙෂණබැවින්;
අප්පධානභූත, ප්‍රධානනොවූ; පචනක්‍රියා, පාකක්‍රියාවගේ; සම්බන්ධ
මුඛෙන, සම්බන්ධවාරයෙන්; අවුත්තත්තාපි, ත්වාප්‍රත්‍යයාවිසින් අනු
ක්තකල්හිදු; නදුතියා, ඔදනශබ්දයාකෙරෙන් ද්විතියානොවේ—(භු
ක්ති පක්ති විශෙෂණබව භික්ඛිත්වා යනාදීන් කිය)—භික්ඛිත්වා, සිඟා
ද; කිණිත්වා, මිලදී ගෙණද; අඤ්ඤථාවා, භිද සිට යනාදී අනික්යම්
පරිද්දෙකින්හෝ; භොජනක්‍රියං, භොජනක්‍රියාව; කතත්‍වං, කරන්න
ට; සක්කාති,පිළිවනැයි;භික්ඛාදිනං, සිඟිමය විකිණීගැන්මය යනාදී
වූක්‍රියාවට; සාමඤ්ඤභූතං, සාධාරණවූ; භොජනක්‍රියං, භොජනක්‍රියා
ව; පාකක්‍රියා, පචනක්‍රියාතොමෝ; භික්ඛාදික්‍රියාතො, භික්ඛණය කි
ණනය යනාදික්‍රියාවන්කෙරෙන්; ව්‍යවච්ඡිඥති, පිරිසිඳිනුයි; පාක
ක්‍රියා, පචනක්‍රියාතොමෝ; භොජනක්‍රියාය, භොජනක්‍රියාවට; විසෙස
නං, විශෙෂණවේ—† පචිත්වා, පිස; දනං, දීමහෝ; ගහණං, ගැන්ම
හෝ; අඤ්ඤංවා, අනික්යමක් (හැරපීමය බැලීමය යනාදික්‍රියා) ද;

---

* (භුජතෙයි කර්තෘක්‍රියාවසේ පෙණේ එසේදවුවත් දකින්ටලැබුනු
පමණ බාලාවතාරවලද සන්නවලද එසේමතිබේ-කම්මකාරකයෙ
හි වනාහි රූපසිද්ධිය භුජ්ජතෙයි වියයුතුයි)—

† ප්‍රශ්නාවධාරණනුඥා සම්පාදෙ හවෙනනානු—යනු බැවින් මෙ
තන නනුශබ්දය ප්‍රශ්නයෙහි වැටේ—

කාතතුම්පි, කරන්නටද; ඝසානි. පිළිවත්තුයි; දනාදීනං, දනගහ
ණාදීන්ට; සාධාරණස්ස, සාමාන්‍යවූ; පචනස්ස, පචනක්‍රියාවතාමා;
භොජනක්‍රියාය, භොජනක්‍රියාවවිසින්: දනාදිතො, දනග්‍රහණක්‍රියා
වෙත්; විසෙසියමානත්තා, වෙනස්කරණලබනහෙයින්; පචනව, ප
චනක්‍රියාවද; විසෙසසංතාතු, විශෙෂ්‍යවන්නේ නොවේද—(සච්චං, ය
නාදී පරිහාරයි)—සච්චං, සැබැව; තථාපි, එතකුදුවුවත්; පචනං, ප
චනක්‍රියාව; අප්පධානං, ප්‍රධානනොවේ; (කවරහෙයකිනැයි යත්)
භානෙතන, භාප්‍රත්‍යයාන්තයාවිසින්; වුච්චමානත්තා, කියනලබන
හෙයිනි—භානොතන. භාප්‍රත්‍යයාන්තයාවිසින්; අභිධීයමානාහි, කි
යනලබන්නාවූ ක්‍රියාවචනාහි; කම්පි, කිසි; උත්තරක්‍රියං, මතුවන
ක්‍රියාවක්; අපෙක්ඛනිති, අපෙක්ෂාකෙරේනුයි; අප්පධානා, ප්‍රධාන
නොවේ—(යම්සේ රජුඅපෙක්ෂාකොටවත්නාවූ අමාත්‍යාදීහු සාපෙ
ක්‍ෂහෙයින් හුදෙක්තමන්ම ප්‍රජාපරිපාලනාදී නොකොටහෙනහෙ
යින් ප්‍රධානයෝ නොවෙද්ද එසේම භානාන්තයාවිසින් වාච්‍යවූ පූර්වක්‍රි
යාතොමෝ උත්තරක්‍රියාවක් අපෙක්ෂාකොටමුත් විවක්‍ෂිතාර්ථය සි
ඩනොකොටහේතුයි සාපෙක්‍ෂහෙයින් අප්‍රධානවේ-විශෙෂණවිශෙ
ෂ්‍යනම්තෙමේ කිමයත්)—

යාව, යම්බඳුවූ; කිචි, කිසි; පදවයං, පදදෙකෙක්; සම්බන්ධං, සම්බ
න්ධවූයේ; උපලබ්භතෙ, දන්නාලැබේද; තත්‍ර, ඒ දෙපදයෙහි; විසෙ
සනවිසෙසසත්තං, විශෙෂණවිශෙෂ්‍යභාවයතෙම; කාමතො, කැමතිප
රිද්දෙන්; ගම්‍යතෙ, හැගේ-(නීලොත්පලං යන්නෙහි නීලය උත්ප
ලය යන පදයෝදෙදෙන උත්පලාඛ්‍ය එකජලජවස්තුයෙක්හි පව
ත්නාහයි ඕවුනොවුන්හාසම්බන්ධයහ මෙහි සෙවතරක්තාදිගුණයට
සාමාන්‍යවූ උත්පලද්‍රව්‍යය සෙවතාදීන්කෙරෙන් වෙනස්කොට සිටි
නා නීලගුණය උත්පලද්‍රව්‍යයට විශෙෂණවෙයි—වැලිදු භෘගාදිද්‍රව්‍ය
යන්ට සාධාරණවූ නීලගුණය ඒ භෘගාදීන්කෙරෙන් වෙනස්කොට
සිටිනුයි උත්පලයද නීලගුණයට විශෙෂණවේ *—මෙසේ විශෙෂණ
විශෙෂ්‍යභාවය විවක්‍ෂාහෙයින් වෙයි දතයුතුයි)-යස්මාහි, යමක්හේ
තුකොටගෙණ; යබුහදබුඩි, යමක්හුගේ වෙනසෙහිබුඩිය; හොති,
වෙද්ද; තං, ඒ හේතුවූදෙය; තබ්බිසෙසනං, ඒවෙනසඇත්තාහට වි
ශෙෂණවෙයි; තච, ඒ විශෙෂණයද; ජාති, ජාතිය; ගුණ, ගුණය; ක්‍රි
යා, ක්‍රියාය, දබ්බං, ද්‍රව්‍යය; නාමන්ති, නාමයයී; අනෙකධා, නොයෙ

* (විශෙෂ්‍යවෙයිනියා අපටදතින්වලැබුනු සියලුපිටපත්වලම පෙ
ණෙන තුමුත් වේකියට්වූ අර්ථයට ඒ නොයෙදේ)—

ක්පරිද්දෙන් වේ—යථා, මෙසේයි; ගො, ගොන්තෙම; ධවලො, සුදු
ය; ගච්ඡති, යෙයි; විසාණී, අංඇත්තේය; දෙවදත්තකො, දෙවදත්ත
නම්; (මෙහි ගොත්වලක්ෂණවූජාතිය හේතුකොටගෙණ අශ්වාදිද්‍රව්‍ය
සමූහයෙන් ගොද්‍රව්‍යයෙහි වෙනස යන බුද්ධිය උපදනාහෙයින් ගො
ත්වජාතිතොමෝ සාස්නාදිමත්වූ ඛණ්ඩමුණ්ඩාදිගොද්‍රව්‍යයට විශෙෂ
ණවෙයි-සාස්නා නම් ගෙරිකර එල්ලෙන සමයි *—ධවලත්වගුණයතෙ
ම විවක්ෂිතගොද්‍රව්‍යය නීලාදිහා ද්‍රව්‍යයන්කෙරෙන් වෙනස්කරණ
හෙයින් විශෙෂණවෙයි-ගච්ඡති යනතන්හි ගමනක්‍රියාව තිට්ඨ ගච්ඡ
යනාදි ගොපදෘෂීයෙන් වෙනස්කරණහෙයින් ද්‍රව්‍යයට විශෙෂණ
වෙයි—විසාණලක්ෂණවූ ගොද්‍රව්‍යය විසාණරහිත ගොද්‍රව්‍යයෙන්
වෙනස්කරණහෙයින් විවක්ෂිතගොද්‍රව්‍යයට විශෙෂණයි-දෙවදත්ත
යන නාම යඥදත්තාදිනමින් යුක්තවූ ගොද්‍රව්‍යයෙන් වෙසෙස්කො
රේනුයි විවක්ෂිතගොද්‍රව්‍යයට විශෙෂණයි—මෙසේ ගොයනාදී ජා
ත්‍යාදින්ට ක්‍රමයෙන් උදාහරණයි—ආදි විශෙෂණවෙතියි ති ජාත්‍ය
දින් විශෙෂ්‍යද වනපරිදි ගහවනපිණ්ස ජාත්‍යාදිපි යනාදිතිය)—
ජාත්‍යාදිපි, ජාතිගුණයෙනුදු සතෙහි තමන්පිළිබඳවූ; නිස්සයෙහිතු,
ආශ්‍රයෙන් වනාහි; විසෙස්සතෙන, වෙසෙසනලැබෙත්—තංයථා,
හේමෙසේයි; ගාවස්ස, ගොපදෘෂීයාගේ; ජාති, ජාතිය; ධවලො, ඔ
හුගේ ධවලත්වය; (මෙතන ධවලශබ්දයෙන් ධවලගුණයයි) ගම
නං, ඔහුගේ යාමය; තථා, එසේම; විසාණං, ඔහුගේ අහය; නාමංඉ
ති, ඔහුගේ නාමයයි; එවං, මෙසේම; ජාත්‍යාදිනං, ජාතිආදීන්ගේ; වි
සෙස්සතා, විශෙෂ්‍යබවවේ—(ගාවස්ස ජාති ගාවස්ස ධවලො ගාවස්ස
ගමනං ගාවස්ස විසාණං ගාවස්ස නාමංයයි යොදනු—ගොත්ව ජාතිය
ධවලත්ව ගුණය ගමන ක්‍රියාය විෂාණ ද්‍රව්‍යය දෙවදත්තනාමය ය
නමොවුන්ට ආශ්‍රයවූ වාච්‍යද්‍රව්‍යය හෙතුකොටගෙණ ගොත්ව ජාති
ය ධවලත්ව ගුණය ගමන ක්‍රියාවය විෂාණ ද්‍රව්‍යය දෙවදත්තනා
මය යනමොහු ගවාදීන්ගේ ජාතිය ධවලත්වය ගමනය නාමය යන
මොවුන්කෙරෙන් වෙනස්හ යන බුද්ධිය උපදනාහෙයින් ගොද්‍රව්‍ය
යතෙමේ ගොත්වයටද ධවලත්වයටද ගමණක්‍රියාවටද විෂාණයටද
නාමයටද විශෙෂණවේ—ගවශබ්දයෙන් ගවරුන් කියත්)—අත්‍ථං,
වාච්‍යය; විසෙසයන්ති, වෙසෙසානුයි; පරියායො, පරියායශබ්දය
තෙමේ; විසෙසනං, විසෙසනවෙයි; තංයථා, හේමෙසේයි; ගොති,
ගොයයි, කථ්‍යතෙ, කීකල්හි, වාචාති, වාචායන මේ ශබ්දයෙන් විව

---

* (සාස්නා නම් ගෙරිකරඑල්ලෙන සමයයි මෙහිපෙණේ—"සාස්නා
තුගලකම්බලඃ" යනු අමරකොෂයි—"සාස්නාසාත්‍යදගල කම්බලඃ"—
යනු හලායුධ කොෂයි)—

ක්ඛිතවූ; අඤ්ඤො, අඤ්ඤයතෙමේ: විසෙසකෙ, වෙසෙසනල්ලැබේ-ගො
සද්දෙ, ගොශබ්දයතෙමේ; පසු, ගෙරිය; භූමි, බිමය; වාචාදි, වාක්‍ය
ය ජලයයනාදිවූ: අභිවාචී, අඤ්ඤවාචකය; තස්මා, එහෙයින්; ගොනි,
ගො යි; වුත්තෙ, කීකල්හි; කොවා අඤ්ඤොනි, කවරඅඤ්ඤයෙක්දෙයෝ
යි; නප්පතීයතෙ, නොහැහෙයි; (එහෙයින්) පුන, නැවත; පරියාය
භූත, පර්‍යායවූ: වාචාසද්දප්පයොගෙනු, වාචාශබ්දයාගේ ප්‍රයොගය
ක්ඇතිකල්හිවනාහි; වචනසංඛාතො, වචනාඛ්‍යවූ; අඤ්ඤො, අඤ්ඤය;
ඤායති, හැගේ—* (සකලබඩයනාදින් ආදිකී ජාත්‍යාදීන්ට ලක්ෂණ
යි)-තනු, ඒ ජාත්‍යාදීන්අතුරෙහි; සකල, සියළු; ඛඩමුඩාදි, ඛඩයමුඩ
ය යනාදිවූ; ඛ්‍යාති, විශෙෂය; අනුයායී, අනුවයන්නාවූ; ගොත්තාදී,
ගොත්වයනාදිවූ: සාමඤ්ඤං, සාමාන්‍යය; ජාති, ජාතිනම්—දබ්බනිස්සි
තො, ද්‍රව්‍යය ඇසුරුකළ; නීලාදිකො, නීලය පීතය යනාදි; ගුණො,
ගුණනම්—ක්‍රියා, ක්‍රියාතොමෝ; වුත්තලක්ඛණා, කියනලද්ලක්ෂණ
ඇත්තීයි-(අදුබ්බභූතං යනාදීන් ක්‍රියාවට ලක්ෂණ පෙරම කීයේයයි
සේයි)-ජාත්‍යාදිනං, ජාති ක්‍රියා ගුණ නාම යනමොවුන්ට; ආධාරො, ආ
ශ්‍රයවූයේ; දබ්බං, ද්‍රව්‍යනම්—පවත්ති නිවුත්ති, ප්‍රවෘත්ති නිවෘත්තියයි;
සංඛාත, කියනලද; වොහාරත්‍ථං, ව්‍යවහාරයපිණිස; කාරීයමානො,
කරණලබන; සංකෙතො, සලකුණතෙම; නාමං, නාමනම්-(ව්‍යවහා
රයතෙමේ ප්‍රවෘත්තිලක්ෂණහෝ නිවෘත්තිලක්ෂණහෝ වත්මුත් අනි
ක්පරිද්දකින් නැති—ඝටංආහර යි කීකල කලයගෙණෙනබවෙහි
පුරුෂයාපවත්නාහෙයින් ඒ ව්‍යවහාරය ප්‍රවෘත්තිලක්ෂණනම්වෙයි—
ඝටං නාහර යි කීකල්හි පුරුෂයා කලය ගෙණෙනබවෙහි නොපැව
ත වලක්නාහෙයින් මේ ව්‍යවහාරය නිවෘත්තිලක්ෂණනම් වේ— මෙ
සේ ප්‍රවෘත්ති නිවෘත්තියයි විවිධවූ ව්‍යවහාරනම් ඝටය පටය යනාදී
සංකෙතයෙක් නැත්නම් නොපවත්නේයි—ඒ විවිධවූ ව්‍යවහාරය ඒ
කෙක්ම කායිකය වාචසිකය මානසිකයයි ත්‍රිවිධ වේ—මෙතැන්හි
ඝටයඇතැයි ගමනාගමනාදි කයින් වනහෙයින් ව්‍යවහාරය කායි
කනම්—තෙපලෙන් ඝටයඇතැයි පැවැත්ම වාචසිකනම්—සිතින්
ඇතැයි ගැන්ම මානසිකනම්)—අභින්නනතො, නොවෙන්වූ අඤ්ඤඇ

---

* ඉණෙ භූමෞ පසෞ රශ්මෞ දිශි වාචි ජලෙක්ෂණේ
ස්වර්ගෙ වජ්‍රේච ගොශබ්දෙ දශස්වර්ථෙෂු දෘශ්‍යතෙ—

යනුහෙයින් ගොශබ්දයතෙමේ ශර භූමි පශුප්‍රභෘති දශාර්ථයෙහි වැ
ටෙනහෙයින් ගොයි කීකල්හි දශඅර්ථයන්කෙරෙන් කවරඅර්ථයද්දෙ
විවක්ෂිතයයි නොහැහෙනහෙයින් නැවත වාචායි කීකල්හි විවක්ෂි
තවූඅර්ථය හැහෙනහෙයින් ගො ශබ්දයහා මෙතන සමානාර්ථහෙ
යින් පර්‍යායවූ වාචාශබ්දය විශෙෂණවෙයි සේයි—

ති; සද්දො, ශබ්දයතෙම; පරියායො, පරියායනම්--(වෘක්‍ෂ ශබ්දයෙන්ද තරුශබ්දයෙන්ද කියනලබන්නාවූ එකම ශාඛාදිමත්වූ අර්ථ හෙයින් වෘක්‍ෂ තරු ශබ්දදෙදෙන පරියායනම්වෙත්—

විසෙස්සස, විශෙෂ්‍යයෙහිලා; දිස්සමාන, පැනෙන: යා, යම්; ලිඞ්ග සංඛ්‍යාවිභත්තියො, ලිඞ්ගභා වචනභා විභක්තිකෙණෙක්දැද්ද; තා, ඒ ලිඞ්ගසංඛ්‍යාවිභත්තිහු; තුල්‍යාධිකරණෙ, සමානාධිකරණවූ; විසෙසනෙ, විශෙෂණයාකෙරෙහි; භියො, බොහෝසේ; කත්ත.ඛ්ඛා, කට්ටුත්තාහුයි-(විශෙෂ්‍යවාචී ශබ්දයන්ගේ යම්ලිඞ්ගසංඛ්‍යාවිභක්තිකෙණෙක්ද විශෙෂණවාචීශබ්දයාගේ ඔහුම්යයි සේයි)—තුල්‍යාධිකරණෙති කිං, තුල්‍යාධිකරණෙ යනු කුමටය; රඤ්ඤො ධනං, රඤ්ඤො ධනං කීතෑ න නොවනපිණිසයි—(මෙහි බ්‍රාහ්මණාදීන්ට සාමාන්‍යවූ ධනය උන්කෙරෙන් වෙනස්කොට රජ්ජුරුවන්ගේ ධනයයි විශෙෂණයෙන්හි පිහිටුවන්හෙයින් රඤ්ඤො යනු ධනං යන්නට විශෙෂණය එතකුදුවූවත් රාජශබ්දයෙන් වාච්‍යවූ නරෙන්ද්‍රාඛ්‍යවූ අර්ථයද ධනශබ්දයෙන් වාච්‍යවූ භොගාඛ්‍යවූ අර්ථයද වෙන්වෙන්හෙයින් රාජ ධන ශබ්දදෙදෙනාගේ තුල්‍යාධිකරණබවෙක් නැත්තුයි විශෙෂවාචීශබ්දයාකෙරෙහි පැනෙන නපුංසකලිඞ්ග නොවන්නේය තෙමේ විශෙෂණවාචී රාජශබ්දයාකෙරෙන් නොවෙයි ෂෂ්ඨීබහුවචනමවේ—භිය්‍යොති, භියො යනු; කිං, කුමටය; ගුණා, ගුණයෝනම්; පමාණං, ප්‍රමාණහ-(ප්‍රමාණයයි කීකල්හි ගුණ යනු විශෙෂ්‍යය පමාණං යනු විශෙෂණය ගුණශබ්දයෙන්ද පමාණශබ්දයෙන්ද එකමයිලාදිඅර්ථවාච්‍යවනහෙයින් තුල්‍යාධිකරණබවෙක් ඇත එතකුදුවූවත් විශෙෂ්‍යවාචී ගුණශබ්දයේ පැනෙන නපුංසකලිඞ්ගබහුවචනයතෙමේ විශෙෂණවාචී පමාණශබ්දයාකෙරෙහි භියොග්‍රහණයෙන් නොවෙයි නපුංසකලිඞ්ග එකවචනවේ-කථංයනාදීන් ආසංකාපරිහාරයි)-විසතිචිත්තානි, විංශතිචිත්තයෝ; ජායන්ති, උපදිතියියනු; කථන්තිචෙ, කිසේයයත්; විසතිසද්දො, විසතිශබ්දයතෙමේ; අත්තනො, තමා; නියතිත්ථිලිඞ්ගෙකවචනත්තා; නියතස්ත්‍රීලිඞ්ගකා ඒකවචනඇතිහෙයින්; චිත්තසද්දස්ස, චිත්තශබ්දයාගේ; විභත්තිමත්තං, විභක්තිමාත්‍රයක්; ගණ්හාති, ගණී—(විසතිචිත්තානි කීකල්හි විසතිශබ්දයෙන්ද චිත්තශබ්දයෙන්ද එකම මනොලක්‍ෂණවූ අර්ථය වාච්‍යවූව විශෙෂණවිශෙෂ්‍යභාවය ඇති විශෙෂ්‍යවාචීවූ චිත්තශබ්දයාකෙරෙහි පැණෙන නපුංසකලිඞ්ගබහුවචනය විශෙෂණවාචීවූ විසතිශබ්දයාකෙරෙන් නොවෙයි විසතිශබ්දයාතමා නියතස්ත්‍රීලිඞ්ගෙකවචනහෙයින්විශෙෂ්‍යවූ චිත්තශබ්දයාගේ ලිඞ්ගද වචනද නොගතහොතුදු ප්‍රථමා විභක්තිමාත්‍රයක්වූකලම ලැබෙයි සේයි)—ආඛ්‍යාතිකනාතු, ආඛ්‍යාතපදයවනාහි; අලිඞ්ගත්තා, ලිඞ්ගනැති හෙයින්; ලිඞ්ගං, ලිංගය; ගහිතු, ගන්නට; නාරහතීති, නොපොහො

සත්තුෂ්ඨ: විසෙසස්ස, විශෙෂ්‍යයාගේ: වචනමත්තං, වචනමාත්‍රයක්; අපෙක්ඛතෙ, අපෙක්‍ෂාකෙරේද; තස්මා, එහෙයින්: ජයන්ත්ති, ජයන්තීතියා; බහුවචනම්පි, බහුවචනයද: චිත්තාපෙක්ඛමෙව, චිත්තශබ්දයඅපෙක්‍ෂාකොටඇත්තේමැයි—(අත්ථිලිංගං ආඛ්‍යාතිකං, කිබැවින් ආඛ්‍යාතිකශබ්දයතෙමේ තුන්ලිඟුමනැත්තේය එහෙයින්හා ජයන්ති යනු චිත්තානි යන්නට විශෙෂණවූයේද විශෙෂ්‍යවාචීවූ චිත්තශබ්දයාගේ නපුංසකලිඟු ගන්නට නොපොහොසත්හෙයින් ඒ චිත්තශබ්දයාගේ බහුවචනමාත්‍රය අපෙක්‍ෂාකෙරෙයි සේයි—ඉදින් ආඛ්‍යාතිකය අලිඟහෙයින් නපුංසකලිඟුනොවතුදු චිත්තානි යනු විශෙෂ්‍යයාමෙන් ජයන්ති යනු ප්‍රථමාවිභක්ත්‍යන්ත කුමැයිනොවේ යත් "ධාතුප්පච්චයවිභත්තිවජ්ජිතමත්ථවලලිංගං" යනුහෙයින් ජයන්ති යනපදය ආඛ්‍යාත විභක්ත්‍යන්තහෙයින් ලිඟුසඤ්ඥවෙක්නැත්තේය එහෙයින් ජයන්තියන්නහුකෙරෙන් යොවිභක්තිනොවේ)—විසතිං, විසතිශබ්දයා: අපෙක්ඛිත්වා, අපෙක්‍ෂාකොට; එකවචනම්පි, එකවචනයද; කිංනහොතීති, කුමැයි නොවෙයියත්; විසතියා, විසතිශබ්දයාතමා; චිත්තවිසෙසනභූතතාය, චිත්තශබ්දයට විශෙෂණවූහෙයින්; අප්පධානත්තා, අප්‍රධානහෙයිනි-(චිත්තානි යනු අපෙක්‍ෂාකොට ජයන්ති යි බහුවචනවූ පරිද්දෙන් විසතිං යනුද අපෙක්‍ෂාකොට ජයන්තියි එකවචනාන්තකුමැයි නොවෙයි යත්-චිත්තානි යන්නට විශෙෂණවූ විසති යනු අප්‍රධානහෙයින් විසති යනු අපෙක්‍ෂාකොට එකවචන නොවෙයි විශෙෂ්‍යහෙයින් ප්‍රධානවූ චිත්තානි යනු අපෙක්‍ෂාකොට බහුවචනමවෙයි—විශෙෂ්‍යය අනිකක්හු අපෙක්‍ෂානොකොට සිටිනාහෙයින් ප්‍රධානය විශෙෂණය විශෙෂ්‍යය අපෙක්‍ෂාකොටසිටිනහෙයින් අප්‍රධානයි)—අයං නයො, මේ නයතෙමේ; අඤ්ඤත්‍රාපි, සෙසුතන්හිදු; ඤෙය්‍යො, දතයුතුයි—

—000—

අනුත්තකම්මං, අනුක්තකර්මය; යථා, මෙසේයි—අත්‍ර, මෙහි; (අනුක්තකර්මයෙහි) සමාසතද්ධිතානං, සමාසතද්ධිතදෙදෙනාට; සකං සකංවාක්‍යමෙව, තමන්තමන්පිළිබඳවූවාක්‍යම; උදාහරණං කාතබ්බං, උදාහරණකටයුතුයි—(කිසේයයත්—ආගතාසමණා යං විහාරං යනුද සනෙන සංසට්ඨො යනවාක්‍යද උදාහරණයි)—එවං, මෙසේම: අනුත්තකත්තරි, අනුක්තකර්තෘයෙහි; (සමාසතද්ධිතයන් තමන්ගේවාක්‍යම උදාහරණයයි දතයුතුයි—ආඛ්‍යාතකිතකවූකලි අනුක්තකර්මයට උදාහරණ සූදෙයනාදින් කියනුමලදී—

සූදෙ, අරක්කැමි; ඔදනං, බත; පචති, පිසේ—බුද්ධො, සර්වඥතෙම; ධම්මං, ධර්මය; දෙසිතවා, දෙසී—එණ, මෙහි; (අනුක්තකර්මයෙහි).

සමාසතද්ධිතාඛ්‍යාතකිතකා, සමාසය තද්ධිතය ආඛ්‍යාතය කිතකය යනාමොහු; කම්මස්මිං, කර්මාර්ථයෙහි; නකතානි, නොකරණලද හුයි; තෙහි, ඒ සමාසතද්ධිතආඛ්‍යාතකිතකයනාමොවුන්විසින්; කම්මං, කර්මයතෙමේ; අභිහිතනාමි, අභිහිතයයි; වුච්චතෙ, කියනුලැබේ—තතො, එහෙයින්; කම්මතො, කර්මාර්ථයෙහි; දුතියා, විතියා විභක්තිවේ—(අභිහිතකර්මයෙහි විතියාවත් සතෙන සංසට්ඨො ඔදනො යනතන්හි සංශ්‍රෂ්ටාර්ථයෙහි ණික නොකළහෙයින් තද්ධිතයා විසින් ඔදනාඛ්‍යවූ කර්මය අභිහිතබැවින් ඔදනශබ්දයාකෙරෙන් විතියාවූවමනාවේදයත් තද්ධිතයවිසින් කර්මය අභිහිතවූවද සංප්‍රදිවූ සජ ගතිමහි යන්නාහුකෙරෙන් කර්මයෙහි තප්‍රත්‍යයකොට ඔහට සාසාදියෙහි වග්‍රහණයෙන් රට්ඨ යන ආදෙශද රාදිලොපද කළකල්හි සංසෘෂ්ටෝඨාසි වනහෙයින් මෙහි කිතකවූ තප්‍රත්‍යයාවිසින්වූකාලි කර්මය උක්තහුයි ඔදනශබ්දයාකෙරෙන් ප්‍රථමාම වත්මුත් විතියානොවේ)—එවං, මෙසේ; කත්තාදිසු, කර්ත්‍රාදියෙහි; අභිහිතත්තං, අභිහිතබවය; ඤෙය්‍යං, දතයුතුයි-*(කත්තුකරණසම්ප්‍රදානාපාදනාවකාසයෙහිද සාමියෙහිද ලැබෙනලැබෙනපරිද්දෙන් සමාසතද්ධිතාඛ්‍යාතකිතකයෝ නොවූනම් ඒ ඒ කාරකද සාමිද අභිහිතයයි දතයුතුයි යේයි)—අනෙකකම්මකානං, නොයෙක්කර්මයන්ට; යථා, උදාහරණ මෙසේයි—ගොපාලො, ගොපළු; ගාවිං, දෙන; ඛීරං, කිරි; දොහති, දෝයි; දුබ්බා, දෙවියහෝය; ඉච්චාදි, මේආදිරූපවේ—(මෙහි ගාවිං ය ඛීරං ය යන කර්මදෙකම දොහති යන ආඛ්‍යාතයාවිසින්ද දුබ්බා යන කිතකයාවිසින්ද උක්තනොවේ—ආදිශබ්දයෙන් බ්‍රාහ්මණො ගහපතිං ඔදනං යාචති යාචිතවා—ගොපාලො ගාවං වජං රුන්ධති රුද්ධවා—සිස්සො ගුරුං ධම්මං පුච්ඡති පුට්ඨවා—විජෙතා ජනං භත්තං භික්ඛති භික්ඛිතවා—ගුරු සිස්සං ධම්මං අනුසාසති අනුසාසිතවා—පණ්ඩිතො ජනං කත්තබ්බං වදති වුත්තවා—මාලාකාරො රුක්ඛං පුප්ඵං අවචිනොති අවචිතවා—ගොපාලිකා දධිං නොනීතං මථති මථිතවතිවා—යනාදිදන්න-මේදුහාදින්ටයි)—දාසො, දස්තෙම; භාරං, බර; ගාමං, ගමට; නයති, පමුනුවයි; නීතවා, පැමිනියහෝ; ඉච්චාදි, මේආදිරූපවේ-(ආදිශබ්දයෙන් දාසො භාරං ගාමං වහති වූළ්හවා—දාසො භාරං ගාමං හරති හරිතවා යනාදියි-මේ නි වහ හරාදීන්ටයි)—ගාවිං ගාමනාති, ගාවිං ගාමං යනා; උභයන්නා, දෙතැන්හි;

* (සතෙන සංසට්ඨො යනතන්හි සංසට්ඨ ශබ්දය කිතන්තහෙයින් ඔදනො යනාදිකර්මයක් ඉත් උක්තවූ කල්හි ඒ තද්ධිතයෙන් උක්තයයි නොගත යුතුයි)—

"යං කරොති තං කම්මං" ඉති, යං කරොති තං කම්මං යනු; ඉහ, මෙහි; අනුවත්තිත, වැටෙනලද; වාකාරෙන, වාශබ්දයෙන්; කම්මසඤ්ඤ, කම්මසංඥවේ—(ගාවිං ඛීරං දොහති යනතන්හි දොහනක්‍රියාවෙන් මුඛ්‍යව සම්බන්ධයෙක් ඛීරං යන්නටමුත් ගාවිං යන්නට නැත භාරං ගාමං නයති යි කීතන්හි නයනක්‍රියායෙන් මුඛ්‍යවූ සම්බන්ධයෙක් භාරං යන්නටමුත් ගාමං යන්නට නැත එහෙයින් ක්‍රියාසම්බන්ධ ඇති ඛීරං භාරං යනදෙක්හි යං කරොති තං කම්මං යි කර්මසංඥවෙයි, ඒ ක්‍රියාසම්බන්ධ මුඛ්‍යවනැති ගාවිං ගාමං යනදෙක්හි වූකලී "යං කරොති තං කම්මං" යන සූත්‍රරට වැටෙන වාශබ්දයෙන් කර්මසංඥවෙයි සේයි—ගතිබොධාදීන්ටද සාමියනාදීන් උදාහරණකියා)—සාමි, ස්වාමිතෙමේ; දසං, දස්නු; ගාමං. ගමට; ගමයති, යවා; දසෙනවා, දසයාලවාහෝ වේ—(සාමි දසෙන ගාමං ගමයති යි ද ප්‍රයොයවෙති යි සේයි—දෙපරිද්දෙන් කිවද අභිසමමැයි)—දසන්ති, දසං යනඃ එහු, මෙහි; ගති—පෙ— ගතිබුධාදීන්; කාරිතෙ සති, කාරිතයක් ඇතිකල්හි; වා, විකල්පයෙන්; දුතියා, ගත්‍යර්ථාදිධාතුන්ගේ ප්‍රයොගයක් ඇතිකල්හි විතියාවේ; පක්ඛෙ, විතියා නොවූ පක්ෂයෙහි; කත්තරි, කර්තෘකාරකයෙහි; තතියා, තෘතියාවේ—ගාමන්ති, ගාමං යන; අනුනු, මෙහි වනාහි; පුබ්බෙව, පෙරපරිද්දෙන්ම; වාකාරෙන, වාශබ්දයෙන්; කම්මසඤ්ඤ, කර්මසංඥ වේ—(ගාවිං ගාමං යනදෙක්හිමෙන් මෙහිදු යං කරොති තං කම්මං යන්නට වැටෙන වා ශබ්දයෙන්ම කර්මසංඥවෙයි සේයි—ගමු යන්නහුකෙරෙන් ණය කළකල්හි "ණවාදීනව" යන සූත්‍රයෙන් වෘද්ධි ප්‍රතිෂෙධ වේ)—එවං, මෙසේ; ගුරු, ගුරුතෙමේ; සිස්සං, ශිෂ්‍යයා; ධම්මං, ධර්මය; බොධයති, දන්වයි; සිස්සෙනවා, සිස්සෙන තියාහෝ වේ—(ආදිශබ්දයෙන් උපාසකො භික්ඛුං භත්තං භොජයති භික්ඛුනාවා—උපජ්ඣායො සිස්සං පාලිං පාඨයති සිස්සෙනවා—සාමි දසං භාරං හාරයති දසෙනවා—මුනි ජනං කුසලං කාරයති ජනෙනවා යනාදි ගන්නේ)—අකම්මකානං, අකර්මකධාතුන්ට; යථා, මෙසේයි—හත්ථාරොහො, ඇතරුතෙමේ; හත්ථිං, ඇතු; සායති, හොවයි; හත්ථිනාවා, ඇතුලවාහෝයයි; ඉච්චාදි, මේ ආදි වේ—(ආදිශබ්දයෙන්—මාතා බාලං ආසයති බාලෙනවා යනාදි දන්න)—

—000—

චුත්තකත්තා, උක්තකර්තෘතෙමේ; යථා, මෙසේයි—ජිතින්ද්‍රියො, දිනනලද ඉඳුරන්ඇති; මුනි, භික්ෂුයි—අභිධම්මිකො, අභිධර්මය දන්නාවූ; භික්ඛු, භික්ෂුව—සූදෙ, අරක්කැමි; ඔදනං, බත; පචති, පිසෙයි—පුඤ්ඤකාරො, පින්කරන්නාවූ; පුමා, පුරුෂයි—(මෙහි ජිතානි ඉන්ද්‍රි

යානි යෙන සීද අභිධම්මමවෙච්චමධිතෙ සීද පචනං කරොති යනඅර්ථයෙහි පච යන්නාහුකෙරෙත්ද ප්‍රත්‍යයං කරොති යනඅර්ථයෙහි ප්‍රත්‍යයං යන විත්‍යානතයාකෙරෙන් පරවූ කර යන්නාහුකෙරෙත්ද කර්තෘහු ත්‍රිවමනාකල්හි බහුව්‍රීහිසමාසය තඩිතවූ ණිකය ආඛ්‍යාතවූ තිය තිත්කවූ ණය යනමොවුන් කරණලදහෙයින් සමාසාදීන්විසින් කර්තෘතෙමේ කියනලදනුයි උක්තකර්තෘනම් වේ—එහෙයින් හැමතැන්හිම ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමායි—අනෙක කර්තෘන් අතුරෙහි උක්තකර්තෘ කියනුලැබේ)—

අනෙකකත්තුසු, නොයෙක් කර්තෘන්අතුරෙහි; යො, යම්කර්තෘයෙක්; මුඛො, ප්‍රධානද; සො, හේතෙම; වුත්තකත්තාති, උක්තකර්තෘයයි; ඤෙය්‍යො, දතයුතුයි;(කවරහෙයින් මුඛ්‍යදයත්) යො, යමෙක්; කත්තාරං, ක්‍රියාව කරන්නාහු; පයොජයෙ, මෙහෙයාද: සො, ඒ මෙහෙයන්නාතැනැත්තේ; උස්සාහවන්තා, උත්සාහඇතිහෙයින්; මුඛො, මුඛ්‍යනම්—යථා, මෙසේයි—සූදජෙට්ඨො, සූපකාරප්‍රධානතෙමේ; සූදෙන, අරක්කැමියාලවා; ඔදනං, බත; පාචෙති, පිසවා—(මෙහි පචනක්‍රියාව කරවනහෙයින් සූදජෙට්ඨද කර්තෘය මෙසේ කර්තෘන්දෙදෙනාඅතුරෙහි පචනක්‍රියාව සූදයා කරතුදු ඔහු මෙහෙයනහෙයින් ඔහු අනලසකොට පිසන්නට මෙහෙයන උත්සාහවන්තවූ සූදජෙට්ඨතෙමේ ති විභක්තියවිසින් උක්තහෙයින් උක්තකර්තෘනම් වේ)—සූදජෙට්ඨොති, සූදජෙට්ඨො යන; අත්‍ර, මෙහි; “යො කාරෙති සහෙතු” ති, යො කාරෙති සහෙතු යි; හෙතුකත්තුසඤ්ඤො, හෙතුකර්තෘසංඥ වේ—වුත්තත්තා, උක්තහෙයින්; පඨමාච, ප්‍රථමාද වේ—සූදෙන ඉති, සූදෙන යන; අත්‍රතු, මෙහි වනාහි—යො—පෙ—යොකරොති යනාදීන්; කත්තුසඤ්ඤො, කර්තෘසංඥ වේ—අනුත්තත්තා, අනුක්තහෙයින්; තතියාච, (“කත්තරිච” යි) තෘතියාදවේ—උත්තරත්‍ර, මත්තෙහිදු; එවං, මෙසේමැයි—මතුකියන ද්විතියහෙතුකර්තෘවිවක්ෂායෙහිද සංඥ විභක්තිහු මෙසේමයයි සේයි)—

යදා පන, යම්කලෙක්හි වනාහි; යො අඤ්ඤො, යම් අනිකෙක්තෙමේ; පයොජකම්පි, හෙතුකර්තෘහුද; පයොජයෙ, මෙහෙයානම්; තදා, එකල්හි; එසො, හෙතුකර්තෘමෙහෙයනතැනැත්තේ; වුත්තකත්තා, උක්තකර්තෘනම; (කවරහෙයිනයත්) තස්මාපි, හෙතුකර්තෘනටද චඩා; උස්සාහවන්තතො, උත්සාහඇතිහෙයිනි—යථා, හේමෙසේයි—අමච්චො, ඇමතිතෙම; සූදජෙට්ඨෙන, සූදජෙට්ඨයාලවා; සූදෙන, අරක්කැමියාලවා; ඔදනං බත; පාචෙති, පිසවයි යන; ඉච්චාදි, මේ ආදියවේ—(ආදිශබ්දයෙන් පාචයන්ති පාචාපයති පාචාපෙන්ති යනු දන්න—මෙහි පචනක්‍රියාව කරවනහෙයින් හෙතුකර්තෘවූ සූදජෙට්ඨයාද මෙහෙයනහෙයින් හෙතුකර්තෘමවූ අමාත්‍යතෙම ඒ සූදජෙට්ඨයා

වදව්ඪා යනාකරණහෙයින් මුඛ්‍යවූයේ ති විභක්තියවිසින්. උක්තනු සි උක්තනම්වේ—සූද සූදජෙට්ඨ දෙදෙනවූකලි ආඛ්‍යාතයාවිසින් අප්‍රකාශිතහෙයින් අනුක්තකර්තෘනම්වේ)-එණු, මේපාචෙති යන්නෙහි; දුතියහෙතුවචනිච්ඡාතො, දෙවන හෙතුකර්තෘවක් කියට්හෙයින්; කාරිතනනස්සාපි, කාරිතානතවූ පාචෙති යන්නහු කෙරෙහුදු; පුන, නැවත; ණෙහොති, ණෙප්‍රත්‍යය වේ-පුබ්බස්ස කාරිතස්ස, පූර්වවූ කාරිතප්‍රත්‍යයහට; යදාදිනා, යදාදීන්; ලොපො, ලොප; කත්තබ්බො, කළයුතුයි—(පච යන්නහුකෙරෙන් හෙත්වර්ථයක් හැඟෙනකල්හි ධාතුහි යනාදින් ණෙද අසංයොගානත්‍යස්ස යනාදීන් වෘද්ධි කළකල්හි පාචෙති යන කාරිතයා ධාතුනොවත් ධාතුන්කෙරෙන් වන්නාවූ ණෙප්‍රත්‍යයතෙමේ දෙවන හෙතුකර්තෘවක් කිවමනාකල්හි කාරිතානතයාකෙරෙන් කෙසේ වෙයි යත් "ධාතුප්පච්චයෙහි විභත්තියො" සි බහුවචනග්‍රහණයෙන් ධාත්වර්ථයෙහි කරණලද්දාවූ ප්‍රත්‍යයන්කෙරෙන් ප්‍රත්‍යයෝද වෙත්—ඉදින් විභක්තිමාත්‍රයක්ම ඉෂ්ටවීනම් "ධාතුප්පච්චයෙහි විභත්ති" යි එකවචනමාත්‍රයක් කළද සියලුවිභක්තිම හැඟෙන්නාහ එසේනොකොට බහුවචනකළහෙයින්ම ප්‍රත්‍යයෝද හැඟෙත් බහුවචනයෙන් සෙසුකාර්‍යයනොව ප්‍රත්‍යයෝම වෙතියනු කියේයයත්—නාමයන්කෙරෙන්ද ධාතුන්කෙරෙන්ද පරව විභක්තීන්හා ප්‍රත්‍යයන් වත්මුත් අනික්වනකෙණෙකුන් නැතිහෙයින් මෙහිද විභත්තියො සි විභක්තීන් දක්වූහෙයින් පාරිශෙෂ්‍යනයයෙන් ප්‍රත්‍යයෝම හැඟෙත්—නොහොත් ධාතුප්පච්චයෙහි සි යොගවිභාගයෙන් ධාත්වර්ථයෙහි කරණදල ප්‍රත්‍යයන්කෙරෙන් ප්‍රත්‍යයෝදවෙත්—මෙසේ කාරිතප්‍රත්‍යය ඛය ඡය සර අය ඊය යන ධාත්වර්ථයෙහි කරණලද ප්‍රත්‍යයන්කෙරෙන් කාරෙතබ්බො අදනෙනා සමානො යනාදියෙහි තබ්බය අනීයය මානය යනාදීන් කිතකප්‍රත්‍යයෙන්ද දතයුනත්‍යාහුයි)—සූදජෙට්ඨන සූදෙනෙති, සූදජෙට්ඨන සූදෙන යන; උභයත්‍ර, දෙතැන්හි; අවුත්තත්තා, ති විභක්තියවිසින් අනුක්තහෙයින්; කත්තරි, කර්තෘකාරකයෙහි; තතියා, තෘතීයා වේ—

කරීයමානං, කරණලබන්නාවූ; යං තම්මං, යම් කර්මයෙක්තෙම; සෙති, සවිතියවූ; ගුණෙහි, ගුණයෙන්; සුකරං, සුවසේ කරන්නේ; සයමෙව, තෙමේම; පසිජ්ඣති, සිඩවේද; (නිමාවට පැමිනේද) තං, ඒ කර්මය; කම්මකත්තාති, කර්මකර්තෘයයි; විදුං, දනිති—යථා මෙසේ සි-කුසූලො, කොට්ටුව; සයමෙව, තෙමේම; භිජ්ජතෙ, බිඳේ; කුසූලො ඛලු; කුසූලය වනාහි; අත්තට්ඨසු, තමාකෙරෙහි පිහිටියාවූ; ලෙඩ්ඩු සක්ඛරාදිසු, කැබිලිති හකුරුආදීන්; ජිණ්ණෙසු, දිරාගියකල්හි; පරප්පයොගං විනා, අනුන්ගේ ප්‍රයොගයක් නැතිවම; භෙදං, බිඳීමට;

උපගච්ඡන්තා, පැමිණෙන්නේ; අත්තනා එව, තමාවිසින්ම; භිජ්ජන්තේනාම, බිඳෙනුලබන්නේනම; තතො, එහෙයින්; කම්මභූතොච, කර්ම්මවූයේද; කත්තුභූතොච, කර්තෘවූයේද; සොඑව, එම්නොටුවම ය—කම්මකත්තා, කර්ම්මකර්තෘතෙමේ; කම්මම්වෙති, කර්ම්මයවැත්තෑසි; වත්තබ්බං, කියයුතුයි—(ක්‍රමටය යත්)—කම්මාතිදෙසතොච, කර්ම්මයවැනිකොට කීමෙන්ද; කම්මකත්තරිපි, කර්ම්මකර්තෘයෙහිද; කම්මනිවිය, කර්ම්මයෙහිමෙන්; අත්තනොපද යවිකරණ, අත්තනොපදය යවිකරණය යනදෙදෙන; සිජ්ඣන්ති, සිඬවෙත්; ඉදංච, මේකර්ම්මයවැනිබවද; යදාදිනා, යදාදීන්; සංගහිතං, ඇතුලත්කරණලදී—*

---

අවුත්තකත්තා, අනුක්තකර්තෘතෙමේ; යථා, මෙසේයි—සූදෙන, අරක්කැමියාවිසින්; ඔදනො, බත; පච්චතෙ, පිසනලැබේ—පුමුනා, පුරුෂයාවිසින්; පුඤ්ඤං, කුසලයතෙමේ; කතං, කරණලදී—(මෙහි ආඛ්‍යාත තෙ විභක්තියද කතං යනතන්හි කිතකවූ තප්‍රත්‍යයද කර්තෘයෙහි නොකරණලදහෙයින් ඔවුන්විසින් සූදාදී කර්තෘ උක්තනොවනහෙයින් සූදෙන පුමුනා යනදෙතැන්හි කර්තෘ නොවනහෙයින් "කත්තරිච" යි තෘතීයා වේ-සමාසතද්ධිතයන් තමන්තමන්ගේ වාක්‍යම උන්උන්ට අනුක්තකර්තෘයෙහි උදාහරණවනහෙයින් මූලනොපවත්ද ජිතානි ඉන්ද්‍රියානි යෙන සී කියාද අභිධම්මං අධීතෙ භික්ඛු යී කියාද අනුක්තකර්තෘහට උදාහරණ දතයුතුයි—යෙන යනතැන්හි සමාසයෙන් කර්තෘහු උක්තනොවනහෙයින් තෘතීයාවෙයි අභිධම්මමධීතෙ භික්ඛු යනතැන්හිවූකලී තමධීතෙ යනමේ අර්ථයෙහි ණිකප්‍රත්‍යය නුවූහෙයින් තද්ධිතයාවිසින් භික්ෂුලක්ෂණවූ කර්තෘඋක්තනොවතුදු අධිපූර්වවූ ඉ අජ්ඣායනෙ යන්නාහුකෙරෙන් වර්ත්තමානෙයි කර්තෘවාච්‍යකල්හි තෙ විභක්තිවූකල්හි අධීතෙ යී යනහෙයින් ආඛ්‍යාතයාවිසින්

---

* පාණිනීයෙහි "කර්ම්මවත් කර්ම්මණා තුල්‍යක්‍රියඃ" කියාද කාතන්ත්‍රයෙහි "කර්ම්මවත් කර්ම්මකර්තෘ" යිකියාද කර්ම්මකර්තෘතෙමේ කර්ම්මවත්වෙයි කීහෙයින් ආත්මනෙපදයෙහි විකරණයද කර්ම්මකර්තෘහුවිෂයෙහි වෙයි මේ කාත්‍යායනයෙහි කර්ම්මාතිදෙශයෙක්හෝ කර්ම්මකර්තෘයෙහි ආත්මනෙපදයවිකරණවිධායකවූ සූත්‍රයක්නැත ඒකෙසේවෙයියත් යදාදීන් කර්ම්මකර්තෘතෙමේ කර්ම්මයවැනිවෙයි එහෙයින් "අත්තනොපදානි භාවෙච කම්මනි" යී ආත්මනෙපද "භාවකම්මෙසුයො" යී යවිකරණදවෙයි සේයි—

කර්තෘහු උක්තනුයි භික්ඛු යනතන්හි ප්‍රථමාම වේ)*—අනෙකකත්තුකානං යථා, අනෙකකර්තෘන් ඇත්තාවූන්ගේ උදාහරණ මෙසේයි-සූදජෙට්ඨෙන, සූදජ්‍යෙෂ්ඨයාවිසින්; සූදෙන, සූදයාලවා; ඔදනො, බත; පාචාපියතෙ, පිසවනුලැබේ-(මෙහි පචනක්‍රියාව කරවනහෙයින් සූදයා ශුද්ධකර්තෘය ඒම්පාකක්‍රියාව කරවනහෙයින් සූදජ්‍යෙෂ්ඨයා හෙතුකර්තෘය ඔහුදෙදෙනම ආඛ්‍යාතවූ තෙ විභක්තියවිසින් ප්‍රකාශිත නොවෙත්)—අමච්චෙන, අමාත්‍යයාවිසින්; සූදජෙට්ඨෙන, සූදජ්‍යෙෂ්ඨයාලවා; සූදෙන, සූදයාමෙහෙයා; ඔදනො, බත; පාචාපියතෙ, පිසවනුලැබේ-(පච යන් නායුකෙරෙන් හෙත්වර්ථයෙහි ණාපෙදණෙ ද යදදීන් ඒද කොට සරලොප්ආදිකොට කළකල්හි පාචාපියතෙ යි වෙයි—තෙ විභක්තියවිසින් පචනක්‍රියාවකරණ ශුද්ධකර්තෘවූ සූදයා ඔහු පිසන්නට මෙහෙයනහෙයින් හෙතුකර්තෘවූ සූදජෙට්ඨය ඔහුපිසන්නට මෙහෙයනහෙයින් දෙවනහෙතුකර්තෘවූ අමාත්‍යයයි යනකර්තෘන් තුන්දෙනාම අනුක්තහෙයින් අමච්චෙන සූදජෙට්ඨෙන සූදෙන යන තුන්තැන්හිම "කත්තරිච" යි භගවත්පාණිනීස තීසු තතියා යි කිය)—තීසු, තුන්තැන්හි; තතියා, තෘතීයා වේ—

පධානාප්පධානක්‍රියාසම්බන්ධතො, ප්‍රධානවූද අප්‍රධානවූද ක්‍රියාවන්ගේ සම්බන්ධවනහෙයින්; යස්ස, යම්කර්තෘවක්හුගේ; අනුත්තත්තා, අනුක්තබවද උක්තබවද; සියුං, වේද; තස්ස, ඒ කර්තෘවකිවමනා කල්හි; තතියාහොති, තෘතීයාවෙයි; අපරාන, ප්‍රථමානොවේ—යථා, මෙසේයි—බ්‍රාහ්මණෙන, බමුණාවිසින්; භුත්වා, කා; සුප්‍යතෙ, නිදිම යි—එත්, මෙහි; සුප සයනෙ ඉති, සුපසයනෙ යන; අස්ස, මේධාතුහු තමා; අකම්මකත්තා, අකර්මකහෙයින්; භාවෙ, භාවයෙහි; තෙ විභත්තිහොති, තෙ විභක්තිවෙයි; භාවොච, භාවයද; සාධරූපත්තා, සාධ්‍යමානස්වරූපහෙයින්; කත්තාරං, කර්තෘහු; අපෙක්ඛතෙ, අපෙක්ෂා කෙරෙයි; කත්තාච, කර්තෘද; තෙ විභත්තියා, තෙ විභක්තියවිසින්; න වුත්තො, කියනනොලද; භාවපච්චයෙන පන, භාවප්‍රත්‍යයවිසින් වනාහි; වුත්තොනාම, උක්තනම්වේ; (කවරහෙයිනයත්) භාවස්ස, භාවප්‍රත්‍යයාතමා; කත්තරි, කර්තෘකාරකයෙහි; කතත්තා, කළහෙයිනි—තථාපි, එතකුදුවුවත්; පධාන, ප්‍රධානවූ; සුපිනක්‍රියා, සුපිනක්‍රියාව හා; සම්බන්ධොපායෙන, සම්බන්ධවාරයෙන්; අවුත්තත්තා, තෙ විභක්තියවිසින් උක්තනොවනහෙයින්; තතියා, "කත්තරිච" යි තෘතීයා වේ—අප්පධානභොජනක්‍රියා, ප්‍රධානනොවන්නාවූ හොජනක්‍රියාව

---

* (මෙහි අභිධම්මං අධිතෙ භික්ඛු යනවාක්‍යයෙහිද ආඛ්‍යාතයෙන් කර්තෘඋක්ත වේ—එසේවුවත් තද්ධිතයෙන් උක්තනොවන බව දත යුතු)—

හා; සම්බන්ධවාරෙණ, සම්බන්ධොපායෙන්; වුත්තත්ථොපි, උත්තාර්ථයක්
ඇතද; නතුපඨමා, ප්‍රථමානො වේ—

——000——

වුත්තකරණං, උක්තකරණය; යථා, මෙසේයි—ජිතා, දිනලද,
රුක්ඛො, වෘක්ෂයඇත්තේ; එරසු, පොරවයි—පහරණං, පහරණන
ම්; ආයුධං, ආයුධයයි-(මෙහි ජිනොනාරුක්ඛො යනඅර්ථයෙහි සමාස
යද පහරන්ති යෙන යනඅර්ථයෙහි කිතකවූ යුද කරණකාරකයෙහි
කරණලදහෙයින් ඔවුන්විසින් කරණය උක්තනම්—කරණයෙහි
තඩිත ආඛ්‍යාත නැතිහෙයින් උදාහරණ නොපැය, මෙහි වාක්‍යයම
අනුක්තකරණයට උදාහරණවනහෙයින් අනුක්තකරණයට උදාහර
ණ නොපෑයේයනු අනුදඟටායි ගාථායෙන් කියනලදි—* එහෙයින්
ම උක්තසම්ප්‍රදානාදියමමුත් අනුක්තසම්ප්‍රදානාදි නොකියනලදි)—වු
ත්තසම්පදානං, උක්තසම්ප්‍රදානය; යථා, මෙසේයි—දින්න, දෙනල
ද; සුංකො, සුංකත්ඇත්තේ; රාජා, රජයි—දක්ඛිණෙය්‍ය, දක්ඛිණෙ
ය්‍යනම්; භික්ඛු, භික්ෂුවයි—සම්පදානං, සම්ප්‍රදානනම්; බුද්ධො, සර්වඥ
යි—(මෙහි දින්නො සුංකො යස්ස යන වාක්‍යයෙහි සමාසද දක්ඛිණ
දීයතෙ යස්ස යන වාක්‍යයෙහි තඩිත ණෙය්‍ය ද සම්මාපදීයතෙ යස්ස
යන වාක්‍යයෙහි කිතකද සම්ප්‍රදානයෙහි කළහෙයින් ඔවුන්විසින්
සම්ප්‍රදානය උක්තනම්—සම්පදානං යනු නියතනපුංසකලිඟුහෙයින්
සවලිංගයෙන්ම සිට පුල්ලිඟුවූ බුද්ධො යන්නට විශෙෂණවේ—මෙහි
ආඛ්‍යාත නැත්)—වුත්තාපාදානං, උක්තාපාදානය; යථා, මෙසේයි—නි
ග්ගත, නික්මුනාවූ; ජනො, ජනයන්ඇත්තේ; ගාමො, ගමයි—භී
මො, භයංකාරවූයේ; රක්ඛසො, රක්ෂසයි—(නිග්ගතා ජනා යස්මා සී
ද භායන්ති යස්මා සීද වාක්‍යයෙහි සමාසද කිතකවූ මප්‍රත්‍යයදවූහෙ
යින් ඔවුන්විසින් අපාදානය උක්තනම්—මෙහි තඩිත ආඛ්‍යාත දෙ
කනැති)—වුත්තොකාසො, උක්තාධාරය; යථා, මෙසේයි—මත්ත, ම
ත්වූ; මාතඟං, ඇතුන්ඇතිවූ; වනං, වනය-රුක්ඛවා, වෘක්ෂඇති; දෙ
සො, ස්ථානයයි—ආසනං, ආසනවූ; පීඨං, පුටුවයි—(මෙහි මත්තමාත
ඟංයස්මිං සීද රුක්ඛා යස්මිං සන්ති සීද යස්මිං ආසන්ති සීද යන වාක්‍ය
යෙහි සමාසද තඩිතවන්තුද කිතකවූ යු ද වූහෙයින් ඔවුන්විසින් ඔ
කාසය උක්තනම්-මෙහි ආඛ්‍යාතනැති)--වුත්තසාමි, උක්තසාමිතො
මෝ; යථා, මෙසේයි-දසබලො, දසබලයක්ඇත්තේ; භගවා, සර්වඥ

---

* ("ජිනෙනාරුක්ඛො යෙන" යනවාක්‍යයෙහි කරණය සමාසයෙ
න් අනුක්තයි—යෙන පහරන්ති යනවාක්‍යයෙහි කරණය ආඛ්‍යාත
යෙන්ද කිතකයෙන්ද අනුක්තයි)—

යී—වෙණිකො, වීණාවාදනය ශිල්පකොට ඇත්තේ; ගන්ධබ්බා, ගන්ධබ්බයී—ගායකයයි සේයි—(මෙහි දසබලාති යනු යීද වීණාසිප්පං අඤ්ඤ යන වාක්‍යයෙහිද සමාසද තද්ධිතවූණිකද වූහෙයින් ඔවුන්විසින් භගවත්ය ගාන්ධර්වීය යන සාමි උක්තනව්—මෙහි ආඛ්‍යාතකිතක දෙක නැත්)—සමාසො, සමාසයතෙමේ; සබ්බන්, සියලුෂට්කාරකයෙහිද සාමියෙහිද; හොති, වෙයි; කිතකො, කිත්ප්‍රත්‍යයතෙමේ; සාමිවජ්ජිතෙ, සාමිරහිතවූ ෂට්කාරකයෙහිද; තද්ධිතො, තද්ධිතයතෙමේ; කරණාදිවජ්ජිතෙ, කරණඅපාදන යනදෙදෙනවර්ජිතකොට; (කර්තෘකර්මසම්ප්‍රදානආධාරසාමියෙහිද)-භියො, බොහෝසේ; ලබ්භතෙ, ලැබෙයි-ආඛ්‍යාතං, ආඛ්‍යාතයතෙමේ; කත්තුකම්මෙසු, කර්තෘකර්මදෙක්හි වෙයි; කරණාදිනන්තු, කරණසම්ප්‍රදානාපාදන ආධාරසාමියනමොවුන්ගේ වනාහි; අභාසිතෙ, අනුක්තවිෂයෙහි; සංසං, තමත්තමන්පිළිබඳවූ; වාක්‍යං, වාක්‍යයම; උදාහාරො, උදාහරණවෙයි; ඉති, එහෙයින්; තානි; ඒ අනුක්තකරණසම්ප්‍රදානාපාදානආධාරසාමි යන මොහු; අනුදාහටා, නොකියනලදහුයි—* ඉදං, මේ; වුත්තානුත්තානං, උක්තානුක්තයන්ගේ; දිසාමත්තං, උපායමාත්‍රයෙක; අනෙන නයෙන, මේනියුක්තින්; වක්ඛමානම්පි, මතුකියනලබනදෙයද; නෙතබ්බං, දතයුත්තේය—(මතුකියන නිබ්බත්‍යාදිවූ කර්මයන්ගේද සූදාදිවූ කර්තෘන්ගේද බාහ්‍යාදිවූ කරණයන්ගේද අනිරාකර්ත්‍රාදිවූ සම්ප්‍රදානයන්ගේද වලාදිවූ අපාදානයන්ගේද ඔපසිලෙසිකාදිවූ ඔකාසයන්ගේද උක්තානුක්තභෙද මෙසේ දතයුතුයි සේයි)—

---

අථ, ඉක්බිත්තෙන්; විභත්තිභෙදෙ, විභක්තින්ගේ විශෙෂ; වුච්චතෙ, කියනුලැබේ—වාති, වායනු; එව, වැටේ—

යං—පෙ—යං ය, කරොති ය, තං ය, කම්මං ය, යනුපදයි—කත්තා, කර්තෘතෙමේ; ඉච්ඡිතං, අභිමතවූහෝ; අනිච්ඡිතං, අභිමත නොවූහෝ; ඉච්ඡිතානිච්ඡිතංවා, අභිමතානභිමතවූහෝ; යං, යමක්; කරොති, කෙරෙයි සේයි; ක්‍රියාය, ක්‍රියායෙන්; සම්බන්ධයති, යුක්තකෙරේද; තව, හෙද; වාකාරෙන, වාශබ්දයෙන්; අකථිතඤ්ච, අකථිතදෙයද; කම්මංනාමහොති, කර්මනම්වේ—(අකථිතයට පාණිනියෙහි "අකථිතච" යනසූත්‍රයෙන් කර්මසංඥකෙරෙති—මේකාත්‍යායනයෙහි අකථිතයට කර්මසංඥකරණ සූත්‍රාන්තරයක් නැති—එහෙයින් "යං කා

---

* ඉති රණී විපර්‍යාසෙ ප්‍රකර්ෂෙ හෙත්වදමර්ථයොඃ
ආද්‍යන්තෙ ච ප්‍රකාරාන්තෙ තථාවච්ඡෙදනෙ පිච—
යනුබැවින් මෙහි ඉති ශබ්දය ඉදමර්ථයෙහි වැටේ—

රොති තං කම්මං" යනසූත්‍රයට වැටෙන චාශබ්දයෙන්ම අනපීතයට කර්මසංඥසිද්ධයයි සේයි)—

"කම්මත්ථෙ දුතියා" ආදි සූත්‍රයෙන් කර්මාර්ථයක් වාච්‍යකල්හි විති යාවේ යුතු කඟවනලදී--(මෙසේම මතුකියන "කත්තරිච" යනාදී සූත්‍රද දතයුතුයි)—තත්‍ර, ඉච්ඡිතාදීන් අතුරෙහි; ඉච්ඡිතං, ඉච්ඡිත කර්මයනෙමේ: තාව, පළමුකොට කියනුලැබේ—බුද්ධං, සඞ්ඝස්ස, ව න්දෙ, වදිම්—ඌනපත්තං, අඩුපාත්‍රයක්; භුජති, වළඳ—එත්‍ථ, මෙහි; පත්තනති, පාත්‍රයයි; තග්ගතං, ඒ පාත්‍රයෙහිවූ; භොජනං, බතයි; (ක වරහෙයිනයත්) අභෙදොපචාරා, භෙදයක්නැතිකොට සිතාගැන් මෙනි—යථා, යම්සේ; ගාමො, ගම්තෙමේ; ආගච්ඡති, එයි යනුද-(යම්සේ ගමඑයි කීකල ගමනම් දසක්ගම්වරහු ගෙණෙති කිහෙයින් ආධාරවූ ගාමයද ආධෙය්‍යවූ ජනයාද නොවෙනස්කොට සිතාගැන්මෙන් ගමවූ ජනයාම එයි යනු හැගේද එසේම මෙහිදු අඩුපාත්‍රයක්වළඳයි කීකල්හි පාත්‍රය නොකැහැක්ක හැගෙනකල්හි භොජනය දරා සිටිහෙයින් ආධාරවූ පාත්‍රයද ඒ පාත්‍රයෙහි තබනලදහෙයින් ආධෙය්‍යවූ භොජනයද අභින්නකොට සිතාගැන්මෙන් පාත්‍රස්ථවූ බතම වළඳයි යනු හැගෙයි සේයි-මෙහි වැඳිමට බුද්ධයාද වළඳිමට පාත්‍රයද පුද්ගලයාට අභිමතහෙයින් බුද්ධං පත්තං යන දෙකම ඉච්ඡිතකර්මනම්)—අනිච්ඡිතං, අනිච්ඡිතකර්මය කියනුලැබේ-කණ්ටකං, කටුව; මද්දති, මිරිකා—විසං, විසය; ගිලති, ගිලී-(මෙහි මැඩිමට කටුවද ගිලීමට විසයද අභිමත නොවනහෙයින් කණ්ටකං විසං යනු අනිච්ඡිත කර්මයයි-ඉච්ඡිතානිච්ඡිතකර්මය කියනුලැබේ)-ඉච්ඡිතානිච්ඡිතං, ඉච්ඡිතානිච්ඡිතකර්මය; යථා, මෙසේයි-ගාමං, ගමට; ගච්ඡං, යන්නේ; රුක්ඛමූලං, ගසමුලට; උපසප්පති, පැමිනේ—අත්‍ර, මෙහි; ගාමගමනං, ගමටයාම; ඉච්ඡිතං, මුඛ්‍යව කැමතිවනලද; රුක්ඛමූලඋපසප්පනං, වෘක්ෂමූලයට යාම; පාසඟිකං ඉති, ප්‍රසඟයෙන්යයි; අනිච්ඡිතං නාම, කැමතිවනනොලද්දනම්වේ --(ඒ ඉෂ්ටවූ ගමනක්‍රියායෙන් සම්බන්ධකරණලබන ගාමං යනු ඉච්ඡිතකර්මය ඒ ඉච්ඡිතකර්මය අයතනයෙන් සමභවවූ උපසප්පනක්‍රියායෙන් සම්බන්ධකරණලබන රුක්ඛමූලං යනු අනිච්ඡිතකර්මනම්— ඒ මේ දෙකම එකතැනෙක්හි පැනෙනකල්හි ඉච්ඡිතානිච්ඡිතකර්මයයි කියත්*—පසඟනම් එක්යම් දෙයක්කරන්නට පටන්ගත්කල්හි කාරණයක් නැතිවම අනිකක්

* (එකක්‍රියාසම්බන්ධයෙහි යෙදුනහෙයින් එකතැන ලැබෙනබවයි—ගච්ඡං යන කෘදන්තක්‍රියාතොමෝ උපසප්පති යන ආඛ්‍යාතක්‍රියාව අපෙක්ෂාකරණහෙයින් එකසම්බන්ධයි)—

සච්ඡවිච්ඡයි-පසහා ආගතං පාසහිකං—පසහ යන ශබ්දයාකෙරෙන් ආගතාර්ථයෙහි ණෙයනවා යනාදියෙහි වාග්‍රහණයෙන් ණ් කවූතැති)- අකථිතං, අකථිතකර්මය; (කියනුලැබේ)—භගවා, සර්වඥතෙම; භික්ඛූ, භික්ෂූන්ට; එතං, මේ; අවොච, කී—එත්ථ, මෙහි; භික්ඛූති, භික්ඛූ යනු; අකථිතං, අකථිතකර්මනම; තව, හෙද; කෙන, කවරක්හුවිසින්; අකථිතං, අකථිතයයන්; ජකාරකසඤ්ඤාහි, ෂට්කාරකසඤ්ඤාවන්විසින්; (අකථිතයි) තස්මා, එහෙයින්; කෙනාපිසුතෙත්තන, කිසිසූත්‍රයකින්දු, කාරකසඤ්ඤ, කාරකසංඥතොමෝ; නවිහිතාති, කරණනොලදුයි, වාකාරෙන, "යං කරොති තං කම්මං" යන්නට වැටෙන වා ශබ්දයෙන්; භික්ඛූති, භික්ඛූයනා; අත්‍ර, මෙහි; කම්මසඤ්ඤ, කර්මසංඥවේ— (මෙහි වචනක්‍රියායෙන් මුඛ්‍යවසම්බන්ධකරණලබනහෙයින් එතං යන්නෙහි "යං කරොති තං කම්මං" යන්නෙන් කර්මසංඥවේ-භික්ඛූයන්නටවූකලි වචනක්‍රියායෙන්මුඛ්‍යව නොහැගෙනූසි යංකරොති තං කම්මංයි කර්මසංඥද නොවෙයි-ක්‍රියාවක් නොකරණහෙයින් කර්තෘහූද නොවෙයි කර්තෘහුගේ ක්‍රියාසිද්ධියට උපකරණ නොවනහෙයින් කරණද නොවෙයි කර්තෘහුගේ දානයට නිමිත්ත නොවනහෙයින් සම්ප්‍රදානද නොවෙයි කර්තෘහුගේ අපගමනාදියට නිමිත්ත නොවනහෙයින් අපාදනද නොවෙයි කර්තෘකර්මදෙදෙනා නොදරණහෙයින් ආධාරද නොවෙයි මේ ෂට්කාරකසංඥයෙන් එක්තරාසඤ්ඤවකුදු නොලොවහැකිහෙයින් ෂට්කාරකසංඥයෙන් උක්තනොවනූහෙයින් අකථිතනම් වේ—එහෙයින් වාකාරයෙන්ම භික්ඛූයන්නට කර්මසංඥවෙයි සේයි)—එවං, මෙසේ; බීරණෙ, බෙරු තෘණයන්; කටංකරොති, කළාලක් කෙරෙයිසන; ඉත්‍යාදි, මේ ආදිවේ—(මෙහි කටං යන්නට "යං කරොති තං කම්මං" යි කර්මසංඥවෙයි—බීරණෙ යන්නට වාකාරයෙන්ම කර්මසංඥකොට විතියා යො කරතු)-අකථිතව කම්මං, අකථිතකර්මයද; විකම්මකධාතුයොගෙ,. විකර්මකධාතුන්හා සම්බන්ධයක්ඇතිකල්හි; දට්ඨබ්බං, දතයුතුයි—(විකර්මකයෝනම් පෙරකී දුහාදිහූයි)—

නිබ්බත්ති, නිර්වෘත්තිය; විකති, විකාර්ය්‍යය; පත්ති, ප්‍රාප්තියයනා; හෙද, ප්‍රකාරයෙන්; කම්මං, කර්මයතෙමේ; තිධා, තුන්පරිද්දකින් වේ; යථා, මෙසේයි; කටං, කළාල; කරොති, කෙරෙයි; කට්ඨං, කාෂ්ටය; ඣාපෙති, දවයි; රූපං, රූපය; විපස්සති, බලා—(නිබ්බත්තියතෙ අවිජ්ජමානං එව උප්පාදියතෙති නිබ්බත්ති—නිබ්බත්තියතෙයි සේයි අවිජ්ජමානං එව, පෙරනැතිදෙයක්ම; උප්පාදියතෙති, උපදවනුලැබේනූයි; නිබ්බත්ති, නිබ්බත්තිනම්-නිපූර්වවූ වතුවත්තනෙ යන්නෙන් "ඉත්ථියමතියවොවා" යි කර්මයෙහි තිප්‍රත්‍යයද "දෙ ධස්සච" යන්නෙහි චග්‍රහණයෙන් වකාරයහට බකාරද විත්වද කළකල්හි නිබ්බත්ති

යනු වේ—කටං කරොති නීකල්හි පෙරනැතිකළාලම තෘණයෙන් කරණලැබේනුයි කටං යනු නිර්‍වෘත්තිකර්‍මයයි-නිර්මිතනම් ඉපදවීමයි-විකරීයතෙ විජ්ජමානං එව අඤ්ඤථාකරීයතෙති විකති-විකරීයතෙ සි සේයි; විජ්ජමානං එව, පෙරඇතිදෙයම; අඤ්ඤථාකරීයතෙති, අනික්පරිද්දෙකින් කරණලැබේනුයි; විකති, විකෘතිනම්—විපූර්‍වවූ කරයන්නාහුකෙරෙන් පෙරසේම කර්‍මයෙහි තිද ධාත්‍වන්තරෙඑයාට යදෑඅීන් ලොප්ද වූකල්හි විකති යනුවේ-කටඨං ඣාපෙති නීකල පෙර ඇතිමවූකාෂ්ඨයම දැවීමෙන් අන්‍යථාභවයට පමුනුවනලැබේනුයි කටඨං යනු විකෘතිකර්‍මනම්—පාපීයතෙ විජ්ජමානං එව විසයීකරීයතෙති පත්ති—පාපීයතෙ යි සේයි; විජ්ජමානං එව, පෙරඇතිමද්‍රය; විසයීකරීයතෙති,,හමුකරණලැබේනුයි; පත්ති, පත්තිනම්-පපූර්‍වවූ අපපාපුණන්තෙ යන්නාහුකෙරෙන් පෙරසේම කර්‍මයෙහි තිද ධාතුහුගේ පකාරයට තකාරද ආකාරයට යදෑඅීන් හ්‍රස්වද පැමිනවිච්ද කළකල්හි පත්ති යනු වේ—රූපං පස්සති නීකල්හි පෙර ඇතිම රූප දර්ශනක්‍රියායෙන් හමුකරණලබනබවමුත් කටයසේ පෙරනැත්තේ උපදවනනොලැබේ, කාෂ්ඨයසේ පෙරමඇත්තේ විකාරයට නොපමුනුවනලැබෙයි එසේහෙයින් රූපං යනු ප්‍රාප්තිකර්‍මයයි—මෙහි කරොති යනාදියෙහි ති විභක්තියවිසින් කතෘහු උක්තවත්මුත් කටාදිකර්‍මයන් අනුක්තහෙයින් කටං යනු අනුක්ත නිර්‍වෘත්තිකර්‍මය කටඨං යනු අනුක්ත විකාර්‍යකර්‍මය රූපං යනු අනුක්ත ප්‍රාප්තිකර්‍මයයි—ඉදින් කටඨං රූපං යන ශබ්දදෙදෙන නපුංසකලිඞ්ගහෙයින් ඔවුන්කෙරෙන් පරවූ සිහට අංවෙයි කටො කරීයතෙ කටඨං දය්හතෙ රූපං පස්සතෙ යි ප්‍රයොගවිනම් කරීයතෙ යනාදියෙහි තෙ විභක්තියවිසින් කටාදීන් උක්තහෙයින් කටො යනු උක්ත නිර්‍වෘත්තිකර්‍මය—කටඨං යනු උක්තවිකාර්‍යකර්‍මය—රූපං යනු උක්තප්‍රාප්තිකර්‍මයයි)—

දුතියා, දුතියා යනු; එව, වැටේ—

කාල—පෙ—කාලද්ධානං ය, අච්චන්තසංයොගෙ ය, යන පදයි-කාලද්ධානං, කාලය මාර්‍ගය යනදෙදෙනාගේ; ද්‍රව්‍යගුණක්‍රියාහි, ද්‍රව්‍යය ගුණය ක්‍රියාය යනමොවුන්හා; නිරන්තරසංයොගෙ සති, අතුරු නැතිව සම්බන්ධයක්ඇතිකල්හි; දුතියාසියා, දෙවන විභක්තිවන්නීයි—මාසං, මසක්; මංසොදනො, මාංසොදනයයි—(මසමුලුල්ලෙහි ඔසවුලෙන්යුක්තවූ බතහෙයින් ඔදනාඛ්‍යවූ ද්‍රව්‍යයහා මාංසයාගේ සංයොගය අවිච්ඡින්නය—මංසෙන මිස්සො ඔදනො මංසොදනො-පෙරසේම මිස්ස ශබ්දයහට අප්‍රයොගවේ)—සරදං, ශරත්කලෘ නදී, හොය; රමනියා, සිත්කළුයි—(ශරත්කලමුලුල්ලෙහිම නදිය රමනියවනහෙයින් රමනියභවගුණයහා ශරත්කාලයාගේ සංයොගය නිරන්තරයි-සරද ශබ්දය ස්ත්‍රීලිඞ්ගය ආකාරාන්ත සි—රති රමණං, ඇ

ළම් රමණනම—රමුයන්නාහුකෙරෙන් භාවයෙහි යු වූතැනි—රමණස්ස ඨානං, රමණීයං, ඇල්මට කාරණවිම රමණීයනම—"තදස්ස ඨානමීයොච" යි ඊයවආ ප්‍රත්‍යයවූතැනි)—මාසං, මසක්; සජ්ඣායති, හදාරා—(මසමුලුල්ලෙහි අධ්‍යයන කරණහෙයින් අධ්‍යයනක්‍රියාවහා මාසයාගේ සංයොගය නිරන්තරයි-මේ තුන්උදාහරණයම කාලයටයි-අධානං, මාගීගවාචී ශබ්දයාකෙරෙන්; (ව්‍යාප්තියනුලැබේයි අධ්‍යාහාරයි)—යොජනං, යොදනක්; වනරාජී, වනරෙඛාවයි—(යොදනමුලුල්ලෙහි වනරෙඛාව සිටිහෙයින් වනරාජිස්වරූපවූ ද්‍රව්‍යයාහා යොජනාඛ්‍යවූ මාගීගයාගේ සංයොගය නිරන්තරයි)—යොජනං, යොදනක්; දීඝො, දීඝීවූ; පබ්බතො, පවීතයයි—(යොදනක් පමණ පවීතය දික්හෙයින් දීඝීභාවගුණයහා යොජනයාගේ සංයොගය නිරන්තරයි)-කොසං, හඬසනක්පමණමග; සජ්ඣායති, හදාරා—(හඬසනක්පමණමගමුලුල්ලෙහි හදාරණහෙයින් අධ්‍යයනක්‍රියාවහා කොසයාගේ සංයොගය නිරන්තරයි—මෙතන අධානයටයි)—*

කම්ම—පෙ—එතපදයි—කම්මප්පවචනීයෙහි යුතෙත්, කම්මප්‍රවචනීයයන්හා යුක්තවූ; ඨානෙ, තැන්හි; දුතියාසියා, විතීයාවිභක්තිවේ-(පවුච්චති ඉතිපවචනීයං, කියනලැබේනුයිපවචනියනම්—පපූවීවූ වච වියත්තියං වාචාය යන්නාහුකෙරෙන් කම්මයෙහි අතීය වූතැනි කම්මං පවච්චනීයං යෙහි තෙ කම්මප්පවචනියා, කම්මයතෙමේ ප්‍රකාසකටයුතුවූයේ යම්කෙනෙකුන්විසින්ද ඔහු කම්මප්‍රවචනියනනම්හුයි-මෙද යොගසංයුතයි—ඔහුකවරහයත්)—ලක්ඛණෙ, ලක්ෂණාර්ථයෙහිද; විච්ඡායං, විප්සාර්ථයෙහිද; ඉත්ථම්භූතෙ, ඉත්ථම්භූතාර්ථයෙහිද; භාගෙ, භාගාර්ථයෙහිද; සහත්ථෙ, සහාර්ථයෙහිද; හීනෙච, හීනාර්ථයෙහිද; වත්තමානස්ස, වැටෙන්නාවූ; අනුස්ස, අනුශබ්දයාටද; සහත්ථහීනවජ්ජිතෙසු, සහාර්ථහීනාර්ථවර්ජිතවූ; ලක්ඛණාදිසු, ලක්ෂණය විප්සාය ඉත්ථම්භූතය භාගය යනසතරඅර්ථයෙහි වැටෙන්නාවූ; පතිපරිනංච, පතිය පරිය යන ශබ්දයන්දෙදෙනාටද; භාග සහත්ථහීන වර්ජිතෙසු, භාගාර්ථය සහාර්ථය හීනාර්ථය යනමොවුන් වර්ජිතකොටඇති; තෙසෙව්ච, එම ලක්ෂණය විප්සාය ඉත්ථම්භූතය යනතු

---

* "චොක්‍රොශො පුංසි ගාවයූතිඃ" යනුනිඝණ්ටුබැවින් ගවුසමාරක් ක්‍රොශනම් වේ—

(ධනුපඤ්චසතං කොසො යනු අභිධාන ප්‍රදීපිකායි—හස්සෙතශව තැණීහිණිවතිහදණ්ඩඃ ක්‍රොශඃ සහස්‍රවිතයෙන තෙෂාං, සතද්‍යොජනං ක්‍රොශචතුෂ්ටයෙන-සිලිලාවතියෙහි පෙනේ—සතරරියණදණ්ඩයි-දණ්ඩදෙදහසක් ක්‍රොශයයි—ක්‍රොශ සතරක් යොදුනයි—මේතුණ එකිනෙකට සම්බන්ධෙවේ)—

න් අර්ථයෙහි වැටෙන්නාවූ; අභිස්සච, අභිශබ්දයාටද; කම්මප්පවචනීයසඤ්ඤා. (පරසම්ඤ්ඤාදීන්) කර්‍මප්‍රවචනීයසංඥ වේ-* ලක්ඛණං, ලක්‍ෂණය; බ්‍යජකං, ප්‍රකාශකයයිසේයි; (යනමෙහි ලක්‍ෂණශබ්දයා ප්‍රකාශාර්ථයෙහි වැටේ)-චන්දො, චන්‍ද්‍රතෙම; රුක්ඛමනු, වෘක්‍ෂයෙහි; විජ්ජොතතෙ, බබලා—(රුක්ඛමනු යන්නෙහි අර්ථදක්වනපිණිස රුක්ඛ ඉත්‍ථභෝ යි කියා)—රුක්ඛ ඉති, වෘක්‍ෂයෙහි යන; අත්‍ථො, අර්ථයි-එසේ, මෙහි; රුක්ඛො, වෘක්‍ෂයතෙම; ලක්ඛණො, ලක්‍ෂණය; විජ්ජොතමානො, බබලන්නාවූ; චන්දො, චන්‍ද්‍රතෙමේ; ලක්ඛිතබ්බො, ලක්‍ෂිතව්‍යයි-(ඒලක්‍ෂණවූවෘක්‍ෂයෙන් චන්‍ද්‍රතෙම ප්‍රකාශකරණලබන්නේයයිසේයි)—තත්‍ර, එහි; අනුනා, අනු ශබ්දයාවිසින්; රුක්ඛස්ස, රුක්ඛ ශබ්දයාගේ; ලක්ඛණවුත්තිතා, ලක්‍ෂණාර්ථයෙහි වැටෙනබව; පකාසියති, පහළකරණුලැබේනුයි; රුක්ඛො, රුක්ඛ ශබ්දයතෙමේ; අනුනා, අනුශබ්දයාහා; යුත්තොනාම, යුක්තනම් වේ—(රුක්ඛශබ්දයාවිසින් වාච්‍ය ද්‍රව්‍යලක්‍ෂණාර්ථ අනුශබ්දයාහා යොගයක් ඇතිකල්හි ප්‍රකාශවෙයි එහෙයින් කර්‍මප්‍රවචනීයසංඥවූ අනුශබ්දයාහා රුක්ඛශබ්දයා යුක්තනුයි රුක්ඛශබ්දයාකෙරෙන් විතීයා වෙයි සේයි-මෙසේම පති පරි ආදීන්ගේ යොගයෙහිද දතයුතුයි)—රුක්ඛං රුක්ඛමනු, වෘක්‍ෂයෙක් වෘක්‍ෂයෙක්හි; චන්දො, චන්‍ද්‍රතෙම; විජ්ජොතතෙ, බබලා—රුක්ඛෙ රුක්ඛෙති, වෘක්‍ෂයෙහි වෘක්‍ෂයෙහිය යන; අත්‍ථො, අර්ථයි—(රුක්ඛෙරුක්ඛෙ යන්නෙන් රුක්ඛං රුක්ඛමනු යන්නෙහි අර්ථකියය)-යදාදිනා, යදනුපපන්නාදින්; විච්ඡායං, ව්‍යාප්තියක් කිවමනාකල්හි; රුක්ඛම්ති, රුක්ඛංයන; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; අස්ස, මේහට; විත්තං, විත්ව වේ—(අනුශබ්දයාහා යොගයෙහි රුක්ඛශබ්දයාකෙරෙන් විතීයාකොට රුක්ඛං යනවිතීයාන්තයහට ව්‍යාප්තියක් කිවමනාකල්හි පසුව විත්වවෙයි සේයි)—එවං, මෙසේ; සබ්බත්‍ථ, හැමතන්හි; විච්ඡායං, ව්‍යාප්තියක්කිවමනාකල්හි; විත්තං, විත්ව වේ-(සියලුවිභක්ත්‍යන්තයහට ව්‍යාප්තියෙහි විත්ව දතයුතුයි සේයි)—

හිනනාති, වෙන්වූ; යානිවත්‍ථූනි, යම්වස්තුකෙණෙක්; ක්‍රියායතු, ක්‍රියායෙකින් වේවයි; ගුණෙනවා, ගුණයෙකින්වේවයි; දබ්බෙනවා, ද්‍රව්‍යයෙකින් වේවයි; බ්‍යපිතුං, සම්බන්ධකරන්ට; ඉච්ඡා, පුරුෂෙච්ඡාව; වීච්ඡාති, ව්‍යාප්තියයි; වුච්චතෙ, කියනුලැබේ—බ්‍යපිතුන්ති, බ්‍යපිතුං යනු; සම්බන්ධිතුං, සම්බන්ධකරණුපිණිසයනුයි—(බ්‍යපිතුං සම්බන්ධිතුං ඉච්ඡා විච්ඡා-බ්‍යපිතුං යයි සේයි, සම්බන්ධකටටිබව ව්‍යාප්තිනම්—විපූර්වවූ අප පාප්‍රනනෙ යන්නනුකෙරෙන් ඉච්ඡාර්ථයෙහි ඡප්‍රත්‍යයවේ,

---

* (අනු පති පරි අභි යන උපසර්ගයන්ට කර්‍මප්‍රවචනීය සංඥවේ ඒ ක්‍රියාවෙන් පූර්වතන්හියි)—

“බ්‍යඤ්ජනාන්තස්ස චො ඡප්පච්චයෙසුච” යන්නෙන් ධාතූහුගේ ව්‍යඤ්ජනයහට ඡවෙයි—“චාපරොඅසරූපා” යි ධාතූහුගේ අකාරයට ලොප් වෙයි ව්‍යඤ්ජනයා පරකල්හි දීඝීවේ අප්‍රත්‍යයාදී වේ)—අනු, මේ විප්සා විෂයෙහි; උදහරණනි, උදහරණයෝ; (නියතුලැබෙත්)—ගාමො ගාමො, ගම ගම: ගම්‍යතෙ, යතුලැබේ-(මෙහි නොයෙක් ග්‍රාමාබ්‍ය වූ වස්තූහු එකගමනක්‍රියායෙන් සම්බන්ධකරණලදහු)—ගාමො ගාමො, ගම ගම; රමණීයෙත, රම්‍යයි—(මෙහි එකරමණීයත්වගුණයෙන් නොයෙක් ග්‍රාමයෝ සම්බන්ධකරණලදහු-මෙතැන්හි ගාමො යන ප්‍රථමාන්තයාට යදදින්විත්ව වේ)—ගාමෙ ගාමෙ, ගම්හි ගම්හි; ජලං, දියයි—(මෙහි ජලාබ්‍යවූ එකද්‍රව්‍යයෙන් නොයෙක්ගම් සම්බන්ධකරණලද්—මෙහි ගාමෙ යන සප්තම්‍යන්තයට විත්ව වේ)—ඉත්ථම්භූතො, ඉත්ථම්භූත නම්; කවි, කිසි; පකාරං, ප්‍රභෙදයකට; පත්තො, පැමිනියේය*—දෙවදත්තො, දෙවදත්තතෙමේ; මාතරමනු, මවකෙරෙහි; සාධු, ගුණයෙන්යුක්තයි—මාතරි, මවකෙරෙහි; සාධුත්තං, සාධුගුණයට; පත්තොත්‍යත්ථො, ප්‍රාප්තයයන අර්ථයි—(මෙහි දෙවදත්තතෙමේ සාධුත්වලක්ෂණවූ ගුණවිශෙෂයකට පැමිනිහෙයින් කිසි ප්‍රකාරයකට පැමිනියා නම් වේ—ඉමිනා පකාරෙන යන අර්ථයෙහි ඉත්ථං කියාවෙයි—භාගො, භාගනම්; කොට්ඨාසො, කොටසයි—එත්ථ, මෙහිලා; යං, යමෙක්; මං අනුසියා, මාගේ කොටස වන්නේද; තං හෙතෙම; දියතු, දෙනුලැබේවා-යො, යමක්; මමභාගො, මාගේකොටසද; සො, හෙතෙම; ද්‍යතු ඉති, දෙනුලැබේවා යනා; අත්ථො, අර්ථයි—(ක්‍රියාපදයක් නැතිකල්හි වාක්‍යාර්ථපරිසමාප්තියක් නැතිකල්හි ගාවිං දණ්ඩෙන යි කීකල්හි දෙන අඩෙනැයි මෙපමණකින්මුත් වාක්‍යාර්ථයාගෙන්ම නිමාමෙන් නොහැහෙසි ආනය යන ක්‍රියාපදයාහා යුක්තකොට ගාවිං දණ්ඩෙන ආනය යි කීකල දෙනදණ්ඩෙන් ගෙණෙවයි වාක්‍යාර්ථය නිමාම තැගේ—දියතු යනුකීය)-බාරානසි, බරනැස; නදිං අනු, නදියහාඑක්ව; අවසිතා, අවබඩයි-නදියා සහ, නදියාහාඑක්ව; අවබඩාති, අවබඩය යනා; අත්ථො, අර්ථයි—භික්ඛු, භික්ෂුතෙම; අනුසාරිපුත්තං, ශාරිපුත්‍රයාටහීනව; පඤ්ඤවා,ප්‍රඥාඇත්තේයි—සාරිපුත්තාතො, සැරියුත්හුකෙරෙන්; පඤ්ඤාය, ප්‍රඥායෙන්; හී

---

* භූප්‍රාප්තාවාත්මනෙ පදෙ යනුබැවින් භූ යනධාතූහු ප්‍රාප්තියෙහිදු වැවේ-ඕහුකෙරෙන් කර්තෘයෙහි තප්‍රත්‍යයකළකල්හි භූතො පත්තො යන අර්ථවේ—එසින් ඉත්ථම්භූතො යි කීකල්හි කිඤ්චිපකාරම්පත්තො යනු අර්ථයි—

(භූසත්තායං යනධාතුව පරස්මෛපදයෙහිම වේ—ආත්මනෙපදයෙහි වන්නේ භූ ප්‍රාප්ත්‍යර්ථ නය ධාතුවයි)—

නොත්‍යන්තො, භිනයන අර්ථයි—(භික්ෂූතෙමේ දැකැයෙන් සැරිසුත් හඬ අඩුයයි සේයි)—එවං, මෙසේ; පච්චාදීහි, පතිපර අභි යනමොවුන්හා; යථායොගං, සම්භවවූපරිද්දෙන්; යොජේතබ්බං, යෙදියයුතුයි—(සඞ්ඛ්‍යාභිනාර්ථදෙකැ පතිපරිදෙදෙනා නොවැටෙනහෙයින්ද භාගාර්ථ සභාජ්‍යනාදි තුන්අර්ථයෙහි අභි යනු නොවැටෙනහෙයින්ද යථායොගං යනුකීය—රුක්ඛම්පති විජ්ජොතතෙචන්දො—සාධුදෙවදත්තො මාතරම්පති—යදෙත්ථම්පතිසියා තං දියතු—මෙසේම පරිශබ්දයාගාද රුක්ඛං යනු යොදනු—රුක්ඛමහි විජ්ජොතතෙචන්දො-රුක්ඛං රුක්ඛමහි විජ්ජොතතෙ චන්දො—සාධුදෙවදත්තො මාතරමභි-මේ පතිපරි අභි යනමොවුන්ට උදාහරණය—අර්ථපෙරසේ මැයි)-

කචි—පෙ—කචි ය, දුතියා ය, ඡට්ඨීනං ය, අන්තෙ ය, යනුපදයි—ඡට්ඨ්‍යන්තෙ ෂෂ්ඨ්‍යර්ථයෙහි; කචි, කිසිතැනෙක්හි; දුතියාසියා, විතීයා විභක්ති වේ—තංඛොපනභගවන්තං, ඒ භගවත්හු ගේ—තස්සභගවතොත්‍යන්තො, ඒ භගවත්හුගේය යනඅර්ථයි—අන්තරා, අන්තරා ශබ්දය; අන්තො, අන්තොශබ්දය; තිරො, තිරොශබ්දය; අභිතො, අභිතොශබ්දය; පරිතො, පරිතොශබ්දය; පටිභා, පටි පූර්ව භා දීප්තිමහි යනධාතුය යන; ඉච්චාදීනං, මේ ආදිශබ්දයන්හා; යොගෙ, සම්බන්ධයක් ඇතිකල්හි; එවං, මෙසේ මැයි—(මෙමසූත්‍රරෙන්ම විතීයාවෙයි සේයි)-අන්තරාච නාලන්දං, එනම්විහාරයාගේ අතුරෙහිද; රට්ඨං, දෙශයාගේ; අන්තො, ඇතුලද; රට්ඨං, දෙශයාගේ; තිරො, පිටත; ගාමං, ගම්හුගේ; අභිතො, හාත්පස්හි; ගාමං, ගම්හුගේ; පරිතො, හාත්පස්හි; උපමා, උපමාතොම; මං, මට; පටිභාති, වැටහේ—

කචිඉති, කචියනු; අධිකාරො, වැටේ—

තතියා—පෙ—තතියා ය, සත්තම්නං ය, ච ය, යනුපදයි—තතියාසත්තම්‍යන්තෙ, තෘතීයාසත්තමිදෙදෙනාගේ අර්ථයෙහිද; චකාරෙන, චග්‍රහණයෙන්; සම්පදානෙච, සම්ප්‍රදානයෙහිද; පඤ්චම්‍යන්තෙච, පඤ්චම්‍යර්ථයෙහිද; කචි, කිසිතැනෙක්හි; දුතියා සියා, විතීයාවන්නියි—මං, මාහා; නාලපිස්සති, නොබෙණේ; මයා, මාහා; සහෙනි, එක්වයන; අන්තො, අර්ථයි—සත්තම්‍යන්තෙ, සප්තම්‍යර්ථයෙහි; (උදාහරණකියනු ලැබේ)—පුබ්බණ්හසමයං, පෙරවරුවේලෙහි; නිවාසෙත්වා, හැඳපෙරව—සමයෙත්‍යන්තො, කල්හිය යන අර්ථයි—උප අනු අධි ආ පුබ්බස්ස, උපය අනුය අධිය ආය යන මොවුන් පූර්වකොටඇති; වස නිවාසෙ ඉති, වසනිවාසෙ යන; අස්ස, මේ ධාතුහුගේ; යොගෙ, යොගයෙහිද; අධි ආ පුබ්බානං, අධි ආ යනමොවුන්පූර්වවූ; සිසයෙ ඨා ආසඉති, සි සයෙය ඨා ගතිනිවුත්තිම්හිය ආස උපවෙසනෙය යන; එසං, මේ ධාතුන්තුන්දෙනාගේ; (යොගයෙහිද) අභිනිපුබ්බස්ස, අභි නි ශ

ඛද්දෙදෙනාපද්කොට ඇති විසප්පවෙසනෙසූති: විසප්පවෙසනෙය
නා: අසස. මේ ධාතූහුගේ: යොගෙව, යොගයෙහිද: (විතියාවෙයි යො
දනු)—ගාමං, ගම: උපවසති, වෙසෙයි; අනුවසති, වෙසෙයි; අධිවස
ති, වෙසෙයි; ආවසති, වෙසෙයි; අධිසෙති, සයනයකෙරෙයි; අභිනි
වඩති, පිහිටවයි: අජ්ඣාවසති, හිඳියි; අභිනිවිසතිවා, වදනේහෝ
වෙයි—(හැමතැන්හිම ගාමං යනු යොදනු)—පානාචාරනේසු, පාන
ය ආචාරය යන අර්ථයෙහි; (විතියා වේ)—නදිං, ගොයෙහි; පිවති,
පැන්බෝ-(මෙහි නදීශබ්දයෙන් නදීසම්බන්ධජලය උපචාරහෙයින් ගැ
ණේ)—ගාමං, ගම්හි: චරති, හැසිරේ-(පුබ්බණ්හසමයං, යනාදිමේ
හැම සප්තම්‍යර්ථයෙහි විතියායි)—සම්පදනෙ, සම්ප්‍රදානයෙහි; (වි
තියානියතුලැබේ)—තං, තට; පටිචාරොචෙම්, පසුවකියම්—තෙනත්‍ථ
නෝ, තටය යන අර්ථයි—පචම්‍යනෝ, පචම්‍යර්ථයෙහි; (විතියානිය
තුලැබේ)—ගාමා, ගමින්; පුබ්බෙන, පූර්වභාගයෙහි—ගාමස්මා, ගමි
න්; පුබ්බසම්නාති, පූර්වයෙහි යනු; අත්‍ථො, අර්ථයි—(පුබ්බෙන යනතැ
න්හි සප්තම්‍යර්ථයෙහි තෘතීයාය යනු භගවතාපිණ්ඩ පුබ්බසම්නාති ය
නුකිය)—සුඛං සෙතිච්චාදිසු, සුඛංසෙති යනාදී ආදියෙහි; ක්‍රියාවිසෙ
සනත්තා, ක්‍රියාවිශෙෂණහෙයින්; කම්මත්‍ථෙයෙව; කර්මාර්ථයෙහිම;
දුතියාසියා, විතියා වේ—කථං, (එම්ක්‍රියාවිශෙෂණත්වය) කෙසේය ය
ත්; භූ කරා, භූ සත්තායං කර කරණෙ යන දෙදෙනා; සබ්බධාතු
නේසු එව, සියළුධාතූන්ගේ අර්ථයෙහිම; සන්ති, ඇත; තස්මා, එහෙ
යින්; (ඒ ධාතූන්දෙදෙනා සියලුධාත්‍වර්ථයෙහිම ඇතිහෙයිනැයිසේ
යි*) සෙතීති, සෙතියි සේයි: සයනං කරොතීති, සයනය කෙරෙයි
යන; අත්‍ථො, අර්ථය—තිං විසිට්ඨං සයනන්ති, කෙසේවූ ශයනදැයි; අ
පෙක්ඛායං, අපෙක්ෂාවන්ඇතිකල්හි; සුඛන්ති, සුඛවූ ශයනය කරන්
නේයයි; අපෙක්ඛියමානත්තා, අපෙක්ෂාකරණලබනහෙයින්; සයන
ක්‍රියාය, ශයනය යනමේක්‍රියාවට; සුඛන්තිඑතං, සුඛං යනමේ; විසෙ
සනන්ති, විශෙෂණහෙයින්; සුඛයස, සුඛශබ්දයාතමා; සයනෙන, ශ
යන ශබ්දයාහා; තුල්‍යාධිකරණත්තා, සමානාධිකරණහෙයින්; තගගා
තං, ඒ ශයනශබ්දසම්වූ; දුතියෙකවචනං, විතියාඑකවචනයද; න
පුංසකත්තං ච, නපුංසකලිඞ්ගබවද; සුඛසද්දො, සුඛශබ්දයතෙමේ; ල
භතෙ, ලබා—†

---

* (ධාත්වර්ථයෙන්හි නිරීම දව්මද ඇත්තේයි එහෙයින් භූකර ය
න ධාතුදෙදෙන සියලුම ධාත්වර්ථයෙහි ඇතැයිකියනලදී)—

† (සුඛසද්දොලබ්භතෙ කියා බාලාවතාරපෙළෙහිද ලැබේ කි
යා ව්‍යාඛ්‍යානයෙහි සිංහලාර්ථද පෙනේ-එසේනම් ලබ්භතෙ යනු ක
ර්ම්ක්‍රියායි—එසේකල උක්තකර්මය විය යුතුයි—ඒ විමසියයුතුයි)—

ක්‍රියාවිසෙසනං, ක්‍රියාවිශෙෂණයතෙමේ; යාව, යම්පමණෙකින්ද; නං සබ්බංහි, ඒ සියල්ලම; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වෙයි; සියාව එකවචනං, එකවචනද වේ; යථා, මෙසේයි; භික්ඛු, භික්ෂූහු; සුඛං, සුවසේ; ඨිතා, සිටියෝයි-(මෙහිදු ඨිතා කීකල ඨානං කතවනෙනා සේ සී ස්ථානක්‍රියාව කළහ යන අර්ථය—කෙසේවූ ස්ථානක්‍රියාව කෙළේ යයි අපෙක්ෂාවක් ඇතිකල්හි සුඛවූ ස්ථානක්‍රියාවයයි අපෙක්ෂාකළ කල්හි සුඛං යනු ඨානං යන්නට විශෙෂණවනහෙයින්ද සුඛශබ්දයෙන්ද ස්ථානශබ්දයෙන්ද එකම ස්ථිතික්‍රියාව කියනලබනහෙයින් සුඛශබ්ද ස්ථානශබ්දදෙදෙනා තුල්‍යාධිකරණහෙයින්ද විශෙෂ්‍යාර්ථාවී ඨානං යන මේ දෙපදයෙහිවූ නපුංසකත්වයද එකවචනද සුඛශබ්දය ලබා)—

යො—පෙ—යො ය, කරොති ය, ස ය, කත්තා ය; යනුපදයි—(සො කත්තාසීතිවමනාතැන්හි "ලොපඤ්ච තත්‍රාකාරො" කියා ලොප්ද අකාරද කළකල්හි සකත්තාසී වේ)—යො, යමෙක්තෙමේ; අඤ්ඤකාරකානං පධානො, සෙසුකාරකයන්ට ප්‍රධානවූයේ; කම්මට්ඨංවා, කර්මස්ථවූහෝ; අත්තට්ඨංවා, තමාකෙරෙහි පිහිටියෝ; ක්‍රියං, ක්‍රියාව; කරොති, කෙරේද; සො, හෙතෙම; කත්තානාම, කර්තෘනම්—කත්තරිචඉති, "කත්තරිච" යී; තතියා, තෘතීයා වේ—සූදෙන, අරක්කැමියාවිසින්; ඔලියං, හැලෙහිලා; කට්ඨෙහි, දරින්; ඔදනො, බත; පච්චතෙ, පිසනුලැබේ—(සූදෙන යනු ඔදනස් පාකක්‍රියාව කරණහෙයින් කර්මස් ක්‍රියාවට කර්තෘය-ඔදනය දරණහෙයින් ඔලියං යනු ආධාරය එකකර්තෘහුගේ පාකක්‍රියාසිද්ධියට අතිශයෙන්ම වහල්ව පැනෙනාහෙයින් කට්ඨෙහි යනු කරණය පචනක්‍රියායෙහි සම්බන්ධකරණලදහෙයින් ඔදනො යනුකර්මය පච යනු සකර්මකහෙයින් පච්චතෙ යනු කර්මසිද්ධියි)—රඤ්ඤා, රජහුවිසින්; පාසාදෙ, ප්‍රාසාදයෙහි; පාදෙහි, පයින්; ඨීයතෙ, සිටීමයි—(මෙහි රඤ්ඤායනු ආත්මස්ථවූ ස්ථිතික්‍රියාව කරණහෙයින් කර්තෘය කර්තෘහු දරණහෙයින් පාසාදෙ යනු ආධාරය ඒ කර්තෘහුගේ ස්ථිතික්‍රියාසිද්ධියට අතිශයෙන් වහල්හෙයින් පාදෙහි යනු කරණය ඨා යනු අකර්මකහෙයින් ඨීයතෙ යනු භාවසිද්ධියි)-එත්ථ, මෙතැන්හිලා; ඔලඛාදි, ඔලිය කාෂ්ඨය ඔදනය යන; කාරකසමූහො, කාරකසමූහතෙමේ; සූදෙන, සූදයාවිසින්; යොජිතො, යොදනලද්දේ; සංසං, තමතමාපිළිබඳවූ; ධාරණාදිනා, ධාරණය ජ්වලනය ක්‍රියාසම්බන්ධය කිරීමය යන; ව්‍යාපාරෙණ, ක්‍රියායෙන්; පාකක්‍රියං, පචනක්‍රියාව; අභිනිබ්බත්තයතීති, නිපදවාතුයි; සූදෙයෙව, සූදයාම; උස්සාහයුත්තත්තා, උත්සාහය යුක්තහෙයින්; පධානො, ප්‍රධානය; නපන ඔලඛාදි; ස්ථාලිආදි ප්‍රධානනොවේ—(ස්ථාලඛාදින් තමන් තමන්ගේ ව්‍යාපාරයෙහි යොදනහෙයින් උත්සාහවත්වූ සූදයා ප්‍රධාන

ය ඔහුවිසින් යොදනලදකල තමන්ගේ ව්‍යාපාරකරත්මුත් වෙනළ ත්‍යාගයක් නැතිහෙයින් ස්ථාලත්‍ද්‍යු අප්‍රධානානයි සේයි-මෙහි ආධාරවූ ස්ථාලි ප්‍රාසාද දෙදෙන කර්මවූ ඔදනය කර්තෘවූ රජයයන දෙදෙනා දරණහෙයින් ධාරණව්‍යාපාරය කෙරෙති, කරණවූ ඉන්ධනය ඒවලනව්‍යාපාරය කෙරෙයි කර්මවූ ඔදනය පාකක්‍රියාව සම්බන්ධව දරණහෙයින් ධාරණක්‍රියාවම කෙරේ)—තස්ස, ඔවුන්අතුරෙහි; පාකක්‍රියා, පචනක්‍රියාතොමෝ; කම්මට්ඨා, කර්මස්ථය; ඨිතික්‍රියාතු, ස්ථිතික්‍රියාව වනාහි; කත්තුට්ඨා, කර්තෘස්ථයි—

යො, යමෙක්තෙම; අඤ්ඤකාරකානි, සෙසුකාරකයන්; සකස කෙවලු, තමන්තමන්පිළිබඳවූ; ක්‍රියෙ, ව්‍යාපාරයෙහි; යොජයං, යොදන්නේ; යතනාසුත්තතයා, උත්සාහවත්හෙයින්; පධානො, ප්‍රධානවූයේ; කම්මට්ඨිතං ක්‍රියං, කර්මස්ථවූ ක්‍රියාවද; අථ, නොහොත්; අත්තඨිතං, ආත්මස්ථිතවූ; ක්‍රියං, ක්‍රියාවක්වේවයි; කරොති, කෙරේද; සො, හෙතෙමේ; කත්තානි, කර්තෘයයි; නිගදිතො, කියනලදී; සොච, සොද; අනෙකභෙදෙ, අනෙකවිධ වේ—

(කර්තෘභෙද කියනුලැබේ—කර්තෘතෙමේ සචෙතනය අචෙතනයයි ද්විවිධවේ—එහි සචෙතනතෙමේ කර්මකර්තෘය හෙතුකර්තෘය ශුද්ධකර්තෘයයි ත්‍රිවිධ වේ—කර්මකර්තෘනම් හෙතුකර්තෘවිසින් මෙහෙයනලබන්නේය මෝහට ප්‍රයොජ්‍යයයි කියාදනම්-හෙතුකර්තෘනම් කර්මකර්තෘහු මෙහෙයන්නේයි-මෝහට ප්‍රයොජකයයිද නම්-ශුද්ධකර්තෘනම් මේ දෙකින් පිටත්වූයේයි-මෝහට ප්‍රයොජ්‍යස්වරූපයක්ද ප්‍රයොජකස්වරූපයක්ද නැතිහෙයින් අනුභවරූපයයිද ස්වතන්ත්‍රයයිද නම්—එහි කර්මකර්තෘතෙමේ ආත්මස්ථක්‍රියාහෙතුය කර්මස්ථක්‍රියාහෙතුයයි ද්විවිධ වේ-කෙසේයත්-රාජනියොගතො තිට්ඨති දෙවදත්තො යි කීකල රජහුගේ නියොගයෙන් සිටිනාවූ දෙවදත්තතෙමේ චෙතනාසහිතවූයේ රජහුවිසින් මෙහෙයනලදින් තමාකෙරෙහි පිහිටියාවූ ස්ථිතික්‍රියාව කෙරේනුයි සචෙන ආත්මස්ථක්‍රියාවට හෙතුවූ කර්මකර්තෘනාම්-රජහුගේ නියොගක්‍රියායෙන් සම්බන්ධකරණලබනහෙයින් කර්මබවක්ද ස්ථිතික්‍රියාව කරණහෙයින් කර්තෘබවක්ද ඇතිහෙයින් එකදෙව දත්තකර්මවූයේ හෙමනුයි කර්තෘවූයේ හෙමනුයි කර්මකර්තෘනම් වේ-රාජනියොගතො ගාමං දහති යඤ්ඤදත්තො යි කීකල්හි යඤ්ඤදත්තතෙමේ චෙතනාසහිතවූයේ රජහුවිසින් මෙහෙයනලදී-ග්‍රාමාඛ්‍යවූ කර්මයෙහි පිහිටියාවූ දහනක්‍රියාව කරන්නේය සචෙතනවූ කර්මස්ථක්‍රියාවට හෙතුවූ කර්මකර්තෘනම්-මේ හෙතුකර්තෘතෙමේ ප්‍රෙෂකය අධ්‍යෙෂකය අනුකුලභාගියයි ත්‍රිවිධ වේ-යමෙක් අනාදරයෙන් යුක්තව ප්‍රයොජ්‍යකර්තෘ මෙහෙයාද හෙතෙම ප්‍රෙෂකනම්-යමෙක්ආදරයෙන්යුක්තව ප්‍රයොජ්‍යකර්තෘ මෙහෙයාද හෙතෙම අධ්‍යෙෂකනම්-

යමෙක්තෙමේ අනාදරයෙන් යුක්තවවේවයි ආදරයෙන් යුක්තවවේ
වයි ප්‍රයොජ්‍යයා නොමෙහෙයාද හුදෙක් ප්‍රයොජ්‍යයාවිසින් කරණක්‍රි
යාවට අනුකූලබවක්ම සෙවීද හෙතෙම අනුකූල්‍යභාගිනම්—ඒ තු
න කෙශෙස්යයත්—සාමිදූසං ගාමං ගමයති යනමෙහි සඩාමිතෙම
අනාදරයෙන් යුක්තව දූසයා ගමට යන්නට මෙහෙයන්නේ සචෙත
නවූ ප්‍රෙෂකවූ හෙතුකත්‍රිනම්—සඩො භික්ඛු භොජයති යන මෙහි
ශ්‍රද්ධාවන්තතෙමේ ආදරයුක්තව භික්ෂූහු වළඳන්නට මෙහෙයන්නේ
සචෙතනවූ අධ්‍යෙෂක හෙතුකත්‍රිනම්—පුත්තො පිතරං තොසයති
යන්නෙහි පුත්‍රතෙමේ පියා සතුටුවනපිණිස ආදරයුක්තවද අනාද
රයුක්තවද නොමමෙහෙයන්නේ හුදෙක්ම ඒ පියාගේ අභිප්‍රාප
තතියට අනුකූලබවක්ම සෙව්නේ පියා මෙහෙ යන්නානම්වේනුයි
සචෙතනවූ අනුකූල්‍යභාගිවූ හෙතුකත්‍රිනම—ශුඩකත්‍රිද ආත්මස්ථ
ක්‍රියාහේතුය කර්මස්ථක්‍රියාහෙතුයයි විවිධ වේ—කෙශෙස්යයත්—දෙව
දත්තො සෙති යන්නෙහි දෙවදත්තතෙමේ අනුන්විසින් මෙහෙයන
නොලද්දේ තෙමේද අනිකක්හු නොමෙහෙයන්නේ තමාකෙරෙහි
පිහිටියාවූ ශයනක්‍රියාවට හෙතුවනහෙයින් සචෙතනවූ ආත්මස්ථක්‍රි
යාහෙතුශුඩකත්‍රිනම්—සූදො ඔදනං පචති යනමෙහි සූදතෙම අනි
කක්හුවිසින් මෙහෙයනනොලද්දේ තෙමේද අනිකක්හු නොමෙ
හෙයන්නේ ඔදනාඛ්‍යවූ කර්මයෙහි පිහිටියාවූ පචනක්‍රියාසිද්ධියට
හෙතුවනහෙයින් සචෙතනවූ කර්මස්ථක්‍රියාහෙතුවූ ශුඩකත්‍රිනම්—
අචෙතනකත්‍රිද කර්මකත්‍රිය හෙතුකත්‍රිය ශුඩකත්‍රියයි ත්‍රිවිධ වේ-
මෙහි කර්මකත්‍රිතෙමේ ආත්මස්ථක්‍රියාහෙතුය කර්මස්ථක්‍රියාහෙතුය
යි විවිධවේ—කෙශෙස්යයත්—වායුනා කම්පියමානො පලලචො කම්ප
තෙ යන්නෙහි පලලවයතෙම චෙතනාරහිතවූයේ පවනයාවිසින්
සලනලබනහෙයින් ඔහුවිසින් මෙහෙයනලබන්නේනම්වන්නේ
තමාකෙරෙහි පිහිටියාවූ කම්පනක්‍රියාවට හේතුවෙයි අචෙතනවූ ආ
ත්මස්ථක්‍රියාහේතුවූ කර්මකත්‍රිනම්-කාකෙන පාතියමානං පුගඵලං
භූමියං පතති යනමෙහි පූගඵලයතෙමේ චෙතනාරහිතවූයේ කපු
ටුවාවිසින් හෙලනුලබන්නානම්වන්නේ තමාගේ පතනක්‍රියාසෙන්
සම්බන්ධකරණහෙයින් කර්මවූ භූමියෙහි පිහිටි පතනක්‍රියාවට හේතු
වන්නේ අචෙතනකර්මස්ථක්‍රියාහෙතුවූ කර්මකත්‍රිනම්—අචෙතන
හෙතුකත්‍රිවූකලී හුදෙක් ආනුකූල්‍යභාගිවත්මුත් ප්‍රෙෂකද අධ්‍යෙෂ
කද නොවේ—කවරහෙයිනයත්-තමා අචෙතනහෙයින් සචෙතන
යන්විසින් කටහැකිවූ ආදරානාදර දෙක කරන්නට නොපොහොස
ත්හෙයිනි—භික්ඛා භික්ඛුං වාසයති යන්නෙහි භික්ෂාතොමෝ චෙ
තනාරහිතවී භික්ෂූහුගේ විසීමට හෙතුවනහෙයින් අනුකූලබවක්
සෙව්නී භික්ෂූහු මෙහෙයන්නානම් වෙයි අචෙතනවූ අනුකූල්‍යභා

හිවූ හෙතුකතෘනම්—අචේතනාශුද්ධකතෘද ආනම්සල්ක්‍රියාහෙතුය කාර්මසල්ක්‍රියාහෙතුසයි විවිධවේ—අග්ගිජලති යන්නෙහි ගිනිතෙමේ අනුන්විසින් මෙහෙයනනොලබන්නේ තෙමේද අනුන්නොමෙහෙයන්නේ ආනම්සල්වූ ජලනක්‍රියාවට හෙතුහුයි අචේතනවූ ආනම්සල්ක්‍රියාහෙතුවූ ශුද්ධකතෘනම්—අග්ගි ඉන්ධනං දහති යන්නෙහි අග්නිතෙමේ චේතනාරහිතවූයේ අනුන්විසින් නොමෙහෙයනලබන්නේ තෙමේද අනුන් නොමෙහෙයන්නේ සවයතනවම ඉන්ධනාබ්‍යකම්මසල්වූ දහනක්‍රියාවට හෙතුහුයි අචේතනවූ කර්මසල්ක්‍රියාහේතුවූ ශුද්ධකතෘනම්—රාජනියොගතො තිට්ඨති දෙවදත්තො යනාදියෙහි දෙවදත්තාදිවූ කතෘහු හැමදෙනම තිට්ඨති යනාදියෙහි ආඛ්‍යාතයෙන් උක්තහෙයින් උක්තකර්තෘාදි නම්වෙත්-යම්කලෙක්හි රාජනියොගතො දෙවදත්තෙන ඨීයතෙ යනාදී ප්‍රයොගවිනම් එකල්හි ඨීයතෙ යනාදී ආඛ්‍යාතයෙන් දෙවදත්තාදි කතෘ උක්තනොවෙත්හුයි අනුක්තකම්මකර්තෘාදි නම්වෙත්—කතෘදෙදෙන නිමි.

——0000——

යෙන—පෙ—යෙන ය, වා ය, කයිරතෙ ය, තං ය, කරණං ය, යනුපදයි—කත්තා, කතෘතෙමේ; යෙන, යමක්කරණකොටගෙණ; කරොති, කෙරේනම්හෝ; පස්සති වා, බලානම්හෝ; තං, ඒ; කත්තුස්ස, කතෘහුගේ; ක්‍රියාසිද්ධියං, ක්‍රියාසිද්ධියෙහිලා; අතිසයෙන, අතිශයෙන්; උපකාරභූතං, වහල්වූයේ; ගම්‍යතෙති, හැගේහුයි; කරණං නාම, කරණනම්—

කරණෙ—පෙ—කරණෙ ය, තතියා ය, යනුපදයි—බාහිරංච, බාහ්‍යය; තථා, එසේම; අජ්ඣත්තං, අභ්‍යන්තරයයි කියා; කරණං, කරණයතෙමේ; දුවිධං, විවිධවෙයි; යථා, මෙසේයි; දාත්තෙන, දෑයෙන්; වීහිං, ගොයම්; ලුනාති, ලයි; නෙත්තෙන, නෙත්‍රයෙන්; චන්දං, චන්ද්‍රයා; ඉක්ඛතෙ, බලා—(මෙහි ශරීරයෙන් පිටත්වූයේ බාහිරනම් ශරීරයෙහි ඇතුලත්වූයේ අජ්ඣත්තනම්—මෙහි දෑත්‍රය බාහ්‍යවූයේ කතෘහුගේ ලවනක්‍රියාසිද්ධියෙහිලා අතිශයින්වහලි—නෙත්‍රයතෙමේ අභ්‍යන්තරවූයේ කතෘහුගේ දර්ශනක්‍රියාසිද්ධියෙහිලා අතිශයින්වහලි)—තතියාති, තතියා යනු; අධිකාරො, වැටේ—

සහා—පෙ—සහාදියොගෙ ය, ච ය, යනුපදයි—සහ අලං කිං ආදීනං යොගෙ, සහය අලංය කිංය යනමේආදී ශබ්දයන්හා සම්බන්ධඇතිකල්හි; සහත්ථෙච, සහශබ්දයාගේ අර්ථයෙහිද; තතියා සියා, තෘතී

යාවත්තියි—(විරත * ආදිශබ්දයෙන් සඩ්ං යන මේ ආදිදන්න)-සහ සඅද්දනංච, සහශබ්දයගාද; යොගෙ, යොගය; ක්‍රියාගුණදබ්බසම්බා යෙ, ක්‍රියාය ගුණය ද්‍රව්‍යය යනමොවුන්ගේ සම්බන්ධයක් ඇතිකල් හි; සම්භවති, සම්භව වේ—පුත්තෙනසහ, පුත්‍රයාහාඑක්ව; වුත්ථෝ, පැ වැත්මය; ථූලො, පුත්‍රයාහාඑක්වස්ථූලය; ධනංවා, පුත්‍රයාහාඑක්ව ධ නයහෝවි—පුත්තෙනෙතිවා, පුත්තෙනයි කියාහෝ වේ-(සහශබ්දයා හා ප්‍රයොගනැද්ද ඒ සහශබ්දයාගේ අර්ථය කිවමනාකල්හි තෘතීයා කළකල පුත්තෙන වුත්ථෝ පුත්තෙන ථූලො පුත්තෙන ධනං කියාද වෙයි සේයි—එසේහෙයින් සහශබ්දයාහා යොද පුත්තෙන සහවුත්ථෝ යනාදී කීකල්හි යම් අර්ථයෙක්ද සහශබ්දයා නැතිවද පුත්තෙන වු ත්ථෝ යනාදී කිවද එමඅර්ථමැයි—මෙහි වුත්ථෝ යනු ක්‍රියාය ථූලො යනු ගුණය ධනං යනු ද්‍රව්‍යවෙයි)-තෙ, තාගේ; වාසෙන, විසීමෙන්; අලං, පමණි-† තෙ, තාගේ; ජටාහි, ජටායෙන්; කිං, කිම-(මෙහි කිං ශබ්ද ය ප්‍රතික්ෂෙපයෙහි වැටේ එහෙයින් ජටා නොකැමැත්තේයි සේයි)-

හෙතු—පෙ-හෙතුවත්ථෙ ය, ච ය, යනුපදයි-හෙතුවත්ථෙ, හෙතුඅර්ථය ක් වාච්‍යකල්හිද; හෙතුයොගෙච, හෙතු ශබ්දයාගේ සම්බන්ධයක් ඇ තිකල්හිද; තතියා සියා, තෘතීයා වේ-අන්නෙන, අන්නය හෙතුකො ටගෙණ; වසති, වෙසේ—කෙන හෙතුනාවා, කවරහේතුවකින්දැයි කියාහෝ වේ-(ආදිතැන හෙතු ශබ්දයා නැද්ද තෘතීයාවවිසින්ම හෙ තුඅර්ථය හඟවනලද පසුතැන හෙතු ශබ්දයතෙමේම ඇති)—

සත්තම්‍යත්ථෙචෙති, "සත්තම්‍යත්ථෙච" සි; තතියා, තෘතීයා වේ—ගා මා, ගමින්; පුබ්බෙන, පූර්වභාගයෙහි—

---

* (මෙහි විරත ආදිශබ්දයෙනැයි කියනලද්දේයි—සහාදියොගෙ ච යි සූත්‍රයෙහිදු ආදිශබ්දය ඇති, එකල සූත්‍රරෙහිය නොකියා විරත යයි ක්‍රමට කියනලදදයත් සූත්‍රරෙහි කියනලද ආදිශබ්දයෙන් අලං කිං සඩ්ං සමං අමා යන මේ සියලල ගතයුතුයි-ඒ සියලල වෘත්තියෙ හි නොදක්වා සහ අලං කිං ආදිනං යොගෙයි එහිදු ආදිශබ්දයක් නැ වත යොදනලදී—ඒ ආදිශබ්දයෙන් සිඩ්ං යන මේ ආදි දන්න කියා ව්‍යාඛ්‍යානයෙහිදු ආදිශබ්දය යොදනලදී—එහෙයින් ආදිශබ්දයෙන් දක්වනලද්දෙහි නිෂ්ඵාවක් නොපෙනේ—මෙහි විරතයයි කියනල ද්දේ කසයින් විරතනොවේ-එහි විරත මෙසේයි-"සහාදියොගතෙ තතියා විභත්තිහොති" මෙහි කියනලද්දේ බාලාවතාරයෙහි යොද නලද සහ අලං කිං ආදීනං යොගෙ සහත්ථෙච තතියා යනු සඳහායි).

† අලම්භූෂණපර්‍යාප්තිවාරණෙෂු ප්‍රයුජ්‍යතෙ—යනුබැවින් මෙහි අලං ශබ්දය නිවාරණයෙහි වැටෙයි—එහෙයින් තාගේ විසීම නො කැමැත්තේයි සේයි—

යෙන—පෙ—යෙන ය, අඞ්ගවිකාරො ය, සූත්‍රපදයි—බන්‍ධිමතා, බන්‍ධිමත්වූ; යෙන අවයවෙන, යම් අවයවයෙකින්; සරීරස්ස, ශරීරයාගේ; විකාරො, අන්‍යථාභාවය; විඤ්ඤායති, දන්නාලැබේද; තත්‍ථ, එහි; තතියා, තෘතීයා වේ—විකාරො, විකාරයනම්; අඤ්ඤථාභාවො, අන්‍යථාභවයයි—අක්ඛිනා, ඇසින්, කාණො, කණී—(මෙහි බන්‍ධිමත් වූ අවයවනම් ඇසයි)—

විසෙසනෙචෙති, "විසෙසනෙච" යි; විසෙසනත්‍ථෙ, විශෙෂණාර්ථයෙහි; තතියා, තෘතීයා වේ-ගොත්තෙන, ගෝත්‍රයෙන්; ගොතමො, ගොතමයයි—(ගොතමනම්ගොත්‍රඇත්තේයයි සේයි—ගොතම ගොත්‍රතෙමේ භාරද්වාජාදිගොත්‍රයෙන් පුරුෂයා වෙනස්කොට සිටියේනුයි පුරුෂයාට විශෙෂණ වේ)—*

වුත්තතො, කියනලදදෙයින්; අඤ්ඤත්‍ර, පිටත්හත්හි යා තතියා, යම් තෘතීයාවක්; දිස්සති, පෑනේද; සා සබ්බා, ඒ සියලුතෘතීයා තොමෝ; කත්තරිචෙති, "කත්තරිච" යි; ඉහ, මෙහි; චකාරෙන්, ච ග්‍රහණයෙන්; සිජ්ඣති, සිඩවේ—තං යථා, හේ මෙසේයි—කම්මත්‍ථෙ, කර්මාර්ථයෙහි; (තෘතීයා වේ)—තිලෙහි, තල; වපති, වපුරේ—පඨමියං, ප්‍රථමාර්ථයෙහි; (තෘතීයාවේ)—මයං, අපි; තෙන, ඒ; මහාසමණෙන, මහාශ්‍රමණයාකෙරෙන්; සුමුත්තා, † මිදුනමු—පඨමායං, ප්‍රථමාර්ථයෙහි; (තෘතීයා වේ)—අත්තනාව, තෙමේම; අත්තානං, තමා; සම්මන්නති, දනී—ඉත්‍ථම්භූතෙ, ඉත්‍ථම්භූතාර්ථයෙහි; (තෘතීයාවේ)—පරිබ්බාජකං, පරිබ්‍රාජකයා; තිදණ්ඩකෙන, ත්‍රිදණ්ඩයෙන්; (උපලක්ෂිත වූවහු) අද්දක්ඛි, දිටී—(මෙහි පරිබ්‍රාජකතෙමේ ත්‍රිදණ්ඩයුක්තත්‍වය ලක්‍ෂණවූ ප්‍රකාරයට පැමිනියේනුයි ඉත්‍ථම්භූත නම්)-ක්‍රියාපවග්ගෙ, ක්‍රියාපවර්ගයක් හැගෙනකල්හි; (තෘතීයා වේ)—එකාහෙනෙව, එකදවසින්ම: බාරාණසිං, බරනැසට; පායාසි, ගියේය—කිරියාපවග්ගොති, ක්‍රියාපවර්ගයනම්; ක්‍රියාය, ක්‍රියාවගේ; ආසු, වහා; නිට්ඨාපනං, නිමවීමයි—තුල්‍යෙ, තුල්‍යාර්ථයෙහි; (තෘතීයාවේ)—මාතරා, මවහා; සමො, සදෘශයි—කාලෙ, කාලයෙහි; (තෘතීයාවේ)—කාලෙන, (සුදුසු) කාලයෙහි; ධම්මසවණං, දහම්ඇසීමයි-(සුදුසුකල්නො ඉක්මයයි සේයි)—පුබ්බාදියොගෙ, පුබ්බශබ්දාදීන්හා යොගයක් ඇතිකල්හි; (තෘතීයාවේ)—මාසෙන, මසකින්; පුබ්බො, ආදියි—යෙනු

---

* ගොත්තං නාමවංසයොඃ යනුබැවින් ගොත්‍රශබ්දයා නාමයෙහිද වංසයෙහිද වැටේ—

† (යහපත්ව මිදුනෙමු කියාහෝ යහපත්සේ මිදුනෙමු කියාහෝ වියයුතුයයි හඟිමි, විමසියයුතු)—

යෝන, බොහෝසේ; උපසංකමි, එළඹිය යන; ඉතනදි, මේආදිවේ.

---

යස්ස—පෙ—යස්ස ය, දාතුකාමො ය, රොචතෙ ය, ධාරයතෙ ය, වා ය, තං ය, සම්පදානං ය, යනුපදයි—

කත්තා, කර්තෘතෙමේ; පූජාබුඩියාවා, පූජාබුඩීන්වේවයි; අනුගාහබුඩියාවා, අනුග්‍රහබුඩීන්වේවයි; යස්ස, යමක්හට; දාතුමිච්ඡතිවා, දෙනුකැමැත්තේහෝ; පීතිං කරොතිවා, ප්‍රීතිකෙරේනම්හෝ; ධාරයතෙවා, දරානම්හෝ; තං, හේතෙම; කත්තුස්ස, කර්තෘහුගේ; දානිච්ඡාදි, දානෙච්ඡාය ප්‍රීතිකිරීමය දැරීමය යනමොවුන්ට; නිමිත්තං, කාරණවූයේ; සම්පදානං නාම, සම්ප්‍රදානනම්—"සම්පදානෙ චතුත්ථි" යි චතුත්ථි වේ-සමණස්ස, ශ්‍රමණයාහට; චීවරං, සිවුර; දදාති, දේ-(මෙහි චීවරදානයට පූජාබුඩීන්ද දලිද්දස්ස වත්ථං දදාති යනාදියෙහි අනුග්‍රහබුඩීන් දානයයි)—සමණස්ස, භික්ඛුහට; සච්චං, සබවසතෙමේ; රොචතෙ, රුස්නේයි—(ප්‍රීතිකරයයි සේයි—මෙහි කර්තෘ සත්‍යය ඔහුගේ රොචනක්‍රියාවට නිමිත්තවූයේ ශ්‍රමණයි)—යඤ්ඤදත්තස්ස, යඤ්ඤදත්තයාහට; ඡත්තං, සත; ධාරයතෙ, දරා-(සත ලැයි සේයි).

අනිරාකත්තු, අනිරාකර්තෘය; අනිමන්තු, අනිමන්ත්‍රය; ආරාධකං, ප්‍රෙෂකයයිකියා; සම්පදානියං, සම්ප්‍රදානකාරකයතෙමේ; තිධා, ත්‍රිවිධවේ; යථා, මෙසේයි; රුක්ඛස්ස, වෘක්ෂයහට; ජලං, දිය; දෙති, දෙයි; භික්ඛුනො, භික්ෂුහට; ජලං, දිය; දෙති, දෙයි; අත්ථිනො, යාචකයාහට; ජලං, දිය; දෙති, දෙයි-(නනිරාකරොති දානං න නිවාරයතීති අනිරාකත්තු—නනිරාකරොතියි සේයි; දානං නවාරයතීති, දානය නොවලකාතුයි; අනිරාකත්තු, අනිරාකර්තෘ නම්-නි ආ පූර්වවූ කර යන් නාහුකෙරෙන් කර්තෘකාරකයෙහි තු කොට යවමදනාදීන් රාගම කොට නනිරාකත්තු ය යනවාක්‍යයෙහි කර්මධාරයසමාසකොට සාමාන්‍යයෙයින් නපුංසකලිඟුකළකල්හි අනිරාකත්තු යනු වේ-මෙහි රුක්ඛස්ස ජලං යන්නෙහි වෘක්ෂයතෙම තට දිය දෙම් යි කිසිවක්හු කීකල එසේ කරවයි අනුදන්නේ නොවෙයි හුදෙක් ජලදානය නොවලකන්නේය ඒ අනුග්‍රහබුඩීන් කරණලද ජලදානයට නිමිත්තවේනුයි අනිරාකර්තෘවූ සම්ප්‍රදාන නම්-අනුමඤ්ඤති දානං අනුජානාතීති අනුමන්තු-අනුමඤ්ඤති යි සේයි-දානං, දානය; අනුජානාතීති, අනුදන්නුයි; අනුමන්තු, අනුමන්තෘනම්-අනු පූර්වවූ මන යන් නාහුකෙරෙන් කර්තෘයෙහි තු වූතැනි—භික්ඛුනො ජලං දෙති යන්නෙහි භික්ෂුතෙමේ මට දිය දෙවයි යාච්ඤානොකරන්නේ තට පැන් දෙමියි කීකල්හි එසේ කරවයි අනුදන්නේම කර්තෘහුගේ ජලදානක්‍රියාවට නිමිත්ත වේනුයි අනුමන්තුනම්—ආරාධයතීති ආරාධකං-මෙහෙයානුයී ආරාධකන

මි-ආ පුච්ඡා රාධ සංසිඩිමෙහි යන් නැහුනෙරෙන් භාජනයෙහි නො වූ තැ නි-
අඤ්ඤො ජලං දෙති යන්නෙහි අන්වීතෙම මට පැන් දෙවයි කාඞ්ඤු
මෙහෙයන්නේම ජලදානයට නිමිත්තවේහුයි ආරාධකසම්ප්‍රදානන
ම සම්පදානං එව සම්පදානියං—සම්ප්‍රදානයතෙමේම සම්පදානිය නා
ම්—"ජනාදිනම්මියාච" යන්නෙහි ආදිග්‍රහණයෙන් ඉස යි)—

සිලා—පෙ—සිලාඝහනුට්ඨා-පෙ—මඤ්ඤනානාදරප්පාණීනි ය, ග
ත්‍යත්ථකම්මනි ය, සංසට්ඨසම්මුතිතිසියාසතනම්සහෝසු ය, ච ය, යනු
පදයි-සිලාඝාදිසු සිලාඝ කත්ථනෙ යනාදින්ගේ ප්‍රයොගයක් ඇතිකා
ල්හි; යං, යම්විසතුයෙක්ඇද්ද; තං, හේතෙම; සම්පදානං නාම, ස
ම්ප්‍රදානනම්—සිලාඝ, සිලාඝයනු; කත්ථනෙ, කීමෙහි වැටේ—බුද්ධස්ස,
සර්වඥයාට; සිලාඝතෙ, සතුතිකෙරේ—සිලාඝනං, සිලාඝනනම්; ථො
මනං, සතුතියයි-හනු යනු; අපනයනෙ, වැලහීමෙහි වැටේ-තුය්හං,
තට; හනුතෙ, වලහා—ඨා යන්නෙන් ඨාගතිනිවුත්තිමෙහි යි සේයි—
සක්‍යපුත්තානං, ශාක්‍යපුත්‍රයන්ට; උපතිට්ඨෙය්‍ය, උපස්ථානකෝරේ-
(උපපුච්යි)—උපට්ඨානං, උපස්ථානනම්; උපගමනං, එළඹසිටීමයි—
සප, යනු; අකෙසාසෙ, ආක්‍රොශයෙහි වැටේ—තුය්හං, තට; සප
තෙ, දිවුරේ—සපනනති, සපනනම්; තොසනත්ථං, සතුටුපිණිස; ස
ච්චකරණං, සබවස්කිරීමයි—ධර යනු; ධාරණෙ, දැරීමෙහි වැටේ—
තෙ, තට; සුවණ්ණං, රත්රන්; * ධායතෙ, දරා-ඉඩ, මෙහි; ධාරණං,
ධාරණනම්; ඉණදෙය්‍යතා, නයදියයුතුබවයි—පිහ යනු; ඉච්ඡායං,
ඉච්ඡායෙහි වැටේ—දලිද්දා, දිලිඳුහු; සමිද්ධානං, සුවපතුන්ට; පිහය
න්ති, කැමතිවෙත්—කුධාදුහාර්ථානං යොගෙ, ක්‍රොධාර්ථධාතුආදීන්
ගේ යොගයෙහි; (සම්ප්‍රදානසංඥා වේ—මෙහි කුධයයි ක්‍රොධයම ගැ
ණේ—කාරණයෙහි කාර්‍ය්‍යොපචාරහෙයින් වෛයාකරණයෝ වාච
කයා කාරණය වාච්‍යයා කාර්‍ය්‍යයයි කියත්)-කුධ යනු; කොපෙ, කො
පයෙහි වැටේ—තස්ස, ඕහට; කුජ්ඣති, කිපේ-දුහ යනු; ජිඝාංසායං
නැසීමෙහි වැටේ-දුහ යනු; පපූරණෙවා, පිරීමෙහිහෝ වැටේ-මෙ
ඝො, මේඝයතෙමේ; අසානං, අගුන්; දුහයති, නසා; නොහොත් වැ
සපුරා-(දුහයන්නෙන් දෙධාතුවම ගන්න)—ඉස්ස යනු; ඉස්සායං, ඊ
ර්ෂ්‍යයෙහි වැටේ-තිත්ථියා, තීර්ථකයෝ; සමණානං, ශ්‍රමණයන්ට; ඉස්ස
යන්ති, නොසෙහෙත්, (ක්‍ෂමානොකරෙතියි සේයි)—ඉස්සා, ඊර්ෂ්‍යාන
ම්; අක්ඛමා, ක්‍ෂමානොකිරීමයි-උසූය යනු; දොසාවිකරණෙ, වෛෂප
හළකිරීමෙහි වැටේ—දුජ්ජනා, දුර්ජනයෝ; ගුණවන්තානං,. ගුණව
තුන්ට; උසූයන්ති, වෛෂකෙරෙත්—රාධ හිංසා සංරාධෙසු ඉක්ඛදස්ස
නාධෙසාසච්ති, රාධහිංසා සංරාධෙසුය ඉක්ඛදස්සනාධෙසුය යනා; එ

* (සවණ්ණමූල්‍යයයි හඟිම්)—

සං, මොවුන්දෙදෙනාගේ; යොගෙ සති, යොගයක් ඇතිකල්හි; ය
ස්ස, යමක්හුගේ; විප්පුච්ඡනං, විවිධවූප්‍රශ්නයද; සො, හෙතෙම; සම්ප
දානං, සම්ප්‍රදානනම්--(පුල්ලිඞ්ගවූ සො යන්නහුහා නපුංසකලිඞ්ගවූ ස
ම්පදානං යන්නහුහා සම්බන්ධය අනවද්‍යවිධෙයභාවයහෙයින්)--*

විප්පුච්ඡනන්ති, විප්පුච්ඡනනම්; විවිධො, නානාප්‍රකාරවූ; පඤ්හා, නී
මය; (පඤ්හනම් ප්‍රශ්නයි)--තං, හේ විප්පුච්ඡනයතෙම; කස්ස පටිබ
ද්ධං, කවරෙක් පිළිබඳදයත්; යස්ස සම්බන්ධි, යමක්හු පිළිබඳවූ; සුභා
සුභං, සුභාසුභදෙක; පුච්ඡන්තස්ස, පුළුවුත්නහු පිළිබඳය--යමක්හු
පිළිබඳවූ (සුභ අසුභ පුළුවුත්නහු පිළිබඳවෙයි විවිධප්‍රශ්නයයි යේ
සි)--මෙ, මාගේ; ආරාධො, ආරාධනාව; රඤ්ඤො, රජහටයි--රාජ
නං වා, රාජනං කියාහෝවෙයි--(රජ්ජනං කිවද රජහට යන අභි
මැයි--මේනසනම් විනියානනබවමැයි)-පුට්ඨො, පුළුවුත්නාලද්දේ;
ආරාධං, ආරාධනාවක්; බ්‍යාපයන්ති, හඟවති යන; අඤ්ඤො, අඤ්ඤයි--
(තොපගේ ආරාධනාව කවරක්හටදැයි රජවිසින් නානාප්‍රකාරයෙන්
පුළුවුත්නාලද්දේ මාගේ ආරාධනාව රජහටයයි සෙයි)--ආයස්ම
තො, ඇවැත්හට; උපතිස්සො, උපතිස්සනම් ස්ථවිරතෙම; උපසම්ප
දාපෙක්ඛො, උපසම්පත්තිකැමැත්ත--ආයස්මන්තංවා, ආයස්මන්තං
කියාහෝ වෙයි--පුට්ඨො, පුළුවුත්නාලද්දේ; උපසම්පදං, උපසම්ප
න්නිය; අපෙක්ඛිතිත්‍යත්ථො, කැමැත්තේයයි යන අභිමයි--එතෙසු,
මේඋදාහරණයන් අතුරෙහි; පක්ඛෙ, එක්පක්ෂයෙක්හි; එසෙව, මේ
සිලාකාදී සූත්‍රයෙහිම; චකාරෙන, චග්‍රහණයෙන්; දුතියා, විතියා
ච්ච--පති ආ පුබ්බස්ස, පති ශබ්දයාහා ආ ශබ්දය පූර්වකොටඇති;
සුණොතිස්ස, සු සවණෙ යන ධාතුහුගේද; අනු පති පුබ්බස්ස, අනුය
පතිය යන මොවුන් පූර්වකොට ඇති; ගි සද්දෙ ඉච්චස්සච, ගි සද්දෙ
යන මොහුගේද; යොගෙ, සම්බන්ධයක් ඇතිකල්හි; පුබ්බස්ස, පූර්ව
වූ; ක්‍රියාය, ක්‍රියාවගේ; යො, යමෙක්; කත්තා, කර්තෘද; සො, හෙතෙ
ම; සම්පදානං, සම්ප්‍රදාන නම්--(යමෙක් පූර්වවූ ක්‍රියාව කෙරේද හෙ
තෙම පසුව මෙකී ධාතූන්ගේ යොගයක් ඇතිකල්හි සම්ප්‍රදානනමැ

---

* ප්‍රසිද්ධංසමනුද්දිශ්‍ය චාප්‍රසිද්ධිවිධියතෙ--ඵනුබැවින් ප්‍රසිද්ධදෙයක් ති
යා අප්‍රසිද්ධදෙයක් සෑදීම අනවද්‍යවිධෙයභාවනම්-යම්සේ දෙවදත්ත
යා නොහඳුනන්නාහට යමෙක් කලද හෙතෙම දෙවදත්තයයි ප්‍රසි
ද්ධවූ කලුපැහැය කියා අප්‍රසිද්ධවූ දෙවදත්තයා හඟවනු ලැබේ--
එසේම මෙහිදු රාධිකඛදෙදෙනාගේ යොගයක් ඇතිකල්හි සම්ප
දානනම් මේ යයි හැහෙනහෙයින් යමක් විවිධවූ ප්‍රශ්නකෙරේද හෙ
තෙම සම්ප්‍රදාන නමැයි හඟවනු ලැබේ--

යී සේයි)-භගවා, භගවත්තෙම; භික්ඛූ, භික්ෂූන්ට; එතං, මේ; අවො
ච, කිය—භික්ඛූ, භික්ෂූහු; භගවතො, භගවත්හට; පච්චස්සොසුං, පිළි
වදන් දුන්හ; ආසුණන්ති වා, ආසුණන්ති කියාහෝ වේ—(අර්ථහේමැ
යි-භගවා භික්ඛූ එතදවොච-භික්ඛූ භගවතො ආසුණන්ති යිද යො
දනු)—පති පුබ්බොච, පති පූර්වවූද; ආ පුබ්බොච, ආ පූර්වවූද; සුණෙති,
සු සවණෙ යනු; පටිඤ්ඤ අනුඤ්ඤසු, පටිඥ අනුඥදෙක්හි; ව
ත්තතෙ, වැටේ-(ධාතූන් අනෙකාර්ථහෙයින් මේ අර්ථයද සු සවණෙ
යනුම කියයි-පති ආ දෙදෙන ඒ ඒ අර්ථද්‍යොතකයෝයි)-එත්‍ථ, මෙහි;
පුබ්බක්‍රියාති, පූර්වක්‍රියානම්; වචනක්‍රියා, වචනක්‍රියාය; තස්ස, ඒ වචන
ක්‍රියාවගේ; කත්තා, කර්තෘනම්; භගවා, භගවතියි-(අවොච යන්නෙහි
වචනක්‍රියාවට කර්තෘවූ භගවත්තෙමේ පසුව පති ආ පූර්වවූ සු සවණෙ
යන ධාතුහුගේ යොගයක් ඇතිකල්හි භගවතො යි සම්ප්‍රදානවී—
මෙසේම මත්තෙහිදු යෙදෙනපරිද්දෙන් දතයුතුයි)—භික්ඛු, භික්ෂු
තෙම්; ජනං, සත්‍වයාට; ධම්මං, දහම්; සාවෙති, අස්වයි; ජනො, ජන්
තෙම; භික්ඛුනො, භික්ෂුහට; අනුගිණාති, අනුදනී; පතිගිණාතිවා, ප
තිගිණාති හෝ වේ—(අර්ථහේමැයි—භික්ඛු ජනං ධම්මං සාවෙති ත
ස්ස භික්ඛුනො ජනො පතිගිණාති යී වේ)—අනු පති පුබ්බො, අනු ප
ති පූර්වවූ; ගිණාති, ගි සද්දෙ යන ධාතුතෙමේ; අනුඤ්ඤණෙ, අනුදන්
මෙහි වැටේ-ආරොචනත්‍ථෙ, ආරොචනාර්ථයෙහිවූ ධාතුහුගේ යොග
යෙහි; (සම්ප්‍රදාන වේ)-වො, තොපට; ආමන්තයාමි, කියමි-තදත්‍ථෙ,
දතර්ථයක් කිවමනාකල්හි—යුඬාය, සටනට; සන්නාඬො, සැරහිනි—
තං, ඒ යුඬාදීතෙමේ; අත්‍ථො යයි සේය; පයොජනං, ප්‍රයොජනවූයේ;
යස්ස, යමක්හටද; තං, හේතෙම; තදත්‍ථං, තදර්ථනම—එත්‍ථ, මෙහි;
සන්නාහකරණස්ස, සැරහීමට; පයොජන භූතං, ප්‍රයොජනවූයේ; යුඬං, යු
ඬයයි-තුමත්‍ථෙ, තුමර්ථයක් හැගෙනකල්හි-ලොකානුකම්පාය, ලො
වට අනුකම්පාපිණිස—තුං පච්චයෙන, තුං ප්‍රත්‍යයාහා; සමානත්‍ථො,
සමානවූ අර්ථඇත්තේ; තුමත්‍ථො, තුමර්ථනම්; තස්මා, එහෙයින්;
ලොකං, ලොවට; අනුකම්පිතුං ඉති, අනුකම්පාකරන්නටය යන;
අත්‍ථො, අර්ථයි—අලමත්‍ථෙ, අලං අර්ථයාගේ ප්‍රයොගයක් ඇතිකල්
හි—මල්ලො, මල්ලවතෙම; මල්ලස්ස, මල්ලවයාහට; අලං සුදුසු
යී; අරහතිවා, (මල්ලො මල්ලස්ස) අරහති කියාහෝ වේ—(අර්ථ
හේමැයි)—මෙ, මට; සුවණ්ණෙන, සවර්ණයෙන්; අලං, පමණි—
(නොකැමැත්තේයයි සේයි)—ඉහ, මෙහි; අලං සද්දො, අලං ශබ්දය
තෙමේ; අරහපටික්ඛෙපෙසු, සුදුසුය නොකැමැත්තේයයි යන අර්ථ
යෙහි වැටේ—මඤ්ඤතියොගෙ, මන ඤාණෙ යන ධාතුහුගේ යොග
යෙහි; අනාදරෙ, අනාදරයක්; ගම්‍යමානෙ, හැගෙනකල්හි; යො,

යමෙක්; අප්පාණී, ප්‍රාණී නොවේද; තං, හෙතෙම; සම්පදානං, සම්ප්‍රදාන නම්—ත්වං, තා; කට්ඨස්ස මඤ්ඤෙ, කාෂ්ඨයක් කොට සිතම්—අනාදරෙති කිං, අනාදරෙ යනු කුමටය; ත්වං, තා; සුවණ්ණං මඤ්ඤෙ, රත්රන් කොට සිතම්—(මෙහි අනාදරයක් නැතිහෙයින් සුවණ්ණං යනු මන යන්නහුගා සම්බන්ධකරණු ලබනහෙයින් කම්මම වේ)—අප්පාණීති කිං, අප්පාණී යනු කුමටය; තං, තා; ගද්‍රභං මඤ්ඤෙ, ඔටුවෙකු කොට සිතම්-ගත්‍යර්ථධාතූනං, ගත්‍යර්ථධාතූන්ගේ; යං කම්මං, යම් කර්මයක් ඇද්ද; තං, හේතෙම; සම්පදානං, සම්ප්‍රදාන නම්; දුතියාච, විතීයාවිභක්තිද වේ—ගාමස්ස, ගමට; ගතො, ගියේයි; ගාමං වා, ගාමං ගතො සී හෝ වේ—සංසට්ඨෙ, ආශිංශනාර්ථයෙහි—භවතො, පින්වත්හට; භද්දං හොතු, වැඩෙක් වේවා-(හොතු යන්නෙහි ආශිංශනාර්ථයෙහි පචමිහෙයින් ආශිංශනාර්ථය හැගේ)-සංසට්ඨං, සංසට්ඨ නම්; ආසිංසනං, ප්‍රාර්ථනාවයි-(සංස පසංසනෙ, යන්නහුගේ ධාතුවනාන අකාරයහට කව්ග්‍රහණයෙන් ලොප් නොකොට ඔහුකොරෙහ් භාවයෙහි කළ නප්‍රත්‍යයාට සාසදිසතො යනාදී චග්‍රහණයෙන් රට්ඨ යන ආදෙශ වේ)—සම්මුත්‍යර්ථෙ, සම්මුති අර්ථයක් හැගෙනකල්හි—මෙ, මට; සම්මුති, සම්මුතිය; සාධු, මැනවි—භිය්‍යොයොගෙ, භිය්‍ය ශබ්දයාගේ යේදීමෙහි—භිය්‍යො සොමත්තාය, බොහෝසේ;(භිය්‍යොසොමත්තාය යන විභක්ත්‍යන්තප්‍රතිරූපකවූ නිපාතපදය කුදු ඇතු මෙතන වූකලී භිය්‍යොශබ්දයාගේ යොගයෙහි සම්ප්‍රදාන වෙයි කීබැවින් සොමත්ත ශබ්දක් ඇතිබව පැනේ)*-සත්තම්‍යර්ථෙ,

---

* (සොමත්ත ශබ්දයක් ඇතිබැව් මෙහි කියනලද්දේවිනමුත් එබඳු ශබ්දයකුගේ ප්‍රයොග අප්‍රසිද්ධයි—භිය්‍යො සොමත්තාය යනතන්හි—සො, හෙතෙම; මත්තාය, ප්‍රමාණයෙන්; භිය්‍යො, අධිකයි; කියා ඇතම් ආචාර්යවරයෝ භිය්‍යො යන ශබ්දයම වෙන්කෙරෙත්; ඇතම් ආචාර්යවරයෝ—භිය්‍යොසො යනු භිය්‍යො යන්න සේම නිපාත ශබ්දයෙකැයි කියති—එයින් භිය්‍යොසො ශබ්දයයි කීම යුක්තතරයයි ගනිමු-භිය්‍යොසො මත්තාය යනු විභක්ත්‍යන්තපදප්‍රතිරූපක එකම නිපාතපදයක යනු භිය්‍යොයොගෙ යන්නට උදාහරණ කළකල්හි යහපත්සේ නොයෙදේ-මෙය පච්කාප්‍රදීපයෙහි රාහුල සාමින් විසින් මෙසේ විස්තරකරණලදී-"භිය්‍යො සො මත්තා යයි විභක්ත්‍යන්ත පද ප්‍රතිරූපක නිපාත පදයෙකැයි යනු ආචාර්යයන්ගේ අභිප්‍රාය වුවද මත්තාය යනු මත්තාසුඛපරිච්චාගා යනාදියෙහි මෙන් ස්ත්‍රීලිඟුයෙහි වැටෙන්නාවූ මත්තා ශබ්දයාකෙරෙන් පචමි විභක්ති වූතැනි—භිය්‍යො සොති ඉදං භිය්‍යො සද්දෙන අතිරෙකත්ථවාචකෙන නිපා

සප්තම්‍යර්ථයෙහි—තුය්හං, තා කෙරෙහි; ආවිකරොමි, පහළකෙරෙමි—අනුග්‍රහණෙන, අනුග්‍රහණයෙන්; තෙ, තට; උපමං කරිස්සාමි, උපමා කෙරෙමි යනු; ඉච්චාදී, මේ ආදි වේ—

"නමොයොගාදිස්වපිච" යි, නමොයොගාදීයෙහිද; චතුත්ථී, චතුර්ථී වේ—තෙ, තට; නමො, නමස්කාරයි—පජානං, සත්වයන්ට; සොත්ථි, වැඩයි—තෙ, තට; ස්වාගතං, ආරොග්‍යද—විප්පටිසාරාය, පශ්චාත්තාපයට; කිං, කිමෙක්ද—

——0000——

යස්මා—පෙ—යස්මා ය, අපෙති ය, භයං ය, ආදත්තෙ ය, වා ය, තං ය, අපාදානං ය, යනු පදයි—

යස්මා, යමක්හු කෙරෙන්; අපෙති, පහවේද; භයං වා, භයහෝවේද; ගණ්හාතිවා, යමක්හු කෙරෙන් ගණීනම්හෝ; තං, එතෙම; කත්තුස්ස, කර්තෘහුගේ; අපගමාදි, අපගමනාදික්‍රියාවන්ට; සීමාභූතත්වාත්, හිම් විනුයි; අපාදානං නාම, අපාදාන නම්—†

"අපාදානෙ පඤ්චමී" යි පඤ්චමී වේ—

ගාමා, ගමින්; අපෙන්ති, පහවෙත්—චොරා, සොරුකෙරෙන්; භායන්ති, බියපත්වෙත්; උපජ්ඣායා, උපාධ්‍යායයාකෙරෙන්; සික්ඛං, සික්ෂාව; ගණ්හාති, ගණී—නියමපුබ්බකෙ, නියමපෙරදූරිකොටඇති; විජ්ජාගහණෙ සාධෙ, විද්‍යාග්‍රහණ සාධ්‍යකල්හි; ආඛ්‍යාතෙනෙ

---

තෙන සමානත්ථං නිපාතපදං යි පුරාතනයන් කීහෙයින් භිය්‍යොසො යනුද අතිරෙකාර්ථවාචකවූ භිය්‍යො ශබ්දයාහා සමාන නිපාතපදයෙකැයි යනු යුක්තයි—මාත්‍රයෙන් අධිකයයි අර්ථකියයුතු—පුරාතනාචාර්‍ය්‍යවරයෝද භිය්‍යොසො මත්තායාති අතිරෙකප්පමාණෙන යි කීහු—රූපසිද්ධිසන්න ගැටපදකාරයෝ, මත්තාය; පමණට සො, ඒතෙම; භිය්‍යො, බොහෝවියයි අර්ථකීහ; එසේකීකල්හි මෙහි ඒත් භිය්‍යොසොමත්තාය යනාදීන් දක්වනලද පුනරුක්තදෝෂය පැමිනෙයි දතයුතු"—භීයො කියාද භිය්‍යො කියාද බුද්ධවචනයෙහි ද්විප්‍රකාරයෙන්ම පාඨයි—එයින් භිය්‍යො යනු බහුලව පෙනේ)—

† (බාලවතාර පාඨයෙහි—"යතො අපසරති භායති ගණ්හාති වා" යනාදීන් පෙනේ. මෙහි—යස්මාදපෙති භයං වා ගණ්හාති වා යනාදි පාඨයක් සන්නකරණලදී—බාලාවතාරපාඨනියායෙන්—යතො, යමක්හු කෙරෙන්; අපසරති වා, පහවෙයිහෝ; භායති වා, බිය වෙයිහෝ; ගණ්හාති වා, යමක් ගණියිහෝ—යනාදීන් අර්ථ කියයුතු)—

ච, ආදනාඤ්ඤයෙන්ම; සිජ්ඣති, සිඬ වේ—යථා, මෙසේයි— උපජ්ඣා යම්හා, උපාධ්‍යායයාකෙරෙන්; අධීයතෙ, හදරා—*

අපගමෙ, පහවීම; සමෙපි, සමකල්හිදු; විනාභං, වස්තූන්දෙදෙනෙක්හුගේ අතුරෙහි; යං, යම් වස්තුයෙක්තෙම; පුබ්බරූපා, පූර්වරූපයෙන්; අච්චුතං, නොපිරිහිනිද; තං, ඒ වස්තුවතෙවේ; අපාදානං වුච්චතෙ, අපාදානයයි කියනු ලැබෙයි; තං, හේ අපාදානයතෙවේ; චලාචලතො, ජංගමය ස්ථාවරයයි; විධා, විවිධ වේ—යථා, මෙසේයි; ධාවතා, දිවන්නාවූ; අස්සා, අශ්වයාකෙරෙන්; පොසො, පුරුෂතෙමේ; පතෙ, හෙයි; රුක්ඛා, වෘක්ෂයාකෙරෙන්; ඵලං, ඵලයතෙවේ; පතෙ ඉතිච, හෙයි කියාද වේ—(මෙහි අභිප්‍රාය අපගමනය වියොගය හේ දෙදෙනෙකු පිළිබඳවත්මුත් එකෙකු පිළිබඳවන්නේ නොවෙයි එසේකල්හි ගාමා අපෙන්ති මුනයො යනාදියෙහි ගමින් පහවීම මුනින්කෙරෙහිද මුනින්කෙරෙන් පහවීම ගමද ඇතිබැවින් ග්‍රාමය මුනිය යන දෙදෙනාහටම අපාදානසංඥවේදැයත් කී පරිද්දෙන් අපගමනය දෙදෙනාහට සමවුවද යමෙක් පූර්වාවස්ථාවෙන් අන්‍යථාභවයකට නොගොස් ස්වරූපයෙන් සිටියේද හෙද අපාදාන නම් වෙයි සේයි—එහෙයින් ඔවුනොවුන්කෙරෙන් අපගමය ග්‍රාමය මුනිය යන දෙදෙනාහටම ඇතද පෙර යම් ස්වරූපයෙක් වේද ඒ ස්වරූපයෙන්ම යුක්තව හැඟෙන ග්‍රාමය අපාදාන නම්වෙයි-පෙරඇතිව පෙනෙන ස්ථිතික්‍රියාවෙන් යුක්තාවස්ථාව හැර පසුව ගමනක්‍රියාවෙන් යුක්තාවස්ථාවට පැමිනිබැවින් පූර්වස්වරූපයෙන් පිරිහුනුවානම්වූ මුනි යනු අපාදානසංඥ නොලබත්—†

ධාතු—පෙ—ධාතුනාමානං ච, උපසග්ගයොගාදිසු ච, අපි ච, ච ශ, යනු පදයි—ධාත්වාදිවිසෙසානං, ධාතුවිශෙෂය නාමවිශෙෂ උපසර්ග

---

* නියමපූර්වවූ විද්‍යාග්‍රහණයක් හැඟෙනකල්හි අපාදානසංඥපිණිස පරයන්ගේ මෙන් මෙහි සූත්‍රාන්තරවිශෙෂයක් නැතද "සාමාන්‍ය විහිතාවිධයඃ ප්‍රයොගමනුසාරයන්ති" යනු බැවින් මෙහි සාමාන්‍යයෙන් කළ අපාදානග්‍රහණයෙන්ම ප්‍රයොගානුසාරයෙන් හේද සිඬයි සේයි—නියමපූර්වවූ විද්‍යාග්‍රහණනම් මෙතෙක්කල් මෙසේ ශාස්ත්‍රාභ්‍යාසකෙරෙමියි නියමකොට විද්‍යාඉගැණීමයි—

† පාණිනියයෙහිද "ධ්‍රැවමපායෙ පාදානං" යයි සූත්‍රෙක් කී මනු—එහි අර්ථද අපාදානයෙහි විශෙෂයක් ඇතිකල්හි ධ්‍රැවනම් ස්ථිරවූයේ අපාදානසංඥවෙයි යනුයි--මෙසේම අස්සා පොසො පතෙ යනාදියෙහිද දතයුතුයි—අස්සා යනු චලාපාදානය රුක්ඛා යනු නිශ්චලාපාදානයි—

විශෙෂය යන මොවුන්හා; යොගෙ, සම්බන්ධයක් ඇතිකල්හි; යං, යම්වස්තුයෙක් ඇද්ද; තං, ඒ වස්තුව; අපාදානං නාම, අපාදානං නාම්—පරා පුබ්බ, පරා යන ශබ්දයා පූර්වකොට ඇති; ජියොගෙ, ජි ජයෙ යන ධාතුහුගේ සම්බන්ධයක් ඇතිකල්හි; යො, යමෙක්; අනභිභවනියො, මැඩපිය නොහැකිද; තං, හෙතෙම; අපාදානං නාම, අපාදාන නම්—අඤ්ඤතිත්ථියා, සෙසුතීර්ථකයෝ; බුඩස්මා, බුදුන්; පරාජෙන්ති, මඩනට නොපොහොසත්හුයි—බුඩං, සර්වඥයා; අභිභවිතුං, මඩනට; අසමත්ථාත්‍යත්ථො, නොපොහොසත්හ යන අර්ථයි—(පරාපූර්වවූ ජි ජයෙ යන ධාතුහු සකර්මකහෙයින් ඔවුන්ගේ යොගයෙහි ප්‍රාප්තවූ කර්මසංඥ වලකා අනභිභවනියහට අපාදානසංඥම වෙයි සේයි)—අනභිභවනියොති කිං, අනභිභවනියො යනු කුමටද; විරො, විරතෙමේ; රිපුං, සතුරා; පරාජයති, මඩී—(මෙහි විරයාවිසින් රිපුහු අභිභවනීය වනහෙයින් පරාජි යොගයෙහි රිපුහට කර්මසංඥ වේ)—පපුබ්බ, ප පූර්වවූ; භූ, භූසත්තායං යන්නාහුගේ; යොගෙ, යො ගයෙහි; යතො, යමක්හුකෙරෙන්; අච්ඡිනාපභවො, ආද්‍යුත්පත්තියද; තං, හෙතෙම; අපාදානං නාම, අපාදාන නම්—අනවතත්තම්හා, අනවතත්තනම් විලින්; මහාසරා, මහානදීහු; පභවන්ති, උපදිත්—පඨමං, පළමුකොට; තතො එව, ඒ අනවතත්තයෙන්ම; උපලබ්භන්තීත්‍යත්ථො, උපදිති යන අර්ථයි-පෙමතො, ප්‍රෙමයෙන්; භයං, භය; ජායතෙ, උපදී-ජිගුච්ඡාපමාදත්ථානං, නින්දාර්ථවූද ප්‍රමාදාර්ථවූද ධාතූන්ගේ; යොගෙ, යොගයෙහි (අපාදාන වේ)—අධම්මා ජිගුච්ඡති, අධර්මයට නින්දාකෙරෙයි; පමජ්ජතිවා, (අධම්මා) පමජ්ජතිහෝ වෙයි—(අධර්මයට මැලි වේ—ජිගුච්ඡ යනු සකර්මකහෙයින් කර්මසංඥ ප්‍රාප්තතන්හි අපාදානසංඥ වේ—මේ හැම ධාතුයොගයහට උදාහරණයි)—

නාමයොගෙ, නාමයන්ගේ යොගයෙහි; (අපාදානසංඥ වේ)—තතොප්පභුති, එතැන්පටන් කොට-යතො, යම් කලෙකපටන්කොට; සරාමි, සිහිකෙරෙම්ද—යතොප්පභුතීත්‍යත්ථො, යම් කාලෙකපටන් කොටය යන අර්ථයි—එහි, මේ යතොසරාමි යනතන්හි; පභුති සද්දො, පභුති යන නාමයතෙමේ; නප්පයුත්තො, නොකියනලදී(කවරහෙයිනයත්) ගම්‍යමානත්ථස්ස, හැඟෙන්නාවූ අර්ථඇති; සද්දස්ස, ශබ්දයාගේ; පයොගං පති, ප්‍රයොගයෙහිම; කාමාචාරාති, කැමතිපරිද්දෙන් පැවැත්මය යන; ඤායා, යුක්තිහෙයිනි-(කාමෙනිච්ඡායාචාරො පවත්ති කාමාචාරො—යතොප්පභුති යන තන්හි පභුති යන නාමය ප්‍රයුක්තකල්හි අපාදානසංඥ වනපරිද්දෙන්ම යතොසරාමි යන තන්හිදු පභුති ශබ්දය අප්‍රයුක්තවුවද ඒ පභුති ශබ්දයාගේ අර්ථය

හැඟෙනහෙයින් පභුති ශබ්දයාගේ යෝගයක් ඇත්තුයි අපාදානසං
ඥවෙයි සේයි)-අඤ්ඤත්‍රානං, අනිකෙක යන අර්‍ථඇතිනාමයන්ගේ;
යොගෙ, යොගයෙහි-දුක්ඛා, දුකින්; අඤ්ඤං, අනිකෙක්, න, නැති-
දෙවදත්තා, දෙවුදත්තයාකෙරෙන්;(පැවැත්ම) හිතෙනාවෙති, අනි
කෙකැයි සේයි—(ආදිශබ්දයෙන් ඉතරො දෙවදත්තා අපරො දෙවද
ත්තා යනාදී වේ)—උපසග්ගයොගෙ, උපසර්‍ගයන්ගේ යොගයෙ
හි—වාණිජ්‍ජා, වෙළඳහු; අපසාලාය, සාලාව හැර; ආයනති, එත්—
සාලං වජ්ජෙත්වාත්‍යත්‍ථෝ, සාලාව හැරය යන අර්‍ථයි-(මෙහි අප යන
උපසර්‍ගයතෙමේ වර්ජනාද්‍යර්ථයෙහි වැටේ)-ආබ්‍රහ්මලොකා, බ්‍රහ්ම
ලොකයදක්වා; සද්දො, ශබ්දයතෙමේ; අබ්භුග්ගච්ඡති, නැගේ—
(මෙහි ආ යන උපසර්‍ගය අභිවිධියෙහි වැටේ මර්‍යාදාවෙහි වැටෙ
නකල ආපබ්බතා ඛෙත්තං යනාදියි)—මුඛ්‍යසදිසෙ, මුඛ්‍යයහා සදෘශ
ය යන අර්ථයෙහිද; පතිදානෙච, ප්‍රතිදානයෙහිද; වත්තමානස්ස, වැ
ඩෙන්නාවූ; පතිස්ස, පති යන; උපසර්‍ගයාගේ, යොගෙ, යොගයෙ
හි—සාරිපුත්තො, සැරියුත්තෙමේ; බුද්ධස්මාපති, බුදුන්හා සමය—බු
ද්ධසදිසොත්‍යත්‍ථෝ, බුදුන්හා සදෘශය යන අර්‍ථයි—(මෙහි ප්‍රඥාදි ගුණ
යෙන් බුදුනු මුඛ්‍යයෝයි)--අස්ස, මොහට; තෙලස්මා පති, තෙලට
වඩා; ඝතං දදාති, ගිතෙල් දේ-විනිමයෙ, ගණුදෙනුපිණිස; උපාත්ත
ස්ස, ගත්තාලද්දහුගේ; පතිනියාතනං, පසුවදීම; පතිදානං, ප්‍රතිදා
න නම්—කත්‍ර, එහි; තෙලං, තලතෙල්තෙමේ; ඝතත්‍ථං, ගිතෙල්පි
ණිස; පඨමං, පළමුකොට; දින්නං, දෙනලද; තෙලස්සත්‍ථාය, තෙල්
පිණිස; ඝතං, ගිතෙල්; පුනදියතෙ, නැවතදෙනලැබේ; තෙලං ග
ණ්හා, තෙල් ගෙණ; ඝතං දදාතීත්‍යත්‍ථෝ, ගිතෙල් දෙයි යන අර්‍ථ
යි—ආදිග්ගහණෙන, ආදිග්‍රහණයෙන්; කාරකමජ්ඣෙපි, කාරකම
ධ්‍යයෙහිදු; (අපාදානසංඥ වේ)—ලුද්දකො, වැදිතෙම; ඉතො, මෙ
දවස් පටන්කොට; පක්ඛස්මා, දෙපෝයකින්; මිගං, මුවා; විජ්ඣති,
විදියි—ලුද්දකො, වැදිතෙම; ඉතො, මෙතනින්; කොසා, හඬසන
කින්; කුඤ්ජරං, ඇතු; විජ්ඣති, විදියි—එත්‍ථ, මෙහි; ඉතොති, ඉතොය
න; අපාදානස්ස, අපාදානකාරකයාගේද; මිගනති, මිගං යන; කම්ම
ස්සච, කර්‍මකාරකයාගේද; මජ්ඣභූතො,මැදවූයේ;පක්ඛො, පක්ෂය;
තස්ස, ඒ පක්ෂයාට; අපාදානසඤ්ඤා, අපාදානසංඥ වේ—අථවා, නො
හොත්; කරණං, කිරීම; කාරො, කාරනම්; (කර යන්නහුකෙරෙන්
භාවයෙහි ණ වූතැනියි) කාරො එව, කිරීමම; කාරකො, කාරකන
ම්; (හෙතෙම කිමයත්) ක්‍රියා, ක්‍රියාවයි-යදාදිනා, යදනුපපන්නාදින්;
සකත්‍ථෙ, ස්වාර්‍ථයක් කිවමනාකල්හි; කපච්චයො, ක යන ප්‍රත්‍යය
වේ—(අනික් අර්‍ථයක් අපෙක්‍ෂාකොට ක්‍රියාමාත්‍රවාචිවූ කාරකශබ්ද
යාකෙරෙන් කප්‍රත්‍යය කළකල්හි කාරකශබ්දයාමෙන් ක්‍රියාමාත්‍රවා

වියයි සේයි, ක්‍රියාවාච්චත්මුත් ක්‍රියානිමිත්තයා කරන්නේයි සේයි)—තතො, එහෙයින්; (කාරකශබ්දය ක්‍රියාවාච්හෙයින්) ක්‍රියානමපි, ක්‍රියාවන් දෙදෙනෙක්හුගේද; මජ්ඣෙ, මධ්‍යයෙහෙමේ; කාරකමජ්ඣෙ නාම, කාරකමධ්‍ය නම්—යථා, මෙසේයි-අජ්ජ විජ්ඣිත්වා, අද විද; පක්ඛස්මා, දෙපෝයකින්; විජ්ඣති, විදියි-එනම්, මෙහි; විජ්ඣිත්වා විජ්ඣතීති, විජ්ඣිත්වා විජ්ඣතියි; ක්‍රියාවයං, ක්‍රියාදෙකෙක-(ඒ ක්‍රියාවන් දෙදෙනාගේ මැදවූ පක්ඛ යන්නට අපාදානසංඥවෙයි සේයි-විජ්ඣිත්වා යිද විජ්ඣති කිවද එකම විදනක්‍රියාවවුද කෙසේවූ ක්‍රියාදෙකෙක්දයත් යම්සේ එකම සඳ අනෙකජලපාත්‍රයෙහි ප්‍රතිබිම්බිතවූයේ අනෙකව පෙනේද එසේම එක අවධික්‍රියාව අතීතය වර්තමානය යන කාලයන් දෙදෙනාගේ වෙනසින් වෙනස හැගේද එහෙයින් ක්‍රියාදෙකෙකැයි කියතුලැබේ—විජ්ඣිත්වා යන්නෙන් අතීතක්‍රියා වාච්‍යය විජ්ඣති යන්නෙන් වර්තමානක්‍රියා වාච්‍යයි—අපිසද්දෙන, සූත්‍රයෙහි අපි ශබ්දයෙන්; නිපාතයොගෙපි, නිපාතවිශෙෂයන්හා යොගයක් ඇතිකල්හිදු; පචමි, පචමිය; දුතියා, විතියාය; තතියාච, තෘතියාද වේ—මාතුජ, මාතුජය; රහිතා, හැර; මාතුජං මාතුජෙන වා, රහිතා මාතුජං රහිතා මාතුජෙන යි හෝ වේ—(අණීහේමැයි)—සද්ධම්මා, සද්ධම්මය; රිතෙ, හැර; සද්ධම්මං සද්ධම්මෙනවා-සද්ධම්මං රිතෙ සද්ධම්මෙන රිතෙයි කියාහෝ වේ—විනා, විනා ශබ්දයාහා; යොගෙපි, යොගයෙහිද; එවං, මෙසේමැයි—(විනාසද්ධම්මා විනාසද්ධම්මං විනාසද්ධම්මෙනායි යොදනු)—*

අයං, මේතෙම; අරියෙහි, ආර්‍යයන්කෙරෙන්; පුථගෙව, වෙන්මැයි—චකාරෙන, චග්‍රහණයෙන්; අඤ්ඤත්‍රාපි, සෙසු තන්හිදු; ඤාතබ්බං, දතයුතුයි—

රක්ඛ—පෙ—රක්ඛණත්ථානං ය, ඉච්ඡිතං ය, යනු පදයි-රක්ඛා, රැක්ම; රක්ඛණං, රක්ඛණ නම; තං, ඒ; (රක්ෂණය) අත්ථො, වාච්‍යවූයේ; යෙසං ධාතූනං, යම් ධාතුකෙනෙක්නටද; තෙසං යොගෙ; ඔවුන්ගේ යොගයක් ඇතිකල්හි; වා, නොහොත්; රක්ඛිතබ්බා, රක්ෂාකටයුත්තී; රක්ඛණ, රක්ඛණ නම් වේ—රක්ඛණච තෙ, රක්ෂාකටයුත්තාහූත් ඔහුමය; අත්ථාචඉති, වස්තුවූවාහූත් ඔහුමය; රක්ඛණත්ථා, රක්ෂණාර්ථයෝ නම්හ, තෙසං, ඒ (රක්ෂිතව්‍යවූ)අර්ථයන්ගේ; මජ්ඣෙ වා, අතුරෙහිහෝ; යං, යම් වස්තුවෙක්; ඉච්ඡිතං, කැමතිවනලදද;

---

* (එවං විනායොගෙපි යන්නට අනතුරුව "නානාකුලා පබ්බජිතා" යන උදාහරණයක් බාලාවතාරයෙහි පෙනේ එය මේ ව්‍යාඛ්‍යාවෙහි නොපෙනේ—"නානාකුලා පබ්බජිතා" යන්නෙහි විනායොගය කුදු නොපෙනේ—එහි වනාහි විනාර්ථයක් පෙනේ)—

තං, ගේ වියතුව; අපාදනං නාම, අපාදන නම් වේ—(ආදිපක්ෂයෙහි
රක්ඛණං යනු භාවයෙහි යු වූකල වෙයි-දෙවනපක්ෂයෙහි රක්ඛණං
යනු කර්මයෙහි යු වූකල වේ)—ඛෙත්තා, කෙත්හිලා; උට්ඨතො,
උගින්; සිගාලෙ, සිවලුන්; රක්ඛන්ති, රකිත්—(මේ රක්ෂාර්ථය ධාතු
යොගයටයි)—ඛෙත්තා, කෙත; යවා, යවයෙන්; ගාවො, ගෙරින්; ප
ටිසෙධෙන්ති, වලකත්-(මේ පසුවනී පක්ෂටයි—මෙහි යවයද රක්ෂිත
ව්‍ය ක්ෂෙත්‍රයද රක්ෂාකටයුතුය එතකුදුවුවත් මේ දෙදෙනා අතුරෙ
න් මුඛ්‍යව රක්ෂාකටයුතුබැවින් ඉෂ්ටවූ යවයට අපාදන සංඥවත්මු
ත් ක්ෂෙත්‍රයට අපාදන සංඥනොවෙයි ආධාර සංඥම වේ)—එත්ථ ප
ක්ඛෙ, මේ (පසුවනී) පක්ෂයෙහි; පටිසෙධවාරෙන, ප්‍රතිෂෙධ මුඛයෙ
න්; රක්ඛණං එව, රක්ෂාවම; ගම්‍යතෙ, හැඟේ—(යවයෙන් ගෙරි ව
ලක්වයි කීකල යව රක්නේය යනු හැඟේමැයි)—රක්ඛණත්ථානන්ති,
රක්ඛණත්ථානං යනු; තිං, කුමටය; අභිධම්මං, අභිධර්මය; අධීයතෙ,
හදූරයි යන තැන්හි නොවනපිණිසයි—ඉච්ඡිතන්ති, ඉච්ඡිතං යනු;
තිං, කුමටය; අනිච්ඡිතස්ස, අනභිමතවූ; ඛෙත්තස්ස, ක්ෂෙත්‍රයට; නා
පාදානසඤ්ඤා, අපාදන සංඥනොවේ—(මේ පාණිනීයයෙහි ක්‍රමයි)-
කෙචි, සමහර වෛයාකරණකෙනෙක්; හතකො, බැළයා; යවං, ය
ව; රක්ඛතීති, රක්ෂාකෙරේනුයි කියා; පච්චුදාහරන්ති, ප්‍රත්‍යුදාහරණ
කෙරෙත්—(මෙහිහතකයා කටයුතු මෙහෙයනහෙයින් යව රක්ෂාක
රත්මුත් ඕහට යවයතෙමේ රක්ෂිතව්‍යහෙයින් මුඛ්‍යව ඉෂ්ටනොවෙයි
හුදෙක් තමා අභිමත බැළ නොලැබේදෝහෝයි යන සිතින් යව ර
කී එහෙයින් රක්ඛ යන සකර්මකධාතුහුගේ යොගයෙහි යවං යන්
නට කර්මසංඥ වේ)—

යෙන—පෙ—යෙන ය, වා ය, අදස්සනං ය, යනු පදයි—යෙන යි
සේයි; දට්ඨුනා, දක්නහුවිසින්; අදස්සනං, නොදක්ම; දට්ඨබ්බෙන,
දක්ක යුත්තහුවිසින්; ඉච්ඡිතං, කැමතිවනලදද; සො, ඒ; දට්ඨා, ද
ක්නාතෙමේ; අපාදනං නාම, අපාදන නම් වෙයි—සිස්සො, ශිෂ්‍ය
තෙමේ; උපජ්ඣායා, උපාධ්‍යායහට; අන්තරධායති, සැඟවේ—නිලී
යතීත්‍යත්ථො, සැඟවෙයි යන අර්ථයි-එත්ථ, මෙහි; දස්සනක්‍රියාය කා
තුභූතෙන, දර්ශනක්‍රියාවට කර්තෘවූ; උපජ්ඣායෙන, උපාධ්‍යායයාවිසි
න්; අත්තනො, තමාගේ; අදස්සනං, නොදක්ම; දට්ඨබ්බභූතො, දැ
ක්කයුතුවූ; සිස්සො, ශිෂ්‍යතෙමේ; අනපෙක්ඛිතුකාමො, හදුරණු නො
කැමැත්තේ; ඉච්ඡති, කැමැත්තෙයි; උපජ්ඣායෙන, උපාධ්‍යායයාවිසි
න්; කත්තබ්බං, කටයුතුවූ; අත්තනො දස්සනං, තමාගේ දැක්ම; සි
ස්සො, ශිෂ්‍යතෙම; උපජ්ඣායො, උපාධ්‍යායතෙමේ; මං, මා; නපස්සතු
ති, නොදකීවයි; ඉච්ඡතීත්‍යත්ථො, කැමැත්ත යන අර්ථයි-(පූර්වසූත්‍රයෙ

න් වැටෙන ඉච්ඡිතං යන්නහා සම්බන්ධඇති න ශබ්දයතෙම දස්ස න ශබ්දයාහා ගමකත්වහෙයින් අදස්සනං කියා සමාසකරණලද්—ගමකත්වනම් අර්ථප්‍රකාශකරණබවයි—කෙසේද යත්—දස්සනං ඉච්ඡිතං කීකල්හිදු එම අර්ථයම හැඟේ එහෙයින් හඳුරන්නට නොකමැති ශිෂ්‍යතෙමේ උපාධ්‍යායයන් තමාගේ දක්ම නොකමැත්තේයයි සේයි)—චකාරෙන, සූත්‍රයෙහි චග්‍රහණයෙන්; සත්තමීච, සප්තමීද වේ—ජේතවනෙ, ජේතවනස්ථානයට; අනන්තරහිතො, සැඟවිනී—එළු, මෙහි; ජේතවනසද්දෙන, ජේතවන ශබ්දයෙන්; ජේතවනට්ඨා, ජේතවනස්ථයෝ ගැණෙත්—(ජේතවනස්ථවූ ජනයන්ම දර්ශනක්‍රියාව කරත්මුත් අචේතනවූ ජේතවනය දර්ශනක්‍රියාව නොකොටහෙන හෙයින් ගාමෙ ආගච්ඡති යනාදියෙහි ආධාර ආධෙය දෙදෙනාගේ අභෙදෝපචාරයෙන් ග්‍රාම ශබ්දයෙන් ග්‍රාමස්ථයන් ගැණෙනපරිද්දෙන් ජේතවන ශබ්දයෙන් ජේතවනයෙහි වූවෝම ගැණෙතියි සේයි)—

දූර—පෙ—දූරන්තික—පෙ—කතතුසු ය, ච ය, යතු පදයි—(මේ සූත්‍රය චිපදය්)—දූරාදිසු, දූරන්තිකාදීන් ඇතිකල්හි; යං, යමෙක් ඇද්ද; තං, ඒ තෙම; අපාදානං, අපාදානවෙයි; චකාරෙණ, චග්‍රහණයෙන්: ක්වචි, කිසිතැනෙක්හි; දුතියාච, ද්විතියාද; තතියාච, තෘතීයාද; ඡට්ඨීච, ෂෂ්ඨීද වේ—තං යථා, හේමෙසේයි—දූරවාචීනං, දූරාර්ථවාචීවූ ශබ්දයන්ටද; තං යොගෙච, දූරවාචීශබ්දයන්ගේ යොගඇතිකල්හිද; අන්‍යේසුච, * සෙසුශබ්දයන්ටද; (අපාදානසංඥ වේ)—දූරතො, දුරින්; ආගම්ම, අවුත්; දූරං දූරෙනවා, දූරං ආගම්ම දූරෙන ආගම්ම කියාහෝ වේ-(අර්ථහේමැයි)-තෙ මොඝපුරිසා, ඒ තුච්ඡපුරුෂයෝ; ධම්මවිනයා, ධර්මවිනයෙන්; ආරකා, දුරුයි—ධම්මවිනයං ධම්මවිනයෙනවා ධම්මවිනයං ආරකා ධම්මවිනයෙන ආරකා යි කියාහෝ වේ-(අර්ථහේමැයි)-ආදීතැන දූරාර්ථවාචීවූ දූර ශබ්දයාටම අපාදානසංඥද චග්‍රහණයෙන් ද්විතියාද තෘතීයාද විය-පසුවතැන දූරාර්ථවාචීවූ ආරකා ශබ්දයාගේ යොගයෙහිද ධම්මවිනය ශබ්දයාහට අපාදානසංඥද ද්විතියාද තෘතියාද වේ—මෙසේම සෙසුතන්හිදු දතයුතුයි)—අන්තිකත්ථෙ, සමීපාර්ථයක් වාච්‍යකල්හි—ගාමා, ගමට; සමීපං, ආසන්නයි; ගාමං ගාමෙනවා, ගාමං සමීපං ගාමෙන සමීපං කියාහෝ වේ—(අර්ථහේමැයි)—අද්ධකාලානං, මාර්ග කාල දෙනාගේ; නිම්මාණෙ, පරිමාණයක් හැඟෙනකල්හි—මධුරාය, මධුරා නම් නුවරින්; චතුසු යොජනෙසු, සතරයොදනෙක්හි; සංකස්සං, සංකස්ස නම් පුරයය—(මේ මාර්ගනිර්මාණයි)-ඉතො, මෙයින්; එකනවුතිකප්පමත්ථකෙ, ඒකානූකපකින් මත්තෙහි-(මේ කාලප්‍රමාණයි)-නිම්මාණං, නිම්මාණ

* (අන්‍යේසු ච යි බාලාවතාරයෙහි පෙණේ)—

නම්; පරිමාණං, ප්‍රමාණයී-ත්වාලොපෙ සති, ත්වාහට ලොප්කළකල්හි; (ත්වාන්තයාගේ උච්චාරණයක් නැතිකල්හි යයි සේයි)කම්මාධිකරණ විසයෙ, කර්මවිෂයෙහි ද අධිකරණවිෂයෙහිද; (අපාදාන සංඥ වේ)-ත්වාලොපොති, ත්වා ලොප්නම්; ත්වාන්තස්ස, ත්වාප්‍රත්‍යයාන්තයාගේ; අත්ථසම්භවෙපි, අර්ථසම්භවයක් ඇතිකල්හිද; තස්ස, ඔහුගේ; අනුච්චාරණං, ප්‍රයොග නොකීමයි—පාසාදං, පහයට නැගී; සංකමෙය්‍ය, යන්නේයි—(පාසාදං සංකමෙය්‍ය කීකල්හි පාසාදං අභිරුහිත්වා සංකමෙය්‍ය යි සේය-* එහෙයින් අභිරුහිත්වා යි ත්වාන්තයාගේ ප්‍රයොගයක් ඇතිකල්හි අභිරොහණක්‍රියාවහා ප්‍රාසාදයාගේ සම්බන්ධය මුඛ්‍යව හැඟෙනහෙයින් ප්‍රාසාදයට කර්මසංඥ වෙයි—යමෙක අභිරුහිත්වා යන ශබ්දයාවිසින් වාච්‍යවූ අර්ථය හැඟෙතුදු ත්වාන්තතෙම ප්‍රයොග කරණු නොලද්දේවීනම් අභිරොහණක්‍රියාවහා සම්බන්ධයක් ප්‍රාසාදයට හැඟෙතුදු ප්‍රාසාදයට කර්මසංඥ නොව අපාදානසංඥ වේ—මේ කම්මවිෂයටයි)-ආසනා, ආසනයෙහි හිඳ; වුට්ඨහෙය්‍ය, නැඟී සිටින්නේයි—(මෙහි ආසනා වුට්ඨහෙය්‍ය යයි කීකල්හි ආසනෙ නිසීදිත්වා වුට්ඨහෙය්‍ය යයි සේයි—මෙහිදු ත්වාන්තයා ප්‍රයුක්තකල්හි ආසනයට ආධාරසංඥ වේ—ත්වාන්තයා අප්‍රයුක්තකල්හි ආදී කී පරිද්දෙන්ම ඔකාස සංඥනොව අපාදානසංඥ වේ—මේ අධිකරණය ඔකාසය යනු එකාර්ථයි)—ත්වාලොපෙති කිං, ත්වාලොපෙ යනු කුමටද; පාසාදං, පහයට; අභිරුහිත්වා, නැඟී; සංකමෙය්‍ය, යන්නේය; ආසනෙ, ආසනයෙහි; නිසීදිත්වා, හිඳ, වුට්ඨහෙය්‍ය, නැඟී සිටින්නේය; (යන තැන අපාදානසංඥ නොවන පිණිසයි)—

(මෙහි අභි පූර්වවූ රුහ යනු සකර්මකහෙයින් ප්‍රාසාදයට කර්ම සංඥවෙයි නිපූර්වවූ සද යනු අකර්මකහෙයින් ආසනයට ඔකාස සංඥ වේ—මෙසේම සෙසු තන්හිද දතයුතුයි)-දිසායොගෙ, දිග්වාචී ශබ්දයන්ගේ අර්ථයෙහිද; තං වාචීනං යොගෙච, ඒ දිග්වාචී ශබ්දයන්ගේ යොගයෙහිද; (අපාදාන සංඥ වේ)—† අවීචිතො, අවීචියෙන්; උපරි,

---

* (මෙහි සඞ්කමෙය්‍ය යන්නෙන් කියනලද ගමන නම් එකකින් අනිකකට මාරුවී යාමයි)—

† (මෙතන්හි පුරත්ථිමතො යන්නක් බාලාවතාරයෙහි පෙණෙතුදු එය සන්නයෙහි නොපෙණේ—රූපසිද්ධියෙහි දිශාර්ථවාචීන්හා යොගයෙහි "ඉතොසා පුරිමාදිසා" යනාදිය දක්වා දිශාර්ථයෙහි "පුරත්ථිමතො දක්ඛිණතො" යනාදිය කියනලදී—කාතන්ත්‍ර යන වෘත්තියෙහි දිසායොගයෙහි "අවීචිතො උපරි" යනාදියහා "පුරත්ථිමතො දක්ඛිණතො" යනාදිය දක්වනලදී—එහෙයින් මෙහි දිශාර්ථයෙහි "පුරත්ථිමතො" යනු බාලාවතාරයෙහි යොදනලදූයි සිතිය යුතු—පුරත්ථිමතො, පෙරදිගින්)—

මත්තෙහි—විභාගේ, විශේෂයක් හැඟෙනකල්හි—යතො, යමක්හ
ටවඩා; පණ්ඩිතතරො, අතිශයින් උත්කෘෂ්ටද—(මෙහි විශේෂාර්ථ
යෙහි කරණලද තර ප්‍රත්‍යයාන්තවූ ශබ්දයාවිසින් විශේෂය හැඟේ)-
ආරත්‍යත්ථයොගෙ, ආරත්‍යර්ථවාචී ශබ්දයන්ගේ යොගයෙහි—ගාම
ධම්මා, මෛථුනයෙන්; විරති, වැලැක්මයි—සුද්ධත්ථේ, ශුද්ධාර්ථයක් හැ
ඟෙන කල්හි—මාතිතො, මවිසින්; සුද්ධො, සුද්ධයී—පමොචනත්ථෙ,
ප්‍රමොචනාර්ථයෙහි—මාරබන්ධනා, සොලශබන්ධනයෙන්; මුත්තො,
මිදුනි—හෙත්වත්ථෙ, හෙත්වර්ථයක් ද්‍යොතනකල්හි; විකප්පෙන, වික
ල්පයෙන්; (අපාදානසංඥ වේ)—කස්මා හෙතුනා, කවරහෙතුයෙන්;
(විකල්පයෙන් නොවූ තන්හි දුතියාදීහු චග්‍රහණයෙන් වෙති යනු
ගහවත්තුපිණ්ඩිස කිං කාරණං යනාදී කිය)—කිං කාරණං-කෙනහෙ
තුනා—කිස්ස හෙතු සී—කිවද කවරහෙයිනැයී යනම අර්ථයි—*

විවිත්තත්ථෙ, විවික්තාර්ථයෙහි—කාමෙහි, කාමයෙන්; විවිච්චෙව,
වෙන් මැයී—පමාණත්ථෙ, ප්‍රමාණාර්ථයක් හැඟෙනකල්හි—දීඝසො,
දිගින්; නවවිදත්ථියො, නවවියතෙක්හි—දීඝොරෙහි ඉති, "දීඝො රෙ
හි" යන සූත්‍රයෙන්; සමාසස, සමාවිභක්තියට; සො, සො යන ආදෙශ
වේ—(මෙහි ප්‍රමාණනම් දීර්ඝ හ්‍රස්වප්‍රමාණයි)—පුබ්බයොගෙ, පුබ්බ
ශබ්දයාගේ යොගයෙහි—සම්බොධා, සම්‍යක්සම්බොධිඥනයට; පු
බ්බෙව, පළමුකොටම-අත්‍ර, මෙහි; පුබ්බො, පුබ්බශබ්දයතෙමේ; පඨ
මත්ථො, ප්‍රථමාර්ථවාචියී; (දිග්වාචී නොවෙයී සේයී)—බන්ධනත්ථෙ, බ
න්ධනාර්ථයක් හැඟෙනකල්හිද; ඉණවිසයෙ, ඉණවිසයෙහිද; (පචමී
වෙයී)—සතස්මා, සියයෙකින්; බද්ධො, බඳනාලදී; (සියයක් දරයී සේ
යී)—සතෙන වා, සතෙන බද්ධො කියාහෝ වේ—(අර්ථයේ මැයී)—
පක්ඛෙ, අපාදානනොවූ පක්‍ෂයෙහි; තතියා, චග්‍රහණයෙන් තෘතීයා
වේ-ගුණ වචනෙ, ගුණවාචීහට (අපාදන් සංඥ වේ)—රාජා, රජතෙ
මේ; ඉස්සරියා, ඓශ්වර්‍ය්‍යයෙන්; ජනං, ජනයා; රක්ඛති, රක්‍ෂාකෙරෙ
යි-(ඉස්සරස්ස භාවො යන අර්ථයෙහි ණ්‍යප්‍රත්‍යය කොට ඉකාරාගම
කළකල්හි සිද්ධවූ ඉස්සරිය ශබ්දයතෙම ගුණවාචීයී)-පඤ්හෙ, ප්‍රශ්න
යක්ද; කථනෙච, ප්‍රශ්නවිසඳීමක්ද හැඟෙනකල්හි; ත්වාලොපෙ,
ත්වාප්‍රත්‍යයාන්තයාගේ උච්චාරණයක් නැතිකල්හි; කම්මාධිකරණෙ
සු, කර්මවිෂයෙහිද; ආධාරවිෂයෙහිද (අපාදානසංඥ වේ)—අභිධ
ම්මා, අභිධර්මය අසා;(නොහොත් අභිධම්මා, අභිධර්මයෙහි පිහිටා)
පුච්ඡන්ති, විචාරත්; අභිධම්මං අභිධම්මෙනවා, අභිධම්මං පුච්ඡන්ති

---

* (දුතියා තතියා චතුත්ථී ච—යනු බාලවතාරයෙහි පෙණේ—කිං
කාරණං කෙන හෙතුනා කිස්ස හෙතු යන තුන්උදාහරණලෙස හෙ
ත්වර්ථයෙහි විතියා තෘතීයා චතුර්ථීද වෙයී—යනුයී)—

අභිධම්මන පුච්ඡන්තියි හෝ වේ—(තම්ම අධිකරණ දෙක්හිම උදාහරණ එක්වැනිහෙයින් එකම උදාහරණ පැය ත්‍යාලොපාදි පෙර කී පරිද්දෙන්මැයි—මේ ප්‍රශ්නයටයි)—(අභිධම්මා, අභිධර්මය අසා අභිධර්මයෙහි පිටුහෝ; කථයන්ති, විසඳත්; අභිධම්මං අභිධම්මනවා, අභිධම්මං කථෙන්ති අභිධම්මන කථයන්ති කියාහෝ වේ-අඥහේ මැයි—මේ කථනයටයි)—පක්ඛෙ, අපාදානසංඥනොවූ පක්ෂයෙහි; දුතියා තතියාච, ප්‍රශ්නකථන දෙකම ද්විතීයා තෘතීයාද වේ—

අත්‍ර, මෙහි, කථනං, කථනනම්; විසජ්ජනං, ප්‍රශ්නවිසඳීමයි—ත්‍යාලොපෙති කිං, ත්‍යාලොපෙ යනු කුමටය; අභිධම්මං, අභිධර්මය; සුත්වා, අසා; පුච්ඡන්ති, විචාරත්-අභිධම්ම ඨත්වාවා, අභිධම්මෙ ඨත්වා පුච්ඡන්ති යි හෝ වේ-(මේ ප්‍රශ්නයටයි)—අභිධම්මං සුත්වා, * අභිධර්මය අසා; කථෙන්ති, ප්‍රශ්නවිසඳත්; අභිධම්මෙ ඨත්වා වා, අභිධම්මෙ ඨත්වා කථයන්ති කියාහෝ වේ—ථොකතෝ, ථොකාර්ථයක් තිවම්නාකල්හිදී කරණවිසයෙ, කරණවිසයෙහිද-ථොකා, මඳදෙයක් කරණකොට ගෙණ, මුච්චති, මිදේ; ථොකෙනවා, ථොකෙන මුච්චති කියා හෝ වේ—පක්ඛෙ, අපාදාන නුවූතන්හි; කරණෙ තතියා, "කරණෙ තතියා" යී තෘතීයා වේ—අකත්තරි, කර්තෘයෙන් පිටත්තන්හි; නිච්චං, නිත්‍යයෙන්; (අපාදාන සංඥ වේ)—විපුලත්තා, මහත් බැවිනි—

——0000——

යස්ස—පෙ—යස්ස ය, වා ය, පරිග්ගහො ය, තං ය, සාමි ය, යනු පදයි—යස්ස, යමක්හුගේ; සං, පිළිබඳද; සාමි, (යමක්හුගේ) ස්වාමිද; සමීපො, (යමක්හුගේ) ආසන්නද; සමූහො, (යමක්හුගේ) රැසද; අවයවො, (යමක්හුගේ) අවයවයහෝ විනම්; තං, හේතෙමේ; සාමිනාම, ස්වාමිනම්—"සාමිස්මිං ඡට්ඨී" යන සූත්‍රයෙන් ෂෂ්ඨී වේ—භික්ඛුනො, භික්ෂුහුගේ; චීවරං, සිවුරයි—නරානං, නරයන්ට; ඉතෙඤු, ඉන්ද්‍රයි—නගරස්ස, නුවරට; සමීපං, ආසන්නයි—සුවණ්ණස්ස, ස්වර්ණයාගේ; රාසි, රැසයි—රුක්ඛස්ස, වෘක්ෂයාගේ; සාඛා, සාඛාවයි—(අවයවයටයි—මේ හැම සං යනාදියට ක්‍රමයෙන් උදාහරණයි)—වාකාරෙනෙව, වාග්‍රහණයෙන්ම; අඤ්ඤත්‍රාපි, මෙයින් පිටත්තන්හිදු; ඡට්ඨී, ෂෂ්ඨී වේ—(සං යනු සූත්‍රයෙහි කී පරිග්ගහො යන්නෙහි අර්ථය සාමි යනාදිය වූකලි වාග්‍රහණයෙහි ඵලය නැවත එම වාග්‍රහණයෙන් අවස්ථාන්තරයෙහිදු ෂෂ්ඨී වෙයි සේයි)—යථා, මෙසේයි—

* ("අභිධම්මං පඝිත්වා කථයන්ති" කියා බාලාවතාරයෙහි පෙණේ—අභිධර්මය කියා විසඳත් යන අර්ථය එපරිද්දෙන්ද යෙදිය හැකි වේ)—

හෙතුයොගෙ, හෙතු ශබ්දයාගේ යොගයෙහි—බුද්ධස්ස හෙතු, බුදුන් හෙතු කොට—(බුදුන්පිණිසයි)—සදිසත්ථෙ, සදෘශාර්ථයෙහි-පිතුස්ස සදිසො, පියාහාසම්යි-අන්තපච්චයයොගෙ, අන්තප්‍රත්‍යයාගේ යොගයෙහි—මුසාවාදස්ස, මුසාවාදයෙන්; ඔත්තප්පං, බන්නේ—(අව පූර්වූ තප යන්නහුකෙරෙන් "වත්තමානෙ මානන්තා" යි අන්තප්‍රත්‍යයකොට "ඔ අවස්ස" යි අව යන්නහට ඔකාරයක්ද "සිම්හි ගච්ඡන්තාදීනං අන්තසද්දො අං" යන සූත්‍රයෙන් විභක්තිසහිතවූ න්තහට අං කළකල්හි ඔත්තප්පං යනු වේ)-ගුණයොගෙ, ගුණයොගයෙහි-පඤ්ඤාය, ප්‍රඥාවගේ; පටුභාවො, පටුත්වයයි-(මෙහි පටුත්වය ගුණයයි)—සුහිතත්ථෙ, තෘප්ත්‍යර්ථයෙහි—ඵලානං, ඵලයෙන්; තිත්තො, පිනාගියේයි—(තෘප්ති නම් අභිලාසාවිච්ඡේදයි)—* නිපාතන්තරයොගෙ, නිපාතවිශෙෂයන්ගේ යොගයෙහි—වසලස්ස කත්වා, වෘෂලයාකොට—(කත්වා යන මේ කෘදන්ත නිපාතයි)—කාලෙ, කාලය කිවමනා කල්හි-මාසස්ස, මාසයකට; ද්වික්ඛත්තුං, දෙවරක්; භුඤ්ජති, කා—රුජ් යොගෙ, රුජ යන ධාතුහුගේ යොගයෙහි—දෙවදත්තස්ස, දෙවදත්තයා; රුජති, පෙළා—වත්තමානෙ, වර්තමානාර්ථයෙහි; ක්තයොගෙ, ක්තප්‍රත්‍යයාහා සම්බන්ධයක් ඇතිකල්හි; කත්තරි, කර්තෘවාච්‍ය කල්හි; (ෂෂ්ඨී වේ)—රඤ්ඤො, රජහුවිසින්; සම්මතො, අභිමතයි—(මෙහි සම්මතක්‍රියාව කරණහෙයින් රජ කර්තෘ වේ)—එත්ථ, මේ සම්මතො යි කිවමනාතන්හි; "භාගදිහි මතිබුද්ධිපූජාදිහි ක්තො" යන සූත්‍රයෙන්; ක්තො,(සංපූර්වූ මන යන්නාහුකෙරෙන්)ක්ත ප්‍රත්‍යය වේ-(ගම ඛනහනාදීන් නකාරයාටලොප් වේ)-යදූදිතා, යදනුපපන්නාදීන්; කලොපො, ක්තප්‍රත්‍යයාගේ කකාරයාට ලොප්වේ—සම්බන්ධෙ, සම්බන්ධයක් ද්‍යොතකකල්හි; (ෂෂ්ඨී වේ—ඒ සම්බන්ධනම් කිමයත්)—

යස්මා අත්ථො, යම්වස්තුවක් හේතුකොටගෙණ; එතෙ ච, මේ වස්තුහු දෙදෙන; සම්බන්ධිනො ඉති, සම්බන්ධඇත්තාහයි; බුද්ධිජායතෙ, බුද්ධිඋපදිද; සම්බන්ධිවය, ඒ සංයුක්තයන් දෙදෙනා; නිස්සිතො, ඇසුරුකළාවූ; එසො අත්ථො, ඒ වස්තුව තෙම; සම්බන්ධොනාම, සම්බන්ධනම්-(වෙන්වෙන්ව පැණෙන වස්තුහු දෙදෙනෙක් සමහරකලෙක එක්ව පැවැත්තේනම් උන් එක්වූහ යන බුද්ධිය උපදනේ සම්බන්ධබලයෙන ඒ සම්බන්ධයද එක්වූ වස්තුන්දෙදෙනාකෙරෙන් එක්වස්තුයෙහි පිහිටියේ නොවෙයි ඒ වස්තූන් දෙදෙනාකෙරෙහිම පිහිටියේයි සේයි)—

---

* ("පූරං හිරඤ්ඤ සුවණ්ණස්ස" යනු බාලාවතාරයෙහි පෙණේ-මේ සන්නයෙහි නොපෙණේ—රූපසිද්ධියෙහි සුහිතාර්ථයෙහි මේ උදාහරණ කරණලදී—හිරණ්‍යසුවර්ණයෝ පිරුණ යනුයි)—

සම්බන්ධිවයෙ, ඒ සම්බන්ධීන් දෙදෙනා අතුරෙහිලා; කොචි, කිසිවෙක්තෙමේ; විසෙසො, විශෙෂ්‍යවෙයි; කොච්, කිසිවෙක්; විසෙසනං, විශෙෂණ වේ; තෙසං, ඒ විශෙෂ්‍ය විශෙෂණදෙදෙනාගේ; කාචි ක්‍රියං, කිසික්‍රියාවක්; උද්දිස්ස, නිසා; සො සම්බන්ධො, ඒ නිවාවූ සම්බන්ධයතෙමේ; පතීයතෙ, පවතී—(එක්තරා ක්‍රියාවක් නිසා සම්බන්ධවනපරිදි මුලම කියනු ලැබේ)—

සම්බන්ධො, සම්බන්ධයතෙම; විටෙඨාපි, විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනාකෙරෙහි පිහිටියේද; භෙද කාරණං එව, විශෙෂණවාචී ශබ්දයාකෙරෙන්; ඡට්ඨී ජායතෙ, ෂෂ්ඨීවේ; (කවරහෙයින යත්)-යතො, යම්හෙතුවකින්; විසෙසසම්හා, විශෙෂ්‍යයාකෙරෙන්; ජාතාපි, වූවාහුද; සා, ඒ ඡට්ඨීතොම; සම්බන්ධං, සම්බන්ධය; නවදෙ, නොකියාද; (එහෙයින් විශෙෂණයාකෙරෙන්ම වෙයි විශෙෂ්‍යයාකෙරෙන් නොවේමය යි සේයි)—

ඒතං, මෙහිලා; අයං, මේතෙම; (විශෙෂණයාකෙරෙන්මවූ ෂෂ්ඨී සම්බන්ධය යි සේයි) සද්දසත්තිසභාවො ඉති, ශබ්දශක්තිස්වභාවයයි කියා; පතීයතෙ, හැගේ; සද්දඤ්ඤූ, ශබ්දාර්ථීයන්ගේ; සණ්ඨිති, ව්‍යවස්ථාව; පතීතිං, ලොකප්‍රතීතිය; අනතික්කම්ම, නොඉක්ම; හොති, වෙයි—(සම්බන්ධ විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනාකෙරෙහි පිහිටියේද විශෙෂණයාකෙරෙන්වූ ෂෂ්ඨී සම්බන්ධය හගවත්මුත් විශෙෂ්‍යයාකෙරෙන්වූ ෂෂ්ඨී සම්බන්ධය නොහගවයි යනු ශබ්දශක්තිස්වභාවය හැගේනම් හුදෙක් ප්‍රතීතියම ප්‍රමාණවූ නියාවේද එසේකල්හි මරීචිකාලයෙහිදු ජලප්‍රතීතිය ප්‍රමාණවන්නේදයත් ලොකප්‍රතීතානුසාරයෙන්ම ශබ්දාර්ථීනියමහෙයින් ශබ්දවිශෙෂයෙහි ප්‍රතීති පමණ වෙයි යනු දූෂ්‍යනොවෙයි සේයි)—

අඤ්ඤමඤ්ඤාපෙක්ඛලක්ඛණො, ඔවුනොවුන් අපෙක්ෂාකරණස්වභාව ඇත්තේ; සම්බන්ධො, සම්බන්ධනම—සොච, ඒ සම්බන්ධයද; නෙකවිධො, අනෙකවිධය; (කිසේයයත්)—ජඤ්ඤජනකභාවලක්ෂණ සම්බන්ධය, වාච්චවාචක භාවලක්ෂණ සම්බන්ධය, විකාර විකාරිභාවලක්ෂණ සම්බන්ධය, පරිමාණ පරිමෙය්‍ය භාවලක්ෂණ සම්බන්ධය, පූරණ පූරයිතබ්බ භාවලක්ෂණ සම්බන්ධය, ආදිභෙදනා, මේ ආදිභෙදයෙනි; * ආදි ශබ්දයෙන් කාර්‍ය්‍යකාරණලක්ෂණාදි භෙද දන්නේ-† යථා,

---

* (මෙහි ජඤ්ඤජනකාදි පාඨයෙහි පදුඩාරයක් නොදක්වා අනීකියා තිබෙන්නේ භාවලක්ෂණ සම්බන්ධ යනු එකක් පාසා යොදනපිණිසයි හැගේ—)

† (අධිකා, අධිකභාවලක්ෂණාදිය යන්නක්—යථා යන්නට පූර්වපෙණේ—එව්මසිය යුතු)—

මෙසේයි-රඤ්ඤො, රජහුගේ; පුත්තො, පිත්-(ජන්‍යජනකභාවලක්ඛ
ණ සම්බන්ධාදිය—මේ ජඤ්ඤජනකසම්බන්ධයි)-සද්දස්ස, ශබ්දයාගේ;
අත්‍ථො, අර්ථයි—(මේ වාච්‍ය වාචකසම්බන්ධයි)—ඛීරස්ස, ක්ෂීරයාගේ;
විකාරො, විකාරනම්; දධි, දියි—(මේ විකාරවිකාර්‍ය්‍ය සම්බන්ධයි—වි
කාරනම් මූලාවස්ථාවෙන් උත්තරාවස්ථාවයි)-තිලානං, තිලයන්ගේ;
මුට්ඨි, මිටයි;(මේ පරිමාණපරිමෙය්‍ය සම්බන්ධයි)-වස්සානං, වර්ෂයන්
ගේ; තතියෙ මාසේ, තුන්වනමස්හි; (මේ ශබ්දයෙන් වස්වසනකල්
තියත්—මේ පූරණපූරිතබ්බ සම්බන්ධයි—විශෙෂන විශෙෂ්‍යදෙදෙනා
හිසි ක්‍රියාවක් නිසා සම්බන්ධවනපරිදි දක්වනපිණිස තත්‍ථ යනාදි කී
ය)-තත්‍ථ, ඔවුන් අතුරෙහි; රඤ්ඤො පුත්තොති, රඤ්ඤො පුත්තො ය
නා; අත්‍ර, මෙහි; ජනනක්‍රියාය, ජනනක්‍රියාවවිසින්;කතො, කරණල
ද; සම්බන්ධො, සම්බන්ධයයි—තථාහි, එසේමැයි-රාජා,රජතෙමේ; ජනෙ
ති, උපදවයි—පුත්තො, පුත්‍රතෙමේ; ජනියතෙ, උපදවනුලැබේ—ත
ස්මා, එහෙයින්; රාජා, රජතෙමේ; ජනෙතිති, උපදවයි; වුත්තෙ, කීකා
ල්හි; කම්ති, කවරක්හු උපදවන්නේදැයි; විසෙසාපෙක්ඛායං, විශෙෂා
පෙක්ෂාවය ඇතිකල්හි; පුත්තං ඉති, පුත්‍රයයි; අපෙක්ඛියමානත්තා, අ
පෙක්ෂාකරණුලබනහෙයින්; පුත්තෙන, පුත්‍රයාහා; රඤ්ඤො, රජහු
ගේ; සම්බන්ධො හොති, සම්බන්ධය වේ-පුත්තො, පුත්‍රතෙමේ; ජඤ්ඤ
තෙති, උපදවනුලැබෙයි; වුත්තෙ,කියනලදකල්හි; කෙන, ඉති කව
රකුවිසින් උපදවනුලැබෙයි;විසෙසාපෙක්ඛායං,විශෙෂයක් අපෙක්ෂා
ඇතිකල්හි; රඤ්ඤොති, රජහුවිසින් උපදවනුලැබෙයි; අපෙක්ඛියමා
නත්තා, අපෙක්ෂාකරණලබනහෙයින්; රඤ්ඤො, රජහුහා; පුත්තස්ස,
පුත්‍රයාගේ; සම්බන්ධො හොති, සම්බන්ධය වේ-(මෙසේ රජහුගේ පු
ත්‍රයාද අපෙක්ෂාකරණහෙයින් උන්දෙදෙනාගේ සම්බන්ධයඋත්පත්ති
ක්‍රියායෙන් කරණලදද අන්‍යොන්‍යාපෙක්ෂාලක්ෂණ වේ)—බ්‍රාහ්මණ
ස්ස පුත්තො, බ්‍රාහ්මණයාගේ පුත්‍රය; වෙස්සස්ස පුත්තොති වා, වෛ
ශ්‍යයාගේ පිතායිහෝ; වත්තුං, කියන්නට, සක්කුණෙය්‍යත්තා, පිළිව
න්හෙයින්; බ්‍රාහ්මණාදීනං, බ්‍රාහ්මණාදීන්ට; සාමඤ්ඤභූතං,, සාමාන්‍ය
වූ; පුත්තං, පුත්‍රයා; බ්‍රාහ්මණාදිතො, බ්‍රාහ්මණාදීන්කෙරෙන්; රාජා, රජ
තෙම; විසෙසයතිති, වෙනස්කෙරේතුයි; විසෙසනං, විශෙසනය; පු
ත්තොත්‍ර, පුත්‍රයාවතාඃහි; තතො, ඒ බ්‍රාහ්මණාදීන්කෙරෙන්; විසෙසී
යතිති, වෙනස්කරණුලැබේතුයි; විසෙසො, විශෙෂ්‍යනම්—(එහෙයි
න් විසෙසනවාචි රාජ ශබ්දයාකෙරෙන්ම ෂෂ්ඨී වේ, ඉදින් ඒ තු වුව
හොත් රජහුගේ පුරුෂය රජහුගේ ධනයයි නොකියහැකිහෙයින් පු
රුෂාදීන්ට සාමාන්‍යවූ රජහු ඒ පුරුෂාදීන්කෙරෙන් වෙනස්කරන්නා
වූද විසෙසනවන්නේ වේද සම්බන්ධකරණකල්හි සම්බන්ධයට ආශ්‍ර
යවූ වස්තූන් දෙදෙනා අතුරෙහි යමෙක් ප්‍රසිද්ධ ඔහු තියා අප්‍රසිද්ධවූව.

සතුව ඇදින්වියයුතුය ඒ දෙකින් වසතුව ප්‍රයොජනත්වයෙන් අභිමත
හෙයින් ප්‍රධානහුයි විශෙෂ්‍යනම් ඒ ප්‍රයොජනත්වයෙන් අභිමතවූ ව
සතුව හඟවනපිණිස ආදිකොට දක්වියයුත්ත අප්‍රධානහුයි විශෙෂණ
වේ-එහෙයින් යම් කලෙක්හි පුත්‍රතෙමේ අප්‍රසිද්ධවූයේ ප්‍රසිද්ධවූ රජනු
නියා හැඟවියයුතුවූද එකල පුත්‍රතෙමේ ප්‍රධානවන්නේ විශෙෂ්‍යම වෙ
යි රජතෙමේ පුත්‍රයා හඟවන්නට කියනුලැබෙයි අප්‍රධානවූයේ වි
ශෙෂණවෙයි විශෙෂ්‍යාර්ථයෙන් විවක්‍ෂිතවේනුයි පුත්‍රයාකෙරෙන් ෂ
ෂ්ඨී නොවේ)-එවං, මෙසේ; වාච්චවාචකාදීසු, වාච්චවාචකාදි විශෙෂ
යෙහි; වචනක්‍රියාදයො, වචනක්‍රියාදීහු; නෙතබ්බා, සම්බන්ධයට නිමි
ත්තවූවාහු දතයුත්තාහුයි-(වුච්චතෙ ඉති වාච්චයො, කියනුලැබේනුයි
වාච්ය නාම්—වච යන්නාහුකෙරෙන් කර්ම්මයෙහි ණ්‍ය කොට ඉකාරා
ගමවූතැනි *වදතීති වාචකො, කියානුයි වාචකනම්—ශබ්දයයි-වච
යන්නාහුකෙරෙන් කර්තෘයෙහි ණ වූතැනි—සද්දස්ස අත්‍ථො යන්නෙ
හිවාච්‍යවූ අර්ත්‍ථයාගේද වාචකවූ ශබ්දයාගේද සම්බන්ධවනක්‍රියාව නි
සා වේ—කිසේයයත්-ශබ්දයාවිසින් කියනුලැබේනුයි සාමාන්‍යයෙන්
කී කල්හි කිමෙක් කියනලබන්නේයයි විශෙෂණයක් අපෙක්‍ෂාක
ළකල්හි අර්ත්‍ථය කියනුලැබෙන්නේයයි අපෙක්‍ෂාකරණු ලබනහෙයි
න් ශබ්දයාහා අර්ත්‍ථයාගේ සම්බන්ධයි—විකති විකාරො, අන්‍යථාභා
වය විකාරනමැයි සේයී—වි පූර්වවූ කර යන්නාහුකෙරෙන් භාවයෙ
හි ණ වේ—විකාරො අස්ස අත්‍ථීති විකාරී—ක්‍ෂීරයයි—දණ්ඩාදින් ඊ
වේ—ක්‍ෂීරයාගේ විකාරයයි සාමාන්‍යයෙන් කී කල්හි කිමෙක්දැයි
විකාරවන්නේයයි විශෙෂයක් අපෙක්‍ෂාකළකල්හි දධිවිකාරවන්නේ
යයි අපෙක්‍ෂාකරණුලබනහෙයින් දධියහා ක්‍ෂීරයාගේ සම්බන්ධය
වෙයි—වැලිදු දධිය විකාරයයි සාමාන්‍යයෙන් කීකල්හි කාගේ විකා
රදැයි අපෙක්‍ෂාකළකල්හි ක්‍ෂීරයාගේ යයි අපෙක්‍ෂාකරණුලබනහෙ
යින් ක්‍ෂීරයහා දධිහුගේ සම්බන්ධය වේනුයි විකාරවූ දධිහුගේද විකා
රීවූ ක්‍ෂීරයාගේද සම්බන්ධය විකෘතික්‍රියාව වේ—පරිමියතෙනෙනා
ති පරිමාණං, මේ කරණකොටගෙණ පිරිසිඳිනාලැබේනුයි පරිමා
ණ නම්—මුෂ්ටියයි—පරිපූර්වවූ මා මානෙ යන්නාහුකෙරෙන් කරණ
යෙහි යු වූතැනියි-පරිමියතෙති පරිමෙය්‍යං, පිරිසිඳිනාලැබේනුයි ප
රිමෙය්‍ය නම්—තිලයයි—එමධාතුහුකෙරෙන් කර්ම්මයෙහි ණ වූ තල
වදමදෘදි සූත්‍රයෙන් එය්‍යාදෙශවූතැනියි—තල පිරිසිඳිනා ලැබේයයි
කී කල්හි කුමකින්දැයි අපෙක්‍ෂායෙහි මුෂ්ටියෙනැයි අපෙක්‍ෂාහෙයි

---

* (වාච්ය වාචක දෙකට පදසිද්ධිය මෙහි කියනලදී පෙළෙහි වා
ච්ච වාචක දෙකපෙනේ ජඤ්ඤ ජනක වාච්ය වාචකාදි වසයෙන්ද
මැනවි)—

න් මුෂ්ටියසහා තිලයාහා සම්බන්ධය—මුෂ්ටියෙන් පිරිසිඳිනාලැබේනුයි තිකල්හි කුමක්දැයි අපෙක්ෂායෙහි තිලයයි අපෙක්ෂාවනහෙයින් තිලහා මුෂ්ටියගේ සම්බන්ධය වෙයි-තිලමුෂ්ටිසම්බන්ධය පරිමිතක්‍රියානිසා වේ-පූරෙනීති පූරණං, පූරානුයි පූරණනාම, පූර පූරණෙ යන්නාහු කෙරෙන් හෙත්වර්ථයෙහි ණෙ කොට කර්තෘයෙහි ක්ත කොට සරලොපො යනාදීන් එහට ලොප්කළතැනියි—පූරියතෙති පූරයිතබ්බං, පූරණ ලැබේනුයි පූරයිතබ්බ නම්—පූරයිතබ්බ නම් වෂීයි-පූරයිතබ්බයී—හෙත්වර්ථයෙහි ණය ප්‍රත්‍යයාන්තවූ පූර යන්නාහුකෙරෙන් කර්මයෙහි තබ්බකොට ඉකාරාගම කළතැනියි-*වස්සානං තතියෙ මාසෙ යන්නෙහි වර්ෂයන්ගේ ත්‍රිසංඛ්‍යාව පූරාසිටියේ මාසයයි මාසය විසින් පූරණලැබෙයි තී කල්හි කවුරුදැයි අපෙක්ෂායෙහි මාසයන්හා සම්බන්ධ වර්ෂයෝ පූරණුලැබෙතියි තී කල්හි කාවිසින්දැයි අපෙක්ෂායෙහි මාසයවිසිනැයි අපෙක්ෂාහෙයින්ම මාසයහා වර්ෂයන්ගේ සම්බන්ධය වේ-මේ වර්ෂ මාස සම්බන්ධය පූරණනිසා වේ-මෙසේම අනානාහු සම්බන්ධයෝ ඒ ඒ තැන්හි ඒ ඒ ක්‍රියාව නිසා වෙතියි දතයුත්තාහුයි).

——0000——

ඡට්ඨී සත්තමී යනු; අධිකරො, වැටේ—

සාමි—පෙ—සාමිස්සරාධිපතිදායාදසක්ඛිපතිභූපසූතකුසලෙහි ය, ච ය, යනු පදයි—සාමතාදී, සාමි ආදිවූ; සද්දයොගෙ, ශබ්දයන්ගේ යොගයෙහි; ඡට්ඨී සත්තමීච, ෂෂ්ඨීද සප්තමීද; හොති, වේ—ගොණානං, ගොන්ගේ; සාමි, ස්වාමියා; ගොණෙසුවා, ගොණෙසු සාමි යි කියා හෝ; ඉති ආදි, මේ ආදි වේ-(අර්ථභේමැයි-ගොණානං ඉස්සරො ගොණෙසු ඉස්සරො-ගොණානං අධිපති ගොණෙසු අධිපති-ගොණානං දායාදො ගොණෙසු දායාදො—දායාදනම් හිමිතැනැත්තේයි-ගොණානං සක්ඛි ගොණෙසු සක්ඛි-සක්ඛිනම් සාක්ෂියි-ගොණානං පති ගොණෙසු පති—ගොණානං පතිභූ ගොණෙසු පතිභූ-පතිභූනම් ඇපවූ තැනැත්තේයි—ගොණානං පසූතො ගොණෙසු පසූතො—පසූතනම් ප්‍රභූතයයි—ගොණානං කුසලො ගොණෙසු කුසලො—කුසලනම් දක්ෂයි)—

නිද්ධා—පෙ—නිද්ධාරණෙ ය, ච ය, යනු පදයි—නිර්ධාරණෙ, නිර්ධාරණයක් ගම්‍යමානකල්හි; ඡට්ඨී සත්තමීච හොති, ෂෂ්ඨී සප්තමීද වේ—(නිර්ධාරණනම් තිමයත්)—

ජාතිගුණක්‍රියානාමෙහි, ජාතිය ගුණය ක්‍රියාය නාමය යන මොවුන් හේතුකොටගෙණ; සමුදායතො, රැසින්; ඒකස්ස, එකක්හුගේ; පෘථක්කරණං, වෙන්කිරීමය යන; යාහි, යමෙක්ද; තං, ඒ; නිද්ධාර

---

* (පූරණ පූරිතබ්බයයි බාලාවතාරයෙහි පෙණෙනනමුත්—පූරණ පූරයිතබ්බ යන ශබ්දයන්ගේ සිද්ධිය මෙහි පෙණේ)—

ණං, නිඩාරණයයි; අබ්‍රවුං, කීහු—(වෛයාකරණයි, අඩකහාරකාවසු
තුං—හි ශබ්දය "තුහිචස්මහවෛ පාදපූරණෙ" යි පාදපූරණයෙහිද
වේ-යං යනු සම්බන්ධවනබැවින් යංහි යී කීතැන්හි හිශබ්දය ගාථාපාද
පූරණාර්ථයෙහි වූවේ-නි පූර්වූ ධර යන්නහුකෙරෙන් භාවයෙහි යු
කොට යදූඳින් ධකාරසථ අකාරයහ ඉද්ග්කකොට වගෙයාෂොසාදීන්
ව්හ කළකල්හි නිඩාරණ යනු සිඩයි-නිඩාරණනම් වෙන්කිරීමයි)—

නරානං, මනුෂ්‍යයන් අතුරෙහි; * ඛත්තියො, රජතෙමේ; සූරතරො,
අතිශයින්සූරයි; නරෙසුවා, නරෙසු සූරතරො යී කියාහෝ වේ-(අර්ථ
හේමැයි—මෙහි මනුෂ්‍යසමූදයෙහි ඇතුළුවූ ක්ෂත්‍රියතෙමේ ක්ෂත්‍රියජ
තිහෙතුකොටගෙණ එම මනුෂ්‍ය සමූහයෙන් වෙන්කරණුලැබේ)—
ගාවීනං, දෙනුන් අතුරෙහි; කණ්හා, කැළිදෙන්තොමෝ; සම්පන්න
ඛීරතමා, *අතිශයින්මධුරවූකිරිඇත්තීයි; ගාවීසුවා, ගාවීසු කණ්හා
සම්පන්නඛීරතමා යී හෝ වේ—(අර්ථහේමැයි—මෙහි ගාවීසමූදයෙ
හි ඇතුළත් දෙන්තොමෝ කෘෂ්ණගුණය හෙතුකොටගෙණ ඒ ගා
වීසමූදයෙන් වෙන්කරණලදී)—පථිකානං, මගීන් අතුරෙහි; ධාවං,
දිවනතැනැත්තේ; සීඝතමො, අතිශයින් ශීඝ්‍රයි; පථිකෙසුවා, පථි
කෙසු ධාවං සීඝතමො කියාහෝ වේ—(අර්ථහේමැයි—මෙහි පථි
කයන්කෙරෙහි ඇතුලත් ධාවකපුරුෂතෙමේ ධාවනක්‍රියාව හෙතු
කොටගෙණ ඒ පථිකසමූදයෙන් වෙන්කරණලදී—බ්‍රාහ්මණානං,
බමුණන් අතුරෙහි; දෙවදත්තො, දෙවදත්තනම් තැනැත්තේ; ප
ණ්ඩිතො, පණ්ඩිතයි; බ්‍රාහ්මණෙසුවා, බ්‍රාහ්මණෙසු දෙවදත්තො ප
ණ්ඩිතො, කියාහෝ වේ—(අර්ථහේමැයි—මෙහි බ්‍රාහ්මණසමූදයෙහි
ඇතුළත්වූ දෙවදත්තනම් බ්‍රාහ්මණතෙම දෙවදත්ත යන නාමහෙතු
කොටගෙණ ඒ බ්‍රාහ්මණසමූදයෙන් වෙන්කරණලදී)—චකාරෙන,
"නිඩාරණෙච" යන්නෙහි චග්‍රහණයෙන්; පඨමත්‍ථෙපි, ප්‍රථමාර්ථයෙ
හිද; සත්තමී, සත්වනවිභක්ති වේ—ඉදමපි, මේද; අස්ස, මෝහට;
සීලස්මිං හොති, සීල වේ-සීලනත්‍යත්‍ථො, සීලය යන අර්ථයි-(මෙහි අ
නවද්‍යවිධෙයභාවය විවක්ෂිතහෙයින් ඉදං යනු සීලස්මිං යන්නට වේ—
ඉම ශබ්දය ආසන්නාර්ථවාචීය එහෙයින් ආසන්නයෙහි කීදෙය ඉම

---

* (මෙහි නිර්ධාරණාර්ථය සිංහලකරණකල්හි "මනුෂ්‍යයන් අතුරෙ
හි" කියා ආධාරවිභක්තිය පෙණේ සෙසුතන්හිද මෙසේයි-මෙසේම
වෙනත් ඇතම් සිංහලපොත්හි පෙණේ, සිදත්සඟරාවෙහි වනාහි-
"නරන්කෙරෙන් කැත් උතට-රුවනතුරෙන් මහගුරතමැණි-යන්
නත්ගෙන් දූවාසෙදහල්, මේ ඇතිදරුණරුතැ අවදිව්බත් රුසි" යී
අවධිවිභක්තිය නිර්ධාරණාර්ථයෙහි දක්වනලදී. එසේ බොහෝ පො
ත් පත්වල පෙණේ—එහෙයින් සිදත් සඟරාව කරණකාලයෙහි නි
ර්ධාරණාර්ථයෙහි අවධිවිභක්තිය ම ව්‍යවහාර කළබැව් හැගේ)—

ශබ්දයෙන් කියා සාදනුලැබේ—මේ යට කී මුලුල්ල මෝහට සීලවෙයි කීකල්හි ඉම ශබ්දයෙන් යට කී දෙය කියා සීලය සැදූ නියායි)—

අනා—පෙ—අනාදරෙ ච, ච ය, යනුපදයි-අනාදරෙ ගම්‍යමානෙ, අනාදරයක් ගම්‍යමානකල්හි; ඡට්ඨී සත්තමීච හොති, ෂෂ්ඨී සප්තමී ද වේ—රුදතො, හඬන්නාවූ; දාරකස්ස, දරුවාට අනාදරකොට; පබ්බජි, පැවිජ්වි; රුදන්තස්මිං වා, රුදන්තස්මිං දාරකෙ පබ්බජීයි හෝ වේ—(අර්ථහේමැයි) රුදන්තං, හඬන්නාවූ; දාරකං, දරුවා, අනාදරියෙත්‍වා, අනාදරකොටය යන අර්ථයි—(දරුවා හඬවහඬවා පැවිජ්වියයි සේයි)—

ඡ—පෙ— ඡට්ඨී ය, ච ය, යනුපදයි—තතියා සත්තමීනං අත්ථෙ, තෘතියා සප්තම්දෙදෙනාගේ අර්ථයෙහි; කචි, කිසිතැනෙක්හි; ඡට්ඨී හොති, ෂෂ්ඨී වේ—(තෘතියා සප්තම්දෙදෙනා චුවමනාතන්හි ෂෂ්ඨී වෙයි සේයි)—යජස්ස, යජ යන ධාතුහුගේ (යොගයෙහි) කරණෙ, කරණ කාරකයෙහි (ෂෂ්ඨී වේ)—පුප්ඵස්ස, මල්කරණකොටගෙණ; බුධං, සර්වඥයා; යජති, පුදා—කිමලමත්ථෙ, කිං අලං ශබ්දදෙදෙනාගේ අර්ථයෙහි (ෂෂ්ඨී වේ)—තස්ස, ඔහුවිසින්; කිං, කිම—තස්ස, ඔහුවිසින්; අලං, පමණියි—(මේ හැම තෘතියායෙහි ෂෂ්ඨීය)—සත්තම්‍යත්ථෙ, සප්තම්‍යර්ථයෙහි; (ෂෂ්ඨී කියනුලැබේ)-නච්චගීතස්ස, නෘත්‍යගීතදෙක්හි; කුසලා, දක්ෂවූ—කචිති, කවියනු; කිං, කුමටය; තතබෙබ්සු, තය තබ්බය යන ප්‍රත්‍යයාන්තයාගේ පූර්වංගමයක් ඇතිකල්හි; තතියා එව, තෘතියාමවෙයි; (ෂෂ්ඨී නොවෙයි සේයි)—යථා, මෙසේයි—මයා, මාවිසින්; දෙසිතො, දෙසනලදී-භික්ඛුනිහි, මෙහෙණුන්විසින්; සික්ඛා, ශික්ෂාවෝ; පාලෙතබ්බා, රැක්කයුත්තාහුයි—

දුතියා—පෙ—දුතියාපචමීනං ය, ච ය, යනුපදයි—දුතියාපචමීනමත්ථෙ, ද්විතීයාපචමිදෙදෙනාගේ අර්ථයෙහි; කචි, කිසිතැනෙක්හි; ඡට්ඨීහොති, ෂෂ්ඨී වේ—කම්මස්ස, කර්මය, කත්තාරො, කරන්නාහු-සත්‍යත්ථෙ, සත්‍යර්ථධාතුය; ඉසුඉච්ඡායං, ඉසු ඉච්ඡායං යන ධාතුය; දය දානගතිරක්ඛණෙසු, දය දානගතිරක්ඛණෙසු යන; ඉච්චාදීනං, මේ ආදී ධාතුන්ගේ; යොගෙ, යොගයෙහි; (ද්විතීයාර්ථයෙහි ෂෂ්ඨී වේ)-මාතුයා, මව; සරති, සිහිකෙරේ-(සරගතිම්හි චින්තායංච)—පිතුස්ස, පියා; ඉච්ඡති, කැමැත්ත-තෙලස්ස, තෙල්; දයති, රක්ෂාකෙරේ-කරොතිස්ස, කර කරණෙ යන්නාහුගේ; (යොගයෙහි) පතියතනෙ, ප්‍රතියතනයක් හැගෙනකල්හි (ද්විතීයාර්ථයෙහි ෂෂ්ඨී වේ)—උදකස්ස, ජලය; පතිකුරුතෙ, සකස්කෙරේ—සතො, පෙර ඇත්තාහුගේ; ගුණධානං, ගුණපිහිටවීම; පතියතනං, පතියතන නම්—(පෙර ඇතිවස්තුවම සකස්කිරීමයයි සේයි—මේ හැම ද්විතීයාවටයි)—පචම්‍යත්ථෙ, පචම්‍යර්ථයෙහි; (ෂෂ්ඨී කියනුලැබේ)—සබ්බෙ, හැමදෙනම; දණ්ඩස්ස,

දණ්ඩනයෙන්; තසන්ති, භයපත්වෙත්—ඛවිති, ඛවි යනු; තිං, තුම වය—තවනතු, තවනතුය; තාවි, තාවිය; තවා, තවාය; ආන, ආනය; මාන, මානය; ණුකාදිසු, ණුකාදි ප්‍රත්‍යයන්ගේ ප්‍රයොගයක් ඇතික ල්හි; දුතියා එව, විනීයාම වෙයි—(ෂෂ්ඨී නොවේමයයි සේයි)—රථං, රථය; කාතවා, කෙළේ; කාතාවී, රථය කෙළේ; කත්වා, රථය කොට; කා රාණෙ, රථය මත්තේ කරන්නේ; කුරුමානොවා, රථයකරන්නේය යි; හෝ වේ—(රථං යනු හැමතැන්හිම යොදනු)—පසෙවා, චතුෂ්පා දයන්; ඝාතුකො, නසන්නේ;(හන යන්නාහුකෙරෙන් ණුක වූ තැනි යි) යදා, යම් කලෙක්හි; කිතකයොගෙ, කිතකප්‍රත්‍යයන්ගේ යොග යෙහි; කත්තරි, කර්තෘකාරකයෙහිද; කම්මනිච, කර්මකාරකයෙහිද; එකක්ඛණෙ, එකවට, ඡට්ඨී, ෂෂ්ඨීතොමෝ; සම්පත්තා, සම්ප්‍රාප්තද; තදා, එකල්හි; කම්මණෙයෙව, කර්මාර්ථයෙහිම; ඡට්ඨී, ෂෂ්ඨී වේ—(ක ර්තෘයෙහි නොවේමයයි සේයි)—යථා, මෙසේයි; අරජකෙන, නොරද හුවිසින්; වත්ථානං, වස්ත්‍රයන්ගේ; රාගො, රැදීම; අච්ඡරියො, ආ ශ්චර්යයී—එනි, මෙහි; රාගොති, රාග යන; අස්ස, මේ; කිතකස්ස, කෘදන්තයාගේ; යොගෙ, සම්බන්ධයෙහි; අරජකස්ස, අරජකයාතමා; කත්තුත්තා, කර්තෘහෙයින්ද; වත්ථානච, වස්ත්‍රයන්ද; කම්මත්තා, කර්ම හෙයින්ද; අරජකසද්දා, අරජක ශබ්දයාකෙරෙන්ද; වත්ථසද්දාච, වත්ථ ශබ්දයාකෙරෙන්ද; එකක්ඛණෙ, එකවට; ඡට්ඨීචෙති, "ඡට්ඨීච" යන සූත්‍රයෙන්ද; දුතියාපඤ්චමීනවෙති, "දුතියාපඤ්චමීනව" යන සූත්‍රයෙන් ද; ඡට්ඨිප්පසඟෙ, ෂෂ්ඨිප්‍රාප්තියෙහි; ඛවිග්ගහණෙන, ඛවිග්‍රහණ යෙන්; අරජකසද්දා, අරජකශබ්දයාකෙරෙන්; නහොති, (ෂෂ්ඨී) නොවෙයි; වත්ථාතු, වත්ථ ශබ්දයාකෙරෙන් වනාහි; ඡට්ඨීහොතෙව, * ෂෂ්ඨී වේමැයි-(මෙහි රජනක්‍රියාව කරණහෙයින් අරජක ශබ්දයා ක ර්තෘය ඒ රජනක්‍රියායෙන් සම්බන්ධකරණලබනහෙයින් වස්ත්‍රයෝ ක ර්මයහ ඒ කර්තෘවාචීවූ අරජක ශබ්දයාකෙරෙන් "ඡට්ඨීච" යන සූත්‍ර යෙන් තෘතීයාර්ථයෙහි වන්නාවූ ෂෂ්ඨීතොමෝ ඒ ඡට්ඨීච යන සූත්‍රයෙ හි වැටෙන්නාවූ ඛවිග්ගහණයෙන් නොවෙයි "කත්තරිච" යන සූ ත්‍රයෙන් තෘතීයාම වෙයි අරජකෙන යී කියා වේ—ඒ කර්මවාචිවූ වත්ථ ශබ්දයාකෙරෙන්වූ කල් "දුතියාපඤ්චමීනව" යන සූත්‍රයෙන් ෂෂ්ඨී වේමැයි-වත්ථානං යනු වේ—නරජකො අරජකො, රදනොවන්නේ අරජක නම්—

යො—පෙ—යො ය, ආධාරො ය, තං ය, ඔකාසං ය, යනු පදයි—

* (මෙහි ඡට්ඨී යනු බාලාවතාරපෙළෙහි නොපෙණෙතුදු සනා යෙහි යොදනලදී)—

යො, යමෙක් තෙමේ; ක්‍රියානිස්සයභූතානං, ක්‍රියාවට පිහිටවූ; කත්තුකම්මානං, කර්තෘකර්මදෙදෙනාට; පතිට්ඨා, පිහිටද; තං, ඒ කාරකය; ඔකාසං නාම, ඔකාස නම්—(මෙහි ය ශබ්දයෙන් විවක්ෂිතවූ පදාර්ථයයි සේයි—ඒ පදාර්ථය පුල්ලිඞ්ගහෙයින් යොයි ත්‍රියා පුල්ලිඞ්ගකොට දක්වූයේ—පදාර්ථනම් පෙරකී ජනකාදිපවකායයි—පතිට්ඨා යනු නියතස්ත්‍රීලිඞ්ගහෙයින් සවලිඞ්ගයෙන් සිට යො යන්නහා සම්බන්ධකරණු ලැබෙයි—තං යනු කාරකං යනු අපෙක්ෂාකොට නපුංසක ලිඞ්ගයි)—

"ඔකාසෙ සත්තමී" යි, සත්තමි වේ—

ඔපසිලෙසික, ඖපසිලෙසිකාය; විසය, විසයය; අභ්‍යන්තස, සාමීපිකය; බ්‍යාපික, ව්‍යාපකය යන; භෙද, වෙනසින්, ආධාරො, ඔකාසකාරකයතෙමේ; චතුධා, චතුර්විධ වේ; (කෙසේයත්) ඝටෙසු, ඝටයෙහි ලා; වාරි, ජලයය; සලිලෙ, ජලයෙහි; මච්ඡා, මත්ස්‍යයෝ; නදියං, නදියෙහි; සස්සං, ගොයම; තිලෙසු, තලයෙහි; තෙලං, තෙල යී වේ—(මේ වෘත්තය පාදකුලකයි—උපසිලෙසනං උපසිලෙසො, වැලඳ ගැන්ම උපසිලෙස නම්—උපශ්ලේෂය සංසර්ගය යි එකාර්ථයි-උප පූර්වවූ සිලිස ආලිඞ්ගනෙ යන්නහුකෙරෙන් භාවයෙහි ණවූතැනි—උපසිලෙසෙන චරතීති ඔපසිලෙසිකො—සංසර්ගයෙන් පවතීනුයි ඔපසිලෙසික නම්—උපසිලෙසෙන චරති යන අර්ථයෙහි ණෙනවා සංසට්ඨං යනාදින් ණික වූතැනියි—

ඝටෙසු වාරීයි කීතැන්හි වාරියන මෙපමණක්මුත් භවති යන ක්‍රියාපදයක් නොකීවද "සබ්බේ ප්‍රථමාන්තාභවනක්‍රියයා යුජ්‍යන්තෙ" යන න්‍යාය හෙයින් සියලුප්‍රථමාන්තයෝ ම භවනක්‍රියාවහාම යොඳනු ලැබෙත්—කිසේයත්—සියලුවස්තූහුම ආත්මලාභසමකාලයෙහි සත්තාව පවත්නාහෙයින් ඉදින් සත්වයෙක් නැත්නම් ආත්මලාභනම් දෙයක් නෙවේ නැත එහෙයින් උපදනා වේලෙහිම සත්තාවඇත සත්තාව භවනක්‍රියායෙන්යුක්තබවය ඒ භවනක්‍රියායෙන් යුක්ත බවද කර්මාදි අවස්ථාන්තරයකට නොපැමිනවූ ස්වස්වරූපසංවූ වස්තුමාත්‍රය ප්‍රකාශකරන්නාවූ ප්‍රථමාවිභක්තියවිසින් හැඟේ—එහෙයින් ඒ ප්‍රථමාන්තයෝ හැමදෙනම භවනක්‍රියාවාචීවූ පදයක්නැතද භවනක්‍රියාවහා සම්බන්ධකරණුලැබෙත්නුයි වාරි භවති යනු ලැබෙයි ඒ භවනක්‍රියාවට කර්තෘවූ වාරි යන්නෙහි භවනක්‍රියාහෙයින් වාරි යන කර්තෘතෙමේ භවනක්‍රියාවට පිහිටවූය ඒ වාරි යන කර්තෘහට ඝටයෝ පිහිටවෙත්-මෙසේ ක්‍රියාවට පිහිටවූ කර්තෘහට ආධාරය පිහිටවන පරිදිද සලිලෙ මච්ඡා යනාදියෙහිදු දතයුතුයි—මෙහි ඝටයෝ කර්තෘවූ ජලයහා අතුරෙහි ව්‍යවධානයක්නැතිව පවත්නාහු භවනක්‍රියාවට කර්තෘවූ ජලයාගේ අවස්ථිතියට හේතුවෙත්—විසයනම් ගොචරය—සං

ලිලෙ මච්ඡා යන්නෙහි පෙර කී පරිද්දෙන් ලැබෙන භවනක්‍රියාවට කර්තෘවූ මත්ස්‍ය සලිලතෙමේ හුදෙක් විෂයබැවින් පිහිට වේ—අභ්‍යසන්න සමීපයය—නදියං ඝොසං යන්නෙහි නදීතොමෝ ඝොෂයාගේ ද ආසන්නයෙහි, පවත්නීම පෙර කී පරිද්දෙන් ලැබෙන භවනක්‍රියාවට කර්තෘවූ ඝොෂයාගේ අවස්ථිතියට හේතු වේ-ව්‍යාප්නාති ආධෙයංමිති ව්‍යාපකො—ආධෙයවූ වස්තුහු පැතිර සිටීහුයි ව්‍යාපක නම්—ව් ආ පූර්වවූ අප පාප්නනෙ යන්නාහුකෙරෙන් කර්තෘයෙහි ණවූ වූතැ නි—ආධියතෙ යන අර්ථයෙහි ආපූර්වවූ ධා ධාරණෙ යන්නාහුකෙරෙන් කර්මයෙහි ණ්‍ය කොට එය්‍ය කළකල්හි සිඩවනබැවින් ආධෙයනම් දරණලබනවස්තුවයි—තිලෙසු තෙලං යන්නෙහි තිලයෝ තුමූ පෙර කීපරිද්දෙන් ලබන භවනක්‍රියාවට කර්තෘවූ ආධෙයවූ තෛලයන්ගේ එකතැනකුත් නොහැරසිට සියලෙලෙහි පැතිරසිට් නාහු ඒ තෛලයාගේ අවස්ථිතියට හෙතුවෙත්—මෙහිකර්තෘහට ආධාරය—කර්මයට ආධාරයකෙසේයත්-ඝටෙසු වාරිං නික්ඛිපන්ති—සලිලෙ මච්ඡෙ පස්සන්ති-නදියං ඝොසං කරොන්ති-තිලෙසු තෙලං ගණ්හන්ති යි වේ—මෙහි නිෂ්ක්ෂෙපණක්‍රියාවට කර්තෘපිහිටවූ වාරිං යන කර්මයට ඝටය පිහිටවූයේ ඖපශ්ලෙෂිකාධාරවෙයි—දර්ශනක්‍රියාවට පිහිටවූ මච්ඡ යන කර්මයට සලිලය පිහිටවූයේ විෂයාධාර වේ—කරණක්‍රියාවට පිහිටවූ ඝොසං යන කර්මයට නදී පිහිටවී සමීපාධාර වේ—ගහණක්‍රියාවට පිහිටවූ තෙලං යන මේ කර්මයට තිලය පිහිටවූයේ ව්‍යාපිකාධාර වේ—මේහැම අනුතෙත්තාකාසයි)—

කම්ම-පෙ—"කම්මකරණනිමිත්තත්ථෙසු සත්තමී" යන සූත්‍රයෙන්; සත්තමී, (කර්මය කරණය නිමිත්තය යන තුන්.අර්ථයෙහි) සප්තමී වේ—කම්මනි, කර්මයක් තිවමනාකල්හි; ගහ චූබි අභිවාදිනං යොගෙ, ගහ උපාදානෙ ය චූබි වදනසංයොගෙය, අභි පූර්වවූ වදි අභිවාදනෙය යන මොවුන්ගේ සම්බන්ධයක් ඇතිකල්හි-(සප්තමී වේ)-බාහාසු, අත්; ගහෙත්වා, ගෙණ; මුඩනි, මුදුන; චුම්බිත්වා, සිඹ; භික්ඛුසු, භික්ෂූන්; අභිවාදෙන්ති, වදිත්—(වදී යනු චුරාදී පඨිතයෙහි යින් ණෙ වූකල්හි අභිවාදෙන්තියි වේ)-කරණෙ, කරණයක් වාච්‍යකල්හි; භික්ඛාචාරෙ ගම්‍යමානෙ, භික්ෂාචාරයක් හැගෙනකල්හි; (සප්තමී වේ)—පත්තෙසු, පාත්‍රයන්කරණකොටගෙණ; පිඩාය, පිඬු පිණ්ඩස; චරන්ති, හැසිරෙත්—නිමිත්තෙ, නිමිත්තාර්ථයෙහි; (සප්තමී වේ)—කුඤ්ජරො, ඇත්තෙම; දන්තෙසු, දළනිමිත්තකොට ගෙණ; හඤ්ඤතෙ, මරණුලැබේ—දන්තවයං, දළදෙක; උද්දිස්ස, පිණිස; හඤ්ඤතෙ ඉති, මරණුලැබෙයි යන; අත්‍ථො, අර්ථයි—

සම්ප—පෙ-"සම්පදානෙච" යන සූත්‍රයෙන්; සත්තමී, සම්ප්‍රදානයෙ

හි සප්තමී වේ—සංඝෙ, සංඝයාහට; දින්නං, දෙනලදී—*පුබ්බ—පෙ—"පඤ්චම්‍යත්ථෙ ච" යන සූත්‍රයෙන්; සත්තමී, පඤ්චම්‍යර්ථයෙහි සප්තමීවේයි—කදලීසු, කෙහෙලින්; ගජං, ඇතු; රක්ඛන්ති, රකී—

කාල—පෙ—කාලභාවෙසු ච, ච ය, යනුපදයි—අත්‍ර, මෙහිලා; භාවෙ, භාවනම්; ක්‍රියා, ක්‍රියාය—කාලෙ, කාලයක්ද; භාවෙ, භාවයක්ද; †(තිවමනාකල්හි) සත්තමී හොති, සප්තමීවිභක්ති වේ—පුබ්බණ්හසමයෙ, පෙරවරු; ගතො, ගියේ—(මේ කාලයටයි)—සංඝෙසු, සංඝයා; භොජියමානෙසු, වළඳනුලබනකල්හි; ගතො, ගියේ—එහි, මෙහි; සංඝානං, සංඝයා; භොජනක්‍රියාය, භොජනක්‍රියායෙන්; කස්සචි, කිසිවක්හුගේ; ගමනක්‍රියා, ගතික්‍රියාතොමෝ; ලක්ඛීයතෙ, හඳුන්වනු ලැබේ—

උප—පෙ—උපාධි ච, අධිස්සරවචනෙ ච, යන්නු පදයි—අධිකවචනවුත්තිනො, අධිකයාගේ කිමෙහි පවත්නාවූ; උපස්ස, උප ශබ්දයාගේද; ඉස්සරවචනවුත්තිනො, ඊශ්වරශබ්දයාගේ කීමෙහි පවත්නාවූ; අධිස්සච, අධි ශබ්දයාගේද; යොගෙ, සම්බන්ධයක් ඇතිකල්හි; සත්තමී හොති, සප්තමී වේ—නික්ඛෙ, නිෂ්කයාගේ; උප, අධිකවූයේ; කහාපණං, කාෂාපණයකි; කහාපණෙ, කාෂාපණයක්; නික්ඛස්ස, නිෂ්කයාට; අධිකොත්‍යත්ථො, අධිකය යන අර්ථයි—(නිෂ්කයකින් වැඩිවූයේ කහවණුයෙකැයි සේයි—නිකයෙක්නම් පහලොස්කලඳෙකි—අධිකනම් අධ්‍යාරූඪය—අධිතෙමේම අධිකීනම, නැවත එහෙයින් මෙහි අධිකනම් කාෂාපණයම අධිකවූ කාෂාපණයෙන් යුක්තහෙයින් අධිකීනම් නිෂ්කයයි—ඒ අධික අධිකීවූ කාෂාපණ නිෂ්ක දෙදෙනාගේ අධිරොහණ ක්‍රියාවනිසාවන්නාවූ සම්බන්ධය සප්තමීවෙයි—කහාපණය යම්කලෙක්හි අධිකාර්ථය උපශබ්දයාවිසින් ද්‍යොතකවේද එකල්හි ඒ උපශබ්දයගේ යොගය වනහෙයින් අධිකවාච්වූ නිෂ්ක ශබ්දයා කෙරෙන්ම සප්තමීවෙයි කහාපණ ශබ්දයාකෙරෙන් නොවෙයි—කවරහෙයින් නොවේදී යත්—දෙදෙනාගේ සම්බන්ධය අධිකශබ්දයා කෙරෙන්වූ සප්තමීයවිසින්ම ප්‍රකාශිතහෙයිනි—ඒ අධිකයාකෙරෙන් ලිඞ්ගාර්ථමාත්‍රාපෙක්ෂායෙන් ප්‍රථමාවෙයි)—අධි, ඊශ්වරවූ; බ්‍රහ්මදත්තෙ, බ්‍රහ්මදත්තයාපිළිබඳවූ; පඤ්චාලා, පඤ්චාලදෙශයෙහි ඇත්තෝයි—ඉස්සරභූතස්ස, ස්වාමිවූ; බ්‍රහ්මදත්තස්ස, බ්‍රහ්මදත්තනම් රජහුගේ; පඤ්චාලාත්‍යත්ථො, පඤ්චාලයෝය යන අර්ථයි—(බ්‍රහ්මදත්තයාඊශ්වරකො

---

* (සංඝෙ දින්නං යන්නට සංඝයා විෂයෙහි දෙනලදී කියාත් ඇතම් ආචාර්ය්‍යවරයෝ අර්ථකියත්)—

† (කාලත්ථෙ භාවත්ථෙච—කියා බාලාවතාරයෙහි පෙණේ—මෙහි කාලෙ භාවෙච යන්නම පෙන්වන ලදී)—

ට ඇත්තාහු පචාලයෝයයි සේයි)-දෙවෙසු, දෙවියන්ට; බුධො, සර්වඥතෙම; අධි, ඊශ්වරයී—දෙවානං, දෙවියන්ට; බුධො, සර්වඥතෙම; ඉස්සරොතාපතො, ස්වාමීය යන අර්ථයි—(මේ උදාහරණදෙක්හි බ්‍රහ්මදත්ත ශබ්දයාද බුධ ශබ්දයාද ඊශ්වරාර්ථයෙහි වැටෙනධිව අධි ශබ්දයාවිසින් හඟවනලදී—ඊශ්වරනම් ස්වාමීය—ඒ ස්වාමී තමා ස්වාමියක්හු නැතිව පවත්නාහෙයින් ස්වාමිලක්ෂණවූ සම්බන්ධය පරිපාලනාදි එක්තරාක්‍රියාවක් නිසා වේ-යම් සම්බන්ධයක්මද්‍යොතනකාල්හි ඒ සම්බන්ධයට ආශ්‍රයවූ වස්තූන් දෙදෙනා අතුරෙහි යමෙක් ප්‍රසිධද ඔහුකියා අප්‍රසිධවස්තු හඳුන්වනුලැබෙයි, එහිදු හැඳින්වියයුතුව සතුව ප්‍රයොජනත්වයෙන් අභිමතවනහෙයින් ප්‍රධානනුයි විශෙෂ්‍ය නම් වෙයි—අප්‍රයොජනත්වයෙන් අභිමතවස්තුව හඟවනපිණිස කියනලබනහෙයින් අනුවාදකරණලබන වස්තුව අප්‍රධානනුයි විශෙෂණනම්වෙයි—එහෙයින් යම් කාලෙක්හි පිළිබඳවූ වස්තුව අප්‍රසිධව ස්වාමිහු කියා හැඟවියයුතුද එකල්හි ඒ පිළිබඳවූ වස්තුව ප්‍රධානවූයේ විශෙෂ්‍ය වේ—ස්වාමී ඔහු හඟවන්නට කියනුලැබේනුයි අප්‍රධානහෙයින් විශෙෂණ වේ—පචාලයන් නොහඳුනන්නාහට ප්‍රසිධවූ ස්වාමීවූ බ්‍රහ්මදත්තයා කියා පිළිබඳ අප්‍රසිධවූ පචාලයන් හැඟවියයුතුහෙයින් පචාලයෝ විශෙෂ්‍යනම්වෙති—ඔහු හඳුන්වන්නට කියනලද බ්‍රහ්මදත්තවිශෙෂණ වේ-එහෙයින් අධිබ්‍රහ්මදත්තෙ පචාලා යන්නෙහි විශෙෂණවාචීවූ බ්‍රහ්මදත්ත ශබ්දයාකෙරෙන් සප්තමීවෙයි—විශෙෂ්‍යවාචීවූ පචාලශබ්දයාකෙරෙන් ප්‍රථමා වේ—ඉදින් ස්වාමී අප්‍රසිධව පිළිබඳයා ප්‍රසිධව්නම් පිළිබඳයා කියා අප්‍රසිධවූ ස්වාමී හඟවනලබනහෙයින් ස්වාමිප්‍රධානනුයි විශෙෂ්‍ය වෙයි—පිළිබඳයා විශෙෂණ වේ-එසේහෙයින් අධිදෙවෙසු බුධො යන්නෙහි ස්වාමිවූ බුදුන් නොදන්නාහට ප්‍රසිධවූ දෙවියන් කියා අප්‍රසිධවූ බුදුන් හැඳින්වියයුතුහෙයින් බුදුහු ප්‍රධානවූවාහු විශෙෂ්‍යවෙති—බුදුන් හඳුන්වන්නට අනුවාදකරණලද දෙවියෝ අප්‍රධානවූවාහු විශෙෂණවෙත්නුයි විශෙෂණවාචී දෙව ශබ්දයාකෙරෙන් සප්තමීවෙයි—විශෙෂ්‍යවාචී බුධශබ්දයාකෙරෙන් ප්‍රථමා වේ—මේ දෙපක්ෂයෙහිම ස්වාමිලක්ෂණ සම්බන්ධද්‍යොතකයි)—එත්ථ, මෙහි; විග්ගහො, විග්‍රහතෙම; විධා, දෙපරිද්දෙන් වේ—වචනං, වචනනම්; උදීරණං, කීමයි-ඉස්සරස්ස, අධිපතිහුගේ; වචනං, කීම; ඉස්සරවචනං, ඉස්සරවචනනම්—(මේ තත්පුරුෂ සමාසයි)-ඉස්සරස්සවචනං, අධිපතිහුගේ වචනය; යස්ස, යමෙකුගේද; තං වා, ඒ හෝ; ඉස්සරවචනං ඉති, ඉස්සරවචන නමැයි—(කියායි—මේ බහුබ්‍රීහියි)—

මඛි—පෙ—මඛිතුපස්සුකොසාසු ය, තජ්ජා ය, ච ය, යනු පදයි—මඛි

තො, මඤ්ඤිතනාමි; පසන්නො, ප්‍රසන්නායි; උස්සුක්කො, උස්සුක්කනාමි; ඊර්ෂ්‍යාසුතෙතා, ඊර්ෂ්‍යාවෙන් යුක්තය—මඤ්ඤිතෙ, ප්‍රසන්නයාද; උස්සුක්කො ච, ඊර්ෂ්‍යායෙන් යුක්තයාද; (ප්‍රයුජ්‍යමානකල්හි) තතියා, තෘතීයාද; සත්තමිච හොති, සත්තමිද වේ—ඤාණෙ, ඤාණයෙහි; පසීදිතො, පහනි; ඤාණෙනවා, ඤාණෙන පසීදිතො කියාහෝ වේ—(අභිහේමැයි) ඤාණෙ, ඤාණයෙහි; උස්සුක්කො, ඊර්ෂ්‍යායුක්තයි; ඤාණෙනවා, ඤාණෙන උස්සුක්කොයි කියාහෝ වේ— *

සි ඩි ර සතු

* (ඤාණෙන පසීදිතො යනාදීන් තෘතියාව මූල්කොට පෙළපෙණේ-මෙහි වනාහි ඤාණෙ පසීදිතො ඤාණෙනවා යනාදීන් අධාරය මුල්කොට ඇතිසේ ව්‍යාඛ්‍යානය පෙණේ)—

# පටුන


පිටේ

1 සඤ්ඤා
2 සරසන්ධි
4 බ්‍යඤ්ජනසන්ධි
9 නිග්ගහීතසන්ධි
11 වොමිස්සකසන්ධි

නාමකාණ්ඩයෙහි

14 පුල්ලිඞ්ග
30 ඉත්ථිලිඞ්ග
32 නපුංසකලිඞ්ග
34 මිස්සලිඞ්ග
35 සබ්බනාම
43 සංඛ්‍යා
46 අලිඞ්ග

සමාසකාණ්ඩයෙහි

53 කම්මධාරය
58 තප්පුරිස
62 බහුබ්බීහි
65 චන්ද
68 අව්‍යයීභාව

තද්ධිත කාණ්ඩයෙහි

73 අපච්ච
76 සංසට්ඨ
78 රාගාදි
81 සංඛ්‍යා
84 භාව

ආඛ්‍යාතයෙහි

91 වත්තමාන
101 පඤ්චමී

පිටේ

103 { පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී, භවිස්සන්ති, කාලාතිපත්ති }
106 හෙත්වත්ථ
107 { රුධාදි, දිවාදි, සවාදි, කියාදි, ගහාදි, තනාදි, චුරාදි }
110 { ඉච්ඡත්ථ, නාමධාතු }

කිතක කාණ්ඩයෙහි

113 තෙකාලික
118 තස්සීලාදි
120 කිච්චාදි
121 ණ්වාදි
124 තතවන්තාදි
126 මානන්තාදි
128 තවෙතුමාදි

කාරක කාණ්ඩයෙහි

132 වුත්තානුත්තභෙද
133 වුත්තකම්ම
140 විසෙසන විසෙස්ස
144 අනුත්තකම්ම
146 වුත්තකත්තු

පිටේ

149 අනුත්තකත්තු
151 උත්තකරණ

152 දුතියා
161 තතියා
167 චතුත්ථී
172 පඤ්චමී
181 ඡට්ඨී
186 සත්තමී


—000—

## ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 7 | අව්‍යුත්පන්නනා: | අව්‍යුත්පන්න |
| 2 | 15 | සෙසෙක | සෙයෙක |
| 3 | 1 | ඇතුලත් | ඇතුළත් |
| 7 | 4 | ව්‍යජසා | ව්‍යජනයා |
| ,, | 9 | ව්‍යජ | ව්‍යජන |
| ,, | 31 | තැනෙක්හි | තැනෙක්හි |
| 8 | 8 | තරඞ්ග | තරල |
| 11 | 23 | සෙයි | සේයි |
| 12 | 2 | සවරූප | රූප |
| ,, | 19 | ලාපූ | ලාපූ |
| 14 | 19 | සෙයි | සේයි |
| 16 | 28 | ශබ්දයො | ශබ්දයෝ |
| 18 | 1 | වෙයි | වෙයි * |
| ,, | 36 | ඒන | ඒනම් |
| 19 | 13 | ඒසම | ඒසම් |
| 20 | 17 | ස්වීං, වේ | සම්ං වේ |
| ,, | 34 | චක්‍ෂු | චක්‍ෂුෂ |
| 21 | 32 | සර්වඥයා | සර්වඥය |
| 22 | 24 | අනත්තං | අනන්තං |
| 23 | 34-36 | ( ) වැඩියි | |
| 29 | 9 | සබ්බඤ්ඤු | සබ්බඤ්ඤූ |
| 30 | 16 | ප | පර |
| 32 | 10 | ප්‍රත්‍යකට | ප්‍රත්‍යයකට |
| 33 | 7 | ගසංඥකට | ගසංඥයකට |
| ,, | 28 | මෙනි | මෙති |
| ,, | 33 | යනු | යතු |
| 35 | 15 | පුරුෂයකුට | පුරුෂයක්හට |
| ,, | 26 | සබ්බනාමකාර තෙය, | සබ්බනාමකාර තොය, එය, |
| 36 | 5 | සෙධ | ෂෙධ |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| ,, | 25 | එකවචනහා | එකවචනවූ |
| ,, | 35 | පුස්ථාව | ප්‍රස්තාව |
| 39 | 12 | වෙනයී | වෙනයි |
| 40 | 12 | වචනයසී | වචනයී |
| 48 | 25 | කළෙක්හි | කලෙක්හි |
| 55 | 9 | විරඉති | විරඉතිච් |
| 56 | 23 | භගවණ | භගවන |
| 56 | 35 | අනන්ත | අනන්තර |
| 58 | 19 | මානයසී | සමානයසී |
| 60 | 16 | දත්වූවෝ | දත්වූවෝද |
| ,, | 38 | තප්පුරුෂ | තත්පුරුෂ |
| 61 | 27 | රූපසංඥ | රූපසඤ්ඤ |
| 62 | 4 | හැගෙන්නේ | නි තඳුහැගෙන්නේ |
| 63 | 27 | ඉවණ්යා | ඉවණ්ණනයා |
| ,, | 36 | බහු | බහු, |
| 64 | 11-2 | නදියො | නදීකො |
| ,, | 12 | ශවණ්ණ | සවණ්ණ |
| 65 | 28 | ද්‍රෂ්ටවූ | දෘෂ්ටවූ |
| 66 | 32 | භාජ්‍යසසං | භාජ්‍යස්සං |
| 67 | 24 | එකත්ව | (එකත්ව. |
| 68 | 8 | ධවඛදිරා | ධවඛදිරං ධවඛදිරා |
| 69 | 25 | සමාසොපද | සමාසොස්සපද |
| 70 | 33 | ව්පෂායෙහි | විපස්සායෙහි |
| 71 | 10 | සප්‍රෂ්ටතා | සප්ෂ්ටතා |
| 72 | 31 | පුවෘත්තිතාභාෂා. | ප්‍රවෘත්තිතා විභාෂා |
| 75 | 4 | වාච්ච | වාච්‍ය |
| 77 | 26 | නිකාරාන්ත | ණිකාන්ත |
| ,, | 27 | ර්ප්‍රත්‍ය | ර්ප්‍රත්‍යය |
| ,, | 33 | විශෙණෙති | විශෙණිනි |
| 79 | 26 | ද්‍රුහෞපි | දෘහෞපි |
| 80 | 27 | අභිජිති | අභි |
| ,, | 31 | සිවේ | සිවේ |
| 81 | 6 | අභිති | අභීති |
| ,, | 30 | නම | නාම-තනියො |
| 84 | 16 | ප්‍රස්ථායෙහි | ප්‍රස්තාවෙහි |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| ,, | 22 | චන්ද්‍රව්‍යවූ | චන්දවූ |
| 85 | 26 | පචක | පාචක |
| 86 | 2 | තලන | තිලිණ |
| 86 | 20 | රිකාරගමො | රිකාරාගමො |
| 87 | 4 | ප්‍රත්‍යනත | ප්‍රත්‍යයානත |
| ,, | 13 | මාතුඤ්ඤ | මාතුඤ්ඤක |
| 88 | 13 | කත | ඒ |
| 89 | 7 | වාසෙට්ඨ | වසිට්ඨ |
| ,, | 23 | දඩිතාදි | තඩිතාදි |
| ,, | 34 | පඩකජති | පඩකජාදි |
| 90 | 20 | මිහු | මිවූ |
| 91 | 1 | විශෙෂණනම් | විශෙෂනම් |
| 93 | 22 | පයුජ්ජමානෙ | පයුජ්ජමානෙපි |
| 95 | 11 | පූරුෂ් | පූරුෂ |
| 96 | 19 | පචකුමයයි | පචක මයයි |
| 99 | 11—12 | කම්මකයෙහි | කම්මයෙහි |
| ,, | 18 | අභාවයට | භාවයට |
| 102 | 18 | න්‍යයා | න්‍යායා |
| 104 | 2 | සව් | සාව් |
| ,, | 3 | අසව් | අසාව් |
| 110 | 12 | කාරිතසඥ | කාරිතසංඥ |
| ,, | 14 | චුරදි | චුරාදි |
| ,, | 16 | පාලතරක්‍ෂාව | රාක්‍ෂාව |
| ,, | 29 | පෙත් | පෙනේ |
| 117 | 16 | හනෙච | හනොච |
| 119 | 28 | ශවභාව | සවභාව |
| 121 | 15 | ණෙ | ණ |
| ,, | 21 | ලොපො | ලොපෙ |
| ,, | 24 | වේමැයි | මෙමැයි |
| 126 | 7 | කාරයාටා | කාරයාට |
| 133 | 21 | (ක්‍රියාවාචී යනු වැඩියි) | |
| 134 | 1 | කම්යෙහි | කම්ය |
| ,, | 28 | ආහරය | ආහාරය |
| 139 | 17 | භොජක්‍රියා | භොජනක්‍රියා |
| 140 | 9 | අභිධීය මානාභි | අභිධීයමානාභික්‍රියා |

| පිට. | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 141 | 7 | නීලාදිභාද්‍රවක | නීලාදිගොද්‍රවක |
| 143 | 4 | දිස්සමාන | දිස්සමානා |
| 144 | 12 | සඞුවෙක් | සංඝුවෙක් |
| 147 | 31 | කතීඃනට | කතීඃගට |
| 152 | 4 | ගාන්ධබ්බීය | ගන්ධබ්බීය |
| 153 | 3 | අි සූතුරුමෙන් | යි සූතුරුපෑමෙන් |
| ,, | 23 | ගමං | ගාමං |
| 154 | 6 | සඞ | සංඝ |
| 158 | 28 | යාගා | යගා |
| ,, | 33 | පතො | පතෙතා |
| 159 | 13 | භගඃවත් | භගවත් |
| 160 | 5 | අජඣාවසති | අජඣාසයති |
| 162 | 27 | සචෙන | සචෙතන |
| 165 | 21—22 | ගාමා | ගාමං |
| ,, | 28 | සිඞ්ං | සඞ්ං |
| 168 | 19 | ධායතෙ | ධාරයතෙ |
| 169 | 25 | පුබබස්ස | පුබබස්සා |
| 170 | 9 | තස්ස | තස්සා |
| 181 | 4 | පිටාහෝ | පිහිටාහෝ |
| 182 | 36 | සවණ්ණයෝ | සවණ්ණයෙන් |

——0000——

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු